

# ජාතක අටුවා

# ගැටපදය.

# ජාතක අටුවා ගැටපදය.

ශාස්ත්‍රාචාර්ය

සර් ඩී. බී. ජයතිලක අධිනීතිඥ මහතාණන්

විසින් සංශෝධිතයි.

කොළඹ-බොරැල්ලේ

ලඞ්කාභිනව විශ්‍රැත යන්ත්‍රාලයෙහි මුද්‍රිතයි.

1943

# ප්‍රස්තාවනාව

ජාතකට්ඨකථා නම් ජාතකපාළි අර්ථවර්ණනාවෙහි ඇතැම් පදයන් විස්තරකිරීම් වශයෙන් ලියන ලද ජාතක අටුවා ගැටපදය කවර කාලයක විසූ කිනම් ආචාර්යවරයෙකු විසින් කරන ලද්දක් දැයි නිශ්චයකිරීමට ප්‍රමාණවත්වන කරුණු මේ දක්වාම සොයාගත නොහැකිව තිබේ.

ජාතකට්ඨකථාව අර්ථකථාචාර්ය බුද්ධඝොෂ මහා ස්ථවිරපාදයන් වහන්සේගේ කෘතියකි යනු පරම්පරාගත මතය බව මේ ජාතක අටුවා ගැටපදයෙහි "සජීවාදීභ කුම්භවිදලන සමන්තාශෙෂ විද්‍යාජ්ජන චක්‍ර චූඩාමණි බුද්ධඝොෂාචාර්යපාදයෝ තමන් විසින් ප්‍රාරබ්ධ ග්‍රන්ථයාගේ........" යනාදි පාඨයෙන්ද ප්‍රකාශිතයි. එසේද වුවත් නවීන පර්යේෂකයන් අතර ජාතකට්ඨකථාව බුද්ධඝොෂහිමියන්ගේ කෘතියක් නොවේයයි සලකන්නෝද වෙති; ජාතකට්ඨකථාව බුද්ධඝොෂ මහා ස්ථවිරපාදයන්ගේ කෘතියක් වුවත් නුවූවත් එහි කර්තෘවරයා පාළිභාෂාව හා බුද්ධධර්මය පිළිබඳ විශාරද බුද්ධියක් ඇති පඬිවරයෙකු බව නිසැකය. ඒ මේ පාළිජාතකට්ඨකථාව සිංහල භාෂාවට පෙරළන ලදුව ජාතක පොත නමින් ඉතා ප්‍රසිද්ධව පවතී. ජාතක පරිවර්තනය කොළේ කවරෙකු විසින් ද යනුත් මත භෙද සහිත කරුණකි. ඒ පිළිබඳ විස්තර විවෙචනයක් සර් ඩී. බී. ජයතිලක මැතිතුමන් විසින් ප්‍රකාශයට පමුණුවන ලද ජාතක පොතේ ප්‍රථම භාගයේ ප්‍රස්තාවනාවෙහි ඇතුලත් වේ.

ජාතක අටුවා ගැටපදය ධම්පියා අටුවා ගැටපදය මෙන් ම සිංහල ග්‍රන්ථපද වර්ණනා ග්‍රන්ථ අතර විශෙෂත්වයක් උසුලයි. එසේ ද වුවත් මෙහි භාෂාව දහවන ශතවර්ෂයෙහි රචිත ධම්පියා අටුවා ගැටපදයේ භාෂාව තරම් පැරණි නොවේ. මේ ග්‍රන්ථයෙහි භාෂා විලාසයට අනුව මෙය රචනා කළ කාලය පොළොන්නරු අවධියේ අවසාන භාගය තරම් යයි සිතිය හැකිය.

ජාතක අටුවා ගැටපදය දොළොස්වෙනි ශතවර්ෂයට අයත් අභිධර්මාර්ථසංග්‍රහසන්නයට හා කාලනියමයක් ඉඳුරා කිය නොහැකි ජාතක ගාථා සන්නයට බොහෝ සේ හුරුය. රාජමුරාරි නම් ව්‍යක්ත බහුශ්‍රැත පඬිවරයෙකුගේ කෘතියක්වූ ජාතකගාථා සන්නය මෙන්ම මෙම ජාතක ගැටපදය ද සංස්කෘත සාහිත්‍යය හැදෑරීම සම්බන්ධව 12 වන ශතවර්ෂයේ සිට ලක්දිව ඇති වූ මහොත්සාහයට සාක්ෂ්‍යව පවතී.

සිංහල භාෂාවේ ක්‍රමවිකාශය දැනගැන්මට උත්සාහ ගන්නා ආධුනිකයන්ට ධම්පියා අටුවා ගැටපදයෙන් පමණ විනොදයක් හෝ ධෛර්යයක් ජාතක ගැටපදයෙන් නොලැබෙතත් මේ පොත පරිශීලනය කිරීමෙන් ලද හැකි ප්‍රයෝජනද අනල්පය.

බොහෝ කලක පටන් සිංහල උගතුන් අතර අර්ථයත් නිරුක්තියත් අවිනිශ්චිතව නානාප්‍රකාර මතභේදයන්ට ගොදුරුව පවත්නා "මරුට සේවටුවත්" ආදි ප්‍රයෝගයන්හි පෙනෙන "සේවටු" ශබ්දය "චේතනවට්ටක" යන පාලි වචනයෙන් බිඳී ආ බවත් අතික් වටුවන් නමා චේතනට මෙහෙයවා වැද්දා අතට පත් කරවන පුරුදු කළ වටුවාට ව්‍යවහාර කළ බවත් මේ ග්‍රන්ථයෙන් ඔප්පුවේ.

මේ පොත කියවන විට වැටහෙන ප්‍රධාන කරුණක් නම් මේ ගැටපදය නිෂ්පාදනය කළ අවධියෙහිදී සිංහල භාෂාවෙහි සංස්කෘත තත්සම ශබ්ද නිදහස් ලෙස බහුල වශයෙන් ප්‍රයෝගයට පැමිණෙමින් තුබූ බවයි. මේ වනාහි ධම්පියා අටුවා ගැටපදය තැනූ අවස්ථාව ගැන කිය නොහැකි ලක්ෂණයකි. ඒ අවස්ථාවෙහි පාලි තත්සම ශබ්දයන්ගේ බහුල ප්‍රයෝගයම පැවතුණු හෙයිනි.

ග්‍රන්ථිපද විවරණයක් වශයෙන් මේ පොත සර්වප්‍රකාරයෙන්ම ප්‍රයෝජනවත්ව සැපයීමට ගත්කරු ගත් උත්සාහය විශාලය.

ආසයානුසයඤාණ 44[3], දසවාස 47[12], විමුත්තිපටිසම්භිදා 161[4], සත්තතිංසබොධපක්ඛියධම්ම 206[4], සත්තඅසද්ධම්ම 207[19] යනාදි ධර්ම විස්තරද පඤ්චප්‍රකාර මීමැසි 34[2], ලදපස්මල් 35[11], අෂ්ටාදශවිද්‍යාස්ථාන 72[1], පඤ්චසුගන්ධ 72[22], පඤ්චාවුධ 73[5], කුමාරිකා ධර්ම 98[5] ආදි ශාස්ත්‍රීය විස්තර ද ග්‍රන්ථය අනුශීලනය කරන්නන්ට ඉතා උපකාර වේ.

මේ ගැටපදයේ අර්ථ කියමන බොහෝසේ ධම්පියා අටුවා ගැටපදයට හුරුය. එක වචනයකට පර්යාය වචන දෙකකින් අර්ථ දීම මෙහි සිරිතය.

"**රණෙහාගතො**, නොරඹුරට ගියේ-විවේකගත වූයේය යනුයි. 9[13], **උදගාහිනිං**, දිය වදනාවූ හෙවත් දිය උනන්නාවූ 10[22], **බද්ධිකා**, හෙළා හෙවත් බහාලා 13[14], **භාරමොරොපනං**, බර මිදීම්-ප්‍රසූතිය යනුයි 20[32], **අගක්ඛාරණකා**, අග නරන්නේ-අය කැමි වූයේ 58[20], **අබ්භත්ථං**, අවාමට-විනාශයටය යුතැන් 109[23]" යනාදි වශයෙනි.

සමහරවිට ගැටපදයට අර්ථ දී ග්‍රන්ථාන්තරාශ්‍රයෙන් විස්තරද ගෙන හැර පාති: "**අත්ථදස්සිනා**, වැඩ දක්නහු විසින් නොහොත් නෙයාර්ථ නීතාර්ථාදි අර්ථ දක්නහු විසින්, නෙයාර්ථ නම් ඥානයෙන් හැඟෙන අර්ථය, නීතාර්ථ නම් ශබ්දයෙන් ගැනෙන අර්ථයි 5[2], **පූතිකායං**, පූතිශරීරය, තදහුජාත කැණහිල්හුද 'ජරසිගාල'ය යන නම ලබන හෙයින්......රන්වන් සිරුරු ගෙහාතුදූ පූතිකාය යයි කියනු ලැබේ 9[20], **වනානා වනානං**, වනාවත්, වනන නම් මහ වන; අවනන නම් කුදු වනි. නොහොත් වනන නම් කුදුවන; අකාර වෘද්ධ්‍යර්ථ බැවින් අවනන නම් මහ වනි. 30[13]"

ඇතැම් තැනක විස්තර ලීමේදී පාලි-සංස්කෘත ග්‍රන්ථයන්හි පාඨාදිය දක්වා ලීමෙන්ම නවතිති: **අග්ගිසඤ්ඤබලං**,

“ඉද්ධිවිධං දිබ්බසොතං පරචිත්තවිජානනං
පුබ්බෙනිවාසානුස්සති දිබ්බචක්ඛූති පඤ්චධා”ති

කියන ලද අභිඥාවට 11[26], දසවාසො, “පඤ්චඞ්ගවිප්පහීනො හොති..... සුවිමුත්තපඤ්ඤො හොති”යි කියන ලද දසවිධ අරියවාසයෙහි වුත්වූ වාසයැති 47[12], විලාස නම්:-

අනවස්ථානමඞ්ගස්‍ය රූපයෞවනවිභ්‍රමඃ
තතො විලම්බනඤ්චවති විලාස ඉති කීර්තිතඃ. 132[3]

සමහර තැනක ධම්පියා අටුවා ගැටපදයෙහි මෙන් පාළියෙන් අර්ථයදී ‘යුතැන්’ ආදියක් යොදති. “භාරෙනබෙබා, ‘භරිතබෙබා’ යුතැන් 93[31], ‘චාතුරන්තං, ‘චතුසාගරන්තං’ යුසේසි 189[27], ඉච්චුභූනස්ස, ‘සත්තුභූතස්ස’යිතැන් 193[23], ජඤ්ඤරූපං, ‘ජඤ්ඤාකාරං’ යුසේසි 199[14], ඝොරාපිසාලක්ඛණෙන, ‘සාධ්‍යලක්ඛණෙන’ යුසේසි 201[11] යනු මෙනි.

ධම්පියා අටුවා ගැටපදය මහාබොධිවංසගැටපදය ආදි පැරණි සිංහල අර්ථ වර්ණනාවල මෙන්ම මෙහිත් පාළි ශබ්දවල විග්‍රහ වාක්‍ය හා ධාතු බොහෝසෙයින් සංස්කෘතයෙන් දක්වා තිබේ.

“සඞ්ගහං-සංග්‍රහ බවට, “පෘථග් විසර්ජිතානාම් එකත්‍රොපසං ඃ සංග්‍රහඃ” 4[28], අත්ථස්ස වණ්ණනං, අර්ථව්‍යාඛ්‍යානය යි. “වර්ණ්‍යතෙ'නෙනාර්ථ ඉති වර්ණනම්” යනු වේ 5[20], පමුදිතො, සොම්නස් වූයේය. මුද-හර්ෂෙ යන ධාතුයි. 15[10], ආභුජති, හැකිළෙයි. භුජ-කෞටිල්‍යෙ යන ධාතුයි 19[34], චරාපෙත්වා-කවා; චර-ගතිභක්ෂණයොඃ යන ධාතුයි 40[3]” යනුමෙනි.

ඇතැම් තන්හි ධාතු හා විග්‍රහ පාඨාදිය පාළිභාෂ වෙන්ද දක්වා තිබේ. “නාථ-යාචනොපතාපිස්සරියාසිංසනෙසු යන ධාතුයි 3[16], අලං-පරියත්තිවාරණභූසණෙසු යන ධාතුයි 15[28], ලොකීයති එත්ථ සුභාසුභං තප්ඵලඤ්චාති ලොකො 2[31], ගුණෙහි අනන්තානං පූරෙන්තීති පුරිසා මහන්තා ච තෙ පුරිසා චෙති.....මහාපුරිසචරියානං යු සේය” 5[13]

ඇතැම් විට ධම්පියා අටුවා ගැටපදයේ මෙන්ම පැරණි බව හඟවන යෙදුම් හා වචනද පෙනේ. ‘අඤ්ජසං-කණු කටු තසවූ 15[16], එවරාවෙසෙස් රුවක් කවරි තැනෙක්හිදු නැත් බැවින් රුවිහි අවසන් පත් 16[29], ලොකවිදූ-සත් සබර ඔවස් ලෝ දත් 18[14], ඛ්‍යාතිතමානසා-පැළපත් සිත් ඇත්තාහු 23[29], සවඤ්ඤූණ 22[26], ධ්‍යන් 219[14], නිධන් 221[24], බ්‍රම්සරවස්” 227[4] යනු මෙනි. මේහැර දෙහිටිලි 13[15], පවා 30[17], තසැළි 55[12], නෙරිවීම 67[23], සියුකු 108[27], සකුස් 164[21], ආදි ඉතා පැරණි ශබ්ද ද මෙහි බහුලව තිබේ. පෙර පවත් අද දක්වාම අමුතු නොවී පවත්නා ශබ්ද ද මේ පොතේ සුලභය. අතු 63[19], පස්වරු 64[23], කුලිය 67[11], පන්දුව 68[15], ඇද 105[33], ඇපය 128[28], නැන්ද 131[7], චොක්ක 143[30], ළිද 150[6], වත්ත 184[7], කොල්ලා 204[4] ආදියයි ද්‍රවිඩ භාෂාව සිංහලයෙහි බලපැවැත්වූ අයුරුද මෙහි පැහැදිලිව පෙනේ. කට්ටලය 39[8], පොදි 71[25], අඩගාණි 94[19], පණම් 99[13], තාඩි 209[27] ආදි ද්‍රවිඩ වචන රාශියක් මෙහි තිබීම ඊට නිදර්ශනයි.

මේ කරුණු අනුව ජාතක අටුවා ගැටපදයේ භාෂාව දොළොස් වන ශතවර්ෂයේ ලියූ අභිධර්මාර්ථ සංග්‍රහ ව්‍යාඛ්‍යාව හා සමාන කොට සැලකිය හැකිය. එමෙන් මේ ගැටපදය නිපදවූ ආචාර්යවරයා පාලි අර්ථකථා ප්‍රකරණ ග්‍රන්ථයන්ගෙන් මෙන්ම සංස්කෘත කොෂ ග්‍රන්ථාදියෙන්ද සුදුසු තන්හි පාඨොද්ධරණය කළ විශාරද බුද්ධිමතෙකු ලෙස ද ගිණිය හැකිය.

ධම්පියා අටුවා ගැටපදය ධම්මපදට්ඨ කථාවේ පාඨශොධනයෙහි ලා ඉවහල් වන්නේ යම්සේද එසේම ජාතකට්ඨ කථාව සංශොධනය කිරීමට මෙම ජාතක අටුවා ගැටපදය අතිශයින් උපකාර වේ.

මුද්‍රිත ජාතකට්ඨකථාවෙහි හා ජාතක අටුවා ගැටපදයෙහි පාඨ පිළිබඳව බොහෝ වෙනස්කම් දක්නා ලැබේ. ඒ සියල්ලම ඒ ඒ ස්ථානයෙහි අධොලිපි වශයෙන් දක්වා ඇත. එයින් සමහර පාඨයන්හි අර්ථයෙන් නොව ස්වරූපයෙන් පමණක් වෙනස්කම පෙනේ. ගැටපදයෙහි තිබෙන "තිස්සන්දං 233[29], අදිට්ඨවයස්සා 221[24], සට්ඨිතිත්‍රියොසීති 217[8], මනුස්සානසෙඤ්ඤච 201[6], තිධනං 200[26], කාරණසරං 184[8]" යන මේ පාඨ මුද්‍රිත ජාතකට්ඨකථාවෙහි "නිපච්චන්ති 3-304[29], අදිට්ඨසහායා 3-256[27], කුපිතිත්‍රියොසීති 3-241[35], පුරිසානසෙඤ්ඤච 3-181[4], බ්‍යසනං 3-178[26], බන්ධනාගාරං 3-87[26]"යි ශබ්දයෙන් බොහෝ දුරට වෙනස්ව අර්ථයෙන් වැඩි වෙනසක් නොමැතිව පෙනේ.

සමහර පාඨ අර්ථ ස්වරූප දෙකෙන්ම වෙනස්ව පෙනේ. ගැටපදයෙහි එන "ගාරවෙනෙවමාහ 190[25], සකිං 197[1], අලම්නෙතා 197[23], පඤ්චතාප 198[3], අසම්මිස්සං 199[20], පත්තිකා 201[22], වෙටකෙ 204[3], සාවෙනෙතා 211[10], බරාටකං 211[24]" යන මේ පාඨ මුද්‍රිත ජාතකට්ඨකථාහි "රාගවෙගෙනෙවං ආහ 3-128[5], දෙවසිකං 3-159[27], අප්පමනෙතා 3-163[28], පඤ්චාතපං 3-164[16], අසුචිමිස්සං 3-171[20], හත්තිකා 3-185[8], චොරඝාතකෙ 3-197[14], සංවෙජෙනෙතා 3-218[20], වරාටිකං 3-221[16]"යි අර්ථ ස්වරූප දෙකෙන් ම වෙනස්ව පෙනේ.

ගැටපදයෙහි එන ඇතැම් පාඨ මුද්‍රිත ජාතකට්ඨකථාවෙහි පාඨයන්ට වඩා අර්ථවත්ය. තැනට සුදුසුය. "සෙදුපෙත්වා 183[21], පරිභුත්තාමතසෙසව 185[3], වාරං පරිගණ්හනෙතා 188[5], මුනෙතන පවාහෙත්වා 190[5], කිං නික්කම්මා අචජ්ජාම 195[8]" යන මේ ගැටපදයෙහි එන පාඨ හා "දුපෙත්වා 3-85[2], පරිභුත්තමිත්තසෙසව 3-91[38], චොරං ගරහනෙතා 3-107[12], මුහුනෙතන පවාහෙත්වා 3-122[7], කිං නික්කම්මා ගචජ්ජාම 3-160[5]" යන මුද්‍රිත ජාතකට්ඨකථා පාඨ සසඳා බැලීමෙන් එය වටහා ගත හැකිය.

මුද්‍රිත ජාතකට්ඨකථාවෙහි නොපෙනෙන බොහෝ පාඨ ගැටපදයෙහි තිබේ. "නියාමෙත්වා 181[19], කූපගෙග 184[13], වෙච්චනානි 186[9], මොවෙත්තුං 191[2], සො ඉති ඉමෙසං පදානං 197[9], නලට්ඨකො 197[18], මූනියානං 200[26], ආමිසසංවිභාගො 201[28], ගද්‍රභො 203[21], අලලං 215[21], ඌනකා 226[22], පඤ්චවාරං 239[13]" මේ ජාතකට්ඨ කථාවෙහි නොපෙනෙන මෙහි එන පාඨ කීපයකි.

ධර්මඥනයත් භාෂාඥනයත් වැඩිදියුණුකර ගැනීමට ඉතා උපකාරී වන මේ ග්‍රන්ථය ශත වර්ෂ ගණනක් මුළුල්ලෙහිම අභාවිත වූ බව පෙනේ. තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමියන් පඤ්චිකාප්‍රදීපයෙහි සඳහන් කළ ග්‍රන්ථ අතර ජාතක අටුවා ගැටපදයද ඇතුළත් වේ. කෝට්ටේ අවධියෙන් පසු ඉතා මෑතක් වන තුරුම ජාතක අටුවා ගැටපදය අප්‍රකාශිතව පැවතිණ. මේ අතර වර්ෂ 1911 දී හරුමල්ගොඩ සුමංගල ස්ථවිරයන් වහන්සේ විසින් ශුද්ධකොට ජාතක 76 කින් පරිමිතව කොටසක් පළකරවන ලදි. එහි තවත් කොටසක්ද ඊට පසුව පළකරවන ලදි. මෙසේ එම ස්ථවිරයන් වහන්සේ විසින් ජාතක 284 කින් පරිමිතව සිරි ජාතකය අවසන් කොට පිටු 160 කින් යුක්ත කාණ්ඩ දෙකක් ප්‍රසිද්ධ කරන ලදි. පැරණි සිංහල ග්‍රන්ථ පිළිබඳ ඒ කාලයෙහි පැවැති පුරුද්ද මෙන්ම වැටහීම ගැන සලකා බලන විට ඒ උගත් ස්ථවිරයන් වහන්සේගේ උත්සාහය ප්‍රශස්තය. එසේද වුවත් එකල පැරණි සිංහල භාෂාව පිළිබඳ දැනීම අත්‍යල්පය. සිංහල ශබ්දකොෂයේ කටයුතු ආරම්භවීම නිසා ධම්පියා අටුවා ගැටපදය, සද්ධර්මරත්නාවලිය ආදි විශිෂ්ට ග්‍රන්ථ කිපයක් ශුද්ධ කිරීමෙන් පසුව ජයතිලක මැතිතුමාට ජාතක අටුවා ගැටපදය සංශොධනය කිරීමේ අත්‍යාවශ්‍යකත්වයද වැටහිණ. පූර්වොක්ත ග්‍රන්ථ දෙක මුද්‍රණය කරවූවාට පසු එතුමාගේ විවේක කාලය බොහෝ සෙයින් යොදන ලද්දේ ජාතක අටුවා ගැටපද පුස්කොළ පොත් සපයා ගැනීමට හා ඒ පොත සංශොධනය කිරීමටය. මේ සඳහා උඩපාත දෙරටින් සොයා ගත් පුස්කොළ පොත් හා ඒ වෙනුවට මෙහි අධොලිපිවල යොදන ලද සඞ්කෙත නම්:

A ලඞ්කාතිලක විහාරේ පුස්තකාලයට අයත් පොත.
B වැලිගම අග්‍රබොධි විහාරේ ,, ,,
C බම්බලපිටියේ වජිරාරාමයේ ,, ,,
D දොඩන්දූවේ ශෛලබිම්බාරාමයේ ,, ,,
E කොළඹ කෞතුකාගාරයේ ,, ,,
F ලොන්ඩොන් නුවර බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ ප්‍රාචීන පුස්තකාලයට අයත් පුස්කොළ පොතින් ගන්නා ලද පිටපත යනුයි.

මේ පොත් අතර මේ ශුද්ධියෙහි ලා ඉතා උපකාර වූයේ A පොතයි. මේ පොත් සමකර බැලීමේදී A පොත එක පරම්පරාවකටත් අනික් පොත්පසම අන්‍ය පරම්පරාවකටත් අයත් බව හැඟේ. දෙවැනිව කී පොත්වල ඇතැම් තැනක ස්වල්ප අන්‍යොන්‍ය විසදෘශත්වයක් පෙනෙතත් ඒ පොත් පසම එක් මුල් පොතකින් ආරබ්ධ වූ පරම්පරාවකට අයත් බව වැදගත් කරුණු දෙකකින් නිශ්චිත වේ. එනම් A පොතෙහි විද්‍යමාන පාඨ රාශියක්ම මේ පොත් පසෙහිම අඩුව තිබීම හා එම පොත් පසෙහිම එකසේ විද්‍යමාන ඇතැම් පාඨ මේ A පොතෙහි අඩුව තිබීමත්ය. හරුමල්ගොඩ සුමඞ්ගල ස්ථවිරයන් වහන්සේ විසින් පළකරවන ලද

කාණ්ඩ දෙක්හිද මේ ඌනත්වය පෙනෙන හෙයින් උන්වහන්සේට ලැබුණු පුස්කොළ පොත්ද අසම්පූර්ණ බැව් නිසැකයි.

කරුණු මෙසේ බැවින් ධම්මපියා අටුවා ගැටපද සංශෝධනයෙහිදී මෙන්ම මේ ජාතක අටුවා ගැටපද ශුද්ධියෙහිදීත් ජයතිලක මැතිතුමාට සම්පූර්ණ එක පුස්කොළ පොතක්වත් සපයා ගන්ට පුළුවන් වීම මහත් භාග්‍යයකි. මේ පොත අව්‍යක්ත ලිපිකරුවෙකු විසින් ලියන ලද්දක් බව බොහෝ තැන්වල පෙනෙන අශුද්ධ පාඨවලින් පැහැදිලි වේ. එසේ ද වුවත් මේ පොතේ ආධාරයෙන් ඌන ස්ථානරාශියක්ම පිරවීමට පුළුවන් විය.

5, 73, 74, 75, 76, 77, 78, 79, 80, 81, 83, 84, 85, 86, 91 154, 168, 173, 203, 210 වැනි පිටු බැලූ කල මේ ඌනපූරණයෙහි ප්‍රමාණයත් ප්‍රයෝජනයත් සලකා ගත හැකි යි.

සර් ඩී. බී. ජයතිලක මැතිතුමාට ඉතාම අනවකාශ කාලයෙක්හි මේ සංශෝධන කාර්‍යයෙහි නියුක්ත වන්නට සිදුවීම නිසා මේ කාර්‍යයෙහි මුලපටන්ම අපට සම්බන්ධ වීමටත් ශුද්ධි පත්‍රාදිය සම්පාදනය කිරීමටත් සිදුවිය.

විද්‍යාලංකාර පිරිවෙන්හි උපාචාර්‍ය ධුරන්ධර පණ්ඩිත මාඳෙවිට ඤාණානන්ද ස්ථවිර පාදයන් වහන්සේ හා සිංහල ශබ්ද කෝෂයේ ප්‍රධාන කර්තෘ ධුරන්ධර ජේ. ඩී. ද ලැනරෝල් මහතාත් මේ සංශෝධන කාර්‍ය්‍ය පිළිබඳව උපකාරී වූ බැව් මේ ප්‍රස්තාවයෙහි ප්‍රකාශ කළ යුතුය.

එසේම පුස්කොළ පොත් සපයා දීමෙන් මේ සංශෝධන කෘත්‍යය සඳහා උපස්තම්භක වූ සියලු ගිහිපැවිදි භවතුන්ට ජයතිලක මැතිතුමාගේ හෘදයංගම ස්තුතිය හිමි වන බවද මෙයින් ප්‍රකාශ කරමු.

යක්කඩුවේ ප්‍රඥාරාම.

1943 ජුලි මස 1 වෙනි දින
පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන්හිදී ය.

# සූචි පත්‍රය


| | | | පිට |
|---|---|---|---|
| | ප්‍රස්තාවනාව | | i |
| | සූචිපත්‍රය | | vii |
| | ශුද්ධිපත්‍රය | | xiii |
| | නමස්කාරාදි ප්‍රාරම්භ ගාථා | | 1 |
| | **නිදාන කථා.** | | |
| | දූරෙනිදාන | | 5 |
| | අවිදූරෙනිදාන | | 32 |
| | සන්තිකෙනිදාන | | 43 |
| 1 | අපණ්ණක | ජාතකය | 51 |
| 2 | වණ්ණුපථ | ,, | 53 |
| 3 | සෙරිවාණිජ | ,, | 55 |
| 4 | චුල්ලසෙට්ඨි | ,, | ,, |
| 5 | තණ්ඩුලනාළි | ,, | 58 |
| 6 | දෙවධම්ම | ,, | ,, |
| 7 | කට්ඨහාරි | ,, | 60 |
| 8 | ගාමණි | ,, | ,, |
| 9 | මඛාදෙව | ,, | 61 |
| 10 | සුඛවිහාරි | ,, | ,, |
| 11 | ලක්ඛණමිග | ,, | ,, |
| 12 | නිග්‍රොධමිග | ,, | ,, |
| 13 | කණ්ඩින | ,, | 63 |
| 14 | වාතමිග | ,, | ,, |
| 15 | ඛරාදිය | ,, | ,, |
| 16 | තිපල්ලත්ථමිග | ,, | ,, |
| 17 | මාලුත | ,, | 64 |
| 18 | මතකභත්ත | ,, | ,, |
| 19 | ආයාචිතභත්ත | ,, | ,, |
| 20 | නළපාන | ,, | ,, |
| 21 | කුරුඞ්ගමිග | ,, | ,, |
| 22 | කුක්කුර | ,, | 65 |
| 23 | භොජාජානීය | ,, | ,, |
| 24 | ආජඤ්ඤ | ,, | ,, |
| 25 | තිත්ථ | ජාතකය | 65 |
| 26 | මහිළාමුඛ | ,, | 66 |
| 27 | අභිණ්හ | ,, | ,, |
| 28 | නන්දිවිසාල | ,, | ,, |
| 29 | කණ්හ | ,, | 67 |
| 30 | මුනික | ,, | ,, |
| 31 | කුලාවක | ,, | ,, |
| 32 | නච්ච | ,, | 68 |
| 33 | සම්මොදමාන | ,, | ,, |
| 34 | මච්ඡ | ,, | ,, |
| 35 | වට්ටක | ,, | ,, |
| 36 | සකුණ | ,, | ,, |
| 37 | තිත්තිර | ,, | ,, |
| 38 | බක | ,, | 69 |
| 39 | නන්ද | ,, | ,, |
| 40 | ඛදිරඞ්ගාර | ,, | ,, |
| 41 | ලොසක | ,, | 70 |
| 42 | කපොත | ,, | ,, |
| 43 | වෙළුක | ,, | ,, |
| 44 | මකස | ,, | 71 |
| 45 | රොහිණී | ,, | ,, |
| 46 | ආරාමදූස | ,, | ,, |
| 47 | වාරුණි | ,, | ,, |
| 48 | වෙදබ්භ | ,, | ,, |
| 49 | නක්ඛත්ත | ,, | ,, |
| 50 | දුම්මෙධ | ,, | 72 |
| 51 | මහාසීලව | ,, | ,, |
| 52 | [චුල්ලජනක] | ,, | ,, |
| 53 | පුණ්ණපාති | ,, | ,, |
| 54 | කිම්පක්ක | ,, | 73 |
| 55 | පඤ්චාවුධ | ,, | ,, |
| 56 | කඤ්චනක්ඛන්ධ | ,, | ,, |

| | | | පිට |
|---|---|---|---|
| 57 | වානරින්ද | ජාතකය | 73 |
| 58 | තයොධම්ම | ,, | 74 |
| 59 | භේරිවාද | ,, | ,, |
| 60 | සඞ්ඛධමන | ,, | ,, |
| 61 | අසාතමන්ත | ,, | ,, |
| 62 | අණ්ඩභූත | ,, | 75 |
| 63 | තක්ක | ,, | 76 |
| 64 | දුරාජාන | ,, | 77 |
| 65 | අනභිරති | ,, | , |
| 66 | මුදුලක්ඛණ | ,, | ,, |
| 67 | උච්ඡඞ්ග | , | 78 |
| 68 | සාකේත | ,, | ,, |
| 69 | විසවන්ත | ,, | ,, |
| 70 | කුද්දාල | ,, | 79 |
| 71 | වරණ | ,, | ,, |
| 72 | සීලවනාග | ,, | 80 |
| 73 | සච්චංකිර | ,, | ,, |
| 74 | රුක්ඛධම්ම | ,, | 81 |
| 75 | මච්ඡ | ,, | ,, |
| 76 | අසඞ්කිය | ,, | 82 |
| 77 | මහාසුපින | ,, | ,, |
| 78 | ඉල්ලීස | ,, | 84 |
| 79 | ඛරස්සර | ,, | 85 |
| 80 | භීමසේන | ,, | 86 |
| 81 | සුරාපාන | ,, | ,, |
| 82 | මිත්තවින්ද | ,, | 87 |
| 83 | කාලකණ්ණි | ,, | ,, |
| 84 | අත්ථස්සද්වාර | ,, | ,, |
| 85 | කිම්පක්ක | ,, | 88 |
| 86 | සීලවීමංස | ,, | ,, |
| 87 | මඞ්ගල | ,, | ,, |
| 88 | සාරම්භ | ,, | 89 |
| 89 | කුහක | ,, | ,, |
| 90 | අකතඤ්ඤු | ,, | 90 |
| 91 | ලිත්ත | ,, | ,, |

| | | | පිට |
|---|---|---|---|
| 92 | මහාසාර | ජාතකය | 90 |
| 93 | විස්සාසභොජන | ,, | 91 |
| 94 | ලොමහංස | ,, | ,, |
| 95 | මහාසුදස්සන | ,, | 93 |
| 96 | තෙලපත්ත | ,, | ,, |
| 97 | නාමසිද්ධි | ,, | 96 |
| 98 | කූටවාණිජ | ,, | ,, |
| 99 | පරොසහස්ස | ,, | ,, |
| 100 | අසාතරූප | ,, | ,, |
| 101 | පරොසත | ,, | 97 |
| 102 | පණ්ණික | ,, | 98 |
| 103 | වෙරි | ,, | ,, |
| 104 | මිත්තවින්ද | ,, | ,, |
| 105 | දුබ්බලකට්ඨ | ,, | ,, |
| 106 | උදඤ්චනි | ,, | 99 |
| 107 | සාලිත්තක | ,, | ,, |
| 108 | බාහිය | ,, | ,, |
| 109 | කුණ්ඩපූව | ,, | 100 |
| 110 | සබ්බසංහාරකපඤ්හ | | ,, |
| 111 | ගද්‍රභපඤ්හ | ,, | ,, |
| 112 | අමරාදෙවීපඤ්හ | | ,, |
| 113 | සිඟාල | ,, | ,, |
| 114 | මිතචින්තී | ,, | 101 |
| 115 | අනුසාසික | ,, | ,, |
| 116 | දුබ්බච | ,, | ,, |
| 117 | තිත්තිර | ,, | ,, |
| 118 | වට්ටක | ,, | 102 |
| 119 | අකාලරාවී | ,, | ,, |
| 120 | බන්ධනමොක්ඛ | ,, | ,, |
| 121 | කුසනාළි | ,, | 103 |
| 122 | දුම්මේධ | ,, | ,, |
| 123 | නඞ්ගලීස | ,, | ,, |
| 124 | අම්බ | ,, | 104 |
| 125 | කටාහක | ,, | ,, |
| 126 | අසිලක්ඛණ | ,, | 105 |

| | | | පිට |
|---|---|---|---|
| 127 | කලණ්ඩුක ජාතකය | | 106 |
| 128 | බිළාරවත | ,, | ,, |
| 129 | අග්ගික | ,, | ,, |
| 130 | කොසිය | ,, | 107 |
| 131 | අසම්පදාන | ,, | ,, |
| 132 | පඤ්චගරුක | ,, | 108 |
| 133 | ඝතාසන | ,, | ,, |
| 134 | ඣානසොධන | ,, | ,, |
| 135 | චන්දාභ | ,, | ,, |
| 136 | සුවණ්ණහංස | ,, | 1(9 |
| 137 | බබ්බු | ,, | ,, |
| 138 | ගොධ | ,, | 110 |
| 139 | උභතොභට්ඨ | ,, | ,, |
| 140 | කාක | ,, | ,, |
| 141 | ගොධ | ,, | 111 |
| 142 | සිගාල | ,, | ,, |
| 143 | විරොචන | ,, | ,, |
| 144 | නඞ්ගුට්ඨ | ,, | ,, |
| 145 | රාධ | ,, | 112 |
| 146 | කාක | ,, | ,, |
| 147 | පුප්ඵරත්ත | ,, | ,, |
| 148 | සිගාල | ,, | ,, |
| 149 | එකපණ්ණ | ,, | 113 |
| 150 | සඤ්ජීව | ,, | 114 |

එකක නිපාත වණ්ණනා නිට්ඨිතා.

| | | | |
|---|---|---|---|
| 151 | රාජොවාද ජාතකය | | 116 |
| 152 | සිගාල | ,, | ,, |
| 153 | සූකර | ,, | 117 |
| 154 | උරග | ,, | 118 |
| 155 | භග්ග | ,, | ,, |
| 156 | අලීනචිත්ත | ,, | ,, |
| 157 | ගුණ | ,, | 119 |
| 158 | සුහනු | ,, | 120 |
| 159 | මොර | ,, | ,, |
| 160 | විනීලක | ,, | 121 |
| 161 | ඉන්දසමානගොත්ත ජාතකය | | 121 |
| 162 | සන්ථව | ,, | 122 |
| 163 | සුසීම | ,, | ,, |
| 164 | ගිජ්ඣ | ,, | ,, |
| 165 | නකුල | ,, | 123 |
| 166 | උපසාළ්හක | ,, | ,, |
| 167 | සමිද්ධි | ,, | 124 |
| 168 | සකුණග්ඝි | ,, | ,, |
| 169 | අරක | ,, | 125 |
| 170 | [කකණ්ටක] | ,, | ,, |
| 171 | කල්‍යාණධම්ම | ,, | 126 |
| 172 | දද්දර | ,, | ,, |
| 173 | මක්කට | ,, | ,, |
| 174 | දුතිය මක්කට | ,, | ,, |
| 175 | ආදිච්චුපට්ඨාන | ,, | ,, |
| 176 | කළායමුට්ඨි | ,, | ,, |
| 177 | තින්දුක | ,, | 127 |
| 178 | කච්ඡප | ,, | ,, |
| 179 | සතධම්ම | ,, | ,, |
| 180 | දුද්දද | ,, | 128 |
| 181 | අසදිස | ,, | ,, |
| 182 | සඞ්ගාමාවචර | ,, | ,, |
| 183 | වාලොදක | ,, | 12? |
| 184 | ගිරිදත්ත | ,, | ,, |
| 185 | අනභිරති | ,, | ,, |
| 186 | දධිවාහන | ,, | ,, |
| 187 | චතුමට්ඨ | ,, | 130 |
| 188 | සීහකොත්ථුක | ,, | ,, |
| 189 | සීහචම්ම | ,, | ,, |
| 190 | සීලානිසංස | ,, | ,, |
| 191 | රුහක | ,, | ,, |
| 192 | [සිරිකාළකණ්ණි] | | ,, |
| 193 | චුල්ලපදුම | ,, | ,, |
| 194 | මණිචොර | ,, | 131 |
| 195 | පබ්බතූපත්ථර | ,, | ,, |

| | | | පිට |
|---|---|---|---|
| 196 | වලාහස්ස | ජාතකය | 131 |
| 197 | මිත්තාමිත්ත | ,, | 132 |
| 198 | රාධ | ,, | ,, |
| 199 | ගහපති | ,, | ,, |
| 200 | සාධුසීල | ,, | 133 |
| 201 | බන්ධනාගාර | ,, | ,, |
| 202 | කෙළිසීල | ,, | ,, |
| 203 | ඛන්ධවත්ත | ,, | ,, |
| 204 | වීරක | ,, | 134 |
| 205 | ගඞ්ගෙය්‍ය | ,, | ,, |
| 206 | කුරුඞ්ගමිග | ,, | ,, |
| 207 | අස්සක | ,, | ,, |
| 208 | සුංසුමාර | ,, | 135 |
| 209 | කක්කර | ,, | ,, |
| 210 | කන්දගලක | ,, | ,, |
| 211 | සොමදත්ත | ,, | ,, |
| 212 | උච්ඡිට්ඨභත්ත | ,, | ,, |
| 213 | භරු | ,, | ,, |
| 214 | පුණ්ණනදී | ,, | 136 |
| 215 | කච්ඡප | ,, | ,, |
| 216 | මච්ඡ | ,, | ,, |
| 217 | සෙග්ගු | ,, | 137 |
| 218 | කූටවාණිජ | ,, | ,, |
| 219 | ගරහිත | ,, | ,, |
| 220 | ධම්මද්ධජ | ,, | ,, |
| 221 | කාසාව | ,, | 138 |
| 222 | චූලනන්දිය | ,, | 139 |
| 223 | පුටභත්ත | ,, | ,, |
| 224 | කුම්භීල | ,, | ,, |
| 225 | ඛන්තිවණ්ණන | ,, | 140 |
| 226 | කොසිය | ,, | ,, |
| 227 | ගූථපාණක | ,, | ,, |
| 228 | කාමනීත | ,, | ,, |
| 229 | පලාසි | ,, | 141 |
| 230 | දුතිය පලාසි | ,, | ,, |
| 231 | උපාහන | ,, | ,, |
| 232 | වීණාථූන | ජාතකය | 141 |
| 233 | විකණ්ණක | ,, | 142 |
| 234 | අසිතාභූ | ,, | ,, |
| 235 | වච්ඡනඛ | ,, | ,, |
| 236 | බක | ,, | ,, |
| 237 | සාකෙත | ,, | 143 |
| 238 | එකපද | ,, | ,, |
| 239 | හරිතමාතු | ,, | ,, |
| 240 | මහාපිඞ්ගල | ,, | ,, |
| 241 | සබ්බදාඨ | ,, | 144 |
| 242 | සුනඛ | ,, | ,, |
| 243 | ගුත්තිල | ,, | ,, |
| 244 | විගතිච්ඡ | ,, | 145 |
| 245 | මූලපරියාය | ,, | 146 |
| 246 | තෙලොවාද | ,, | ,, |
| 247 | පාදඤ්ජලී | ,, | ,, |
| 248 | කිංසුකොපම | ,, | ,, |
| 249 | සාලක | ,, | 147 |
| 250 | කපි | ,, | ,, |
| | දුකනිපාත වණ්ණනා නිට්ඨිතා. | | |
| 251 | සඞ්කප්ප | ජාතකය | 147 |
| 252 | තිලමුට්ඨි | ,, | 1 8 |
| 253 | මණිකණ්ඨ | ,, | ,, |
| 254 | කුණ්ඩකකුච්ඡිසින්ධව | | 149 |
| 255 | සුක | ,, | ,, |
| 256 | ජරූදපාන | ,, | 150 |
| 257 | ගාමණිචණ්ඩ | ,, | ,, |
| 258 | මන්ධාතු | ,, | 151 |
| 259 | තිරීටවච්ඡ | ,, | ,, |
| 260 | දූත | ,, | ,, |
| 261 | පදුම | ,, | ,, |
| 262 | මුදුපාණි | ,, | 152 |
| 263 | චූලපලොභන | ,, | ,, |
| 264 | මහාපනාද | ,, | ,, |
| 265 | ඛුරප්ප | ,, | 153 |
| 266 | වාතග්ගසින්ධව | ,, | ,, |

| | | | පිට |
|---|---|---|---|
| 267 | කක්කටක ජාතකය | | 153 |
| 268 | ආරාමදූසක | ,, | " |
| 269 | සුජාත | ,, | 154 |
| 270 | උලූක | ,, | ,, |
| 271 | උදපානදූසක | ,, | 155 |
| 272 | ව්‍යග්ඝ | ,, | ,, |
| 273 | කච්ඡප | ,, | ,, |
| 274 | ලොල | ,, | 156 |
| 275 | රුචිර | ,, | ,, |
| 276 | කුරුධම්ම | ,, | ,, |
| 277 | රොමක | ,, | 157 |
| 278 | මහිස | ,, | ,, |
| 279 | සතපත්ත | ,, | ,, |
| 280 | පූටදූසක | ,, | 158 |
| 281 | අබ්භන්තර | ,, | ,, |
| 282 | සෙය්‍යංස | ,, | 159 |
| 283 | වඩ්ඪකීසූකර | ,, | ,, |
| 284 | සිරි | ,, | 160 |
| 285 | මණිසූකර | ,, | 161 |
| 286 | සාලූක | ,, | 162 |
| 287 | ලාභගරහ | ,, | ,, |
| 288 | මච්ඡුද්දාන | ,, | 163 |
| 289 | නානාච්ඡන්ද | ,, | ,, |
| 290 | සීලවීමංස | ,, | ,, |
| 291 | භද්‍රඝට | ,, | 164 |
| 292 | සුපත්ත | ,, | ,, |
| 293 | කායවිච්ඡින්ද | ,, | ,, |
| 294 | ජම්බුඛාදක | ,, | ,, |
| 295 | අන්ත | ,, | 165 |
| 296 | සමුද්ද | ,, | ,, |
| 297 | කාමවිලාප | ,, | ,, |
| 298 | උදුම්බර | ,, | ,, |
| 299 | කොමායපුත්ත | ,, | 166 |
| 300 | වක | ,, | ,, |

**තිකනිපාත වණ්ණනා නිට්ඨිතා.**

| | | | |
|---|---|---|---|
| 301 | චුල්ලකාලිඞ්ග ජාතකය | | 167 |
| 302 | මහාඅස්සාරොහ | ,, | 168 |
| 303 | එකරාජ | ,, | ,, |
| 304 | දද්දර | ,, | ,, |
| 305 | සීලවීමංස | ,, | ,, |
| 306 | සුජාත | ,, | 169 |
| 307 | පලාස | ,, | ,, |
| 308 | ජවසකුණ | ,, | 170 |

| | | | පිට |
|---|---|---|---|
| 309 | ඡවක ජාතකය | | ,, |
| 310 | සෙය්‍ය | ,, | ,, |
| 311 | පුචිමන්ද | ,, | 171 |
| 312 | කස්සපමන්දිය | ,, | ,, |
| 313 | ඛන්තිවාදී | ,, | 172 |
| 314 | ලොහකුම්භි | ,, | ,, |
| 315 | මංස | ,, | 173 |
| 316 | සස | ,, | 174 |
| 317 | මතරොදන | ,, | ,, |
| 318 | කණවෙර | ,, | ,, |
| 319 | තිත්තිර | ,, | 175 |
| 320 | සුච්චජ | ,, | ,, |
| 321 | කුටිදූසක | ,, | 176 |
| 322 | දද්දභ | ,, | 177 |
| 323 | බ්‍රහ්මදත්ත | ,, | 178 |
| 324 | චම්මසාටක | ,, | ,, |
| 325 | ගොධ | ,, | ,, |
| 326 | කක්කාරු | ,, | 179 |
| 327 | කාකාති | ,, | ,, |
| 328 | අනනුසොචිය | ,, | 180 |
| 329 | කාළබාහු | ,, | ,, |
| 330 | සීලවීමංස | ,, | 181 |
| 331 | කොකාලික | ,, | ,, |
| 332 | රථලට්ඨික | ,, | ,, |
| 333 | ගොධ | ,, | ,, |
| 334 | රාජොවාද | ,, | 182 |
| 335 | ජම්බුක | ,, | ,, |
| 336 | බ්‍රහාඡත්ත | ,, | ,, |
| 337 | පීඨ | | 183 |
| 338 | ථුස | ,, | ,, |
| 339 | බාවෙරු | ,, | 184 |
| 340 | විසය්හ | ,, | ,, |
| 341 | කණ්ඩරී | ,, | 185 |
| 342 | වානර | ,, | ,, |
| 343 | කුන්තිනී | ,, | ,, |
| 344 | අම්බචොර | ,, | ,, |
| 345 | ගජකුම්භ | ,, | 186 |
| 346 | කෙසව | ,, | ,, |
| 347 | අයකූට | ,, | 187 |
| 348 | අරඤ්ඤ | ,, | ,, |
| 349 | සන්ධිභෙද | ,, | ,, |
| 350 | [දෙවතාපඤ්හ] | ,, | ,, |


**චතුක්ක නිපාත වණ්ණනා නිට්ඨිතා.**

| | | | පිට |
|---|---|---|---|
| 351 | මණිකුණ්ඩල | ජාතකය | 188 |
| 352 | සුජාත | ,, | ,, |
| 353 | ධොනසාඛ | ,, | ,, |
| 354 | උරග | ,, | 189 |
| 355 | ඝත | ,, | ,, |
| 356 | කාරණ්ඩිය | ,, | ,, |
| 357 | ලටුකික | ,, | 190 |
| 358 | චුල්ලධම්මපාල | ,, | ,, |
| 359 | සුවණ්ණමිග | ,, | ,, |
| 360 | සුස්සොන්දිය | ,, | 191 |
| 361 | වණ්ණාරොහ | ,, | ,, |
| 362 | සීලවීමංස | ,, | 192 |
| 363 | හිරි | ,, | ,, |
| 364 | ඛජ්ජොපනක | ,, | ,, |
| 365 | අහිගුණ්ඩික | ,, | ,, |
| 366 | ගුම්බිය | ,, | 193 |
| 367 | සාලිය | ,, | 194 |
| 368 | තචසාර | ,, | ,, |
| 369 | මිත්තවින්ද | ,, | ,, |
| 370 | පලාස | ,, | ,, |
| 371 | දීඝිතිකොසල | ,, | 195 |
| 372 | මිගපොතක | ,, | ,, |
| 373 | මූසික | ,, | ,, |
| 374 | චුල්ලධනුග්ගහ | ,, | ,, |
| 375 | කපොත | ,, | 196 |

පඤ්චක නිපාත වණ්ණනා

නිට්ඨිතා.

| | | | |
|---|---|---|---|
| 376 | ආවාරිය | ජාතකය | 196 |
| 377 | සෙතකෙතු | ,, | 197 |
| 378 | දරීමුඛ | ,, | 198 |
| 379 | නෙරු | ,, | 199 |
| 380 | ආසඞ්ක | ,, | 200 |
| 381 | මිගාලොප | ,, | ,, |
| 382 | සිරිකාලකණ්ණි | ,, | 201 |
| 383 | කුක්කුට | ,, | 202 |
| 384 | ධම්මද්ධජ | ,, | ,, |
| 385 | නන්දියමිග | ,, | ,, |
| 386 | ඛරපුත්ත | ,, | 203 |
| 387 | සූචි | ,, | 204 |
| 388 | තුණ්ඩිල | ,, | 205 |
| 389 | සුවණ්ණකක්කටක | | 209 |

| | | | පිට |
|---|---|---|---|
| 390 | මය්හක | ජාතකය | 209 |
| 391 | ධජවිහෙඨ | ,, | 210 |
| 392 | භිසපුප්ඵ | ,, | ,, |
| 393 | විඝාස | ,, | 211 |
| 394 | වට්ටක | ,, | ,, |
| 395 | කාක | ,, | ,, |

ඡක්ක නිපාත වණ්ණනා

නිට්ඨිතා.

| | | | |
|---|---|---|---|
| 396 | කුක්කු | ජාතකය | 212 |
| 397 | මනොජ | ,, | 213 |
| 398 | සුතනු | ,, | ,, |
| 399 | ගිජ්ඣ | ,, | 214 |
| 400 | දබ්භපුප්ඵ | ,, | ,, |
| 401 | දසණ්ණක | ,, | 215 |
| 402 | සත්තුභත්ත | ,, | 216 |
| 403 | අට්ඨිසෙන | ,, | 218 |
| 404 | කපි | ,, | ,, |
| 405 | බකබ්‍රහ්ම | ,, | 219 |
| 406 | ගන්ධාර | ,, | 221 |
| 407 | මහාකපි | ,, | 223 |
| 408 | කුම්භකාර | ,, | 224 |
| 409 | දළ්හධම්ම | ,, | 225 |
| 410 | සොමදත්ත | ,, | 226 |
| 411 | සුසීම | ,, | ,, |
| 412 | කොටසිම්බලි | ,, | 228 |
| 413 | ධූමකාරී | ,, | ,, |
| 414 | ජාගර | ,, | ,, |
| 415 | කුම්මාසපිණ්ඩ | ,, | 229 |
| 416 | පරන්තප | ,, | 232 |

සත්තක නිපාත වණ්ණනා

නිට්ඨිතා.

| | | | |
|---|---|---|---|
| 417 | කච්චානි | ජාතකය | 233 |
| 418 | අට්ඨසද්ද | ,, | ,, |
| 419 | සුලසා | ,, | 234 |
| 420 | සුමඞ්ගල | ,, | 235 |
| 421 | ගඞ්ගමාල | ,, | 236 |
| 422 | චෙතිය | ,, | 238 |
| 423 | ඉන්ද්‍රිය | ,, | 239 |
| 424 | ආදිත්ත | ,, | 241 |
| 425 | අට්ඨාන | ,, | 243 |
| 426 | දීපි | ,, | 244 |

අට්ඨක නිපාත වණ්ණනා

නිට්ඨිතා

# ශුද්ධි පත්‍රය

| පිට | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 1 | 10 | මඞගල ප්‍රණාමයෙන් | මඞගලප්‍රභාවයෙන් A |
| ,, | 23, 25 | කළ | කල |
| 2 | 29 | හිත එළවා දුක් හරනේ | දුක් හරනේ A |
| 4 | 6 | රාගාද්‍යුපද්‍රවයන්ද | රොගාද්‍යුපද්‍රවයන්දA |
| ,, | 8 | විසින් | විසින්; පුරා, පෙර, A |
| ,, | 23 | වෙයි | වෙති |
| 6 | 1 | නතට | නතථ |
| 9 | 9 | සබබත්ථ | සත්ථ |
| 15 | 22 | දත් | ගෙවා දත් |
| 16 | 22 | කාණ්ඩලයෙහි | කට්ටලයෙහි |
| 20 | 22 | අභිමුඛ ව; | අභිමුඛවැ ය, |
| 22 | 10 | සෑතුයෙහි | තුන් සෑතුයෙහි A |
| ,, | 16–17 | මෛත්‍රිස්ථානයෙන් | මෛත්‍රීස්ඵරණයෙන් |
| ,, | 26 | සවඤදණ | සවඤදඤදණ |
| 23 | 5 | තෙල්යත් | තෙලියත් |
| 24 | 11 | බොධි''යි | බොධි'' ජිනබොධි'යි |
| ,, | 30 | මහත් රූඇති | මහත්වූ A |
| 27 | 15 | එකක්හට | එකක්හටමෙ A |
| ,, | 22 | නිරුකති | නිරුකත |
| 29 | 16 | ආදීන් | ආදීන්ගේ |
| ,, | 21 | නොහෙළා | නොහෙළා එව් A |
| 30 | 1 | පතානුණණදෙශයෙ | පතානුණණදෙශයෙහි |
| 31 | 11 | නොවෙත් | නොවෙත් |
| 35 | 8 | එව් | එවැ |
| 36 | 10 | වාත | නහවා |
| ,, | 14 | ගස් | ගස |
| 41 | 28 | පිරිමැදි | පිරිමැසි |
| 43 | 18 | මැදට | මැනව |
| ,, | 30 | කියනු | එහි කියනු A |
| 46 | 22 | උඛ | උස්වැ |
| 46 | 35 | යාග | යාග නම් A |
| 47 | 11 | නිකඛසුවණණා | නිකඛසවණණා |
| 49 | 12 | හදනේ | බඳනේ |
| 50 | 18 | උජුභූතෙසු | උජුභූතෙසු |
| 52 | 18 | ඛානනාරං, | ඛානනාරං, කතර; |
| 58 | 5 | ගෙය; | ගෙය; ආකූල•, අලෙලාල; |
| ,, | 22 | ඇතුළුවූ නුවර | ඇතුළුවූ |
| 59 | 29 | අගසව්වන් | දෙඅගසව්වන් A |
| ,, | 31–32 | සුදුසු නොවෙයි | සුදුසු නොවන්නේ වේදැයි |

| | | | |
|---|---|---|---|
| 66 | 30 | බත් | බත් |
| 68 | 16 | පරිතතාගනතා | පරිතතාගනතා |
| 71 | 21 | පෙසනාඛවොරා | පෙසනාඛවොරා |
| ,, | 29 | ජිතකගිරිඛා | ජිතනගිරිඛා |
| 73 | 21 | ගිහිබවට; | ගිහිබවට; ආවතතිසසාමි නවත්මි; A |
| 73 | 21 | සච්නේ දත් | සච්නේ ගෙවං දත්තා |
| ,, | 22 | කලවා සා; | කලවයක් සා මහත ඇති ගෙමත් වට ඇති;A |
| 74 | 18–19 | ගෙරිමස්කත්නම් බෙරගසත්නම් උඹ | ගෙරිමස්කත්තෝත් යමෙක් බෙරගසත් නම් උයිත් |
| 76 | 25 | බස් | බසිත් |
| 77 | 28 | ජිනනතමෙ | ජිනනතමෙ |
| 80 | 12 | තොපගේ | මේ තොපගේ A |
| ,, | ,, | උන්මත් | උන්මත් කොටසක් A |
| 108 | 21 | විතෙතකාග්‍රතා | විතෙතකාග්‍රතා |
| 126 | 15 | හැකුලුණේ | හැකුළුණේ |
| 128 | 7 | කැණක් | කැනක් |
| 139 | 14 | දනව් | දනවු |
| 143 | 25 | ගොවුවෙක් | ගොව්වෙක් |
| 153 | 18 | කලවිටි | කලවිටි |
| 161 | 15 | රූපී | [3]රූපී |
| 163 | 7 | [8]පිරුළුන් | [3]පිරුළුන් |
| 164 | 9 | මහලු | මහළු |
| ,, | 21 | පරිවොකඛ | පරිවොකඛ |
| 166 | 27 | තිසලලීනෙ | පතිසලලීනෙ |
| 168 | 17 | ලභිතබා | ලභිතබා |
| 169 | 11 | වොකඛා | වොකඛා |
| 173 | 8 | ඓනුද්දෙගකං | ඓණුද්දෙගකං |
| 174 | 21 | අහි | අහී |
| 181 | 2 | ගණහනතාතං | ගණ්හනතාතං |
| 182 | 5 | [5]ගවජ්නෙත | [4]ගවජ්නෙත |
| 184 | 25 | සංගමනෙතසසව | සංයමනතසෙසව |
| 193 | 3 | [1]වුතෙතා | [2]වුතෙතා |
| 194 | 18 | තිපියමාතං | තිපිංසමාතං |
| ,, | 27 | කිවාමැ | කිවා |
| 209 | 5 | [8]ගුණෙන් | ගුණෙන් |
| ,, | 6 | පූණණමියෙහි | පුණණමියෙහි |
| 213 | 23 | එතිමිගො | එණිමිගො |
| 224 | 27 | මැණික් | මැණික් |

‘A’ ලකුණ දරන ශුද්ධ පාඨ A පොතෙහි ආධාරයෙන් ශුද්ධ කර ගත් බවත් එම ලකුණ ඇති තැම තැන්හිම අශුද්ධ පාඨ වශයෙන් සඳහන්වන්නේ අනික් පොත්වල ඒ වෙනුවට තිබෙන පාඨ බවත් සැලකිය යුතුයි.

# ජාතක අටුවා ගැටපදය

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

නත්වා වත්ථුත්තයං සග්ගාපවග්ගසුඛදායකං
ජාතකට්ඨකථාගණ්ඨිපදත්ථං වණ්ණයාමහං.

සර්ව්වාදීභකුම්භ විදලන සමස්තාශෙෂ විද්‍යාජ්ජන චක්‍ර චූඩාමණි බුද්ධඝොෂාචාර්‍ය්‍යපාදයෝ තමන් විසින් [1]ප්‍රාරබ්ධ ග්‍රන්ථයාගේ අවිඝ්නයෙන් පරිසමාප්තිය පිණිස ජාතකාර්ථසංවර්ණනාදියෙහි ඉෂ්ටදෙවතා නමස්කාර දක්වන්නාහු "ජාතිකොටිසහස්සෙහි" යනාදි කීහු. එහි

"පූජා ච පූජනීයානං එතං මඞ්ගලමුත්තමං"

යනාදි ගාථාවෙන් පූජ්‍යයනට කළ පූජා උතුම් මඟුලැයි වදළ බැවින් ආරම්භයේ කළ මඞ්ගලප්‍රණාමයෙන් උපන් පුණ්‍ය විශෙෂයෙන් ආධ්‍යාත්මිකවූද [2]බාහ්‍යවූද සියලු අන්තරාය නාක් දුරුකොට තමන් විසින් ප්‍රාරබ්ධ ග්‍රන්ථයෙහි නිෂ්ඨාව දක්නා පිණිස එසේ ඉෂ්ටදෙවතා නමස්කාර දක්වන්නාහු "ජාතිකොටි සහස්සෙහි" යනාදි පූර්වචරිතගුණ ගෙන කීහු.

**ජාතිකොටිසහස්සෙහි,** [3]ච්‍යුතිප්‍රතිසන්ධීන් [4]පිරිසුන් බව කෙළ [5]දහස්හි නොහොත් දෑකෙළ [5]දහස්හි පටන් ගෙන. "අබ්බොච්ඡින්නං කත්වා" යනු අධ්‍යාහාර කොට යොදනු. නොහොත් **ජාතිකොටිසහස්සෙහි,** දෑ කෙළදහස්නෙනුදු අපරිච්ඡින්න කාලයෙහි. "අපි" ශබ්ද ලුප්ත නිර්දිෂ්ට කොට "ජාතිකොටිසහස්සෙහිපි අපරිච්ඡින්නෙ කාලෙ" යි යොදනු. නොහොත් **ජාතිකොටිසහස්සෙහි,** ජාතිකොටිසහස්‍රයන් කාරණකොටගෙන. "ජායනං ජාති" යි භාවප්‍රධාන කොට විකාරොපචාර විසින් ගතයුතු. "ජායන්ති එත්ථාති ජාති" යි ආධාරකාරකයෙහි [6]සිද්ධ කළ අවකාශොපචාර විසින් ගතයුතු. "ජායතීති ජාති" යි කර්තෘකාරකයෙහි [6]සිද්ධ කළ මුඛ්‍ය විසින් [3]ච්‍යුතිප්‍රතිසන්ධීන් පිරිසුන් ස්කන්ධපඤ්චකය ජාති නම් වේ. මෙතැන පස්කඳම ගන්නේ. "කොටි" ශබ්ද

1 ප්‍රාරබ්ධවූ A B C. 2 බාහිරවූද A. 3 චුති C E F. 4 පිරිහුන් B. 5 සුවහස්හි-හැම.
6 සිඬ කල A B C E F.

[1]"වත්ථකොටි" යනාදි ස්ථානයෙහි සතලිසක් කියා. "කප්පකොටි" යනාදි ස්ථානයෙහි සියක් සුවහස් කියා. "පුබ්බා කොටි න පඤ්ඤායති" යනාදි ස්ථානයෙහි කෙළවර කියා. මෙතැන වනාහි සියක් ලක්ෂය කියා. "ජාතීනං කොටි ජාතිකොටි, ජාති එව වා කොටි ජාතිකොටි" යනු වේ. "ජාතිකොටීනං සහස්සානි ජාතිකොටිසහස්සානි, ජාතිකොටියො එව වා සහස්සානි ජාතිකොටිසහස්සානි, තෙහි ජාතිකොටිසහස්සෙහි." "පමාණෙන රහිතං අපෙතන්ති පමාණරහිතං". කින්තං? හිතං. **පමාණරහිතං**, ප්‍රමාණාතික්‍රාන්තවූ; **හිතං**, දානශීලාදි දසපෙරුම් විසින් එව්; දාන, ප්‍රිය වචන, අර්ථචර්‍යා, [2]සමානාත්මතා යන සතර සඞ්ග්‍රහ වස්තූන් විසින් එව්;

"අන්නං පානං [3]යානං වත්ථං මාලාගන්ධවිලෙපනං
සෙය්‍යාවසථපදීපෙය්‍යං දානවත්ථූ ඉමෙ දස"

යන දශ දානවස්තු විසින් එව්;

"දානං සීලඤ්ච භාවනා පත්ති [4]පත්තානුමොදනා
වෙය්‍යාවච්චාපචායඤ්ච දෙසනා සුති දිට්ඨිජු"

යන දශ පුණ්‍යක්‍රියා වස්තු විසින් එව්;

"වරසුතධනභරියානං අඞ්ගානං ජීවිතස්ස ච"

යන පඤ්ච මහාපරිත්‍යාගාදි විසින් එව් ඒ ඒ වැඩ. නොහොත් ජාතියෙන් පරිච්ඡින්නවූ කාලයම "ජාති" යයි ගතහොත් [5]"පමාණරහිතං" යි කාලයම ගතයුතුය. එගත් කල්හි වාක්‍යශෙෂයුක්තීන් "කාලං" යනු අධ්‍යාහාර කොට අච්චන්තසංයොගයෙහි ද්විතීයා කොට "පමාණරහිතං කාලං" යි යොදා ගතයුතු. [6]දෑ කෙළ [7]දහස් සියලු කල්හුදු නොපිරිසුණේද පිරිපුන් කල්හිය යූ තැනි. "දුක්ඛං හිංසතීති හිතං". "හිසි හිංසායාම්" යන ධාතුහු කෙරෙන් කර්තෘ කාරකයෙහි [8]කප්‍රත්‍යය කෙළේයි. නොහොත් "සුඛං දධාති විදධාතීති හිතං". [9]"ධා ධාරණෙ" යන ධාතුහට [10]හිකාරකොට "හිතං" යනුවේ. දුක් නසා සුව ධරානුයි යූසේයි. ව්‍යාධිහර ඖෂධ රොගීහට හිත නම් වන හෙයින් සුව එලවා දුක් හරනේ හිත නම් වේ. නොහොත් ලේ මස් වඩන රසයින් කයට හිත නම් වන හෙයින් සුව එලවන්නෙනුදු හිත නම් වේ මැයි. "ලොකියන්ති එත්ථ සුභාසුභං තප්ඵලඤ්චාති ලොකො". අනුමාන විසින් කුශලාකුශලකර්ම

---

1 මනොරථපූරණී 864 වැනි පිට බ. 2 සමානාත්මතාය-හැම. 3 වත්ථං යානං C E F. 4 දානානුමොදනා A C. 5 "පමාණ රහිතං කාලං" යි කාල ශබ්දය අධ්‍යාහාර කොට අච්චන්තසංයොගයෙහි විතීයාකොට "පමාණරයිතං කාලං" යි යොදා ගතයුතු" B C D E F. 6 "දෑ කෙළ.....යූ තැනී" යන මේ පාඨය Aහි පමණක් පැනේ. 7 සුවහස්. 8 කප්‍රත්‍යයඃ C E. 9 ධර C E F. 10 හකාර කොට A F.

යද ප්‍රත්‍යක්ෂ විසින් ඉෂ්ටානිෂ්ට විපාකද මේහි සිට බලානුයි සත්ව සන්තාන ලොක නම්. නොහොත් [1]“ලුජ්ජති පලුජ්ජතීති ලොකො.”[2]දුකින් ඉපැද [3]ජෙරෙන් දිරා මරණින් පිරිකෙන්න බැවින් සත්ව ලොක නම්. මෙයින් ජරාමරණාදීන් පීඩිතවූ සත්වවර්ගයා කුලුණින් දුක වැඩ වැඩූසේ දුක්වූවාහු වෙත් “තස්ස ලොකස්ස” යනු හිතයොගයෙහි චතුර්ථියි. **ලොකනාථෙන,** තිලෝ පිළිසරණවූ ප්‍රතිෂ්ඨාර්ථයෙන් නාථ නම් වෙයි. නොහොත් යාචන උපතාපන ඉස්සරිය ආසිංසන යයි කියනලද සතර නාථාඞ්ගයෙන් යුක්ත බැවින් නාථ නම. “ධම්මං වො භික්ඛවෙ දෙසිස්සාමි, තං සුණාථ සාධුකං මනසි කරොථ” යනාදි ආයාචනායෙන්ද ශික්ෂාපද ප්‍රඥප්තීන් ව්‍යතික්‍රමණකෙලශයන් තවන බැවින්ද සමස්ත ලොකය හට අග්‍රපුද්ගලව සර්වධර්මයෙහිද සියලු සත්වයන් කෙරෙහිද ඉසුරුවන [4]බැවින්ද [5]සසර වසන සව් සතුන් කිකලෙක්හි සසර දුකින් මුදන්නෙම් හොයි හිත පසස්නා බැවින් දූයි කියා “යාචනො පතාපතිස්සරියාසිංසන”යයි කියනලද සතර නාථාඞ්ගයෙන් යුක්තබැවින් හෝ “නාථ” නම්. “නාථ යාචනොපතාපිස්සරියාසිංසනෙසු” යන ධාතුයි. **මහෙසිනා,** [6]මහත්වූ ශීල සමාධි ප්‍රඥා විමුක්ති විමුක්තිඥානදර්ශනසකන්ධය යන පඤ්ච ගුණරාශීන් සොයා සිටි හෙයින් මහෙසී නම්.

**තස්ස පාදෙ,** ඔහුගේ පාදපද්මයන්; **නමස්සිත්වා,** භය [7]ලාභ [8]කුලාචරිය හෙයින් [9]කරන චතුර්විධ ප්‍රණාමයෙන් විනිර්මුක්තව හුදෙක් ආදරයෙන් වැඳ; “සම්මා පටිපන්නෙ සත්තෙ චතූසු අපායෙසු අපතමානෙ කත්වා ධාරෙතීති **ධම්මො**”, සතර මාර්ග සතර ඵල නිවන් පෙළය යන දශවිධ දහම්; **අඤ්ජලිං කත්වා,** [10]අඤ්ජලි පග්ගහ කොට-නමස්කාර කොටය යනුයි. **සබ්බ සම්මානභාජනං,** හැම සත්කාරයට භාජනවූ. “සඞ්ඝං ච පතිමානෙත්වා” යන සබඳ. **පතිමානෙත්වා,** පුදා – වැඳය යනුයි. “සීල දිට්ඨිසාමඤ්ඤෙන [11]සංහතත්තා සඞ්ඝො”, [12]තං සඞ්ඝං. **නමස්සනාදිනො,** නමස්කාරාදිවූ නොහොත් ‘නමස්සන’ ශබ්දයෙන්

1 ලුජ්ජතපලුජ්ජතාටෙඨන ලොකො C E F. 2 ‘දුකින් ඉපැද’ යන්න පටන් 7 වෙනි පෙළේ ‘යාචන උපතාපන’ යන්න දක්වා පාඨය A හි නොපැයේ. 3 ජරෙන් B C F. ජරායෙන් D. 4 ‘බැවින්ද’ යන්නට අනතුරුව “ව්‍යසනප්‍රාප්ත සත්වයාගේ ව්‍යසන දුරුකරන බැවින්ද ” යන පාඨයක් A හි දක්නා ලැබේ. 5 “සසර” යන්නෙහි පටන් 17 වැනි පෙළේ ‘නාථ නම්’ යන්න දක්වා පාඨය A හි නොපැයේ. 6 මහෙසි නාම මහතෙන B C E F. 7 ලොභ-හැම. 8 කුලාචාර A C E. කුලාචාරයෙන් D. 9 කරණ ලද C. 10 අඤ්ජලීපනොට A B C. 11 සඞ්ගතත්තා-හැම. 12 “තං සඞ්ඝං” යන්නට අනුව 4 වැනි පිටේ **“සබ්බ උපද්දවෙ”** යන්න දක්වා A හි පැනෙන පාඨය මෙසේයි:-“සබ්බ සම්මාන භාජනං” යනු විභක්ති පෙරළා ෂෂ්ඨ්‍යන්ත කොට යොදනු. නමස්සනාදි යන තැන ආදි ශබ්දයෙන් අඤ්ජලිකම්ම පතිමානන ගන්නු.”

බුද්ධරත්නයට කළ නමස්කාර ගෙන 'ආදි' ශබ්දයෙන් ධර්මයට කළ අඤ්ජලිකර්ම සඞ්ඛ්‍යාත නමස්කාරයද සඞ්ඝරත්නයට කළ ප්‍රතිමානන සඞ්ඛ්‍යාත නමස්කාරයද ගෙන නමස්සනාදීහු සම්බන්ධ වූයයි කියා හෝ අර්ථ ගතයුතු. **සබ්බ උපද්දවෙ,** [1]අධ්‍යාත්මික [2]රාගාද්‍යුපද්‍රවයන්ද බාහ්‍යවූ තීර්ථකාදි උපද්‍රවයන් ද; **හන්ත්වා,** නසා–දුරුකොටය යනුයි. **තං තං කාරණං,** [3]දන් සිල් පැන ඈ ඒ ඒ කරුණට නොහොත් ඒ ඒ අර්ථොත්පත්තියටය යුසේයි. **ජුතිමතා,** රූපශ්‍රී ඥානශ්‍රී ඇත්තහු විසින්. "යානි යෙසුචිරං" යන්නෙහි "යානි" යනු ආදි ගාථාවට යොද "අපණ්ණකාදීනි යානි පුරා ජාතකානි"යි සම්බන්ධකොට කියනු.

"අනාගතෙ සන්නිකෘෂ්ට තථාතීතෙ චිරන්තනෙ
කාලද්වයෙ'පි කවිභිඃ පුරා ශබ්දො නිපාත්‍යතෙ"යි

යු බැවින් මෙතැන 'පුරා' ශබ්ද අතීත චිරන්තනාර්ථයෙහි ලැබේ. "යෙසු" යන තැන "යෙසු ජාතකෙසු"යි යොදනු. **චිරං,** බොහෝ කලක්. "සදෙවකො ලොකො සාසති අනුසාසතීති **සත්ථා**" යනු වේ. "ශාසු අනුශිෂ්ටෞ" යන ධාතුයි. **ලොකනිස්සරණජ්ඣාසයො,** ලෙව් [4]සංසාර සයුරෙන් තරන සිත් ඇත්තේ—නිවන් පමුණුවන සිත් ඇත්තේය යි තැන්. **අනන්තෙන,** දන් ඈ එකෙකින්ම පිරිසේ නැති බැවින් අපමණවූ; **බොධිසම්භාරෙ,** සර්වඥතාඥනප්‍රතිලාභයට කාරණවූ දශ පාරමිතා [5]ධර්මයන්. මෙහි බොධිපර්‍ය්‍යාය මාර්ගඥනය සර්වඥතාඥනය නිවනය යන මේ බොධි නම. කිසෙනි යත්? "අබුධ්‍යතාත්‍රෛත්‍යධිකරණෙ බොධිර්‍වෘක්ෂඃ, ස්වයම්බුධ්‍යතෙ'නෙන චෙති කර්තෘකරණයොඃ බොධිර්මාර්ගඃ, බුද්ධ්වානීති කර්තරි බොධිර්ඥනං, අබුධ්‍යතෙති කර්මණි බොධිර්නිර්වාණම් සාක්ෂාත් කර්තව්‍යත්වාත්"යි දන්නේයි. **පරිපාචෙසි,** මිහිකිරිවීද–හැමසෙයින් බලගැන්වීද යු තැන්. "ඩු පචෂ් පාකෙ" යන ධාතුයි. **තානි සබ්බානි,** ඒ සියලු ජාතකයන්; **එකජ්ඣං,** එක් තැන්හි නොහොත් එක් කොට; **සඞ්ගහං,** සඞ්ග්‍රහ බවට. "පෘථග්විස්තීර්ණානාම් එකත්‍රොපසංහාරඃ සඞ්ග්‍රහඃ" යනු වේ. **සඞ්ගීතං,** එකක·නිපාතාදි විසින් [6]සඞ්ගායනා කරන ලදද නොහොත් රැස්කොට කියනලදද. **එතස්ස බුද්ධවංසස්ස,** මේ බුද්ධවංශයාගේ–මේ අපණ්ණකාදි වූ සියලු [7]ජාතකයන්ගේය යනුයි. [8]සර්වඥයන්ගේ ජාතිපරම්පරායෙන් ආ අපණ්ණකාදි වූ ජාතකයෝද බුද්ධවංශ නම් වෙත්නුයි මෙතැන අපණ්ණකාදිවූ

1 අදඇතිවූ A D. 2 රාගාදීන්ද A. 3 දන් සිල් ආදි ඒ ඒ කාරණයට A. 4 සංසාර සොරුන්ගෙන් තොරණ B E. සංසාර සාරුනෙන් තොරණ C සංසාර සොරුන්ගෙන් තොරණ F. 5 'ධර්මයන්' යන්නට ඉක්බිති "බොධිසම්භාර නම් දස පැරුම්" යන පාඨය Aහි පැනේ. 6 සඞ්ග්‍රහ කරන ලදද A. 7 සත්වයාගේද C E F. 8 සර්වඥයාගේ C.

ජාතක බුද්ධවංශ නම් වේ. එහෙයින් කීහු "බුද්ධවංසස්ස" යි. **අත්ථදස්සිනා,** [1]වැඩ දක්නහු විසින් නොහොත් නෙයාර්ථ නීතාර්ථාදි අර්ථ දක්නහු විසින්. නෙයාර්ථ නම් ඥානයෙන් හැඟෙන අර්ථය, නීතාර්ථ නම් ශබ්දයෙන් හැඟෙන අර්ථයි. නොහොත් එනම් වූ. **අසංසට්ඨ විහාරෙන,** [2]දහර මහණ ආදීන් හා අමිශ්‍රවූ විහාර ඇති–කායවිවෙක ඇත්තාවූය යනුයි. "සද්ධ අසංසට්ඨවිහාරෙන" යුතැන්. **සද්ධිවිහාරිනා,** සද්ධිවිහාරිකවූ -නොහොත් "සද්ධ" යනු "සද්ධිවිහාරිනා" යනු හා යොද "**සද්ධ සද්ධිවිහාරිනා**" යි ගන්නේයි — හැම [3]කාලම එක්ව වසන්නාවූය · යනු අර්ථයි. **මහිංසාසක වංසම්හි,** මහිංසාසක නම් රජහුගේ වංශයෙහි නොහොත් මහිංසාසක නම් පරපුරෙහි; **සම්භූතෙන,** වූ; **නයඤ්ඤුනා,** එකත්ත නය, නානත්ත නය, අබ්‍යාපාර නය, එවං ධම්මතා නය යන චතුර්විධ නය දන්නා වූ. "ගුණෙහි අත්තානං පූරෙන්තීති පුරිසා, මහන්තා ච තෙ පුරිසා චෙ'ති මහා පුරිසා, මහාපුරිසානං චරියා මහාපුරිසචරියා." කො තෙ? දානසීලාදයො. "තෙසං මහාපුරිසචරියානං" යුසේයි. **විජ්ජොතයන්තස්ස,** පහළ කරන්නාවූ; [4]**ජාතකස්ස,** ජාතකයාගේ. "ජාතත්තා ජාතකං, ජාතිත්තා වා ජාතකං". 'ජාතත්තා ජාතකං' යනු පෙර වූ ඒ ඒ ජාතියෙහි චරිතයි. 'ජාතිත්තා ජාතකං' ඒ ඒ ජාතියෙහි කළ සුචරිත බුද්ධභාවය ඉපැදවූ හෙයින් ජාතක නම්. **අත්ථස්ස වණ්ණනං,** අර්ථ ව්‍යාඛ්‍යානයයි. "වණ්ණීයතෙ'නෙනාත්ථො ඉති [5]වණ්ණනම්" යනු වේ. "මහාවිහාරවාසීනං වාචනාමග්ගනිස්සිතං" යනු ධර්මරුචි සාගල නම් වූ බගිරි දෙනා වැස්සන්ගේ ඇජරොල් වෙන් කළ බැවින් කීහු. **වාචනාමග්ගනිස්සිතං,** පෙළ මඟ ඇසිරැ කළා වූ— පාලිබසින් මෙ යුතුවූය යුසේයි. "වණ්ණනං" යි සබඳ. නොහොත් **වාචනාමග්ගනිස්සිතං,** පාලිමාර්ගීය ආශ්‍රය කොට. **භාසිස්සං,** කියම්—පෙළෙහි පැවැති [6]සද ඇර අර්ථය හොබවම් යු · තැන්. **සාධවො,** සුජනයෝ; **සාධු ගණ්හන්තු,** එකඟ සිතින් කස් බජනෙහි සිංහතෙල් මෙන් නොනස්නාකොට ගනිත්වා.

**සමුදාගමතො පට්ඨාය,** ආදියෙහි පටන්; **යස්මා,** යම් කරුණෙකින් මොනවට දතයුතු වේද ඒ කරුණෙන්; **පරිච්ඡෙදෙ,** අවධිය — මෙතැන සිට මෙතැනට දූරෙ නිදානය යනාදීන් නිදානයන්ගේ හිම නියමය යනුයි. **බොධිමණ්ඩෙ,** බෝමැඩෙහි—උතුම් බෝපලක්හිය යු තැන්. **තෙසු තෙසු ඨානෙසු,**

1 "වැඩ දක්නාහු විසින් නොහොත්" යන්න A හි පමණක් දක්නා ලැබේ. 2 දහරාදීන් හා A. 3 'කාලම' යන්නට ඉක්බිති 'මෙහෙකරු' යන පාඨය හැම පොත් හිම පැනේ. 4 'ජාතකස්ස' යනු පටන් 20 වෙනි පෙළේ 'ජාතක නම්' යන්න දක්වා පාඨය A හි පමණක් පැනේ. 5 වණ්ණනා-හැම. 6 සද හැර B C D. සම්ද හැර F.

(සැමැත් රජගහා ඈ) ඒ ඒ තැන්හි. **තත්ථ,** ඒ තුන් තිදන්හි; **ඉදං,** මේ මත්තෙහි කියන්නේ; **කප්පසතසහස්සාධිකානං,** කප් සුවහස් ඉතිරි කොට ඇති. "කප්පීයති සාසපපබ්බතාදීහි උපමාහි කෙවලං සංකප්පීයති න මනුස්සදෙව සංවච්ඡරාදිගණනාය ගණීයතීති කප්පො" යි කී කපින්. **චතුන්නං අසඞ්ඛෙය්‍යානං මත්ථකෙ,** සතර අසඞ්ඛ්‍යයකින් මත්තෙහි — ඔබ්බෙහි යනුයි. අසඞ්ඛ්‍ය නම්:—

"එකං දස සතඤ්චෙව සහස්සං දසසහස්සකං
[1]සතසහස්සං දසසතසහස්සං කොටි අට්ඨමී
එවමෙව පකොටී ච තථා කොටිප්පකොටි ච
නහුතා ච නින්නහුතා අබ්බුදා ච නිරබ්බුදා
අබබා අටටා චෙව අහහා කුමුදානි ච
සොගන්ධිකං උප්පලඤ්ච පුණ්ඩරීකඤ්ච පදුමකං
කථානං මහාකථානඤ්ච සඞ්ඛපා ගණනා තහිං
තතො උපරිමා භූමි අසඞ්ඛෙය්‍යාති වුච්චති"

චරියාපිටකයෙහි අසඞ්ඛෙය්‍ය නම් ස්ථානාන්තරයෙක. එහෙයින් "සඞ්ඛාතුං න සක්කාති අසඞ්ඛෙය්‍යං" යනු හා නොයෙදෙයි. අසඞ්ඛෙය්‍යයයි භූම්‍යන්තරයක් වීනම් [2]එයට මේ අසඞ්ඛ්‍යත්ව විරුද්ධ නොවෙ යී නිරාකරණ කොළේ. අසඞ්ඛ්‍යභාවය ගෙන අසඞ්ඛ්‍යත්වය වීනම් චතුර්විධත්වය කෙසේදැයි කියත්. සතර තැනෙක්හි අසඞ්ඛ්‍යත්වය පසස්නාලද බැවිනැයි ඒ දක්වන්නාහු:—

"දීපඞ්කරස්ස භගවතො කොණ්ඩඤ්ඤස්ස ච සත්ථුනො
එතෙසං අන්තරා කප්පා ගණනාතො අසඞ්ඛියා.
කොණ්ඩඤ්ඤස්ස අපරෙන මඞ්ගලො නාම නායකො
තෙසම්පි අන්තරා කප්පා ගණනාතො අසඞ්ඛියා.
සොභිතස්ස අපරෙන අනොමදස්සී මහායසො
තෙසම්පි අන්තරා කප්පා ගණනාතො අසඞ්ඛියා.
නාරදස්ස භගවතො පදුමුත්තර සත්ථුනො
තෙසම්පි අන්තරා කප්පා ගණනාතො අසඞ්ඛියා."

මෙසේ ගණනාතීතයෙන් අසඞ්ඛ්‍යත්වයක් ඇතද සතර ස්ථානයෙක්හි මහාකල්පයන්ගේ ගණනාතීත ක්‍රමයෙන් [3]චතුර්විධත්වය ඉෂ්ටයයි කීහ.

1 එකං සතසහස්සං-හැම. 2 එට A C F. ඒට B. 3 චතුර්විධාත්වය-හැම

**සංසුද්ධගහණිකො**, පරිශුද්ධ වූ මාතෘගර්භාවකාශ ඇත්තේයි. මාතෘකුක්ෂියෙහි මූත්‍රපුරීෂාදීන් අපවිත්‍ර ස්ථානයෙහි ප්‍රතිසන්ධිග්‍රහණය කළ සත්වතෙම රූපවර්ණාදීන් සම්පන්න නොවන්නේය. පරිශුද්ධ ස්ථානයෙහි ප්‍රතිසන්ධිග්‍රහණය කළ සත්වතෙම රූපවර්ණාදීන් සම්පන්න වන්නේය. එහෙයින් මෙතෙම මාතෘකුක්ෂියෙහි පවිත්‍ර ස්ථානයෙහි ප්‍රතිසන්ධිග්‍රහණය කෙළේනුයි "සංසුද්ධගහණික" නම් වේ. නොහොත් හීන ජාතීන් සංසර්ගයක් නැතිව යමෙක් [1]පවිත්‍රව සිටියේ ද එසේ වූ බ්‍රාහ්මණයාගේ මවු වූ බ්‍රාහ්මණිය හා සංසර්ගය හෙතුකොටගෙන මාතෘකුක්ෂියෙහි ප්‍රතිසන්ධිග්‍රහණය කෙළේනුයි සංශුද්ධවූ ප්‍රතිසන්ධිග්‍රහණය ඇත්තේය. එහෙයින් හෝ "සංසුද්ධගහණික" නම් වේ. **ජාතිවාදෙන**, ජාතිවාදයෙන් – කුල පිළිබඳ තෙපුලෙන් යනුයි. **අක්ඛිත්තො**, කුල ගණන තන්හි මෙසේවූ හීන කුල ඇත්තේය. ඇයි කුමට ගණවූ දූයි කියා මෙසේ [2]නොදූමිය හැකි වූයේ-නොහැරිය හැකි වූයේ; **අනුපක්කුට්ඨො**, අනින්දිතවූයේ වී; **අභිරූපො**, මිනිස්වෙස් ඉකුත් වෙසෙස් රූ ඇත්තේ; **දස්සනීයො**, අතෘප්තිකර දසුන් ඇති බැවින් දක්නට හැකිවූයේ; **පාසාදිකො**, දුටු දුටුවනට ප්‍රසාද ජනන බැවින් පහද උපයන්නේයි; **වණ්ණපොක්ඛරතාය**, වර්ණසම්පත්තීන්; නොහොත් ඡවිසම්පත්තීන් හා සංස්ථාන සම්පත්තියෙන්; **බ්‍රාහ්මණසිප්පමෙව**, බමුණන් හික්මියයුතු ශිල්පම. "[3]ෂඩ්ධර්මා බ්‍රාහ්මණස්‍ය—දාන ප්‍රතිග්‍රහණ යජන [4]යාජන අධ්‍යයන අධ්‍යාපන ඉති"යි කියූ ෂඩ්ධර්මයෝ එව්; ත්‍රිවෙද එව්. **රාසිවඩ්ඪකො අමච්චො**, අය වියදම්කොට වස්තු රක්‍ෂාකරන්නාවූ භාණ්ඩාගාරික ඇමැති; **ආයපොත්ථකං**, ද්‍රව්‍ය ඈ කැකැස් පත් හෙවත් ලේකම්. [5]**අය්‍යකපය්‍යකාදීනං**, මුතුන් මීමුතුන් ඈ. **යාව සත්තමා කුලපරිවට්ටා**, සත්වන කුලපරම්පරාව දක්වා; **පටිපජ්ජාහිති**, අනුභවකර යි; **සංහරිත්වා**, රැස්කොට; **එකං කහාපණමපි**, එක කහවණුවකුත්; [6]**ගමනාකාරණං**, ගමනක්‍රියාව; **ගාථාබන්ධදීපකානි වචනානි සද්ධිං**, ගාථා බන්ධන භගවන්නා වූ වාක්‍ය හා සමඟ. ගාථාවෝ තුමූම ගාථාබන්ධනක්‍රම භගවත්නුයි ගාථාබන්ධනදීපක වචනයෝ නම් ගාථාවෝමැයි. "**අමරවතීති ච**"යි දිව්‍යයන් හා සම මනුෂ්‍යයන් ඇති හෙයින් කීයේයි; නොහොත් "**අමර**" යනු මසුන් නම; "**වතී**" යයි පවුරෙහි නම; අමර නම් වූ චණ්ඩ මත්ස්‍යයන් විසින් ගැවසීගත් පරිඛායෙන් හා

---

1 පිත්‍රැව A. 2 නොදූරිය හැකිවූයේ B C. 3 මනුසම්මානි I. 88 බ. 4 යාජෙ-හැම. 5 අය්‍යකපය්‍යකානං-මූ. අ. කා. 6 ගමනකාරණං-මූ. අ. කා.

තිස් රියන් උස පවුරෙහි පිරිබෙව් ලද හෙයින් හෝ "අමරවතී" යයි කීයේසි. නොහොත් **අමරවතීතිච**, බුද්ධවංසපාළියෙහි "නගරෙ අමරවතියා" යී කී බැවින් "අමරවතී" යි කියාද; **අමරන්තිච**, "අමරං නාම නගරං"යී කී බැවින් "අමර"යයි කියාද; [1]**ලද්ධනාමං**, ලද නම් ඇති.

**කප්පෙ ච-පෙ-අසඞ්ඛියෙ**, කප්පානං සතසහස්සාධිකානං චතුන්නං අසඞ්ඛෙය්‍යානං මත්ථකෙ—කප්ලක්‍ෂයක් අධිකකොට ඇති සාරාසඞ්ඛ්‍ය කපකින් මත්තෙහි; **දස්සනෙය්‍යං**, අතුරු වේ [2]සියුකු පවුරු දොරටු ගටලු අවුණු තොරණ ඇයින් දක්නාහට [3]හැකි වූ; **මනොරමං**, දුටු ඇසුවන් සිත් ඇලවනු වූ; **අන්න**, ඛජ්ජභොජ්ජාදි වූ ආහාරයෙන් ද; **පාන**, (සුරා ආදිවූ) පානවර්ගයෙන්ද. පිටඤ්සුරා ඇ රහද පුප්ඵාසව ඇ මෙරයද මනා දියද පියයුතු බැවින් පානයයි කීයේසි. **රථසද්දෙන**, රියෙහි නිම් හඬින්; **භෙරිසද්දෙන**, එක්තල ඇ [4]නැටුම් බෙරහඬින්; **මුතිඞ්ගසද්දෙන**, මිහිඟු බෙරහඬින්; [5]**සම්මසද්දෙන**, [6]මනුෂ්‍යපට හඬින්; **තාලසද්දෙන**, කුළුතාළම් හඬින්. "**අස්නාථ**"යි ආලොපකොට කන දූ අපෙක්‍ෂායෙන් කීහු. "**ඛාදථ**"යි කඩ කඩා කන දූ අපෙක්‍ෂායෙන් කීහු. "අස්නාථ පිවථ ඛාදථ"යි තුන එක්කොට ගෙන "දසමෙන සද්දෙන'යි කීහු. **භෙරිසඞ්ඛරථානි ච**, යනු 'භෙරිසඞ්ඛ රථානං සද්දං'යි තැන්. **සබ්බඞ්ගසම්පන්නං**, පවුරු පිරි ඇ හැම නුවර පිරිවරින් යුතු වූ; **සබ්බකාම**, රූපශබ්දාදි පස්කම් ගුණෙන්; **සත්තරතන**, රන් රිදී මුතු මැණික් ශඞ්ඛ ශිලා ප්‍රවාලයයන සත්රුවනින්; **නානාජනසමාකුලං**, නන්ජෑ නන් ගොත් නන් සිප් නන් වෙස් නන් බස් මහාජන විසින් හවුල් වූ—නිරතුරුවූය යනුයි. **දෙවනගරංව**, දෙව්නුවරක් මෙන්; දෙවතාවන්ගේ ආලකමන්‍ද නම් රාජධානිය මෙන් ය යනුයි. **සමිද්ධං**, මනුෂ්‍ය පරිභොගයට එළඹියයුතු සර්වෝපකරණයෙන් යුතු බැවින් සමෘද්ධ වූ; "පුඤ්ඤකම්මිනං දෙවානං ආවාසං දෙවනගරං විය සමිද්ධං"යී යොදනු මෙ. "පුඤ්ඤකම්මිනං [7]නරානං ආවාසං දෙවනගරං විය සමිද්ධං"යී හෝ යොජනු මෙ. "**අනෙකකොටිසන්නිචයො**" යනු නිධානකොට තබන ලද නොඑක් කෙළගණන් වස්තුරාශි ගෙන කීහු. **පහූතධනධඤ්ඤවා**, බොහෝ වූ මුක්තාමාණික්‍යාදි වූ ධන හා ශාලිව්‍රීහ්‍යාදි චතුර්විධ ධාන්‍ය ඇති. මෙයින් අනිධානගත වස්තු කීහු. **අජ්ඣායකො**, හදාරන්නා වූ—ශාස්ත්‍ර පිරිවත්නාවූය යූ තැන්. **මන්තධරො**, මන්ත්‍රධර වූ-අථර්වන

1 ලද්ධනාමෙන-හැම. 2 සියුතු B C D E F. 3 කී හැකිවූ A. 4 නටුම් A 5 සඞ්ඛසද්දෙන-මූ. අ. ක. 6 මනුස්සපට AB. 7 නගරානං D.

මෙද දන්නාවූය යූ තැන්. **තිණ්ණං වෙදානං පාරගූ,** ඍග්වෙදය යජුර්වේදය සාමවෙදය යන මේ තුන්වෙදයෙහි පරතෙර ගියා වූ; **ලක්ඛණෙ,** [1]සැටපන්දහසක් ඇති ලක්‍ෂණ ශාස්ත්‍රයෙහි; නොහොත් දෙලොස් දහසක් ඇති මහා පුරුෂ ලක්‍ෂණ ශාස්ත්‍රයෙහි. "ඡඬාදස [2]සහස්සගන්ථප්පමාණං ලක්ඛණසත්ථං" යෙත් මෙ. නැවත "සොළස සහස්ස[3]ගාථාපදපරිමාණො බුද්ධමන්තො" යෙත් මෙ. **ඉතිහාසෙච,** "ඉතිහ ආස ඉති"–"ඉතිහ ආස"යන මේ පද හා යුත් ශාස්ත්‍රයෙහිද; නැටුම් ශාස්ත්‍රයෙහි එව්; පුරාණ ග්‍රන්ථයෙහි එව්; **සධම්මෙ,** [4]සවකීය බ්‍රාහමණ කුලධම්යෙහි; **සබ්බත්ථ** යෙත් මෙ-හස්ති අශ්ව රථථරු ධනුශ්ශිල්ප චන්‍ද්‍රසූර්‍ය්‍යනක්‍ෂත්‍ර චරිත[5]උල්කාපාත ස්වප්න ලක්‍ෂණ ලෙඛ මුද්‍රා ගණිත ඈ සියල් දිසාපාමොක් සිප්හිය යුතැන්. [6]**මහාඋපරිතලෙ,** උතුම් උස් බුමුයෙහි; උතුම් පාහි උස්බුමුයෙහි එව්; **රහොගතො,**[7]තොරඹුරට[8]ගියේ–විවෙකගත[9]වූයේය යනුයි. **පල්ලඞ්කං,** තුන්සන්ධියක් ඇති [10]ඔසරබජු අසුන්–ඝසරම්ණි; **ආභුජිත්වා,** අවුළුවා—බැඳය යනුයි. **සරීරභෙදනං,** සිරුරුබිඳුම් යන මරණ; **අජරං,** ජරා නැති බැවින් අජර නම් වූ; **සීතලං,** කෙලෙස් පරිළාහ නැති බැවින් සිහිල්වූ; **අමතං,** [11]මරණ නැති බැවින් අමා වූ; **එකෙනමග්ගෙන,** එක් මහෙකින්; නොහොත් **එකෙනමග්ගෙන,** උතුම් මහෙකින්; **භවිතබ්බන්ති,** විය යුතුයයි–එක් මහක් ඇත මැනවැයි යූ තැන්; **පූතිකායං,** පූතිශරීරය. තදහුජාත [12]කැණහිල්හුදු "ජරසිගාල" ය යන නම ලබන හෙයින් [13]තදහුජාත වූ කිඳිවැල් "පූතිලතා"ය යනු ලබන හෙයින් රන්වන් සිරුරු හොතුදු පූතිකාය යයි කියනු ලැබේ. **අනපෙක්ඛො,** ඇලුම් නැත්තෙම්; [14]**අනත්ථිකො,** නොකැමැත් තෙයිම්; නොහොත් කාර්‍ය්‍ය නැත්තෙයිම්; **භෙහිති,** 'භවිස්සති'යි තැන්; **න හෙතුයෙ,** නභවිතුං–නොවන්නට; **න සක්කා,** නොපිළිවන–වුව මැනැවි. "අත්ථි" කියා ප්‍රත්‍යක්‍ෂකොට හඟනා බැව්දක්වන්නාහු කිහු. අනුමන් බැව් හඟවන්නාහු "භෙහිති"යී යූහු. අනුමන් නම් අප්‍රත්‍යක්‍ෂවන බැවින්[15]නොසනිටුහන් ව හඟනා බවයි. "න හෙතුයෙ න සක්කා" යනු දුක් පෙනෙන බැවින් එයට පිළිවක් වැ නිවන්නෙක් අවසිටියයි හඟවන්නාහු කිහු. **අනවජ්ජධම්මා,** කුසල්ධම්; **සබ්බජාතික්ඛයන්තො,** සියලු ජාති ගෙවන හෙයින්–සියලු ජාතීන්ගේ ක්‍ෂය භාවය කරන හෙයින යනුයි. **භවෙ,** සංසාරප්‍රවෘත්තිය; **විභවොපි,** සංසාරප්‍රවෘත්තියගේ නිවෘ

1 සැට පද දහසක් E F. 2 සහස්සගන්ථප්පමාණං-හැම. 3 ගාථාපරිමාණො E. 4 සවකීය කුලධර්‍මයෙහි C. 5 උත්පාත A. 6 උපරිපාසාදවරතලෙ-මු. අ. සා. 7 තොරම්බොරට B D E. තොරම්බුරට C F. 8 ගියෙම් B C D E F. 9 වූයෙම්-හැම. 10 ඔරබජු C E F. 11 මර නැති බැවින් C. 12 කැණසිල්හිදු E. 13 තදහුජාතදවූ A. 14 අනපෙක්ඛො-හැම. 15 නොසනිටුහන් හඟවන බවයි E.

තනියයි කියනලද නිර්වාණයද. **ඉච්ඡිතබ්බකො** යනු සවාසීගෙහි කප්‍රත්‍යයයි; **තිවිධග්ගි**, රා දෙස් මොහ තුන් ගිනි; **පඤ්චවණ්ණපදුමසඤ්ඡන්නං**, පදුම, පුණ්ඩරීක, රාජීව, ශතපත්‍ර, කුවලය යන පස් පියුමෙන් ගැවසී ගත්. වණ්ණශබ්දය ජාතියෙහිදු වැටෙන බැවින් නෙළුම්, උපුල්, කුමුදු, මහනෙල්, ඇඹුලු කිව දෙස් තැන්. **සිවෙ මග්ගෙ**, සෙත්මග; **බ්‍යාධිතිකිච්ඡකො**, රොග පිළිදගිනා. **කිලෙසවිනාසකස්ස**, කෙලෙස් නසන්නාහු-අභාවයට ගෙන යන්නාහුය සී තැන්. "[1]ගුහනති තං, ගුය්හතෙ වා ගූථං" යනු වේ. **න ගවෙසති තං තළාකං**, ඒ තළාකය නොසොයාද-ඒ තළාකයට යන මාර්ගය නොසොයාද යනුයි. තළාක යයි විල් කියත්. **අරීහි**, සතුරන් විසින්; **පරිරුද්ධො**, පිහිකොට ගන්නාලද්දේ-වටකොට සිසාරා ගන්නා ලද්දේය යනුයි; **අඤ්ජසස්ස**, මාගියට; **සිවමඤ්ජසෙ**, සිවස්ස අඤ්ජසස්ස-නිර්වාණ මාර්ගයාගේ; **පතිපීළිතො**, දුකින් පෙළෙන්නේ; **මණ්ඩනජාතිකො**, සැදුම් සොඬ. "මණ්ඩ[illegible]සායං" යන ධාතුයි. **ආසත්තං**, බඳනාලද; **උච්චාරභූමි[illegible]**[2]පිරිපිටුහු-මූත්‍රපුරීෂකවචර විසර්ගස්ථානයෙහිය යනුයි; **උච්ඡ[illegible]**, [4]හිණින් එව්; **නාවිකා**, [3]වෙණඳහු; **කරජකායො**, [illegible] කවා පොවා වැඩූහෙයින් හෝ නොහොත් කර නම්වූ [illegible]ශ්‍රොණිත දෙකින් සඤ්ජාත හෙයින් කරජ නම්වූ මේ ශරීරය; **සෙරී**, තමා කැමැති නියායෙන් පවත්නේ; **සයංවසී**, තමා වශගවූයේ; **ජජ්ජරං**, [5]දූදුරුව ගිය-හෙවත් මහලුවූ; **පලුග්ගං**, [6]බැනි පිපිර ගියාවූ-නොහොත් සිදීබිදී ගිය; [7]**උදගාහිනිං**, දිය වදනාවූ-හෙවත් දිය උතන්නාවූ; **නෙක්ඛම්මුපසංහිතං**, නිවන් හා එක්වූ-නිවන් පිළිබැඳිවූය යී තැන්; [8]පබ්බජ්ජාවද කියත් මෙ. **අපරිමිතං**, පිරිසේ නැති; **භොගක්ඛන්ධං**, ද්‍රව්‍ය රැස්. "**කපණද්ධිකාදීනං**" යන්නෙහි ආදි ශබ්දයෙන් වණිබ්බක යාචකයන් ගත්තාහු. එහි කපණයෝ නම් දුගී දිළිඳු මිනිස්සුයි. අද්ධිකයෝ නම් මගීහුයි. වණිබ්බකයෝ නම් දුන්නෙහි ඉෂ්ටකාන්තමනාපාදී විසින් අනුසස් කියා යාචඤකරන්නාහුයි. යාචකයෝ නම් යාචඤමතු කරන්නාහුයි. **කිලෙසකාමෙ** ච යනු වත්කාම් විකුම් ඈ පියු සෙයින් එමෙ අරමුණුකොට පවත්නා [9]සඳරා ඈ කෙලෙස්කමුදු පියන බැවින් එව් නොහොත් කිලෙස්හි විරකතාව තිකුත් බැවින් තදඞ්ග විසින් පී බැවින් එව් කියත්. **පඤ්චහි නීවරණදොසෙහි**, [10]කාමච්ඡන්ද, ව්‍යාපාද, ථිනමිද්ධ, උද්ධච්චකුක්කුච්ච, විචිකිච්ඡා යන පස් නීවරණයන් කෙරෙන්; **අට්ඨහි කාරණගුණෙහි**, අභිඥාවට කාරණවූ "එවං සමාහිතෙ චිත්තෙ පරිසු

---

1 ගුය්හතනි C. 2 පිරිපිටුහු A C E F. 3 වෙදහානු E F. 4 අතින් අපින් B C E F. 5 දෙදරුව B E. දෙදූරුව C D F. 6 බැනි C. 7 උදකගාහිනිං A E. 8 පබ්බජ්ජාවද C I E. 9 සඳරා B D. සදරා E F. 10 කාමච්ඡන්දව්‍යාපාද ථිනමිද්ධ උද්ධච්ච කුක්කුච්ච-හැම.

ද්ධෙ පරියොදතෙ අනඞ්ගණෙ විගතොපක්කිලෙසෙ මුදුභූතෙ කම්මණියෙ ආනෙඤ්ජප්පත්තෙ”යන අට ගුණෙන්; **ධඤ්ඤවිභාතිං**, [1]ධාන්‍යයෙන් කළාවූ - ධාන්‍යමුවා වූය යූ තැන්. **පවත්තඵලභොජනො** යන මෙයින් බ්‍රහ්මචාරි ගෘහස්ථ ශාසන ප්‍රව්‍රජිත වානප්‍රස්ථ පරිබ්‍රාජක සතර තවුසන් අතුරෙන් වානප්‍රස්ථ බව කීවෙත්; **අට්ඨන්නං සමාපත්තීනං**, රූපාරූප අට සමවතුන්; **පඤ්චන්නඤ්ච අභිඤ්ඤාණං**, දිවසක් දිවසෝ පුබ්බෙනිවස් ඉද්ධිවිධ චෙතොපරියඤ්ඤාණය යන පස් අභිඥවන්; **නාථානාථානං**, සපිළිසරණ අපිළිසරණුන්ට; නොහොත් පොහොසතුන් නොගන්නා බැවින් “ අනාථ අනාථානං ” යී තැන් එව්; නොහොත් **නාථො**, මහාජනහට පිළිසරණ වූයෙම්; **අනාථානං**, අපිළිසරණුන්ටය යී තැන් එව්; **අවිදූරෙ**, ඉතා [2]නුදුරු-හමුයෙහිය යූ තැන්; **ධම්මකො නාම පබ්බතො**, හැම බෝසතුන් තවුස් පැවිදිව එපව් බම් වටන බැවින් ධම්මක නම්වූ [3]පබ්බතයෙක් විය. දිය රුක් පල සපන් සම සුදුවැලි තෙලෙන් [4]චොරජනා කිම්පියෙස් ඇති ඒ ධම්පව් වන [5]ගෙලෙහි; **අස්සමො**, “ආසයස්ස අසමස්ස සමකරණතො, විසමානං වා කායවචීමනොකම්මානං සමකරණතො, කසිකම්මාදිපරිස්සමරහිතත්තා වා, අස්සිතානං සුඛදායකත්තා වා අස්සමො”යී කියූ අසපුයෙක්. **තත්ථ**, ඒ ධම්පව් වන ගෙලෙහි කළ අසපුයෙහි. “**චඞ්කමං තත්ථ මාපෙසිං**” යනාදි ගාථාවෙහි “**අට්ඨගුණසමූපෙතං**” යන්නට “අස්සමං මාපෙසිං” යන්නක් අධ්‍යාහාර කරනු. **මාපිතං**, වපුළ; **රොපිතං**, පැළ හිඳුවූ; **පවත්තඵලං**, පිළිකුන් [6]තුවටුයෙන් සැව ගිලිහී කිම හුණු ස්වයම්පතිත ඵල. **පධානං**, වීර්‍ය්‍ය; **පදහිං**, අනිත්‍ය දුඃඛ අනාත්ම ගෙසින් නිරතුරෙන් [7]හැවීම් වශයෙන් කොළෙම්; **අබ්භන්තරම්හි සත්තාහෙ**, “සත්තාහස්ස අබ්භන්තරෙ යෙව”යී තැන්; **අභිඤ්ඤාබලං**,

“ඉද්ධිවිධං දිබ්බසොතං පරචිත්තවිජානනං
පුබ්බෙනිවාසානුස්සති දිබ්බචක්ඛූති පඤ්චධා.”යි

කියනලද අභිඥඥාවට; **අජ්ඣොගාහෙත්වා**, වැද; [8]**ඵද්ධවිසමතා**, ගකුරු පහණ කිහිලිව කොරොස් බැව් හා වළගොඩව විසම බැවිය; **ගහණච්ඡන්නතා**, දෙපසින් සක්මනට බලා අරා සිටි ලැහැඹින් වැලින් පිළිසන් බැවිය. **අතිසම්බාධතා**, දිගින් පුළුලින් හක බැව්; නොහොත් ඉතා ලුහුඹු බැව්; **අතිවිසාලතා**, දිගින් පුළු

1 ධාන්‍යයෙහි-හැම. 2 නොදුරු C. 3 පබ්බතයෙක් A D. 4 ඔරජනා A C E F. 5 සෙලෙහි B F. සලෙහි E. 6 තුවටියෙන් A. 7 ගැමින් B. හැවීම් E. 8 ඵන්ධවිමතා A E. පිඨවිඝමතා C.

ලින් මහත් බැවි; නොහොත් ඉතා පළල් බැවි; **රුජන්ති**, රෙදෙති; **ඵොටා**, පොළහු; නොහොත් [1]බිබුළුහු; **විජ්ජන්ති**, නසී; **පටිහඤ්ඤන්ති**, ගැසේ; **අඩ්ඪරතනිකො වා**, රියන් භාගයක් පමණ ඇත්තාවූ හෝ; **පරිච්ඡෙදෙ**, හිම් පිණිස එබූ ගල්කොඳු ආදියෙහි; **දියඩ්ඪරතනං**, යෙළ රියන් පළල; **දීපප්පසාදකා**, ලක්දිව් පැහැදවූ; **අනවජ්ජ [2]පිණ්ඩපරියෙසනභාවො**, කුහනා ඈ නොමුසු නිවරද පිඬු පිරියස්නා බැවි; **නිබ්බුත [2]පිණ්ඩභුඤ්ජනභාවො**, පස්වීකු පිඬු වළඳනා බැවි; පරහිංසා පරපීඩා නොකොට දැහැමෙන් සෙමෙන් සොයා ලත් ආහාරය අනුභවකරන බැවි එවි; **ඝනසාරං වා**, රන් රිදී ඈ ද්‍රව්‍ය එවි; **සීසකහාපණාදීනි වා**, හිස් කහවණු ඈ එවි–[3]හිසකට මස්සක් දුනමැනවැයි නොහොත් හිසකට මෙතෙක් රන් දුන මැනවැයි කියා මෙසේ මිනිසුන් අතින් ගන්නා හිස් රනැයි සේයි. [4]ආදි ශබ්දයෙන් රිදී අමුණු සැළ කහවණු සෙනඟ පිළී ඈ ගත්හු. **ගණ්හන්තෙසු රාජකුලෙසු**, යථාක්‍රමයෙන් මෙසේ රජදරුවන් ගන්නා කල්හි; [5]**රට්ඨකිලෙසාභාවො**, රටවැස්සන් විඳුනා දුක් තමහට නැති බැවි; **උපකරණෙසු**, ගෘහොපකරණයෙහි; **නිච්ඡන්දරාගභාවො**, ඇලුම් නැති බැවි. **අප්පටිභයභාවො**, සතර දසට යත් [6]ඛයයක් නැති බැවි; **අනිච්චතො**,[7]වැ නොවන විසින්; **දුක්ඛතො**, උදව්යෙන් පෙළෙන විසින්; **ආරභිත්වා**, කොට; **ථාමප්පත්තං**, [8]බලපත්–සපිරබවට පැමිණිය යනුයි. **ආනුපුබ්බිකථා**, අනුපූර්වකථා–අනුක්‍රම දීපකවූ කථාය යූ තැන්; **කුටි**, [9]තෘණකුටිය; **ලෙණ**, කටාර කෙටූ ගල් ගුහාය; **අපගත [10]ව්‍යාළ මිග හිංසනක සකුණං**, කසවූ සැඬමුව රැව් කිය [11]ජනවත ලිහිණියන් ඇති; **ආලම්බනඵලකං**, එල්බ වැතිර සිටි පුවරුව; **සංවිධාය**, සංවිධාන කොට; **ජටාමණ්ඩල**, දළ මඬුලු; **පානීයකුට**, පැන්කළ; **පානීයසඞ්ඛ**, පැන්සක්; **පානීයසරාවානි**, පැන් මලා; **අඞ්ගාරකපල්ලං**, අඟුරු කබල්; **ගිරිකන්දරානුසාරෙන**, ගිරිකඳුරු[12]ඇසුරුව යෙමින් ගිරිකඳුරු හොස්සේ ගොස්ය යනුයි. "කං වුච්චති උදකං; තෙන [13]දාරිතත්තා කන්දරං" යනුවේ. **නදීනිවත්තනෙ**, හෝවක්හි; **සක්කදත්තියං**, සක්දුති—ශක්‍රයා විසින් දෙන ලද්දවූය යනුයි; [14]**ධුවගාමෙ**, ආසන්න ගම්හි; **අතිවිය විරාගන්ති**, ඉතාම ලස් වෙති–තව දක්වා පන්සල ඈතුළෙන් මැතට නොඑති; **පරපටිබද්ධතාය උප්පජ්ජනභාවො**,

1 බුබුළු B. 2 පිණ්ඩපාත-මූ. අ. ක. 3 ඉසකර මස්සක් B D E F. 4 "ආදි ශබ්දයෙන්" යන්න පටන් 17 වැනි පෙළේ 'ගෘහොපකරණයෙහි' යන්න දක්වා පාඨයෝ A හි නොපැනෙත්. 5 රට්ඨපීළනකිලෙසාභාවො මූ. අ. ක. 6 සභයක් A. සංග්‍රහයක් B C D E F. 7 ව-හැම. 8 බලවත් A. බැලපත් C. 9 තිණකුටිය C. 10 වාළ-මූ. අ. ක. 11 ජනවදන A E F. 12 ඇඳුත්ව A. ඇදුරුව C D E F. 13 ධාරිතත්තා-හැම. 41 ධුරගාමෙ-මූ. අ. ක.

පරා පිළිබඳ බැවින් උපදනා බැව්-මෙරමාගෙන් උපදනා බැව්ය යනුයි; **ඡන්නං වා**, හිදියම් එව්; **අගලද්දනං වා**, කඩ ලිම් එව්; **දුරභිසම්භවභාවො**, දුලදහැකි බැව්; **පච්චත්ථිකානං**, සොරුන් හා; [1]**විභූසණට්ඨානභාවො**, සැදුමට කාරණ බැව්; **ධඤ්ඤභාරමහිච්ඡභාවො**, දසරුයෙන් ඇද හාර [2]පිරිරත මහ ඉස් ඇති බැව්; **හිරහිරං කත්වා**, හිරිහිරි කොට; **ගණ්ඨෙත්වා**, ගොතා; **සණිකං**, සෙමෙන්-සුහු නොවය යනුයි; **වාකචීරං**, වැහැරි සිවුරු. "චීරයතෙති චීරං" යනු වේ. **ලග්ගිතං**, එල්වූ; **අනොජපුප්ඵදාමසදිසං**, කටුකරඬු මල්දමක් බඳු; නිත්ත මල්දමක් බඳුවූය යෙත් මෙ. **පුන්නාගපුප්ඵසන්ථරසදිසං**, දෙඹමල් පතරක් බඳු-දෙඹමල් ඇතිරියක් බඳුය යෙත් මෙ. **පටිමුඤ්චිත්වා**, හිස හෙළා; **චූලාය සද්ධිං**, සිළ හා සමඟ-හිසකේ වැටිය හා සමඟය යනුයි; **නිච්චලභාවකරණත්ථං**, නිසල්බැව් කරන්නවස්. **සාරසූචිං**, දළ හිද්ද නොහොත් [3]හර හිද්ද; **ඕකාසාය**, සාල්ලෙහි; **ඔදහිත්වා**, හෙළා හෙවත් බහාලා; **තීසු ඨානෙසු වඞ්කං**, තුන් තැනෙක්හි වක්වූ; **අඞ්කුස**, දෙහෙටිලි; **පච්ඡි**, පිරිවැසි; **ඛාරිභාරං**, කත්බර - පිරිකර ලූ කදය යිතැන්; **වීරපුරිසෙහි**, උත්සාහ ඇති පිරිමිනින් විසින්; **ඛාරිකාජං**, තවුස් පිරිකර කද; **චඞ්කමනවෙමජ්ඣෙ**, සක්මන් මැද එකත්පස්හි; **බිදලමඤ්චකපස්සෙ**, වේපත් මංහැඳ මහවෙළෙහි; **කටත්ථරිකාය**, දඹුමැස්සෙහි; **සරීරං උතුං ගාහාපෙත්වා**, ශරීරය සෘතු ගන්වා-ශරීරය සතපාගෙනය යනුයි; **බලවපච්චූසෙ**, බිලිඅලුයම්හි-පැසිම් යම්හිය යූතැන්; **මිච්ඡාවිතක්කමක්ඛිකා**, කාම ව්‍යාපාද විහිංසා විතර්ක නම් ඇති මැස්සෝ; **අනුබ්‍රෑහෙතුං**, වඩන්නට; **මනාපා**, සිත් වඩන්නීය-සිත් හසුරුවන්නීය එව්; **පරිභණ්ඩකතා**, පිරිබඬ කළ-නොහොත් මට කළ; **භූමි**, ගෘහභූමි තොමෝ; **බෙලුවපක්කවණ්ණා**, බෙල්පක් පැහැබඳුවැ තිල; **කපොතපාදවණ්ණං**, පරවියන් පය පෑ බඳු පැහැ ඇතිව-රතැයි යනුයි; **පදරජ්ජනං**, පුවරු සෙවෙනි ඇති; **විචිත්තත්ථරණාවණ්ණා**, විසිතුරු ඇතිරි ඇත්තක්හු බඳුය - මල්කම් නවාම් ඇති විසිතුරු එළලොම්මුවා ඇතිරි අතුරන ලද්දක්හු වැනිව [4]සුඛසෙය්‍යාවට යොග්‍යව පිළියෙළව තුබූයේය යනුයි; [5]**එතෙනාව**, මෙයින් මෙබෙලුවළුලවණ්ණී පරිභණ්ඩකෘත භූම්‍යාදීන් මෙය යනුයි; **ගෙහසම්පදා**, ගෙසපුව; [6]**අතිරෙකතරා විය**, අධිකයාසේ; [7]**මහාසමාරම්භෙන**, මහාවීර්‍ය්‍යයෙන්-මහා උත්සාහයෙන්ය යනුයි; **දබ්බසම්භාරෙ**,

1 විභූසනභාවො-හැම. 2 පිරිහරණ C. පරිඝරණ E. 3 හළ හිද්ද A. 4 සුඛසෙය්‍යාවට A. 5 එතෙනා-මු. අ. ක. 6 අතිරෙකතරං විය ච- E F. 7 මහාසම්භාරෙන-A B E F. සම්භාරෙණච-D.

ගෙට වුවමනා තෘණලතාලටඩී ආදිවූ ද්‍රව්‍යසම්භාරයන්; **කරණ පරියෙසනභාවො**, කරන්නන් පිරියස්නා බැව්; **තාසං**, ඒ තෘණ ආදීන්; **පුනප්පුන ඨපෙතබ්බතාය**, නැවත නැවත වගුළ තැන හුණු තැන තිබියයුතු බැවින්; **පටිසායනෙන**, නැසීමෙන්; **ගරහා පටිච්ඡාදනභාවො**, වරද පිළිසන් කරන බැව්; [ස] **දුතියකා**, දෙවන්නකු හා සමඟ; **උක්කා**, උකුණුවෝ; **මඞ්කුණා**, මකුණුවෝ; **ඝරගොළිකා**, [1]ගෙසුහුණුවෝ-සිකනළුවි; **ජනානං**, ගෙය; **අප්පසමාරම්භතා**, සවල්පවූ උත්සාහයෙකින් සිද්ධවන බැව්; **කායං න සන්ථම්භෙන්ති**, කය තැදි නොගන්වානුයි-කය දැඩිකොට රුක්ෂ නොකෙරේනුයි යනුයි; **අසන්ථම්භනභාවො**, නො තැදි ගන්නා බැව්; **පරිග්ගහකරණාභාවො**, මාගේයයි කියා මමායන කොට පරිග්‍රහකිරීමක් නැති බැව්; **පටිජග්ගිස්සාමි නං**, මම ඒ රුක් මූල් පිළිදගිම්; **නික්ඛමන්ති**, තෝ ඉන් පලා යා යී; **නීහරණකාභාවො**, නෙරනක්හු නැති බැව්; **වසනත්ථස්ස සජ්ජිතකභාවො**, රුක්මූල් හි වසන්නහටද [2]පිනි හරන බැව්; 'මානමද පුරිසමදෙ වඩ්ඪෙන්ති' යනුයෙහි **මානමද** නම් "සෙය්‍යස්ස සෙය්‍යොහමස්මි" යනාදි විසින් උපදනා මන් මානමද නම් වේ; **පුරිසමද** නම් මාමුත් පිරිමි කවුරුදැයි කියා මෙසේ පිරිමිනි බැව් නිසා උපදනා මත් පුරිස මද නම් වේ-රාග කියත්මැයි; [3]**සවෙජෙනා**, තැත් කරන්නේ; **සංකම්පි**, කම්පාවූ; **සම්පකම්පි**, විශෙෂයෙන්ම කම්පාවූ - වෙවුලා ගිය යූ තැන්. "කපි-චලනෙ" යන ධාතුයි; **සාසනෙ**, තවුස් සස්නෙහි; **උපසජ්ජනෙන ච**, මවු කුස පිළිසිඳ ගන්නා කල්හි-[4]ච්‍යුතිප්‍රතිසන්ධිග්‍රහණයෙහිද; **ජායනෙන**, මවු කුසින් බිහිවන කල්හි-ප්‍රසූතියෙහිද; **බුජ්ඣනෙන**, චතුස්සත්‍යාවබොධය කරන කල්හි-සත්‍යාවබොධයෙහිද; **සම්පජානො**, යුක්ත වූයෙම්; **සප්පි**, ගිතෙල්. [5]"පසුතො ගො වා සප්පතීති සප්පි" යනු වේ; **නවනීතං**, [6]වෙඬුරු; **වත්ථච්ඡාදනානි**, සිවුරු පිළී-"අච්ඡාදනාය වත්ථානි" යූ තැන්; **නමන්තිනා**, දුරදීම ගෞරවයෙන් නමනව; **නමෙපාණා**, ඉන් ඔබ්බෙහි එයට වඩා නමනව; **තප්පභාරා හුත්වා**, සම්පසප්ව විශෙෂයෙන් භක්තිප්‍රෙමාතිගෞරවයෙන් නමනව; **ස්වාතනාය**, සෙට දවස් කටයුතු වූ ආහාර අනුභවය පිණිස-නොහොත් සෙට දවසට වියයුතු ප්‍රීතිප්‍රමොදය පිණිස; **සජ්ජෙත්වා**, පිළියෙළ කොට; **උදකභින්නට්ඨානෙසු**, දියෙන් බුන් තන්හි; **ලාජානි චෙව පුප්ඵානි ච**, විළඳද මල්ද යුතැන්-නොහොත්

1 ගෙසුණුවෝ A. 2 පී හරන බැවු A. ප්‍රිනි හරන බැවු E. 3 සවෙනො A E F. 4 චුතිප්‍රතිසන්ධිග්‍රහණයෙහිද-හැම. 5 පසුගත විසප්පතීති සප්පි-A. පසූගතෙ සප්පි ති සප්පි-C D E F. 6 වෙඬරු E.

ලද පස්මල්ය යූ තැන්; **නානාවිරාගෙහි**, නන් පැහැ ඇති; **පච්චන්තදෙසවිසයෙ**, පසත් දනවුයෙහි [1]පිහිටි නුවරෙහි; මහා මණ්ඩලයෙහි සාර බැවින් කියත්; **තථාගතං**, "තථා ආගතත්තා-තථා ගතත්තා- තථලක්ඛණතත්තා-තථා අභිසම්බුද්ධත්තා-තථාවාදිතාය තථාකාරිතාය යනාදි අට අර්ථයෙන් තථාගත නම්වූ සර්වඥයන්; **ආගමනං**; ඉයයුතු."ආනච්ඡති එත්ථ එතෙනාති වා ආගමනං" යනුවේ; **සකාස්සමා**, සවකියවූ ආශ්‍රමයෙන්; **වාකචීරානි**, වැහැරිමය සිවුරු; **ධුනන්තො**, ගමන වෙගයෙන් කම්පා කරන්නෙසිම්-සලන්නෙසිම්ය යනුයි. "ධු-කම්පනෙ" යන ධාතුයි; **අම්බරෙ**, අහස්හි; **මහාජනො**, මහාජනතෙම; [2]**තුට්ඨහට්ඨො**, තුටුපහටුය; **පමුදිතො**, සොම්නස් වූයේය. "මුද-[3]හෂේ" යන ධාතුයි; නොහොත් සමඟ වූයේයි. "මුද-සංසගේ" යන ධාතුයි. **වෙදජාතො**, උපන් තුෂ්ටි ඇත්තේය - නොහොත් "න කද්දමො න රජො න වාරි ලිප්පති" යනු සෙයින් "තුට්ඨහට්ඨො පමුදිතො වෙදජාතො මහාජනො" යනු තෘතීයාර්ථයෙහි ප්‍රථමා කොටගෙන තෘතීයාර්ථයෙන් කියනු; **අකද්දමං**, කණු කටු නසවූ; **චම්මායනං**, ගොඩ වළ නස වූ; නොහොත් අකද්දමය වටුමය අයන යයි කියනලද; **මග්ගං**, මඟ; **කස්ස**, කාහට; **සොධෙන්ති**, ශුද්ධකරනු ලැබේදැයි විචාළෙම්; **බුද්ධස්ස**,

"අභිඤ්ඤෙය්‍යං පරිඤ්ඤෙය්‍යං භාවෙතබ්බ පහායකො,
සච්ඡිකාතබ්බ ධම්මෙ ච බුද්ධො බුද්ධො තථාගතො" යි

යූ හෙයින් සර්වඥ දත්; **භගවතො**,

"භගීති භගවා භාගී භාජී ඉති විභත්තවා
වන්තාගමනත්තා භවෙසු භගගමනාසි ඉති වාදිතො." යි

කියනලද භගවත්හට; **පඞ්කෙච**, පළුමුමැයි-කැලම් දූලබය යනුයි; **කායවෙය්‍යාවච්චං**, කය [4]කලකුරුවා කරන මෙහෙයක්-කය සොල්වා මෙහෙයක්ය යනුයි; **අනලඞ්කතෙයෙව**, නොසැදූ සඳෙහිම-නොසදන තුරුමය යූ තැන්. "අලං-පරියත්ති [5]වාරණ භූසණෙසු" යන ධාතුයි. **දිබ්බසඞ්ගීතෙසු**, දිව ගදෙව්; **මනොසිලාතලෙ**, [6]රත්ගල් මුදුනෙහි; **අක්ඛීනි උම්මීලෙත්වා**, ඇස් නහා; **ද්වත්තිංසමහාපුරිසලක්ඛණපතිමණ්ඩිතං**, සුප්පතිට්ඨිතපාදතා, චක්කඞ්කිතපාදතා, උස්සඞ්ඛචරණතා, දීඝඞ්ගුලිතා, බ්‍රහ්මස්සරතා, බ්‍රහ්මුජ්ජුගත්තතා, [7]ආජානුකරතා, නිග්‍රොධපරිමණ්ඩලකායතා,

1 පිටිනුවරෙහි D. 2 තුඨපහට්ඨා B D E. 3 හෂීණෙ E. 4 කළුකිරුවා C. 5 ධාරණ-හැම 6 රත්ගල් A E. රත්ගල් B D F. 7 ආජානුතරතා B D E F.

සුඛුමච්ඡවිතා, කඤ්චනසන්නිභත්තචතා, චත්තාලීසදන්තතා, සිනිද්ධදන්තතා, අවිරළදන්තතා, සුසුක්කදාඨතා, උණ්ණාභමුකතා, සීහපුබ්බද්ධකායතා, චිතන්තරංසතා, එණිජඞ්ඝතා, සීහහනුතා, පහූතජිව්හතා, සුරත්තහත්ථපාදතා, ජාලහත්ථපාදතා, ආයතපණ්හිතා, කොසොහිතවත්ථගුය්හතා, රසග්ගසග්ගිතා, සමවට්ටක්ඛන්ධතා, උණ්හීසසීසතා, අභිනීලනෙත්තතා, එකෙකලොමතා, උද්ධග්ගලොමතා, සත්තුස්සදතා, ගොපඛුමතා ය යන දෙතිස් මහා පුරිස්ලකුණෙන් හෙබියාවූ. "ලක්ඛීයතෙ ඉති ලක්ඛණං, ලක්ඛති අනෙනාති වා ලක්ඛණං" යනු බැවින් ලකුණු නම්. **අසීතියා අනුබ්‍යඤ්ජනෙහි**, තම්බනඛතා, තුඞ්ගනඛතා, සිනිද්ධනඛතා, වට්ටවිතඞ්ගුලිතා, අනුපුබ්බඞ්ගුලිතා, අනුපුබ්බවිතඞ්ගුලිතා, තම්බහත්ථපාදතා, [1]ආයතසිනිද්ධඅච්ඡිගත්තපාණිලෙඛතා, අනුපුබ්බවිත්තබාහුතා, සුවිසුද්ධින්ද්‍රියතා, මට්ඨගත්තතා, පදක්ඛිණාවත්තලොමතා, සිනිද්ධනීලතනුරුහතා, කුණ්ඩලාවත්තකෙසතා, ගම්භීරනාභිතා, පදක්ඛිණාවත්තනාභිතා, නාගනාසූරුතා, පඤ්චපපසාදයුත්තවිලොචනතා, සිනිද්ධවිසාලනෙත්තතා, සිතසිනිද්ධදන්තතා, තම්බජිව්හතා, තුඞ්ගනාසතා, ආයතකණ්ණතා, පුථුලලාටතා, වට්ටසීසතා, සංහතනාසිතා, නීලසිරොරුහතා, සිනිද්ධකෙසතා, සණ්හකෙසතා, අලුලිත කෙසතා, යනාදිවූ අසූ අනුබ්‍යඤ්ජනයෙන්; [2]**ව්‍යඤ්ජිතං**, තැවරීගිය-සැදුණාවූය යූ තැන්; **බ්‍යාමප්පභාය**, බ්‍යාමප්‍රභායෙන්-හාත්පසින් සිසාරා බ්‍යාමයක් කණ්ඩලයෙහි බුදුසිරුරු වටා සිටි ශරීරප්‍රභාමණ්ඩලයෙන්-සිරුරු පැහැයෙන යූ තැන්; **ආවෙළාවෙළභූතා චෙව**, සරල් සරල් [3]සැහැටි වූද-ඔවුනොවුන් වැලඳ අක්බඹුරු ආකාර වූද යූ තැන්. නොහොත් කැන් කැන් [3]සැහැටි වූ;නොහොත් දම් [3]සැහැටි වූ;**යුගළ යුගළ භූතා ච**, සඟළ සඟළ [3]සැහැටි වූද;දෙදෙ රස් එක්වැ රැස් රැස්ව හැසිරෙන බැවින් තිමුල් තිමුල් බඳු රස් හ සීතැන්; **ඡබ්බණ්ණා**, නීලපීතලොහිතාවදාතමාඤ්ජෂ්ඨප්‍රභාස්වරය යන ෂට්ප්‍රකාරවූ; **රූපග්ගප්පත්තං**, එ වරා වෙසෙස් රුවක් කවරි තැනෙක්හිදු නැති බැවින් රුවිහි අවසන්පත්; **මණිවලක්ෂෙතුම්පන අඤ්ඤාමනෙනා විය**, [4]මිණිල් පුවරු හෙයක් ඇක් මෙත්තක්නු සෙයින්. මුහුකළ [5]මිණීල තිල රත්වන් වේලු. **දීපඞ්කරො**, "දීපො විය අන්ධකාරං ඤාණාලොකෙන අවිජ්ජන්ධකාරං විධම්භිතත්තා දීපඞ්කරො"; **ජිනො**, සිවු මරුන් දිනූයේ; **පීති**, ඛුද්දක, ඛණික, ඔක්කන්තික, උබ්බෙග, ඵරණ යන පඤ්ච ප්‍රකාර ප්‍රීති; **පවෙදයිං**, විත්දෙමි; **සංවිග්ගමානසො**, "හා, මෙ තෙක් කල් සර්වඥයන් ලොකයෙහි උපන් බව නොදත් නියා" සි

---

1 ආයතසිනිද්ධතා A. 2 අනුබ්‍යඤ්ජනං-මු. අ. සා. 3 සැහැටි A B D. 4 මිනිල් E F. 5 මිණීළ E F.

කියා මෙසේ සංවෙගයට පැමිණි සිත් ඇත්තෙම්; **ඉධ,** මේ අරි අටගි මහ මඩ කෙතැ — දිවකුරු බුදුන් සස්තෙහි; **බීජානි,** සතර විධීන් සිටි විපුල ඵල දෙනුවූ සැදැහැ බිජුන්; නොහොත් කුසල් බිජුන්; **ඛණො,** ඛණ සපුව - අෂට අක්ෂණ වර්ජිත නව වන බුද්ධොත්පාදක්ෂණය යූ තැන්. **වෙ** යනු නිපාතයි. **ජලගි කෙසැඤ්ඤගි,** පස් අභිඥ හා ආස්‍රවක්ෂයකර ඥාන ඇත්තවුන් විසින්; **පච්චුගගමනා,** පෙරගමන්හු. "දෙවා මනුසෙස පසසනති" යනාදි ලොකවිවරණ පෙළහැර වූ බැවින් කියත්. **පඤජලිකා,** පගත් අඤජලි ඇත්තාහු; **දෙවා,** ගදෙව් [1]ගළ වාසී දෙවියෝ; **දිබබගි තුරියෙහි,** අටසැටදහසක් [2]අවුස් නැහෙන අහස්හි අටසැට දහසක් [3]සමජු මඩුලු කොට නැටුම් ගී ගදෙව් දක්වන්නාහු; **මනුසසා,** මිනිස්සු [2]අවුස් රැස්කොට අටලොස්දහසක් සමජු මඩුලු බැඳ. "මානුසකෙහි තුරියෙහි වජ්ජයනතා තථාගතං අනුයනති" යන සබඳ. **වජ්ජයනතා,** වයන්නාහු; **දිබබං මන්දාරවං පුපඵං,** දිවමඳාරාමල්; **දිබබං පදුමං,** [4]තානූ [5]පොකුරුණින් දිවපියුම්; **පාරිච්ඡත්තකං,** පරසතුමල්; [6]**ඔකිරනති,** පුද විලසින් ඉස්නාහුයි. "කෘෘ-විකෂෙපණෙ" යන ධාතුයි. **ආකාසනභගතා,** ගැඹුරු අහස්හි පිහිටි; නොහොත් නභ සඞ්ඛ්‍යාත ආකාශයෙහි සිටි; **මරූ,** දෙවියෝ; **චමපකා,** සපු; **නීප,** බක්මී මල්; **පුනනාග,** [7]කිණදෙඹ; **උකඛිපනති,** ඌර්ධවක්ෂෙපණය කෙරෙත් - උඩට නඟා ඉස්නාහුය යනුයි; **තාගෙ,** තිස් රියන් දළමඩලත්; **අවකුජෙජා,** කිබිසිනි වූයෙම්; **මා අහාකම්කෙථා,** නහමක් ඇක්මේවා. **නං** යනු නිපාත හෝය. නොහොත් "නං [8]අනකකමතං හිතාය මෙ භවිසසති"යි කිවද දෙස් නැති; ඒ මඩෙහි නො ඇක්මීම මට හිත පිණිස වන්නේයි සේයි. **ඛාපෙතවා,** අර හත් මහ කදැණින් අනුතාපනනික කොට; **අසැඤ්ඤාතවෙසෙන,** අප්‍රසිද්ධ වෙසින්; **මෙ චෙතසො,** ම සිත්; **එවං ආසි,** මෙසෙ සිත් පැවැත්තේයි; **සදෙවකො,** දෙවියන් සහිත ලෙව්හු; **එකෙකන තිණෙණන,** එකලාව එතෙරව යාමෙන්; **ථාමදසසිනා පුරිසෙන,** සියල් ලෝසසරින් එතෙර කරන්නට සුදුසු ශක්ති මා කෙරෙයි ඇතැයි කියා මෙසේ වීයඪ දක්නා පුරුෂයා විසින්. **ථාමදසසිනා මෙ පුරිසෙන,** ශක්ති දක්නා ම පිරිමිනීහු විසින් කරන ලද; **ඉමිනා** [9]**අධිකාරෙන,** මේ විශෙෂ ක්‍රියායෙන්-ජීවිත පරිත්‍යාගයෙන යූසේයි. නොහොත් ෂෂ්ඨ්‍යර්ථයෙහි තෘතීයා එව්. "ථාමදසසිනො මෙ පුරිසසස ඉමිනා අධිකාරෙන" යූ සේයි— ශක්ති දක්නා ම පිරිමිනිහුගේ මේ විශෙෂ ක්‍රියායෙන යී තැන්.

1 ගැළ B D. 2 අබුස් B D. 3 සමජු D. 4 නාදුන්-හැම. 5 පොකුණින් D. 6 වොකිරනති E. 7 දෙඹ D. 8 අකකමතං-හැම. 9පටිකාරෙන B C D E.

**බහුං ජනතං,** බොහෝ ජනසමූහයා; **තාරෙමි,** කෙලෙසුන් මූද සසරකතර තරවමි; **සංසාරසොතං ඡින්දිත්වා,** අනමතග්ග සසර දුක් රැස්කරන තෘෂ්ණා නැමැති නදීශ්‍රොතස සිඳ; **විද්ධංසිත්වා තයො භවෙ,** තුන් භවයන් විදහා – භවත්‍රය විෂයවූ නිකාන්ති නසාය යනුයි. **හෙතු,** ඒ ජාතියෙහි රහත් වන්නට නිසි පින් ඇතිබැවි; **ඡන්දො,** රිසි; **උස්සාහො,** උත්සාහ; **වායාමො,** වැර; **පරියෙට්ඨි,** බුදුකුරු දහමුන් සෙවීම්; **පසාරිත්වා,** පිනා; **වියූහිත්වා,** [1]දෙඅත්කොට පීරා; **සන්තිකෙ ආකොටෙත්වා,** අඩයටි උඩු මුවා කොට [2]හිඳුවා; **සත්තිඵල,**[3]සත්තලයෙන් – ශස්ත්‍රමුඛයෙන් යනුයි. **විතච්චිකා,** පහවූ [4]ජවාලා ඇති. [5]"**පත්ථරිත්වා**" යනු උදක ගෙන කීහු. "ගහෙත්වා" යනු සෙස්ස ගෙන කිහු. **අනාගතංසං ඤාණං,** අනාගතකොට්ඨාස විෂයවූ ඥානය – අනාගත කොටස් දන්නා නුවණය යනුයි; **උග්ගතාපං,** මහත්වූ තපස් ඇති; **අග්ගසාවකො,** ප්‍රථම ශ්‍රාවක තෙම; **ලොකවිදූ,** [6] සත් සබර ඔවස් ලෝ දත්. **ආහුතීනං, [පටිග්ගහො,]**

"අන්නං පානං යානං වත්ථං මාලාගන්ධවිලෙපනං,
සෙය්‍යාවසථපදීපෙය්‍යං දානවත්ථූ [7]ඉමෙ දස." යි

කියනලද දශප්‍රකාරවූ දන්වතුන්–[8]පිළිගන්නට යොග්‍යවූ–අහිත් වූ; **උස්සීසකො,** හිස්දෙරහි; **ජටිලං,** ජටාධරවූ; **උග්ගතාපනං,** [9]දරුණු කෙලෙස් තවන්නාවූ; [10]**කපිලවහයෙ රම්මෙ,** රම්‍යවූ කිඹුල්වත් නම් නුවරෙක්හි; **අයං–භවිස්සති,**(මෙතෙම)වන්නේයි; හෙවත් එනම් නුවරෙක් මෝහට නිවාසස්ථාන වන්නේය; **නික්ඛමිත්වා,** ඒ නුවරින් නික්ම; නොහොත් මහාභිනික්මන් නික්ම; **අජපාලරුක්ඛමූලෙ,** යන්නෙහි එනස [11]එළු ගොවුවන් එළුවන් රක්නා තැන් බැවින් අජපාල නම් වී. [12]**නෙරඤ්ජරාය තීරෙ,** නිල්නරා හෝතෙර; [13]**ආදිය,** වළඳා; **පටියත්තා,** දෙවියන් විසින් පිළියෙළ කළ; "බොධිමූලං හි" යනුයෙහි **හි** යනු නිපාතයි. "බොධිමූලං එහිති"යි යුසේයි—බොධිමණ්ඩලයට එළඹෙයි යූ තැන්; **ජනිකා,** ජනෙතනිවූ–වැදූමාවූ යනුයි; **මාතා,** මවු. "මාන–පූජායාම්, මාන්‍යත ඉති මාතා" යනු වේ. **පිතා,** පියේ. "පා–පානෙ, රක්ඛණෙ වා, පිවති, [14]පාතීති වා පිතා" යනු වේ. **සමාහිතා,** එකහවූ සිත් ඇති; **බුද්ධබීජඞ්කුරෙ වාති,** බුදුබිජුවටෙක් ල, බුදු පැළයෙක් ලයි; නොහොත් **බුද්ධඞ්කුරො කිරාති,** බුදුඅකුරෙක්

1 දෙඅක්කොට C. 2 හිඳු සිටුවා C. 3 සත්තලයෙන් A E F. සත්තයන් D. 4 ජටා මාලා ඇති–හැම. 5 පත්ථරිත්වා B C D E F තරිත්වා–මු. අ. ක. 6 සංඝකාර ඔවස් B C D E. සදසකර ඔවස් F. 7 දසා ඉමෙ A D E F. 8 පිළිගන්නට යොග්‍යවූ B C D E F. 9 කොලෙස් තවන්නාවූ E F. 10 කපිලවහයා, රම්මා–මු. අ. ක. 11 එළුගොව්වන් රක්නා බැවින් C D E F. 12 නෙරජරාතීරෙ E. 13 ආදය–මු. අ. ක. 14 පායතීති–හැම.

ලයි. "අති-ලක්ඛණේ" යන ධාතුයි. "අඞ්කීති අඞ්කුරො" යනු වේ. **පදක්ඛිණං කත්වා**, නොවැඳ පැදකුණුකොට; **පටික්කන්ත කාලෙ**, ගිය කල්හි; **බොධිසත්තං**, බෝසත්හු. චතුර්විධ මාර්ගඥාන යද සර්වඥතාඥානයද බොධි නම් වෙයි. එහි ඇලුණු බැවින්ද බුදුන් කෙරෙන් ලත් ව්‍යාකරණ ඇති බැවින්ද එකාන්තයෙන් බුජ්ඣනක සත්ත්වයයිද බොධිසත්ත්ව නම්. **ථුතිහි**, හමුයෙහි කියන ගුණෙන්. **අභිත්ථුනිංසු**, වැනූහු - කීහු එව්; **උක්කුට්ඨිසද්ද**, උකුටු කුල්හඬහු. ප්‍රීතිහරිතවැ කිළ නැගී මහත්කොට පවත්වන මහහඬනුය යී තැන්. **අප්ඵොටෙන්ති**, වමත හකුළුවා දකුණතින් ආස්ඵොටනයද කරන්නාහ; **හසන්ති ච**, [1]සන්තොෂ හසනයද කරන්නාහ; **අද්ධානෙ**, කල්හි; **භෙස්සාම සම්මුඛා ඉමං**, "ඉමස්ස සම්මුඛා භෙස්සාම" යී යු තැන්; **පටිනිස්සං**, [2]හමු තොට-ඉදිරි තොටය යනුයි; **මම කම්මං**, මා කළ කම්හි නිපත්; ම කම් එව්; **පකිත්තෙන්තා**, සමතිස් [3]ආකාරයෙකින් ව්‍යාකරණ කොට කියා; **ජිනපුත්තා**, සව්වෝ; **පදක්ඛිණමකංසු** යනු නොවඳනා බැවින් කිහු. ප්‍රදක්ෂිණ කොළෝ- දකුණත් කොට ගියෝය යනුයි. **ගන්ධබ්බා** යන්නෙහි ගන්ධර්වයෝ නම් ගී නැටුම් පවත්වන දෙවතාවෝයි; **හට්ඨෙන චිත්තෙන**, සොම්නස්වූ සිතින් යුක්තව; **ආසනා**, හොත් තැනින්; **සුඛෙන**, කායික චෛතසික සුවෙන්; **පාමොජ්ජෙන** යනුවෙහි [4]ප්‍රමොද නම් ප්‍රීතිමෙ බැවින් කුදු මහත් ප්‍රීතීන්ය යුතැන්; නොහොත් තරුණ ප්‍රීතීන් එව්; **පීතියා ච**, බලවත් ප්‍රීතියෙන්ද. "සුඛෙන" යී කිවද "පීතියා" යෙමින් සුවවූ තැනජු පී නොනියත බැවින් කියු වෙත්. **අභිස්සන්තා**, තෙමුණෙම්, පිනා ගියෙම්-නොහොත් ප්‍රීතියෙන් ගැලුණෙම්; **සාහස්සිකම්හි ලොකම්හි**, දහසක් සක්වළෙහි-නොහොත් **දසසහස්සිම්හි ලොකම්හි**, දසදහසක් සක්වළෙහි; **ඉසයො**, තවුසෝ- බාහිර තවුස් පැවිජ් ගෙන කියත්; **දසසහස්සාධිවාසිනො**, දසදහසක් සක්වළ වැසිදෙවියෝ. "යා පුබ්බෙ" යනාදි ගාථායෙහි "යා" යනු "යානි" යි ගෙන "නිමිත්තානි" යනු හා සම්බන්ධ කරනු. **උපසම්මන්ති**, සන්හිඳෙන්නේය යු තැන්; **නිරාකුලා**, ආකුල නැතිවූ නොහොත් එක් එළිවූ; **සවන්තියො**; ගංනු; **න සන්දන්ති**, මුව දෙරින් ප්‍රභවයෙහි පටන් පිරීසිටිනා බැවින් නොපවතිත්; **ඵලිනා**, ගත් පක් ඇත්තාහු; **ජොතන්ති**, බබළත්. [5]**අභිසරන්ති**, මියුරු හඬ පවත්වත්-මධුර ශබ්ද කෙරෙති යනුයි; **ආභුජන්ති**, හැකිළෙයි; තරඞගවෙග රහිතව සන්හිඳෙන්නේය යු තැන්. "භුජ- කොෟටිල්‍යෙ" යන ධාතුයි. උළල් වෙග [6]නැති මූත් හිඟුල් හඬ

1 සන්තොෂකාර D. 2 හමුකොට ඉදිරිකොටය C E F. 3 ආරයකින් C. 4 ප්‍රමොද්‍ය-හැම. 5 අභිරවන්ති-මූ. අ. ක. 6 නැති බවමූත් B C D.

වූකලී ඇත්මැයි. හේ "තෙපජ්ජුහො අභිරවන්ති" යනුයෙන් හැගේ. [1]**දසසහස්සිම්හි**, දසදහසක් සක්වළ එව්; දස යොදුන් දහස් ඇත්තාවූය යෙත් මෙ. [2]**අනොවට්ඨෙන**, නොවටියෙන්ම-වැසි නොවැසමය යනුයි; **උබ්බිජ්ජි**, තැංගේයි. **තාරාගණා**, තරු ගණහ; **නක්ඛත්තා**, "නක්ඛත්තානි" යූ තැන්. නකත් තරු ගණහ යන මොහු; **බිලාසයා**, භූමි ගුහායෙහි - බිම් සිදුරෙහි - හෝනා සත්වයෝද; **දරීසයා**, ගල් ගුහායෙහි - ගල් සිදුරෙහි - හෝනා සත්වයෝද; **සකාසයා**, තමන් තමන් වසන තැනින්; **ජුදඩා**, එක පැහැර නික්මුණාහ; **අරති**, උකටලී; **තදූපසම්මන්ති**, "තද උපසම්මන්ති"යි යූ තැන්. "දෙසො මොහො විනස්සති" යනු තනුව ගෙන කීහු. **තෙන ලිඞ්ගෙන**, ඒ සලකුණෙන්; **උද්ධං**, උඩට; **නුද්ධංසති**, න උද්ධංසති, නො උදහා - උඩට නො නැඟෙන්නේය යූ තැන්. **අනිට්ඨගන්ධා**, දුගඳ; **පක්කමන්ති**, දුරුවෙයි; **ඨපසිත්වා අරූපිනො**, යනු [3]අරූ බඹතල වැසි බ්‍රහ්ම යන් රූ නැති හෙයින්මෙ චක්ෂුශ්‍රීමඃ චක්ෂීායතන නැති බැවින් කියත්. **යාවතා නිරයා නාම**, වැඩ කසවූ බැවින් ආස්වාද රහිත බැවින් නිරය නම්වූ යම් පමණ අපාය කෙනෙක් ඇත්ද; **කුඩ්ඩා**, කොඩවරබිත්; **ආවරණා න හොන්ති**, රූපගත වසතුන් ප්‍රකාශ විය නොදී ප්‍රච්ඡන්නකොට නොසිටිනාහ. **ආකාසභූතා**, ඇවිරිලි නැති බැවින් අහස් සැහැවියහ. **උපපත්ති ච**, යනු එකෙණෙහි මියන්නවුන් නැති හෙයින්මෙ උපත් නැති බැව් සිද්ධවන බැවින් කියත්. **අභික්කාම**, අභිමුඛ ව; නොහොත් නොපසුබසු; **භියොය සොමනස්සාය**, බොහෝ සෙයින්-වඩාලාය යනුයි. "බුද්ධස්ස" යනාදී ගාථායෙහි "උභයං" යනු "උභයෙසං"යි කියා ගෙන "බුද්ධස්ස ච දසසහස්සීනං චාති උභයෙසං වචනං සුත්වා"යි යොදනු. **අද්වෙජ්ඣවචනා**, දෙබසක් ඇත්තාහු නොවෙත්-සබාය බොරුය යන දෙබස ඇත්තාහු නොවෙති-සත්‍යවූම තෙපුල් ඇත්තාහුය යනුයි; **විතථං නත්ථි බුද්ධානං**, "බුද්ධානං [4]කථාය විතථං නත්ථි" යූ තැන්. **ධුවසස්සතං**, එකාන්තයෙන් පෙරළුම් නැත්තේය යූ තැන්. **නික්ඛන්තසයනස්ස**, හොත් තැනින් නික්මුණාවූ - නොහොත් වසන තැනින් නික්මුණාවූ; **ආපන්නසත්තානං**, ගර්භිණීන් ගේ; **භාරමොරොපනං**, බර මිදීම් - ප්‍රසූතිය යනුයි; **න පච්චාහරති**, [5]ඇතුලෙහි [6]මෙද ජලයකුත් අවශිෂ්ට නොකෙරේද - නොහොත් එසේ වමාරාපී ජලය නැවැත නොගනීද; **යශං වා**, පරිවාර හෝ; **හන්ද**, එබැවින්; නොහොත් එකැතියෙන්; **විචිනාමි**, සොයමි - නොහොත් පරීක්ෂා කෙරෙමි-තීරණය කෙරෙමි; **ඉතො චිතො ච**,

1 දසසහස්සී-මු. අ. සා. 2 අනොවටෙටන-මු. අ. සා. 3 අරූප A E. 4 කථං-හැම. 5 අතුරෙළෙහි A. අතුරළෙහි D. ඇතුරළෙහි B E F. 6 මනා B.

[1]"ඉතො ඉතො"යි යූ සේයි; **උද්ධං**, දෙව්ලෙව්හි; **අධො**, මිනිස්ලෙව්හි. **දසදිසා** යි කියා දෙව්ලෝ මිනිස්ලෝ ඇතුළුකොට දසදිසා කීහු. **යාවතා ධම්මධාතුයා**, සියලු [2]කම් වැජිරි රුවාරූ වැජිරි ධමුන් කෙරෙහි නොහොත් යම් පමණ ධර්මයන්ගේ ප්‍රවෘත්තිස්ථානයද එපමණ සියලු ස්ථානයෙහි; "විචිනාමීති විනෙතසි" යන සබඳ. **පුබ්බකෙහි**, ඉකුත්වූ; **මහෙසිභි**, සිල් ඇයිදූ නිවනුදූ එසනය කරන හෙයින් මහෙසී නම්වූ මහර්ෂීන් විසින්; **අනුචිණ්ණං**, හැසිරෙනලද; **මහාපථං**, සම්‍යක්සම්බෝධියට මහාමාර්ගවූ; **පඨමං**, සතුන් දිවි [3]උවාරණ බැවින් පළමුවූ. "පාරමිතා"යනුයෙහි ස්වාර්ථයෙහි භාවප්‍රත්‍යය දක්නේ. **නිස්සෙසං**, සිටියක් නැතිකොට–නොතබාය යනුයි. **දුතියං**, දන සිලැ සිටැ දියයුතු බැවිනුදූ [4]කුසල් ධම් සිල් මූල් බැවිනුදූ දෙවනු වූ; **යථාපි**, යම්සේ; **චමරී**, චමරිනොමෝ; **කිස්මිචි**, කණ්ටකාදි කිසිවෙක්හි; **පටිලග්ගිතං**, ලගනාවූ; හෙවත් ඇලුණු; **වාලං**, වාලධිය – නොහොත් වාලධියෙහි රෝමය වාලය කැඩියේද්‍යේහෝයි යන භයින් කොප නොකරන්නීද; **තත්ථ මරණං උපෙති**, [5]වාලය යම් තැනෙක්හි ලගනා වීනම් එ තැනම සිට මියන්නීද; **වාලධිං න විකොපෙති**, වාලය හා මිසි වාලධිය නොනසන්නීද; **චතූසු භූමිසු**, ප්‍රාතිමොක්ෂ ඉන්ද්‍රිය ආජීව ප්‍රත්‍යය පයෙෂ්ෂණයයි කියනලද සියු බුමුයෙහි; **තතියං**, සීලපරමියෙහි සිට පිරිය යුතු බැවින් තුන්වනුවූ; **අන්දුඝරෙ**, සිරගෙහි; **චතුත්ථං**, සඳුණින් පිරික්සා නෙක්ඛම්මයට යායුතු බැවින් සතරවනුවූ; "හීනමජ්ඣිමුක්කට්ඨෙසු" යනු ජාත්‍යාදීන් හීනත්වාදිය ගෙන කීහු. "හීනාදිභෙදෙසු" යනුත් ජාත්‍යාදීන්මෙ හීනතාදිය ගෙන කීහු. **භික්ඛමානො**, සිඟන්නේ; **එවං**, මෙසේ; මෙම ක්‍රමයෙන්-මේ ආකාරයෙන් සිඟන්නේය යනු වේ. **සබ්බකාලං**, හැම කල්හි; "කාලයතීති [6]කාලො, ඛිපති විද්ධංසයති සත්තානං ජීවිතම්ති අත්ථො". **සබ්බභවෙසු**, උපනුපන් සියලු භවයෙහිද; **පඤ්චමං**, පැනයෙන් කටයුතු පිරිසිඳුනාට කරුණු බැවින් පස්වනුවූ; **පග්ගහිත**, හිවියාවූ; නොහැකුළුණාවූ; නොපසුබටුවාවූය යූ තැන්. **මනො**, සිත් ඇත්තේවේද; **සම්මානනෙ**, ආදරයෙහිද; **අවමානනෙ**, අනාදරයෙහිද; **ඡට්ඨං**, වීය්‍යීයෙන් අනුන් කරනලද ආදර අනාදර ක්‍රියා සහන බැවින් සවනුවූ: **අද්වෙජ්ඣමානසො**, ආදරකළවුන් කෙරෙහි සෙනහ වශයෙන් හා අනාදර කළවුන් කෙරෙහි ප්‍රතිඝවශයෙන් හා මෙසේ ද්විධා [7]ප්‍රවෘත්තවූ සිතක් නැත්තෙහි. "යථාපි පඨවී නාම" යනාදි ගාථාවෙහි "සුචිම්පි අසුචිම්පි සබ්බං" යනු

1 ඉනි ඉතියි යූසේයි A D F. ඉතියි යූසේයි E. 2 කම්රුජාරි රුවුරුජාතිධමුන් A. කම්රුජපිදෙවුරජරි ධමුන් B. කම්රුජාරිරුවුරුජාරිධමුන් E F. 3 ඔවාරුණ A B. ඔවාරණ E. F 4 ධම් C. දම් E. 5 වාලධිය D. 6 කාලං-හැම. 7 ප්‍රවෘත්තවූ-හැම.

"සුචිනොපි අසුචිනොපි සබ්බසං"යි ෂෂ්ඨ්‍යන්ත වශයෙන් ගෙන "යථාපි පඨවී සුචිනොපි අසුචිනොපි සබ්බසං නික්ඛිපං සහති"යි සම්බන්ධ කරනු. **නික්ඛිපං**, බහාලීම; **දුසං**, සෙනහ; **සම්මානාවමානක්ඛමො**, ආදරඅනාදර ක්‍ෂමා කරන්නෙහි; **සත්තමං**, යට කියූ දානාදිය වචීසත්‍යයෙහි පිහිටියහට නිපදනා බැවින් සත්වනුවූ; **අසනියා**, සෙණ; **ඔසධීතාරකා නාම**, ඖෂධීතාරකා නම්; **අනතනො ගමනවිථිං**, තුමා යන වේ; **තුලාභූතා**, [1]තලගිරි [2]සැහැවි වී–හැම කලම තමාගේ වීථියෙන් අතික් වීථියකට නොබැස්මෙන් හැම ඍතුවට මධ්‍යස්ථ වීය යනුයි. **සමයෙ**, ශීතාදි කාලයෙහි වේවයි; **උතු**, හිමත් ගිමන් වසන්ය යන ඍතුයෙහි වේවයි. **වස්සෙ වා**, වර්ෂාසෘතුයෙහි වේවයි–නොහොත් වර්ෂායෙහි වේවයි; [3]**න වොක්කමති**, නොකඩ වේද; [4]**අට්ඨමං**, යට කියූ දන් ඈ ඉටන් විසින් [5]නිපදනා බැවින් අටවනුවූ; "පබ්බතො" යනු පස් පව්වටදු ලැබෙන බැවින් හුදු ගල්පව්වම හඟවන්නාහු "සෙලො"යි යුනු. **භුසවාතෙහි**, ප්‍රචණ්ඩවාතයෙන්. [6]"වාතීති වාතො". "වා–ගති [7]බන්ධයොඃ" යන ධාතුයි. **නවමං**, හැම තැනමෙ මෛත්‍රීස්ථානයෙන් දන් ඈ විපුල ඵල වන බැවින් නවවනුවූ; **රජොජල්ලං**,රජස්දූලි; **පවාහෙති**, දුරුකෙරේද; **දසමං**, මෙත් සව්සතුන් අතුරෙහි මැඳහත් වුවහොත් නිපදනා බැවින් දසවනුවූ ; **ආසෙවිතා**, හැම සෙයින් සෙවි; **නිසෙවිතං**, නියමයෙන් නිදෙස්කොට එව් නිරතුරෙන් එව් සෙවි; **කොපානුනයවජ්ජිතා**, ක්‍රොධ ආලය වර්ජිතද; **තුලාභූතො**, තලහුරා සැහැවි වූයෙහි–සුඛයෙහි ඉපිල්ලවාසී නොව දුඃඛයෙහි කපොල නොව – නොහොත් [8]සුඛදුඃඛයෙහි කම්පා නොව – නොහොත් සුඛයෙහි සෙනහ නොකොට [9]දුඃඛයෙහි ද්වේෂ නොකොට මැඳහත් ආකාරයෙන් යුක්තවූයෙහිය යනුයි; **බොධිපාචනා**, [10]සවඥණ මුකුරුවන්නාවූ. "හදයබ්භන්තරෙ" යනු සිත් පිළිබඳ බැවින් කියූ වෙත්. **ඔසාපෙති**, නිමවන්නේය. සෙසු තන්හි බාහ්‍යවස්තු පරිත්‍යාග [11]පැරුම්, අඞ්ග පරිත්‍යාග උපපැරුම්, ජීවිතපරිත්‍යාග පරමත් පැරුම් කොට කියති. මෙහි වනාහි "බාහිරභණ්ඩපරිච්චාගො උපපාරමියො නාම"යි කියන්නාහු අඞ්ගපරිත්‍යාගයට වඩාද [12]බාහ්‍ය නම්වූ පුත්‍රදාර පරිත්‍යාග බිලී තැන් සඳහා කියූ වෙත්. **යමකතෙලං**, දෙතෙලක්; ගිතෙල් හා මීතෙල් එව්; **විනිවට්ටෙන්තො විය**, එක්රස කොට–එක් කොට–හනන්නක් හු සෙයින්; **මහාමෙරුං මත්ථං කත්වා**, මහමෙර මත්දඬු කොට; **චක්කවාළමහාසමුද්දං**, සක්වළගලින්

1 තරගිරි A. 2 සැහැවිරි–හැම. 3 නාතික්කමති–මු. අ. කා. 4 අට්ඨමයා D E F. 5 පදනා බැවින් D E F. 6 වායතීති–හැම. 7 බන්ධනෙ F. 8 සුඛයෙහි E F. 9 සුඛයෙහි D. සුවයෙහි E F. 10 යෙවිඥණ B. සෙවිඥණ D. සෙවිඥණ E F. 11 පෙරුම් E F. 12 බාහිර.

පිරිසුත් මහමුහුද; **ආලොළෙන්තො විය**, අලළන්නක්හු සෙයින්; **චතුනහුතාධිකා**, සතර නහුතයක් අධිකකොට ඇති. නහුත ශබ්ද දසදහසක් කියා. **නළකලාපො විය**, හුණකලඹක් සෙයින්; **උච්ඡුයන්තම්ව ච**, උක්යතුරක් මෙන්ද; **කුලාලචක්කං විය**, කුඹල් සකක් මෙන්ද; **තෙලයන්තචක්කං විය ච**, තෙල්යත් සකක් මෙන්ද; [1]**තදුද්ධං**, එයින් මත්තෙහි-ඒ දසපාරමිතාවන් කොරෙන් මත්තෙහි අන්‍ය පාරමිතා කොතෙක්ද යනුයි. **සභාවසරසලක්ඛණෙ-සභාව**, ස්වභාව ලක්ෂණ හා; **සරසලක්ඛණෙ**, සර්වධර්ම සාධාරණ සාමාන්‍ය ලක්ෂණ ඇති-නොහොත් **සභාව**, සාමාන්‍ය ලක්ෂණ හා; **සරසලක්ඛණෙ**, ස්වභාව ලක්ෂණ ඇති-නොහොත්; **සභාව**, පරමාර්ථවූ; **සරසලක්ඛණෙ**, ලක්ෂණරස සහිතවූ-ලක්ෂණ හා; කෘත්‍ය ඇත්තාවූය යනුයි. **ඉමෙ ධම්මෙ**, මේ දස පැරුම් ධමුන්; **සම්මසන්තො**, තුලනාකරන්නාහට; **ධම්මතෙජෙන**, පාරමිතා තෙජසින්; **වසුධා**, "වසු" යනු ද්‍රව්‍යය; ඒ [2]ධරන්නේ එව් ඒ දෙයි එව් "වසුධා" නම්වූ පොළොව; **යුගන්තවාතෙන**, ප්‍රලය වාතයෙන්; **අබ්භාහතා**, පහරනලද; **කුලාලභාජනානි**, කුඹල්බඳුන්; **නාගාවමෙවා**, නාගාවජ්ජිතයෙක් හෝ-[3]මේ නයින් කළ පෙරළියෙක් ද්‍යෝහෝයි; [4]නැවැටිලියෙක් ද්‍යෝහෝයි-නයින් කළ විකාරයෙක් ද්‍යෝහෝයි යූ තැන්. "**භූතයක්ඛදෙවතාසු**" යනුයෙහි භූතයෝ නම් වෘක්ෂපර්වතාදිනිශ්‍රිත යක්ෂයෝය; යක්ෂයෝ නම් සාතාගිරාදි බලවත් යක්ෂයෝය; දෙවතාවෝ නම් දෙව්ලෝ වැසි දෙවීයෝයි. **ඉතො නිදානා**, මේ කාරුණෙන්; **බුද්ධස්ස පරිවෙසනෙ**, බුදුන් වළඳනා තැන; පරිවෙසන නම් මෙතැන භක්තාග්‍රයයි. **කුමගීනං ච සතා බහූ**, බොහෝ සියගණන් සැළහුද; **සංවුණ්ණමථිතා**, සුනුසුනුව මිරිකෙනලදුව - නොහොත් ඇලළී ගියෝ. "මථ-විලොළනෙ" යන ධාතුයි. "සම්භග්ගා මථිතා" යෙත් මෙ. **උබ්බිග්ගා**, විසන පත්වූවාහු. **තසිතා**, ත්‍රාස පත්වූවාහු; **භන්තා**, එක් තැනෙක්හි ස්ථිර නැත්තාහු. "භ්‍රමු-අනවස්ථානෙ" යන ධාතුයි. **බ්‍යාධිතමානසා**, [5]පැළ පත් සිත් ඇත්තාහු. මෙහැම [6]බියවිසි බැව් හඟවන්නාහු කීහු. **චක්ඛුම**, බුද්ධචක්ඛු සමන්තචක්ඛු [7]පඤ්ඤාචක්ඛු දිබ්බචක්ඛු මංසචක්ඛු යන පස්ඇස් ඇත්තව; **සඤ්ඤාපෙසි**, හැඟවී ගෙවත් ගිවිස්වී; **විස්සට්ඨා හොථ**, නිර්භය වව්-බුහුටි වව්; **පුබ්බකං**, [8]පොරොන්. "ධම්මං" යනු හා සබඳ. **ජම්භිතන්තං වා**, සිරුරු [9]තැතිගැන්මෙක් වේවයි; **පසිරුදහංසු**, කීහු; **අබ්භුග ගනච්චා**, නැගී. "දිබ්බං මානුසකං" යනාදි ගාථායෙහි "ගහෙත්වා"

---

1 තතුද්ධං-මු. අ. ක. 2 අධරන්තොන් A B D. 3 වේ B. 4 නාබවිලියෙක් B C D E F. 5 පෑළපත් A. පළපත් B C D E F. 6 බිස විසින් B D E F. 7 මඟගචක්ඛු B D F. 8 පොරාන් E. 9 නැදිගැන්මෙක් A.

යන්නක් අධ්‍යාහාරකොට "දෙවමානුසකා උභො දිබ්බං මානුසකං පුප්ඵං ගහෙත්වා"යි යොදා කියනු. එම ගාථායෙහි "පුප්ඵෙහි" යන්නට "තෙහි" යන්නක් අධ්‍යාහාර කොට "තෙහි පුප්ඵෙහි"යි යොදා කියනු. **චුම්බහනනස්ස**, නැහෙන්නහු; නැහෙත් නැහෙත් එවි. **තෙ**, ඒ දෙවියෝ; **සොත්ථි**, ස්වස්තිවචන; **පවෙදයන්ති**, දන්වත්;පහළකොට කියති යනුයි. **සබ්බීතියො**, සියලු පීඩාවෝ. **ජින** යනු බොධිසත්වයන්ට ආමන්ත්‍රණයි. මෙහි සජීඥවාචීවූ ජිනශබ්දයෙන් නොබුදුවූ බොධිසත්වයන්ට ආමන්ත්‍රණය "අගමා රාජගහං බුද්ධො" යනු සෙයින් අභූතයෙහි භූතවචනොපචාර යෙනැයි දතයුතු. නොහොත් **ජිනබොධියං**, හැම බුදුන්ට පිහිටවූ බෝමඬම්හි. "ජිනානං බොධි"යි සමාස දක්නේ. **පුණ්ණමාසෙ**, පුනුපොහොයෙහි - මැදි පොහොයෙහිය යූ තැන්. "මා වුච්චති චන්දො, සො එත්ථ පුණ්ණොති පුණ්ණමාසො" යනු වේ. **තාපෙන**, ප්‍රභායෙන් හෙවත් රසින්; [1]**ලොකං මුඤ්චිත්වා**, සත්ව ලොකයා හැර-ලොක හා අසම්මිශ්‍රව; උන්ට අධිකව යනුයි. **ඔසරන්තු**, හැසිරෙත්වා-නොහොත් යෙත්වා-නොහොත් වදිත්වා. [2]**ථුතප්පසත්ථො**, සතුතිකොට ප්‍රශංසාකරන ලද්දාවූ-නොහොත් [3]හමුයෙහි වර්ණනා [4]කරන ලද්දාවූ; පරාඞ්මුඛයෙහි ප්‍රශංසා කරන ලද්දාවූ; **පවනං**, මහවලට. "පවද්ධං වනං පවනං" යනු වේ.

## සුමෙධකථා නිට්ඨිතා.

**අනුපාදිසෙසාය**, සකන්ධශෙෂයක් නැතිවූ; **නිබ්බානධාතුයා**, නිවන් ධයින්; **සාමඤ්ඤං**, ශ්‍රමණභාවය; "සමණස්ස භාවො සාමඤ්ඤං"යනු වේ. **චතූරො ඵලමුත්තමෙ**,"උත්තමෙ චතුරො ඵලෙ" යූ තැන්. **සො කස්සචි අසමෙ ධම්මෙ චතුස්සො පටිසම්භිද දෙති**, පිළිසිඹියා සෙබාසෙබ බිම්හි නිපදනා බැවින් හෙතෙම කිසිවක්හට සතර මග හා සිවුපිළිසිඹියා දක්වා දෙන්නේය. **තිස්සො විජ්ජායො**, දිබ්බචක්ඛු-[5]පුබ්බෙනිවාස-ආසවක්ඛයඤාණය යන මේ ත්‍රිවිද්‍යාවන්; **කෙන යොගෙන**, ඒ නියෙන්-ඒ ක්‍රමයෙන් යනුයි; **විත්ථාරිතං ආසි**, මහත් වී; **මහාහනු**, පරිපූර්ණ කපොල ඇති; මහත් රූ ඇති - හනුපරියොසාන ඇත්තාවූය යූ තැන්. **උසභක්ඛන්ධො**, වෘෂභරාජයක්හුගේ කඳට බඳු කඳට ඇත්තාවූ-ගොන්රජක්හුගේ කඳට බඳුවූ කඳට ඇත්තාවූය යනුයි. **දීපඞ්කරසනාමකො**, "සො දීපඞ්කරනාමකො" යූ තැන්. නොහොත් අතීතානාගත බුදුන් හා [6]එක් නම් ඇතියේ. **දුග්ගතිං**, "දුගගතිතො" යි තැන්. **බොධනෙය්‍යං**, සත්‍යප්‍රතිවෙධ කැරවිය යුතු;

1 ලොකා මුච්චිත්වා-මු. අ. ක. 2 ථුතිප්පසත්ථො. B D. 3 මුයෙන් E F. 4 කියන ලද්දාවූ C D F. 5 දිබ්බසොත A. 6 එක්වන් C.

**පඨමාභිසමයෙ**, සත්ත්වයන්ගේ පළමුවන සත්‍යාවබෝධයෙහි. බුදුන් නිරන්තරයෙන් දහම් දෙසූ කල නිරන්තරයෙන් අධිගම කරන්නන් ඇතද මහා අභිසමය ගෙන—බොහෝදෙනා සත්‍යාවබොධය කළ තැන් ගෙන—ප්‍රථමාභිසමයයැ ද්විතීයාභිසමයයැ තෘතීයාභිසමයයැයි කියනලදී. "**සන්නිපාතා තයො ආසුං**"යී එක්වන් සන්නිපාත ඇතත් පවාරණාදියෙහි බොහෝ දෙනාගේ මහා සන්නිපාත ගෙන කියනලදී. **සමිංසු**, රැස්වූ; **සුදස්සනසිලුච්චයෙ**, සුදසුන් නම් පව්වෙහි; **දසවීසසහස්සානං**, දසදහසක් පමණ විසිදහසක් පමණ දෙනාගේ; [1]**විත්ථාරිකං**, ඒ ඒ [2]දිගත පතළ විසින් විස්තර විය; **බාහුජඤ්ඤං**, [3]බොහෝ දෙනා විසින් දන්නාලද්දේ විය; **ඉද්ධං**, මහාජනයාගේ අභිසමය විසින් සපිරුණේ වී; **ඵීතං**, [4]අභිඥසපුයෙන් පිරුණේ වී; **සාසනං**, තුන් සිඛයෙන් සඞ්ග්‍රහවූ බ්‍රම්සරසසුන්; **අප්පත්තමානසා**, අප්‍රාප්ත අර්හත් ඵල ඇත්තාවූ; **සෙඛා**, ශෛක්ෂවූ. "යෙ කෙචි මානුසං භවං ජහන්ති"යී අනුසන්ධාන කරනු. **සුපුප්ඵිතං**, අභිඥකුසුමයෙන් සුපිපි; **පාවචනං**, ශාසනය; **තාදිහි**, අෂ්ටලොකධර්මයෙහි ඒකාකාරවූ; **පිසඵලිති**, පුලිලයයි; **දීපරුක්ඛාව**, පහන්රුකක් මෙන්; **බහුංජනානං**, බොහෝ [5]ජනසමූහයා—විසිඅසඞ්ඛ්‍ය සතිස්කෙළසුවහස් සත්සැත්තෑකෙළදහස් අසූකෙළක් පමණ ජනයන්ය යූ තැන්. **ජලිත්වා**, බුදුසිරින් [6]දිලිහීපියා. "සසාවකො මහාජනං සන්තාරෙත්වා"යී යොදනු මෙ. සවු විනෙයින් සතර අසඞ්ඛ්‍ය සතලිස්කෙළසුවහස් පනස්කෙළදහස් සත්කෙළහු. දෙඅසනින් සූවිසි අසඞ්ඛ්‍ය සත්සැත්තෑකෙළසුවහස් සත්විසිකෙළදහස් සතාසූ කෙළහු. **සො ච යසො**, ඒ පිරිවරද; **සමන්තරහිතං**, [7]අතුරුධන්වී; [8]**සබ්බසඞ්ඛාරා**, සියලු ප්‍රත්‍යයසමුත්පන්න ධර්මයෝ; **රිත්තා නනු**, සිස්හු නො වෙති-සිස්හ යූ තැන්.

**කොණ්ඩඤ්ඤො නාම**, ගොත් විසින් කොණ්ඩඤ්ඤ නම්වූ; **අනන්තතෙජො**, ශීලසමාධ්‍යාදි අනන්තගුණ තෙජසින් හමුවට [9]දුයාහැකි බැවින් අනන්තවූ ගුණතෙජස් ඇති; **අප්පමෙය්‍යො**, ගුණ ඉදින් මූර්තිමත් වුවහොත් දසදහසක් සක්වළ පුරන පමණ ගුණ ඇති වන බැවින් අපමණ ගුණ ඇති; **දුරාසදො**, එළබෙත් මඩුත් සලත් සටත් නොහැකිවූ-නොහොත් අනුන් විසින් නො මැඩියහැකිවූ; **චක්කවත්ති ගුණ්ඩා**, දිවසක්විතිව; **මහාදානං**, තුන් මසක් මහදන්; **සාලකල්‍යාණිනාමකො**, සල්කලණ නම් රුකෙක්; "මඞ්ගලසම්පත්තියං ජාතොති මඞ්ගලො". **වෙමාතිකා**

1 විත්ථාරිතං E. 2 දිග C. 3 බොහෝ දෙවියන් දක්නා ලද්දේවිය B C D F. 4 අභිඥසැපහෝ A. 5 ජනසමූහයා විසින්-හැම. 6 දිලිපියා B D E F. 7 අතුරුදන්වී E. 8 සබ්බ සඞ්ඛාරා-හැම. 9 පුයහැකි A. දුයහැකි D E F. දුස හැකි C.

**ඝාතා,** වෙත මවුන් දරු මල්වූ-මවුන් විසින් වෙන් එක පියන්ට ද සුළුමවුන් දරු මල්වූය යනුයි; **ආනුපුබ්බිකථං,** දන් ඈ අනුක්‍රම දීපක කථා—දානකථා සීලකථා ආදිවූ පිළිවෙළ කථාය යනුයි; **ආකප්පසම්පන්නා,** [1]සථානනිෂද්‍යාදි ඊර්‍යාපථසම්පන්න වූවාහු; **අනනමඝෙසො උක්ඛලි ආදීනි උපාදය,** යටත්පිරිසෙයින් සැළි ආදි [2]කළු වළන්මෙ ආදිකොට; **සුවණ්ණපට්ටපරියොනද්ධා විය,** රන්පට පෙරවූවවුන් බඳුවූවාහු; [3]**රවන,** හඬන; **නො නත්ථි,** නැත්තේ නොවේ. ''ද්වෞ ප්‍රතිෂෙධෞ [4]ප්‍රකෘතාර්ථඞ්ගමයතඃ'' යනු හෙයින් ඇතැයි යනු අර්ථයි. **මූලකලාපං විය,** මුලපලා මිටක් සෙයින්-නොහොත් මූලපලා මිටියක් සෙයින්මෙ; **උග්ගිරමානං,** වැගිරෙන්නාවූ; **දණ්ඩදීපකාවෙඨනනියාමෙන,** දඬුවැට වෙළන නියායෙන්-දඬුවැට කඹ වෙළන පරිද්දෙන්මෙ යනුයි; **රථනමඞ්ගුලං,** රියනක් පමණ මැද උස් තැන [5]උක්කෙම් ඇති—කැකුළක් ඇතිය යනුයි; **උසුමං න ගණ්හි,** හුණු නොගත්තේය; **චතුරසීතියොජනසහස්සමත්ථකො** යනු මෙර එක්ලක්ෂ අටසැටදහසක් යොදුන. එයින් දියෙහි සුවාසූදහසක් යොදුන් පමණ තැන් ගැලී සිටියේ, සුවාසූදහසක් පමණ තැන් දියෙන් මත්තෙහි සිටියේ. එහෙයින් දියෙන් මත්තෙහි සිටි තැන් ගෙන කීහු. **වාසිඵරසුහත්ථො,** වෑ පොරෝ ගත් අත් ඇත්තේ. ''ද්වාදස තෙරස'' යනු අයම්විතර ගැන කියත්. පුළුල දෙළොස් යොදුන, දිග තෙළෙස් යොදුන යනුයි. **ඝටකා,** කළවටු; [6]කොතුරුපක්; [7]**අනනනෙනන,** [8]අතතින්; කෙළවර කෙළවරය යනුයි. **කිඞ්කිණිකජාලා,** කිකිණිදැල්—රසුදැල්ය යනුයි; **පඤ්චඞ්ගිකස්ස,** ආතතය විතතය ආතතවිතතය ඝනය සුසිරය යන පස් අඟක් ඇති; **ගන්ධදාම** නම් සුවඳ කල්ක වැළ ඇටසේ ඉදිකොට කරන ලද්දේයි; **ආධාරකානි ච,** පාත්‍රාධාරකයෝද—පාත්‍ර වළලුද යනුයි; **කොණෙ කොණෙ,** [9]කොන්හි කොන්හි; **උදකචාටියො,** පැන් සැළි; **පඤ්චවණ්ණාය පීතියා,** [10]ක්ෂුද්‍රිකාක්ෂණිකොද්වෙගාවක්‍රාන්ති ස්ඵුරණී යන පස්වනක් ප්‍රීතීන්; **ඵුටං,** පිරුණේ; **ආගම්ම,** පැමිණ-නොහොත් දූන; **කාරිතො,** විස්කම්හු එවා කැරවූයේ; **කිත්තකම්පි සමානං,** කොපමණ වූයේත්; **අඤ්ජිත,** යහපත් කොට අඳුන් ගහා [11]සරහනලද; **උබ්බතෙත්වා,** උපුරා; **පඤ්චකහාපණමත්තානි,** [12]පස්ලක්ෂයක් මසුරන්; **මජ්ඣෙ නගරෙ,** 'නගරමජ්ඣ' යූ තැන්; **භාගො,** සනෙතාෂ; [13]**විතතඤ්ඤදත්ථතං,**

---

1 ෂට්නිෂද්‍යාදි A. 2 වළන්මෙ C. 3 රවන්ත A B C E F. 4 ප්‍රත්‍යාර්ථඞ්ගමයතඃ B C D. 5 උන්සොම් A C F. 6 කොතුරුපත් E C F. 7 අන්තරන්තරෙ-මූ. අ. සා. 8 අතහිරින්-හැම. 9 කොන් කොන්හි C. 10 ක්ෂුද්‍රිකාක්ෂණිකාධාරාවක්‍රාන්ති ස්ඵුරණී-හැම. 11 පරසහනලද-හැම. 12 පනස්ලක්ෂයක් E. 13 විත්තං අඤ්ඤදත්ථං-මූ.අ.සා.

සිත්හුගේ [1]අන්බවෙක්; **කොලම්බෙ**, කුඩුවම; නොහොත් සැළෑ; **සනපාකපක්කො**, [2]කැකෑරී සිදී බොල්වූ; **පක්කමධු**, කකාළ මීය; **සක්ඛරචුණ්ණ**, ශකීරාසුනුය; **සප්පිං**, ගිතෙල්ය යන මෙයින්; **අභිසඞ්ඛතං**, පිළියෙළ කළ; **එකන්තරිකා හුත්වා**, මනුෂ්‍යයන්ට ඉක්බිති ඉක්බිතිව වීම් වශයෙන් එකාන්තරිකවැ-මිනිසුන්ට ඉක්බිතිවැ දෙවතාවෝය දෙවතාවන්ට ඉක්බිතිවැ මිනිස්සුයයි කියා මෙසේ මේ ක්‍රමයෙන් එකන්තරිකවයැ යනුයි; **නාගරුක්ඛො**, නාරුකෙක්; **ආරොදන**, හැඬීම්; **පරිදෙවනං**, වැලපීම්. හැඬීම් නම් මහත්කොට හැඬීමය. වැලපීම් නම් මහත්කොට නොහඬා කඳුළු ගැනීම්. **තමං**, මොහඅඳුරු; **ධම්මොක්කං**, සියලු ලොකගත ප්‍රකෘති අන්ධකාරය ශරීරාලොකයෙන් නසා සියලු සත්ත්වයන් සන්තානවර්තීවූ මොහන්ධකාර විධමනය පිණිස දහම් නැමැති ප්‍රදීපය; නොහොත් සියුසස් නැමැති [3]සිළි විළක්කුව යනුයි. **සුමනො නාම**, පිළිසඳ ඈ සුමන මල්වැසි වට බැවින් සුමන නම්වූ; **උපහාරං**, පූජා; **පච්චෙකං**, එකක් එකක්හට; **නාගරුක්ඛාව**, නාරුකෙක් මෙ. [4]**සබ්බධම්මෙසු අසමො**, සියලු ශීලසමාධ්‍යාදි ගුණයෙන් අසමය. "නහි ධම්මො අධම්මො ච උභො සමවිපාකිනො" යනු [5]සෙයින් මෙතැන ධර්මශබ්ද ගුණවාචියි. **රෙවතො නාම**, උපන් දා සත්රුවන් වැසි වටුයෙන් එව් රතිජනක ආභරණ වැසි වටුයෙන් එව් රෙවත නම්වූ. එසේ වුවහොත් [6]"රතන ප්‍රවාසී" කියා එව් "රතිමා" [7]කියා එව් වියයුතු [නො]වේද යත්—එසේ වියයුතු නැතැ නිරුක්තිවිධින්"රෙවතො"යනු වී. **උත්තරා සඞ්ගෙන**, උත්තරීයයෙන්—උතුරුසළුයෙන්ය යනුයි; **නාගරුක්ඛාව**, නාරුකෙක් මෙ; **අතුලො**, නොකිලියහැක්කාවූ; **සොභිතො නාම**, ලක්ෂණ අනුව්‍යඤ්ජන ඈ රූපකාය සුහෙන් හා බල වෛශාරද්‍යාදි ධර්මකාය සුහෙන් හොබනා බැවින් සොභිත නම්වූ; **මහාදානං අදාසි**, යොදුන් සියයක් පමණ තන්හි භික්සඟුන් රැස්කොට තුන්මසක් මහදන් දිනි; **නාගරුක්ඛාව**, නාරුකෙක් මෙ; **අනොමදස්සී**, අභිජාති සත්රුවන් වට බැවින් අනොම රුවන් දුටුයයි එව් දැක්වූයයි එව් අනොමදස්සී නම් වී; **අට්ඨභික්ඛු සත** [8]**සහස්සානි**, අටසුවහසක් පමණ මහරහතන්වහන්සේ; **මහාදානං අදාසි**, [9]පිරිසේ නැති බුදුපාමොක් භික්සඟුන්ට දිබ්බන්නපානයෙන් සතියක් මහදන් දිනි; **අජ්ජුනරුක්ඛො**, [10]කුඹුක්රුකෙක්; **දුරතික්කමො**, හික්මපිය නොහැක්කාවූ; **පදුමො**

1 අන්හවෙක් B C D F. 2 කැරිකැරි C. 3 සිලවිලක්කුව D. පිළි විලක්කුව E. 4 සබ්බධම්මෙසු A. 5 හෙයින් C D E F. 6 රතනවාසි A. 7 කියා නාම එව්-හැම 8 සහසෙසහි B D E F. 9 යොදුන් සියක් පිරිසේ නැති B C D E F. 10 කුඹුක් C D E.

නාම, උපන් දවස් අහසින් දණ පමණ පියුම් සියලු දඹදිව්හි වට බැවින් පියුම් නම්වූ; **පසිරූපාසමානො**, උපස්ථාන කරන්නේ; **සොණරුක්ඛා**, [1]මහ හුණු රුකෙක්; **නාරදෙ නාම**, ප්‍රතිසන්ධි ග්‍රහණය කළ දවස් පලඳනා අහසින් වට. එයින් "නරානං අරං සීසං ආභරණං අදාසීති නාරදෙ" යනු වී. **ලොහිතචන්දනෙන**, හිමවතින් හළ සතරගුල් අනැගි ගොසී [2]සඳනෙන්; නොහොත් රත් [2]සඳනෙන්; **මහාසොණරුක්ඛා**, මහ හුණු රුකෙක්; **පදුමුත්තරො නාම**, පිළිසැඳ පවා [3]මවට ඇක්මෙන්නට මහත් තළියක් සා පියුම් නැඟි බැවින්, හැම තැනම පියුම් වට බැවින් පියුමුතුරා නම් වී. **මහාරට්ඨියො හුත්වා**, මහරැටිවැ. රට්ඨියයෝ නම් රට ලද්දෝයි. **සාලරුක්ඛාව**, සල්රුකෙක් මෙ; **අක්ඛොභො**, නොමැඩිය හැකිවූ; **සාගරූපමො**, ගුණෙන් මහමුහුදු බඳුවූ; **සුමෙධො**, නුවණැතිව උපන් බැවින් [4]නෛමිත්තික වූ සද බැවින් සුමෙධ නම් වී. **නිදහිත්වා ඨපිතං**, [5]නිධානකොට තුබූ; **නීපරුක්ඛා**, බක්මී රුකෙක්; **දුරාසදෙ**, නොළඟවිය හැකිවූ; **සුජාතො නාම**, දිළිඳු දුගීන්ට සුව උපයමින් උපන් හෙයින් සුජාත නම්වූ; **රට්ඨුප්පාදං**, [6]රට අය; **ආරාමිකකිච්චං**, ආරාමික කම්; **මහාවෙළුරුක්ඛා**, මහහුණ රුකෙක්; **මොරපිඤ්ඡකලාපො විය**, මොණරපිල්කලඹක් මෙන්; **මණ්ඩකප්පම්හි**, මණ්ඩකප්හි- එ නම් බුදුන් උපදනා කප්හිය යු තැන්. බුදුන් උපදනා කප්ද සාරකප්පය, මණ්ඩකප්පය, වරකප්පය, සාරමණ්ඩකප්පය, භද්දකප්පය යන පඤ්චප්‍රකාර වේ. එහි යම් කපෙක්හි එකම බුදු කෙනෙක් උපදිත් නම් හේ සාරකප්ප නම් වෙයි. යම් කපෙක බුදුහු දෙදෙනෙක් උපදිත් නම් හේ මණ්ඩකප්ප නම් වෙයි. යම් කපෙක්හි බුදුහු තුන් දෙනෙක් උපදිත් නම් හේ වරකප්ප නම් වෙයි. යම් කපෙක්හි බුදුහු සතර දෙනෙක් උපදිත් නම් හේ සාරමණ්ඩකප්ප නම් වෙයි. යම් කපෙක්හි බුදුහු පස්දෙනෙක් උපදිත් නම් හේ භද්‍රකල්ප නම් වෙයි. [7]එහෙයින් කිහ:—

"යස්මිං ගුණසාරරහිතෙ ලොකෙ සාරුප්පාදකො සම්මාසම්බුද්ධුප්පාදෙ එකොයෙව සො සාරකප්පො නාම; උප්පන්නගුණප්පසාදකෙ දුතියෙ තු උප්පාදෙ මණ්ඩකප්පො නාම; යස්මිං තයො උප්පජ්ජන්ති පඨමො දුතියං දුතියො තතියං ව්‍යාකරොති, තස්මිං නතරා ලද්ධස්සාසා අනන්තො පණිධිවසෙන වාරෙන්ති වර කප්පො නාම; යස්මිං චත්තාරො උප්පජ්ජන්ති සො [8]පුරිමකප්පතො විසිට්ඨත්තා සාරමණ්ඩකප්පො නාම; පඤ්චන්නං පාතුභාවො නාම භද්දකප්පො"යි.

---

1 මුහුණු රුකෙක්- හැම. 2 සඳුනෙන් B D F. 3 මට-හැම. 4 නෛමිත්තික උසද බැවින්-හැම. 5 නිදහනකොට-හැම. 6 රට අයද-හැම. 7 එසේ හෙයින් C, 8 පුරිමතො C.

**අට්ඨාරසකප්පසතමත්ථකෙ**, එක්සියඅටළොස් කපකින් මත්තෙහි; **පියදස්සී**, ලොවට [1]පෙළහර දක්වූ බැවින් පියදස්සී නම්; **පරිච්චාගෙන**, විසජ්මෙන්; [2]**කඞ්ගුරුක්ඛො**, පුවඟු රුකෙක්; **සයම්භූ**, [3]අනාචාර්‍ය්‍යව තමා විසින්මෙ මුළු ලොව දත්තාවූ; **අත්ථදස්සී නාම**, තුබූ තැන නුදුටු ද්‍රව්‍ය හා අසා සිහි නොකළ අර්ථද ඔහු පිළිසඳහි දුටු බැවින්—සිහිකළ බැවින්—අත්ථදස්සී නම්වූ. **පූජෙසි** යනු දණ පමණකොට සතර දෙසෙහි මල්වැසි වස්වා මල්සත් මල්මඬුලු ඇගෑ තොරණ පස්කැන් දම් ඇයින් පුදමින් ගුණ කියමින් සිටියේ කියනු පිණිස කීහු. **චම්පකරුක්ඛො**, සපු රුකෙක්. **ධම්මදස්සී නාම**, මවුකුසින් ප්‍රසූතවූ සඳ පටන් සුතුරු ලී පොත්තෙහි අධර්මව්‍යවහාර නැතිව ධර්මව්‍යවහාරමෙ සිටි හෙයින් ධම්මදස්සී නම්වූ; **රත්තකුරවකරුක්ඛො**, රත්කරවු රුකෙක්. **බිම්බජාලොතිපි වුච්චති**, බිම්බජාල නම් රත්කරවුයෙහි මෙ නම් බැවින් කී වෙත්. කණවේරිය යෙත් මෙ. **සිද්ධත්ථො නාම**, උපන් සඳ දිළිඳු ගිලන් ආදීන් අභිමතාර්ථය නිපන් බැවින් සිද්ධාර්ථ නම්වූ; **කණිකාරරුක්ඛො**, කිණිහිරි රුකෙක්; **අබ්භුග්ගතො සූරියො යථා**, උදගල් මුදුනෙහි නැඟි හිරු මෙන්; **තිස්සො**, එනම් ඇති; **අසනරුක්ඛො**, පියාගසෙක්; **ලොකග්ගනායකො**, "ලොකග්ගො ලොකනායකො" යී තැන්; **ආමලකරුක්ඛො**, ඇඹුලු රුකෙක්; **අසමසමො**, අතීතානාගත බුදුන් හා සමවූ; **විපස්සී නාම**, උපන් දවස් ඇසිපිය නොහෙළා නිමල කොට එව් බැලූ බැවින් විපස්සී නම්වූ; **සොවණ්ණමහාපීඨං**, සත්රුවනින් විසිතුරුවූ මහ රන් පුටුවක්; **පාටලිරුක්ඛො**, පළොල් රුකෙක්; **සිඛී**, උෂ්ණීසය සිළක්මෙන් නැඟි බැවින් එනම් ලද්දුවූ; **සත්තරතනපතිමණ්ඩිතං**, සත්රුවනින් විසිතුරුවූ;-සියලු භාණ්ඩාලඞ්කාරයෙන් හෙබි; **හත්ථිරතනං දත්වා**, ඇත්රුවනක් බුදුපාමොක් මහසඟනට දමනක දක්වා දී; **හත්ථි-පෙ-අදාසි**, නැවත විකිණී ගෙන ඇත් පමණ කොට කැප බඩු දිනි; **පුණ්ඩරීකරුක්ඛො**, ඇටඹ රුකෙක්; **වෙස්සභූ නාම**, [4]උපදිත්ම සොම්නස් ජනවා උසභ නාද බඳු නාද පැවැත්වූ හෙයින් නෛමිත්තිකයෝ වෙස්සභූ නම් කළහ. එහෙයින් වෙස්සභූ නම් වූ; [5]**චිත්තීකාර**, ආදර හා; **සාලරුක්ඛො**, සල් රුකෙක්; [6]**කකුසන්ධො**, එනම්වූ; **අඤ්ජනාදි**, රසඅඳුන් ඈ; **මහාසිරීසරුක්ඛො**, මහරී රුකෙක්; **කොණාගමනො නාම**, උපන් සඳැහි පවා සියල් දඹදිව්හි පලඳනා වැසි වට බැවින් කොණාගමන නම්වූ; **මහා**

1 පෙරහර E. 2 පියඞ්ගුරුක්ඛො-මු. අ. ක. 3 අනාචරියව A. 4 උපදිත A D. උපදිතම E F. 5 චිචිත්තීකාර A. චිචිතීකා: B D E F. 6 කකුසන්ධසා-හැම.

[illegible]**දුස්ස**, වණ්ණප්ප [illegible] මහදන්; **පත්තුණ්ණ**, පත්තුණ්ණදේශයෙ පිළී; **චීනපට්ට**, චීනදේශයෙහි පිළී; **කොසෙය්‍ය**, තිහිරි පිළී; **කම්බල**, එළලොම් හුවා පලස්; **දුකූලානි චෙව**, දුහුල් පිළිද; **සුවණ්ණපට්ටකඤ්ච**, [1]රන්වන් පිළිද; නොහොත් සෙනාසන සන්ථ[illegible] කළ ආස්තරණාදියද; නොහොත් "සුවණ්ණප [illegible] "සුවණ්ණපාදුකඤ්ච"යි තැන්. සියල් දඹදිව් තෙලෙහි දිය දිය තන්හිදු වට්ටාතික කොට රන් පාදුකා තබවා [2]සෙනසුන් පිරිකර පිරිහෝ අනුකොට දෙවිය යු තැන්. **උදුම්බරරුක්ඛො**, දිඹුල් රුකෙක්; **කස්සපො නාම**, එනම් ගොත්‍ර ඇති හෙයින් කාශ්‍යප නම්වූ නොහොත් එනම්වූ; **භුම්යඤ්ච**, මනුෂ්‍යලොකයෙහිද; **අන්තලික්ඛෙ ච**, දිව්‍යලොකයෙහිද; **පාකටො**, ප්‍රසිද්ධවූ; නොහොත් භූමි ලක්‍ෂණ දන්නා හෙයින් භූමියෙහිද ආකාශ ලක්‍ෂණ දන්නා හෙයින් ආකාශයෙහිද ප්‍රකටවූ; **වතනා වතනං**, වතාවත්. වතත නම් මහ වත; අවතත නම් කුදුවති. නොහොත් වතත නම් කුදුවත; අකාර වෘද්ධ්‍යර්ථ බැවින් අවතත නම් මහවති. **නිග්‍රොධරුක්ඛො**, නුග රුකෙක්; **තස්මා [3]කප්පතො පට්ඨාය**, ඒ කප පටා; **ධූතරාගා**, නසනලද රාග ඇත්තාහු; **සතරංසිව**, හිරු මෙන්; නොහොත් සියරැලි විදුලිය මෙන්; **මහාතමවිනොදනා**, මහත් මොහ අඳුරු දුරුකරන්නාහු; **උප්පන්නා**, උපන්හ.

**ඔරභාගෙ**, කෙළවර—මෑතය යනුයි; **එවං**, මෙසේ-යථොක්ත ක්‍රමයෙන්. [4]"**යෙ පන තෙන**" යන තැන "තෙන" යනු මත්තෙහි "කතාභිනීහාරෙන" යනු හා සම්බන්ධකොට "කතාභිනීහාරෙන තෙන"යි කියනු. එහිම "යෙ" යනු මත්තෙහි "බුද්ධකාරක ධම්මා" යනු හා යොදා එක්කොට කියනු. **යාව වෙස්සන්තරත්තභාවා ආගමි**, වෙසතුරු අත්බැව් දක්වා ආයි. "යෙ තෙ ආනිසංසා"යි සබඳ කරනු. **එවං**, කී ප්‍රකාරයෙන්; **සබ්බඞ්ගසම්පන්නා**, සියලු ගුණාඞ්ගයෙන් සම්පන්නවූ; **බොධියා**, සර්වඥතාඥානයට නොහොත් සර්වඥතාඥානප්‍රතිවෙධයට; **නියතා**, සතිටුහන්වූ;-නියතව ගියාවූ—බුදුවමුත් නොනවත්නාවූය යු තැන්; **දීඝමද්ධානං**, දික් කල්හි-බොහෝ කල්හිය යනුයි; **ලොකන්තරෙසු ච**, තුන් සක්වළ [5]අතුරෙහිවූ ලෝඇදිරි මහනරකයෙහිද නොඋපදිත්; **ඛුප්පිපාසා**, ක්‍ෂුත්පිපාසාදුඃඛයෙන් පීඩිත වූ; [6]**නිජ්ඣාමතණ්හිකා න හොන්ති**, කුසෙහි පටන් සියල් සිරුරෙන් නික්මෙන වහනිජ්ජාලා ඇති [7]නිධ්‍යාමතෘෂ්ණිකා ප්‍රෙතව

1 රන්පිළිද E. රන්රිදීපිළිද F. 2 සෙනසුන් සෙනසුන්-හැම. 3 කාපපා-මූ. අ. කා. 4 යෙන පන තෙන-මූ. අ. කා. 5 ඇතුළෙහිවූ C. 6 නිජඣාමතණ්හා-මූ. අ. කා. 7 නිධ්‍යාමතණ්හිකා A.

නොඋපදිනාහ; **කාලකඤ්ජකා න හොන්ති**, කාලකඤ්ජක අසුරද නොවන්නාහ–[1]කාලකඤ්ජක නම් එක් දුක් විඳුනා අසුර කෙනකුන් කෙරෙහිද නොඋපදිති යනුයි; **දුග්ගතිං**, දුගතියෙහි–තිරිසන් යොනියෙහිය යූ තැන්; **උපපජ්ජන්තාපි**, උපදිනාහුද; **ඛුද්දකා පාණා න හොන්ති**, වටුවන්ට කුඩා සත් වැ නොඋපදිනාහ; **ජච්චන්ධා න** [2]**භවන්ති**, මවුකුස්හි මෙ [3]කණ නොවන්නාහ; **සොතවෙකල්ලකා**, බිහිරිබැව්; **මූගපක්ඛකා**, ගොළුපිළි වූවාහු. මේ දෙපද එක්පද කොට මූගයන් කියත් මෙ. **ඉත්ථිභාවං න ගච්ඡන්ති**, මාගම් බවට නොයෙත්; **උභතොබ්‍යඤ්ජනපණ්ඩකා**, උභතොබ්‍යඤ්ජනපණ්ඩක වූවාහු; **පරියාපන්නා න භවන්ති**, පණ්ඩකාදීන් කෙරෙහි අන්තර්ගත නොවෙත්; නොහොත් "උභතොබ්‍යඤ්ජනකපරියාපන්නා පණ්ඩකපරියාපන්නා" යූ තැන්. උභතොබ්‍යඤ්ජනකයන් කෙරෙහි අන්තර්ගත වූවාහු පණ්ඩකයන් කෙරෙහි අන්තර්ගත වූවාහුය යූ සේයි. **ආනන්තරිකෙසු**, මාතෘඝාතාදි ආනන්තරිකකර්මයෙන්; **සුද්ධගොචරා**, පිරිසුදු අදහස් ඇතිවන්නාහ; **කම්මකිරියදස්සනා**, කර්මවාදී ක්‍රියාවාදීවූ සම්‍යක්දෘෂ්ටි ඇත්තාහු; **සුද්ධාවාසෙසු දෙවෙසු**, සුදවස් දෙවියන් කෙරෙහි; **හෙතු නාම**, සුදවස්හි අනාගැමියන් උපදනා බැවින් බෝසතුන් අනාගැමි නොවන හෙයින් සුදවස්හි බෝසතුන්ගේ ඉපදීමට කාරුණෙක් නම්; **න විජ්ජති**, නැති–එහි නොඋපදිතියි යනුයි. **නෙක්ඛම්මනින්නා**, බොධිඥානයෙහි නිම්නවූ; **භවාභවෙ විසංයුත්තා**, කුදු මහත් භවයෙහි නොඇලුණාවූ; **සකත්තානං**, තමාගේ ආත්මය; දිවි එව්; **භොජපුත්තෙන**, වැදිපුත්‍රයන් කෙරෙහි–නොහොත් වැදිපුත්‍රයන්ට; **වජ්ඣෙනා**, හරන මට; **ලග්ගනං**, ලග්ගන බැවෙක් – ඇල්මෙක්ය යූ තැන්; **න හොති**, නොවිය; **නිස්සඞ්ගතාය**, ඇලුම් නැති බැවින්; [4]**පවිචිනන්තෙන**, පරීක්ෂා කොට සොයන්නෙයිම්; **අඤ්ඤොනාභඤ්ඤාගතං**, ඇතුළු [5]පසුම්බියෙහි [6]පිහිවැ හොත්. **සබ්බෙව මානුසා**, මා හා කැටිව මූදු මැදට පැමිණි සියලු මිනිස්හු; **අතීරදස්සී**, තෙර නොදක්නාහු; **ජලමජ්ඣෙ**, සාගරමධ්‍යයෙහි; **හතා**, නටහ; **චිත්තස්ස මෙ අඤ්ඤථා නත්ථි**, මසිත්හුගේ [7]අන්‍ය ප්‍රකාරයෙක් නැත–එසමයෙහි මූහුද මැද නොපිහිටියහෙමියි වීයෑ කටනොහෙමියි යන සිතෙක් මට නොවූයේය යනුයි. **අචෙතනංව**, සිත් නැත්තක්හු මෙන්—මළ සිරුරක් මෙන්ය යූ තැන්; **න මෙ දෙස්සා**, [8]මට අප්‍රියයෝ නොවෙති—නොකල්හු නොවෙති යනුයි. **න මං කොචි උපහසති**,

1 කාලකඤ්ජකයෝ නම්–හැම. 2 හොන්ති C. 3 කාරණයෙහි E. 4 විචිනන්තෙනා–මූ. අ. කා. 5 පසිම්බයෙහි B C D F F. 6 ළහිටවිම E. 7 අන්‍යත්ප්‍රකාරයෙක් A C. 8 ම අප්‍රියයෝ A B D E F.

මං දිස්වා සොවි න උත්තසති, මා දුක කිසිවෙක් ගය නොකරත් නේය. "මෙත්තාබලෙන" යනු "මෙත්තාබලං" යු තැන්. එහෙයින් **මෙත්තාබලෙනුපත්ථද්ධො**, මෛත්‍රිබලය වහල් කොළෙයිම්; නොහොත් **මෙත්තාබලෙනුපත්ථද්ධො**, මෛත්‍රීබලයෙන් වහල් ලදුයෙම්– තර වූයෙම්ය යු තැන්; **පවනෙ**, මහවල්හි; [1]**ඡවට්ඨිකං**, මිනීඇට; **උපධානකං**, හිස්කන්වසින් පාතත් වයිත් කොට. "උපධාය" කියාත් පාඨයි. අව් [2]මෙතෙක්මැයි. **ගොමණ්ඩලා**, ගොපලු දරුවෝ; නොහොත් ග්‍රාමදූරකයෝ; **රූපං**, විසුළු රූ; **නිට්ඨුභනාදිහි** වෙව, වෙර කෙළ දීම් ආදීන්ද. ආදි ශබ්දයෙන් වෙර පැහැරීම් කන දඬුදීම් ඈ ගත්හු. "සුඛං දුඛං අවිකුඤුය පවත්තමානා අවෙතනා සා අයං පුඨුවී"යි සම්බන්ධකොට කියනු.

## දූරෙ නිදානං.

---

බුද්ධහලාහලං, බුදුන්ගේ උත්පත්තියට හෙතුවූ ඝොෂා; **කප්පුට්ඨානං**, කල්පවිනාශය; **මුත්තසිරා**, මුදා පිට හෙළූ හිසකේ සිළු ඇත්තාහු; **විකිණ්ණකෙසා**, විසුරුවනලද හිසකේ ඇත්තාහු–විහිදූ හිසකේ ඇත්තාහුය යනුයි; **පුඤ්ජමානා**, පිස්නාහු. [3]**උස්සුස්සති**, වියළෙන්නේයි; [4]**උඩ්ඩහිස්සති**, දන්නේය. **ලොකපාලදෙවතා**, ලෝ රක්නා දෙවියෝ; **ආහිණ්ඩනකා**, ඇවිදිත්; **පුබ්බනිමිත්තෙසු**, පඤ්චපූර්වනිමිත්තයන්; **චාතුම්මහාරාජිකා** යනාදි ඒ ඒ තෙලෙහි [5]ප්‍රධානුන් ගෙන කියත්. **උදකෙ දණ්ඩරාජි විය**, දියෙහි දණ්ඩෙන් ඇඳි හිරි මෙන්; **තස්ස අපරෙන**, එයට පරපස්හි–එයට ඔබ්බෙහිය යනුයි. **තතො පරං**, එයින් ඇත; **ඔරතො**, මෑත; **මජ්ඣෙ**, මධ්‍යම මණ්ඩලයයි; **එවං විනයෙ වුත්තො පදෙසො**, මෙසේ විනයෙහි කියනලද ප්‍රදෙශයයි; මධ්‍යම මණ්ඩල නම්. **අඩ්ඪතියානි**, දෙසියපනස් යොත්නයි. **පරික්ඛෙපතො**, වටෙහි; **ඉදඤ්චෙව තත්ථ කපිලවත්ථු නාම නගරං**, මෙසේ නියම්කරනලද මධ්‍යම මණ්ඩලයෙහි දූන් කිඹුල්වත් නම් නුවරෙක; **ලොලා**, කාමයෙහි ලොල් වී; **කුසලකම්මාකාසං**, කුසල්කැමින් ඉපැද්දයුතු පියස්; [6]**සාරයමානා**, සිහිකරවන්නාහු; **ආසාළ්හිනක්ඛත්තං ඝුට්ඨං**, උතුරුසළ නැකැත් ලද ඇසළ මස මැඳි පොහොයෙහි කරන උත්සවයට ඝොෂාකරන ලද්දේ; **පුරෙපුණ්ණමාය**, [7]පූර්ණිමා දිනයට පෙරටු–ආදියෙහි; **විගුති**,

---

1 ඡවටඨිං–මු. අ. කා. 2 මෙසේ මැයි C. 3 පුසසිස්සති–මු. අ. කා. 4 උඩ්ඩයයිස්සති–මු. අ. කා. උඩ්ඩස්සහිති A. 5 ප්‍රධනුන් A C F. 6 සරමානා, සිහිසාරන්නානු C. 7 පුණ්ණවිදියට A C D.

[1]සපුයෙන්; **උපොසථඞ්ගානි**, අටසිල්; **අලඞ්කතපටියත්තං**, සැදූ පිළියෙළ කළ; **තෙසං දෙවියො**, සතරවරම් රජුන්ගේ දේවිවරු අඹුවෝ; **දක්ඛිණපස්සං** [2]**නාගෙලත්වා**, මැණියන්ගේ දකුණැළය සමීණයකොට; **බ්‍රාහ්මණපාමොක්ඛා**, උතුම් බමුණන්; [3]**හරිතූපලිත්තාය**, කළ පිරිබඩ ඇති; **ලාජාදීහි**, ලද ආදීන්—ලද පස් මලින්ය යනුයි. ලද පස්මල් නම්: විලඳය, සුන්සාල්ය, සිදුහතුය, සමන්කැකුළුය, හිතණය යන මේයි. [4]**පටිකුජ්ජිත්වා**, පියාලා; **අහතවත්ථ**, [5]හාපිළී; **කපිලගාවි**, [6]කිඹුල්වන් ගෙරි; **අගාරං**, ගිහිගෙයි; **විවත්තච්ඡදෙදා**, විහිදි කෙලෙස් සෙවෙනි ඇති; **සඞ්කම්පි**, කම්පිත වූ; **සම්පකම්පි**, ප්‍රකම්පයෙන් මෙ කම්පා වූ; "කපි-චලනෙ" යන ධාතුයි. **සම්පවෙධි**, වෙවුලා ගියා; **ඔභාසො**, පැහැ; **තස්ස තං සිරිං**, ඒ ඔභාසයාගේ ශ්‍රිය; **උජ්ජගත්තා**, ඉදි සිරිරු ඇතියාහු; **පඞ්ගුලා**, පිළුහු; **අන්‍දුබන්ධනාදිහි**, [7]අදු බැඳුම් ආදීන්; [8]**හසිංසු**, කිල්ලෝ; **විප්පසන්නා**, අභ්‍ර, ධූම, රජස් ආදීන් විගමනයෙන් ප්‍රසන්න වූවාහු; [9]**විස්සන්දි**, පැවැත්තේයි. "ස්‍යන්දු—ස්‍රවණෙ" යන ධාතුයි. **තලො**, දියපිට ඇත්තේ; **පුප්ඵිංසු**, පිපියෝ. "පුප්ඵ—විකසනෙ" යන ධාතුයි. **ඛන්ධපදුමානි** යනාදියෙහි පදුමයයි ඒ ඒ ගස පිපෙන සවපුෂ්ප මෙ පදුම ව්‍යවහාරයෙන් කිහු; නොහොත් පදුමමැ හෝයි. **ඔලෙ සිලාතලානි**, [ගොඩ] අතල ගල්ලන්; **වෙඨෙත්වා** **විස්සට්ඨ**, වටා ගෙතූ; නොහොත් වටා වුහුවූ; [10]**මාලාගුළං විය**, මල්වට පරිද්දෙන්; **උප්පීළෙත්වා**, පෙළා—ඇදය යනුයි; **මාලාසනං විය ච**, මලස්නක් මෙන්ද; **එකමාලාමාලිනී**, එක පැහැර මලින් ගැවසී ගත්තී; **විප්ඵුරන්ත**, පොපියන—සැලෙන්නාවූය යූ තැන්; **පරිවාසිතා**, වාසිත කරන ලද්දී; **සොභග්ගප්පත්තා**, කල්බවට පැමිණී—රමණීය බවට පැමිණී එවි; **පණ්ඩුසුත්තං විය**, රත් හුයක් මෙන්; **ධම්මතා**, පියවි යි; **පත්තන්න තෙලං විය**, පාත්‍රය කින් ගෙන යන තෙලක් පරීක්ෂා ඇතිව රක්ෂාකොට ගෙන යන් නාසේ; **උක්ඛිපාපෙත්වා**, [11]නඟවා. ගන්නා ඇමැත්තෝ දහසක් දෙනා කැටිවලා සිවිගෙය ගත්තාහු නොවෙති. දේවීන්ට පිරිවරකොට දුන් බව ගෙන කිහු. **මඞ්ගල**, [12]සමෘද්ධියට කරුණුවූ; වැඩ කරුණුවූ; සැපත් කරුණුවූ; **සාලවනං**, සල්වනයෙක්. [13]"වනයතීති වනං" – තමා සපුයෙන් භක්ති කරවයි එවි; තමා අතුරෙහි සතා උපයයි එවි වන නම්. **සබ්බං**, සියලු සල්වනය;

1 සපුහියෙන්-හැම. 2 ඵාලෙත්වා-මු. අ.සා. 3 හරිතූපලිත්තාය-මු. අ. සා. 4 පටිකුජ්ජෙත්වා-මු. අ. සා. 5 තාන්පිළී E. 6 කුඹුල්වන් A. 7 අන්දන-හැම. 8 ගසිංසු B C D E F. හෙසිංසු-මු. අ. සා. 9 විසුදි-හැම. 10 මාලාගුළා-හැම. 11 සඟවා C. 12 සමූ කරුණුවූ B D E F. 13 වඩතීති-හැම.

**එකපාලිඵුල්ලං**, නොපිපි රුක් නැතිව එක පැහැර [1]සුපිපියේ; **පඤ්චවණ්ණභමරගණා**, [2]කුඹුලු, මහමී, දඹුවෙල්බෑ, බමර, කණවෙය යන පඤ්චප්‍රකාර මීමැසියෝ; [3]**ආපානමණ්ඩලං විය**, අවන් මඬුල්ලක් මෙන්; නොහොත් කෙළිමඬුල්ලක් මෙන්; [4]**සුසෙදිතවෙත්තග්ගං විය**, මනාකොට හුයනලද වෙයගබඩක් මෙන්; **කම්මජවාතා චලිංසු**, කම්ජවාත චලිත වූ-පහළ වූ-විළි පහළහ යනුයි; **උතුං**, විඩා සන්හිඳෙන පිණිස ශීත ඍතු.

**අජිනප්පවෙණියා**; දෙතුන් පට කළ අඳුන් දිවිසමින්; **දුකූලචුම්බටකෙන**, දුහුල් සුඹුළුයෙන්. දුහුල් සුඹුළුව නම් යහපත් සිහින් පිළී සුඹුළුවයි. **එකඞ්ගණානි අහෙසුං**, [5]එක් එළිවූ; **පදවීතිහාරෙන**, පියවරින්; **සෙසරාජකකුධභණ්ඩහත්ථාති**, සෙසු [6]උණ්හීස, ඛග්ග, උපහි යයි කියනලද රාජ කකුධභාණ්ඩ ගත් අත් ඇතිව. උණ්හීස නම් නළල්පටයි. උපහි නම් රන් මරවැඩියි. පඤ්චරාජ කකුධභාණ්ඩයන් කෙරෙන් ශ්වෙතච්ඡත්‍රය වාලවීජනිය යන මේ [7]දෙක මහාබ්‍රහ්මයා හා සුයාමයා ධරා සිටි හෙයින් මේ උණ්හීසාදිවූ තුන [8]ශෙෂ නම්. එහෙයින් කීනු "සෙස" යනාදි. **අග්ගො**, ප්‍රධානයෙමි; **ආසභිං[9] වාචං**, අභීත වාක්; **ඔසධගච්ඡො චාපිසං පක්ඛිපිංසු**, ඖෂධය ගෙන සැලෙක බහාලූ—ඖෂධය හැරගෙන පැන ගහා ඒ පැන් ආ ආ රොගීන්ට දෙන පිණිස සැලෙක වත්කොට තුබූය යනුයි. **සහස්සත්ථවිකං**, දහසින් බඳ පියල්ලක්. **ගාවුතප්පමාණා** යනාදි නිධානයෙහි මුව විටි පළල. කට මහතට ගෙන කිවත් බට තැන් දියපොළොව දක්වායි. **වෙළුසොබපාදීනි**, හිස්මත්තෙහි පිළී සිසෑරීම් ආදී; **අලඞ්කතපටියත්තං**, සඳ නිමවනලද; **න මෙ අනත්ථං නාසෙතුං පුත්තනන්ති**, මේ කුමාරයා මා වැඳවූවානු වී නම් මා මුඳුන් සත්කඩක්ව පැළෙයි. එහෙයින් මේ කුමාරයා අතින් වැඳුම් ගෙන මා විසින් මා නසන්නට හෙවත් මා විසින් මා නසා ගන්නා බව නොහොත් මාගේ ආත්මය නසන්නට සුදුසු නොවෙයි සිතා. **බොධෙතුං අසක්කුණෙය්‍යො** යනු උපන් සෝවාන් මඟ ඇත්තහට විවසුනෙත් අවසිටි මඟ ඵල [16]නිපතු වූවද සෝවාන් මඟ පරතොඝොස යොනිසොමනසිකාරාදි ප්‍රත්‍යය නැති තැන නොඋපදනා බැවින් කියත්. **අරූපභවෙ** යනු ආකාසානඤ්චායතනතල කියන සඳහා කියත්. මහති [11]**ජනි**, මහත් හානියෙක්; **රොදිතුං උපට්ඨිතො**, හඬන්නට පටන්ගත; **උපධාරෙන්තො**, විචාරෙනෙනා; [12]**ලග්ගෙත්වා**, එල්වා; [13]**නාළකං පටිපදං**,

1 පිපියේ B D. 2 තුඹුළු A D F. 3 ආපණමණ්ඩලං-මු. අ. ක. 4 සුසෙවිත F. 5 එක්හෙළිවූ A. 6 උණ්හීසය නම් E F. 7 දෙ B D. 8 සෙසය E. ශෙෂය F. 9 වාචිං D E F. 10 නිපහුතුව A. 11 හානි A. ජනි B. 12 ඔලගෙගත්වා-මු. අ. ක. 13 නාළක පටිපදං-මු. අ. ක.

යන්නෙහි නාළකපටිපදා නම්—“මොනෙය්‍යං තෙ [1]උපඤ්ඤිස්සං” යනාදි නයින් බුදුන් විසින් නාළක නම් තෙරුන්ට දෙසූ පිළිවෙති. **සත්තෙව මාසෙ ආයුං පාලෙත්වා**, රහත්වූ තැන් පටන් සත් මසක්මැ ආයු වළඳා; **සුවණ්ණපබ්බතං නිස්සාය**, [2]සුරත් වන් ඇති පව්වක් [3]නිසා– “සුරත්තවණ්ණපබ්බතං” යී සේයි. “හිඞ්ගුලපබ්බතං නිස්සාය”යි [4]සුතත්හි කී බැවින් මෙ තැන “සුවණ්ණපබ්බතං”යී රන් පව් කිවහොත් දෙක සංසන්දනා නොවන බැවින් සුරත් වන් ඇති පව් යයි හිඟුල්පව්යෙහි එව් අරුත් කියනු. රුවැති පැහැ ඇති බැවින් “සුවණ්ණ” යයි හිඟුල් ගතයුතු වෙයි කියත් මෙ. [5]**චතුජ්ජාතිකගන්ධෙහි**, “කාලානුසාරී තගරං කප්පූරං හරිචන්දනං”යී කියනලද සිවුදෑගඳින්; **ලාජපඤ්චමකානි පුප්ඵානි**, සුන්සාල්, ශීතණ, සිදුහතු, සමන් කැකුළු, විලඳය යන මේ ලදපස්මල්; **අසම්භින්න**, දිය නොමුසු; **අට්ඨුත්තරසතං**, අටතුරාසියක්; **පටිග්ගාහාපෙසුං**, පරික්ෂා කැරැවූ; **ෂළඞ්ගවා**, ශික්ෂා, කල්ප, ව්‍යාකරණ, නිරුක්ති, ඡන්දෙ විචිති, ජ්‍යොතිශශාස්ත්‍රය යන ෂඩ් වෙදාඞ්ගයන් ඇත්තාවූ; “එතෙ අට්ඨ බ්‍රාහමණා අහෙසුං’යී අනුසන්ධාන කරනු. **මන්තං**, ඒ බ්‍රාහමණයෝ ලක්ෂණමන්ත්‍ර වූ පරිද්දෙන් බොධිසත්ත්වයන්ගේ ලකුණු නිපැත්; **බ්‍යාකරිංසු**, ව්‍යාකරණය කළහයි—කියන ලද්දාහුයි යනුයි; [6]**එකව්‍යාකරණං**, එක් වියරණක්; **එකමෙව ගතිං**, එකම නිපැත්; **උරුවෙලං**, බොහෝ වැලි හෝ වරදට ගෙනා වැලි ඇති හෙයින් හෝ මහත් වැලි රැසක් ඇති හෙයින් හෝ උරුවෙලයයි කියනලද පියසට; **පධානාය**, වීය්‍යී කරන්නට; **අලං වතාති**, සමත්වී යයි–වීය්‍යීයෙහි යෙදී වසන්නට සුදුසුයයි; **එථ**, මා හා කැටිව එව්; **අහං තං පුරිසං අනුපබ්බජිස්සාමීති**, මම් ඒ සිද්ධාර්ථකුමාරයන් අනුව මහණවෙමි කී; **තද පන රාජා**, එසමයෙහි නැවත සුදෙවුන් මහරජාණෝ; **ඉස්සරියාධිපච්චං**, ඓශ්වය්‍යී හා ප්‍රධාන බැව් ඇති; **චක්ඛුපථෙ**, ඇස් මිදුලෙහි–ඇස්හමුයෙහිය යනුයි; **පටිජානි**, දෙමියි ප්‍රතිඥකොළේ–ගිවිස්සේය යනුයි; **පුරක්ඛත**, “පුරතො” යූ තැන්; නොහොත් **පුරක්ඛතපරිවාරිතො**, හැම පරිද්දෙන්ම පිරිවරන ලද්දේ–හාත්පසින් වටකොට පිරිවරන ලද්දේය යනුයි; **බලිවද්ද**, ගොන්ය; **රස්මි**, [7]නැගැපටය; **යොත්තානි**, විය බඳනා රැහැණය යන මොවුන් හා සමහ; **රජත [8]පරික්ඛතානි**, රිදී කසුකම් කරන ලද්දාහු වෙත්; **රඤ්ඤො ආලම්බනනඞ්ගලං පන**, රජ්ජුරුවන් ගෙන [9]සාතා නඟුල වනාහි; **සුවණ්ණ [10]පරික්ඛතං හොති**,

1 උපනිස්සයතානි A. උපනිචචාසයනානි E. උපනිධායයනානු F. 2 සුපත්වත් A E F. සුපත්වත් B D. 3 මැදිය A වය E F. 4 සුත්හි A. සුතන්හි C. 5 චතුජාතිගන්ධෙසි A C E F. 6 එකංසව්‍යාකරණං-මු. අ. ක. 7 කැහැටය-හැම. 8 පරික්ඛිත්තානි A B D E F. 9 ඇහන A 10 පරික්ඛිත්තං A E F,

රන් කසුකම් කරන ලද්දේ වන්නේය; **බලිවද්දනං සිඞ්ගා,** ගොනුන්ගේ හං; **රස්මිපතොදපි,** විය රැහැණය කැහැටය යන මොහුද; **බහලපලාසො,** ඝනවූ පත් ඇත්තේ - ගහනවූ පත් ඇත්තේය යනුයි; **සණ්ඩච්ඡායො,** ඝනවූ-අවිරලවූ ඡායා ඇත්තේ; **බච්ඡං,** සැදී ගැවසීගත්තේ එව්; **නඞ්ගලකරණවෙලායං,** නඟුලෙන් සහන තැනට; **කස්සකා,** සාන ගොවියෝ; **සෙස නඞ්ගලානි,** සෙසු [1]දෙසියයක් පමණ නඟුල් ගත්තු; **ඔරතො වා පාරං ගච්ඡති,** මෑත සිට හෝ ඈතට සැගෙන යන්නේය; **ආනාපානෙ පරිගණ්හෙත්වා,** වදනා නික්මෙන නොහොත් නික්මෙන වදනා [2]වාත විෂයවූ කම්සථානයන් ගෙන; **ඛජ්ජභොජ්ජනතරෙ විචරමානා,** කන බොන දෑ අතුරෙහි ඇවිදිනාහු- කාබී ඇවිදිනාහුය යනුයි; [3]**විරාසිංසු,** ලස්වූහු; **පරිමණ්ඩලා හුත්වා,** පරිමණ්ඩලවැ-හිර [4]නැමූවත් ඡායානොමෝ [5]නොගොස් ගස් වටකොට ගෙනය යනුයි; **පාටිහාරියං,** පිළිවක් හරන විසින් එනම් ලද පෙළහර; **පදෙසිකො,** පියෙස්හි [6]පිහිටියේ; නොහොත් "සොළසවසෙසහි අපදිසිතබ්බො සොළසවස්සපදෙසිකො" යනු වේ - සොළොස් ඇවිරිදියයි කියයුතු වූයේ යූ තැන්; **නිප්පුරිසෙසි,** පිරිමිනීන් විසින් නොපගත්-[7]නොවැයූයේය යනුයි. [8]**උතුවාරෙන,** සෘතුවෙන් සෘතුවට; **පසුතො,** යුකතය; **එසෙ,** ඒ ඔවුන් කියනුයෙහි; **පතනකාලෙ,** යුද්ධයක් සැපත් කල්හි; **කිං මඤ්ඤසි,** කුමක් කටයුත්තේයයි සිතවුදැයි කීහු; නොහොත් විචාදෙ කිං මඤ්ඤසි යනු- "කිං කාතබ්බං මඤ්ඤසි"යි යූ සේයි; **අක්ඛණවෙධී,** අකුණු සතින් ලක් විදුනා; **වාලවෙධී,** එල්වූ බටුපක් සතින් වාල විදුනා; **ධනුග්ගහෙ,** දුනුවායන්; **කුමුදපත්තවණ්ණෙන,** කුමුදුපත්‍රයට බඳු පැහැ ඇති-හෙළ ඇඹුළු මල්පෙත්තේ පැහැ බඳු පැහැ ඇතිය යනුයි; **වඞ්කං,** ගෝනසක්සේ වක්ව ගියාවූ; **ඔභග්ගසරීරං,** කඳටය කටිප්‍රදෙශය දණය යන තුන් තැනින් නැමුණාවූ ශරීර ඇති කොට; **යත්‍රහි නාම,** "යෙන නාම කාරණෙන"යි යූ සේයි; **සංවිග්ග,** නුවණ සංවෙයින් සංවේ පත්වූ; [9]**අලඞ්කාරකාරණං,** අලඞ්කාරණ ක්‍රියාව; **අඩ්ඪරත්තසමයෙ,** මධ්‍යම රාත්‍රියෙහි; **කප්පකස්ස හත්ථතො** යනාදියෙහි කපුවා අතින් වෙළුම් පිළී ගත්තේ කපුවා එනැනින් යවන පිණිසය. ඒ මානුසික වස්ත්‍රාදියෙන් සරහන පිණිස නොවෙයි. දිව්‍යවස්ත්‍රාදියෙන් සැරහී යයි කියත්. **වෙඨනදුස්සං,** වෙළුම් පිළී; **වෙඨනෙන,** එක් වෙළුම් පිළියෙකින්; **මොලියං,**

1 සියයක් A C E F. සියක් B D. 2 තව-හැම. 3 විතයිංසු A. විතරංසු B E. විතරිංසු D F. 4 නැම්වත් A. 5 නොහොත් A B D E F. 6 සිටියෙ A. 7 නොපසුයේය A. නොවැසුමයය B D. 8 උතුවාරෙන උතුවාරෙන-හැම. 9 අලඞ්කාරණඤ්ඤාලං-මු. අ. කා.

වොටුන්හෙයි; **මණිරතනාකාරෙන**, ඒ ඒ සන්ධානයෙහි එබ්බූ මිණිරුවන් සැටියෙන්; **අබ්භුග්ගච්ඡි**, නැංගේ නොහොත් පිරිණී ඇත්තාව නැඟී පැනියේය යු තැන්; **තථං අබ්භුග්ගතානි**, මෙතෙක් වස්ත්‍රයෝ කෙසේ නැංගෝද්දහෝයි; **සාමලතාපුප්ඵප්පමාණං**, පුඩාමලක් සා ඇති වන්නේය; **කුතුම්බකපුප්ඵප්පමාණානි**, තුඹ මල් සා ඇතියාහුයි; **කිඤ්ජක්ඛ**, කෙසුරෙන්; **ගවච්ඡිතං**, ගැවසීගත්; **කුය්‍යකපුප්ඵං විය අහොසි**, බක්මී මලක් පරිද්දෙන් වොරජනෝ වී. "කුය්‍යකපුප්ඵ" යයි කොළඹ මල්ද කියත්. **සබ්බතාලාවචරෙසු**, සියලු වාද්‍ය දන්නවුන්; **සකානි සකානි පටිභානානි**, තමන් තමන්ගේ විද්‍යාවන්; [1]සූද, අරක්කැමියන්; නොහොත් [2]බමුණන්ට ද රදුන් බඩ හොත් බමුණන්;[3] **මාගණ්ඩිකාදිසු**, මූඛමඞ්ගලිකාදීන් නොහොත් වන්දිභට්ටාදීන්; **සම්භාවෙන්තෙසු**, සම්භාවනා කරන කල්හි-[4]සම්භවන කල්හිය යු තැන්; **රාහුලො ජාතො**, හැකිල්ලෙක් සම්භව විය; **බන්ධනං ජාතන්ති**, බන්ධනයෙක් වියයි. ලොකයෙහි පුත්‍රස්නෙහය බලවත් හෙයින් ඒ පුත්‍රයන් කාරණකොටගෙන ප්‍රව්‍රජ්‍යාවට යානොහැකි හෙයින් කීහු. **තං වචනං සුත්වා**, සුදොවුන් මහරජාණෝ "රාහුලො ජාතො" යන බොධිසත්වයන් කී වචනය දූතයන් කෙරෙන් අසා. "ඉතො පට්ඨාය" යනාදි "රාහුලො ජාතො" යන බොධිසත්වයන් කි බසම ගෙන සුදොවුන් මහරජාණන් තමන් මුනුබුරාණන්ට රාහුල කුමාරයෝ යයි නම් තුබූ බැව් හඟවන පිණිස කීහු. **උදානං**, උදන්[5] වැකි-සොම්නසින් පරිභාවිතවූ තෙපුල යු තැන්.

**නිබ්බුතා නූන**, නිවිය හගිම්; නොහොත් එකාන්තෙන් නිවුණු; **නාරී**, [6] සවවශයට ඇසින් පිරිමිනිහු තුමා විසීබව අරවන හෙයින් "නරං අරතීති නාරී" යී කියනලද මාගම්; **සුස්සවනං**, මනා තෙපුලක්; **ආචරියභාගො**, ඇදුරුබැල; **භාරං**, මූත්භර; **අජෙඣාපරිතා**, [7]වැතිර; **ලාලාකිලින්නගත්තා**, කුණුකෙළින් ආර්ද්‍රවූ හෙවත් තෙත්වූ සිරිරු ඇත්තවුන්. "කලිද - ආර්ද්‍රීභාවෙ" යන ධාතුයි. **කාකච්ඡන්තියො**, කස්නවුන් නොහොත් නැහැ හඬවන්නවුන්; නොහොත් නතනන්නවුන්; **බීභච්ඡ**, විසුළුවූ; නොහොත් අසුචීන් භයානකවූ; **සම්බාධට්ඨානා**, රහස්පියෙස් ඇත්තවුන්, **විප්පවිද්ධ**, විසුළු නොහොත් පියනලද-දමනලද්දාවූය යනුයි; **හරිතං**, පිරුණු; **ඛායිංසු**, වැටහුණාහු; **උපද්දුතං**, උපද්‍රවයෙන් යුක්තය; **උපස්සට්ඨං**, පීඩිතං-පීඩා ඇත්තේය යනුයි; නොහොත් පෙළනලදි; **උම්මාරෙ**, එළිපතෙහි; **කපෙප**

1 සූත-මූ. අ. ක. 2 බ්‍රාහ්මණ්‍යාං ක්ෂත්‍රියාජ්ජාතඃ සූතශ්චතුර්ව්‍යතෙ - අමරකොෂටීකා. 3 මාගධාදිසු-මූ. අ. ක. මාඝකාදිකාසු A. මාඝනන්දිකාදිසු B D. 4 සල්වටනා A. සමවනා B. 5 කියයුතු-හැම 6 වශයට ඇසින් B. ශාශායට ඇසීම C වශයට ඇසීම D. වයහට ඇසිම D E. 7 පැතිර. B D.

හිති, [1]සද; [2]**අසංහරණීයං**, [3]අස්සජ්ජු; [4]**සුමනපටවිතානස්ස හෙට්ඨා**, [5]සමන්මල් පිළිවියන් යට; **අයං කප්පනා**, මේ සැදි; **මහාහසිතං හසි**, මහත්කොට කුල්නාද කෙළේයි; **නිරුම්භිත්වා** වළකා; **ඛායති**, දිලියේ; **සුමනමල්ලිකාදීනං පුප්ඵානං**, දෑසමන් සීනිද්ද ආදි කුසුමයන් සම්බන්ධිවූ; **තාරය**, එතෙර කර; **උල්ලඞ්ඝිත්වා**, පැන; **හංසස්ස වා**, කුල්නාද කෙළේ නම් වේවයි; **පදසද්දං වා කරෙය්‍ය**, පියහඬ කෙළේ නම් වේවයි; **ද්වීසු ද්වාරකවාටෙසු**, දොර පුවරු දෙක්හි; **න අවාපුරීයති**, නොවැරී ගියේ නම්; **ඌරූහි නිප්පීළෙත්වා**, කල්වයින් පෙළාගෙන- දෙකලවා හස්සෙන් පෙළාගෙනය යනුයි; **උප්පතිත්වා**, පැනපියා; **කුච්ඡිං පරික්ඛිපන්තෙන**, මහබඩැහි අත්ලා බඩමැද දී වටකොට ගන්නෙම්ය යනුයි; **උපකච්ඡන්තරෙ කත්වා**, කිසිළි අතුරෙහි කොට; **ඔතාරාපෙක්ඛො**, සිදුරු බලන්නේ; **අනපගච්ඡන්තො**, පා නොවන්නේ-සමීපචාරී වූයේය යනුයි; නොහොත් නොනවත්නේ; **අනුබන්ධි**, [6]පසුපස් අනුවැ ඇවිද්දේයි.

**ධාරාහි විය**, වැසිධරින් මෙන්; **සමන්තතො**, හාත්පසින්-සිසාරා; **අට්ඨතුරියානි**, අට වගීයෙක බෙරය; **සට්ඨිතුරියානීති**, සැට වගීයෙක බෙරයයි; **සමුද්දකුච්ඡියං**, මුහුදුකුස්හි; **මෙඝත්ථනිතකාලො විය**, මහමේ ගිගුම් පවත්නා කලක් මෙන්; **යුගන්ධරකුච්ඡියං**, යුගඳුරු කුස්හි; **සාගරනිග්ඝොසකාලො විය**, මුහුදු හඬ පවත්වන කලක් මෙන්; **එකරත්තෙනෙව**, එක රැයින් මෙ; **නෙමිවට්ටිං**, නිම්වළල්ල; **පුරෙ පාතරාසමෙව**, පෙරවරු බත්මැ; **සඤ්ජනනං**, ගැලුණු; **මාලාජටං**, මල් අවුල්; **පණිහියා**, විළිබින්; **වාලුකාපුලිනෙ**, වැලිතෙලෙහි; **මොලියා සද්ධිං**, මිණි සිළු හා සමඟ. හිසකේ වැටියෙහි අලඞ්කාර පිණිස පැලඳගත් තා චූඩාමාණික්‍යය මෙතැන මෞලි නම් වෙයි; නොහොත් එනම් ආභරණ විශෙෂයෙක් හෝය-ඒ හා සමඟය යනුයි. **චූළං**, හිසකේසිළ-හිසකේ වැටිය යනුයි; **සීසං අල්ලීයිංසු**, හිඳිකටු සේ උස්ව නොසිට හිස්හි එබී සිට ගත්හ යනුයි; [7]**චූළාමණිවෙඨනං**, මිණින් වෙළූ සිළ-මිණි සහිතවූ හිසකේ සිළිය යනුයි.

**වරගන්ධවාසිතං**, උතුම් සුවඳින් වැසගන්වනලද; **මොලිං**, සිළුමිණියෙන් අලඞ්කාරවූ කෙස් වැටිය; **සහස්සනෙත්තො**, දහසක් නුවණැස් ඇති-ජන දහස් එව් තෙපුල් දහස්තෙන් පුළුවුත් පැන සිටි පියේ සිට කියන නුවණ ඇත්තාවූය යූ තැන්. **එකං බුද්ධන්තරං** යනුයෙහි බුද්ධාන්තරයෙක් නම් දහසක් හවුරුද්

1 සද්ද A E F. 2 අසංහරණීයං-මු. අ. සා. 3 අස්සජි A. අස්රජ්ජු E. 4 සුමන පටට-මු. අ. සා. 5 සමන් පිළිවියන් B D. 6 පසුපස්සෙහි ඇවිද්දෝ C. 7 චූඩාමණි වෙඨනං A C D E.

දෙන් අඟලක් වඩනා පොළොව එක් යොදුන් තුන් ගව්වක් කච්චලයේ වැඩෙන කලි. **ජරං** [1]**අපතෙනන**, [2]නොනටුවාවූ; **බන්ධනං**, [3]කහබහන්; **සුත්තසොගස්ස**, මහණුයමැ පුතුවූ; **අරහද්ධජං**, අභිධ්වජ නම්වූ කහවත්; **මාතාපිතුනනං** යනාදියෙහි **මාතා** යනු මහාමායා දේවීන් බොධිසත්ත්වයන් උපන් සත්දවසින් සැව දෙව්ලොව උපනද මහාපජාපතිගොතමීන් ගෙන කිහු. **සපදානං**, ගෙපිළිවෙළින්; **භගෙන**, යනු උවසර නොයුත් අමතුන්; **නිමුජ්ජිත්වා**, කිමිද-ගැලීය යනුයි; **සංහරිත්වා**, අවුළා; සිහා-එක් කොට ගෙනය යනුයි; **අන්තානි**, අතුනු හෙවත් බඩවැල්; [4]**පරිවත්තිත්වා**, ඉදිර; [5]පෙරළී එව්; **අප්පටියමානො**, පිළිකුල් කරන්නේ; **නානග්ගරසෙහි**, මධුරාමලතික්තකටුකකෂායලවණය යන නත් කොටස් ඇති රසයෙන්; **ආළාරකාලාමං**, කාලාම නම් ආළාර තාපසයන් කරාද; **උද්දකඤ්ච රාමපුත්තං**, රාමපුත්‍ර නම් උද්දක තාපසයන් කරාද; **සමාපත්තියො**, ආළාරකාලාමහු තිසා ආකිඤ්චඤ්ඤායතන උද්දකරාම්පුත්හු තිසා නෙවසඤ්ඤානාසඤ්ඤායතන නම් ඇති අරූ සමවතුන්; **අනලංකරිත්වා**, [6]ආදර නොකොට; **ථාමවිරියසඤ්ඤසනත්තං** යනුයෙහි **ථාම** නම් කායිකවීය්‍ර්‍යය; **විරිය** නම් චෛතසික වීය්‍ර්‍යයයි; **පරිවෙණ**, වෙහෙර අඟණ මළු. **එකතිලතණ්ඩුලාදීහිපි**, දවසකට එක තලඇටක් එක සාලැටක් ආදී අනුභවකිරීමෙන්; **උපසංහරමානා**, එළවන්නවුන්- ශරීරයට ප්‍රවෙශ කරන්නවුන්ය යනුයි; **පරමකසිමානප්පත්ත**, වෙසෙසින් කෘශභාවයට පැමිණි; **අපෙපකද**, එක් කලෙක; **අප්පාණකං ඣානං**, ආශ්වාසප්‍රශ්වාස නැති කොට ධ්‍යානය කරන බැවින් අප්පාණකයයි කියනලද ධ්‍යානය; නොහොත් **අප්පාණකං**, ආශ්වාස ප්‍රශ්වාස නැති කොට; **අභිතුදෙන්තා**, මඩනාලද්දේ; **ආකාසෙ ගණ්ඩිකරණකාලෙ විය**, අහස පොළොව් ගැටලන කලක් පරිද්දෙන්—නිරතුරුයෙන්ය යූ තැන්; **ආහාරෙතුං**, අනුභව කරනු පිණිස; **ගාමනිගමෙසු** යනුයෙහි **ගාම** නම් ක්‍ෂුද්‍රග්‍රාමය, **නිගම** නම් අංගාණි ඇති මහා ග්‍රාමයි; **බාහුලිකො එස**, මෙතෙම ප්‍රත්‍යය බහුල කොට ඇත්තේය; නොහොත් චීවරාදි ප්‍රත්‍යය බාහුල්‍යය පිණිස පිළිපන්නේය; **පධානවිබ්භන්තො**, වීය්‍ර්‍යයෙන් පිරිහුණුයේය; **සිසංනහායිතුකාමස්ස**, හිසින් නහනු කැමැත්තක්හුගේ-හිස් සෝධා නහනු කැමැත්තක්නුගේය යනුයි; [7]**උස්සාවබින්දුතක්කානං විය**, පිනිබිඳු තකීණයක් වැන්න—පිනිබිඳුයෙන් නහම්යි සිතීමක් වැනිය යනුයි.

---

1 අපපතෙනන-මු. අ. ක. 2 නොනවටුවාහු A. නොනටුවාහු B D. 3 කහබත් A. 4 පරිවතෙතත්වා A. 5 පෙළී C E F. 6 ආදරකොට A E F. 7 උස්සාවබින්දුතක්කා-විය-හැම

**සෙනානිනිගමෙ**, එතැන [1]සෙනාඞග සිටි බැවින් එව් සුජය පියහු සෙනානීහු ගම් බැවින් එව් එනම් තියම් ගම්හි; **ලට්ඨිමධුකවනෙ**, වැල්මී වනයෙහි; **චරාපෙත්වා**, කවා; "චර—ගතිභක්ඛණයොඃ" යන ධාතුයි. **පඤ්චධෙනුසතානි** යනුයෙහි ධෙනුශබ්දයෙන් මෙතැන වැස්සන් කියනු. **අඩ්ඪතියානීති**, දෙසිය පනසක් දෙන පොවායයි. ආදි දහසක් දෙනුන් වැල්මී වනයෙහි කවා ඔවුන්ගේ කිරි පොවා පන්සියයක් වැස්සන් වැඩූහ. උන් වැඩුණු කල උන් නැවත වැල්මී වනයෙහි කවා ඒ පන්සියයක් දෙනගේ කිරි දෙසිය පනසක් පමණ වැස්සන් පෙවූහයි යනාදි ක්‍රමයෙන් ගතයුතු; නොහොත් වැස්සන් නොගෙන දෙනුන්මැ හෝ ගතයුතුයි. **ඛීරපරිවත්තනං නාම අකාසි**, යනුයෙහි ක්ෂීරපරිවර්තන නම් ඒ දහසක් දෙනුන්ගේ කිරි පන්සියයක් දෙනුන් පෙවීම් ආදීන් කල ක්‍රියාවයි. **දුහාපෙසි**, දෙවූ; "දුහ—ප්‍රපූරණෙ" යන ධාතුයි. **ථනමූලං**, තනය සමීපයට; **එකබින්දුමපි**, එක පෙණකුදු; නොහොත් එක බිඳුවකුදු; **අලාතානි**, පෙණෙහෙලි; **සමානෙන්තා**, ඇතුළ ලන්නේ—ලිප ඇතුළට අනන්නේය යනුයි; **උපකප්පන**, එළඹියයුතු නොහොත් අනුභවයට යොග්‍යවූ; **දණ්ඩකබද්ධං**, දඬුවැල් බැ; **මධුපටලං**, සන මී වදයක්; **කබලෙ කබලෙ**, ආලොපයෙහි ආලොපයෙහි; **දෙවට්ඨානං**, දෙවාලය.

**පඤ්ච මහාසුපිනෙ දිස්වා** යනුයෙහි පඤ්චමහා ස්වප්න නම්:—මහපොළෙෝ ශ්‍රීයහන් විය, හිමවත කන්වයින් විය, වමත පූර්ව සාගරයෙහි පිහිටියේය, දකුණත පශ්චිම සාගරයෙහි පිහිටියේය, ශ්‍රීපාදද්වය දකුණු සාගරයෙහි පිහිටියේයි, මේ පළමුවන ස්වප්නයයි. [2]තිරියා නම් තෘණජාතියෙක් නාභියෙන් නැඟී ආකාශයෙහි ගැසී සිටියේයි. මේ දෙවන ස්වප්නයයි. ජාතියෙන් සුදුවූ කළුවූ හිස් ඇති පණු ජාති කෙනෙක් පත්ලෙහි පටන් ගෙන දණ දක්වා නැංගාහ. මේ තුන්වන ස්වප්නයයි. පක්ෂි සතර දෙනෙක් නන් නන් වර්ණ ඇත්තාහු සතර දෙසෙන් අවුත් පාමුල්හි හෙව සර්වාඞගයෙන් සුදුබවට පැමිණියහ. මේ සතරවන ස්වප්නයයි. බොධිසත්ත්ව අවස්ථායෙහිමැ සිටියාහු අශුචි පර්වතයක් මතුයෙහි සක්මන් කළහ. මේ පස්වන ස්වප්නයයි. මේ පඤ්චමහාස්වප්න නම් වේ.

**උබ්බෙගප්පත්තා හුත්වා**, භ්‍රාන්තබවට පැමිණියාවූ; **පත්තභාජනං ආවජ්ජෙසි**, කිරිපිඩු පිසූ බඳුන අධොමුඛ කොට රන් තළියට බලා නැමූ; **පටිකුජ්ජිත්වා**, පියාලා; නොහොත් වසාලා;

1 සෙනඟ C. 2 කිරිය A D F. ක්‍රිය B. ක්‍රියා E.

**වසනෙන**, හෙළ දුහුලින්; **ගන්ධපුප්ඵවාසිතං**, සුවඳ මලින් වාසිත කරන ලද; **ඔලොකෙසි**, මේ රන්තළියත් එසේම මට දුන්නේද්ද හෝ නුදුන්නේද්ද හොයි දුන් බව නුදුන් බව දන්නා පිණිස බැලූ; **ආකාරං**, බොධිසත්ත්වයන් ඒ රන්තළිය තමන්ට දුන් බව නුදුන් බව දන්නා පිණිස බැලූ ආකාරය; **පුරාණ [1]පණ්ණං විය**, පරඬලා පතෙක්හි මෙන්; **[2]සරිරවළඤ්ජං**, ශරීරමල; **පටිසොතං**, උඩුහෝ බලා; **අනුසොතං**, යටිහෝ බලා; **සොතං**, දියසිළු; **[3]මජ්ඣමජ්ඣට්ඨානෙනෙව**, දෙඅසට නොගොස් මැදින් මැදින්මැ; **ආවත්තෙන**, සළා වැටූ මෙක්හි; **නිමුජ්ජිත්වා**, ගැලී ගොස්; **අනෙකෙහි පදසතෙහි**, නොඑක් පදසියෙන්-නොඑක් සියපෙදෙන යූ තැන්; **වණ්ණවතො**, තුවටුයෙන්; **පටිපථෙ**, අභිමුඛයෙහි; **ඔසීදිත්වා**, ගැලී; **නාගියා පතිට්ඨිත**, නැබින් තුබූ; **නෙවජ්ජමහති**, නොද එබෙන්නේය; **කිලෙසපඤ්ජර**, කෙලෙස් නැමැති මැදිරිය; **පොත්ථකාරො වා**, [4]වැළි පෙත්කරුවෙක් වේවයි; **ආලිම්පිතුම්පි**, ලියන්නටද; හෙවත් අඳනටද. 'අපි' ශබ්දයෙන් "කාතුං ච"යි ගන්නේ. **අවසිස්සන්තු**, අවශෙෂව යේවයි; **අපරාජිතපල්ලඞ්කං**, කාත් විසින් පරාජය කොටපිය නොහැකි පර්‍යඞ්කය—අසරම්ණීය යනුයි; **ආභුජිත්වා**, බැඳගෙන.

**මාරො**, තමා විසා ඉක්මෙන්නට පිළිපන් සතුන් මරායි මාර නම්වූ මර; **උඩ්‍රියන**, [5]ඉදිරියෙන නොහොත් පැළියන; **දියඩ්ඪයොජන[6]සතිකං**, යෙළසියයක් යොදුන් පමණ; **[7]නානායුධානි**, අසි සත්ති තොමර කණය තමපත [8]හෙණ්ඩිවාළ එරපු ධනු චක්‍ර කුන්ත [9]මූෂ්ඨිවජ්‍ර අෑ තත් ආයුධ; **නානප්පකාරමුඛා**, සිංහමුඛ ව්‍යාඝ්‍රමුඛාදි නානාප්‍රකාර මුහුණු ඇත්තාහු; **ධමමානො**, පුම්නේ; **අභිරෙත පදසතෙන**, බුද්ධගුණ ප්‍රතිසංයුක්ත වූ නොඑක් සිය ගණන් දහස් ගණන් පෙදෙන්; **භාතා වා**, මල්බෑයෙක් එව්; **පුට්ඨ [10]පරිජනසදිසා**, [11]පිරිමැදි හෙවත් පිරිමට මෙහෙකරුවන් වැන්නහ; **එලකං කත්වා**, පිළියක්-නොහොත් පලගයක් කොට; **වාතමණ්ඩලං**, වා සළා; **පදලෙත්වා**, හිරා-බිඳය යූ තැන්. **උම්මූලෙත්වා**, මුලින් උපුටා; **අජ්ඣොත්ථරිත්වා**, මැඩ ගලා [12]කුබුස්වා; **උස්සාවබින්දුමත්තට්ඨානම්පි**, පිනිබිඳෙක් සා තැනකුත්—පිනිබිඳෙකින් තෙමුණු තැනක් පමණ තැනකුත්ය යනුයි; **පහරණවස්සං**, ආයුධවර්‍ෂාවක්; **එකතොධාරා**, එක් දිසා

1 පතෙත C. 2 සරීරවළඤ්ජා-මු. අ. ස. 3 මජ්ඣමජ්ඣට්ඨානෙනෙව A B D F. 4 වැලිපෙම්කරුවෙක්-හැම. 5 ඉදිරෙහා A. 6 සතියං B C D. 7 නානාවුධානි-හැම. 8 සිඛිවාළ A. හෙඬිවාල B. 9 මූසඞ්ඨිවජ්‍ර A. මූෂ්ඨ F. 10 පරිවන A B D F. 11 මේ පාඨය විමසිය යුතුයි. 12 බුස්වා B C E F.

යෙකින් මුවහත් ඇති; **උභතොධාරා**, දෙදිසායෙන් මුවහත් ඇති; **අසි**, කඩුය; **සත්ති**, අඩයටිය; **ඛුරප්පාදයො**, මැඩහඟු දුනු ශර ආදීහු; **කුසකුලවස්සං**, හුණ[1]හළු වර්ෂාවක්; **චතුරඞ්ග**, සත වතළැව්, මධ්‍යම යාම, ගුණපොහො, මහාමෙඝ යන මේ සියුරඟින්; **පඤ්චමහාපරිච්චාගා**, අඞ්ගපරිත්‍යාගය, ධනපරිත්‍යාගය, පුත්‍රපරිත්‍යාගය, දාරපරිත්‍යාගය, ජීවිත පරිත්‍යාගය යන මේ පස් මහා පරිත්‍යාගයෝ; **ඛුරධාරං**, කර මුවහත් ඇති—කර මුවහත් වැනිවූ මුවහත් ඇතිය යනුයි; **වංසකළීරෙ විය**, හුණ කිළිල්මෙන් කොට; **ඝිඤ්ඤනතං**, කපමින්; “ඡිඤ්ඤනතං” යනුත් පාඨයි—කපමින්ය යනුමැ අර්ථයි. **ගීවං**, කඳට; “ගෘ-නිගරණෙ”-“ගිරත්‍යන්නපානමිති ග්‍රීවා” යනු වේ. **දිනනභාවං**, “දිනන භාවෙ” යී තැන්; **කො සක්ඛිති**, කවරෙක් ශක්ති දැයි-නොහොත් කවරෙක් දෙස්දැයි; **අවත්ථරමානා විය**, වැතිරෙන්තියක මෙන්—මඩින්තියක මෙන්ය යු තැන්, ගලන්තියක මෙන් එව්. **ජණ්ණුකෙහි පතිට්ඨාසි**, දණෙන් පිහිටි; **විදිසා**, අනුදිසායෙහි.

**සිරිමතො**, නුවණ ඇත්තාවූ—නොහොත් රූ ඇත්තාවූ; **පාපිමතො**, පාපිවූ; “පාපං ඉච්ඡතීති පාපිමා” යනු වේ. **මහෙසිනො**, සර්වඥයාහට; **තාදිනො**, තාදිගුණෙන් යුත් බුදුරජහට; **ධරමානෙ යෙව සුරියෙ**, හිරු අස්තයට නොයන තෙක්ම, **විධමිත්වා**, පරාජය කොට; [2]**රතනපවාලදලෙහි විය**, රත්පබළු පෙත්තෙන් මෙන්—නොහොත් පබළුසැබැල්ලෙන් මෙන්; **පුබ්බෙනිවාසඤාණං**, පෙර විසූ කඳපිළිවෙළ දන්නා නුවණ; **දිබ්බචක්ඛුං**, දිවඇස් නුවණ; **වට්ටවිවට්ටවසෙන**, “අවිජ්ජා පච්චයා සඞ්ඛාරා”යි කියා මෙසේ කම්වට විවාවට කෙලෙස්වට විසින්ද “අවිජ්ජානිරොධා සඞ්ඛාරනිරොධො”යි කියා මෙසේ නිර්වාණසඞ්ඛ්‍යාත විවට විසින්ද; **ද්වාදසක්ඛත්තුං**, දෙළොස් පදයට දෙළොස් වටෙක්හි; **ධජානං පටාකානං**, ධජාදීහු; ධජ අක්ය යනුයි. **ඵලපිණ්ඩිභාර**, පක්කැන් බරින්; **දණ්ඩකපදුමානි**, [3]සත්බුමු මහපියුම්; [4]**අනුබන්ධනාදීනි**, අඳුබැඳුම් ආදීහු.

**පුනප්පුනං ජාති දුක්ඛා ඉති**, නැවත නැවත ජාති දුකැයි; **ගහකාරකං**, ශරීර නැමැති ගෘහය කරන තෘෂ්ණා නැමැති වඩ්ඩකීහු; **ගවෙසන්තො**, සොයන්නෙයිම්; **අනිබ්බිසං**, මෙතෙක් කල් ඔහු නොදක්නෙයිම්; **අනෙකජාතිසංසාරං**, නොඑක් ජාති සමූහ ඇති සසර; **සන්ධාවිස්සං**, අනුව දිව්මි—ඇවිද්දෙම් යනුයි.

---

1 අළු A. 2 රතනපවාලකලෙහි A B F. 3 සත්බොමු A. 4 අනුබන්ධනාදිනි, අනුබැඳුම් ආදිහු C.

ගහකාරක, තෘෂ්ණා නැමැති වඩුව; දිට්ඨොසි, මා විසින් දක්නා ලදහි; පුන ගෙහං න කාහසි, නැවත ශරීර නැමැති ගෙය නොකරන්නෙහි; තෙ, තාගේ; සබ්බා ඵාසුකා, සියලු කෙලෙස් නැමැති පරාලහු තාක්; භග්ගා, බිඳපියන ලදහ—නොහොත් බිඳුණාහ; ගහකූටං, [1]සිරුරු නැමැති ගෙහි අවිද්‍යා නැමැති කැණිමඩලද; විසඞ්ඛිතං, විහිඳුනා ලද-විසුරුවනලද; විසඞ්ඛාරගතං චිත්තං, සිත තෙමේ නිවන් අරමුණු කෙළේය; තණ්හානං ඛයං, තෘෂ්ණාක්ෂයට; අජ්ඣගා, පැමිණියෙමි-අර්හත් ඵල පිළිලදිමියි යනුයි—නොහොත්; තණ්හානං ඛයමජ්ඣගා, අරමුණු [2]කරන විසින් නිවනට ගිය සිත් රහත්ඵල පිළිලදුයි සිත් මත්තේ ලබම්වා කියත්මෙ.

## අවිදූරෙ නිදානං.

සාවත්ථියං, [3]සවසත රුසිහු වුසු තැන කල බැවින්ද ලේ වැගිරෙන ඇට ගිජුහු ගෙන නුවර බිම් ගන්නා තැනට ආ බැවින් ද යන මේ ආදි කාරණයෙන් සාවත්ථි නම් නුවරෙහි; වෙසාලියං, තුන් යලක් පවුරු පිරිවටා මහත් කල බැවින් වෙසාලි නම්වූ නුවරෙහි; කූටාගාරසාලායං, වැඹහිස් ලා [4]කුළාරගේ සෙයින් කල කිළි ඇති වෙහෙරෙහි; සංකප්පා, සජීඅතාඅත යට [5]පමුණු මැදට යන මාගේ සඞ්කල්පනාවෝ; එකපල්ලඞ්කෙන, ආසනය නොඋදුරා ඇවිලවූ එක් පලඟින්; විමුත්ති සුඛපටිසංවෙදී, විමුක්ති සුව ඵලසමවත් සුව විඳිනෝ; ඊසකං, මඳක්. "ඉමස්මිං වත මෙ පල්ලඞ්කෙ" යන තැනට "නිසිනෙන ත" යන්නක් අධ්‍යාහාර කරනු. පල්ලඞ්කං කිය ආසනයත් බොධියත් ගෙන කිහු. අනිමිසෙහි, නිමෙෂ රහිතවූ—ඇසිපිය නොහෙළූ; හෙවත් නොහෙළූ ඇසිපිය ඇති; ඇසිපිය නොහෙළාය යනුයි. අනන්තනයං, අනන්තවූ නය ඇති; සමන්තපට්ඨානං, ඒ නැමැති ප්‍රකරණය; සත්තන්නං පන පකරණානං,

> "ධම්මසඞ්ගණී විභඞ්ගඤ්ච කථාවත්ථුං ච පුග්ගලං
> ධාතු යමක [5]පට්ඨානමභිධම්මොති වුච්චති" යි.

කී සත් ප්‍රකරණයන්. නන් ප්‍රභෙදයෙන් බුන් අර්ථයෝ [6]ප්‍රකාරයෙන් කියනු ලැබෙත්නුයි යථොක්ත ධම්මසඞ්ගණී ආදි ප්‍රකරණ නම් වේ. උභොපෙතෙ පරියායා, මේ දෙපලම; අප්පාල, එළුගොවුවන් හිඳුනා; ඛන්ධාරාපෙතො, සිදුරු සොයන් නෙම්; බලිනං, වරදක්; මම වසං, මාගේ ආඥව; සොළස ලෙඛා,

1 සිරිරු D. 2 කරණු O. 3 සවසති A. 4 කූටාකාරගින් B E F. 5 'පමුණු මැදට යනු විමසිය යුතුයි. 6 පට්ඨානං අභිධම්මොති A B. 7 ප්‍රකාශයෙන් ABEF.

සොළොස් හිරක්; [1]**ආඛණ්ඩි** [2]ඇන්දේ; **ඉන්ද්‍රියපරොපරිය ඤාණස්ස**, සද්ධින්ද්‍රියාදි ඉඳුරන්ගේ ලා මුහුකළ බව දන්නාවූ ඤාණයාගේ; **ආසයානුසයඤාණස්ස**, ආසයානුසයඤාණයාගේ. ආසය නම් පෙර පුරුදු කාරණයෙන් ආසෙවනප්‍රත්‍යය ලදින් ශාශ්වතොච්ඡෙදාදි මිථ්‍යාදෘෂ්ටි හා ඛන්තිසොරච්චාදි සානුලොම සම්‍යක් දෘෂ්ටි ගන්නට සුදුසුවූ සත්ත්වසන්තානය. අනුසය නම් මූෂිකාවිෂයක් සෙයින් ප්‍රත්‍යය ලද කල්හි උපදනට තිබූ [3]කෙලෙසය. මේ දෙක දන්නා නුවණ ආසයානුසයඤාණ නම්. **විලිම්බමානං**, හිරිහදනහු; **අම්මා**, දූරියෙනි; **පාදෙ තෙ සමණ පරිචාරෙමාති**, මහණ, තාගේ ශ්‍රීපාදයෙහි මෙහෙ කරම්හයි; **උපධිසඞ්ඛයෙ**, නිවන්හි නොහොත් මාර්ගඥානයෙහි; [4]**විමුත්තමානසො**, අධිමුක්තවූයේ, මිදුණාවූ-කෙලශවිනිර්මුක්තවූ සිත් ඇත්තේ; **විවෙකසුඛඤ්ඤෙව**, රහත්ඵලසුවමෙ; **උච්චාවචා**, නොඑක් සෙයින් පවත්නාහ; **සතං සතං**, කුමාරි අවිජාත සකිංවිජාතාදිවූ අවස්ථාන්තර වෙෂයෙන් එකක් එකක්මැ එකවටම තමාගේ ආත්මභාවය [5]කුමාරිකාදි වෙන වෙන වෙසින් සියක් සියක් කොට. කුමාරිහු නම් දෙළොස් ඇවිරිදි ස්ත්‍රීහුයි. අවිජාත ස්ත්‍රීහු නම් දරුවන් නොවැදූවෝයි. සකිංවිජාත ස්ත්‍රීහු නම් එක්දරුමාවෝයි. දුවිජාත ස්ත්‍රීහු නම් දෙදරුමාවෝයි. මහිත්ථිහු නම් මැහැලි ස්ත්‍රීහුයි. **යථා නං**, "යථා"යි තැන්. "යථා-පෙ-විමුත්තො න විලොකෙති තථායං භගවාපි න ඔලොකෙසි"යි යු තැන්. **අවීතරාගාදීනං** යන්නෙහි ආදි ශබ්දයෙන් [6]අවීතමොහාදීන් ගතයුතු.

**යස්ස ජිතං**, යමක්හු විසින් දිනනලද රාගාදි කෙලෙස්—නොහොත් යමක්හු දිනූ රාගාදි කෙලෙස්; **නාවජීයති**, නැවත [7]දිනනු නොලැබේද-නොහොත් "යස්ස" යනුයෙහි ෂෂ්ඨී ප්‍රථමාර්ථයෙහි දක්නේ. "ජිතං" යනුයෙහි ප්‍රථමා තෘතීයාර්ථයෙහි දක්නේ. "යො ජිතෙන නාවජීයති" යි තැන්. එහෙයින්-**යස්ස ජිතං**, යමෙක් තමා විසින් පරදවන ලද කෙලෙස්හු විසින්; **නාවජීයති**, නැවැත පරදවනු නොලැබේද-යම් සර්වඥයෙක් බෝමැඩහි පරයනලද සියලු කෙලෙස් සතුරන් විසින් නැවැත නොපරදවනු ලැබේද යු තැනි. **ජිතං**, දිනනලද-හෙවත් පැරදූ; **කොචි**, කිසි එක් කෙලෙසකුදු; **ලොකෙ**, ලොකයෙහි; **අස්ස**, මෝහට; **නො යාති**, අනුව නොපවතීද—දිනනලද යම්කිසි එක කෙලෙසක් මේ සර්වඥයන් අනුව මොහුගේ සන්තානයෙහි නොපවතීද යනුයි. **අනන්තගොචරං**, අනන්ත අරමුණු සර්වඥතාඥානයට

1 ඛණ්ඩි-මු. අ. ක. 2 ඇද්දේ A. 3 සොලෙස B F. 4 විමුත්තිමානසො A B F. 5 කුමාරිකා විලසින් C. කුමාරිකාදි විලසින් E. 6 අභීතමොහාදීන් A B F. 7 දිනනු ලෑබේද A B. දන්නා ලෑබේද F.

විෂයකොට ඇත්තාවූ; **අපදං**, රාගාදි ක්ලේශ සංඛ්‍යාත පද රහිත වූ; **තං බුද්ධං**, ඒ සර්වඥයා; **කෙන පදෙන**, කවර කෙලෙස් පිය වරින්–හෙවත් රාගාදි ක්ලේශ සංඛ්‍යාත කවර නම් පදයකින්; **නෙස්සථ**, ගෙන යවුද හෙවත් තොප වසඟ කරවුද.

**යස්ස**, යම් සර්වඥයක්හට—නොහොත් යම් සර්වඥයක්හුගේ; **කුහිඤ්චි නෙතවෙ**, කිසි යම් භවයෙක්හි ගෙනයන්නට–කිසියම් භවයකට ගෙනයන්නට නිසිවූය යනුයි. **ජාලිනී විසත්තිකා තණ්හා**, ජාලිනීය විසත්තිකා යයි කියනලද තෘෂ්ණා තොමෝ; **නත්ථි**, නැත්ද; හෙවත් ප්‍රහීණද. තෘෂ්ණා තොමෝ දැලක් වැනි හෙයින් ජාලිනී නම් වෙයි. සියලු සත්ත්වසන්තානයෙහි පැතිරෙන හෙයින් විසත්තිකා නමුදු වූ.

**රාගෙන**, රාගය හෙතුකොටගෙන; **සුවානයො**, සුවසේ ගෙන ගිය හැක්කේ; **න**, නොවේ—තමා වසඟකොට ගතහැක්කේ නොවේ; **මුචලින්දමූලං**, මිදෙල්රුක්මුලට. හේ මුචලින්ද නම් විල්තෙර වූයේයි. **සත්තාහං**, සතියක්; **වද්දලිකාය උප්පන්නාය සති**,[1] වදල ඇතිවූ කල්හි; **භොගෙහි**, දරණ [2]වැලින්; **රාජායතනං**, කිරිපලු රුක්මුලට; **අගදහරීටකං**, එකෙණෙහි දෙස් හරනට නිසිවූ අමා අරළු; **සරීරවලඤ්ජං අහොසි**, සිරුරුමල ශුද්ධ වී; **උක්කලා**, එනම්වූ; **ඤාතිසාලොහිතාය**, ඉක්බිති ජනම යෙහි නෑවූ; **සකටනිරුම්භිත්වා**, වළකා—බුදුන්ට ආහාර දෙන පිණිස තමාගේ ආනුභාවයෙන් ගැල් වළකා නොයාහැකි පරිද්දෙන් කොටය යනුයි. "සත්ථු ආහාර [3]සම්පාදනෙ" යනාදියෙහි දෙවතා පසුව වෙළඳුන්ට [4]සාදෘශ්‍යයෙන් පැනී සර්වඥයන්ට ආහාර දූනයෙහි වෙළඳුන්ට උත්සාහජනනය කළැයි දතයුතු. **මන්ථං ච**, බදහත්ද හෙවත් හත්සුනුද; **මධුපිණ්ඩිකං ච**, සකුරු ගිතෙල් මී යොදා කළ බදහත්ද; **මුග්ගවණ්ණෙ සෙලමයෙ**, මුංවන් සලමුවා; **පච්චග්ඝෙ**, වෙන වෙන මා ඇගිවූ, නොහොත් එකෙණෙහි උපන්—නොහොත් වෙන වෙන පැතෙන මුවවිටි ඇත්තාවූ; **ද්වෙවාචිකඋපාසකා අහෙසුං**, සඞ්ඝරත්නය තව ලොකයෙහි නොඋපන් බැවින් "බුද්ධං සරණං ගච්ඡාමි, ධම්මං සරණං ගච්ඡාමි"යි කියා මෙසේ දෙතෙප්ලෙන් දෙවිටෙක වාග්භෙද කොට දෙසරණ ගිය උපාසක වූහු; **පරිචරිතබ්බට්ඨානං**, පූජනීය වස්තුවක්; **බුද්ධානං ආවිඤ්ඡණා**, හැම බුදුන්ටම පුරුදු වූ හෙවත් හැම බුදුන් විසින්මෙ පුරුදු කරන ලද. "විතක්කො" යනු හා සම්බන්ධ කරනු. **ධම්මො**, චතුස්සත්‍ය ධර්ම; **සත්තාහ**

1 ඔලද-හැම. 2 වලින්. A 3 දනෙ A. 4 සදෘශයෙන්.

**කාලඤ්ඤුභාවං** එතැනට මල සත්දවසක් බවු; **අභිදොසෙ**, රෑ මැදුම් යම්හි; **මනසිකාරං කත්වා**, සිහිකොට—නොහොත් සිහි එළවා—නොහොත් සිහි උපදවා; **මිගදායෙ**, මුවන්ට අභය දුන් තැන්හි; **ආවත්තිත්වා**, වැටී—පැවතය යනුයි. නොහොත් ව්‍යාවෘතවූ—නියුක්තවූ යනුයි; **ආසනාභිහාරං**, ආසනදීම් මාත්‍රයකට, නොහොත් අසුන් පාවාදීම් මාත්‍රයකට; **අනොදිස්සක වසෙන**, හැම සත්‍වයන් කෙරෙහි පැවැත්වීම් වශයෙන්; **ඔදිස්සක වසෙන**, පස්දෙනා නිසා පැවැත්වීම් වශයෙන්; **පච්චුට්ඨානාදීනි**, දූක හුනස්නෙන් නැඟීම් ආදිවූ; **සමුදාචරන්ති**, පවතිත්—නොහොත් බැවහාර කෙරෙත්. **ධම්මචක්කප්පවත්තනසුත්තන්තං** යනුයෙහි **ධම්මචක්ක** නම් බොධිපය්‍යඞ්කයෙහි හුන්නාහට උපන් ද්වාදශාකාර ආදීවූ ත්‍රිවර්ත්‍ය ඥානයද ඉසිපතනයේ හුන්නාහට උපන් ද්වාදශාකාර පරිපූර්ණවූ දෙසුන් පැවැත්වූ දෙශනා ඥානයද ධම්මචක්ක නම් වේ. **පඤ්චමියං පක්ඛස්ස**, පක්ෂයා සම්බන්ධිවූ විසේනිය ලද දවස්; **නිබ්බිජ්ජිත්වා**, සසර කල කිරී; [1]**කප්පාසිකවනසණ්ඩෙ**, කැප්පැටිය වනයෙහි; **භද්දවග්ගිය කුමාරෙ**, යහපත් හෙයින් භද්‍රවූ සමූහව ගෙන ඇවිදිනා හෙයින් වගවූ කුමාරවරුන්; **අඩ්ඪුඩ්ඪානි පාටිහාරියසහස්සානි**, තුන්දහස්පන්සියයක් පමණ ප්‍රාතිහාර්‍ය්‍යයන්; **ගයාසීසෙ**, ගයා නම් හෝ හිස; **ආදිත්තපරියාය දෙසනාය**, "සබ්බං භික්ඛවෙ ආදිත්තං" යනාදි දෙශනායෙන්; **රාජගහනගරූපචාරෙ**, රජගහා නුවර සමීපයෙහි; **ලට්ඨිවනුය්‍යානං**, යටක්සේ උඩ වැඩුණු අඹගසක් ඇති හෙයින් හෝ නොහොත් තල්ගස් ඇති හෙයින් හෝ නොහොත් වැල්මී ඇති හෙයින් ලට්ඨිවන නම් උයනට; **ද්වාදසනහුතෙහි**, එක්ලක්ෂවිසිදහසක් පමණ. නහුතයෙක් නම් දසදහසෙකි. **සිරසා නිපතිත්වා**, මුඳුනෙන් පුදා වැඳ; **චෙතසා චෙතොපරිවිතක්කමඤ්ඤාය**, සිතින් සිත් දැන.

**උරුවෙලවාසී**, උරුවෙල්දනවු වැසි; **කස්සප**, කාශ්‍යප යෙනි; **කිසකො**, තවුසන්ට; **ඔවදානො**, අනුශාසනා කරන්නේ; **කිමෙව දිස්වා**, කුමක් නම් දැක; **අග්ගිං** [2]**පහාසි**, වහ්නිපූජා හළද; **තව**, තා විසින්; **අග්ගිහුත්තං**, වහ්නිපූජා.

**රූපෙ ච**, රූපයන්ද, **සද්දෙ ච**, ශබ්දයන්ද; **අථො**, නැවැත; **රසෙ ච**, රසයන්ද; **ඉත්ථියො චාපි**, ස්ත්‍රීන්ද—නොහොත් ප්‍රෂ්ට; ව්‍යයන්ද ගන්ධයන්ද; **කාමෙ**, යථොක්ත මේ පඤ්චකාමයන්; [3]**යඤ්ඤා අභිවදන්ති**, යාගයෙන් [4]සමහව වෙතී යන්නාහ. යාග

1 කප්පාසියවනසණ්ඩෙ C. 2 ඔපහාසි BEF. 3 යඤ්ඤං A B D F. 4 සමහවෙති-හැම.

මෙතැන වහ්නිපූජාදීහුයි. **එතං**, මේ සියලු පඤ්චකාමය; **උපධීසු**, ස්කන්ධොපධීන් කෙරෙහි; **මලන්ති**, ස්කන්ධයන් කිලුටු කොට නරකාදියෙහි හෙළන හෙයින් මලයයි කියා; **ඤත්වා**, දැන; **තස්මා**, ඒ කාරණයෙන්; **යිට්ඨෙ**, යාගයෙහි; **හුතෙ**, වහ්නිපූජායෙහි; **න අරඤ්ජිං**, නොඇලිණිමි.

**අරහාති මඤ්ඤමානො**, මම රහත්මියි සිතන්නාවූ; **දිට්ඨිජාලං**, දෘෂ්ටිසමූහය නොහොත් දෘෂ්ටි නැමැති දැල; **පඤ්චඅස්සාසකෙ**, "අභික්කන්තං භො ගොතම" යනාදීන් කියනලද පස් අස්විසිලින්.

**පුරාණජටිලෙහි** යනු උරුවෙල් කසුප් ආදීන් අවක්සාති වෙත්; **සිඞ්ගීනික්ඛසුවණ්ණො**, උකා නහා ගත් [1]රන් නික කට බදුවූ ශරීර වර්ණ ඇති; **දසවාසො**, "පඤ්චඞ්ගවිප්පහීනො හොති — ඡළඞ්ගසමන්නාගතො— එකාරක්ඛො— චතුරාපස්සෙනො— පනුන්නපච්චෙකසච්චො— සමවයසට්ඨෙසනො — අනාවිලසඞ්කප්පො — පස්සද්ධකායසඞ්ඛාරො — සුවිමුත්තචිත්තො— සුවිමුත්තපඤ්ඤො හොති."යි කියනලද දසවිධ අරියවාසයෙහි වුසුවූ වාසයැති; **දසබලො**, කායබල දසයක් හා ඥානබල දසයක් ඇති හෙයින් දසබලවූ; **දසධම්මවිදූ**, දශකුශලකර්මපථයන් දන්නාවූ; **දසහිචුපෙතො**, "ඉධ භික්ඛු අසෙඛාය සම්මාදිට්ඨියා සමන්නාගතො හොති—සම්මාසඞ්කප්පෙන සම්මාවාචාය සම්මාකම්මන්තෙන සම්මාආජීවෙන සම්මාවායාමෙන සම්මාසතියා සම්මාසමාධිනා සම්මාඤාණෙන සම්මාවිමුත්තියා සම්මාවිමුත්තිඤාණදස්සනෙන සමන්නාගතො හොති." යි කියනලද දස අසෙක අඞ්ගින් යුක්තවූ; **දසසතපරිවාරො**, දහසක් පමණ මහරහතන් පිරිවරකොට ඇති; **සබ්බධි දන්තො**, චක්ඛු සොත ඝාන ජිව්හා [2]කායය යන පඤ්චෙන්ද්‍රියයන් විෂයෙහි හැම පරිද්දෙන් [3]දමණීද; **පරිවාරකො**, මෙහෙකරුයෙකිමි.

**සුවණ්ණනිඛකාරෙන**, රන්කෙණ්ඩියෙන්; [4]**පයිරුපාසිත්වා**, එළඹැ උපස්ථානකොට; **හෙතුප්පභවා**, කර්මාදිහෙතුයෙන් උපන්හුද; **සඤ්ජයං ඔලොකෙත්වා**,සඤ්ජය නම් පරිබ්‍රාජකයන් බලා—ඔවුන් අතින් සමුගෙන; **න පච්චාහරිංසු**, නැවත ගෙන හැර නොකීහු; **සබ්බකිච්චසාධකො**, හැම කටයුතු [5]සාධන; **සහපංසුකීළිතො**, පස්කෙළියෙහි පටා සමඟ කෙළ වැඩී; **ඵුස්සමාසපුණ්ණමාය**, දුරුතුමස [6]මැදිපොහොයෙහි; **එගගුණ**

1 රත්රන් A. 2 කායමනසාය යන A B F. 3 දැමුණේද B. 4 පයිරුපාසෙත්වා A B E F. 5 සාධන B F. 6 පැමිණි පොහොයෙහි C E.

පුණ්ණමාසියං, මැදින් මස මැදි පොහොයෙහි; සම්බුබසම්බුබ ධොනෙති මග්ගො දිස්සති, යනු වතිපරික්ෂෙපයෙන් හැදවූ මං ඉදිවූ බව හඟවන පිණිස කීහු.

අඞ්ගාරිනො, සහපලු අකුරෙන් කිහිරඟුරුරැස් බඳුවහ; ඵලෙසිනො, ඵල කැමැත්තාහු; හෙවත් ඵල ගතැටිවූවාහු—ඵල ගන්නට [1]ආසන්නවූවාහුය යනුයි; ඡදනං විප්පහාය, පුරාණ පත්‍ර හැර—පත්සලාය යනුයි; තෙ, ඒ වෘක්ෂයෝ; අච්චිමන්තොව, ජ්වාලා සහිත අඟුරුරැස්මෙන්; පභාසයන්ති, බබළන්නාහ; එහෙයින් "දස්සනාය" යනුවක් අධ්‍යාහාර කොට "භගීරසානං දස්සනාය සමයො"යි යොදනු. [2]භගීරස නම් රාජවංශයෙහි ආ රජදරුවන් දක්නට කලැයි යූ සේයි. [2]භගීරස නම් ආදි රාජ වංශය. ඔහු පරපුරෙන් වූවෝ භාගීරස නම් වූහු. "භගීරථානං" යනුදු පාඨයි. මෙහිදු අර්ථ මෙසේමැ ගන්නේ. නාතිදුබ්භික්ඛ ජාතකං, දුර්භික්ෂයෙන් වන සායක් යන මඟ ඉතා නැත; භූමි, භූමිතොමෝ; සද්දලාභරිතා, හී[3]තණපතින් තිල.

ගම්යවත්තං, සෙනාසනපටිසාමනාදී ගම්යවත්; අතුරිත චාරිකං, නොහික්මන් ගමන්; උබ්බෙධවා, උලා; එතදග්ගං, "එසො අග්ගො"යි තැන්; යදිදං, "යො අයං"යි තැන්; පටිජග්ගනවිධිං, සෙනසුන් නැගුම් ආදි; නාගර, නුවර වැසි; සාණිචෙට්ඨා, කුඩා මල; භාගිනෙය්‍යො, බෑනාය; නත්තා, මුණුබුරුය; අභිඤ්ඤාපාදකං, අභිඥවට පිහිටවූ; ඣානං, සියුතජ්ඣානයට; සිඛාප්පත්තො, කෙළ පැමිණී නොහොත් විපුලබවට පැමිණී; පොක්ඛරවස්සං, පොකුරු පතක්[4]සා වලාකඩ අහස්මැද[5]සමුට්ඨග පැතිර කැමැතියන් තෙමා මහත්ව වස්නා වැසි—නොහොත් පොකුරුවැසි-සොඳුරු වැසිය යූ තැන්. "වණ්ණපොක්ඛරතාය සමන්නාගතො" යන තැනැ සෙයින් පොක්ඛර ශබ්ද සෞන්දර්‍ය්‍යාර්ථය කියා. අහො අච්ඡරියං, ඉතා ආශ්චර්‍ය්‍යය—විස්මය පත්ව අසුරු පහරන්නට සුදුසුය යූ තැන්. අහො අබ්භුතන්ති, ඉතා නුවූවිරි යයි—අන්ධයන්ගේ පබ්බතාරොහණයක් සෙයින් ඉතා අපූර්වය; නොවූ විරූ දෙයක් වූයේ යයි යූ තැන්. ඉන්දඛීලෙ, දෙරටු එළියෙහි—විසල් එළිපතය යනුයි; උපපටිපාටියා, උපිළිවෙළින්; ඉස්සරජනානං, රජ යුවරජ ඇමැත්තන්ගේ; ඝරානි, ගෙවලට; සපදානචාරිකං, ගෙපිළිවෙළින්; පග්ගහෙතබ්බා, නැඟිය යුතුයයි; කොපියං නිච්චට්ඨ, අක්කෙළ පිහිටි; නොහොත් කොපියං නිච්චට්ඨගෙහතො පට්ඨාය, ආදි වන්

1 ආසන්නවූවාහු B E F. 2 භාගිරසානං A B F. 3 තණපතරින් A. 4 සා පමණ A B F. 5 සමුට්ඨා A E.

ගෙහි පටන්ගෙන; **සීහපඤ්ජරෙ**, [1]සීමැදුරු කවුළු; **ඡායාවණ්ණො**, යුක්ත වූයේ; **නානාවිරාග**, නානා රාගයෙන්-නොඑක් පැහැයෙන යුතුයි; **සමුපගූළ්හාය**, වළඳනාලද. "බුද්ධසිරියා" යනු හා සම්බන්ධයි. **උණ්හීසතො පට්ඨාය**, මුදුනෙහි පටන් නොහොත් උණ්හීසයයි කියනලද රන්මුවා නළල්පටින් මෙළුවා වැනි නළල් ඇති හිස පටන් ගෙන.

**කුඤ්චිත**, සරල්-[2]අක්බඹුරු; **සුරිය**, හිරුමඬලට බඳු; **නිම්මල**, නිර්මලවූ; **තල**, ප්‍රදෙශ ඇති; **අභිනලාටො**, යහපත්වූ නළල් ඇති; **සුනත**, යෙදුණාවූ; **තුඞ්ග**, උස්වූ; **මුදුක**, මොළොක් වූ; **ආයත**, දික්වූ; **නාසො**,- නාසා ඇති; **නරසීහො**, "එසො නරසීහො තුය්හං පිතා" යි තැන්. **අභිත්ථවිත්වා**, සතුතිකොට; **සණ්ඨපෙනෙතා**, [3]හදනේ නොහොත් හම්වන්නේ—සළු එක තින් ගෙතය යුතුයි; **භික්ඛාචරෙ නාම**, බික සිඟු විරියෙක් නම්; **අයං**, "මහාසම්මතවංසො" යු තැන්.

**උත්තිට්ඨෙ**, ඇවිලිලි අහරෙහි-භික්ෂාටනය කොට ලද්දවූ මිශ්‍රාහාරයෙන් දිවිපෙවෙත් වැටීමෙහිය යු තැන්; **සුචරිතං ධම්මං**, අනෙසුන් පියා බික සිඟන සුසිරිධම්; **සුඛං සෙති**, සෙ හෙන් දවස් ලා; **දුච්චරිතං**, ගණිකා ඇ [4]අගොදුරු හැසිරෙන දුසිරි; **නං**, එවු; **න චරෙ**, නුපුරනු.

**ගොපානසු**, පාසඬියෙහි; පාහිසැ යු තැන්-නොහොත් ගොප්මසැ; **පරිවත්තෙත්වා**, ගවා-නොහොත් සටා; **බහුමාන**, ආදර; **මහාසයනස්ස**, උසසුන් මහසුන්; [5]**තට්ටිකාමඤ්ච**, ඇතුළු [6]සුතලු හැදෙක්හි [7]පටුහැද එවි; **තුවට්ටං**, වහා; [8]**අවිසහමානො**, [9]නොසහන්නේ; **දෙය්‍යං**, ලදයුතු ද්‍රව්‍ය; **වට්ටානුගතං**, සසර අනුය; **සවිඝාතං**, දුක් සහිතය නොහොත් නස්නේය; **සත්තවිධං අරියධනං**,

> "සද්ධාධනං සීලධනං හිරිඔත්තප්පියං ධනං
> සුතධනඤ්ච චාගො ච පඤ්ඤා වෙ සත්තමං ධනං" යි

කියනලද මේ සප්තවිධවූ ආර්‍යධනය; **අධිමත්තං**, අධිකවූ; **නිවෙදෙත්වා**, දන්වා; **සීතවනෙ**, එනම් සොහොන් වෙනෙහි; **කොටිසන්ථාරෙන**, ජෙත නම් කුමාරයාගේ උයන මුළුල්ලෙහි මසු කොටින් කොට ගාවා අතුට ඒ ක්‍රමයෙන් අතුළු රන් මුළුල්ලේ දී; **කිණිත්වා**, විකිණිගෙන; **පාටියෙක්කසන්නිවෙසනෙ**, වෙන වෙන පිහිටි; **ආවාසෙ**, ගෙවල්ද; **එකකුඩ්ඩක**, එක්දිසාවෙක හිත්ති ලා සෙසු තැන හිත්ති නොලා සාල ගෙවල්ද; **ද්විකුඩ්ඩක**,

1 සීමැදිරි C D. 2 අග්බබුරු A. අක්බබුරු C F. 3 බදනේ-හැම. 4 ගේ දුරහැර සිරෙන A. ගොදුරුහැර හැසිරෙන B C E F. A. 5 පටපිකා-මූ. අ. ක B C D E F. 6 සුළු B C F. 7 පටහැද-හැම. B F. 8 අවිසහමානො-මූ. අ. ක. 9 නොසගන්නේ A. නොගසන්නේ B. නොහසන්නේ C D E F.

දෙදිසායෙහි හිතහි ලා සෙසු තැන හිතහි නොලා කළ ගෙවල්ද; **හංසවට්ටක,** [1]හස්වටුගෙයද-හංසවළලු ඇතිකොට කළ ගෙවල් ද යනුයි; **දීඝසාලා,** දික්කොට තැගූ භොජනශාලාද; **අබ්භුග්ගච්ඡි,** පෙරගමන් විසින් එළඹියේ; **සුවණ්ණරසසෙකපිඤ්ජරානි විය,** කනකද්‍රවපරිෂෙකයෙන් පිඟුවූ බඳුවන්; **පටිපජ්ජාමීති,** පිළිපදිම්දැයි-වහන්ස, මේ විහාරය කවර සැටියේ පිළිගන්වම්දැයි යි තැන්; **ආගතානාගතස්ස,** ආ නොආ.

**සීතං උණ්හං,** සී හුණු-ශීතොෂ්ණ දෙකින් වන පීඩා ගෙනැ කියත්; **සිසිරෙචාපි,** පිනි විසින් වන පීඩාද නොහොත් පොද විසින් වන පීඩාද; **වුට්ඨියො,** ඉදිවැ වස්නා වැස්සෙන් වන පීඩාද; **පටිහන්ති,** නසා—ඒ සෙනාසන යථොක්ත පීඩාවන් දුරුකෙරෙයි යනුයි; **පටිහඤ්ඤති,** [2]නසනු ලැබේ; **ලෙණත්ථං ච,** [3]පිළිසරණින් ගැලී දවස් ගළවන්නවද; **සුඛත්ථං ච,** සුව පිණිසද නොහොත් උපද්‍රව පීඩා නැති වන බැවින් සුව විහාර පිණිසද; **ඣායිතුං,** ධ්‍යාන භාවනා කරන්නවද; **විපස්සිතුං,** විදර්ශනාවටද-සෙනාසනය සුදුසුවන්නේයි. **බහුස්සුතෙ,** පරියත්ති පිළිවෙත් බහුශ්‍රුතයන්; **සෙනාසනානි,** මඤ්චපීඨාදි සෙනාසනයන්; **උජුභූතෙසු,** ඍජුවූ සිත් ඇති සවභාව ඇත්තවුන් කෙරෙහි; **දදෙය්‍ය,** පිහිටුවනු-දෙන්නේය යු තැන්; **තෙ,** ඒ විහාරයෙහි වසන භික්ෂූහු; **තස්ස,** ඒ විහාරය කරවා දුන් උපාසකයාහට; **සබ්බදුක්ඛාපනූදනං,** සියලු දුක් දුරුකරනු වූ.

**විහාරමහො,** විහාරපූජා; **සුවණ්ණිට්ඨිකා,** රන් උළු; **සුවණ්ණඵාලසන්ථාරෙන,** තුන් ගවුවක් පමණ එම තැන සතරන්මය කොට කරනලද රන්පලු හොපින් හොට ගාවා අතුට බිම් මිල දීමෙන්; **සුවණ්ණහත්ථිපදසන්ථාරෙන,** යොදනක් පමණ එම තැන සත රන්මය කොට කරනලද ඇත්පිය ඔපින් ඔට ගාවා අතුට ඒ ක්‍රමයෙන් අතුළ සතරන්මය ඇත්පිය මුළුල්ල බිම් මිල දී; [4]**කිණිත්වා,** බිම් ඇත්තවුන්ගෙන් බිම් විකිණී ගෙන; **සුවණ්ණකච්ඡපසන්ථාරෙන,** ගවුවක් පමණ එම තැන සතරන්මය කොට කරනලද හිදිබුත් [5]හොපින් හොට ගාවා අතුට බිම් ඇත්තවුන්ට බිම් මිල දීමෙන්; [6]**සුවණ්ණකට්ඨිකා,** රන් කැටි......

**සන්තිකෙ නිදානයි.**

---

# නිදාන කථා නිට්ඨිතා.

---

1 හස්පවු AEF. හස්පටු B D. 2 කියනු ලැබේ B. යනු ලැබේ EF. 3 පිළිසරණීම් හාලින් B. පිළිසරණින් හාලීක C D E F. 4 විකිණීත්වා A. 5 ඔපින් ඔට. D E. 6 සුවණ්ණිට්ඨිකා-මූ. අ. ක.

[1]**තෙසං තිණ්ණම්පි විත්ථාරකථා**, ඒ තුන්දෙනාගේ විස්තර කථා; "පඨමට්ඨකථායං කථිතාව" යනු හා සම්බන්ධකරනු. "පඨමට්ඨකථායං" යී තමන් කරන [2]අටුවායට පෙරටු අටුවා කියත්. **පඨමට්ඨකථායං**, පළමු අටුවාහි; **ඉධ පන**, මේ අටුවායෙහි— තමන් කරන අටුවා කියත්; **වාචනාමග්ගො විත්ථාරිතො**, [3]කථාමාගී විථරතලදී. "වාචනාමග්ගො විත්ථාරිතො" යී දිව කුරු [4]සථරහු පටන් කොට ගොයුම් [4]සථරහු [5]සර්‍වඥතාප්‍රාප්තිය අවසන් කොට මේ දෙඅතුරෙහි බුද්ධවංස පාඨ [6]විථරා කියූ තැන් ගැන කියත්. **ඡ නිසජ්ජාදොසෙ**,

> [7]"අච්චාසන්නාමතිදූරෙ උපරිවාතුන්නතෙපි ච
> අතිසම්මුඛාතිපච්ඡා ච න නිසීදන්ති පණ්ඩිතා"යි

කියනලද ෂඩ් නිෂද්‍යදොෂයන්; **එකමන්තං**, එකත්පස්වැ. භාව නපුංසකයි. **බ්‍රහ්මකායං**, බ්‍රහ්මයාගේ ශරීරයට බඳුවූ ශරීරය නොහොත් උත්තම ශරීරය; [8]**යමකයමකා හුත්වා**, යුගමයුගමවැ; **මනොසිලාතලෙ**, රත්ගල් මුදුනෙහි; **පාවුස්සකමෙඝො විය**, [9]ප්‍රාවෘෂ්කමෙඝයක් මෙන්-වහරේ මෙඝයක් මෙන් යනුයි; **ගජ්ජන්තො විය**, ගොතන්තක්හු සෙයින් - අවුණන්තක්හු සෙයින් එව්; **අට්ඨඞ්ගසමන්නාගතෙන**, විස්සට්ඨ, විඤ්ඤෙය්‍ය, මඤ්ජු, සවණීය, බින්දු, අවිසාරී, ගම්භීර, නින්නාදී යන අෂ්ටාඞ්ගයෙන් යුක්තවූ; **කමනීයෙන**, මනොඥවූ; **බ්‍රහ්මස්සරෙන**, උතුම් හඬින්- පිරිහුන් හඬින් එව්; **මූලට්ඨානෙයෙව**, තීර්ථකස්ථානයෙහිමෙ; **දිබ්බගන්ධගන්ධිතං**, දිවගඳින් සුවඳවූ; **නිච්ඡාරෙන්තො**, පතුරුවන්නේ; **පටිච්ඡාදෙතුං**, සඟවන්නට නොහොත් වළඟන්නට; **තිරියං**, සරස; **අග්ගමක්ඛායති**, "අග්ගො ඉති අක්ඛායති කථියති" යූ තැන්; **ඉධ වා**, මේ ලෙව්හිද හෙවත් මේ මිනිස්ලොවද; **හුරං වා**, පරලෙව්හිද හෙවත් දෙව්ලොවද; **යං කිඤ්චි විත්තං**, යම් කිසි රත්නවිශෙෂයෙක් ඇත්ද - සියලු ඒ රත්නයට වඩා සර්‍වඥරත්නය උත්තමයයි කියාද; **අග්ගතො**, "අග්ග"යී තැන්; **මොක්ඛවසෙන**, ප්‍රධාන වශයෙන්.

**ගතාසෙ**, ගියාහුද; **දෙවකායං**, දිව්‍යසටය; **භාවිතො**, වඩනාලද්දේ; **බහුලීකතො**, නැවැත නැවැත මෙනෙහි කරන ලදුයේ; **එකන්තනිබ්බිදාය**, එකාන්තයෙන් සංසාර ප්‍රවෘත්තියෙහි උකටලී පිණිස; **විරාගාය**, සසර විරක්තවීම පිණිස;

---

1 පළමුවැනි පෙළේ "තෙසං තිණ්ණම්පිවිත්ථාරකථා" යන්නෙහි පටන් 6 වැනි පෙළේ 'වාචනා මග්ගො විත්ථාරිතො' යනු දක්වා පාළිපාඨ මුද්‍රිත අටුවා පොත්හි නොපැනේ. 2 අටුවාවට B C E F. 3 කථාමගග විතරනලදි B C D E F. 4 සතරඹු B C D E F. 5 සබ්බඤ්ඤුතා B F. 6 විතරා B C F. 7 අච්චාසන්නාමතිදූර B C D E F. 8 ඥමලයමලා B C E F. 9 ප්‍රාවෘත් A. ප්‍රවෘත්ත B C E F. ප්‍රවෘත්තක D.

**නිරොධාය**, කෙලශයන්ගේ නිරොධය පිණිස හොහොත් ප්‍රවෘත්ති නිරොධය පිණිස; **උපසමාය**, කෙලෙසුන් සන්හිඳවනු පිණිස හොහොත් වට සන්හිඳුවනු පිණිස; **අභිඤ්ඤාය**, විවට දන්නා පිණිස හොහොත් වට විවට දෙක දන්නා පිණිස; **සම්බොධාය**, [1]චතුස්සත්‍යය දන්නා පිණිස හොහොත් මාර්ගය පිණිස; **නිබ්බානාය**, අමාමහනිවන් පිණිස. "සංවත්තති" යනු හැම්හෙහිමෙ යොදනු. **බුද්ධානුස්සති**, බුදුන් විෂය කොට උපන් සිහි; **අභිත්ථවිත්වා**, ගුණකීම් වශයෙන් වණිනා කොට; **නානත්ථිකානං**, විරුද්ධග්‍රාහීන්ගේ; **සීහවසාය**, සිංහතෙලින්; **සුවණ්ණනාළිං**, රන්නලක්; **සත්තුපාදං ජහෙත්වා**, සිහි එලවා—දමාවා; **හිමගබ්භං**, වලාගබ්.

**සත්ථවාහකුලෙ**, සත්වා කුලෙහි – වෙළඳකුලෙහිය යනුයි; **වණිජ්ජං කරොන්තො**, වෙළඳාම් කරන්නේ; **පුබ්බන්තතො**, පැදුම් දෙසෙන්; **ගමනසජ්ජානි කත්වා**, ගමනට යොමු කොට; **නප්පහොස්සති**, නොසෑහෙන්නේය; **අභිනෙකතෙනව මග්ගෙන**, චක්‍රඝාතාදීන් බිඳී වල නොවූ මගින්; **අනාමට්ඨතිණං**, නොකෑ තණ; **සූපෙය්‍යපණ්ණං**, මාළුපලා–කන පලාය යු තැන්; **පරිණතට්ඨ**, [2]මුහුකළ තදවැ සිට ගිය; **කන්තාරං**, "කං වුච්චති උදකං තං ගහෙත්වා අස්මා තරන්තීති කන්තාරං" යනු වේ. සෙසු වැලිකතර ආදිය "කන්තාරවත් කන්තාරං" යනු වේ. **අධිට්ඨිත**, සිටි; **මූලබාදනීයාදි**, අලමුල් ආදිවූ; **යානකං**, රථයක්; **කලාපං**, හියවුරු; **පටිපථං**, අභිමුඛයට; **පරිවාරමනුස්සා** යනු යක්ෂයන්ගේ මිනිස් වෙස් ගෙනැ කීහු; **භිසමුලාලානි**, නෙළුම්අල නෙළුම්දළි; **ධුරවාතො**, අභිමුඛවැ හමන සුළඟ; **පරිහරන්තා**, දුරු කරන්නාහු; **පුරතො**, සෙසු ගැලට පෙරටුවැ; **පරතො**, පසුකළ තැනට; **පසතම්තතම්පි**, නැළියක් පමණද නොහොත් පතක් පමණද; **පාජිපෙසි**, පැදවී; [3]**පරිවත්තනෙන**, වට්න විසින්; **ඛන්ධාවාරෙ** යන්නෙහි ඛන්ධාවාර නම් නුවරින් අවුත් අටවිමුඛයෙහි කඳවුරු බැඳගෙන හුන් තැනයි; **අනාපුච්ඡිත්වා** යනාදි ගෙනගිය පැන් නොවිචාරා විසඳම් කෙරෙත් නම් එහා පැන් නැති කොටපියෙති යන බුද්ධීන් සම්මත කරන්නාහු කියත්; **පරතො**, ඔබ්බේ; **චූටසීවාතො**, වැසිසුළඟ; **මෙඝසීසං නාම**, වැසිවලා නම්; **සකටපරිවත්තනෙන**, ගැල් වටා තිබීමෙන්; [4]**දිගුණතිගුණෙන**, එකට දෙකය තුනය යනාදීන් දිගුණු තිගුණුවූ; [5]**තක්කගාහිනො**, වරදවා සිතා ගත්තාහු; [6]**අපණ්ණකගාහිනො**, අවිරුද්ධ කොට ගත්තාහු.

---

1 ව්‍රත්තය-හැම. 2 මුහුකළ වැදව-හැම. 3 පරිවත්තනෙතන A B C F. 4 දිගුණදිගුණෙන B C D E F. 5 තක්කගාහගාහිනො-මු. අ. ක. 6 අපණ්ණකගාහගාහිනො-මු. අ. කි.

**අස්ස**, අනෙන—මොහු විසින්; **යොනි ච**, කාරණ-හෙවත් ඉන්ද්‍රියෙසු ගුප්තද්වාරතාදිවූ නිර්වාණසම්ප්‍රාපකවූ ප්‍රතිපත්ති නො මෙයි; **ආරද්ධා**, පටන් ගන්නා ලද්දීද; **ජාගරියං**, නොනිදා කරන භාවනා. ජාගෘ-නිද්‍රාක්ෂයෙ. **න නිමිත්තග්ගාහී**, [1]හස්ත යෝ ශොභනයහැ පාදයෝ ශොභනයහැ යනාදීන් ශුභ වශයෙන් ආලම්බන ග්‍රහණය නොකරන්නේ වන්නේද—ලොභ වශයෙන් නොගන්නේ වේද යනුයි; **පටිසඞ්ඛාය**, විචාරා-ප්‍රත්‍යවෙක්ෂා කොට; **යොනිසො**, නුවණින්; **අනුපාදා**, තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් කිසි ගැන්මක් නැතිවැ නොහොත් කිසි [2]කෙලශලව යක් නැතිවැ; **පරිනිබ්බානස්ස**, [3]ස්කන්ධපරිනිර්වාණය පිණිස. කාමූපාදානාදීන් කෙරෙහි කිසි උපාදානයක් නොගෙනැ පැවැති අග්‍රඵල අනුපාද පිරිනිවන් නමැයිද යෙත්. **තිස්සො කුලසම්පත්තියො**, ක්ෂත්‍රිය, බ්‍රාහමණ, වෛශ්‍ය යන තුන් කුල සම්පත්තීන්ද; **පඤ්චසු නීචකුලෙසු**, වෙණ, නෙසාද, රථකාර, පුක්කුස, චණ්ඩාල නම් ඇති පස් නීච කුලෙහි; **චත්තාරි සච්චානි**, දුක්ඛසමුදය නිරොධ මාර්ගය යන සිවුසස්. තෘෂ්ණාව හැර තෙභූමක ධර්ම දුක්ඛසත්‍ය නම් වෙයි. ඒ [4]තෙභූමක පඤ්චස්කන්ධය උපදවන තෘෂ්ණාව සමුදයසත්‍ය නම් වෙයි. ඒ දුක්ඛසමුදය දෙ දෙනා අපවත් වන [නිරොධය] නිරොධසත්‍ය නම් වේ. පස්කඳ දුකැයි දන්නා තෘෂ්ණාව දුරුකරන නිවන් ප්‍රත්‍යක්ෂකරන අරි අටඟිමඟ මාර්ගසත්‍ය නම් වේ. **සොළසහි ආකාරෙහි**, පීළන, සඞ්ඛත, සන්තාප, [5]විපරිණාම විසින් දුක්ඛසත්‍යයද, ආයූහන, නිදාන, සංයොග, පළිබොධන විසින් සමුදය සත්‍යයද, නිස්සරණ, විවෙක, අසඞ්ඛත, අමත විසින් නිරොධසත්‍යයද, [6]නිය්‍යාන, හෙතු, දස්සන, ආධිපතෙය්‍ය විසින් මාර්ගසත්‍යයද යන මේ සොළොස් ආකාරයෙන්.

### 1. අපණ්ණක ජාතකං.

---

**වොස්සට්ඨවිරියං**, හළ වීර්‍ය ඇති; **විපස්සනාචාරං**, විදර්ශනා යෙහි හැසිරීම්-විදර්ශනා විධියෙහිය යනුයි; **ඔභාසමත්තං වා**, විදර්ශනාවට උපක්ලෙශවූ අවභාස මාත්‍රයකුදු; **නිමිත්තමත්තං වා**, උද්ග්‍රහනිමිත්ත මාත්‍රයකුදු මෙඝමුඛයෙන් නික්මුණු පූර්ණචන්ද්‍රයා මෙන් උද්ග්‍රහනිමිත්තයෙන් නික්මුණු ශතගුණයෙන් වැටහෙන ප්‍රතිභාගනිමිත්ත මාත්‍රයකුදු; **චත්තාරො**, උග්ඝටිතඤ්ඤුය, විපඤ්චිතඤ්ඤුය, නෙය්‍යය, පදපරමය යන සතර; **පදපරමෙන**

---

1 ආසෙවලයෝ B. අසතයෝ A C. ආසතයෝ D. 2 කෙලශාවක් නොගෙනැ A. 3 පරිනිර්වාණය B C E F. 4 තෛභූමික B. C D E. 5 පරිණාම-නැම. 6 නිර්වාණ D.

යනුයෙහි පදපරම නම් මේ ජාතියෙහි අධිගම කරන්නට නොහිසිවැ පයත්‍රාපතිය ශ්‍රවණධාරණාදි සෙයින් වාසනා කොට මත්තෙහි අධිගම කරන්නට හිසි වූයේයි; **සන්දිට්ඨා**, දුටුපිරූ මිත්‍රයෝ; **සම්භත්තා**, දෘඪ මිත්‍රයෝ; **සඞ්ගණිකාය**, ගණසඞ්ගණිකායෙහි නොහොත් කථායෙහි ඇලුණු ජනසමූහයා කෙරෙහිය යනුයි; [1]**අප්පපිපත්තිකො ජානොසීති**, නිම් පිළිවෙත් ඇති විහිදූයි. “අසෙඛා ධම්මා” යන තැන සෙයින් “අ” යනු නිෂ්ඨා ප්‍රාප්තිය කියා. **අනිච්ඡමානං**, නොකැමැත්තහු; [2]**බලා**, බලාත්කාරයෙන්; **සන්තුට්ඨොති වා**, ලද ලද පසයෙහි සතොස්බැවින් යුක්තයයි කියා හෝ. ඒ සන්තෝෂයද එකෙකී පසයෙහි යථාලාභසන්තෝෂය, යථාබලසන්තෝෂය, යථාසාරුප්පසන්තෝෂ යයි කියා සිවුරු ඈ සතර පසයෙහි දොළොස් ප්‍රකාරවේ. **පවිවිත්තොති වා**, කාය චිත්ත උපධි විවේකයෙන් පිරිහුන්නේ යයි කියා හෝ; **උපසම්පන්නො**; වහල් ලදුයේ; **එකස්ස එකස්ස**, හුදකලා මොහුගේ; **සතුප්පාදං ජනෙත්වා**, සිහි උපදවා.

**හෙට්ඨා න තිට්ඨති**, සියුම් හෙයින් මිටිහි නොසිටි–අතැ එච්; **සකටානි පරිවත්තං කත්වා**, ගැල් වට කොට තබා – ගැල් පිරිවටා–ගැල් මඬුලු බැඳය යුසේයි; **ථලනියාමකො**, ගොඩ නියමු; **ආසන්දිං**, දික්හගලා පුටු නොහොත් දික්පා ඇති හැඳ; [3]**නක්ඛත්තං**, නකත්තරු; **නිච්චට්ඨ**, ආදි වැසූ තැන්; **ආකිණ්ඩෙන්තො**, ඇවිදිනේ; **දබ්බතිණගච්ඡං දිස්වා**, හිතණ පඳුරක් දක; **ඔනමිත්වා**, නැමී; **සොතං බද්ධිත්වා**, කත එතැනට කොට නමා; **සද්දං ආවජ්ජෙන්තො**, යට දිය යන හඬ ඇත්තේ දෝහෝයි ආවජ්ජනා කරන්නේ—පරීක්ෂාකරන්නේය යනුයි; **චූලූපට්ඨාකං**, සුළුවටුවා හෙවත් බුලත් කවන්නහු; **අයකූටං**, යකුළු—නොහොත් කුඤ්ඤලිය යෙත්; **සොතං**, යට යන දිය සිළු—යටින් මඟ යන ජලප්‍රවාහය යනුයි; **සනිරුම්භිත්වා**, නොයාදී වළකා; **උදකාවට්ටි**, ජලධාරා; [4]**අක්ඛයුගාදීනි**, අකුරක් වියදඬු ආදීන්; **ධජං**, දිය ඇති බවට සලකුණු ධජ.

**නික්කොසජ්ජා**, අකුසීත වූවාහු; [5]**අනාවටෙ**, ඇවිරිළි නැති; **පපීයනභාවෙන**, බොනු ලබන බැවින්; **කායමොනෙය්‍යාදිසු** යනුයෙහි **කායමොනෙය්‍ය** නම් කායද්වාරයෙන් මුනිභාවයයි–මනා බවයි–නොහොත් කායද්වාරයෙන් පණ්ඩිත බව–[6]නොහොත් ත්‍රිවිධකායදුශ්චරිත වළකන බව – නොහොත්

1 අප්පපටිසන්ධිකො-මු. අ. ක. පටිපත්තිකො A. 2 අටුවාහි මෙය නොපැනේ. 3 නක්ඛත්තෙන-මු. අ. ක. 4 අක්ඛරයුගාදීනි DE. 5 අනාවාටෙ-මු. අ. ක. 6 නොහොත් ......වළකන බව -මේ පාඨය A හි නොපැනේ.

ත්‍රිවිධකායසුචරිතය-නොහොත් කායාරම්මණයෙහි විපස්සනා-[1]නොහොත් කායපරිසුද්ධ - නොහොත් පරිසුද්ධසහගතමන-නොහොත් කයෙහි ඡන්දරාග නසන බව - නොහොත් කාය සඞ්ඛාර නිරොධ කළ චතුත්ථජ්ඣාන හෝ කායමොනෙය්‍ය නම්. ආදි ශබ්දයෙන් වචීමොනෙය්‍යාදි ගතයුතු. **චිත්තස්ස ච**, චිත්තයා ගේද; **හදයරූපස්ස**, හදවත්හු; **වොකිණ්ණා**, මිශ්‍ර වූයේ; **සද්ධිං**, තමහට වැඩ; **අග්ගස්ස**, උතුම් නිවනට; **අකතාභිනිවෙසස්ස**, නොකළ අභිනිවෙස ඇත්තාහට-ප්‍රතිවෙධ නොකළ ආර්‍ය්‍ය ධර්‍ම ඇත්තාහටය යූ තැන්; **දෙව චක්ඛුනි**, අතීතප්‍රත්‍යුත්පන්න දෙවතුන් ......

## 2. වණ්ණුපථ ජාතකං.

**කච්ඡපුටවාණිජෝ**, [2]කසැළි වෙළදෙක්—කසැළි වෙළඳම් කරන ව්‍යාපාරයෙක්ය යනුයි; **අය්‍යකාය**, මුත්තා හා; **අවසෙසා**, අවශිෂ්ට; **භණ්ඩෙ**, [3]වළලු; **අද්ධමාසකොපි**, දෙවියැටසමාර කුත්; **මූලං**, මිල; **තුලසුබ**, තුලාදණ්ඩ; **පරිභාසිත්වා**, තෙපුලෙන් තර්ජන කොට; **තුය්හං පන සාමිකසදිසො**, තා හිමියකු වැන්නෙක; **මහාජානිකරො**, මහත් හානියක් කෙළේ; **විසඤ්ඤී හුත්වා**, සංඥ නැතියාවැ—"විගතසඤ්ඤී හුත්වා"යී යූ සේයි; **වාපිකද්දමො විය**, වැ මඩක් සෙයින්-දියසුත් වැවූ වළල්මඩක් මෙන්ය යනුයි......

## 3. සෙරිවාණිජ ජාතකං.

**රාජගහං**, මහාමන්ධාතු ගොවින්දාදි රජදරුවන් විසින් [4]පිරිගා කළ බැවින්-ගත් බැවින්-එනම් නුවර; **ජීවකම්බවනෙ**, දිවි දෙන හෙයින් එනම් ලද වෙදහුගේ අඹවෙනෙහි; **අග්ගද්වාරෙන**, පළමුකොට වළ දෙරින්; **ගබ්භවුට්ඨානං**, ප්‍රසවවීම්. "ගබ්භාති සත්තා, තස්ස වුට්ඨානං-නිපන්නට්ඨානතො චලනං ගබ්භවුට්ඨානං." **පටිසාමෙත්වා**, තැන්පත් කොට තබා; **පච්ඡිස්ස සෙ**, පෙළවැස්සන්-ඉක්බිති ගෙයි ඇත්තන්ය යූසේයි. **දුරකො නෙ ලභෙද්ධාති** යනු ආදි දරුවන් නැති හෙයින් කීහු. **නවපඤ්චකකම්මට්ඨානං** යනුයෙහි **නවපඤ්චකය** නම් කෙස ලොමාදි පඤ්චකයයි; **දණ්ඩො**, නුවණ නැත්තේ.

[5]**පාතො චුල්ලං**, උදයමෙ පිපියාවූ; **අවිනගන්ධං**, අවි ගතවූ ගන්ධ ඇති; **සුගන්ධං**, සුවඳ ඇත්තාවූ හෙවත් සුගන්ධ වහ

---

1 නොහොත්......නසනබව-A හි නොපැනේ. 2 කසලි B C. කාසළි E. 3 වැළ A. වල B C F. වළා E. 4 පරිග්‍රහ B C F. 5 පාතො සියා චුල්ලං--හැම.

නය කරන්නාවූ; **කොකනදං පදුමං යථා**, කොකනද පද්මයක් වැනිවූ නොහොත් කොකනද පද්මයක් යම්සේ වන්නේ වේද එවැනිවූ. කොකනද නම් හෙල්පියුම්; රත්පියුමැයිද කියත්. **අන්තලික්ඛෙ**, ආකාශයෙහි; **තපන්තං**, තෙජසින් දිලියෙන්නාවූ; **ආදිච්චම්ව**, හිරුමෙන්; **විරොචමානං**, ශරීරප්‍රභායෙන් වොරජනාවූ; **අඞ්ගිරසං**, ශරීරයෙන් නැඟෙන රස් ඇති හෙයින් අඞ්ගීරස යයි කියනලද-නොහොත් අඞ්ගීරස නම් සර්වඥයන්; **පස්ස**, බල.

**උද්දසගහණකාලෙ**, පෙළ කියවා ගන්නා කල්හි; **පරිහාසකෙළිං**, [1]සිනාකෙළි; **ගහිතගහිතපදං**, වනපොත් කළ කළ පදය; [2]**උපරිපදං ගණ්හන්තස්ස**, මත්තේ පදය වනපොත් කළදී; **අවිරූළ්හිධම්මො**, අනභිවෘද්ධිස්වරූප ඇත්තේ; **විබ්භමිතුං**, ගිහි වන්නට; **පමුඛෙ**, අගවිරුවැ-නිසවත්තෙහි යනුයි; **අභිසඞ්ඛතං**, ඍද්ධින් මවනලද; **පුරිමපක්ඛං**, පෙර ඇති පරිශුද්ධ භාවය; **ඛයවයං** යනුයෙහි **ඛය** නම් ගිරිකඳුරෙහි දිය සෙයින් ක්‍රමයෙන් විනාශය; **වය** නම් පවතින් පහරනලද පහන් සෙයින් වහාම නැස්මයි; [3]**රජරජ්ජිතං**, රජසින් හැනුණේ-රජසින් මුසු වූයේය යනුයි.

**රෙණු**, ධූලි; **අධිවචනං**, නම්; **විප්පජහිත්වා**, සමුච්ඡෙදයෙන් නසා; **භික්ඛවෙ**, මහණෙනි; **රජොහරණමෙව**, කඩමැ; **පච්චයො**, රහත් බවට හෙතු වූයේ; **කොමාරභච්චො**, කුමාර පරිහාරයෙන් [4]රජකුමරක්හු මෙන් වැඩූ හෙයින් කොමාරභච්ච නම් වූ; **නත්ථි නනු**, නැත්තෝ වෙති; **අත්තානං**, තමා නොහොත් තමාගේ ශරීරය; **සහස්සක්ඛත්තුං**, දහසක් යල් හෙවත් දහසක් කොටැස් කොටින්—දහසක් පමණින් සී තැන්; **යාවකාලප්පවෙදනා**, වලඳන කල් අරොජන තාක්; **මුඛසහස්සං** උට්ඨහි යනු

"එකස්මිං භාසමානස්මිං සබ්බෙ භාසන්ති නිම්මිතා
එකස්මිං තුණ්හිමාසීනෙ සබ්බෙ තුණ්හී භවන්ති තෙ"යි

කී බැවින් දහසක් පමණ දෙනා එකවිට බිණූ බව ගෙනැ කීහු. එයින් දහසක් දෙනා එකවිට බිණුහ යන අර්ථයි. **තං හන්ද ගණ්හ**, [5]එසේ කීවවුන් කෙරෙන් එකක්හු අත ගන; **සඞ්ඛොභෙත්වා**, මහාජනයා ඔබා; **ගන්ධකුටිපමුඛෙ**, [6]ගෙඳකිළි දොර නොහොත් නිසවත්තෙහි; **සුගතොවාදං**,

1 සිනාකෙළි B D. 2 උපරිඋපරිපදං-මු. අ. ස. 3 රජොරජ්ජිතං-මු. අ. ස. 4 රාජකුමාරයක්හුමෙන් B C D E F. 5 එසේ හෙයින්-හැම. 6 ගඳකොළි A.

“සබ්බෙ භායථ දුක්ඛස්ස සචෙ වො දුක්ඛමප්පියං,
මාකත්ථ පාපකං කම්මං [1]ආවි වා යදි වා රහො”.

යනාදි නයින් තථාගත අවවාද; [2]සුරභිගන්ධවාසවාසිතං, සුගන්ධගන්ධාමොදයෙන් වාසිතවූ; සීහසෙය්‍යං, දුරාසද බැවින්-එළඹෙන්නට නොපිළිවන් බැවින්-සිංහයක්හු බඳුවැ දකුණැලයෙන් [3]හෙවීම්; සමොසරිත්වා, රැස්වැ; සාණිං, [4]කඩතුරා; අනන්තරහිතෙ, අතුරු බතැ; බුද්ධසෙය්‍යාය, චතුත්ථජ්ඣානයෙන්; සුරත්තදුපට්ටං, යහපත් කොට රැඳූ සුරත් දෙපට සිවුර-හඳනයයි; මත්තවරවාරණසීහවික්කන්තවිලාසෙන, මත්තහස්තිරාජයක්හුගේද සිංහයක්හුගේද ගමන්ලීලායෙන්; හත්ථකුක්කුච්චං වා, අත නපුරුකොට තිබීම් හෝ; උක්කාසිතසද්දො වා, සෙම් බහන හඩ හෝ; ඛිපිතසද්දො වා, [5]කිවිස්නා හඬ හෝ; ආයුකප්පම්පි, පරමායුපරිච්ඡේදද; විප්පකතා, අඩාළ කරනලදද; ධම්මසු, ශාසනධර්මයෙහි; ධම්මමහන්තතං, සියුසස්ධර්මින් මහත්බැව්; නිමිත්තානි, උල්කාපාත දිශාඩාහාදි නිමිත්තයන්; සමානෙත්වා, [6]සමතා-විචාරා-පරීක්‍ෂාකොටය යනුයි; චක්ඛුමතා, නුවණැත්තහු විසින්; උන්දූරං, මීයා; [7]දූරභරණං, අඹුවන් පොෂ්‍යකිරීම්; කාකණිකං, කණාවක්; කුණපෙන, කළයෙන්; උදකෙන, පැන් එවින්; අඛෙණ්ඩාවිතාසො, සමාරක් කඩාගත්; චූලන්තෙවාසිකො යනුයෙහි චූල්ල නම් සිටාණන් කි උපදෙශයෙන් සමෘද්ධියට පැමිණි හෙයින් හෙතෙම චූල්ල නම් සිටුහට අන්තෙවාසික නම් වේනුයි චූල්ලන්තෙවාසික නම්; ජලපථකම්මිකෙන, මුහුදුකැමියා හා ද හෙවත් මුහුදු කර්මාන්තයෙහි නියුක්තයා හා ද-මුහුද යාත්‍රාකරන්නහු හා ද යූ තැන්; ථලපථකම්මිකා නම් ගොඩ යාත්‍රා කරන්නෝයි; ගොචරං, තණ; නාවකාලිකං, පිරිවුළු; සච්චකාරං, අත්තිකාරම්—තමා බඩු නොගත් සඳ අනුන්ට බඩු නොදෙන්ට දෙන අත්ලසි-අනුන්ට බඩු නොදෙන බවට හිමි කොට අත්ලස් කොට තබන වස්තුය යූ තැන්; නතිසෙන [8]පාටිහාරෙන, තුන්වන දෙරබායෙන් නොහොත් තුන්වන දොරටුයෙහි සිටියවුන් විසින්—තුන්වන හස් තෙන්ය යූ තැන්; පාදමූලිකපුරිසා, නොතොරවන සෙවකයෝ; දත්වා, අත්තිකාරම් තුබූ තැනැත්තවුට දී; පත්තිකා හුත්වා, ඔහු හා කැටිවැ බඩු ගන්නා පරිද්දෙන් නැවට හිමිවගෙනැ-හෙරිවැ ගෙනැය යනුයි; පත්තිං, ඒ අත්තිකාරම් තුබූ තැනැත්තවුගේ

---

1 ආවිං-හැම. 2 සුරභිගන්ධවාසිතං-හැම. 3 හෙවුම් C. 4 කඩතරා A. 5 කිබිස්නා A. 6 සමානයිත්වා C. 7 දූරාභරණං-හැම. 8 පටිහාරෙන-මු. අ. ක. පාටිහාරියෙන D E.

නැවට හිම්බව—එරිබව යනුයි; කුම්භස්ස, සැපතට; සණ්ඨපෙති, පිහිටුවා.

## 4. චුල්ලසෙට්ඨි ජාතකං.

භත්තුද්දෙසකො, [1]බත්උදෙසි-බත් සාහන්නේයැ යනුයි; සලාකග්ගං, [2]ලාපත් ගෙනදෙන ගෙය; සලාකපච්ඡිං, ලාපත් තිබෙන පැස; අසුකවස්සග්ගෙ, අසෝ වසග—අසෝ පාළියෙහි අසෝ දවස් තුන්වස් ඈ ඇත්තවුන් කෙරෙහිය යනුයි; ඨිතං, පඞ්කතීන් දීගෙන එමින් සිට තුබූයේ; ඨිතිකං කරොන්තෙනාපි, සඞ්ඛ කරන්නේද හෙවත් සිටියපි සඞ්ඛිය විචාරන්නේද—එකහෙළා ලාපත් දෙන කල පාළියෙන් පමුණුවා අද අසෝ දවස් තුන්වස් ඈ ඇත්තවුන් කෙරෙහි අසෝ වහන්සේ කෙරෙහි දී සඞ්ඛියයි සඞ්ඛ කරන්නේද යනුයි; [3]ඨිතිකාති, ඨිතිකාව සිටියායයි; ඨිතවෙලාය, භික්ෂූන් පඞ්කතීන් සිටි වේලේ [2]ලාපත් පමුණුවාගෙන අවුත්; අයං ඨිතිකා, මේ වරබතෙහි සඞ්ඛියයි-අද වරබත් මූන්වහන්සේ කෙරෙහි සඞ්ඛියයි; අයනති, මේ ලාමකභත්තයෙහි ඨිතිකායයි; නෙසු—පෙ—හොති, භික්ෂූන් මඳ කල හිර [4]යටව සිටි; බහුතරෙසු—පෙ—හොති, භික්ෂූන් බොහෝ කල්හි හිර මතුව සිටි; පටිපජ්ජනෙනා, පිළිබහන්නේ.

අග්ගකාරකො, අග කරන්නේ-අයකැමි වූයේ; ලුද්දො, ලොභීය; සනගරබාහිරං, ඇතුළු පිටත් සහිතවූ—ඇතුළු නුවර හා ඒ නුවරට ඇතුළුවූ නුවර පිටත ජනපදය හා එක් කොටය යනුයි; පාකාරපරික්ඛෙපො, ප්‍රාකාරපරික්ෂිප්තස්ථානය-සිසාරා සිටි පවුරෙන් ඇතුළතය යනුයි; පඤ්ඤාසම්පදා, ප්‍රඥසමපත්ති යක්.

## 5. [5]තණ්ඩුලනාළි ජාතකං.

විහාරපච්චන්තෙ, විහාරකෙළවර; පරිවෙණෙ, [6]පිරිවෙන් මළුයෙහි; විරියාරම්භස්ස, වීර්‍ය්‍යකරණයාගේ; ඉමිනා නිහාරෙන, මේ නියමින්-මේ සැටියෙන යනුයි; උපට්ඨහමානො, පිටිවහල් වන්නාහු; ආබාවිකා පරිබාවිකා විචරණකාලෙ, ඇත මෑත දිව පැන ඇවිදිනා සමයෙහි; [7]පදුමිනිපණ්ණෙන, පියුම්පතින්; උදකං පවෙසෙත්වා, දියට වදවා—දිය ඇතුළට හැර ගෙනැ ගොස්ය යනුයි. විරියනතං, ලස්වන්නහු; මග්ගං සන්නය්හිත්වා, කඩුව බැඳගෙනැ; වනකම්මිකා, දඬකම් කරන-වල කර්මාන්තකොට ඇවිදූනාය යනුයි; කිලිට්ඨගත්තො, නොනැහැ සිරුරු ඇත්තෙයිම්.

1 බත් උදෙසා A. 2 ලාබත් A. 3 ඨිතානි C. 4 හිය A B C F. හිසිට්ටි D. හිය සිට්ටි E. 5 තණ්ඩුලනාළිජා A. 6 පිරිවණ B C F. පිරිමළුයෙහි D. 7 පදුමිනි පණ්ණෙහි-මූ. අ. කා.

උබ්බෙගස්සෙතං අධිවචනං, භ්‍රාන්තියට මේ නමෙකි. භ්‍රාන්ති නම් භයයි. **අජ්ඣත්තසමුට්ඨානා**, ස්වසන්තානයෙන් උපදිනීය; නොහොත් ස්වසන්තානය කරණකොට නිසා උපදිනීය. "නියකජ්ඣත්තං අත්තනො ඛන්ධපඤ්චකං සමුට්ඨානකාරණං එතිස්සාති අජ්ඣත්තසමුට්ඨානා" යනු වේ. **බහිද්ධාසමුට්ඨානා**නං, බාහ්‍යසන්තානය කරණකොටගෙන හෙවත් අනුන් නිසා අනුන් කාරණකොටගෙන උපදනා හෙයින් බාහ්‍යසන්තාන සඞ්ඛ්‍යාත කාරණයෙන් උපදී; **සප්පතිස්සවලක්ඛණා**, ආදර සහිත බව ලකුණු කොට ඇත්තී; **වජ්ජ—පෙ—ලක්ඛණං**, වරදෙහි භයපත්වීම හා අපායභය [1]දුක්ම ලක්ෂණ කොට ඇත්තේ; **හීනජච්චානං**, හීනජාතිවූ; **කෙවට්ටාදීනං**, කෙවුළු වැදි ආදීන්ගේ; **නාගරිකො**, [2]ශුචිප්‍රියවූ ශෘඞ්ගාරී පුරුෂතෙම; **ධුනවාදිස්ස**, රාගද්වෙෂාදිවූ පාපධර්මයන්ගේ දූරීකරණයෙහි ගුණ කියන්නාවූ නොහොත් ඒ පාපධර්මයන්ගේ විනාශයෙහි යොග්‍යවූ ධූත සඞ්ඛ්‍යාත ගුණප්‍රතිපත්ති කියන්නාවූ තට; [3]**හිරිළිකො**, ලජ්ජා ඇත්තේ; **ඔක්කාමිකො**, බැසැ; [4]**යං තපෙ** යනුයෙහි "යං" යනු "අගණ්හතං" යනු හා සම්බන්ධ කරනු. "තං" යන්නක් අධ්‍යාහාර කොට "තං විය"යි කියා ගතයුතු. [5]**ජාතිමහත්තපච්චවෙක්ඛනා**, පාපකර්මය නම් කෙවට්ටාදිවූ හීනජාතීන්ගේ ක්‍රියාවෙක, එසේ වූ පාප කරණය තා සේවූ ජාතිසම්පන්නයන්ට නුසුදුසු වේදැයි කියා මෙසේ ජාතිමහත්වප්‍රත්‍යවෙක්ෂාය; [6]**සත්ථුමහත්තපච්චවෙක්ඛනා**, බුදුහු නම් ත්‍රිලෝගුරුහුය. ඒ ත්‍රිලෝගුරු බුදුන්ගේ වචනාතික්‍රමණ කොටගෙන තා පවු කරන බව සුදුසු නොවන්නේ වේදැයි කියා මෙසේ ශාස්තෘමහත්ව ප්‍රත්‍යවෙක්ෂාය; [7]**දායජ්ජමහත්තපච්චවෙක්ඛනා**, තට පිතෘවූ ත්‍රිලෝගුරු බුදුන්ගේ [8]සප්තත්‍රිංශත් බොධිපාක්ෂිකධර්ම නැමැති දායාදයට—වස්තුවට හිමිව සිට තා පවු කරන බව සුදුසු නොවන්නේ වේදැයි කියා මෙසේ දායාදමහත්වප්‍රත්‍යවෙක්ෂාය; [9]**සබ්‍රහ්මචාරිමහත්තපච්චවෙක්ඛනාති**, සැරියුත් මහමුගලන් අගසව්වන් පරම්පරායෙන් ආ සුපිළිපන් මහාසඞ්ඝසඞ්ඛ්‍යාත සබ්‍රම්සරුන්ගේ වංශයෙහි ඇතුළත්ව සිටියාවූ තා විසින් පවු කරන බව සුදුසු නොවෙයි කියා මෙසේ සමානබ්‍රහ්මචාරිමහත්ව ප්‍රත්‍යවෙක්ෂායෙනැයි; **අත්තානුවාදභයං**, ඉදින් තෝ පවු කෙළෙහි වී නම් මා කළ සේ නපුරැයි කියා තෝම තට අවවාද කරන්නෙහි යයි කියා එසේ තමාම තමහට කරන්නා වූ අවවාදයෙහි භයය; **පරානුවාදභයං**, ඉදින් තෝ පවු කෙළෙහි වී නම් නින්‍දා කෙරෙති කියා

1 දුක්වීම B D. 2 සූචිප්‍රියවූ A. 3 හිළිකො-මූ. අ. සා. 4 තපෙ-මූ. අ. සා. 5 ජාතිමහත්ත BCF. ජාතිමහත්ත D. 6 සත්ථුමහත්ත BCF. 7 දායජ්ජමහත්ත BCF. 8 සත්තිංශ A. 9 සබ්‍රහ්මචාරිමහත්ත B CF.

මෙසේ අනුන් තමහට කරන්නාවූ අපවාදයෙහි භයය; **දණ්ඩ භයං,** ඉදින් තෝ පවු කෙළෙහි වීනම් රාජරාජමහාමාත්‍යාදීහු තට දණ්ඩනය කෙරෙතියි කියා මෙසේ දණ්ඩනයෙහි කරන භයය; **දුග්ගතිභයනති,** ඉදින් තෝ පවු කෙළෙහි වීනම් නරකාදි සතර අපායෙහි දුක් විඳිනෙහි යයි කියා මෙසේ දුර්ගතියෙහි කළ භයයයි කියා; **ආහාරට්ඨිතිකා,** [1]පසයෙන් සිටුම් ඇත්තාහු.

**යාවතා,** යම් පමණ තැනෙක්හි; **චන්දිමසුරියා,** චන්ද්‍රසූර්‍ය්‍යයෝ, **පරිහරන්ති,** [2]හැවිදිත්ද හෙවත් පවතිත්ද; **විරොචනා,** බබළන්නාවූ ඔහු; **දිසා භන්ති,** දිශාවන් බබුළුවත්ද—යම් පමණ තැනෙක්හි දිගුන් පහන් කෙරෙත්දැයි යූ තැන්; **තාව,** එතාක්—හෙවත් එපමණින්; **සහස්සධා ලොකො,** දහසක් පමණ ඇති ලෝකයය–දහසක් සක්වළ වන්නේය යනුයි. **එත්ථ,** මෙහි; මෙපමණ තැන්හි—දහසක් සක්වළය යනුයි; **තෙ වසො,** තාගේ ඉසුරු නොහොත් තාගේ ආඥව; **වත්තති,** පවත්නේ යයි මෙසේ කී තැන.

**දෙවාති,** දෙවස්ථානයෙහි තබා දෙවියහයි; [3]**සුද්ධිභාවසොව කාරණත්තා,** ක්ෂත්‍රියබ්‍රාහමණාදිවූ [4]කුලසම්පත්තියද දෙවලොකොත්පත්තියද පිරිසුදු බව සිදුවන බවට නොහොත් සමෘද්ධ වන බවට කාරණ හෙයින්; **පුග්ගලාධිට්ඨානාය,** පුහුල් පිහිට කොට වූ; **අස්සකි,** පොහොසත් වී; **ආයතනං කාරෙත්වා,** දෙවාලයක් කරවා...

## 6. දෙවධම්ම ජාතකං.

**මුහුනතිකාය,** එතෙණෙහි [5]භායසිංසස්ථානයට එළඹි; **කට්ඨහාරිකාය,** දරකැටියගේ; [6]**පුප්ඵඵලහොගෙන,** මල්පක් අනුභව කෙරෙමින්; **අඞ්ගුලිමුද්දිකං,** ඇඟිල්ලෙහි ලන මුන්ද නොහොත් හස්; **සකඛි,** ලකුණු; **ඉමං සඤ්ජානාසිති,** මේ හැඳින්න මැනැවැයි; **උරෙ,** ළමැද; **ඛෙත්තඤ්ඤො නාම,** පිය වන්නව නිසි තැනැත්තහු අයති තැන උපන් හෙයින් ක්ෂෙත්‍රජ නම්; [7]**හත්ථි බන්ධ,** ඇත්ගොවු...

## 7. කට්ඨහාරි ජාතකං.

[8]**හාතිකසනකනිවෙඨාපි හුත්වා,** සියක් බැයන්ට බාලවද සිට; **අවෙගායිත්වා,** වෙළෙවි නොවැ; **එතෙ,** අභිසිද්ධියෙහි; **සමි**

1 රසයෙන් සියුම් ඇත්තාහු A. පසයෙන් සියුම් ඇත්තාහු D E. 2 ඇම්දිද්ද C. 3 විසුඩිභාවසෙසව-මු. අ. සා. 4 කුශලසම්පත්තියද A E. 5 හරියස්ථානය A. 6 පුප්ඵඵලලොහෙන-මු. අ. සා. 7 ඇත්වාද B C D F. 8 භාගිකසනයස සාණිවෙඨාපි-මු. අ. සා.

**ජඞ්ඝතිමෙයව**, ආශාව මුදුන්පත් වේමැයි. **ආසාඵල** යන්නෙහි යම් වෘද්ධියෙක් මහත්වූ ආශාවෙන් වියර්‍ථකොට නිපදවා ගන්නා ලද්දේ වීනම් ඒ මහත්වූ ආශාවෙන් වියර්‍ථකොට නිපදවූ හෙයින් ආශා නොකළහොත් නොවන හෙයින් ඒ ආශාවගේ ඵල නම් වේනුයි මහත්වූ ආශාවෙන් යතන කොට නිපදවූ අභිසිද්ධිය ආශාඵල නම් වේ. **ඵලං**, යථොක්තවූ ආශාඵලය; (සුහුවැ වියර්‍ථ කරන්නාහට) **තම්මූලිකාය—පෙ—පටිලද්ධකතා**, ඒ සතරසඞ්ග්‍රහවස්තූන් මුල්කොට ඇත්තාවූ නොහොත් මොවුන් මූල්කොට යස සැපත් ලත් හෙයින්.

8. ගාමණි ජාතකං.

---

**පලිතානි**, නර; **සුවණ්ණසණ්ඩාසෙන**, රන්හඬුයෙන්; **හරන්තො**, ගෙනයනහෙයින්; **මච්චු**, මෘත්‍යු-මාරයි; **දූතිකං**, බිලී ගිලන්; **ව්‍යාධිතඤ්ච**, ව්‍යාධිරූපයද; **ගතමායුසඞ්ඛයං**, යට ගිය ආයු ඇති; **මතං**, මළ රුවද; **ඛීයමානං**, පිරිහෙන්නාවූ.

9. මඛාදෙව ජාතකං.

---

**අත්තානං රක්ඛන්තො**, තමා රක්නේ; **අඤ්ඤං ව්‍යාකරොති**, රහත්බව කියා; **උදිච්ච**, වැතිසිටි; **තට්ටිකං**, [1]වටපත් පැදුරු.

10. සුඛවිහාරි ජාතකං.

---

## පඨමො වග්ගො.

---

[2]**යාවඅභිමාරප්පයොජනා**, දුනුවාවන් මෙහෙයීම් දක්වා; **පඤ්චවත්ථූනි**, පඤ්චවස්තු නම්-සියලු භික්ෂූන් යාවජීවයෙන් [3]ආරණ්‍යක වෘක්ෂමූලික පාංශුකූලික පිණ්ඩපාතික වූවමැනව, මත්ස්‍ය මාංස නොකෑහැක්ක යන මේ පඤ්චවස්තු නම් වේ; **පටිච්ඡාපෙසි**, පාවා දිනි. **පරිහරන්ති**, රකිත්; **කිට්ඨසම්බාධෙ**, [4]ගොයම් හකුල ඇති හස්සේ; **ඔපාතං**, වළ; **පාසාණයන්තානි**, [5]උගුල්; **කූටපාස**, සොරමළ; **ඔඩ්ඩෙන්ති**, හටවත්; **ගමෙන්ති**, පමුණුවත්; [6]**සුඛසීලතාය**, කීකරු.

11. ලක්ඛණමිග ජාතකං.

---

**උස්සන්න**, බලවත්; **අනෙනාකුමෙ**, ඇතුළු කලෙහි; **හරිචන්දනමයො**, [7]අභල ලක්ෂ වටනා රන්වන් සඳුනෙන් නිම්යේ;

---

1 වටාපත් A. 2 අභිමාරපපයොජනා-හැම. 3 ආරඤ්ඤකායෑ A. 4 ගොයම් හස්සේ හකුල් ඇති A. 5 ලුඹුල් A D. 6 සුඛසීලතාය A. සුඛසීලතා B C F. 7 අභලෙ D.

**පුණ්ඩරීක**, හෙළපියුම්; **අම්බොසධ**, [1]අමාඹස්සෙන්; **අට්ඨො**, කිම් පිළියත්; **මාතාපෙත්තිකසම්භවො**, මවුපියන්ගේ සුකුරු ශ්‍රොණිතයෙන් විය; **අනිච්චුච්ඡාදනපරිමද්දනභෙදනවිද්ධංසනධම්මො**, අතිස් ගඳ හරනට උළන [2]පැළ හරනට මඩන බිඳෙන විසිරෙන සුලුය; **කාමසිවඩ්ඪනො**, සොහොන් වඩා-පොළෝහෝ; **නිදානං**, කාරණයැ; **වත්ථු**, පිහිටයැ; **ආලයො**, ගෙයයැ; [3]**පටිග්ගහො**, පිළිගන්නේයැ; **සිවථිකපරායණො**, සොහොන් පිහිටයැ.

**තචමංසවිලෙපනො**, සම්මසින් ලිපියේය; **ඡවියා**, සිවියෙන්; **අන්තපූරො**, අතුණෙන් පිරිණ; **උදරපූරො**, ආමාශයෙන් පිරිණ; **යකපෙළස්ස**, අක්මාකැණින්; **වත්ථිනො**, [4]වටන් විතින්ද; **හදයස්ස**, [5]හෘත්මාංසයෙන්ද; **පප්ඵාසස්ස**, පපුගඩුවෙන්ද; **වක්කස්ස**, වකුගඩුවෙන්ද; **පිහකස්ස**, බඩදිවින්ද; **පූරො**, පිරිණ; **සිඞ්ඝාණිකාය**, [6]මුකුණුයෙන්ද; **ලසිකාය**, සඳමිදුලෙන්ද; **වසාය**, වුරුණුතෙලින්ද; **අස්ස**, මේ ශරීරයාගේ; **එකදා**, සමහර කලෙක; **පිත්තං**, පිතද; **සෙම්හං**, සෙමද; **වමති**, නැහෙන්නේය; **සුසිරං**, බුහුරුවූ; **විසරුක්ඛ**, කිම්පක්ගස්; **අනෙනා**, ඇතුළ; **බාහිරතො සියා**, පිටත් වීනම්; **වාරෙය නූන**, [7]වළකනුය ගහිම්; **උක්කාරූපමො**, කසළගොඩ [8]උවාම්.

**ඉන්ද්‍රියානං අඤ්ඤදත්ථත්තං**; චක්ෂුරාදි ඉන්ද්‍රියයන්ගේ විවර්ණීදිය; **අනුද්දයා**, කරුණා; **අජ්ඣුපෙක්ඛති**, ඉවසයි; **උපසම්බාජෙතුං**, සිවුරු හරවන්නට; **සෙළගුළං**, වටගුළක්; **පවට්ටයමානො විය**, හිසට පෙරළන්නක්හු මෙන්; **පක්ඛන්දිත්වා**, පැන නැඟී; [9]**ජඝිත්තිකං**, හළිය; **පවිච්ඡාපෙසි**, පාවා දුන්හු; **උදරපරියොසානානි**, වසාතාභි-තනකිස හදන් එව්; **සමානෙත්වා**, ගැණ බලා; **එකදගගං**, හේ උතුම්. අනිර්දිෂ්ටබව වී නපුංසක වී. **සද්දං**, යො අයං; **මනං නාසිතා**; ඇසිල්ලකින් නටුවා.

**මණිගුළ**, මිණිවට; **රතනකම්බලපුඤ්ජවණ්ණං**, රත් පලස් හූවට බඳු පැහැ ඇත්තේය; **නිවාපතිණං**, තිමතණ-එතම් තණ හෝ; [10]**වාගුරං**, දැල්; **ගුම්බ**, බැද්ද; **සන්ති**, තෙප්; **ධම්මගණ්ඩිකට්ඨානෙ**, දම්ගෙඩි තැන. දම්ගෙඩි නම් හිස තබා කපන කොළොම්බුවයි. **සමං චරනෙනා**, සමචරණ වූයේ; **පුප්ඵකණ්ණිකසදිසං**, මල්කැන් හා සම; **පණ්ණසන්ථරං**, පැන්තැලි;

1 අමෘත BCDF. 2 පැළ හැරැ මඩනාලද-හැම. 3 පරිගගහො-මු. අ. සා. 4 වපින් B C D F. 5 හෘත්මාංසයෙන්ද C. 6 මුගුණුයෙන්ද B D. 7 වළඝනිය AB DEF. 8 උවම් D. 9 ජඝිනකං-මු. අ. සා. 10 මේපාඨය මුද්‍රිත අටුවා කථාහි නොපෑනේ.

**විනිවට්ටෙත්වා**, පෙරළා—සියුසස් දෙසා; **අනුසන්ධිං**, එකල්හි ඒ පුත්මවුනට දුන් මෙය යන අනුසන්ධි; **සමොධානෙසි**, නිමවී.

## 12. නිග්‍රොධ මිග ජාතකං.

**පබ්බජනෙය්‍යමිගො**, පවිතබෙයද වැසි මුවෙක්; **පටිච්ඡන්නකොට්ඨාසෙසු**, පිළිසන් කොටුපතැ; **වාතගතියා**, පවන්ගතින්; **ඛක්ඛනතිත්වා**, කපා; **සුගතියා**, මිනිස්පියෙහි; **පඤ්චවිධබන්ධනාදි**, ගිනිගත් යහුල් අත්පාහි ලෙහිද [1]ගසනු ඈ; **ඛත්තියපරිනායකො**, සත්‍රිය ප්‍රධානකොට ඇත්තේ; [2]**වනසණ්ඩං උන්නාදෙන්තො**, වනදෙවතාවන් ලවා සාධුකාර දෙවන්නේ; **උත්තාස උබ්බෙග** යනුයෙහි ශරීර ක්ෂොභකොට උපදනා භය උත්‍රාස නම් වේ. එවිගස ලොමුදූ ගන්නා භය උද්වෙග නම් වේ; **කණ්ඩිනං**, දුනුවා; **අනුපවිසනමත්තෙන**, කපා වදන අභියෙන්; **සල්ලං**, [3]සරය; **කණ්ඩෙන**, ශරයෙන්; [4]**කුමුදපත්තසණ්ඨානෙන**, කුමුදු මල්පෙත්තක් බඳු තල ඇති.

## 13. කණ්ඩින ජාතකං.

**වණ්ණදාසී**, කැතියක්; **උළුඞ්කගීතකං**, සැදිබත්; **සරකගිකතං**, මලාවක් බත්; **උප්පබ්බාජෙත්වා**, සිවුරු හරවා; **වාතමිගො**, පවන් හා සමජව ඇති මුවෙක්; **චරති**, තණ කා; **පරික්ඛිපිත්වා**, තමා වසා; **සාඛාභඞ්ගං**, අතු; **සඤ්ජාතරාග**, ඇලුම් ඇති වැ; **මධුරසෙන**, මීරසයෙන්.

## 14. වාතමිග ජාතකං.

**දුබ්බච**, නොකිකරු; [5]**සත්තොවාදෙ අතික්කන්තෙන**, සත් දවසක් අවවාද දෙන තැනට නො ආගිය හෙයින්.

## 15. ඛරාදිය ජාතකං.

**කොසම්බියං**, කොසඹය වූ තැනැ කළ හෙයින් කොසම්බි නම්වූ; **බදරිකාරාමෙ**, ඩෙබර අරම්හි; **අග්ගාළවෙ චෙතියෙ**, උතුම් අළවු යකුගේ [6]දෙවායතනයෙහි කළ විහාරයෙහි; **උපට්ඨානසාලාය**, බොහෝ දෙන රැස්වන ශාලාවෙහි; **සුරුසුරුපස්සාසා**, සුරුසුරු යන ශ්වාස ඇත්තාහු; **කච්ඡපයා**, කොරේ නම්; **උස්සීසකරණත්ථාය**, හිස තබන්නට; **වලඤ්ජන**, ශරීරකෘත්‍යය කරන; **ඛාරිකානි**, එල්වන ලද්දහු; **මුට්ඨිසම්මුඤ්ජනිං**, මිටි මුසුන්; **උක්කාසි**, සෙම් බැවී; **අසඞ්ඝට්ටනට්ඨානතනි**, අනුන්

1 ගසන ABCEF. 2 සරය කණ්ඩනම්-හැම. 3 ,වනසණ්ඩං-මූ අ.සා. 4 කුමුද පත්තසණ්ඨානඵලෙන-මූ. අ.සා. 5 අභික්කන්තො-මූ. අ. සා. 6 දෙවස්ථානයෙහි B.

විසින් ගැසිනි නැති තැන් යයි; **ජානාසි ඛො පන ත්වං සාරිපුත්ත**, ශාරීපුත්‍රය, තෙපි රාහුලයන් විසූ තැන් දනුද; **සාව සික්ඛාකාමො**, ඉතාම ශික්‍ෂාකාමීහ; **උභොහි පස්සෙහි**, දෙඇල්ලයෙන්; **ගොනිසින්නකවසෙන**, ගොන් හිඳිනා ආකාර වශයෙන්; **වාතසන්නිරුම්භනෙන**, ශ්වාසවාත වැළකීමෙන්; **අයිමුඛාසඬ්ඪනෙන**, පය ගෙනැ හෙළන කල මලාසේ හෙවීමෙන්ද; **පච්පසණාමනෙන**, පය අල්වාගෙනැ ඉදිරියට අදනා කල මලාසේ හෙවීමෙන්ද; [1]**උභතො සංචාරෙන**, දෙපාශ්වයට හදනා කල මලාසේ හෙවීමෙන්ද; **උද්ධං**[2]**ඛිපනෙන**, උඩ නැගීමෙන් නො සෙල්වීමෙන්ද; **උද්ධුමාතකං කත්වා**, උදුම්වාගෙන; **විධුනිත්වා**, [3]පොලා.

## 16. තිපල්ලත්ථමිග ජාතකං.

**භවසඞ්ඛපගතත්තා**, භවයෙහි සැඟවී ප්‍රවෘත්තාවූ අප්‍රකට හෙයින්; **පුබ්බපක්ඛෙ**, පෙරබමස්හි; **කාළපක්ඛෙ**, පසබමස්හි; [4]**විජායනයෙව**, හමනකල්හිමැ.

## 17. මාලුත ජාතකං.

**පඤ්චඞ්ගුලිකං**, පිටි පසඟුල්; **පඤ්චසතිමො**, පන්සියය පුරා සිටිනා.

## 18. මතකභත්ත ජාතකං.

**ආඝාතනතො**, ඝාදිතියෙන්; **පටිස්සවතො**, ගිවිස්මෙන්.

## 19. ආයාචිතභත්ත ජාතකං.

**සුවිසරත්ථාය**, හිදිකඳ පිණිසැ; [5]**ලූනරොහිතමිගපොතකප්පමාණො**, [6]හෝලූ මුවකු සා; **බහුදෙව දිවසං**, මහපස්වරු දක්වා; **ආවිජ්ඣිත්වා**, සිසාරා ඇවිද; **පණ්ඩරමුඛො**, සුදු මුහුණු ඇත්තේ; **බීභච්ඡදස්සනො**, භයඞ්කර දර්‍ශන ඇත්තේ; පුම්, පිම්බෙයි; [7]**හිතොපචාරස්ස**, හිතවිත්තය; **අනොවස්සකං**, නොතෙමී.

## 20. නළපාන ජාතකං.

# දුතියො වග්ගො.

[8]**සිලං පවිජ්ඣි**, ගල් පෙරළී; **කුරුඞ්ගමිගො**, [9]තිත්මුවා; **සෙපණ්ණිරුක්ඛෙ**, ඇත්දෙමට ගසකැ; **බලම්බකං** [10]**චාලෙනෙතා**

1 උභතොපස්සෙසු සඤ්චරණෙන-මු.අ.ක. 2 උක්ඛිපනෙන-මු.අ.ක. 3 පෙලා C D. 4 විජජනෙනයෙව-මු. අ. ක. 5 රොහිතමිගපොතකප්පමාණො-මු.අ. ක. 6 ඔලූ මුවකු B D F. 7 හිතොපචාරසංහාරස්ස A B F. 8 B F හි නොපැනේ. 9 තුජමුවා A. 10 ඔතාරෙනෙතා-මු. අ. ක.

විය, ඔලුඹු බහන්නක්හු මෙන්; **විසිණ්ණ**, විසුරුවනලද; [1]**අවිරුද්ධා**, නොවැරුද්ද~

## 21. කුරුඞ්ගමිග ජාතකං.

**තථාරූපං කම්මං**, තිරිසන් යෝනිය උපදවන්නට තිසි කම්යක්; **රථවරඤ්ඤං**, රථ වරමද්දු; [2]**නඤ්ඤං**, වරමද්දු; **නිද්ධමනමුඛෙන**, වාරිමාගීයෙන්; **ධාරුණ්ණොහා**, ධාරායෙන් උණණවූ; **පූතිමුත්තං**, කුණු මූත්‍ර නම්; **පූතිලතා**, කිඳි ලිය කුණුලිය නම්; **සමවා න**, සමාන ඝාතනය නොවේ; [3]**දබ්බතිණං**, හිතණ~

## 22. කුක්කුර ජාතකං.

**අනායතනෙ**, අස්ථානයෙහි; **නිවසිස්සා**, තුන් හවුරුදු සුවඳවූ; **චතුජ්ජාතිගන්ධ** නම්:—

"කාලානුසාරී තගරං කප්පූරං හරිචන්දනං
[4]චතුජාතිකගන්ධන්ති වදන්ති වදතං වරා"

යන මේයි; **සමොසරිත**, එල්වනලද; **ඛලුඞ්කස්සා**, සින්ධු දෙශයෙන් අන්‍ය දෙශයෙහි උපන් කුඩා අශ්වයි; [5]**භොජාජානිය සින්ධවොච සෙසෙයා**, භොජාජානියෙ [6]සෙන්ධවයා මෙ උතුම්~

## 23. [5]භොජාජානීය ජාතකං.

**සඞ්ගාමසීසෙ**, සඞ්ග්‍රාමයෙහි; **වරසින්ධවො**, සින්ධුදෙශයෙහි උපන් උතුම් අශ්ව~

## 24. ආජඤ්ඤ ජාතකං.

[7]**සුවණ්ණකාරපුබ්බකං**, පෙර තරාල්දරු; **නිමිත්තමත්තම්පි**, ප්‍රතිභාග නිමිත්තමාත්‍රයකුදු; **කිඤ්ජක්ඛං**, කෙසුරු; **සාරදිකං**, [8]සරා කල්හි-ශරත් කාලයෙහි-වූ; **කුමුදං**, කුමුදයක්-ඇඹුල මලක්; **පාණිනා ඉව**, අතින් කඩන්නාක් මෙන්; **අත්තනො සිනෙහං**, තා සිත සෙනහය; **උච්ඡින්ද**, අභීත්මාගීඥත නැමැති [9]හස්තයෙන් කඩ; **සුගතෙන දෙසිතං**, බුදුන් විසින් දෙසූ; **නිබ්බානං**, නිවන් පමුණුවන; **සන්තිමග්ගං**, අරිඅටමඟ; [10]**භාවෙහි**-වඩ; **සොහං**, හේ මම; [11]**වුත්ථවාසො**, වුසූ බඹසරවස් ඇත් තෙම්; **පරිපුණ්ණමානසො**, පරිපූණ්වූ මනදෙල ඇත්තෙම්; **රාහුමුඛා පමුත්තො**, රාහුමුඛයෙන් ගැලවුණු; **චන්දො යථා**,

1 අවිරුද්ධො-හැම. 2 තඤ්ඤං-මු.අ.සා. BF. 3 දබ්බතිණානි-මු. අ. සා. දබ්බතිණං ABDF. 4 ඉදං චතුජාතිගන්ධන්ති-හැම. 5 භොජාජානියො ABDF. 6 සෙන්ධවයො BCDF. 7 සුවණ්ණකාරපුත්තං-මු.අ.සා. 8 ශරත් කල්හි BCF. 9 ශස්ත්‍රයෙන් A. 10 බ්‍රෑහය-මු. අ. සා. 11 වුත්ථවසො-හැම.

චන්‍ද්‍රයාමෙන්; **සම්භාතානං**, පතළ; **මොහමහන්ධකාරං**, [1]මොහාන්ධකාරද; **සබ්බමලං**, සියලු කෙලෙස්මලද; **අසෙසං**, සිරි නැතිවැ; **විනොදයිං**, දුරුකොළෙම්; **ආලොකමුජ්ජොතකරො**, ආලොක කරන; **පභඞ්කරො**, ප්‍රභාකරවූ; **සහස්සරංසි**, දහස් රශ්මින් ඇති; **භානුමා විය**, සූර්‍ය්‍යා පරිද්දෙන්; (**මොහමහන්ධකාරං**, මොහාන්ධකාරය; **විනොදයිං**, ප්‍රහාණී කොළෙම්;) [2]**සිඞ්ගාරිතාය**, සුවිතාමී බැවින්; **ධාතො**, පිරිණේ; **පරිසතිං**, තෘප්තියට.....

## 25. තිත්ථ ජාතකං.

**පඤ්චථාලිපාකසතානි**, පන්සියයක් බත්සැළි; [3]**උපායාසො**, මහදුක්; **සඋත්තරිභඞ්ගං**, අවුළු සහිත නොහොත් මස් ඈ උතුරු අවුළු ඇති; **අට්ඨාරසවිධං ඛජ්ජකං**, තෘප්ති පූරණ සොවස්තික කණ්ණවේණකාදිවූ අටළොස් වැදෑරුම් [කැත දෑ]; **පටිකණ්ටකො**, [4]විරුද්ධවියැ; **සක්ඛා මා භික්ඛු එත්ථ පරිහාරං කාරි**, මහණ මෙහි තෝ ලෙස නොකර; **සඞ්ඛෙජ්ජද**, දෙරකාවුළු කපන-උමං හෝ; **නිජ්ජටං**, හවුල් නැති; [5]**පුරාණ**, පළමු.....

## 26. මහිලාමුඛ ජාතකං.

[6]**හතනසිත්ථානි**, බත්හුළු; **කබුසකබලං**, ලුණු බත්පිඬු; **සංසිතුං**, උළන්නට; **විනිවෙඨෙත්වා**, දෙශනා කොට.....

## 27. අභිණ්හ ජාතකං.

**ඔමසවාදං**, පරුෂ තෙපුල්; **තුංසෙනති**, ගරහත්; **වමෙහනති**, හෙළා බෙණෙත්; **ඔවිජ්ඣනති**, තෙපුල් ශරයෙන් විදිත්; **දසහි අක්කොසවත්ථූහි**, දශ ආක්‍රොශ නම්:-ජාති, නාම, ගොත්‍ර, කුල, කම්, ශිල්ප, ආබාධ, ලිඞ්ග, කිලෙස, ආපත්ති යන මේ දශයයි; **සමුදාචරන්තං**, කියන්නනු; **ගොදකම්ණා**, ගෙරිදන්; **සමධුරො**, සමභාර උසුලන; **පොසාවනියං**, පොෂණය කළ නට මිල; [7]**ධුරං**, වියැ; **ගොවිකන්තකං**, ගවධනය ඇති; **අතිබද්ධං**, පඩිතීන් එකාබද්ධ කොට එක්කොට බඳනාලද; **පමවෙති**, අදී; **අබ්භුතං කරොහි**, පරදු තබ; **අකම්බන්ධනයොත්තෙන**, අකුරක් බත් යොයින්; **එකතො බන්ධිත්වා**, ගැලින් ගැල අකුරක් බැඳ. අකුරක් නම් [8]රිකිල්ලයි. **පුරිමසකටධුරෙ**, ආදි ගැල යෙදූ වියෙහි ගැල්හිස; **එකතොපිං**, එක්

---

1 මොහාන්ධකාරාදි A B F. 2, සිඞ්ගාරතාය-මු.අ.කා. සිංගාහිකාය BD. 3 උපායො-මූ.අ.කා. 4 විරුඩවිය-පිණිසැරිනියැ A. 5 පුරාණං ABCF. 6 හතනසිත්ථං ABCF. 7 අටුවාහි නොපැනේ. 8 කිරිල්ලයි ABD.

කෙලවරක්, ගැල්හිස හා එක්කොට වියය බැඳ වියබාතින් විය අග දක්වා වෙලා එමැ ලණුව ගෙන ගොස් වියකෙලවර බහා විය කෙලවර හා අකුරක් ඇණ මුල තිසා මූඩක් දී ඒ මූඩ අග හා විය අග දක්වා වෙලා එමැ ලණුව ගෙන ගොස් විය කෙලවර මෙසේ යොදනු. **ධුරයොත්තකත්** පලිවෙඨෙත්වා, වියබාතින් බැඳ; **අක්ඛාණිපාදං නිස්සාය,** අකුරක් ඇණමුල තිසා; **මුණ්ඩ රුක්ඛදණ්ඩකං,** මූඩුදඬු; **වතුදොසරහිතං,** සතර වාග්දෙෂ රහිතවූ–මෘෂාවාදාදි.

## 28. නන්දිවිසාල ජාතකං.

[1]**වූළ්හ ධුරං,** ඉසිලූ ධුරය; [2]**නිවෙසනවෙතනතො** [පරිවජ්ජිත්වා,]ගේකුලියට කඩා;**යුගපරම්පරාය,**වියදඬුපරම්පරායෙන්; **ගොසුත්තවිතත්තකො,**|ගොසුත්‍ර දත්තේ;උදකාවිකබලලමහනනකාය, දිය මඩ බොහෝ බැවින්; කට නම් ඉවුරයි.

## 29. කණ්හ ජාතකං.

**වුල්ලකුමාරිකා** නම් වැඩිවයස් පත් සරණ හිඳලැටි ගැනුයි; **කම්මධුරං,** කම්ාන්ත; **භාතරං,** මහාලොහිතං–මහලේ; [තාත,][3] දරුව; **පිහං,** ආශා; **භුසං,** රඬු.

## 30. මුනික ජාතකං.

## තතියො වග්ගො.

**වියූහිත්වා,** පිරා – දෙඅත්කොට; **මුසල,** තඹ; **වාපි** කහාපණ,ාරාසැලකට කාවණුයෙකැයි කියා මෙසේ සැලකට මස්සක් බැගින් ගන්නා සැලකහවණු; **දණ්ඩ,** දඬ; **බලි,** අය; **පතනිං,** හෙරි වීම්; **නිබන්ධිංසු,** නිරන්තරයෙන් පිළියෙළකොට තුබූහු; **සණ්හං,** සිලුටු තෙපුල් ඇති; **සබිලං,** මධුරවූ; **මච්ඡෙර විනයෙ,** මසුරු කෙලෙසුන් දුරුකිරීමෙහි; **දිබ්බපානං,** දිව්සුරා; **එමහං,** වැඹක්; [4]**පිපිලිකා විය,** ඇඹලයන් මෙන් තොහොත් කඩියන් මෙන්; **අනුසඤ්චරමානා,** හැසෙන්නාහු; **කෙරාපිනාමපානභොජනං,** එනම් කෑයුතු පියයුතු දෙයෙක්; **දානවයෝ** නම් කෲර යක්ෂ කෙනෙකි; **අසං ලාළකො,** මේ ජඩයෙක.

## 31. කුලාවක ජාතකං.

1 වූළ්හං ධුරං–මු. අ. ක. බූළ්හං ධුරං BDF. 2 නිවාසවෙතනතො–මු. අ. ක. 3 දරුවා–හැම. 4 කිපිල්ලිකා–මු. අ. ක.

ඛිඩ්ඩිනි, නිඳු වේවායි; හීනායාවත්තෙතා, ගිහිබවට පැමිණි යේ; වාරෙසි, කැමැතිවූ හෙවත් ලැබගත්; [1]චිත්‍රපෙඛුණං, විසිතුරු පත් ඇති…

## 32. නච්ච ජාතකං.

චුම්බටකලහං, සුඹුළු ඔබර හෙවත් ශාක්‍යරජදරුවන් ගැනුන් පිණිස කළ කලහයක්; ලුද්දකො, වටුවැදි; ජාලක්ඛිකො, දැල් ඇස්; ත්වමෙව, තෝමැ; ජාලං උක්ඛිප, දැල ඔසව…

## 33. සම්මොදමාන ජාතකං.

මධුරහස්සරසා, මිරි අත්රස ඇත්තී; ජාලං පරිහරමානා, දැල වළහන්නී; සබ්බරූතඤ්ඤු, සියල්ලවුන්ගේ රැව් දන්නේ; අවස්සයො, වහල්…

## 34. මච්ඡ ජාතකං.

දවග්ගි, ලැව්ගිනි; පටග්ගිං, ගිනි නවතන ගිනි; අරණි සහිතං, ගිනිදඬු; ඔපිලාපිතතිණුක්කා විය; ගැලූ තණසුලක් මෙන්; විනිබ්බධෙනො, දිගින් පළලින්; මහා[2]ගෙණ්ඩුකප්පමාණො, මහත් පන්දුවක් සා තොගොත් බඹරක් සා [3]ගැල් පන්දුවක් සා හෝ වම්බටු සා හෝ; පරිත්තායන්තා, රක්නාහු; පක්ඛා, අභීත්මාගීඥත; විමුත්තිඤාණදස්සන, ප්‍රත්‍යවෙක්ෂා ඥන; සොචෙය්‍යං, තුන් දොරින් සුචිබවය; සච්චබලං අපස්සාය, විද්‍යමාන සවභාවවූ ධර්මබලය නිසා–ආශ්‍රය කොට…

## 35. වට්ටක ජාතකං.

කෙදරෙ [4]පායෙත්වා, කුඹුරේ දිය හෙළා; [5]චුණෙඩ, චපුළු තල්හි; නිඩ්ඩායිත්වා, නෙළා; ලායිත්වා, දැ…

## 36. සකුණ ජාතකං.

යථාගිරන්තං, කැමැතිතාක් කල්; [6]පළිබුද්ධන්ති, වළකත්; අප්පතිස්සා, ආදර නැත්තෝ; ධම්මසංවෙගො,

“සබ්බසඞ්ඛතධම්මෙසු ඔත්තප්පාකාරසණ්ඨිතං,
ඤාණමොහිතභාරානං ධම්මසංවෙගසඤ්ඤිතං.”

සාමිචිකම්මං, ආදරක්‍රියා; තිත්තිරො, කැටකුරුලූ; [7]තරුණපොතකකාලෙ, [8]ළා පැළ කල; අනන්තරසම්පිසු, යටබඩ; සම්පරෙතබ්බ, මතු පැමිණිය යුතු…

## 37. තිත්තිර ජාතකං.

---

1 චිත්‍රපෙක්ඛණං–හැම. 2 ගෙණ්ඩුකප්පමාණො–ABDF. මු. අ. ක. 3 ගැල් පුඬුවක් DF. මේ පාඨය A හි නොපැනේ. 4 පායෙත්වා ABCF. 5 වුනෙත–හැම. 6 පළිබුජ්ඣන්ති–මු. අ. ක. 7 තරුණපොතකාලෙ A. 8 ලාපෙලන කාල BDF, ලාපෙලෙන කාල C.

**චීවරවඩ්ඪකං,** චීවරකර්මාන්තයෙහි දක්ෂ හෙයින් සිවුරු මාහැඟි කොට කරන්නාවූ; **ඝටෙන්ත,** කැපූ කඩ එක්කරන;[1]**විචාරණ,** අසවල් අත්ත යයි විචාරන; **වඩ්ඪෙති,** වඩයි; **පිට්ඨිදණ්ඩෙන,** පිටිදියෙන්; **කාණමහාමච්ඡං,** කණපද්දකු; **ඉච්චෙවතං කුසලං,** එසේ වුව මැනැවි; **වනන්තකෙනෙව මුඛෙන,** වළ කටින්; **කුමුදනාලං,** ඇඹුලුදඹු; **ඝාසෙපසෙනො විය,** කපන්නක්හු මෙන්; **තෙරාවිකභාවං,** වඤ්චා ස්වභාවය.

## 38. බක ජාතකං.

**උපකාරං,** කටයුතු මෙහෙ; [2]**දක්ඛිණගිරිජනපදං,** දකුණු දෙශයෙහි සිටිය දනවුවට-දකුණු දෙස් එව් - නොහොත් ගල් පිහිටි දකුණු දිශායෙහි; **ආසයං,** අදහස: [3]**කුද්දාලපිටකං,** කවු ලැසි කුඩා; **දසං උක්ඛිපාපෙත්වා,** දසයා ලවා ගෙන්වා ගෙන.

## 39. නන්ද ජාතකං.

**සථාපිතලක්ඛිතාව,** පියු වතින්ම-හස්තල වතින්ම; **මහාකම්මන්තිකස්ස,** අයකැමියාගේ; **චූළාය ගහෙත්වා,** හිසකේ ගෙන; **කාණාජකං,** නිමුඹු; **බිලඞ්ගදුතියං,** කාඩි දෙවනු; **අනොමදස්සිස්ස,** නිර්වාණදර්ශීවූ; **බුද්ධස්ස,** සර්වඥයන් කෙරෙහි; **අප්පිකා,** විපාකවශයෙන් ස්වල්පවූ; **පාරිචරියා,** දැනයෙක්; **න කිරත්ථි,** නොම ඇති; **එකොඝපුණ්ණං කත්වා විය,** පස්මහ නදීන්ගේ වතුරු එක්කොට පුරන්නක්හු මෙන්; **අතිවෙලං,** ප්‍රමාණාතික්‍රාන්තකොට; [4]**මණ්ඩසාසනෙ,** උතුම් මාර්ගඵලයෙන් හෙබියාවූ සස්නෙහි; **සිරියා,** පිහිත්; **ආයුත්තකවෙසං,** අයකැමි වෙසක්; **ලෙඛණිං,** පන්හිත්; **පටිජානාති,** ගිවිස්නීයැ; **භද්‍රං,** ඉෂ්ට විපාකය; **න විපච්චති,** නොවිවස්නේ; **පාපො,** තුන් දුසිරිත් යුත් පුහුල්; **භද්‍රො,** තුන් සුසිරිත් යුත් පුහුල්; **භද්‍රානි,** ඉෂ්ට විපාකයන්; [5]**චක්කඞ්කිතෙ,** සක්ලකුණෙන් යුත්-හඳුන්වන ලද හෝ; [6]**පාදෙ නිපතිත්වා,** [7]පා වැඳ; **විසුද්ධදස්සනො,** මාර්ග හෙයින් ආ සම්‍යග්දෘෂ්ටි ඇත්තෙහි; **සුඛුපකරණෙහි,** [8]සුවයට උපකරණවූ; **නිපච්චාකාරං,** වන්දනාදිවූ ආදරක්‍රියා; **පරිකම්මකාරකං,** මෙහෙකරුවා; **විකම්පමානො,** මාගේ විෂයාතික්‍රමණ කරවන වනැයි වෙවුලන්නේ; **අන්තරවත්ථුම්හි,** ගෙදෙරැ; **නමෙ,** හිතතියෙහි; **වචස්සඟගසෙ නිපාතො,** සතිටුහන් අර්ථයෙහි නිපාතයි; **අඞ්ගාරකාසුයා ජලතො,** අඟුරුවළ යටින්; අතන

1 විචාරෙත්වා, අසවල් අත්තයයි විචාරා-හැම. 2 දක්ඛිණගිරිජනපදෙ-හැම. 3 පිටකං-හැම. 4 රතනාසාසනෙ-මූ.අ. ක. 5 චක්කඞ්කිතෙසු-මූ. අ. ක. 6 පාදෙසු-මූ.අ.ක. 7 පාදගුණ්ඨි පතිතම්, A. 8 සුඛයට BOF.

**සන්නාමං**, තමා සත්වනු කොට ඇති; **මහාතුම්බ[1]මත්තං**, **තිඹක්** පමණ......

## 40. ඛදිරඞ්ගාර ජාතකං.

---

# චතුත්ථො වග්ගො.

---

**උක්ඛලිධොවනස්ස**, බඳුන් දෙවි දිය; **එකෙකං සිත්ථං**, එකි එකි හුළු; **උච්චිනිත්වා**, හවුලා; **අතිකාරුඤ්ඤප්පත්තො**, ඉතා බැගෑ වූය; **ජීවිතසඞ්ඝාන**, දිවි යපෙන; **සමතිත්තිකො පුණ්ණා**, පිරී; **හෙට්ඨා**, උන්වහන්සේ කෙරෙන් ඔබ්බට; **අග්ගිසාලෙ**, අගඹුසුරු; **පෂාණතෙනා**, පියව් සීල ඇත්තේ; **සමවත්තවාසං**, බුදුන් වදාළ හැම වත් නොහැර. [2]**සාරමසක් සාරමසක්** එක ගම වැස; **ධුරගාමෙ**, ආසන්න ගමැ; **පරිහීනෙනා**, කිදිණ; **උපට්ඨානවෙලාය**, වඳිනා පුදනා වේලෙහි; **අපලිබුද්ධභාවං**, නො ඇලුණු බව; [3]**පායසං පිවිස්සති**, ක්ෂීරපායසය බොන්නේ නම්; **පක්කාවසෙසෙන**, තිරයෙහි පැසී අවශිෂ්ටකම්යෙන්; **භත්තවමනං**, නැගු බත්; **නාගිනො උදකං**,[4]පෙකිණියෙන් මත් තට; **උදකකඤ්ජිකං**, දියකැඳ හොහොත් දිය වේවයි කැඳ වේවයි; **පුඤ්ඤසිප්පං සික්ඛති**, ආචාර්යයන්ට ආචාර්යභාග කොට දීලන්ට සුදුසුවූ වස්තුවක් නැති හෙයින් කුසලව ශිල්ප උගන්නේයි; **සුඛාසනං දුක්ඛාසනං**, කටයුතු නොකටයුතු-මතා නොමතා හසුන්; **කොට්ටෙත්වා**, හැනැ......

## 41. ලොසක ජාතකං.

---

**තං නිස්සාය**, තා නිසා; **ථුස-චණ්ණං**, නො පැස; [5]**ධූපනවාසනං**, දුම්ගඳ; [6]**තිණබීජානි**, තණඇට; **අතිවෙලං**, කල් යවා; **තිත්තිණෙනා**, තතතන්නේ; **දීපවට්ටිං**, පහන්පියලි; **උසුම නික්ඛමනත්ථං**, හුණුසුම් යවන පිණිස; **රසපරිස්සාවනකරොටිං**, රස පෙරහන කොරමරුව-මලාවක් කියත්; **අද්දසිඞ්ගිවෙරං**, අද්දිගුරු; **ලොණජීරකාය**, ලුණු හා දුරු එක්කොට......

## 42. කපොත ජාතකං.

---

[7]**ගණසත්ථා**, ගණජ්‍යෙෂ්ඨ වැ; **පූතිභාවං පත්තා**, පූතිමූබ සජියා ඝෑහෙයින් පූතිභාවයට පැමිණ; **නිහතො**, නසතලද......

## 43. [8]වෙළුක ජාතකං.

---

1 මනෙතා-මු. අ. ක. 2 සාරමස් සාරමස් A. 3 පායාසං-මු. අ. ක. 4 පෙකණියෙන් C. 5 ධූපනවාසං-මු අ.ක. 6 තිණබීජාදීනි-මු. අ. ක. 7 ගණසඞ්ඝා-මු. අ. ක. 8 වෙළු-හැම.

උස්සන්නො, පිරුණේ; පරං [1]පහරන්තො, අනුන් මැරූ; පලිතවඩ්ඪකී, නර ඇති වඩුවෙක්; තම්බලොහථාලකපිට්ඨිසදිසෙ සීසෙ, තඹ තලු පිටක්සේ වූ හිසැ; මුඛතුණ්ඩකෙන, මුව හිදින් නොහොත් මුවසැතින්; [2]පච්චාමිත්තොව පණ්ඩිතො [සෙය්‍යො], නුවණැති සතුරාමැ මැනැවි.

44. මසක ජාතකං.

---

වීහිපහරණට්ඨානෙ, වී පහරන තැන; විනාවි, අරුත් පහළ කරන්නේ; බාලො, නුවණ නැත්තේ; අනුකම්පකො, අනුකම්පා ඇත්තේ වී නමුත්; නො සෙය්‍යො, උතුම් නොවේ.

45. රොහිණී ජාතකං.

---

අඞ්ගණට්ඨානං, හෙළි තැන්; ගච්ඡෙ, කුඩා ගස්; මූලප්පමාණෙන, මුල පමණින්. ගස මුල උදුරා ඒ දිග බලා එපමණින් දිය තබත්ලු. [4]චම්මං චෙව [4]සම්පුඵල්ද දුරුකුමෙ ච, පැන් තබන දඬුකොටුද; අනායතනෙ, අකාරණයෙහි.

46. ආරාමදූස ජාතකං.

---

වාරුණිවාණිජො, රාවෙළඳ; ලොණසක්ඛරා, පැලහූ ලුණුකැට; වාරුණිපායකා, රා බොන්නාහු; ඛාදාපාහතං, තෙපුල් පඬුරු.

47. වාරුණී ජාතකං.

---

පෙසනකචොරා, යවා වස්තු ගෙන්වන සොරහු; ඨපෙථ, සිටුවව්, [5]අඩ්ඪතියානි සතානි, දෙසියපනසක්; ඛග්ගං සන්නය්හිත්වා, කඩුව හයාගෙන, [6]ඔරොපෙත්වා, බහා තබා; විනාසං, දරසැය; පරෙතා, ඔබ්බට; සඤ්ජීවිතුං, සතපන්ට හෙවත් මේ වස්තු ඇරගෙන ජීවත්ව හිඳින්ට; ගණ්ඩිකාබද්ධස්ස, පොදි[7]බන්; අපවිද්ධං, දුමූවහු.

48. වෙදබ්භ ජාතකං.

---

[8]වයකම්මගතං, වැයට ගිය; අවඤ්ඤාය, අනාදරකොට; ජිණ්ණකිරිකා ගහපතිකා, පිළී නැති [9]ගැවියෝ; අපෙක්ඛාව, සමහව වත අපියම; අපෙක්ඛස්ස, ලදමනා අපියට; නක්ඛත්තං, නකත්.

49. නක්ඛත්ත ජාතකං.

---

1 පහරණ-මු. අ. කා. 2 පච්චාමිත්තොපි-මු. අ. කා. 3 විම්මජ්ජමණ්ඩපච්ච-මු. අ. කා. 4 සල්සම්පුඵල් CD. 5 අඩ්ඪතියානි පුරිසසතානි-මු. අ. කා. 6 ඔතාරෙත්වා-මු. අ. කා. 7 බත් AD. 8 වයකම්මං ගතං-මු. අ. කා. 9 ගැහැවියෝ C.

**අට්ඨාරසන්නං විජ්ජට්ඨානානං**, ඍග්වේදය යජුර්වේදය සාමවේදය අථර්වන්වේදය [1]ස්මෘති ව්‍යාකරණ නිරුක්ති ඡන්දෝ විචිති අපාදන පුරාණ ග්‍රන්ථ ඉතිහාස නීති තර්ක වෛද්‍යකාදිවූ අෂ්ටාදශවිද්‍යාස්ථානයන්ගේ. [2]තදුක්තම්.

"ශ්‍රැතිඃ ස්මෘතිර්ව්‍යාකරණං ඡන්දෝවිචිතිරෙවච,
නිරුක්ති ජ්‍යෝතිෂං ශික්ෂා මොක්ෂඥනං ක්‍රියාවිධිඃ
ධනුර්වේදෙ හස්තිශික්ෂා කාමතන්ත්‍රඤ්ච ලක්ෂණම්.
පුරාණමිතිහාසශ්ච නීතිස්තර්කෝථ වෛද්‍යකං,
වදන්ත්‍යෂ්ටාදශෛතානි විද්‍යාස්ථානානි පණ්ඩිතාඃ."

**දෙවතාමඞ්ගලිකා**, දෙවිමඟුලෙහි නියුක්තයන; **අචේලකා** තිරෙළු පලෙළු; **අනග්ගවට්ටි**, අතුණුවැටි; **දුම්මෙධානං**, ප්‍රඥ නැත්තවුන්; **ආයාචනෙන**, දෙවතාරාධනාවෙන් ......

## 50. දුම්මෙධ ජාතකං.

---

## පඤ්චමො වග්ගො.

---

**සොළසවස්සපදෙසිකොව**, සොළොස් හැවිරිදි වයස සිටි යේම. "සොළසවස්සෙන අපදිසිතබ්බො සොළසවස්සපදෙසිකො" යනු වේ. සොළොස් හැවිරිදි යයි කියයුතු යයි සේයි. **අන්තෙපුරෙ [3]පදුබ්භිත්වා**, අන්තඃපුරයෙහි වැරද; **අවාපුරාපෙත්වා**, විවෘත කරවා; **පච්ඡාබාහං**, පිටිතොල හයා; **ගාළ්හබන්ධනං**, දැඩිබැඳුම්; **නිබණ්ණ**, වලලව්; **නික්ඛාමෙසුං**, නුවරින් පිටත් කොළෝ; **සතං ආකොටෙත්වා**, සතකොට තළා; **පඤ්චසුගන්ධි** යනුයෙහි පඤ්චසුගන්ධ නම්:-කපුරු, තකුල්, ලමඟ, තිරිපුල්, [4]කසතුරි, යන මේ පසයි; **සපථං කත්වා**, දිවුට; **සබ්බසෙණි** නම් ගන්ධකාර දුස්සකාරාදි සේනගයි; **සරභපාදකො**, ව්‍යාඝ්‍රපාද දක්වා කළ. ශරභමෘගරූද කියත්. **පල්ලඞ්කො**, ආසනයෙහි; [5]**ආසවෙච්ඡෙදනකම්මං**, ආශාවෙඡදන ක්‍රියාව; **අත්තනො**, තමාගේ ......

## 51. මහාසීලව ජාතකං.

---

## [52. [6]චූලජනක ජාතකං.]

---

**විසඤ්ඤීකරණං**, සිහි නැති කරන; **අයොජිතකා**, විෂ නොයෙදූ; **උපඩ්ඪපාතියො**, අඩු පා ......

## 53. පුණ්ණපාති ජාතකං.

---

1 ෂඩංග ABCF. 2 මේ පාඨය A හි නොපැනේ. 3 පදුභිත්වා C. 4 කස්තුරු A. 5 ආසාවෙඡදන-මු. අ. ක. 6 මේ ජාතකයට අයත් පාඨ සුගම බැවින් ගැටපදයට නොගත් බව හැගේ.

ඵලකුසලං, ඵල අඳුනන; මහාවත්තනිඅටවිං, වින්ඣාටවි නම් වලට; හලාහලවිසං, සිරිංගි විස; කිංකාති, කුමකැයි කියා; සොත්ථිගමනං, [1]සුවගමන්.

## 54. [2]කිම්පක්ක ජාතකං.

[පඤ්චාවුධකමෙව යනුයෙහි] [3]පඤ්චාවුධ නම්:-ධනු, කඩු, කාණ්ඩය, මුගුරු, බාහු යන මේ පසයි. වුත්තං හි:-

"අමුත්තං පාණිමුත්තඤ්ච යන්තමුත්තං තථෙව ච,
සබ්බසාධාරණඤ්චෙව බාහුයුද්ධඤ්ච පඤ්චමං" යනුදු

අපරම්පි වුත්තං:—

"ධනුමුග්ගරඛග්ගඤ්ච කාණ්ඩයමෙහණ්ඩිවාලකං,
[3]පඤ්චාවුධන්ති අක්ඛාතං මුනිනා ලොකචක්ඛුනා."

සිලෙසලොමයක්ඛො, ලා සේ ලොම් ඇලෙන යකෙක්, අත්තානං නාකොසාපෙතා, තමාගේ ශක්ති තමන්මැ දන්නේ; කණ්ඩලමකුල, කඩුලුගෙඩිය සැකුළු; සහස්සයක්ඛො, දුනුදියෙහි ශරය හිඳුවා; [4]අඩ්ඩනං නාම, සුරුබැව්; පඤ්චාවුධනො [පඤ්චසු ඨානෙසු බද්ධො ඔලම්බමානොපි], පස් තැනින් බඳනා ලද්දේ නොහොත් පස් තැනින් ඇවිණ අහස්හි එලෙන්නේද; [5]අසඞ්කුච්තෙන, නොහැකුළුණු.

## 55 [3]පඤ්චාවුධ ජාතකං.

රඤ්ඤො සන්තෙ, බුදුසස්නෙහි; එකවිධෙන, "එකවිධං" යු තැනි; ගිහාය, ගිහිබවට; බුද්ධසුබුද්ධනාය, සව්නේ දත් නුව ණින් මනාකොට දත් බැවින්; උපරූපතනපරිණාහං, කළවා සා; මූලසන්තානකං, [6]මුල්සමූහයෙක්; [7]දිවසං යනු දිවාභාගය ගෙනැ කියත්; කුටුම්භරණාය, කුස් රක්නට; විනිවරණො, පහවූ නීවරණයන් ඇත්තේය යු තැන්; සහංසිකො, නැහැසැ තුබූ "සුවණ්ණං විය" යු තැන්. සප්පහාසං, යනුත් පාඨයි— ප්‍රභා සහිතය යන අර්ථයි.

## 56. [8]කඤ්චනක්ඛන්ධ ජාතකං.

[9]දිසොතො, දිවසිතෙක්; බහිමතිරකො, මෙතෙරින්; [10]පිට්ඨි පාසාණො, අතළගලෙක්; කාසා, 'නෙත' යු තැන්-[11]නොහොත්

1 සුවතිගමන්-හැම. 2 ඵලජාතකං-මු.අ.සා. 3 පඤ්චායුධ BCDEF. 4 අඩ්ඩිතං නාම-මු අ. සා. 5 අසංකුටිතෙන-මු. අ. සා 6 මූල්සමූහය BCDEF. 7 'දිවසං' යන් හොයි පටන් 25 වෙනි පෙළේ 'යු තැන්' යනු දක්වා පාඨය A හි පමණක් ආයේයි. 8 මේ ජාතකයෙහි පටන් ජාතක නිපයක අවසානයෙහි මාතෘකා ගාථාවෙහි පද ගත සන්නය රාජමුරාරින්ගේ ජාතක ගාථා සන්නයෙන් උපුටාගෙන A හි බහා තිබේ ඒ මෙහි ඇතුළත් නොකරන ලදි. 9 මේ පාඨය හා අර්ථය A හි පමණක් පැනේ. 10 පිඨිපාසාණ, අතළ ගල BDF. A හි නොපැනේ. 11 මෙතැන් පටන් 74 වෙනි පිටේ 5 වෙනි පෙළේ 'එසාකු සෙයින්' යන්න දක්වා A හි පමණක් පැනේ

'තස්ස උදක' [ස්ස] සී ගන්නෝ; **අක්ඛීනි නිම්ලනති,** ඇස් පියා ගන්නේයි.

### 57. වානරින්ද ජාතකං.

**උපපාටෙති,** උපුරන්නේයි – උපුට දමන්නේයි සේයි; **ආලිඞ්ගහෙනා විය,** සිපගන්නා එකකු සෙයින්; **දෙව කුමුදි නියො,** [1]රතැඹුල හෙළැඹුල; **තිස්සො උප්පලිනියො,** [2]රක්ත ශ්වෙතනීලොත්පල; [3]**පඤ්ච පදුමිනියො,** යථොක්ත රත්කුමුදු ආදිවූ පඤ්චප්‍රකාර පද්මිනීහු හෙවත් පද්මයෝ; **පදුමිනියො** යනු කුමුදිනී ආදින් කෙරෙහි පද්ම ව්‍යවහාරයෙන් කිහු. **නිරුදකට්ඨානං,** ඒ විලමැ එක් දිය සිඳී ගිය තැනකට; **පරතො,** එතෙරට; [4]**නිරුදකෙ ආකාසෙ ඨිතානෙව,** දිය නැති අහස්හි සිටියාහුමැ. පද්ම දිය හා අමිශ්‍රවැ දියෙන් මත්තෙහි සිටිනා හෙයින් කිහු. **පඤ්ඤපනා පට්ඨපනාය,** කටයුතු පනවන හෙවත් දක්වන–නොහොත් කටයුතු පනවන්ට තිසිවූ; **උපායපඤ්ඤාය,** ස්ථානොචිත ප්‍රඥවට;[5]**පිතා මං රාජානං** [6]**කාතුකාමො,** පියා ණෝ මා මල් ගෙතැ ගිය කල මා රජ කරනු කැමැත්තෝය.

### 58. කයොධම්ම ජාතකං.

[7]**භෙරිවාදකකුලෙ,** බෙරවාකුලෙහි. ගෙරිමස් කත් නම් බෙරහස්ත් නම් උඃ බෙරවායෝයි. **සමජ්ජමණ්ඩලෙ,** නැටුම් මඬුල්ලෙහි; [8]**ඉස්සරභෙරිං විය,** ඉසුරන්ට ගසන බෙර පරිද්දෙන්; **අන්තරන්තරා,** අතුරතුර දක්ව දක්වා—අතරතුරෙහි යූ තැති; **නො න වාදෙය්‍ය,** නොගසන්නේ නොවෙයි; **අති ධමෙන්තො,** අධිකකොට බෙරගැසීමෙන්.

### 59. හෙරිවාද ජාතකං.

[9]**සඞ්ඛධමනකුලෙ,** සක්[10]පුඹුනා කුලයෙහි;

### 60. සඞ්ඛධමන ජාතකං.

## ජටෙඨා වගෙගා.

[11]**සබ්බසිප්පෙසු,** චිත්‍ර කර්ම පත්‍රච්ඡේදදි වූ සියලු ශිල්ප ශාස්ත්‍රයෙහි; [12]**අග්ගිභවනානං,** ගිනිදෙවියා; [13]**අසාතමන්ත** නම් සත්‍රී දෙෂයි; **මාතරං උක්ඛිපිත්වා,** මෑණියන් උසුලාගෙන

1 රතැඹුලු හෙළඹුලු CDE. 2 රතුපුල හෙළපුල A. 3 මෙතැන් පටන් 14 වෙනි පෙළේ 'තිසිවූ' යන්න දක්වා A හි පමණක් පැනේ. 4 නිරුදකාකාසෙ-මු. අ. ක. 5 මේ පාඨය හා අර්ථය A හි පමණකි. 6 කාතුකාමො-මු. අ. ක. 7 හෙරිවාදකුලෙ A. 8 මෙතැන් පටන් 21 වෙනි පෙළේ 'නොවෙයි' යන්න දක්වා A හි පමණක් ආයේයි. 9 සඞ්ඛධමකකුලෙ-මු. අ. ක. 10 පිඹිනා BOEF. 11 A හි පමණකි. 12 අග්ගිභගවතානං-මු.අ.ක. 13 අසාතමන්තුයෝ A.

නොහොත් උසුලුවා ගෙනැ; [1]**අසා**, [2]අසතියෝ–නොඋදීහු; **ලාමිකා**, යටත්හු; **පච්ඡිමිකා**, [3]පශ්චිමයෝයි–හීන වශයෙන් හැම දෙනහට අන්තයෝයි; [4]**එකාති සද්දා**, එක් යන හඬ; **පාපි සෙසකා**, වෙන්වැ; **මායා**, පුරුෂයන් [5]වඤ්චා කරන හෙයින් මායාවක් වැන්නැ; **මරීචි**, [6]නැති දෙය ඇත්තාකොට හඟවා පුරුෂයන් බඳනා හෙයින් මිරිඟුවක් වැන්නැ; **සොකො**, ශොක යට කාරණ හෙයින් ශොකයක් වැන්නැ; **රොගො ච**, රොග යට කාරණ වන හෙයින් රොගයකුත් වැන්නැ; **උපද්දවො** යනුත් එසේමැයි; **එතා**, මේ ස්ත්‍රීහු; **ඛරා**, ක්‍රෑරයහ; **බන්ධනා ච**, බන්ධනයක් වැන්නහ; [7]**ගුහාසයො**, ප්‍රව්‍රජ්‍යාස්ථානයෙහි හට වන ලද හෙවත් ප්‍රව්‍රජ්‍යාකොට හටවනලද; **මච්චුපාසො**, මරුගේ මලහ; **සංවරො**, වැළැක්මෙක්; **කායපාගබ්භියෙන** යනාදියෙහි **කායපාගබ්භි** නම් කාය අචාරාදීන් අසඤ්ඤමතායි; **පගබ්භා**, බුහුටිය; **හදයමෙණ්ඩ**, ඇත්ගොවු; [8]**කායවිවෙකො** යන්නෙහි **කායවිවෙක** නම් ගණයෙන් කාය වෙන් කොට ගැන්මයි; **චිත්තවිවෙකො** යන්නෙහි **චිත්තවිවෙක** නම් කෙලශයන් කෙරෙන් සිත වෙන් කොට ගැන්මයි; [9]**උපධිවිවෙකො** යන්නෙහි **උපධිවිවෙක** නම් නිරුපධිය විසංසකාර්‍ය යන නම් ඇති නිර්වාණයයි; **විවෙචෙත්වා**, වෙන්කොට.

## 61. අසාතමන්ත ජාතකං.

**රජ්ජගහලනෙ**, රිදී [10]පුවරුයෙහි; **සුවණ්ණපාසනෙ**, රන් පස ඇට; **අඞ්ගවිජ්ජාය**, [11]ශරීර ලක්ෂණ දන්නා ශාස්ත්‍රයෙහි; **උපයොජෙත්වා**, අතික් තැනකට යවාපියා; **ගන්ධ**, සුවඳ; **ධූප**, සුවඳදුම්; **චුණ්ණ**, වත්සුනු; **පයුත්තකාබුත්තා**, [12]මා මෙසේ කරන්ට වන් කල තෙපි හැම මෙසේ කරවයි මෙසේ කියවයි නියොගකොට උගන්වා සිටුවන ලද ධූර්තයෝ; **ආකප්පෙන**, ගමන ආදිවූ ආකාරයෙන්—

[13]"ලිඞ්ගං හත්ථාදිසණ්ඨානං නිමිත්තං මිහිතාදිකං
කුත්තං සුපපාදිනා කිළා ආකප්පො ගමනාදිකං"

**කණ්ණයාණෙණ්ණසි**, කොණකොණයෙන්; **සංඝාඩසිත්වා**, [14]හයා මැත ලා; **පුප්ඵපච්ඡියා**, [15]මල්ගෙනගිය පැසින්; **සොධනකාලෙ**, [16]පලමුවන දොරකඩ රකවල සිටි ස්ත්‍රිය ඒ

1 ආසා ABODF. 2 අසතීහ BCDF. 3 ඇම දෙනහට අනාතයෝයි CD. 4 එකාති A. එකාති-මූ. අ. සා. 5 බඳනා හෙයින් මායාහ BODEF. 6 නැති ගුණ හඟවනා හෙයින් මරීචිහ BODEF. 7 ගුහාසයො, ප්‍රව්‍රජිතාවූ; මච්චුපාසො, මාරයාගේ පාශය BCDEF. 8 'කායවිවෙකො' යන්නෙහි පටන් 19 වෙනි පෙළේ 'වෙන් කොට' යන්න දක්වා A හි ආ සේයි. 9 උපධිවිවෙකො, නිවන් BCDF. 10 පෝරුයෙහි BCDEF. 11ලක්ෂණ ශාස්ත්‍රයෙහි BODEF. 12 උගන්වා යවු ධූර්තයෝ BODEF. 13 මේ ගාථාව A හි නො ආයේයි. 14 මැත ලා A. හයා මත ලා BCF 15 මල්කාසල පැසින් BDF. 16 බලා පරීක්ෂා කරන කල BDF.

වලින් සොයන බලන කල; **ආරක්ඛිත්ථියා**,[1] පලමුවන දොරකඩ රකාවල සිටි ස්ත්‍රියගේ; **උපෙති**, [2]හිස්මුදුනෙහි; [3]**ඡඩ්ඩති**, [4]ඇට කිපියාම තමා ගෙන යන වලින් නොබලන පරිද්දෙන් දමන්නේයි හෙවත් ලන්නේයි; **අධිපියමානා**,[5] පෙළෙන්නී-පීඩිතවී; **ආහරති වා**, [6]පිටතින් යමක් ගෙනෙන්නිය වේවයි; **හරති වා**, [7]ගෙන් පිටතට යමක් ගෙනයන්නිය වේවයි; **සණිකං**, සෙමෙන්; [8]**කසසරෙන**, වලමිටින්; **වෙදනට්ටා හුත්වා**, වෙදනායෙන් පීඩිතවැ; **තපස්ස**, ව්‍රතසඞ්ඛ්‍යාතවූ තපස් නොහොත් මිථ්‍යාචාර විරමණ සඞ්ඛ්‍යාත වූ තපස්; **අනතනො ජාරං**, තමාගේ සොර ස්වාමියා; [9]**හතා වා පුට්ඨා වාති අත්ථො**, පොෂණය කරන ලද්දීය යන අර්ථයි; **හරිතානාය වා**, පිරුණු බැවින් හෝ; **ආමසනකෙසු**, [10]පස්කම් ගුණෙන් අනුභව කරන්ට මෙසේ වරෝයි කියා කැඳවන්නන්; **නිමන්තනකෙසු**, පස්කම් ගුණෙන් [11]පවරන්නන්; [**විජ්ජමානෙසු**], ඇති කල්හි; **න කරොමි**, මම එසේ නො කෙළෙමි; **මච්ඡස්ස උදකෙ ගතං ඉව**, දියෙහි මසුන්ගේ ගමනක් සෙයින්; **තාසං**, ඒ ස්ත්‍රීන්ගේ; **මුසා යථා**, යම්සේ බොරුද; **සච්චං තථා**, සබාවත් එසේමැයි. [12]ඔහු සබා කියත් නමුත් බොරුම කියන්නාහුයි. උන් විෂයෙහි සබාත් බොරුමය. වැළිදු-**තාසං**, ඔවුන්ගේ; **සච්චං යථා**, සබාව යම්සේද; [13]උන් විෂයෙහි-**තථා මුසා**, එසේම බොරුත් බොරුමය; **ගාවො බහුතිණස්සෙව**, ගවයන් තණ බොහෝ තැන් සෙවුනාසේ; **වරං වරං** උතුම් උතුම් පුරුෂයන්; **ඔමසන්ති**, සෙවිත්.......

**එතා**, මේ ස්ත්‍රීහු නම්; **චොරියො**, සොරහු; **කඨිනා**, චණ්ඩහෘදූඪයහු; **වාළා**, ව්‍යාල සමානයහ-දූඩියහ; [14]**චාපලසක්ඛරා**, චාපල්‍යයෙන් ශරීර මධුරාහ-මිහිරි බස් සකුරු වැන්නහ; **මනුස්සෙසු**, මනුෂ්‍යයන් විෂයෙහි; **යං වඤ්චනං**, යම් කිසි වඤ්චා ප්‍රයොගයෙක් වේද; **තා**, ඒ ස්ත්‍රීහු; **තං**, ඒ; **කිඤ්චි**, කිසිවකුත්; **න න ජානන්ති**, නොදන්නාහු නොවෙති-හැම දනිත්.

## 62. අණ්ඩභූත ජාතකං.

**ඉත්ථිකුත්තං**, ගැනුන්ගේ ක්‍රියා; **ඉත්ථිලීළ්හං**, ස්ත්‍රීන්ගේ කටාක්ෂාදි ලීළා; **කාකතාහතියා**, මොහොර බැළයෙන්-අනුන්ගේ මොහොර විකොට දීලා ඉන් ලත් බැළයෙන්ය යනුයි;

---

1 රකාවල සිටි ස්ත්‍රියගේ BCEF. 2 මුදුනෙහි BF. 3 ඡඩ්ඩසි-මු.අ.සා. 4 දමා BF. 5 පීඩිතවී A. 6 ගෙනේද BF. 7 ගෙනයේද BF. 8 A හි පමණකි 9 භතා, පොෂණය කරනලද BEF. 10 පස්කම්ගුණෙන් මෙසේ වරෝයයි කැඳවන BF. 11 පවරන BF. 12 ඔහු සබා යයි යත් නමුත් බොරුමැයි D. 13 මුසං තථා, බොරුත් එසේ මැයි. ඔවුන්ගේ සැබෑත් බොරුමැයි CD. 14 ච අලසක්ඛරා-මු. අ. සා.

සුන්හාතදුන්හාතකං, කටයුතු නොකටයුතු; [1][ආචික්ඛෙය්‍යාසි එකං වසාති], මේ ගාමද්වාරයෙහි හිඳැ යන එන්නන් කියන යහපත් හස්තක් වේවයි නපුරු හස්තක් වේවයි තෙපි අපට [කියා වසවයි]; [2]භණ්ඩිකා, පොදි; [3]කිඤ්චිදෙව නිස්සාය, කිසි වක් නිසා–කිසියම් පිටබලයක් කොට ගෙනය යනුයි; සම්පියායමානා විය, සිනැහැති බඳුව; කොට්ඨකෙ, ගැබැ; [3]සපත්තං, සතුරකු; උක්කාසං, සුළු විලක්කුවක්; [3]නාව හත්ථෙ පාතෙසි, නා අත ගෙළුව ගෙවත් නා අත්පත් බවට පමුණුව.

## 63. තක්ක ජාතකං.

බුද්ධමාමකො, සම්ඥයෝ [4]මාගේ යයි කියා මෙසේ මම ත්වය කරන්නේ; භාවං, අදහස්; උබ්බාළ්හා, පෙළන ලද්දේ; ඝරණී, ගෘහසත්‍රී; චිණ්ණදිවසෙ, සෙවුනා ලද දවස්–කාළු දවසය යනුයි; අචිණ්ණදිවසෙ, මිථ්‍යාචාරයක් නොසෙවුනා ලද දවස්– නොකාළු දවසය යනුයි; න ගණ්හාති, කිසිවක් කොට [5]නොතකාත්.

## 64. දුරාජාන ජාතකං.

[6]භණ්ඩිකො, කලහ කරන ලද්දේ නොහොත් දුකට පැමිණියේ; [3]ථායසා උපෙති, ඈ හොරෙහි; පපා, පැන්වල නොහොත් පින් පැන්. "ජලං පිවන්ති එත්ථාති පපා". ජයම්පතිකා, අඹු සැමි දෙදෙන.

## 65. අනභිරති ජාතකං.

[3]සංකිලෙසං, එක් භික්ෂුවක්හුගේ සන්තානයෙහි උපන්නවූ රාගයක්; පටිපන්නකො, ප්‍රතිපත්ති පුරන්නට [7]පිළිපන්නේ; [8]යොගාවචරො, කම්ස්ථානයෙහි යෙදුණේ; කායස්සාදං, කාය සුඛයක් වේවයි යනුයි; භන්තමිගසප්පටිභාගො, වැද්දන් විසින් උගුළුවන ලද බිය පත්ව ඇවිදුනා මෘගයන් වැන්නේයි; පරූළ්හ, වැඩි; වික්ඛමෙහත්වා, [9]ඔබා; මුණ්ඩපබ්බතකං, කුළු නැති ගල්; [3]ජිතන්තතෙ විරූළ්හං ගච්ඡං, කැඩුණු ඉවුරෙහි හටගත් ගසක්; ආයසක්‍යං, [10]අයසට; සණ්ඨපෙත්වා, [11]එළෙන තැන් හකුළුවා තැන්පත් කොට; [12]විවිධං බාරිං ආදාය, නො එක් පිරිකර ගෙනැ; චරියාවිහාරෙනෙව, ගමනාගමනාදී

1 මෙතැන් පටන් 4 වෙනි පෙළේ 'වසවයි' යන්න දක්වා A හි පමණක් පැනේ. 2 භණ්ඩිකං A. 3 A හි පමණකි. 4 මාගේමයයි මමත්වය ඇත්තේ BDF. 5 නොසලකාත් A. 6 භණ්ඩිකතො CD. 7 පිළිගත්තේ BDF. 8 මෙතැන් පටන් 27 වෙනි පෙළේ 'වැඩි' යන්න දක්වා A හි පමණක් ආයේයි. 9 හොබා BDEF. 10 අගුණ BDEF, 11 හෙළන BDEF, 12 බාරිකාජමාදය-මු. අ. කා.

ජ්ඣාපථ විහාරයෙහිමැ; [1]චුල්ලසයනං, කුඩා යහනක් නොහොත් කුරුැ හැඳක්; හඤ්ඤි, බිම්; ඵලකත්ථරකො, [2]පුවරු මැස්සෙහි; [3]පච්ඡිං, පැසක් නොහොත් කූඩයක්; එකමෙකං ආහරාපෙත්වා, එකි එකී වර එකක් එකක් රජ්ජුරුවන් කරා තාපසයන් යවා ගෙන්වාගෙනැ; නිසීදනානං, [4]හිඳිනට වන්නවුන්; [5]දුසිකාසු, දුළියෙහි ගෙනැ; ඔනමිත්වා, [6]නමා; පුරිම්භා ඉච්ඡා, [7]මෘදුලක්ෂණාවන් හා සඞගමය පිණිසවූ තෘෂ්ණා තොමෝ; උපකරණ නම් [8]මඤ්චාදි ගෘහොපකරණයි; උපභොග නම් සමීපයට එළඹැ අනුභව කටයුතුවූ උද්‍යානවිමානා දියි——

## 66. මුදුලක්ඛණ ජාතකං.

අච්ඡාදනං, පිළී; [9]පරියාති, [10]වටකොට ඇවිදී; සාමිකාච්ඡාදනං, සවාමිසඞ්ඛ්‍යාතවූ වස්ත්‍රයක්; භාතාව, බැයෙක් මැ හෝ මලෙක් මැ; [1]උච්ඡඞ්ගෙයෙව, හිණමැයි; උච්ඡඞ්ගකත්වා, [11]කොඩොක්කුවේ කොට; [1]සාකං [12]උච්ඡින්දිත්වා, පලා කඩා——

## 67. උච්ඡඞ්ග ජාතකං.

[13]අජ්ජුනවනෙ, [14]කුබුක් වෙනෙහි; අනනරද්වාරෙ, නුවර වාසල් දෙර [15]ඇතුළතදී; ගොපඵකෙසු, ගොප්මසැ; චුල්ලපිතා, කුඩා පියේ; මහාපිතා, මහා පියේ; [16]දියඩ්ඪජාති සහස්සං, එක්දස් පන්සියයක් ජාතියෙහි.

## 68. සාකෙත ජාතකං.

පිටඨබජ්ජකං, පිටි කන දෑ; අතිරිත්තං, ඉතිරිවැ ගියේ; අනොනාගාමගතානම්පි, ඇතුළුගමට සිඟා ගිය භික්ෂූන්ටද; ථෙරස්ස අදංසු, භික්ෂූහු සැරියුත් මහතෙරුන්ට දුන්හු; විසවෙජ්ජකුලෙ, විෂ හරනා වෙද කුලයෙහි; පරිභාවිත්වා, පිසැ; ආවාහෙත්වා, කැඳවා ගෙනැ; පච්චාවමිස්සාමි, නැවැත නොගන්මි නොහොත් නැවත අනුභව නොකෙරෙමි; [17]පච්චාහරිස්සාමි, නැවත අදනෙම්ද–නැවත කම්දැයි යනුයි——

## 69. විසවන්ත ජාතකං.

1 A හි පමණකි. 2 පෝරුමැස්සෙහිBODF. 3 මෙතැන් පටන් 5 වෙනි පෙළේ 'ගෙන්වා ගෙනැ' යන්න දක්වා Aහි පමණක් පැනේ. 4 හිඳිනාහු BODF. 5දුසිකාය BOF, 6 බිසවුන් නමා කරා නමා A.7 මෘදුලක්ෂණාවගේ සමාගමයට ඉච්ඡාව BEF. 8 මූඩාදි BD.9 පරියාවති A. පරියායති BODF. 10 පෙරටකොට යේ BDEF. 11 හොඩොක්කුවේB. 12 උච්චිණ්ඩිත්වා-මු. අ. කා. 13 අඤ්ජනවනෙ-මු.අ.කා. 14 කුම්බුක් BF. 15 අතුරෙදී BODEF.16 දියඩ්ඪං, යෙළදහස් BEF. 17 පච්චාවමිස්සාමි-මු.අ.කා.

**මාසද්ධමාසච්චයෙන**, මසකින් ශෙළමසකින්; **සත්තප්පකරණිකො**, [1]පුහුණුවූ ධම්සඟුණු ආදී සප්ත ප්‍රකරණ ඇතිවූ; **ධම්මං වාචෙන්තො**, පෙළ කියවා පුහුණු කරන්නේ;

**දුන්නිග්ගහස්ස**, නිග්‍රහ නොකොට හැකි; **ලහුනො**, සැහැල්ලුවූ; **යත්ථ කාමනිපාතිනො**, යම් තැනෙකැ කැමැතිවැ හෙන; **චිත්තස්ස**, චිත්තයාගේ; **දමථො**, දමනය [2]නොහොත් අරී මඟින් දැමුණුබව; **සාධු**, යහපති; **දන්තං චිත්තං**, දැමූ චිත්තය; **සුඛාවහං**, සුව [3]ගෙන දෙන්නේයි.

**පණ්ණිකකුලෙ**, පලා වෙළඳ කුලෙහි; **සාකඤ්චෙව**, තම්පලා ආදී පලාද; **අලාබු**, ලබුද; **කුම්භණ්ඩ**, [4]කොමුඩුපුසුල් ද; **එලාළුක**, කැකිරිද; **කුණ්ඨකුද්දාලං**, කෙටි උදැල්ල; [5]**ආවිජ්ජිත්වා**, සිසාරා; **අවජීයති**, පරයනු ලැබේද; **සාධු ජිතං න හොති**, [6]මතාකොට ජයගන්නාලද රට නම් නොවන්නේයි; [7]**සඞ්ගාමසීසං ජිනිත්වාපි**, යුද්ධභූමිය දිනැද;

**යො**, යමෙක් තෙමේ; **සඞ්ගාමෙ**, යුද්ධයෙහි; **සහස්සෙන**, දහසක් මිනිසුන් ගෙනැ; **සහස්සං මානුසෙ**, දහසක් මිනිසුන්; **ජිනෙ**, ජයගනීද-ඕහට වඩා-**එකං**, හුදකලාවූ; **අත්තානං**, [8]ඒ තමා; **ජෙය්‍ය**, යමෙක් ජයගනීද; **සො**, හෙතෙම; **වෙ**, එකාන්තයෙන්; **සඞ්ගාමජුත්තමො**, සඞ්ග්‍රාමයෙහි දිනන්නවුන්ට අග්‍රයි; [9]**පටිසුණිත්වා**, ගිවිසැ; [10]**එකපරිච්ඡෙදමෙව**, එක නියම යමැ; **නීහරිත්වා**, ගෙන හැර පැ [**අස්සමපදං භාජෙත්වා**], පත් සල් ආදිය බෙදා දී;

70. කුද්දාල ජාතකං.

## සත්තමො වග්ගො.

[11]**නාගමාලක** නම් නාගස් ඇති මළුවයි; [12]**සලලමාලක** නම් සලලගස් ඇති මළුවයි; [13]**ආජානාම**, දනුමෝද-ඒ දන්නාවූ අපි; **තිස්සො අනුමොදනා**, [14]මඞ්ගලයෙහිද [අවමඞ්ගලයෙහිද] භත්තාග්‍රයෙහිද යන තුන් තැනැ කරන අනුමෙවුන්; [15]**අට්ඨතිංසාය කම්මට්ඨානෙසු** යනුයෙහි සමසතලිස් කම්සථා

1 ධම්සඞ්ගණීකාදි සප්ත ප්‍රකරණ ඇතිවූ BCDEF. 2 නොහොත් අටඟිමඟින් බුදුබව-මේ පාඨය A හි පමණකි. 3 එලවා BCDEF. 4 කොමඩුද BDEF. 5 A හි පමණකි. ආවිජ්ඣිත්වා-මු. අ. ක. 6 මතාකොට දනානා ලද්දේ නොවේ BCDF. 7 සඞ්ගාමසීසං, යුඩභූමිය BCDF. 8 එක තමා BCDF. 9 පටිස්සුත්වා-මු. අ. ක. 10 මෙතැන් පටන් 21 වෙනි පෙළේ 'බෙදා දී' යනු දක්වා A හි පමණක් පැනේ. 11 නාගමාලක, නාමළු BCDEF. 12 සලලමාලක, එනම් මළු BDEF. 13 A හි පමණකි. 14 මඞ්ගල අවමඞ්ගල භකතාග්‍රදුනු අනුමෝදනා BDF. 15 මෙතැන් පටන් 80 වෙනි පිටේ 5 වෙනි පෙළේ 'කීහු' යනු දක්වා A හි පමණක් පැනේ.

නයෑ අරමුණු විසින් අටතිසක් කොට කීහු; **ඝටෙන්තා**, පූර්ව රාත්‍රියෙන් අපර රාත්‍රිය [1]වඩොාවජ්ජන කොට පැවතීම් වශයෙන් ඝටනා කරන්නාහු; **වායමන්තා**, උත්සාහ කරන්නාහු; **විපස්සනාගබ්භං ගාහාපෙත්වා** යනු විදර්ශනාව [ගැබ්] ගන්වා- මාර්ගඵලප්‍රාප්තියට ආසන්නකොට වැඩූ විදර්ශනාව ගෙනෑ කීහු; **ඌරුට්ඨිකං**, කලවේ ඇට; **න සම්පත්තං**, සමෘද්ධ නොවූයේයි.- නොපැමිණියේයි; **බ්‍රාහ්මණවාචනකං**, [2]බ්‍රාහ්මණයන් වළඳවා වෙද කියවීම් නොහොත් බමුණන් දත් වළඳවා වෙද [කියවා] දෙන ලාභ; [3]**යාගුං**[4]**පාචෙත්වා**, කැඳ පිසවා බී; **අම්හාකං පත්තකොට්ඨාසං** යනු ආචාරීන් නොගියත් ශිෂ්‍යයන් ගොස් වෙද කියා ශාන්ති කළ කල ශාන්ති කළ ගෙයි ඇත්තවුන් තොපගේ ආචාරීන්ට ගෙන යවයි උන්ටත් දෙන හෙයින් කීහු; **අල්ලවරණදාරූනි**, [5]දිය නොබට වරණ දර; [6]**මුඛවාතං දදමානාපි**, මුවෙන් සුළං ඕනීද; **යාගුපාචිකා**, කැඳ පිසන තැනැත්තී-අඹු පිසන මිඩි.....

## 71. වරණජාතකං.

---

**රජතපුඤ්ජසන්නිභො**, රිදීපිඩක් බඳු; **මණිගුළසදිසානි**, [7]මිණිගුළ වැන්නාහ; **පඤ්ඤායමානා**, වෙන වෙන විභාගවැ පැනෙන; **රත්තකම්බලසදිසං**, රත්පලසක් වැනි; **සුවණ්ණබින්දුපතිමණ්ඩිත**, රන් බිඳුයෙන් හෙබියාවූ නොහොත් හොබවන ලද්දවූ; [8]**කායවිවෙකස්සත්ථාය**, කය වෙන් කොට වසනු පිණිස; **ආජීවභණ්ඩකං**, ජීවත්වීමට සුදුසු වස්තු; **දන්තකාරො**, දළ ලියන්නවුන්; **ඛරකකචං**, [9]තීක්ෂණ කියතක්; **පාදෙ සම්මිඤ්ජිත්වා**, පය හකුළුවා ගෙනෑ; **ගොනිසින්නකං**, ගොනු හුන් පරිද්දෙන්; **ආවජ්ජනං කත්වා**, සිත් පවත්වා; **ඉණසොධනමත්තමෙව ජාතං**, ණය ගෙවන පමණටමැ සැහුණේයැ; [10]**මූලදන්තා**, මාංසයෙහි හුන් තැන දළ; **පණිකා පහරෙන්තා**, විළම්බින් පහරන්නේ; **චතු-පෙ-පඤ්ච**, දෙලක්ෂ සතලිස් දහසක් යොදුන් පමණ බොළ ඇති මහා පෘථිවී.....

## 72. සීලවනාගජාතකං.

---

**උබ්බෙජනීයො**, [11]ඇසුදුටුවන්ට භය උපදවන්නේයි; **පෙස්සජනං**, මෙහෙකරු ජනයා; **ඔපිලාපෙත්වා**, උපුල්ලාපියා; **උන්දූරො හුත්වා**, මීහීවැ; **සොතං**, දියසිළු; **අගණෙත්වා**, කිසිවක්

---

1 විමසිය යුතුයි. 2 බමුණන් තමනා වළඳවා වෙද කියවීම් A. 3 මෙතැන් පටන් 12 වෙනි පෙළේ 'කීහු' යනු දක්වා A හි පමණක් පැනේ. 4 පචාපෙත්වා-මු අ ක. 5 අමුවරණ දර BCF. 6 මෙතැන් පටන් 14 වෙනි පෙළේ 'මිඩි' යනු දක්වා A හි පමණක් ආයේයි. 7 මැණික්වට BCDEF. 8 කායවිවෙකස්ස D. කායවිවෙකස්ස ආනි සංස-මු අ. ක. 9 තියුණු AC. 10 මූලෙ දළ A. 11 දුටුවන්ට ඇසුවන්ට BCDF.

කොට නොසලකා; **සිරස්‍යං,** [1]අමුරන්-මසුරනැයි සේයි; **ධම්ම සුධම්මතාය,** සිත ඇති සවභාවයෙන්-සිත අනිකක් නොතබා සිත ඇති සැටියේය යනුයි; **ආකප්පසම්පන්නං කත්වා,** ඉරියවු [2]සැපත් කොට; **මං පස්සිතුං අදත්වාව,** මා දැක්ක නොදීමැ; **චතුක්කෙ,** සතර මංසන්ධියෙහි; **උක්ඛාසෙඨාති,** හිඳුවවයි; **ආඝාතනං,** සොරුන් මරන තැනට; **විසිවනත්ථාය,** ගිනි තප්නා පිණිස; **ඉමං-පෙ-ආහරිනති,** මම මට මේ දුක් එළවීමියි; **උට්ඨහිත්වා,** පැන නැගී-[3]වට වසාගෙනැය යනුයි; **උසු,** ශරය.

## 73. සච්චංකිර ජාතකං.

---

[4]**සංවෙජෙත්වා,** [5]බව; **එතස්මිං වෙස්සවණෙ පරිවත්තෙ,** ඒ ආදි උපන් වෛශ්‍රවණයා පෙරළී ගිය කල්හි [6]හෙවත් සැව වූ කල්හි නොහොත් ඔහු පෙරළී අනික් වෙසමුණු රජක්හු වූ කල්හි; **රුක්ඛ** යනාදි තදසප්වූ දෙවතාවන් ගෙන කිහු. **අපප ධංසියාති**[අපෙක්ඛා], නොනැසිය හැක්කාහයි යන [අවසි.]

## 74. රුක්ඛධම්ම ජාතකං.

---

**කාලගහනං,** මඩ අතුරට; **කුලලාදයො,** උකුසු ආදීහු නොහොත් [7]ගිජුලිහිණී ආදීහු; **කණ්ණගගසදිසෙහි,** තෙප් මූණ වැනි වූ නොහොත් සැරතුඹ වැනිවූ; **සොපානෙ ඨත්වා,** පියගැටෙහි සිට; **එකොනනෙනාන,** එක් කොනකින්; **ධුරසොපානෙ,** ආදි පියගැට; **එකං වලාහකං,** එක් වැසිපටලයක්. වැසිපටල නම් දියපටලය. එය ඔහු තමන්ගේ ආනුභාවයෙන් ප්‍රකෘති වස්ත්‍ර පරිද්දෙන් [8]නිවාසනාදිය කෙරෙත්. **එකංසගතං කත්වා,** එකස්කොට බහාලා; **ගන්ධකුටිපරිවෙණෙ,** ගඳකිළි පිරිවෙන්හි-මළුයේ යයි සේයි; **මණිසොපානඵලකෙ,** මාණික්‍යමය වූ නොහොත් මැණික් හොබා කරන ලද පියගැට [9]පුවරුයෙහි; **ජලාසයෙසු,** විල් ආදියෙහි; **ඔපිලාපෙනෙනා විය,** උපුල්වන්නක්හු සෙයින්; **වලලිගහන,** වැල්ගහනයෙන් හෙවත් ගහනව හටගත් බොහෝ වැලින්; **අඤ්ජනරුක්ඛසාර සවිසාවණ්ණ,** කළුහර ගැටක් බඳු; **ලොහිතඩකමණිසදිසානි,** පියුම්රාමිණී වැනි—ඇස් රත්හෙයින් කිහු; **සමාන ජාතිකානං,** මසුන්ගේ; **පරිවාරකවෙටකං,** මෙහෙකරු

---

1 හමුරන් AE. 2 සපන් A. සපත් BCDF. 3 වළ වසාගෙන A. වටුවසාගෙන CE. වටුවසනෙන් D. 4 සංවෙජයිත්වා A. 5 භව A. 6 මෙතැන් පටන් 14 වෙනි පෙළේ 'අවසි' යන්න දක්වා A හි නොපැනේ. 7 ගිජුලිහිණී AB. ගිජුලිණි CF. 8 නිවාසනය A. 9 පෝරුයෙහි BCDEF.

ගැත්තකුට; **සොකාය රන්ධති,** සොකයට පමුණුව; [1]**පමො චය,** මොචනය කර.

## 75. මච්ඡ ජාතකං.

**අජ්ඣාචරිතං,** සාථවාහයන් මැඩපියන්නට; **චඬක මෙඤ්ඤව අධිට්ඨාසි,** සක්මන්මැ අධිෂ්ඨාන කෙළේ-සක්මන්මැ කෙළේයි යූ තැනි; **කම්මං,** ගිය කම් හෙවත් තමාගේ කටයුතු; **යාව-පෙ-භගවතා,** සර්‍වඥයන් වහන්සේ විසින් මේ කී නියාය ඉතා යහපතැයි කියා; **මං රක්ඛිස්සාමිති** යනාදියෙන් ඉදින් නිද්‍රොපගත වුවහොත් වෛරොපද්‍රව වෙයි කියා රාත්‍රිය මුළුල්ල සක්මන් කළ බව කියූ වෙත්; **සබ්බෙ නිච්චෙට්ඨ,** සකටසාථය කඳවුරු බැඳ හුන් කල්හි; **සාරජ්ජං වා,** චිත්තොත්‍රාසයෙක් වේවයි; **තිකචතුක්කජ්ඣානිකානි** යනු චතුක්ක නය හා පඤ්චක නය ගෙනැ කීහු. චතුක්ක නයෙහි මෛත්‍රී කරුණා තිකජ්ඣානික නම් වෙයි. පඤ්චක නයෙහි මෛත්‍රී කරුණා චතුක්කජ්ඣානික නම් වෙයි.

## 76. අසඞ්කිය ජාතකං.

**නිද්දූපගතො,** කපිනිද්‍රාවට ගියේ; **විකිනාමෙසි,** රාත්‍රිය පහන් කෙළේ; **සුඛමසයිත්ථාති,** යෙහෙන් ඔත්දැයි; **සොමහි,** "සො අහං භයප්පත්තො අමහි" යූ තැන්; **විධුහිංසු,** සැලූ; **කො [2]තෙසං නිප්ඵත්ති,** ඔවුන්ගේ නිෂ්පත්තිය කවරක්ද-උන්ගෙන් වන වැඩ අවැඩ කිම්දැයි යූ තැන්; **සප්පටිකම්මා,** පිළියමට සුදුස්සෝද-ප්‍රතික්‍රියා කොට සන්හිඳවිය හැක්කෝදැයි සේයි; **සබ්බචතුක්කෙන,** ඇතුන් සතර දෙනකුයැ අසුන් සතර දෙනකුයැ යනාදීන් සියලු ප්‍රාණීන් කෙරෙන් සතර සතර දෙනකු ගෙනැ මැරීමෙන්; [3]**ආරාධෙස්සාම,** ලබම්හ නොහොත් නිපයම්හ; **යඤ්ඤවාටං,** යාග කරන වළ; **ථූණූපනීතෙ කත්වා,** යාගවළ මැද හිඳුවනලද යාගස්තම්භයට එළවන ලද්දවුන් කොට; **සුපිනන්තරං,** සවපන කාරණ-නොහොත් සවපනයන්ගේ නානත්වයැ; **අතිප්පගෙව,** ඉතා උදෑසනමැ; **ඤාණමුඛෙ,** ඥානමුඛයට නොහොත් ඥානද්වාරයට; **ආපාථං,** හමුබවට හෙවත් අරමුණු බවට.

**අයුජ්ඣිත්වාව,** යුද්ධ නොකොටමැ හෙවත් පොර නොඇනමැ; **විපරිවත්තමානෙ,** පෙරළෙන කල්හි හෙවත් තුබූ සැටියෙන් අනික් සැටියකට පෙරළෙන කල්හි; [4]**ඔසක්කන්තෙන,**

1 පච, පාචනය කර-හැම. 2 තෙසං-මු. අ. කා. 3 ආහරාපෙස්සාම-මු. අ. කා. 4 ඔස්සතෙක-මූ. අ. කා. B. ඔසක්කන්තෙන AE.

මිරිහුණු කල්හි; **ඔක්කමෙන්ත** යනුත් පාඨයි-[1]ගැලුණු කල්හිය යනු අර්ථයි; **මෙඝපාදා**, වැසිකකුල්හු; **ආතපෙ පජ්ජොතානං**, [2]අවුයෙහි වැනූ; **අන්තො පවෙසිතකාලෙ**, ඇතුළුගෙට ඇරගත් කල්හි; **ආළිං**, මියර; [3]**ඛුද්දකා රුක්ඛා චෙව**, මතු මහත්වැ උස්වැ වැඩෙන කුඩා පැළගස්ද; **ඛුද්දකා ගච්ඡා ච**, මතු නොඋස්වැ වැතිරැ වැඩෙන කුඩා පැළගස්ද; **අසම්පත්තවයාව**, සොළොස් ඇවිරිදි [4]වයසට නො පැමිණියාවූමැ; **පුරිසන්තරං ගන්ත්වා**, පිරිමින් කරා සරණ ගොස්; **සයමෙව කුටුම්බං සංවිදහන්තා**, තුමූම [5]බිරින්දත් විචාරන්නාහු; **ධුරවාහෙ**, විය උසුලන්ට තිසිවූ; [6]**තරුණගොදම්මෙ**, දමන බර තාඹන්; **පවෙණිකුසලානං**, අසෝ පරම්පරායෙහි අසවලුන් කොට ආයේ මෙසේයැ යනාදි පරම්පරා වශයෙන් කටයුතු දැනුම්හි සමර්ථ හෙයින් දක්ෂවූ; [7]**සාමම**[8]**නිඤ්ඤරණ**, කටයුතු පසිඳීමෙහි; **යවසං**, යව නොහොත් යව තණ හෝයි; **අඩ්ඩපච්චත්ථිකානං**, වස්තු විෂයෙහි ඔවුනොවුන්ට පසමිතුරුවූ; **සම්මජ්ජිත්වා**, හැමදපියා; **සමජ්ජිත්වා** යනුත් පාඨයි. අර්ථ මේ මැයි. **විජාති**, නපුරු වූ ජාති ඇති; **විසිඛාලොලා**, වීථියෙහි ඇවිදිනා කැමැත්තාහු; **කිච්ඡෙන**, දුකින්; **කසිරෙන**, යන්තම් පරිද්දෙකින් නොහොත් දෙකින්මැ ඉතාමැ දුකිනැයි කී නියායි. **සමහතං**, රැස්කරනලද; **ජාරෙහි**, [9]විහිර සැමියන් හා හෙවත් සොර සැමියන් හා; **අච්චාසිතමපි**, ඉතා ඉක්මන්වූද; [10]**ගෙහපරික්ඛෙපස්ස උපරිභාගෙනපි**, [11]ගෙබිත්තක් මත්තෙන්ද හෙවත් [12]බළල්වායෙන්ද; **චත්තාරොපි පන වණ්ණා**, ක්ෂත්‍රිය බ්‍රාහමණ වෛශ්‍ය ශුද්‍ර යන සිවුවනක් මිනිස්හුද; **පූරිතකුම්භමෙව**, පිරුණු කළ මැ; **පුබ්බන්න**, පෙරවරු වැපිරිය යුතු වී; **අපරන්න**, උඳුමුං; **ලායන්තා**, දන්නාහු; [13]**පවෙසන්තා**, කොටගෙවලැ ලන්නාහු; **යන්තානි**, උච්ඡුයන්ත්‍රයන්; **යන්තානි වාහෙන්තා**, යන්ත්‍ර මඬනාහු හෙවත් යතින් උක් මිරිකන්නාහු; [14]**ලඤ්ජවිත්තකා**, අත්ලස්මැ ධන කොට ඇත්තාහු; **උච්ඡුගණ්ඩිකා විය**, උග්ගැට පෙළන්නාසේ; **බලිං**[15]**ආසාදෙත්වා**, අය වඩා තබා; **ඝනවාසො**, ඝනවූ ගේ ඇති; **විදූරෙත්වා**, හොරකොට; [16]**කුම්භියා**, සැළියෙහි; **අතිකිලින්නා හොති**, ඉතාමැ විලිස්සුණු වැත්තෝයැ; **උත්තණ්ඩුලො**,

1 ඇලුනු BCDF 2 අවුවෙහි A. 3 ඛුද්දක A. 4 වසට A. 5 බිරිඳ විචාරත්තාහු A. 6 තරුණෙ-මු. අ. සා. 7 සාමමං-මු. අ. සා. 8 නිපතරණ A. නිපපරණ CD. 9 විසිර සැමියන් B. විහිරමියන් CD. 10 ගෙහෙ පරික්ඛපස්ස-මු.අ.සා. 11 ගෙබිණත B. ගෙබිතන් C. ගෙබිත්න D. ගොබිත්තක් F. 12 බල්වායෙන් ද B. බලල්ලායෙන් ද F. 13 පවෙසෙන්තා-මු. අ. සා. 14 A හි පමණකි. 15 උපපාදෙත්වා-මු. අ. සා. 16 මෙතැන් පටන් 87 පිටේ 6 වෙනි පෙළේ 'දිට්ඨම' යනු දක්වා A හි පමණක් ආයේයි.

සාල්........; **රාජයුත්තා**, රාජ්‍යකටයුත්තෙහි නියුක්තයෝද; **රට්ඨ** නම් මහාදෙශය; **ජනපද** නම් ඒ මහාරට එකී එකී ප්‍රදෙශයයි; **නිප්ඵරණපක්ඛසිතා**, සසරින් නගත පක්‍ෂයෙහි සිටියාහු; **අඩ්ඪ**, මසුහාග; **පාද**, දූක; **මාසකරූපාදීනි**, අට වියට ආදි රූ; **සිදනනානි**, ගැලෙන්නවුන්; **ඵලවමානා අද්දසං**, ඉපිල්ලෙන්නා දිටිමි; **ඛුද්දකමධුකපුප්ඵපමාණා**, කුඩා මී පුප්සා, [1]**මංසං ඛාදිත්වා**, [මස්] සපා නොහොත්..................**පරිච්ඡදාදිජාතං වා**, පිළී ආදී උපකරණ සමූහ එව්; **කිං තුය්හිමිනා ව්‍යාපාරෙන**, තට මේ විචාරයෙන් ප්‍රයොජන කිම්ද; [2]**දසයි අසද්ධම්මෙහි**, "ධංසී ච පගබ්භො ච [3]නිත්තින්නො ච මහග්ඝසො ච [4]පලුද්ධො ච අකාරුණිකො ච [5]දුබ්බලො ච [6]ඔරම්තා ච මූට්ඨස්සතී ච [7]නෙරයිකො ච" යන මේ අසද්ධම්යි; [8]**ගාමගොචරං**, ගම් ගොදුරු **ගන්තා**; **නගා**, හණපත් වූවාහු; **වක්කා**, ව්‍යාඝ්‍රයෝ නොහොත් දිවියෝ; [8]**අපඤ්ඤාතා**, අප්‍රසිද්ධවූවාහු; [9]**අභිජ්ඣිත්වා**, සටන් කොට; [8]**ධම්මසුධම්මතාය**, සිත සවභාවයෙන්; **ආමිසචක්ඛුතාය**, හුලැසි බැවින් [10]නොහොත් ප්‍රත්‍යයෙහි ලොල් බැවින්; **අතිඡෙක**, නොනොට හෙවත් නොමනැ; **පටිජානාපෙත්වා**, නැවත දන්වා හෙවත් ගිවිස්වා; **පුරිසයුගෙ වත්තමානෙ**, පුරුෂයුගය පවත්වමින් සිටි කල්හි හෙවත් සත්ව යුගය මොක්‍ෂසම්පත්ති යුගය පවත්වමින් සිටි කල්හි......

## 77. මහාසුපින ජාතකං.

**න සමණබ්‍රාහ්මණානං අග්ගං අනුභොන්ති**, මහණ බමුණන්ට වැඩ නොසාධා; [8]**කපල්ලපූවං**, කබලු පූ; [8]**උප්පණ්ඩුප්පණ්ඩුකජාතො**, පඬුවන් පැහැ ඇතිවූයේ; **ධමනිසන්ථතගත්තො**, නහර වැල් පතළ සිරුරු ඇත්තේ; [8]**මඤ්චකං උපගූහිත්වා**, හැඳ [11]වැළඳගෙනැ; **එවං ගතෙනාපි**, [12]එසේවූ අවස්ථාවට පැමිණියේද; [8]**වචනං පටිග්ගණ්හන්තා විය**, තෙපුල් ගලන්නකුසේ; **එකරච්ඡාවාසිනං පහොන්තකං**, [13]අප හා සමඟ එක වීථියේ වසන ඇත්තන්ට සෑහෙන පරිද්දෙන්; [8]**සකලතණ්ඩුලෙ**, මුල්සාල්; **උද්ධනකපල්ලානි**, [14]ඉදිතිය හා කබලු පිසන කබල්; [8]**විස්සජ්ජෙත්වා**, ගෙන් පිටතට යවාපියා; සූචි, හිඳි[15]හගුඑ; **සබ්බා**, උඩින් හෙළන

1 මෙතැන් පටන් 9 වෙනි පෙළේ 'කිම්ද' යනු දක්වා A හි පමණක් පැනේ. 2 දසසි අධම්මෙහි A. 3 නිත්තාතිනො ච C. නිත්තිමානො ච D. 4 පලුටෙඨා ච D 5 දුබ්බලො ච CD. 6 ඔරමතා ච C. බරම්තා ච D. 7 නෙරයිකා ච CD. 8 A හි පමණකි. 9 අභියුඤ්ජිත්වා-මු. අ. ක. 10 මෙතැන් පටන් 21 වෙනි පෙළේ 'මහාසුපින ජාතකං' යන්න දක්වා A හි පමණක් පැනේ. 11 වැළපිස ගෙනැ A. 12 එසේවූයේද CDE. 13 එකවීපියේ වසන තැනැත්තවුන්ට සෑහෙන සේ CD. එකවීපියක ඇත්තවුන්ට සෑහෙනසේ E. 14 ඉදිනිකබල් CDE. 15 අගුළු A. හිඟුළු E.

හගුළු; **මණිරූපකං විය**, ඉඳුනිල්මිණි රුවක්මෙන්; **අපදෙ**, පිහිට නැති අහස්හි; [1]**පදං දස්සෙත්වා**, පද වළජ දක්වා; **දබ්බිකණ්ණකෙන**, සැඳි අගින්; **පිපාසා උච්ඡිජ්ජි**, කබලු පූයෙහි ආසා සිඳිණි; **අත්ථි දින්නං**, [2]දනය ඇත-දුන් දනයෙහි ඵල ඇත; **අත්ථි යිට්ඨං**, [3]පූජා ඇත-කළ පූජායෙහි ඵල ඇත; [4]**විඝාසාදනං ච**, කවුඩනටද-සිඟන්නන්ට යයි සේයි; **පබ්භාරට්ඨානෙ**, නතුවැ වලවැ තිබෙන තැනෙක්හි; **විකිරි**, ඉසපී; [5]**පතිසල්ලීනෙ**, විවෙක ගතවූ [කල්හි]; **යථා**, යම්සේ; **භමරො**, භෘඞ්ග තෙම; **පුප්ඵං**, පුෂ්පය; **වණ්ණගන්ධං අහෙඨයං**, වර්ණගන්ධ දෙකා නො නසමින්; **රසමාදය**, පුෂ්ප රේණුව ගෙනැ; **පලෙති**, යන්නේද; **ධුරාචාරකං**, [6]රාපද්දක්; **කොසකං**, [7]රහචිත නො හොත් මලාව; [1]**විහඞ්ගපාසො විය**, පෙළු පුළුන්මෙන්; **පණ්ඩු**, සුදුවූ; **මාසකමත්තං**, [8]කතාවක් නොහොත් අටවියටක් පමණ; **අන්තොඋම්මාරෙ**, ඇතුළුගෙයි-[9]එළිපත ඇතුළෙහි; [10]**සිතාකාරං දස්සෙත්වා**, සිනා ආකාර දක්වා හෙවත් මඳක් සිලා; **නාසා රජ්ජුකං**, නැරුහැණෙහි; **ඝොටෙත්වා**, තළාපියා නොහොත් ඇන; **එත්තාවතා ච**, මේ කපපරප්‍රහාරාදියෙන්මැ; **තස්ස**, ඒ සිටුහුගේ; **වංසපෙසිකාහි**, හුණපත්තෙන්; [11]**කුණ්ඨපාද**, ලුහුඬු පා ඇත්තාහු [4]නොහොත් එක් පා එව් කොර ඇත්තාහු; **කුණ්ඨහත්ථා**, [12]කුරු අත් ඇත්තෝ [13]නොහොත් කොර අත් ඇත්තෝ. කොරදතෝද අත් එව් එක් අත එව් කුණු තිය ඇත්තෝද යෙත් මෙ. **විසමචක්ඛුමණ්ඩලා**, වමරුසිවූ ඇස් ඇත්තෝ-තපුරු බැලුම් ඇත්තෝ; **කෙකරා**, වමරුස්සෝ; [4]**න පස්සාමි**, නොහඳුනමි; [4]**පුඤ්ජිත්වා**, පිසැ......

## 78. ඉල්ලීස ජාතකං.

[4]**පච්චන්තගාමෙ**, පසල් දනව්වෙහි; **රාජබලිං ලභිත්වා**, රජුගෙන් එගම අය තමාට ලදින්; **මනුස්සෙ ආදාය**, එගම මිනිසුන් ගෙනැ; **පගෙව**, සොරුන් එන්තාට පළමු; **උපසගෙනාපසගෙනා විය**, සන්හුන් එකකුමෙන්; **විලුම්පිත්වා**, පැහැරගෙනැ; [14]**ඛරමරෙ ගහෙත්වා**, [15]අද මේ ගමට සොරු

1 මෙතැන් පටන් 4 වෙනි පෙළේ 'සිඳිණි' යන්හා දක්වා A හි පමණක් ආයේයි. 2 දුන් දූ ඇතCDE. 3 පූජාකළ දූ ඇත CDE. 4 Aහි පමණකි. 5 මෙතැන් පටන් 11 වෙනි පෙළේ 'යන්නේද' යනු දක්වා A හි පමණක් පැනේ. 6 රාබද්දක් CDE. 7 මාලාවක්C. 8 A හි පමණකි. 9 අටවියටක් පමණ CDE. 10 එළිපත් පඩියෙහි A. 10 මෙතැන් පටන්18 වෙනි පෙළේ 'සිටුහුගේ' යන්හා දක්වා Aහි පමණක් ආයේයි. 11 කුණ්ඨකපාද-මු. අ. ක. 12 ලුහුඬු අත් ඇති CE. 13 මෙතැන් පටන් 23 වෙනි පෙළේ 'බැලුම් ඇත්තෝ' යනු දක්වා A හි පමණක් පැනේ. 14 ඛරමරගාහං ගාහෙත්වා-මු. අ. ක. 15 සිරකොටගෙනැ CDE,

එතිසි මිනිසුන් බැණලා කරවුවර ගන්නාසේ ගෙනෑ නොහොත් සුද්ධකොට පරදවා එයින්ම මිනිසුන් සිරකොට ගන්නාසේ ගෙනෑ; [1]**හතපුත්තාය**, දරු නැති මවගේ.

## 79. ඛරස්සර ජාතකං.

[2]**විකුජ්ජිතං**, [3]බැඳගෙන කියන සුලු නොහොත් වණ්ණනා කරන සුලු; **කාසිකවිලෙපනං**, කසීරට විලවුන්; **ලූඛානි**, කොරසැටි; **විකත්ථෙන්තො**, [4]බැඳගෙන තමාගේ ජාත්‍යාදි වණ්ණනා කරන්නේ; [5]**වම්භෙන්තො**, අනුන් ඔබන්නේ; **සබ්බසමයසිප්පානි**, අෂ්ටාදශ විද්‍යාස්ථානයන් හෙවත් සෙසු සියලු ජනයන් කෙරෙහි පවත්නා ශිල්ප; **ඛනකාකාරො**, මඳක් බඹ නැමුණු ආකාර ඇත්තේ; **එලකං කත්වා**, වහල්කොට; **නානාවායස්ස**, [1]වියන්නක්හුගේ; [1]**නානාවිනනට්ඨානං**, හු වියන තැනට; **උපධි**, ශරීරසම්පත්තීන්; [6]**කොපෙය්‍ය**, අනාදර කරන්නේයි; **නිබන්ධිස්සති**, නියම කොට තබා දෙන්නේයෑ; **සයං චුල්ලධනුපට්ඨාකො හුත්වා**, තුමූ ඔහුගේ කුඩා අතවැසි දුනුවායකුවෑ; **චුල්ලුපට්ඨාකො**, සුළු අතවැසි; **ජඩ්ඩාපෙති**, හසර [7]නොකිරියදී වළකා; [1]**උට්ඨානභාවං**, පැන නැගි බව; **අවඤ්ඤං**, අනාදර; **උපරුන්ධිත්වා**, වළකා; **ඡන්නවෙසං**, ගූඪවෙෂ; [1]**තාසමරණභයෙන**, ඔහු මියයෙතී යන භයින්; **ඝොසෙන්තො**, පොරොද්දෙන්; [8]**දූසෙසි**, නැසී; **ඉදං තාව එකං**, මේ ආදි කියේ එකෙක–එසේ තා ආදි කී දෙයට දූන්වූ දෙය අතිකෙක–විසදෘශය යනුයි; **සරණභාවෙන ච**, සිලියෙන බැව්න්ද–වැහෙන බැව්න්ද යනුයි; **සකට්ඨානමෙව**, ඔහුගේ ආදි වියත ගමටමෑ.

## 80. භීමසෙන ජාතකං.

# අට්ඨමො වග්ගො.

**පසුපාලකා**, එළුගොපලු; [1]**පථාවිනො ච**, මගීනුද; **භද්දවතිකාය අවිදූරෙ**, එනම් ගමට නුදුරු තැන්හි; [1]**ජටිලස්සමෙ**, ජටිලයාගේ ආශ්‍රමයේයි; **මක්ඛං අසහමානො**, අනුන්ගේ ගුණමකන ලකුණු ඇති–නොහිවසියහෙන ලක්ෂණ ඇති–මකුකෙලෙස් නොඉවසිය හෙන්නේයෑ–**කාපොතිකා**

1 A හි පමණකි. 2 විකාජිතං-හැම. 3 වණ්ණනා කරන සුලු CDE. 4 වණ්ණනා කරන්නේ CD. 5 මෙතැන් පටන් 10 වෙනි පෙළේ 'ශිල්ප' යන්න දක්වා A හි පමණක් පැනේ. 6 මෙතැන් පටන් 16 වෙනි පෙළේ 'දුනුවායකුවෑ' යනු දක්වා A හි පමණක් ආයේයි. 7 නොකියදී වළහා BCDF. 8 මෙතැන් පටන් 23 වෙනි පෙළේ 'ගමටමෑ' යනු දක්වා A හි පමණක් පැනේ.

**සුරා**, පරෙවියන් බඳු පහන් රා. පරෙවියන් සුවිහෙයින් ප්‍රසන්න සුරායට උපමා කොළෝ. **උදකසෙදඬුහකාමපි**, දියබරණකුදු; **වසානසමයෙ**, වර්ෂාසමයෙහි; **බහිද්වාරගාමෙ**, නුවරින් පිටත දොරටුගමැ; [1]**පරිභාරිතින්ද්‍රියා**, මරනලද නොහොත් **සත්** හිඳුවනලද චක්‍ෂුරාදි ඉන්ද්‍රියයන් ඇත්තාහු; **බාරියාදිනි අවසරිත්වා**, තවුස් පිරිකර ආදිය වැතිරැ-තිදඬු [2]කොණ්ඩිකා ඈ තවුස් පිරිකර හා වෘක්‍ෂපාෂාණාදියෙහි වැතිරැ යුතැන්; **වානරා නාහුම්හ**, [3]මහවඳුරු නුවූම්හ; **දිටඨා**, 'එතදෙව සාධු'-මෙම යහපති; **ලාලෙහනා**, සලන්නමෝ නොහොත් **ලාලෙත්වා**, සලා; **සඤ්ඤ**, ධම් සංඥ ආදිවූ සංඥවන්~

## 81. සුරාපාන ජාතකං.

[4]**උරචක්ක** නම් පාෂාණමයවූ හෝ මාණික්‍යමයවූ හෝ කර මුවහත් ඇති වටවූ ගිනිගෙනැ දිලියෙන කර ලූ කල කැපෙන මෙයින් සැව පරලොව උපන් පාපී සත්‍වයාහට දුඃඛාවහවූ ආයුධ විශෙෂයෙකි; **අගිනිවිටෙඨා**, [5]වදනා ලද්දේ නොහොත් එයින් යුක්තවූයේ; **අපෙක්ඛා සුටො**, වැතිරෙන ලද්දේ~

## 82. මිත්තවින්ද ජාතකං.

**සහපංසුකිළිතො**, එක්වැ පස්කෙළියේ; **අත්තනො කුටුම්බං පතිවඡාපෙසි**, තමාගේ කිරින්ද රක්‍ෂාකරන පරිද්දෙන් පාවා දිනි නොහොත් තමාගේ වස්තු රක්‍ෂාකරන පරිද්දෙන් පාවා දිනි; [6]**යකොඩාපි පලායෙසය**, යකෙකුත් වීනම් පලායන්නේයි-එසේ 'කාලකණ්ණිය' යන මේ ශබ්දය අසා යකුත් පලා යන කල නිරන්තරයෙන් 'කාලකණ්ණී' යන බස අසන්නාවූ තොප කෙරෙහි නම්[ශ්‍රී නොමෙෝ] කොයි වසන් නීද-ඉතිකින් තොප ශ්‍රී [7]නැතිවැ යන්නේයි; [6]**දුරූපෙතො**, විසුළුය; **ආලිඛහං**, මිහිඟුබෙර; **සමජ්ජං**, රඟමඬුලු; **මෙ කුටුම්බං**, මාගේ වස්තු; **තස්සඝනරෙ**, සිටාණන් අතුරෙහි-ඔහුගේ දෙයක්~

## 83. කාලකණ්ණි ජාතකං.

[8]**ගුරූනං**, ගුරුන්ගේ නොහොත් ප්‍රඥවන්තයන්ගේ; **කාරණනිස්සිතං** [සුතං], හෙතු ඇසුරු කළ [ශ්‍රැතය]—භාරත සීතා හරණාදි නිරර්ථක [9]ශ්‍රැතය ඇරැ අවශෙෂ කාරණ සහිත සාර්ථක

1 පරිචාරිතින්ද්‍රියා-මු. අ. සා. 2 කුණ්ඩිකා E. 3 වඳුරු A. 4 උරචක්ක CD. 5 වදනා ලද්දවූ A. බඳනාලද්දේ E. 6 මේ පාඨය හා අර්ථය A හි නොපැනේ. 7 නැතිවන් නේයි CD. 8 ගරූනං-මු. අ. සා. 9 ශාස්ත්‍රය A.

ශ්‍රැතය යනුයි. **අපස්සිතානං**, හිත ඇසිරූ කල; **අනිවත්තා**, නො හැකිලෙන බැව්.

## 84. අත්ථස්සද්වාර ජාතකං.

**අග්ගානි**, අතුණු; **පුබ්බන්තා**, පැදුන් දෙසෙන්; **අපරන්තං**, පැල දෙසට; [1]**ඵලාඵලානි**, කුදු මහත් ඵල; **අනෙන**, අනාතයෙහි හෙවත් විපාකාවස්ථායෙහි-විපාක කාලයෙහි; **අනෙන**, පාකාවස්ථායෙහි-පාකයට යන කල්හි නොහොත් [2]හෑ අනාතයෙහි.

## 85. කිම්පක්ක ජාතකං.

[3]**කුලපදෙස**, කුලපරපුරූ; [4]**හෙරඤ්ඤිකස්ස**, රන්කැමියා ගේ නොහොත් වණ්ණක්කාගේ; **ඵලකෙන**, රන් තිබෙන පුවරුවෙන්; **රාජකුටුම්බං**, රාජභාණ්ඩය; **රාජකුටුම්බිකස්ස**, රජ කොලෙඹියාගේ හෙවත් රජ්ජුරුවන්ගේ වණ්ණක්කාගේ; **පමුඛං**, ප්‍රධාන; **දානාධිමුත්තො**, දන්හි බලවත් අදහස් ඇත්තේ; **අභිගුණ්ඩිකා**, සපියන් කෙළවන්නාහු; **ගලෙ වෙඨෙන්ති** [5]සපියා හැරගෙනෑ තමන් කර වෙළන්නාහ; **ආචාරසීල** නම් පඤ්චසීලයමැයි; **අනුස්සාවනෙන**, අසා එන විසින්.

## 86. සීලවීමංස ජාතකං.

**සාටකලක්ඛණ**, වස්ත්‍ර ලක්ෂණ හෙවත් වස්ත්‍රයෙහි මේ මේ තැන මූෂිකාදීන් කෑ කල තපුරු මේ මේ තැන කෑ කල යහපතෑ යනාදීන් පිළියෙහි ලක්ෂණ දන්නා; **කොතුහලමඞ්ගලිකො**, හෙද මඟුල හෙද මඟුලැයි ගන්නේයි හෙවත් දෘෂ්ට මඞ්ගලය ශ්‍රැතමඞ්ගලය යනාදි වශයෙන් හෙද මඟුල හෙද මඟුලැයි ගන්නා හෙයින් කොතුහල මඞ්ගලිකය; **මිගවීථිං ගහෙත්වා**, මුවා එන මඟ ගෙනෑ; **අගාරසප්පං විය**, ගෙන් ගත් දීසී ජාතියකුමෙන්; **යුගසාටකං**, පිළිසහළ; **අනන්තරවිට්ඨිනං**, අතුරු වෙය; [**මඞ්ගලා**], නිඳ නැගී කිඹුල්වන්ගෙරි ගර්භිණී මාග මූන් දක්ම දෘෂ්ටමඞ්ගල නම් වෙයි. [6]සිරිවඩ්ඪන ධනවඩ්ඪන යනාදි ශබ්ද අසනු ශ්‍රැතමඞ්ගල නම් වෙයි. දධිතාලඵලාදිය අත් පහරවනු මූතමඞ්ගල නම් වෙයි. **එතෙ මඞ්ගලා සමුච්ඡින්නා** [යනු] [7]යමෙක්තුමූ කර්මයෙන් සිද්ධවන්නාවූ අර්ථසිද්ධියට දෘෂ්ටමඞ්ගලාදිය පූර්වනිමිත්ත වනබවමුත් වෙන දෘෂ්ටමඞ්ගලාදියෙන් වන අර්ථසිද්ධියෙක් නැතැයි නොගෙන ඒ දෘෂ්ටමඞ්ගලාදියෙන්ම අර්ථසිද්ධිය වෙයි කියා ගත්තාහු වූ නම්

1 ඵලානි-මූ. අ. ක. 2 විපාකඅනාතයෙහි A. 3 කුලපපදෙස-මූ. අ. ක. 4 හිරඤ්ඤිකස්ස-හැම. 5 හැරගෙනෑ A. 6 සිරිවඩ්ඪ ධනවඩ්ඪ BCDF. 7 යථොකතවූ A.

උන්ගේ ඒ ග්‍රහණය දෘෂ්ටමඞ්ගලාදි විෂයවූ අසද්දෘෂ්ටි නම් වෙයි. එසේ වූ දෘෂ්ටමඞ්ගලාදීන්ම අභිසිද්ධිය වෙයි කියා ගැනිම් වශයෙන් ප්‍රවෘත්තවූ විපරීත දෘෂ්ටියගේ සමුච්ඡේදය තකා කීහු. නොහොත් යථොක්තවූ [1]තත් විපරීත දෘෂ්ටියගේ විනාශයෙන් දෘෂ්ටිස්ථානවූ ඒ දෘෂ්ටමඞ්ගලාදීන්ගේ විනාශය කළා නම් [2]වේනුයි ඒ දෘෂ්ටමඞ්ගලාදීන්ගේම විනාශය තකා හෝ **එතෙ මඞ්ගලා සමුච්ඡින්නා** යි කීහු. [3]උප්පාත සුපිනාදියෙහිදු මෙමැ ක්‍රමයි. **චන්දග්ගාහො**, සඳ රාහු ගැනුම්; **එවරූපො භවිස්සති**, [4]මෙබඳු වන්නේයැ හෙවත් සඳ රාහු ගත් කල මෙසේවූ ඉෂ්ටයෙක් මෙසේවූ අනිෂ්ටයෙක් වන්නේයැ; **නක්ඛත්තග්ගාහො**, නක්ෂත්‍රයන්ගේ විග්‍රහය; [5]**උක්කාපාතො**, මහත් තරු හීම්; **දිසාඩාහො**, ගිනිගත් කලක් සෙයින් දික් ප්‍රසන්නවීම්; **සුභග** [ලක්ඛණං], පින් ලකුණු; **මඞ්ගලං වා**, ඉෂ්ටයෙක් වේවයි; **න පවෙච්ඡති**, නොදක්නේද හෙවත් නොපසස්නේද; **සබ්බමඞ්ගලදෙසවීතිවත්තො**, යථොක්ත සියලු මඞ්ගල විෂයවූ [6]දෘෂ්ටි දෙෂයන් ඉක්මුණේයි; **කොධො**, පළමු උපන් ද්වෙෂය; **උපනාහො**, බද්ධවෛරය; **මක්ඛො**, අනුන්ගේ ගුණ මකන ලක්ෂණවූ මකු කෙලෙස් නොහොත් කළ ගුණ නසන දෙෂය; **පලාසො**, අනුන්ගේ ගුණ හා සමවූ ගුණ ඇත්තෙමියි උපදනා දෙම්නස් සිත්.

## 87. මඞ්ගල ජාතකං.

**ඔමසවාදසික්ඛාපදං**, හැවිලි පිණිස ජාත්‍යාදීන් සවා කිණීම් [7]නිසා පැනවූ [8]සික්ඛාපදයැ.

## 88. සාරම්භ ජාතකං.

**කූටජටිල**, කුළු තවුස් වූ; **ජටානං—පෙ—පටිනිවත්තති**, ජටා අතුරෙහි එක් තැනකින් තණ [9]කොන්දක් ගෙනැ රුවා තබා ගෙනැ නැවැත කෙළෙඹියා කරා අයි; [10]**සත්තං**, ඇලුණේයි; **තිණසලාකං**, තණ [9]කොන්ද; **නික්ඛසතං**, නික් සියයක්. නිකෙක් නම් රත්රන් පසළොස් කළඳෙකි. ඒ එක්දහස් පන්සියයක් පමණ රත්රනි. **අසජ්ජිත්වා**, නො නැවැත හැරැගෙනැ; **සජ්ජතාසීති**, ඇලුණෙහිදූයි-ලග්න විහිදූයි හෙවත් මේ නිකම් තණකොන්දක් මාත්‍රයෙහි සැකතොට නැවැත්තෙහිදූයි.

## 89. කුහක ජාතකං.

1 තත් තත් විෂයවූ A. 2 වෙත්නුයි-හැම. 3 උතුපාද BF. උත්පාද C. 4 මෙවන්නු BCEF. 5 උල්කාපාතො A. 6 දෙෂයන් C. 7 පිණිස BEF. 8 ශික්ෂාපදය AB. 9 කොන්දක් BCEF. 10 ලග්ගං-මූ. අ. ක.

අදිට්ඨසභාගො, නුදුටු විරූ යහළු; උට්ඨානක, උපදනා; [1]කම්මික, කර්මාන්තයෙහි යුක්ත. "කම්මන්තික" යයි කියාත් පාඨයි. අපි/මෙමැයි; පච්චකොබන, පසකින්-උන්ගේ රකවල් ඇතිවැ; සාගතං වොති, තොපගේ ආගමන යහපතැයි හෙවත් තොප[2]ආසේ යහපතැයි; විචක්ඛාණි සඛා, සක් නැති කොට-ගැලින් සක් වෙන් කොටය යනුයි; භූමියං ඨපෙත්වා, [3]සක් ගැලවූ ගැල් නිකම් බිම තබාපියා; කතකිච්චො, කරන ලද වැඩ ඇත්තේ; කල්‍යාණක්ඛෙව, කල්‍යාණද හෙවත් කෘතොපකාරද.

### 90. අකතඤ්ඤු ජාතකං.

## නවමො වගෙගා.

පටිසංඛාය, පරීක්ෂාකොට; යොනිසො, නුවණින්-උපායෙන්; විවරං, උතුරුවසා සිවුරු; නන්තිං, පයසීපති හෙවත් පෙළ; අක්ඛධුත්තො, අක්ෂශෞණ්ඩවූයේ-දූ කෙළියෙහි ලොල්වැ ධූර්තවූයේය යනුයි; අක්ඛා, වට හෙවත් පසඇට; හොතු, වන්නාටය; පටිරූපං, සුදුස්සක්; චොදෙතුං, චොදනා කරන පිණිස හෙවත් වූ තියාව ප්‍රකාශකොට කියනු පිණිස; ගුළකං, පසඇට; වමනයොගං, නහන්නට සුදුසු ඖෂධයොගයක්; ඵාණිත, සකුරු; ඉමස්මිං කාලෙ, මේ බුදුහමුයෙහි.

### 91. [4]ලිත්ත ජාතකං.

පරිපුණ්ණායතනතා ච, පරිපූර්ණවූ චක්ෂුරාදි ඉන්ද්‍රියයන් ඇති බවද; මඤ්ජුසාය, පෙට්ටගමෙහි නොහොත් මැදිරියෙහි; නතො යං සක්ඛිසාම, ඒ [5]අප ඇසූ ධර්මයෙන් යමක් උගැන් මට තිස්සමෝද; අනත්තමනො, නොසතුටුවූයේ; ආගතාගමො, [6]අධිගම හෙයින් ආ ආගම ඇත්තේ; ඔරකෙන, හීනයකු විසින්; [7]වාචනත්ථාය, හදුරවන්නට; අනොවලඤ්ජනමනුස්සෙ, ඇතුළත පරිවාර ජනයා; අසක්කි පන නං ආහරාපෙතුන්ති, ඒ ගන්වන්නට පොහොසත්විහිදූයි හෙවත් ඒ ගෙන්වා ගත [8]හිණිදූයි කිවූ; පිණ්ඩදානං, [9]මැටිපිඬු දීමද; පලාලපිණ්ඩං වා, පිදුරු [10]කැරල්ලක් වේවයි; ආදාය, තමන් පසිඳිනා පරිද්දෙන් [11]හැරගෙනැ; න ඔසක්කිස්සති, පසු නොබස්නේයැ; වන

1 කම්මන්තික-මු.අ.ක. 2 ආයේ ABDEF. 3 ගැලෙන් ගැල් සක් A. ගැලනූ ගැල්සක් BCDEF. 4 විත්තජාතකං BCEF. 5 අතුරු A. 6 අධිගමනය හෙයින් A. 7 පාඨනත්ථාය CD. 8 හිඟිණිදූයි CD. 9 මැටිවටලිම්ද BCDF. 10 කැබැල්ලක් BEF. 11 පැහැරගෙන BCDF.

**සතරානි විචරිත්වා**, පුෂ්පාරාම ඵලාරාමයෙහි ඇවි
**පගගීවුපගාදීනි**, හිස පලන් කර පලන් ආභරණ අ
**පෙත්වා**, පාවා දී; **පචලායිතුං**, හිඳ නිඳන්නට හෙව
චනා හිඳ නිඳන්නට; **මහාමුත්තාහාරං**, [1]දළමුත්හර;
**සගනා විය**, සන්හුන්නියකසේ; **බලිකාරකපුරිසෙ**
එකෙක් නොහොත් කරවුවර දෙන [2]අය කුඩිගෙ
**පිවජාමි න තනි**, ඒ මම ගත්මියි කියා [3]ගිවිසමියි; **මහා**
**නං**, දළහර පළඳනාව; **මහාසාරං නාම**, දළහර යටි
හරින් කළ හෙවත් මහරුක්හරින් කරන ලද පා අ
**බ්බස්ස**, ගී කියන එකකුට; **වණ්ණදාසියා**, කැතිය
වෙශ්‍යාවට; **අනොනාවලකෙඛජ්**, ඇතුළත ඇත්තවුන්
**බහිවලකෙඛජා**, රජගෙන් පිටත වසන්නෝයැ; [4]
**මාති**, පසිඳපියම්හයි; **කණ්ණං දත්වා**, කන් දී; [5]**සන**
**වෙලාය**, හැකුළුණු වේලෙහි; **මහාසාරං**, මහඇගි
**සාරපාදකං**, රුක් හරින් කරන ලද පා ඇති; **ගෙ**
සිරිදඹුමය; **මකඛං**, අනුන්ගේ ඉසුරු ගුණ මකන
මකුකෙලෙස්; **ආහතනති**, ගන්නාලදූයි; [6]**උභතො**
අතින් එළබැ සිටි හෙවත් දෑතින් නහා සිටි; **සමමතන**
[7]විචාරන කල්හි; **අවිකිණණවාචො**, ඒ ඒ තැන කිම්
නොවිසුරුණු තෙපුල් ඇත්තෝ; **අපථගමගිරෙ ධම**
යනු අර්ථ හා පෙළ හා ගැඹුරු හෙයින් කියත්

92. මහාසාර ජාතකං.

---

**මාතුලානියා**, නැන්දා විසින්; **විස්සත්ථා හුත්වා**
හෙවත් නිරාසඞකවැ; **කිටඨසමබාධසමයෙ**, ගොය
ඇති සමයෙහි; **ගොපලලිකං කත්වා**, ගහල් බැඳ;
**කාය සඤ්ඤිං**, මිහිවින්නක හා; **ලෙපිත්වා**, ලෙවැ; **වස**
තෙල්ද; [10]**අජෙඛනා**, අනුව ගියාද

93. විස්සාසභොජන ජාතකං.

---

**පාටිකාරාමෙ**, පාටිකය යන තිවටහුගේ [11]අරම්
**කඛතතියස්ස**, එනම් තිවටාගේ; **උතතරිමනුස්සධම**
ධර්මයෙන් ප්‍රකෘති මනුෂ්‍යයන්ට සාධාරණ දශශීලා
ධර්මයන්ට අධිකවූ; [12]**අලං**, ආයති බව කරන්නට

---

1 දගමුත්හර BCDF. 2 අයකුණසයින් A.. අසතුදූඩියෙක්
4 නිතතරිස්සාමිති A. නිස්ථරිස්සාමිසි-මු. අ. සා. 5 සනනිසිනන
6 උභතොබුළෙහ-මු. අ. සා. 7 විතාරන A. 8 අකුල් BCDF. 9
අනොවති-හැම. 11 ආරාමයෙහි A. 12 ;මෙතැන් පටන් 92 වැ
ඉපළේ 'බැවින්' යනු දක්වා A හි නොපෑනේ.

නොහොත්-**අලං**, නිදෙස්වූ; **ඤාණදස්සනවිසෙසො**, [1]ඥානදසුන් විසෙස්. දිව්‍යචක්ෂුසය, මාර්ගඵල පස්විසාන නුවණය, සර්වඥතා ඥානය යන මේ [1]ඥානදසුන් නම්. **නානාපරියාහනං**, ආචාර්‍ය මුඛයෙන් ගත් දෙයක් නැති බැවින් සිතාගෙන එසේ වන්නේ වෙයි කියා තර්කයෙන් පහරනලදුවා කොට; **වීමංසානුචරිතං**, එසෙයින් කරත් කියත් වටනේ වන්නේ වෙයි යන නුවණ ඇසිරෙනලදුවා කොට; **සයංපටිභානං**, තමාගේ ඥනයෙන් මැවූවා හෙවත් කවි කථාසේ තමාගේ ඥනයෙන්මැ නිපදවා බැඳගත්තා කොට "යස්ස ච ඛ්වාස්ස අත්ථාය" යනුයෙහි "යස්ස ච ඛො අස්ස අත්ථාය"යි පදච්ඡේද කරනු. **ඛො** යනු පදපූරණයෙහි නිපාතය. ච යනු සමුච්චයාර්ථයෙහි නිපාතයි. **යස්ස අත්ථාය**, යමක්හු පිණිස; **තක්කරස්ස**, ඒ ධර්මය කරන්නාහට හෙවත් පිළිපදින්නාහට; **සො න [2]නිය්‍යාති**, ඒ ධර්මය නොවත්නේයි නොහොත් ඒ ධර්මය නොපමුණුවන්නේයි. "සො න [2]නිය්‍යාති" යනාදිය කියන්නාවූ සූනක්ඛත්ත තෙමේ දුක්ඛයාගේ විනාශය පිණිසැ පවත්නාවූ ධර්මයෙක් ඇතැයි යනු සිත්හි තබා කියානුයි "සො ච [2]නිය්‍යාති" යනාදියත් [3]කිවා නම්මැ වෙයි එහෙයින් "සො න [2]නිය්‍යාති-පෙ-භාසති" යි කියනලදි. **ඡළභිඤ්ඤා** නම්:-

"ඉද්ධිවිධං දිබ්බසොතං-පරචිත්තවිජානනං,
පුබ්බෙනිවාසානුස්සති-දිබ්බචක්ඛු ති පඤ්චධා"යි

කියන ලද පසයැ ආශ්‍රවක්ෂයකරඥනයැ යන මේයි. [4]**චතුවෙසාරජ්ජඤාණ** නම්:-

"අන්තරායෙ ච නිය්‍යානෙ-බුද්ධතෙන ආසවක්ඛයෙ,
එතෙසු චතුසු ඨානෙසු-බුද්ධො සුවඤ්ඤු විසාරදෙ"යි

කියන ලද චතුර්විධ ස්ථානයෙහි ප්‍රවෘත්තවූ සොමනස්සමයවූ ඥණයයි. **චතුයොනිපරිච්ඡෙදකඤාණ** නම් අණ්ඩජයැ ජලාබුජයැ සංසෙදජයැ ඕපපාතිකයැ යන සතර යොනිය දන්නා නුවණයි. **පඤ්චගතිපරිච්ඡෙදකඤාණ** නම් තිර්‍යක් ප්‍රෙත මනුෂ්‍ය දෙව නරකය යන පඤ්චවිධවූ ගති පිරිසිඳ දන්නා නුවණයි. [5]**අප්පටිනිස්සජ්ජිත්වා**, නොහැරැ; **යථාභතං නික්ඛිත්තො**, ගෙන හැර තුබූ දෙයක් සෙයින්; **සුදං** යනු නිපාතයි; **පරමතපස්සී**, උතුම් තපස් ඇති හෙවත් අධිකවූ තපස් ඇති; **තපස්සී හොමි**, තපස්වී වෙමි නොහොත් [5]තපස්වීමි; **පරමජෙගුච්ඡී**, පාපයෙහි අධිකවූ පිළිකුල් ඇති; **රජොජල්ලිකො**,

1 ඥණදසුන් BCDF. 2 නියාහි BCDF. 3 කියනලද්දුහ A. 4 චතුවෛශාරද්‍ය ඥන A. 5 අප්පටිනිස්සජ්ජිත්වා-මු. අ. කා. 5 තපස්වී වීමි BF.

රජස්දූලි ධැරූයෙමි. රජස් නම් බාහ්‍යවූ පාපිවිරජස් ආදිවූ රජස. **දූලි** නම් ශරීරසෙවදයෙන් ඇති වූයේයි. **මහාවිකට භොජනො**, නොසකස්මැ හෙවත් මලමැ භොජන කොට ඇත්තේ; **අනන්තරට්ඨකෙ**, නවාම් මැදින් දින දෙඅතුරෙහි අට දවසෙක්හි–නවාම්මසැ අන්තයෙන් සතර දවසෙක මැදින්මස ආදියෙන් සතර දවසෙකැයි මෙසේ අතුරෙහි අට දවස්හිය යනුයි; නොහොත් අටවක් අතුර හෝ යනුයි; **තින්තො**, තෙත් වූයේයි; **ගිම්හානං පච්ඡිමෙ මාසෙ**, පොසොන් මසැ අන්ත දෙ පෝය හා ඇසළ මසැ ආදි දෙපෝයෙහි; **බ්‍රහ්මචරියමෙවෙතං**, [1]මේ බ්‍රහමචරිය නම. [2]**මොනෙය්‍යාය**, කායමොනෙය්‍යාදිය පිණිස–කායසඤ්ඤමාදිය පිණිස යනුයි.

## 94. ලොමහංස ජාතකං.

**සාතතිකපුණ්ණමාය**, හිල්මසැ මැදිපොහෝහි; **ජාතො වරකො**, උපන් ගබඩායෙහි හෙවත් උපන් ගර්භයෙහි; **අමාවාසියං**, [3]ගුණුමැ පොහෝහි නොහොත් අමාවාසිනම් ගුණු පොහෝහි; **ඛුද්දකනගරකෙ**, කුඩා නුවරෙහි; **විසමෙ**, ජලාශ්‍රයාදිය නැති හෙයින් විෂමවූ; **උජ්ජඞ්ගලනගරකෙ**, රළු නුවරෙහි; **සාඛානගරකෙ**, මහරුක්හි අතු බඳු කුඩු නුවරෙහි; **ඡන්දං විනෙති**, ඇලුම් දුරුකර; **තීනි ලක්ඛණානි පස්සා**, අනිත්‍යය දුඃඛය අනාත්මය යන ලක්ෂණත්‍රයට පැමිණ; **තත්ථ තත්ථෙව**, යම් සන්තානයෙක්හි උපන්නාහු වූ නම් ඒ ඒ සත්ව [4]සන්තානයෙහිමැ; **ඉත්තරා**, ඇසිල්ලක් පවත්නා හෙයින් සවල්පයහ. **චලිතා**, අබලයහ නොහොත් චපලයහ; **කම්පිතා**, කම්පිතයහ; **පයාතා**, යන සුල්ලහ; **නාවකාලිකා**, [5]පිරිවු ලෙන් ගෙනා දෙයක්මෙන් අසථිතයහ; **වට්ටූපසමනකො**, කාම්වට කෙලෙස්වට [6]සිඳීමෙන්.

## 95. මහාසුදස්සන ජාතකං.

**පරමපාසාවිනී**, විශෙෂයෙන් දක්ෂය; **හිරොත්තපෙසා මත්තාය**, වෙසෙසින්; **දුක්ඛපටිකූලො**, දුකට [7]පිළිකුල් කර නුයේ; **අනන්තරෙන ච මහාසමයං**, මහාජනයා අතුරෙහිද හෙවත් මැදින්ද; **හාරෙතබ්බා**, "හරිතබ්බා"යු තැන්; **උක්ඛිත්තාසිකො**, නැගූ කඩු ඇත්තේ; **අමනසිකාරිකො**, [8]සිහි නො කොට හෙවත් සිහි නැතිවැ; **ඛිඩ්ඩා පමාදං ආහරෙය්‍යං**,

1 මේ බ්‍රහමචරිය්‍යම්මය A. මේ බ්‍රහමචරියා නම CD. 2 මොනෙය්‍යප්‍රාය A. 3 ගුණමැසැහි BCDF. 4 සථානයෙක්හි A. 5 පිරුළෙන් A. 6 සිස්මීමෙන් BCDF. 7 ගරහනුයේ A. 8 සිහිනොකොටBF.

පිටත ප්‍රමාදයෙන් එළවන්නේද-පිටත ඒ ජනපද කල්‍යාණී යන් කෙරෙහි ප්‍රමාදව සිතක් මෙහෙයන්නේද; **සුසමාරද්ධා**, මනාකොට පටන්ගත්තී; **පියඞ්ගුසාමා වා හොති**, පුවඟුමල් වන්වූ ශරීර ඡවිය ඇත්තී හෝ වන්නීයෑ; **සුවණ්ණසාමාවා**, රන්වන්වූ හෝ ශරීර ඡවි ඇත්තී වන්නීයෑ; **මුඛපරියොසානං**, අධරපල්ලව හෙවත් ඔෂ්ඨයෑ. **නකාරෑ** ශබ්දයෙන් මෙතැන නබයි. **සූළුසසිනා**, සිපී තිබෙන්නාහෑ; **නිබ්බලිපලිතා**, විලිපිලි නැත්තී; **වෙළුකොබ්බපෙසූ**, පිළී නැඟූ කල්හි; **නිගලානි**, හැකිළී; **භූතපුබ්බමෙවෙතං**, මෙතෙම වූ විරීමැයි හෙවත් මේ පූජීයෙහි වූ දෙයෙක් මැයි; **පරිකප්පවසෙන**, පරිකල්පනාවශයෙන්-සිතා ගැන්මෙන්; **අභිසඞ්ඛතං**, සාදනලද; **පරිහරිත්වා**, වළා; **සුවණ්ණතාරකාවිචිත්තං**, රන් තරුයෙන් විසිතුරුවූ; **නානාවිරාග**, නොඑක් පැහැ ඇති; **අජ්ඣාචාරෙ කතෙ**, සමාගම කළ කල්හි; **ලොහිතෙන පගඝරන්තෙන**, ලේ වගුරුව වගුරුවා; **උභතොලොහිතකූපධානෙහි**, හිස්දෙර පාමුල රත් කන්වයින් ඇති; **රූපගොචරො**, රූපාලම්බනයෙහි ගිජු; ඔහීයි, පසුවී; **යං හොති තං හොතු**, වන දෙයක් වන්නාවය; **පුරතො**, බොධිසත්වයන්ට ඉදිරියෙහි; **ඔදනිකාපණං**, බත් තබන අංගාණී; **ඔරමන්තො**, මහත් පරීක්‍ෂා ඇත්තේය නො හොත් ඉතාම මනාත්‍රීය; [1]**අටවියා පරභාගෙ**, අටවියගේ ඈත භාගයෙහි-බොධිසත්වයන්ට තව ඉදිරි දසාවෙහි යු තැන්; **කොමාරසාමිකො**, කුමාරකාලයෙහි සිට මා හිඳුවූ සමණෝයි; **භවන්තං තක්කෙත්වා**, තොප තකා; **අඞ්කනාදය**, උකුලෙන් ගෙනෑ හෙවත් උකුලේ හිඳුවා ගෙනෑ; **අත්තනො උපකප්පනකං**, තමහට එළවන ලද නොහොත් තමා කන්නට නිසිවූ; **ආහරිත්වා**, වළඳ; **එකෙන පස්සෙන පරිවත්තිත්වා**, එක් [2]ඇලයකින් පෙරළී හෙවැ; **නිප්පිළියමානා විය**, විහෙසන ලද්දියක මෙන්; **ඔඩ්කු භවිස්සාමි**, කර බාමී-[3]කොයත් නිත් තේ අස්තෙමි. [4]**අනෙනා වලඤ්ජනකානං උපරි**, ඇතුළු රජ ගෙයි වසන්නවුන් කෙරෙහි; මම **වසං** [5]**වත්තනාත්ථාය**, මා වසහව පවත්නා පිණිස; [6]**හරිතූපලිත්තං කත්වා**, පිරිබඩගෙනෑ; [7]**වනමාලා බන්ධිත්වා**, වනමල් ගොතා දෙරකඩ එල්වා. වන මල් නම් සමන්මල් බෝපත් ආදියයි, **අපරිස්සාවනකං කත්වා**, නොවගුරුවා; **කායගතාසතියා ගොචරෙ චෙව**, කායිගාසී සතිය විසින් පිහිටි අරමුණෙහිද; **සම්පයුත්තකසතියා චාති**,

1 අටවියං-මූ. අ. කා. 2 හැලයකින් BCDF. 3 මුළුපාඨයම A හි නොපෑනේ. 4 වලඤ්ජකානං BF. 5 වත්තනාංය BCDF. 6 හරිපරතං කත්වා BCD. පරහරතං කත්වා F. 7 නවමාලා ගහපිත්වා A.

කාගියාසී නම් ලද චිත්තසම්ප්‍රයුක්ත සමෘතියගේ ද; **එතස්ස හි**, මේ චිත්තයාගේ කෙසේවූ චිත්තයාගේද යත්-**දුන්නිග්ගහස්ස**, නිග්‍රහ [1]කරන්නට නොපිළිවන්වූ; **යත්ථකාමනිපාතිනො**, කැමැති තැනෙක හෙන්නාවූ, "චිත්තස්ස" යනු හා සම්බන්ධ කරනු. **දමථො**, දැමීම්; **දන්තං**, දැමුණාවූ. "තස්මා යොගාවචරො චිත්තං රක්ඛෙය්‍ය"යි යූ තැන්. **සුදුද්දසං**, ඉතා නොදැක්ක හැකි; **සුනිපුණං**, ඉතා සියුම්; **ගුත්තං**, රැක්කාවූ; [2]**ඉදම්පි**, මේද-රක්ෂිතවූ චිත්තයාගේ සුඛාවහත්වයයි. එහෙයින් යොගාවචරතෙම යථොක්තක්‍රමයෙන් චිත්තය රක්ෂා කරන්නේය යූ තැති.

**දූරඞ්ගමං**, දුර අරමුණු ගන්නාවූ; **එකචරං**, හුදකලාව ඇවිදුනාවූ; **අසරීරං**, ශරීරයක් නැත්තාවූ; **ගුහාසයං**, ශරීර නැමැති ගුහායෙහි වසන්නාවූ; **සඤ්ඤමෙස්සන්ති**, ඒ ඒ අරමුණට නොයාදී වළකත්ද; **මොක්ඛන්ති මාරබන්ධනා**, යමෙක් මෙසේ චිත්තසඤ්ඤමනය කරන්නෝ වීනම් ඔහට මාරබන්ධනයෙන් මුක්තියෙක් වන්නේය; **ඉතරස්ස පන**, අනිකාට වනාහි; කෙසේවූද යත්-**අනවට්ඨිත**, චපලවූ; **පරිප්ලවපසාදස්ස**, ඉපිලෙන ප්‍රසාද ඇත්තාවූ පුද්ගලයාහට; **ථිරකම්මට්ඨානසහායස්ස පන**, ස්ථිරවූ කම්ස්ථානය සහාය කොට ඇත්තාහට වනාහි; කෙසේවූ ද යත්-**අනවස්සුත**, රාගාදීන් නොතෙත්; **අනන්වාහතචෙතසො**, රාගාදීන් විසින් නොපහරන ලද සිත් ඇත්තාහට; **ජාගරතො**, නිදි දුරුකරන්නාහට හෙවත් ප්‍රමාද නිද්‍රා දුරුකරන්නාහට. "භයං නත්ථි" යනු හා සබඳ. **එතං**, මේ චිත්තය; කෙසේවූද යත්-**ඵන්දනං**, වෙවුලන; **උසුකාරො තෙජනං ඉව**, ශර සෘජුකරන්නාවූ හීවඩුවකු ශර සෘජුකරන්නාක් මෙන්; **අනමතග්ගෙ**, නොදතහැකිවූ පූර්වාපරකොටි ඇති; **අගතපුබ්බං දිසං**, සවපනයෙනුදු නොගියවිරූ දිසා නම් නිවනි. **පුත්තදාරා**, පුත්‍රදාරාවෝ; **පච්ඡා දිසා**, පැසුලු දිසාවහ; **හෙට්ඨා**, අධො දිසාවහ; **උද්ධං**, [3]ඌර්ධ්ව දිසාවහ; [4]**අලම්බෙන්තා**, සමර්ථ ආත්මභාව ඇති හෙවත් සමර්ථවූ; **කුලෙ ගිහි**, කුලෙහි වසන්නාවූ ගිහිපුද්ගල තෙම; **එතා දිසා**, මේ ශ්‍රමණබ්‍රාහ්මණ සඞ්ඛ්‍යාත දිසාවන්; **ඉමායො** [5]**දසදිසාතා**, මොහු දසදික්හැ. සවාර්ථියෙහි තාප්‍රත්‍යයයි. **ඡබ්බිසාණං යං**, සවනක් රස් විහිදුවන්නාවූ දළ ඇති යම් හස්තියක්හු; **සුපිනෙ**, සවපනයෙහි; **අද්දසා**, දිටිද; **සො නාගරාජා කතමං දිසං**, "කතරස්මිං දිසාභාගෙ"; **තිට්ඨති**, "අට්ඨාසි" යූ තැන්; **අන්නදපානවත්ථද**, අන්නපාන වස්ත්‍රදායකවූ; **අගාරිනො**, යම් ගිහි කෙනෙක් ඇත්ද; එසේවූ

1 කරවන්ට A. 2 ඉද.හි-මූ. අ. ක. 3 උඩ C. 4 අලම්බෙනො-මූ. අ. ක. 5 දස දිසා-මූ. අ. ක.

ඔවුන්ටද–**අවභාසිකානම්පි**, අනාතපානාදිදායකවූ ගිහිමිනිසුන් කම්වැජරි [1]සපුව කැඳවූවන් වැනි හෙයින් [2]ඔවුන්ට කම් වැජරිසපුව එළවන හෙයින් අවභාසිකායයි කියන ලද මහණ බමුණන්ටද; **දිසං වදන්ති**, දිසාව යයි කියති. **සෙනකෙති** යනු ආමන්ත්‍රණයි; **ඝොරො**, අභ්‍යාස.

## 96. තෙලපත්ත ජාතකං.

**නාමසිද්ධිකං**, නමින්මැ වැඩ කැමැති; **මඞ්ගලං නාමං ආහරාපෙතීති**, ඉෂ්ට නමක් එළවන්නේ යයි හෙවත් තමහට ඉෂ්ට නමක් කරන්නට කියන්නේයයි; **භතිං අදදමානං**, බැළ නොදෙන්නිය හෙවත් මෙහෙ බැළ නොදෙන්නියැ; **ආගතො**, දත්තේ. "යෙ ගත්‍යර්ථාඃ තෙ බුද්ධ්‍යර්ථාඃ" යනු හෙයින් කීහු.

## 97. නාමසිද්ධි ජාතකං.

**අජීරකෙන**, අජීර්ණයෙන්; **අතිපපක්කො තෙ ඝනො**, තා විසින් ලස්වැ එන ලද; **ලද්ධබ්බාති**, ලැබිය යුතුයයි; **පච්ඡිජ්ජති**, [3]පසිඳිනැයි; **අඩ්ඪජ්ඣාමෙන**, අඩදැමූවූ හෙවත් අඩක් දැවාවූ; **ඔලම්බනෙන**, එලෙන්නේ; [4]**මනම්හි**, ඇසිල්ලකින්; **උපකූලිතො**, දැගියෙමි.

## 98. කූටවාණිජ ජාතකං.

[5]**පුථුජ්ජනපක්ඛිකං පඤ්හං**, පුහුදුනන් ආදිකොට [6]රහතුන් අවසන් කොට ඇති පස් පක්‍ෂයෙහි ඇත්තවුන් සතස්පුර දෙරදී [7]විචාල ප්‍රශන; **වස්සාරත්තසමයෙ**, වැසි කල්හි; **කාලකිරියසමයො ජාතො**, මියන කල සම්භව වී; **අධිගමං**, ධ්‍යානාධිගමය; **රොදෙය්‍යුං පරිදෙවෙය්‍යුං**, ඉදින් අඬියක් දකුම්හයි කියා කැපිවගෙන හඬන්නාහු වූ නමුත් වලප්නාහු වූ නමුත්.

## 99. පරොසහස්ස ජාතකං.

[8]**කුණ්ඩදනවනෙ**, [9]කොළුවෙනෙහි–කුඹුබටු කුඹුවෙලහ [10]යෙත්මැ; **අධිමත්තවෙදනාභිභූතාපි**, අධිකවූ ප්‍රසවවේදනාවෙන් පීඩිතවූද; **ථෙරං**, මුගලන් මහතෙරහු; **කච්චි තෙ ඛමනීයන්ති**, කිමෙක්ද තාගේ ශරීරය ක්‍ෂමදැයි හෙවත් [11]යපේදැයි; **ලොහකුම්භියං**, මාතෘකුක්ෂියෙහි; **උදානං උදානෙසි**, සංසාර දුක්ඛයෙන් තමන්වහන්සේගේ මුක්තිය නිසා උදන් අනා; **තස්මිං කාලෙ**, බොධිසත්වයන් රජ කරන කල්හි; බාරාණසී

1 සපුවට ACD. 2 ඔවුන් BF. 3 අසිඳිනායි BDF. 4 ඛණමහි ACD. 5 පුථුජ්ජන පුච්ඡකං-මු. අ. ක. 6 රාතුන් A. 7 විතාළ A. 8 කුණ්ඩධාන-මු. අ. ක. A. 9 කොටළුවෙනෙහි BD. කොඩ්ළුවෙනෙහිCF. 10 වෙත් BF. මෙන් CD. 11 සැපදැයි BCDF.

**රඤ්ඤො**, බොධිසත්ත්වයන්ගේ; **නිද්ධමනද්වාරෙන**, වාරිමාර්ගයෙන්; **සංහරිත්වා**, රැස්කොට; **රුක්ඛි**, සිසාරා ගති; **සක්ඛරං**, හසර; ගුළදධිං, සකුරු දී.

**අමධුරමෙව**, අනිෂ්ට විපාකදායක හෙයින් අමධුරවූ අකුශල කර්මයමැ; **මධුර-පෙ-අතිවත්තති**, මිහුරුවූ ආකාරයෙන් ප්‍රමාද සත්ත්වයා හික්ම පවත්නේයි. අමධුරවූ අකුශලකර්මය තෙමේ කරන කාලයෙහි සත්ත්වයාහට මධුරාකාරයෙන් වැටහෙන්නේ යැ. එහෙයින්මැ සත්ත්වයෝ අමධුරවූ අකුශලකර්මය මධුරාකාරයෙන් ගෙනැ කොට අපායභාග්වැ මහදුකට පැමිණෙන්නාහ. එහෙයින් අමධුරවූ කර්මය මධුරාකාරයෙන් අපායභාග් කොට දුක්දීම් වසයෙන් ප්‍රමාද සත්ත්වයා අභිභවනය කොට හික්ම පවත් නා නම් වෙයි. "පුබ්බෙ-පෙ-පතිරූපකෙන ගබ්භපරිහරණගබ්භවාසසඞ්ඛාතෙන ඉමිනා අසාතාදිනා දුක්ඛෙන" යි අනුසන්ධාන කොට කියනු. **අසාතාදිනා** යන්නෙහි 'ආදි' ශබ්දයෙන් අප්පිය අසුභ දෙක ගන්නු. **පුබ්බෙ—පෙ—පතිරූපකෙන**, පෙර සාතය ප්‍රියය සුඛ යයි කියා ගෙන කරන ලද [1]නගරරුන්ධනය වැනිවූ. නගරරුන්ධනාඛ්‍යවූ පාපකර්මය වැනිවූ [2]මවට සත්අවුරුද් දක් මුළුල්ලෙහි ගර්භපරිහරණයෙන් වූ දුක්ඛයද සත්දවසක් මුළුල්ලෙහි මූඪගර්භතායෙන් වූ දුක්ඛයද පුත්‍රයාහට සත්අවුරුද් දක් මුළුල්ලෙහි ගර්භවාසයෙන් වූ දුක්ඛයද පූර්වයෙහි දෙදෙනා විසින් කරන ලද [1]නගරරුන්ධනය වැනි හෙයින් කිහු. "ඉදානි සා උපාසිකා පෙමවත්ථුවසෙන පුත්තසඞ්ඛාතෙන සාතාදිපතිරූපකෙන දුක්ඛෙන ආදිමහි අජ්ඣොත්ථටා හුත්වා පුනපි සත්තක්ඛත්තුං එවරූපෙ අසන්දෙ සත්තපුත්තෙ ලභෙය්‍යං ඉච්ඡෙය්‍යමෙවාහන්ති එවරූපං අසාතං අප්පියං දුක්ඛං තථා අවච"යි සම්බන්ධකොට කියනු. "පුත්තසඞ්ඛාතෙන" යනු පුත්‍රයාත් දුක්ඛයට කාරණ හෙයින් දුඃඛ යයි ගෙනැ කිහු.

100. අසාතරූප ජාතකං.

---

## දසමො වග්ගො.

---

**වත්ථුතො** ච, වර්තමාන වස්තු අතීත වස්තු හෙයින්ද; **වෙය්‍යාකරණතො** ච, ව්‍යාකරණ හෙයින් නොහොත් විස්තර කොට කීම් හෙයින්ද; **සමොධානතො** ච, අතීත වස්තු වර්තමාන වස්තු සටනා කොට නිමවීම් හෙයින්ද.

101. පරොසත ජාතකං.

---

1 නගරරුන්ධය A. 2 බවට E.

**පණ්ණිකං**, පලාවෙළඳ; **මූලපණ්ණාදීනි ච**, මුල්පලා ආදිද; [1]**නිච්චප්පහසිතමුඛා**, හැම සඳමැ තුටු මුහුණු ඇත්තීයැ; **වාරෙය්‍යත්ථාය**, රුස්වන්නට වස් හෙවත් සරණ [2]බණවන පිණිස. අසෝ කුලෙහි අසෝ තැනැත්තවුට මැය [3]රුස්වම්හයි මවුපියන් හා [4]සමමන්ත්‍රණය වාරෙය්‍ය නම්; **කුමාරිකාධම්ම නම්** මවුකුසින් බිහිවූ කල් පටන් පුරුෂසංසර්ගයක් නොකළ බවයි හෙවත් ගෙයි වඩනා බවයි. ඹූබසනෙතාෂය පුරුෂසංසර්ගය කළ ස්ත්‍රීන් කෙරෙහි මුත් නොකළවුන් කෙරෙහි නැති හෙයින් නැවැත මැ කෙරෙහි ඒ ගුණය ඇති හෙයින් මැ කෙරෙහි කුමාරිකා ධර්මය නැත්දෝහෝයි පරීක්ෂා කෙරෙත්. **චිරං පට්ඨාය**, බොහෝ කලෙක පටන්–මාතෘකුක්ෂිප්‍රසූතියෙහි පටන් යූසේයි.

## 102. පණ්ණික ජාතකං.

**අවිලම්බමානා**, නොලසන්නාහු හෙවත් නොලස්වන්නාහු; **නිමන්තනං**, නිමතුනු හෙවත් පැවැරූ මඟුල් බතක්; **ගොණෙ පාජෙන්තො**, හුන් ගැල්රිය අදනා ගොන් බණන්නේ; **පතිට්ඨිතො හුත්වා**, ශක්ති ඇතිවැ; **පණ්ඩිච්චෙන**, නුවණින්.

## 103. වෙරි ජාතකං.

[5]**අත්‍රිච්ඡතාය**, මතු මතුයෙහි බලවත්වූ තෘෂ්ණා ඇති හෙයින් ලදුලදු පියා නොලදුයෙහි ප්‍රාර්ථනායෙනැයි යූසේයි. "අත්‍ර අත්‍ර ඉච්ඡතීති අත්‍රිච්ඡා, තස්ස භාවො අත්‍රිච්ඡතා"යි ශබ්ද සිද්ධි [6]දක්නේ. **සකලාභෙන**, සවකියවූ යථොක්ත [5]විමානප්‍රෙති ප්‍රතිලාභයෙන්; **අත්‍ර අත්‍ර ඉච්ඡන්තො**, මතු මතුයෙහි අධිකවූ ලොභකරන්නේ; **පුනප්පුන පත්ථනාවසෙන**, උඩට නැඟී නැඟී ලාද කර මත්තේ නැවැත නැවැත හීම්වසයෙන්.

## 104. මිත්තවින්ද ජාතකං.

[7]**උත්තසන්ත**, භය ගන්නාසුලු; "ආනඤ්ජකාරණං" යන්නෙහි **ආනඤ්ජකාරණ** නම් සටන් දුටු කල නොපලනා පිණිස [8]අළුතෙහි ලා හික්මවන යොගයි; **ආලානෙ**, ස්තම්භයෙහි; **තොමර**, කුත්තුකෝල්; **විධුනිත්වා**, හකුළුවා නොහොත් සලාපියා.

## 105. දුබ්බලකට්ඨ ජාතකං.

1 නිච්චපහාසිතමුඛා A. 2 වන BEF. 3 පසසම්හයි BEF. 4 සමමන්ත්‍රය DE.
5 විමානප්‍රතිලාභයෙන් A. 6 දන්නේ B. 7 උත්තසිත-මු. අ. ක. උත්තාසන ABCF.
8 අළුයෙහි BCDEF.

**සීලව්‍යසනං**, ශීලවිනාශයට; **පජ්ඣායන්තො**, එක්වන් සිතන්නෙහි; **වසං ගමෙත්වා**, වසඟ බවට පමුණුවා; **උදකං උස්සිඤ්චනසමත්ථාය**, දිය ඉස්නා [1]තැඳූල්ලට; **ආකඩ්ඪන්ති මෙවාති**, ගෙන්වන්නීමැය යනු.

## 106. උදඤ්චනි ජාතකං.

**හංසපහරණකං**, හංසයකු ගැසූ; [2]**සක්ඛරාඛිපනකසිප්පං**, අතකුරු ගසන යන්ත්‍ර ශිල්පය; **අසනනං**, බොරු; **තියංසං**, තුනැස්වූ; **යන්තෙත්වා**, [3]යන්ත්‍රණයකොට; **අතිමුඛරො**, දෙඩමලු; වට **නූපච්ඡෙදකං**, තෙපුල් පසිඳිනාක්හු; **උපධාරෙන්තො**, පරීක්ෂා කොට බලා සොයන්නේ; **පීඨසප්පී**, පිළුයි. [4]"පීඨෙන සප්පති ගච්ඡතීති පීඨසප්පී" සේයි; **නං**, ඔහු; **රථකං**, රියයකට; **නගරද්වාරමූලෙ**, නුවරදෙර සමීපයෙහි; **කාකණි-පෙ-කර**, [5]කනා පණම් රන් කාවණු ආදි තමන් අතින් ඔහට දී නළුවා අප බලන පරිද්දෙන් මේ නුගගස පත අතකුරෙන් ගසා ඇත්රුවක් කරම; [6]**ඡිද්දවිච්ඡිද්දාමෙව**, සිදුරු විසිදුරු වී-හෙවත් නොඑක් තැනින් සිදුරු වී. **ඡිද්දාවච්ඡිද්දාමෙව** යන පාඨ වී නම් කුදු මහත් සිදුරු ඇතිය යනු අර්ථයි. **උස්සාරණභයෙන**, රජ්ජුරුවන් සිටි තැනින් මිනිසුන් දුරු කරන කල ඒ දුරුකිරීමෙහි භයින්; **උස්සාරෙත්වා**, දුරුකොට; **අජලණ්ඩිකා**, එළුබෙටි; [7]**නාලිනලම්හියෙව**, ඇත මැත නොපාරවා කටසිදුරෙහිමැ; **නාළිකං**, නළුකට; **අඩ්ඪාළ්හකමත්තා**, දෙනැළියක් පමණ වූවාහු-දෙමනහ පමණ එව්; **පිය ඩගුදකං**, පුවගුකොළ මැඬ පැන්; **සාලිත්තකකම්මෙනාපි**, ගත කුරු ගැසීම් මාත්‍රයෙකිනුදු.

## 107. [8]සාලිත්තක ජාතකං.

**කූටාගාරශාලා** නම් එක කැණිමඬුල්ල තබා කළ සාලා වයි; **උද්ධුමාතකනිමිත්තසදිසා**, උද්ධුමාතක නම් ඇති අසුභ නිමිත්ත හා සුදුසු වී. **උද්ධුමාතක** නම් ඉදිමුණු රූයි. **අනාකප්පසම්පන්නා**, ශරීරාකෘතීන් සම්පන්න නොවී-නොසොඳුරු විය යූ සේයි; **එතිස්සා ච වත්ථු විසදං භවිස්සති**, මැගේ ශරීරය වාතපිත්තාදි දොෂයන් අධික නොවැ සමවැ පවත්නා හෙයින් නිර්මල වන්නේයැ හෙවත් නිරොගි වන්නේයැ; **යන්ති නාම**, "යෙන නාම කාරණෙන"යි තැන්; **වත්වා**, එහෙයින්

1 තුදූල්ල AE. 2 සක්ඛරාඛිපණ-මු. අ. ක. සක්ඛරඛිපනක A. 3 යන්ත්‍රකොට B. 4 පීඨෙන සප්පිතන්ති ගච්ඡතීති A, පීඨෙන සප්පතීති පීඨසප්පි BCDEF. 5 කණ පමණ රන්ද කාළුණු BCEF. 6 ඡිද්දාමෙව-මු. අ. ක. 7 නාලමහියෙව BF. 8 සාලිත්තක-මු. අ. ක. සාලිත ABF. සාලික C.

[1]හික්මියයුතුවූ ශිල්ප කුමක් පිණිස [2]නොහික්මිය යුතුදැයි කියා; **සරීරවලඤ්ජං**, පුරීෂයැ; [3]**හනනං**, පුරීෂොත්සර්ගය; **සුහනනං නාම**, [4]සුහනන නම්. "හද-පුරීෂොත්සර්ගෙ" යන ධාතුයි.

### 108. බාහිය ජාතකං.

**ගණබන්ධෙන**, ගණබන්ධනයෙන් හෙවත් ගණගණවැ ගෙනය-[5]සමූහවැ ගෙනැ යනුයි; **වීථිසභාගෙන**, එකි එකී වීථියෙහි ඇත්තෝ එක්ව ගෙනැ-නොහොත් වීථියක් සමගවැ ගෙනැ; **සකලනගරං**, සියලු නුවර ඇත්තෝ; **ඡන්දකං සංහරිත්වා**, එක්සිත්වැ ගෙනැ; **අක්ඛපණ්ණෙන**, වරාපතින්; **කුක්කුලෙ පචිත්වා**, උණු හලුයෙහි උයා. "අපෙතසම්ං" යනාදී යෙහි සැණ නම් දෙවතාවන්ට බලිකර්මාන්ත වශයෙන් ප්‍රවෘත්ත වූ උත්සවයයි; **උළුම්බකෙන**, එවින්; [6]**කිං විනා කාරණෙන නාසෙසි**, මේ කුඩුපුව කාරණයක් නැතිවැ කුමට නසම්ද.

### 109. [7]කුණ්ඩපූව ජාතකං.

[8]**සබ්බසංහාරකපඤ්හා**, සබ්බසංහාරක පැනය; **සබ්බාකාරෙන**, [9]හැමයෙන්-වියර විසින්; [**උම්මඟ්ගජාතකෙ ආවිභවිස්සති**], මහා උම්මග්ගජාතකයෙහි පහළ වේ.

### 110. සබ්බසංහාරකපඤ්හ ජාතකං.

## එකාදසමො වග්ගො.

**ගද්‍රභපඤ්හො උම්මඟ්ගජාතකෙයෙව ආවි භවිස්සති**, ගඩුබුපැන මහඋමංදෑයෙහිමැ පහළවනු.

### 111. ගද්‍රභපඤ්හ ජාතකං.

**අමරාදෙවීපඤ්හො තත්ථෙව**, අමරාදෙවි පැන එම දෑයෙහිමැ පහළ වනු.

### 112 අමරාදෙවීපඤ්හ ජාතකං.

**ඨානප්පත්තං**, මුදුන් පත්. මේ බුදුන් විෂයෙහි කියන මුසාවාදයෙක් ඇත්නම් මෙයින්මැ නිමි හෙයින් මතු කිමක් නැති හෙයින් කිහු [10]**උපොසථා**, පාමොක් [11]උදෙස්හු; **සුසානවනෙ**, [12]මහසොහොනක් සමීපයෙහිවූ මහවනයෙක්හි; **නක්ඛත්තං**

1 ඉක්මිය යුතු ABF. 2 නොඉල්විය යුතුයයි A. 3 ජනනං A. 4 සුජනනං A. 5 A හි පමණකි. 6 කිං ඉමං අකාරණෙන-මු. අ. සා. 7 කුණ්ඩකපූවජාතකං-මු. අ. සා. කුඩුපූ ජාතකං A. 8 සබ්බසංහාරිකපඤ්හං-හැම. 9 වියර විසින් ABDEF. 10 උපොසුථ්ඛං ABCDF. 11 උපදෙස්හු ABCF. 12 මහසේනක් ABCF,

ඝුට්ඨං, නකත්කෙළි ඝොෂය කරන ලදී හෙවත් සැණකෙළියට කල් ගහන ලදී; [1]චච්චර, අඬගණ නොහොත් වීථිඅතුරුවේ නොහොත් [2]වීථිකොව; රච්ඡා, වීථි; පපුනනාගගච්ඡනාරං, තුවරගස් අතුරට; සරීරනිස්සන්දං, ශරීරමල; සිඝපිඝානං සතං, බොල්ලෝ සියයකුදු.

## 113. සිගාල ජාතකං.

පාථෙය්‍යං, මාගෝපකරණ; සභාගට්ඨානෙ, අවිරුද්ධස්ථානයෙහි හෙවත් තමන්ට ගුණවත් තැනෙක්හි; "අරඤ්ඤතො" යනු එම නදියෙහි [3]වළ භාගය ගෙනැ කිහු. "මනුස්සපථං" යනු එම නදියෙහි මිනිසුන්ට සමීපවූ [4]භාගය ගෙනැ කිහු බඩි පසෙසන, [5]දූල යට සිඝාරා පිටිපසින්; ජාලකුච්ඡිට්ඨානං [ගනබා], දූල්කුස දියට නොගැවී සෙමෙන් වැදලා.

## 114. මිතවින්දි ජාතකං.

අනුසාසිකාං භික්ඛුනිං, අනුන්ට [6]අනුසස්නා මාගම්පැවිද් දක; සපරිස්සයට්ඨානං, සොපද්‍රවස්ථානය; මෙණ්ඩකො, එළු වෙක්; මහාවත්තනිමග්ගං, මහා අටවිමහකට; චන්‍ෂකාන, රියසකින්; ඡින්දිත්වා, මඟ කමින් සිටි [7]පක්‍ෂිය මිරිකා ගෙනැ; සාළිකා, සැළලිහිණි.

## 115. අනුසාසික ජාතකං.

[8]ලඞ්ඝනකනටකයොනියං, අඬයටි ආදි පනන නටක ජාතියෙක්හි-කිඹියරුයි; සකනිලඞ්ඝන, අඬයටි පනන; චතුනනං-පෙ-ජානාති, පඬිකතීන් උඩු බලා හිඳුවූ අඬයටි සතරක් කවටලයේ පනන ශිල්පය දන්නේයි; දණ්ඩකො-පෙ-ආවුතො, දණ්ඩක ඇවිණගිය මීපුප් පරිද්දෙන් තෙප්මුණයෙහි ඇනී ඇවිණ ගියේ; අකිකාරං අකාර, නොපට නොපිළිවත් අඩිකවූ ක්‍රියාවක් කළව; අනකනො [9]කාරණිනො, නොප දන්නා [10]කාරණයෙන් නොහොත් කරණමින්; අනතානං, සිරුරු; ලඞ්ඝසිත්වා, පන්වා; කාකබ්බුකතාකං, දූවිම් ආදි කටයුතු.

## 116. දුබ්බච ජාතකං.

අනකනො [11]වාචං නිස්සාය, තමාගේ ආක්‍රොශ වචනය නිසා; කූඨාගිං, පොරොවක් නොහොත් කොට්ටේරියක්;

---

1 චරඅඬහණෙ ABCF. චරඅඬහණ D. චරඅඟු E. 2 වීථිනොබා B. වීථිනොව CF. 3 වළදිසායෙහි භාගය BF. 4 තැන් A. 5 දූලට BEF. 6 අනුශාසනාකරණ A. 7 පක්‍ෂිනියක A. 8 ලඞ්ඝනටකයොනියං-මූ. අ. කා. ලඞ්ඝනනටක යොනියං C. 9 කාරණනො-හැම. 10 කාරණයෙන්-හැම. 11 චාරං E.

**රොසෙසි**, රොස් ඉපැදවී හෙවත් කිපි වී; **තිත්තිරො**, තිත්වටු යෙක්; **අතිඋග්ගතා**, ඉතා උස්වූ-ඉතා මහත්කොට කියන ලද්දුවූය යනුයි.

## 117. තිත්තිර ජාතකං.

**බ්‍රහ්මවණ්ණී**, උත්තමවූ ශරීරවර්‍ණ ඇති; **කත්තිකජණනක්ඛත්තෙ**, කැති නකත් ලද හිල්මස පුණුපොහෝහි කෙළියයුතු සැණ හෙවත් ක්‍රීඩාව සම්ප්‍රාප්තවූ කල්හි; **කත්තික** [1]**රත්තිවාරජණෙ**, කැති නකත් ලද පුණුපොහෝද රෑ හැසිරෙන සැණ හෙවත් පවත්නා ක්‍රීඩාව; **නිබන්ධිත්වා**, අර්ප්පිවැ නොහොත් තැත්කොට; **සයනිස්සරං**, හෝනා ගෙට; **ඉත්ථිකුත්තං**, ස්ත්‍රීන්ගේ ක්‍රීඩා; [2]**ලීළෙහ**, ලීලා; **පහට්ඨාකාරෙන**, සතුටු ආකාරයෙන්; **අග්ගදන්තෙ විවරිත්වා**, අග්දත් දල්වා හෙවත් දත මඳක් දල්වා; [3]**අට්ඨිසඞ්ඛලිකා විය**, ඇටසැකිල්ලක් මෙන්; **බසිතං**, නිමි; **සමානෙථාති**, ගෙනෙවයි; **එත**, තව; **ඨපෙත්වා**, දෙඅත්හු එක්කොට හුවත විසින් තබා; නොහොත් **ඨපෙත්වා**, පුනප්පුන පහරන විසින් තබා; **උස්සරථ**, දුරු වව් හෙවත් පහ වව්; **මාතරං පටිච්ජාපෙත්වා**, මවට පාවා දී; **අවිස්සට්ඨ**, නො හළ; **ඉමිනා උපායෙන**, මේ දුකින් මිදුණු මම මහණ වෙමියි කියා මෙසේ සිතූ ධර්‍මචින්තා සඞ්ඛ්‍යාත උපායයෙන්. ඔවුන්ගේ බන්ධනයෙන් මුක්තියද ඒ ධර්‍මචින්තාමහිමයෙන් වූ හෙයින් කීහු. **කිං–පෙ–වට්ටකොති**, මේ වටු කුමක් කෙළේ ද්‍යෙහෝයි හෙවත් කුමක් කොට වැහැරගියේ ද්‍යෙහෝයි.

## 118. වට්ටක ජාතකං.

**අකාලරාවිං**, කල් නොකල් නොහැඳිනමැ මූබප්‍රාප්ත දෑ කියමින් මහා අගීල කරන්නාවූ; **උපට්ඨානබද්ධං**, ආචාර්‍යෝපාධ්‍යායාදීන්ට උපස්ථාන කටයුතු; **ගීවාය වලිතාය**, කර [4]ඇඹරූ කල්හි; **අතිරත්තිං**, ඉතාම රෑ-පහන්වන්නට බොහෝ වේලෙක සිටමය යනුයි; **ගහිතට්ඨානම්පි**, පුහුණු කොට තිමවූ තැනුත් හෙවත් පිරිවා තිමවූ තැනුත්.

## 119. අකාලරාවි ජාතකං.

**තෙන**, ඒ රජහු විසින්; **සංහරිත්වා**, රැස්කොට; **අනිබද්ධා**, නියත නැතැ; **දුප්පරිහාරො**, නොපස්වැටිය හැක්ක හෙවත් නොරැක්ක හැක්ක; **විප්පටිපජ්ජිසෙව**, අනාචාර කළා මැයි; **ජයක්ඛන්ධාවාරට්ඨානෙ** යන්නෙහි ජයකඳවුරු නම් ජය

1 රත්තිවාර ජණො-මු. අ. කා. 2 ලීළෙහ-මූ. අ. කා. 3 අට්ඨිකා සඞ්ඛලිකා-මු. අ. කා. 4 ඇඹූරූ A.

ගෙන අවුත් නුවරට ආසන්නයෙහි කඳවුරු බැඳ හුන් තැනයි. **පාදමූලිකානං**, නිතොරවන සෙවකයන්; **නබවලක්ඛ**, නිය සත්; [1]**අබ්භඤ්ජක්ඛා**, ගහවා නොහොත් ගල්වා; **කිලිට්ඨ ධාතුකං**, කිලුටු සවභාව ඇති; **ලොණසක්ඛරා විය**, ලුණුකැට මෙන්; **ආඝාතනං**, දම්ගෙඩියට හෙවත් [2]වධ්‍යයන් මරණ තැනට; **රාජකුම්භං**, රාජභාණ්ඩාර; **සොත්ථියකුලෙ**, බමුණු කුලයෙහි; **කුත්ථ**, කුඩාසින්නෝ; **කිපිල්ලක**, මහසින්නෝ; **හස්සවසෙන**, කෙළි විසින්; **අවක්ඛුකෙන**, බොරුයෙන් ~

### 120. බන්ධනමොක්ඛ ජාතකං.

---

## ද්වාදසමො වග්ගො.

---

**නිවජ්ජම්තතං**, කුදු සබඳක්හු-දිළිඳු එව්; **කුසනාළිගච්ඡ**, [3]දියමෙරලිය ගසෙක්හි; **රුචරුක්ඛො**, [4]බුරුද රුකෙක්; [5]**මුක්ඛමොකිපි වුච්චති**, තෙලඹු යසිද කියත්; **එකපට්ඨහකස**, එක්පා නම් ඇති; **පරිසජ්ජිත්වා**, සිපගෙනැ; **රුචාය**, තෙලඹුයෙහි ~

### 121. කුසනාළි ජාතකං.

---

**සමත්ථසමත්ථහූතා**, සුගමසුගමවූ; **භණ්ඩමානෙ**, කියන කල්හි; **උසූයං**, ඊර්ෂ්‍යා; **අභෙ රූපං**, රූපයක් ඉතා විසමය නියාය; **ගති**, ගමන; **ඨපෙහිති**, සිටුවයි; **පණිහිතාය සද්දං අද්දසි**, විළුමෙන් සංඥ දිනි; **පුඤ්ඤිද්ධියා** යන්නෙහි පුඤ්ඤිද්ධි නම් ධ්‍යානභාවනායෙන් නිපන් අභිඥසමෘද්ධියෙන් වන්නාවූ විකුබ්බනාදිවූ සෘද්ධි විනා සවභාවයෙන් කුශලයෙන් සමභව වන්නාවූ ආකාශගමනාදිවූ සෘද්ධියි. **උපභොගත්ථාය**, අනුභව පිණිස ~

### 122. දුම්මේධ ජාතකං.

---

**තිරොකුච්ඡස්සු**, උඩුවරින් හෙවත් හිතතින් පිටත; **සන්ධි**, වීපිසන්ධියෙහි නොහොත් ගෘහසන්ධි හිතතිසන්ධි කවාටසන්ධියෙහි; **සිඞ්ඝාටකෙසු**, සතරමංසන්ධියෙහි නොහොත් තුන්මං සන්ධියෙහි; **දත්ථපරිසක්කානො**, [6]සිපිල් වියසී ඇත්තෝ නොහොත් [7]දත්ථපියෝ ඇත්තෝ; [8]**නිච්චලාලකො**, හැම දවස්මැ ජඩ වූයේ; **ධම්මන්තෙවාසිකො**, බැළ නොදියහෙත බැවින් පිතට ශිල්ප උගන්නේ; **මඤ්චපාදෙ උපට්ඨමෙහත්වා**, ඇඳ පයට

---

1 අබ්භංගිත්වා BCDEF. A හි මේ පාඨය හා අර්ථය නොපෑනේ. 2 වදයන් A. වධයන් BF. 3 දියපෙරලිය C. දියමෙනෙරලිය D. 4 මුරුද රුකෙක්හි A. 5 මොක්ඛකො CDF. 6 සිපිල්ලිය A. 7 දත්පියෝ BF. 8 A හි පමණකි.

රුකුල් දී; **සෙය්‍යථාපි නඞ්ගලීසා,** නඟුලිසක් මැන්නේයි; **නිමන්තනෙ,** ශාන්ති කරන පිණිස නිමන්ත්‍රණය කළ තැනෙක; [1]**ලෙසෙන,** මඳක් ආසන්න කොට; [2]**ලෙසො,** දික්බැවින් මඳක් ආසන්න බවෙක්; **පක්ඛිත්තභාජනසණ්ඨානානි,** [3]එවූ බඳුන් සටහන්හු.

## 123. [4]නඞ්ගලීස ජාතකං.

**උරං දත්වා,** සිත් දී; **ජනාසර,** ගිහිගල්ගෙය; [5]**ඛුද්දකමහාවත්තෙසු,** ආගන්තුක වත ආවාසික වත භත්තාග්‍ර වත සෙනාසන වත ජන්තාඝර වත වච්චකුටි වත උපාධ්‍යාය වත අනුමොදනා වත පිණ්ඩපාතික වත ආරඤ්ඤක වත සද්ධිවිහාරික වත අන්තෙවාසික වත යනාදිවූ තුදුස් මහාවත්හිද; **අසීති ඛන්ධකවත්තෙසු ච,** තජ්ජනියාදි ඒ ඒ කර්ම කළ කාලයෙහිද පරිවාසාදි කාලයෙහිද පිරියයුතුවූ දෙව්සි කඳුවත් ආදිවූ අසූමහ කඳුවතෙහිද; **විතක්කමාළකං** යනුයෙහි ආදිකොට ඇත්ගම් යනුවා විසින් වසන වෙහෙරින් එතැනට අවුත් කාමවිතර්කාදී යක් නොසිතිය යුත්තේ යයි සනිටුහන් කොට යායුතු හෙයින් විතක්කමාළක නම්. වසන වෙහෙරින් අවුත් එහි සිට බික් සිඟන්නට යායුතු තැන් විතක්කන බැවින් විතක්කමළු නම් වේ යයිද යෙත් මැයි. "විතක්කෙත්වාන් එත්ථ පිණ්ඩාය චරිතබ්බාට්ඨානානි–විතක්කමාළකං" යනු වේ. **ධුරභත්තානි** යනුත් පාඨයි. එහි ධුරභත්ත නම් නිති බත්–නොහොත් එකක්හු ප්‍රධාන කොට දෙන බත්. **නිද්දෙසො,** නියඟ; **දොණිං,** අවුණුවක්–[6]වාණක් එව්; **උස්සිඤ්චිත්වා,** නගා; **අඩ්ඪතෙය්‍යඝටහාරප්පමාණං,** දෙගැල්සමාරක් බරයි. ගැලෙක් යාළක් ගන්නි. එහෙයින් දෙගැල් සමාරක් බර නම් දෙයාළ දසමුණෙක් පමණය යනු වේ. **නිප්ඵලභාවතො,** අඵල බැව් නැති බැවින්; **ඉතිහ ආස ඉතිහ ආසාති,** මෙසේ වීල මෙසේ වීලැයි කියා; **එවං,** මෙසේ; [7]**ඉතිහිතිහෙන,** මෙසේල මෙසේලැයි කියා [8]අප්‍රත්‍යක්ෂ වශයෙන්.

## 124. අම්බ ජාතකං.

**ලෙඛං,** ලේකම් නොහොත් අකුරු; **ගණනං,** ගණන්; [9]**දෙව තයො වොහාරෙ අකාසි,** වත පොත් දෙතුන් පොතක් පුහුණු කෙළේයි නොහොත් දෙතුන් [10]භාෂාවක් පුහුණු කෙළේ; **වචනකුසලො,** කියවීමෙහි දක්ෂයි. 'වාචන කුසලො'යි

1 A හි පමණකි 2 මෙතැන් පටන් 10 පෙළේ 'සද්ධිවිහාරිකවත' යනු දක්වා A හි නොපැනේ. 3 එබැවින් ධාන්‍ය බඳුන් සටහන්හු BCF. 4 නඞ්ගලීස BCF. 5 මඥසම්භවරාජ්ජු BCF. 6 වතක් BCF. 7 ඉතිහිඉතිහෙන A. 8 අප්‍රත්‍ය BCDEF. 9 මෙ තයොති වොහාරෙ අකාසි–මූ.අ. ක. 10 භාෂාකෙනකුත් BCF.

තැන්. නොහොත් වචනකුසලො, තෙප්ලෙහි දක්‍ෂයි-බිණීය හෙයි යනුයි; වොහාර, බිණීමෙහි; ලක්ඛණෙන අධිකො, ලකුණෙන් අධික කොට හෙවත් [1]ලකුණු ඔබා-සත් ගණය යනුයි. ආවාහ නම් අනුන්ගෙන් තමන්ට ගැන්මයි; විවාහ නම් තමන් ගෙන් අනුන්ට දීමයි; මුද්දිකාය, හස්මුන්දෙන්; ජීවාමි නාම, ජීවත්වන්නා නම් වෙමි; [2]පතිට්ඨපෙසි, [3]පිහිටුවාලී-තන් [4]මහත් කොළේය යනුයි; සාටකෝ [5]වලිතුං, පිළී හකුළුවන්නට-හඳනට දෙන පිළී හකුළුවාලා දෙනසේය යනුයි; පිංසිතුං, වටන්නට හෙවත් [6]හඹරනසේ; වත්ථකම්මන්තිකාදයො, වස්ත්‍රකර්මාන්තිකාදීන්; පුන ආගන්තුං, සිටාණන් අවුත් මාගේ ගෙය දෙර නසාපී කල නැවැත මාගේ ගෙටමැ එන්නට; අපචිතිකම්මං, ආදරක්‍රියා; පටිග්ගහං, අත් දෙවුනා මලාව හෙවත් අත් දෙවුනා විල්; ඛෙළසරකං, කෙළමලාව හෙවත් කෙළගොටු; විජනිම්පි, තල්වැටද; සරීරවලඤ්ජනකාලෙ, මුවාපස් කරන කල්හි; උදකකාලසං, අත්පස් දියකොතලා; සසුරං, මයිලාට; උපකා, උකුණුවන්; [7]අප්පමත්තකා, නොපමාද-වචන් තමා ලැබේදයු නැති; දුක්ඛසීලොව, දුක් දෙන සුලුමැයි; අපිච, [8]බල එකෙක් ඇත්; ගෙ, තිට; අනුමග්ගං ගන්ත්වා, පසුමං හොසින් හෙවත් පසුගමන් කොට ගොස්-ගමන් පසුකොටය යනුයි; කටච්ඡුං, සැන්ද; වම්භනවචනං, ගරහන තෙපුල්; කසාභිඝාතෙහි, සැමිටි පහරින්; පසිරැදුහාසි, කිවායි; නිහතමානො, පහවූ මන් ඇත්තේයි.

## 125. කටාහක ජාතකං.

අසිලක්ඛණපාඨකං, ශස්ත්‍රලක්‍ෂණ දන්නාවූ; උපසිඞ්ඝිත්වා, හිඹපියා; මරිචචුණ්ණං, මිරිස්සුනු; ආකඩ්ඪිත්වා, කොපු යෙන් ඇද; උපසිඞ්ඝනකාලෙ, හිඹිනවුහට; ඛිපිතුකාමතං, කිවිස්සැටි බැව් හෙවත් කිවිස්නා කැමැති බැව්; අසිධාරාය, කඩුමුවහතින්; පටිහතා, පහරන ලද්දී; පච්ඡෙනතා, කියන්නේ; ලාභාය, ලායෙන්; පටිනාසිකං, බොරු නාසාවක්; [9]මහාඉක්ඛණිකං, [10]මහයක්දෙස්සියකු [11]වට සිටි තැනැත්තී; රාජධීතාය-පෙ-අහොසි, රදුව කෙරෙහි [12]ඇලවැ ඔත් එක් කාලකණ්ණි යක්‍ෂයෙක් ඇති; මණ්ඩලපීඨිකාය, නහන්නට බඳ පිලෙහි; [13]හෙට්ඨාමඤ්චෙ, යට ඇඳහි හෙවත් එහි හිද

1 ලකුණු සහ සත්ගණය යනුයි BCDEF. 2 පතිටඨාපෙසි-මු. අ. ක. 3 පිහිටු වාවී BCEF. 4 මහාන් කොළේ BCD. මහාත් කොළේ F. 5 වලෙතුං-මු. අ. ක. A. 6 අඹරන්නටසේ A. 7 අප්පපොතා BCEF. 8 බලඇත් BCDEF. 9 මහාඉක්ඛිණීකං-හැම. 10 මහායක්ෂෙත් දෙස්සකු A. 11 යකුන්ට සිටි තැනැත්තී BCDEF. 12 ඇලිවා AC. 13 හෙටඨාසුකානමඤ්චෙ-මු. අ. ක.

කහන්තට හිඳිනා පරිද්දෙන් ලූ ඇඳ යටහි; **පවාහෙස්සාමි**, දුරු කෙරෙමි; **පටිකුජ්ජිත්වා**, උඩුතෙල්ලා හෙවැ හෙවත් උඩු බලා හෙවැ; **බිම්පෙය්‍යාසි**, කිවුසු; **පුට්ඨා**, පෝෂණය කරන ලද හෙවත් වඩනා ලද; [1]**පායසෙන ජඩ්ඩිත**, කිරිබත් මත්තෙහි ඔත්; **සප්පි විය**, [2]හෙළගිතෙල්සේ. දෙන්නා ඔවුනොවුන්ට සුදුසු බව ගෙනැ කිහු; [3]**පටිපූරියං** [4]**ඨත්වා**, හිරුට අභිමුඛව හෙවත් හිර බලා සිට; **ලාඛා විලිසි**, [5]ලාරසයෙන් කළ බොරු නාසාව විරිණි.

## 126. අසිලක්ඛණ ජාතකං.

**තිබිණභෙසජ්ජ**[6]**පරිවාරිතං**, අනුභව කළ කල්හි ශීත නොවදනා පරිද්දෙන් කුරුවූ බෙහෙත් ලා [7]කනාරන ලද්දවූ; **දිවසභාගම්පි**, දවස් භාගයක් මුළුල්ලෙහිත් හෙවත් මුළු හිරිය කුත්-මුළු [8]දවහලක්ය යනුයි; **ඛීරගණ්ඩුකං**, [9]කිරිකටක් නොහොත් කිරිකබලක්-කිරිසුබුක්කක්ය යනුයි; **විකාහලෙත්වා**, මුව සලා; [10]**නුවණ්ණුහති**, දමයි; **ගීවං පන මෙ වලිත්වා**, මාගේ කර අඹරාපියා.

## 127 [11]කලණ්ඩුක ජාතකං.

**වුද්ධිමන්වාය**, වැඩිවිය පැමිණ; **සූකරච්ඡාපකසදිසො හුත්වා**, හූරුපැටවකු වැනිවැ-ඔහු සා ඇතිවැ යනුයි; **ආසයස්ස**, බිලයට; [12]**සංඛාදිත්වා**, ලොම්යා හෙවත් සපා නොහොත් කා; **අජ්ඣාහරිත්වා**, ගැලපියා; **ඉදානි සිම්බලා**, දැන් [13]තුනුවැ සිටුම්හ; **තස්ස උපරි පක්ඛන්දි**, බොධිසත්වයන් කරා [14]පැන හිනිය යූ තැනි; **ධම්මසුධම්මතාය**,'ධම්මස්ස සුධම්මතාය'යි [15]බිඳනේයි. **ධම්මස්ස**, කල්‍යාණධර්මියාගේ; **සුධම්මතාය න**, සුන්දරස්වභාවයෙන් නොවෙයි-කුමය යූ තැනය යත්-තා කරන තෙල නපොධර්මය ධර්මියාගේ සුන්දරස්වභාවයෙන් වූයේ නොවෙයි. ඉඳුරා ධර්මාධ්‍යාශයකින් වූයේ නොවෙයි-පාපාධ්‍යාශයෙන් වූයේය යූ තැනි. **ගලනාළියං**, [16]බොටුයෙහි.

## 128. [17]බිළාරවත ජාතකං.

**දවඩාහෙ**, ළැව්ගිනි; **සීසං ආහච්ච**, හිස පැහැරු හෙවත් හිස ඇන ගෙනැ; **සොණ්ඩියං**, කෙම්හි; **තං මූසිකාදසිං**, ඒ

1 පායාසෙ-හැම. 2 එළගිතෙල් සේ A. 3 පටිපූරිසං BCEF. 4 ඨපෙත්වා A. 5 ලාසෙන් A. 6 පරිභාවිතං A. 7 කරන ලද්දවූ A. 8 දවලක් BC. දවාලක් F. 9 කිරිබටක් A. කිරිසකටක් BE. කිරිගඬුසා-කිරිබටක් C. කිරිසටවක් F. 10 නිවණ්ණුහති BCEF. 11 කලණ්ඩු BCEF. 12 මංසං ඛාදිත්වා BCF. 13 තනුවැ BCF. 14 පැකිණසිද්ද A. පැනසිනිදිය BCF. 15 බිඳුනේයි-හැම. 16 බුටුයෙහි A. 17 බිළාර ජාතකං A. බිළාරජාBCF.

[1]මීලෙණ; **අඞ්ගුට්ඨගණනං**, ඇඟිලි ගණන්. හෙවත් ඇඟිල් ලෙන් ගණන් [2]ගිණීම්. අඞ්ගුට්ඨගණන නම් ආදියෙන් ගිණූ අඞ්ගුට්ඨ පටන් [3]දූන්......

## 129. අග්ගික ජාතකං.

**අතිචරිත්වා**, අනාචාරකොට; **ගිලානාලයං**, ගිලන් ආකාර; **නිපජ්ජමානා**, නතනන්නී; **ජාරෙහි සද්ධිං**, සොරසැමියන් හා; **භවසඞ්ඛපගතන්තා**, හවයෙන් මූවාවූ හෙයින්; **පක්ඛපණ්ණානි**, පස්පලාද; [4]**එලානි ච**, එහිමැ [5]පක්දූ; **කුට්ටෙත්වා**, කකියවා හෙවත් කකාරා; **තම්බලොහභාජනෙ**, තඹ බඳ නෙහි; **යොත්තං වා**, යොත් බානක් හෝ; **රුක්ඛලතං වා**, රුක්සුඹුලක් හෝ නොහොත් ගස් වැලඳගෙන නැහෙන වැලක් හෝ; **කාපෙරෙන**, වැලම්ටින්; [6]**පොථෙය්‍යාසි**, තලව; [7]**ධිති**, නිඳු වේවායි; **සාගුහත්තානුවජ්ජිකං**, තී මාගෙන් අනුභව කරන [8]කැඳව බතට සුදුසු; **උස්සුක්කං**, [9]උත්සාහයට......

## 130. කොසිය ජාතකං.

# තෙරසමො වග්ගො.

**කෙනචිදෙව** [10]**කාරණෙන**, කිසි කරුණකින්-කිසි හය හෙතුවකින් යුසේයි; **පච්චයං**, වහල්; [11]**පරිච්ඡදපරිවාරං**, වස්ත්‍රාදි උපකරණද පරිවාරජනයාද; **සෙට්ඨිසරණිං**, සිටැඹුව; **නිවාපං**, [12]තිම; **දසනෙන**, දැකන්හි; **බහලපලාපතුම්බං**, බොල් වී තිඹක්. බොල් බොහෝ සෙයින් කීහු; **ඔපුනාපෙත්වා**, පොළවා; **කතවිනාසකභාවෙන**, කළ උපකාර නැසූ බැවින්; [13]**පරලොපෙන** [14]**සද්ධිං**, "අසම්පාදනෙන"යි කිවමනා තැන [15]පරසවර ආකාරයහට ලොපය හා සමඟ; **අසම්පදනෙන** යන්නෙහි අර්ථ 'අගහණෙනාති අත්ථො' යී තැන්. **යස්ස-පෙ-ලාමකස්ස**, ඔහු විසින් දෙන ලද යම් කිසි හීනවූද උත්තමවූද වස්තුහුගේ අග්‍රහණයෙන්; **අට්ඨන්නං නාළීනං**, අට ලාස්සකට; **අඩ්ඪමානන්ති**, අඞ්මාන යයි කියා; **චතුන්නං**, සතරලාස්සකට නම; **චතස්සො නාළියො**, සතර ලාස්සෙක්; **සස්සතාව**, නිත්‍යවීමැ; **කම්මන්තද්දසො**, කර්මාන්ත කරන ගැත්තෙක්; **උපරවං** [16]**අකාංසු**,

1 මීබෙන A. 2 බිණීම් BF. 3 මෙහි උණුනාඩයක් පැනේ. 4 හිඑලාදීහිච-මූ. අ. ක. 5 පත්දBCF. 6 පොථෙය්‍යාසීති, තලයි ABCEF. 7 ධිති-මූ. අට්ඨකථාහි නො පැනේ. 8 කැඳබතට BCEF. 9 උස්සාහයට ACF. උස්සායට B. 10 කාරණීයෙන-මූ. අ. ක. 11 පරිචෙඡද ABC. 12 වැටුම් BCEF. 13 සරලොපෙන-මූ. අ. ක.-හැම, 14 සඞ්-මූ. අ. ක. 15 පකාරසථ-හැම. 16 අකාසි-මූ. අ. ක.

පොළුවරහඬ කොළෝ නොහොත් මහත් කොට හැඬූ; **කුටුම්බං සණ්ඨපෙත්වා,** [1]බෑන්දය ආදි පරිද්දෙන් තබා ගෙන෴

## 131. අසම්පදාන ජාතකං.

**දද්දල්ලමානා,** බබළන්නාහු; **පණ්ඩී,** පහකෙළේ-පැලවිය යු තැනි; **භට්ඨං,** [2]තැනින් හිගුළුවුණු හෙවත් ගසින් ගිලිවුණු; **තූලංව,** හිඹුල්පුලුනක් මෙන්; **අභිසඞ්ඛතං,** මැවූ හෙවත් සංස්කාර කරන ලද-සරහන ලද්දාවූය යු තැනි; **පයොජෙසුං,** කොළෝ හෙවත් ගී නැටුම් පැවැත්වූ; **මෙඝත්ථනිතපූරිතො,** වලාහඬින් පුරනලද; [3]**භයභීරුතාය,** [4]භයභීරුත්වය හෙතු කොට ගෙන. **අවත්ථිතතතා ච,** නොනැවැති බැවින් හෙවත් පසු නොබට හෙයින්ද; නොහොත් **අභයභීරුතාය,** අභය භීරුත්වයෙහි; **අවත්ථිතතතා ච,** පිහිටි බැවින්ද෴

## 132. පඤ්චගරුක ජාතකං.

**ගාමකං,** [5]නියරිපිටි ගමක් හෙවත් පිටිසර ගමක්; **ජාතස්සරතීරෙ,** විල්තෙර. නොකැණී [6]හෙබි ජාතස්සර නම්. **බහලපත්තපලාසං,** ඝනවූ පත් ඇති; **උද්ධනාරොපිතං විය උදකං,** උදුනට නැඟූ දියක් මෙන්; **පක්කාවට්ටාපෙත්වා,** කකියවාපියා෴

## 133. ඝතාසන ජාතකං.

**අවසෙසසචිත්තකසත්තෙන,** ධ්‍යානලාභීවූ බ්‍රහ්මාදිවූ අවශෙෂ [සචිත්තක] සත්වයන්; **බලවචිත්තෙකග්ගතාසඞ්ඛාතෙන,** බලවත්වූ චිත්තෛකාග්‍රතා සඞ්ඛ්‍යාත සමාධි ඇති හෙයින්. නෙවසඤ්ඤානාසඤ්ඤායතනාදිවූ ධ්‍යානය කොටිප්‍රාප්ත ධ්‍යාන හෙයින් තත්සම්ප්‍රාපකවූ සමාධිය බලවත් හෙයින් කියත්෴

## 134. ඣානසොධන ජාතකං.

**ගාධති,** පිහිටාද. 'ගාධ-[7]ප්‍රතිෂ්ඨායාම්' යන ධාතුයි. **පටිභාගකසිණං .වඩ්ඪෙත්වා** යනු කිසුණු [8]ප්‍රතිභාග නිමිත්තයි. **දුතියෙන ඣානෙන** යන මෙහි සියුතු නියෙන් අවිතක් අවිසර පැසුම් නියෙන් [9]අවිතක් විසර ඇති ධ්‍යාන කීහු෴

## 135. චන්දාභ ජාතකං.

1 බිරින්ද BCDEF. 2 තණින් ගිළිහුණු A. 3 අභයභීරුතාය-හැම. 4 ගිරුත්වය BCF. 5 නියරිමට BCEF. 6 හෙම් A. හෙබි BCF. 7 පතිඨාශං·A. 8 පිළිභාගනිමිත් ත්‍රියා A. 9 අවිතක් අවිසරමතු ආනි A.

**ලසුණෙන**, ලූනුනින්; **පවාරෙත්වා**, [1]රිසි උපයා. 'වර-ඊප්සා යාම්' යන ධාතුයි. **දෙව තයො භණ්ඩිකා**, දෙතුන් පඩුරක්. භණ්ඩිකා [2]ගොහ ලූනුනුයි; **යථාභතං ලසුණං**, ගෙනා ලූනු හෙවත් ආදි ගෙන හැර තුබූ ලූනු; **න මත්තං ජානිත්වා**, පමණ නොදැන හෙවත් බොහෝ කොට; **ආහරාපෙසි**, ඉල්වා ගතු; **උජ්ඣායිංසු**, කිපියෝ නොහොත් **උජ්ඣායිංසු** යන මෙහි 'උත්' යන උපසර්ගය 'අව' යන අරුත් කියා. **අවජ්ඣායිංසු** යු සේයි. අවඥ කොළේ‍රය යන අර්ථයි. **මහිච්ඡා පුග්ගලා**, බොහෝ පසස්නා පුහුල්. "මහන්තං ඉච්ඡතීති-මහිච්ඡා-තණ්හා, සා අස්ස අත්ථීති මහිච්ඡො". **අප්පියො**, අකල්-කල් ඇසින් තොබැලිය යුත්තේය යනුයි-සඳ උපතට නොවූ සැහැව් එව්; **අමනාපො**, සිත් නොවඩන්නේයි-සිත් නොකැමැතිවිය යුතු වන්නේය යනුයි; **භියොභාවො මත්තාය**, බලවත් පමණින්; **කොට්ටනසට්ටනසභාවං**, කැපීමට තැලීමට නිසසහැ; **කොට්ටනසට්ටනසභාවානි** යී යෙත්මැයි-කැපීමට තැලීමට සුදුස්සහ යනු අර්ථයි. **පිට්ඨිවංසකොටියං**, [3]පිටිසෙනෝ වස්යට කෙළවරෙහි; [4]**අස්සාසා**, අස්වැසුණාහු හෙවත් නිදුක්වූවාහු; **බකපතත**, කොක්පත්...

## 136. සුවණ්ණහංස ජාතකං.

---

**කාණා** යන්නෙහි [5]රුමැත්තෙන් දුටුවන් කණ බඳු කරන් තෙන් කාණා නම් වූ. ඇගේ මවු කාණමාතා [6]නමු. **න සම්පජ්ජි**, නොනිපනි; **උපච්ඡින්නභාවො**, [7]නැතිකොටපි බැව්; **පාසාණ** [8]**කොට්ටකකුලෙ**, [9]මිණිකරුකුලෙහි-නොහොත් ගල්වඩු කුලෙහි; **පරිසොධෙත්වා**, [10]පුහුණු; **අබ්භන්තරං**, [11]අවාමට-විනාශයටය යූ තැන්; **අපණ්ණත්තිකභාවං**, නම් නැති බවට; **එකෙන මාසකෙන**, එක් මඳැටකින්-මස්සෙන් මඳැටක් පමණ ගෙන එයින්; **සණ්ඨපෙත්වා**, ගහවා; **නික්ඛමනාකාරපත්තානි**, නික්මෙන බඳුවූවාහු හෙවත් පිටතට යන පමණ වූවාහු; [**පාපුණිංසු**], පැමිණියාහු; **මූසිකං වා මංසං වා ලභති**, මීයා හෝ මස් හෝ ලබන්නේද-එක් බිළාරයෙක් ආදිකොට මීයා ගොවරව සිටි හෙයින් මීයා තමා හෝ නොහොත් ඒ මීයා කෙරෙන් මස් හෝ ලබන්නේද නොහොත් ලද්ද; **තත්ථ**, ඒ මීයා කෙරෙහි; **උප්පජ්ජති**, පාතුභවිස්සති...

## 137. බබ්බු ජාතකං.

---

1 සිරිA. 2 ගොහ ලුහුනුයි A. විමසිය යුතු. 3 පිටිසෙයින් BCDEF. 4 අඩකා-මු. අ. කා. !අසසා, අස්වැහුණුහුගේ හෙවත් නිස්මුණුවාහු-හැම. 5 රූපත්තෙන් A. 6 නම්වූ A. 7 නැති කොට තිබූ බැව් A. 8 කොටඨක ABCF. 9 මිණිකර ABF. 10 පිරිසුදු A. 11 ඇමැමට BCDF.

ධම්මූපසංහිතං, කාරණයෙන් යුත් නොහොත් ධම්මින් යුත්; අත්ථූපසංහිතං, වැඩින් යුත්; මක්ඛිකා, [1]මැරුහු; සම්භාරයුත්තං, දුරු මිරිස් ආදි සම්භාරයෙන් යුක්තවූ; කඤ්ජිකපූරිත, පල්කාඩි පිරූ; විත්තකසරො විය ච, පිටත සිතියම් කළ කළයක් මෙන්ද; බහිමට්ඨාව, පිටතින් මට වූයෙහිමැයි.

## 138. ගොධ ජාතකං.

ජටාලානං, සොහොන් [2]පෙනෙළි; [3]කට්ඨපං, දරකිස හෙවත් දරින් කළමනා කිස; නෙව එරති, නොම [4]සාභා; සාමඤ්ඤත්ථං, ශ්‍රමණ ඵලය. මාර්ගඵල ආදිවූ පිළිවෙත් [5]ශ්‍රාමණ්‍ය ඵල නම්. නොහොත් ශ්‍රමණ භාවය හෝ යි; බාළිසිකා, බිළී වැද්දෝ; සොබ්භ, [6]හෙබ්හි; පකතියාපි, ස්වභාවයෙන්මැ–බොහෝ සේ. මෙයින් බොහෝ බිළීවැද්දන් මස් ගන්නා වළ සෙස්සන්ට උපද්‍රවයක් නොවැ මෝහටම වූ බව හැඟවූවා වෙත්. පටිවිස්සකෙහි, ඉක්බිති ගෙයි ඇත්තවුන් හා; උත්තරිසාටකං, උතුරුසළුව; ඡින්දි, කණ කොට ගති–නොහොත් සිල් කොට ගති; හත්ථෙන අක්ඛීනි [7]නිප්පීළියමානො, අතින් ඇස් [8]වසාගත්තේ; උක්ඛලිමසියා, බඳුන් දූල්ලෙන්; අක්කොසසි, හැවිහි; පරිභාසසි, නිසරු බිණිහි; අට්ඨ කහාපණෙ දණ්ඩාපෙස්සාමීති, අට මස්සක් දඩ [9]ගන්වමියි; විසොධියමානෙ, පසිඳුනා කල්හි හෙවත් පසිඳුනාං ලබන කල්හි.

## 139. [10]උභතොභට්ඨ ජාතකං.

මච්ඡො, හිස්හි; සරීරවලඤ්ජං, වචිස්; [11]පඤ්ඤායිස්සසිති, තාගේ කැමින් සුඛයෙන් හෝ දුක්ඛයෙන් හෝ යුක්තවැ තෝමැ පැනෙන්නෙහි යයි; ඔලම්බකං [12]චාරෙන්තො විය, ඔලුඹු බහන්නකු සෙයින්; ඡෙදෙ, සේද; අලාතං, [13]ගිනිපෙන හෙල්ලක්; හත්ථිපිට්ඨානි, ඇතුන්ගේ පිටි; කාකවසා, කවුඩු තෙල්; පක්ඛන්දිත්වා, පැන නැඟී ගොස්; සරණං, සරණ කොට; විස්සමිත්වා, සැතපී; නිසම්ම, විචාරා; වෙරවසිකො, වෛර වශග වූයේ හෙවත් කොපවිසී වූයේ; කඤ්චනභද්දපීඨං, රන් බදපුටුවක්; ඔමද්දිත්වා, හනා.

## 140. කාක ජාතකං.

## චුද්දසමො වග්ගො.

1 මරඹු BCDEF. 2 පෙනෙහිළි A. පෙණෙළි B. 3 කට්ඨං ABCEF. 4 සාඩා A. 5 ශ්‍රමණ BCEF. 6 හෙබි B. හෙබ්බි CF. 7 උපපීළියමානො-මු.අ.ක. 8 ඔසවාගත්තේ BCDEF. 9 ගන්මියි BF. 10 උභතොභණ්ඩ A. 11 පඤ්ඤායිස්සති AB. 12 කාරෙන්තා A. 13 ගිනිපෙලෙල්ලක් A.

**විපක්ඛසෙවිං**, ප්‍රතිපක්‍ෂ සෙවුනා; **ගොධාපිල්ලිකො**, [1]ගෝපැටවෙක්; **අවත්ථරති**, ඔහු ඇඟ වැතිරෙන්නේයි; **වාතබිලං**, සුළං වදනා සිදක් හෙවත් සොරමහක්-ආදි වදනා ප්‍රකෘතිච්ඡිද්‍ර තිබියදීමැ සොර මහක්සේ අතික් සුළං වදනාට යයි කියා සිදක් කරවිය යතුයි; **වම්මිකාමක්ඛිකා**, මැරුහු; **ආසයං**, වසන තැන; **තස්ස හත්ථතො මුත්තා**, ඔහු අතින් මිදී [2]පැලැ ගොසින් —

## 141. ගොධ ජාතකං.

[3]**න විජ්ඣි**, නොහළී; **උපසඞ්කමනම්පි**, සමීපයට ආවාවූද බොධිසත්වයන්; **ශාලාහතාරං**, මුගුරු තරවාමැ; [**පටික්කමිත්වා**], [4]නැවතැ; **ඔනාසො නාම න හොසිති**, මුගුරු තරවා ගත් හෙයින් මළේ නමුත් නොවෙයි. මළකුසේ ඕනා හෙයින් නොම ළෙහි නමුත් නොවන්නෙහි යයි; [5]**විරදෙධා**, වැරැද්දෙහි —

## 142. සිගාල ජාතකං.

**සුගතාලයස්ස දස්සිතභාවං**, සජීඥ ක්‍රියා දක්වූ බව; **අනනරහිත**, නවුවාවූ; **ආවෙණ්**, වෙන; **පටිභාතු**, [6]තට වැටහේවා; **ආගිලායති**, රෙදෙයි; **නාමහං ආයමිස්සාමිති**, ඒ මම සන්හිඳු වම්යි-නොහොත් එහෙයින් මම් හෝනෙම්යි; **පිටඨිකණ්ටකං එස්සහෙනා විය**, සැපිණි ඇණයක් ගසන්නකු මෙන්-නොහොත් පෘෂ්ඨකණ්ටකයක් [7]ගසා බහන්නකු මෙන්. [8]පිටඨිකණ්ටක නම් නොඑක් දූ එල්වන පිණිස [9]ගෙබිත ගසන කණුයි. **සීහනාදං**, අභීත නාද-උතුම් අඬ එව්; **සිහවිකාසමංසං**, සිංහයා කා හළ ඉඳුල් මස්; **සිඛරෙ**, මුඳුනෙහි; **විරොචසාමිති**, බබළ [10]සවාම්යි; **ඛරම්තුං**, වලකාන්නට හෙවත් තමා කරන්නට සිතූ ක්‍රියායෙන් නවත්නට; **පාදෙන** [11]**සඞ්ඝරිත්වා**, පයින් කැටි කොටලා නොහොත් [12]හිළිකොට; **මත්ථලුඞ්ගානි**, හිස්මුල් —

## 143. විරොචන ජාතකං.

**උක්කුටිකප්පධාන**, [13]කෙළිල්ලෙන් හිඳ ඇවීදුනා තප-නොහොත් අක්පත්ලෙන් ඇවිදුනා තප; **වග්ගුලිවත**, වවුලන් සේ උඩ එලෙන තප; **කණ්ටකාපස්සය**, කටුමැස්සේ හෝනා තප; **පඤ්චතාපතාපනාදිහෙදං**, සතර දිසායෙහි දල්වූ ගින්

1 ගෝපැටෙක් BCF. 2 පලාගොසින්-හැම. 3 මෙතැන් පටන් 15 වෙනි පෙළේ 'දක්වූ බව' යන්න දක්වා A හි නොපැනේ. 4 නැවැතු-හැම. 5 විරුඬො BCE. 6 බට A. 7 ගසන්නකුමෙන් A. 8 පෘෂ්ටකණ්ටක BCF. 9 ගෙබිත්ත BCEF. 10 සාමි AC. 11 සංහරිත්වා A. 12 A හි නොපැනේ. හිළිකොට BC. 13 එළිල්ලෙන් A.

තෙන් හා උඹින් හිරුරසින් තැවීමයයි කියන ලද පඤ්චතාප තපපනාදිවූ භෙද ඇති; **ජාතග්ගිං**, දැගිනි හෙවත් උපන්දා පටන් රැකි ගිනි-උපන් දවස් ගෙන නොනිවා තබා තුබූ ගිනිය යනුයි; [1]**අග්ගිජුහනාදිවසෙන**, වහ්නිපූජාදි වශයෙන්; **ගොදක්ඛිණං ලභිත්වා**, ගොනකු දන් ලදින්; **අග්ගිභගවා**, ගිනි බුදුනු; **ජඩ්ඪක්ඛුව**, [2]සිහින් කකුල්ද; **පරිහරණෙන**, පුදන්නාවූ.

### 144. නඞ්ගුට්ඨ ජාතකං.

**අතිවරිතුං**, හික්ම පවත්නට; **ඉදානි ඛො ජානාති**, ප්‍රථම යාමයෙහි මෙතෙක් දෙනා ආකල ඉතිකින් මත්තේ මෙතෙක් දෙන එති කියා දූත් කවුරු දනිත්ද; **කින්නඛොපි ආගමිස්සන්ති**, කෙපමණ කෙනෙක් එන්නාහුද-ඉතිකින් බොහෝ කොටමැ එන්නාහ යනුයි; **විලාපං විලපසි**, හඬ හඬන්නෙහි; **සිනෙහො වා**, මඳ සනායෙක් වේවයි; **පෙමං වා**, වැඩි සනායෙක් වේවයි.

### 145 රාධ ජාතකං.

**සඨාසනනිහිතං**, සපයා තුබූ පරිද්දෙන්-නොහොත් පිළියෙළ කල; **මධුරහත්ථරසා**, මියුරු අත්රස ඇත්තීයි; [3]**සංඛාදිත්වා**, සපාපියා; [4]**අජ්ඣොහරිත්වා**, ගැලපියා; **ගලෙ සුස්සමානෙ**, උගුර වියළී ගිය කල්හි; **උට්ඨායුට්ඨාය**, දියේ නැගි නැගී; **හනුසු කිලමන්තෙසු**, [5]දෙහනුව එලෙන කල්හි; **දිනා**, බැගෑවූවාහු; **ඔසාරෙම**, මුහුදින් ගොඩට බහම්හ.

### 146. කාක ජාතකං.

**කතතිකරතනිවාරජණො**, කැති තකත් ලද [6]හිල්මසැ මැඳිපොහෝද රැ පවත්නා උත්සවය; **ඝන**, දළවූ; **ඔහඤ්ජාපෙත්වා**, බිඳුවා; [7]**සතවලලිකං**, සියක් තරු නොහොත් සියක් පත්; **කුසුමභරතනං**, වතුක්මලින් රැඳූ; **කුසුමභවත්ථුසම්ං**, වතුක් මල්වත්තෙහි; **වතිසද්දං**, වැට මඩනා හඬ; **කොටෙත්වා**, හස්තපාදයෙන් තලාපියා; **උත්තාසෙථ**, හිඳුවව්; **කණ්ණගගසදිසෙහි**, තෙප්හුල් වැනිවූ; **ඝනපුප්ඵරත්ත**, ඝන කොට රැඳූ වතුක් රත්පට; **කණ්ණෙඨ ආසත්ත**, කර බහාලූ.

### 147. පුප්ඵරත්ත ජාතකං.

**අනෙනාහොපිසඨාගෙර**, කහවුණු [8]සුලසින් අතුට ගත් කිම්පියෙස් ඇතුලත-ඇතුළු දෙව්රම් වෙහෙර වසන බව කි

1 අග්ගිදුහනාදිවසෙන-හැම. 2 සීන්AC. 3 මංසං ඛාදිත්වා-මු. අ. සා. 4 අජ්ඣොහරි-මු. අ. සා. 5 දෙඅනුව AC. 6 මැඳිපොහෝද BCF. 7 සතවලිකං-මු. අ. සා. 8 කලින් A.

නියේ; **අයං**, මා සමීපයෙහි වසන භික්ෂූන්ගේ සන්තානයෙහි කෙලශොත්පත්තිය; **ගන්ධකුටිපරිවෙණෙ**, ගඳකිළි මළුයෙහි; [1]**කිලෙසස්ස**, කෙලශය; **අවාපුරණං**, කොස්ස; **පරිවෙණෙන පරිවෙණං**, පිරිවනින් පිරිවනට; **සිලාපට්ටියං**, සල පොලොව පිහිටි; **කූටාගාරකුච්ඡිමත්තා**, කුළුගෙවල් සාවූ; **උප්පාටිතච්ඡවිලොම**, උපුල සිවි සහ ලොම් ඇති; **අල්ලීයිතුං**, ඇලෙන්නට; **විවට්ටති**, පෙරළේද හෙවත් දුරුවේද; **නදීතීරෙ**, නදී වැලත්හි; [2]**නඞ්ගලීසාය දට්ඨකාලො විය**, නඟුලිසක් ඩැහැගත් කලක් පරිද්දෙන්; **සුසසොපියා**, කුළුකෙලවරෙක; **කුසුලෙ**, කොටුවෙක; [3]**අස්සාදං අලභන්තො**, ආස්වාද රහිතවූයේ-නිරසවූයේ; **වක්කා**, වකුගඩු; **හදය**, [4]හෘත්මාංස; [5]**උදරං පක්ඛිත්වා**, [6]උදර මාංසයෙහි වැතිරැ නොහොත් උදර මාංසය අතුට; **වලිමොගණ්හි**, රැළි ගති-හැකිළ ගියේය යුතැන්; **උක්කලිසං** [7]**පිට්ඨපිණ්ඩං විය**, ඇතිලියේ බහාලූ පිටිපිඩක්මෙන්; [8]**සිජ්ජමානෙ**, තැවෙන කල්හි හෙවත් ඉදෙන කල්හි; **සංසින්නසරීරත්තා**, හිඳී ගිය ශරීර ඇති හෙයින්; **තාලක්ඛන්ධසදිසෙන**, තල්කඳක් වැනිවූ; **ඉතො පුන**, මෙයින් නැවැත වාරයකද; **නතො පුනන්ති චූතනවාරතො ච**, ඒ ගාථායෙහි දෙවනු 'පුන' යන්නෙන් නිර්දිෂ්ට වාරයෙහිද; **පුනනතොපි ච**, නැවත ඒ 'පුනප්පුනං' යන්නෙන් නිර්දිෂ්ට වාරයෙහිදූයි කියා මෙසේ; **පුනප්පුනං**, නැවැත නැවැත—

## 148. සිගාල ජාතකං.

**ගාවුතගාවුතන්තරෙ**, ගවුයෙකින් ඔබ්බේ පවුරෙක ගවුයෙකින් ඔබ්බේ පවුරෙකැයි කියා මෙසේ ගවුගවු අතුරෙහිවූ; **ගොපුර**, දොරටු; [9]**අට්ටාලකා**, අටලු; **කොට්ඨකා**, විවර; නොහොත් **අට්ටාලකකොට්ඨකා**, කොටුයේ වූ අටලු හා දොරටු; **උට්ඨිත**, පිහිටි; **දුද්දසිකං**, දුදුකිය හැකි; **උබ්බෙජනීයො හුත්වා**, භය ඉපැදවිය යුතුවැ; **දුතියකාචිත්තවාරෙ**, චුතිචිත්තයට දෙවන ප්‍රතිසන්ධිචිත්තයෙන්; [10]**ජාලාගිහන**, ගින්නෙන් දැගිය; **රජ්ජුයා උබ්බන්ධන්ති**, කර වැල් ලති; **එකතො-පෙ-පතන්ති**, එක් රෝගයකින් නැගී එක්රෝගයෙක්හි හෙන්නාහ; **එකොවාදෙනෙව**, එක් අවවාදයෙන්මැ; **නිබ්බිසෙවනො**, පාපවිෂයෙහි නිපොපි වූයේ; **අළවිශෙනතා**, තල උදුල; **සමුග්ගනිකා**,

---

1 කිලෙසාතා.-මු. අ. සා 2 නඞ්ගලිසා A. 3 A හි පමණකි. 4 හෘත්මාංස ABCE. 5 උදරමථරිත්වා A. උදරම්පරිත්වා BCDE. 6 උත්මාංසය ABCE. 7 පිට්ඨපිණ්ඩිවිය-මු. අ. සා. B. 8 සිජ්ජමානො, තැවෙන්නේ හෙවත් ඉදෙන්නේ ACDE. 9 අට්ටාල A. 10 ජාලාභිඝාත AB.

උගන්නාලද; **ආනඤ්ජකාරණ** නම් ඇතුන් හික්මවන පිණිස කරන කම්කටුලි; **යාව සුභාසිතං**, "අති සුභාසිතං" යි තැන්. මේ 'හත්ථිදමකෙන' යනාදීන් වදාළ පාඨාපෙක්ෂායෙන් කීහු. **හත්ථිදමෙමා**, දම්‍යවූ හස්තිතෙම හෙවත් දමන තරම් ඇත්; **සාධිතො**, දමා මෙහෙයන ලද්දේ; **එකංයෙව දිසං ධාවති**, එක් ඊර්‍ය්‍යාපථයෙන් එක දිසාවකටම දිවන්නේය-අනික් දිගට දිවිය නොහේමයැ; **පුරිසදමෙමා**, දැමිය යුතුවූ පුරුෂ තෙම හෙවත් දමන තරම් සත්වතෙම; **සාධිතො**, දමනලද්දේ නොහොත් දමා [1]මෙහෙයන ලද්දේ. එක ඊර්‍ය්‍යාපථයෙහිම **ඉද-අට්ඨ දිසා ධාවති**, අෂ්ට විමොක්ෂ නැමැති අට දිසාවට දිවේ. අෂ්ට විමොක්ෂ නම්:-"රූපී රූපානි පස්සති-අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති—සුභන්ති අධිමුච්චති-චත්තාරො ආරුප්පා-නිරොධසමාපත්ති"යන මේයි. **රූපී**, ආධ්‍යාත්මිකවූ [2]කෙශාදිවූ නීලකෘත්ස්නාදි වශයෙන් උපයන ලද ධ්‍යාන රූප නම් වන බැවින් ඒ ධ්‍යාන ඇත්තේ; **රූපානි**, බාහ්‍යවූ නීලකෘත්ස්නාදි රූපයන්; **පස්සති**, බලා-ඒ විෂය කොට ධ්‍යාන උපයයි යි තැන්. **යොගාවචරානං**, යොග්‍යවූ ආචාර්‍ය්‍යවරයන් කෙරෙන්; **කඤ්චි කාලං**, මඳ කලක්; **සුගමනන්දසො**, වියදඹු පමණක් බලන්නේ; **සහස්සත්ථවිකං ඨපෙනෙනා විය**, දහසින් බඳ පියල්ලක් තබන්නක්හු මෙන්. මේ බර දෙයක් ඔසවා සෙමෙන් සන්හිඳී තබන්නාසේ ශාන්තවූ පාදවින්‍යාස හෝ තකා කීහු. නොහොත් ඒ ශාන්තවූ ගමන ඊර්‍ය්‍යාපථයෙහි ප්‍රසන්නවූ ජනයහට ස්වර්‍ගාපවර්ගසම්පත් දීමෙන් ඒ ජනයා කෙරෙහි දහසින් බඳ පියල්ලක් තබන්නක්හු වැනිනුයි මේ හෝ අපෙක්ෂායෙන් කීහු. **සීහවිජම්භිතෙන**, සිංහ[3]වික්‍රාන්තියෙන්; [4]**හෙමවතිකා නාමමහාති**, හිමවත වසන්නම්හයි; **වස්සාරත්ත**, වැසි කල්හි; **එකතො-පෙ-පණ්ණානි**, එක්දිසායෙකින් එක්පතෙක එක්දිසායෙකින් එක්පතෙකැයි කියා මෙසේ දෙපතකින් උපලක්ෂිතවූ; **එකං නිම්බපොතකං**, එක් දෙ පෙති කොසඹ පැළයක්; **නිටඨුහි**, කාරා දැමී; [5]**පබ්බාජනියකම්මං**, දෙශත්‍යාග කිරීම්; **නිම්බ-පෙ-හිතො**, කොසඹ පැළය වැනිවූ යම් තාගේ කෲරවූ ගුණයෙක් ඇත්නම් හැරපියා.

## 149. එකපණ්ණ ජාතකං.

**අසන්තපග්ගහං**, [6]අසන්තජනයන් වැඩීම් හෙවත් අසාධුවූ දෙවදත්තයන්ට කළ අනුග්‍රහ; **තිබ්බකාරණං**, දැඩි කම්කටු

1 වෙහෙසන ලද්දේ A. 2 කෙලශාදිවූ BCE. 3 වික්‍රමයෙන්A. 4 හෙමවතකා-මූ. අ. ක. A. 5 පයොජනිය කම්මං E. 6 අසජ්ජනවිසම් A.

ලෙන්; **අග්ගිනුනෙනා විය**, පෙළෙන ලද්දකු මෙන්; **අවත්ථානං**, පිහිටාගැන්මෙක් හෙවත් [1]නිශ්චලවැ සිටීමෙක්; **පරියායෙන**, [2]ලෙශයකින්; [3]**රත්තිසම්පදං**, [රාත්‍රිසම්පත්තිය]; **යං**, යමක්හු කරා; [4]**පතිරූපාසනො**, එළඹෙන්නාහට; **හො**, හවන්ති; **දෙසිනා**, අභ්‍ර මහිකා ධූම රජස් රාහුය යන පස්වනක් දෙෂයෙන් විනිර්මුක්ත හෙයින් අපගතවූ දෙෂ ඇති; **රත්ති**, රාත්‍රි තොමෝ; **ලක්ඛණ්ණා වත**, විශෙෂයෙන්මැ සැලකිය යුත්තී යි හෙවත් උත්තමයයි කියා සැලකිය යුත්තීයි; නොහොත් ඉතාමැ ලක්ෂණයෙන් යුත්තීයි; නොහොත් ඉතාමැ චොරොජනීය යනුයි; **අයිරූපා**, කී දෙස් මූත් සඳපහනින් බැබැළුම් ගත් බැවින් මොනොවට රුවැත්තීයි; **දස්සනීයා**, දක්නට නිස්සියි; **පාසාදිකා**, දුටුවන් සිත් පහයනු වී; **රමණීයා**, මහාජනයා සිත් අභිරමනු වී; **යං**, යමක්හු කරා; **අඩ්ඪතෙලසෙහි භික්ඛුසතෙහි**, එක් දහස් දෙසිය පනසක් පමණ භික්ෂූන් හා; **කප්පාපෙත්වා**, සදවා; [5]**ගන්ධමණ්ඩලමාළෙ**, කන්මඩුලු ගත්වා හංස වට අයුරෙන් කළ කුළාරගෙයි නොහොත් එක්කන් මඩුලු ගත්වා වටහි [6]වැම් දී කළ වටත්හල්ගෙයි නොහොත් බොජුන් හල්හි; **සන්තවීචිමජ්ඣෙ**, සිසාරා සන්හුන් රළමැදහි; [7]**මහණ්ණවං විය**, මහාසාගරයක් මෙන්-සිසාරා සන්හුන් රළ ඇති මැද නිශ්චලවැ සිටිනා සාගර පරිද්දෙනැයි යනුයි. සාගරය තමා සිසාරා කෙළවරින් චඤ්චල බව මූත් මධ්‍යයෙහි නිශ්චලව සිටිනා හෙයින් කියත්. නොහොත් සන්තවීචිමජ්ඣෙ මහණ්ණවං විය යී සත් පරිභණ්ඩ පව් පිරිසේ මැද [8]සීදන්ත මූහුදු එව් සුනෙරපා මුහුදු එව් ගෙනැ කියූවෙත්. **අචිරපක්කන්තස්ස**, ගිය නොබෝ කලකින්; **ඛණො**, කණතලද කුසල්මුල් ඇත්තේ; **උපහතො**, නටුයේ; **මනකුට්ඨාපන**, මලවුන් දිවි ඇත්තවුන්සේ නඟා සිටුවාපියන; **පටිබාහන**, පිළිබහන-නඟා සිටුවූ මෘතරූපය නැවැත මෘතස්වරූපයෙන්ම කරන; **ගලනාළියං**, බොටුයෙහි; **ව්‍යග්ඝුට්ඨාපකො**, ව්‍යාඝ්‍රයා නඟා සිටුවූ—

150. සඤ්ජීව ජාතකං.

---

## පන්නරසමො වග්ගො.

---

## එකකනිපාතවණ්ණනා නිට්ඨිතා.

---

1 නිශ්චලවැ පිහිටාගැන්මෙක් සිටීමෙක් ABF. 2 ලෙයින් A. ලෙසකින් BD. 3 සඤ්ඤසම්පදං, බුදුන්ගේ ගුණ සම්පත්තිය ABCEF. 4 පතිරූපාසනතානං-මූ. අ. ක. 5 ගන්ධමණ්ඩලමාලෙ-මූ. අ. ක. 6 වෑඹ BEF. 7 මහානාවං විය-මූ. අ. ක. 8 සීදන්තර BCEF. සන්තර D.

**රාජෝවාදං**, තමන්වහන්සේ[1] රජ්ජුරුවන්ට කළ අවවාද; [2]**ගතිගතං**, [3]ඡන්දගති ආදිවූ සතර ගතියෙන් එක ගතියකට පැමිණියාවූ නොහොත් පරම්පරා විසින් දෙතුන් රදෙල් ගියාවූ නොහොත් බැණගත නොගීමෙන් කල් ගියාවූ; **අල්ලහත්ථාව**, තෙත් අත් ඇත්තේමය-බත් කා අත දිය නොසිඳෙන තුරුමය යනුයි; **භද්දං**,'පුච්ඡාමි' යි තැන්; **දිවා දිවසස්ස**, දෙවෙනි[4] දවහල්; **තං නිරෙත්වා**, ඒ බැණ නිමවා. "යං පුබ්බ-පෙ-අගමංසු එතදෙව අවජ්ජියනාති වත්වා" යි සම්බන්ධ කරනු. **අනුසාසි**, අනුශාසනා කෙළේයි-බිණිය යනුයි; **වොහාරං**, යුක්තියි; **කූටට්ටකාරකා**, කුළුසටන් බණත්තෝ-නොහිමිවූ හිමියම්හයි බණත්තෝය යනුයි; **උපරවො**, පොළුහර ගැසීම්; **අන්තොවලඤ්ජනකානං අන්තරෙ**, ඇතුළත්හි පරිවාරජනයන් අතුරෙහි; **බහිවලඤ්ජනකෙ** යනු රජගෙයින් පිටත වසන්නවුන්. අන්තොනගරාදි වශයෙන් පරීක්ෂා නොකොට එකහෙළා සාමාන්‍යයෙන් පරීක්ෂා කළ බව ගෙනැ කීහු. **අන්තො නගරං** යනාදි වශයෙන් වෙන වෙන ඇවිද පරීක්ෂා කළ බව නිසා කීහු. **නිහතො**, වළවූ; **උක්කමාපෙහීති**, මඟින් පහ කොට ගනැයි; **බලං**, ශක්තිබල; **යසං**, පරිවාර; **ගොත්ත**, කෞණ්ඩන්‍යාදි ගොත්‍ර; **කුලප්පදෙස**, කුලවේසෙස්; **නිපති**, බහාලයි නොහොත් ප්‍රේරණය කෙරේ; **උක්කමාපෙත්වා**, ඇළ කරවා; **උප්පථෙන**, නොමඟින්-වලිතැයි සේයි; **අගුණා පන කිදිසාති**, [5]මෙ කිවා ගුණ කල අගුණයෝ කෙබන්දෙ දූයි-අගුණයෝ තමූත් මේ තා කිවාහු මැ වෙත්දූයි;[6]**පටිගගහෙත්වා**, විචාරා හෙවත් පරීක්ෂා කොට......

## 151. රාජෝවාද ජාතකං.

**නහාපිතපුත්තං**, කරනැවැති පුත්‍රයක්හු; **මස්සුකරණ**, දැළි සිටිවීම්-[7]දැළි කපා සිටිවීම්; **කෙසසණ්ඨාපන**, කෙහෙ සිටිවීම් නොහොත් කෙස් බැසැ සිටිවීම්-තැතින් කපා සම කොට සිටිවීම්-නොහොත් කුඩා කුමරුවන් මුදුනෙහි කෙහෙ සිටිවීම්; [8]**අඩ්ඪපාදවඩ්ඪපනාදිනි**, කියඹු තිබීම් ආදි; **මඤ්චකං පරිසජ්ජිත්වා**,[9]හැඳ වැළ බැඳ ගෙනැ;**අවත්ථුම්හි**,නොතැන්හි හෙවත් ඡන්දරාග නො කළ මතා තන්හි නොහොත් අකාරණයෙහි; **පෙතකිච්චානි**, මළවුන් උදෙසා කළ මතා කිස; **ඉමානි දිවසානි**,

1 රජදරුවන්ට A. 2 අගතිගත.-මු. අ. ක. 3 ඡන්ද ආදිවූ BCDEF. 4 දහවල් BD E. දවල් C. 5 මේ තාමැ කිවවුත් A. 6 පටිගගහෙත්වා-හැම. 7 A හි පමණකි. 8 අටඩපදවඩපනාදිනි-මු. අ. ක. 9 හෑදවැල වැළඳගෙන A. හැඳ වැලි බැඳගෙන B. හැඳවැළද බැඳගෙන D.

මේ යටගිය දවස; **ලොකාමිසපටිසංයුත්තං,** [1]පස්කම් ගුණෙන් යුත්; **පතිකූලෙඨා,** යටත් හෙවත් ගර්හිතයි; **අසබ්භං,** සභාමැද කියන්නට නුසුදුසුවූ හෙවත් අනුන් නොදැන්විය හැකි-නොහොත් අනුන් නොඇසිය හැකි; **සභාගිරූම්හිත්වා,** වළතා; **එවමෙව,** මෙසේ; **න සම්බජ්ඣන්ති,** නොබැඳෙන්නී යයි හෙවත් මා කීවා නොකරන්නී යයි; **ආකාසෙ නිපතෙනා,** රිදීපව් මුදුනෙහි පිහිටි ස්ඵටිකගුහායෙහි හොත් ශෘගාලයා ආකාශයෙහි හොත්තාසේ පෙනෙන හෙයින් කියා; **පරිගණ්හනපඤ්ඤාය,** විචාරා දන්නා නුවණ හෙවත් පරීක්ෂාකොට දන්නා බුද්ධියක්; **සාති,** සවතියවූ; **සොචෙනති,** ශෝක කරවත්; **අජ්ඣාහරණීයං,** ගිලිය යුත්තක්; **කණ්ඨම්පි,** උගුරද. තෘණසිංහයෝ නම් තණ කන සිවුපාවෝයි. පාණ්ඩුසිංහයෝ නම් පාණ්ඩුවණී සිවුපාවෝයි. කාළසිංහයෝ නම් වලස්සුයි.

## 152. සිගාල ජාතකං.

**මණිසොපානඵලකෙ,** මැණික් පියගැටෙහි නොහොත් මිණිලපුවරුවෙන් කළ පියගැට එව්; **ආලොලෙනෙනා,** අලලන්නේ; [2]**අවෙධිකාං යෙව,** නොවිසඳිය හැක්කේමැයි-නොවිසඳිය හැකි කොට හෝ; **නිබ්බෙධිකාං යෙව වා,** විසඳිය හැක්කේ මැයි-නොහොත් විසඳිය හැකි කොට හෝ; **නිග්ගහෙ වා,** නොදන්නෙහි යයි කියා නිග්‍රහ කිරීමෙහි එව්; **පටිනිග්ගහෙ වා,** නොදන්නෙහි කියා අප්‍රශංසා කිරීමෙහි එව්; **විසෙසෙ වා,** තන්හි තන්හි ඇලුම්කොට පිළිවිස්මෙහි එව්; **පටිවිසෙසෙ වා,** වෙසෙසින් ඇලුම් කොට පිළිවිස්මෙහි එව්; **ඉච්ඡාචාරෙ ඨිතො,** තෘෂ්ණාවිසී බව සිටියේ හෙවත් ලාභසත්කාරවිෂයෙහිවූ තෘෂ්ණා ප්‍රවෘත්තියෙහි පිහිටියේ; **භින්නපදරාය වච්චකුටියං,** බිඳිගිය පුවරු ඇති අත්පස් වළෙක්හි; **විප්පටිසාරිනො,** කළසේ නොයෙදෙයි කියා විපිළිසරබවට පැමිණියාහු; **උබ්බිල්ලාවිතො හුත්වා,** උඩඟු සවරූප ඇතිවූ; **පයොජෙත්වා,** සපඩා කොට-සැහැසිය යු තන්; **යාවදත්ථං,** කැමැති පමණ; [4]**චූලසූකරො,** මහ ඌරෙක්; **අවහයනෙනා,** කැඳවන්නේ; **වාතයොගං,** මෙකල මේ සුළඟ මේ දෙසින් හමයි කියා මෙසේ වාතයොගය; **ලෙසො,** පසාර; **වායසි,** පවත්නෙහි.

## 153. සූකර ජාතකං.

1 මෙතැන් පටන් 119 වෙනි පිටේ 29 පෙළේ 'පැමිණ' යනු දක්වා A හි නොපැනේ. 2 ආවෙධිකායෙවා-මු. අ. ක. 3 නිබ්බෙධිකායෙවා-මු. අ. ක. 4 චූලල සූකරො-මු. අ. කු.

[1]**සෙනානිභණ්ඩන**, සෙනාප්‍රධාන ඇමැත්තන් දෙදෙනකු කළ කලහයක්; [2]**සෙනාපමුඛා**, සෙනායෙහි ප්‍රධානවූ; **කලලචිත්තානං**, නොගිලන්වූ සිත් ඇති බැවි-සමවූ සිත් ඇති බැවිය යු සේයි; **අච්චයං දෙසෙත්වා**, වරද දෙසා හෙවත් ඔවුනොවුන්ගේ වරද ඔවුනොවුන්ගේ සම්මුඛයෙහි කියා දෙසා; **මහාසමජ්ජං**, මහානෘත්‍යමණ්ඩලය; **අංසෙ**, දසරුයෙහි; **නදීපිට්ඨෙන**, ගංපිටින්; [3]**දරථසම්මං**, ග්‍රීෂ්මයෙන් ඇතිවූ කායපීඩා; **මණිකඛන්ධවණ්ණං**, මැණික් කඳක් වැනි සටහන් ඇති. 'පවාළමණිකඛන්ධසණ්ඨානං අත්තභාවං"යි තන්. මෙතැන වණ්ණ ශබ්ද සංස්ථාන කියා 'පත්තස්ස තයො වණ්ණා' යන තැන සෙයින්. **සෙට්ඨවණ්ණං**, උත්තම ගුණ

### 154. උරග ජාතකං.

**අත්තනො ඛිපිතසං**, තමන්වහන්සේ කිවිසි කිවිස්මක්; [4]**උච්චාසද්දමහාසද්දං** යනු උස නැගෙන දසට පැතිරෙන විසින් කියත්. **නාලපන්ති**, 'ජීවථ' යි කිවවුන්ට නැවැත 'ජීවථ'යි නොකියන්නාහ. **ඉට්ඨමඞ්ගලිකා**, මඟුල් තෙපුල් කැමැත්තාහ; **ජීවපටිජීවං නාම**, 'ජීව' යි කීවාහට හෙවත් 'ජීවත්ව' යි කිවාහට නැවැත 'ජීව' යි යන තෙපුල් හෙවත් නැවත 'ජීවත්ව'යි කිම; [5]**මණිභණ්ඩං**, [6]වළලුබඩු; [7]**උක්ඛිපිත්වා**, ගෙන්වාගෙනැ; 'උක්ඛිපාපෙත්වා' යු සේයි; **ඵලකෙ**, ගොනටු පෝරුයෙහි හෙවත් සාලායෙහි ඔනා පිණිස අතුට තුබූ පුවරුයෙහි; **පිට්ඨිවංසථූණාය**, වස්කප නොහොත් වස්යට; **සුඛුමචුණ්ණං**, නාසාවට වන් කල කිවිස්නව තිසිවූ සියුම් සුන්නක්. "යකෙඛා" යනාදි බොධිසත්ත්වයන් පියාණන් කිවිසි කල කිවමනා 'ජීව' යන මේ බස නොඅසා කන්නට යක්ෂයා තික්මුණු බව ගෙනැ කීහු; **සරදසතං ති**, ශරද්ඍතු සියයකුදු; **තමොතමපරායණො**, අඳුරෙන් අඳුරමැ පිහිටකොට ඇති එකක්හු මෙන්

### 155. ගග්ග ජාතකං.

**මංසපෙසිසදිසස්ස** යනු ළද බව ගෙන කීහු; **සඤ්ඤං කත්වා**, සලකුණු කොට; **ගෙහසම්භාරෙ**, ගෘහකරණයට උපකරණවූ දඬුපත්; **පුබ්බං ගණ්හි**, පූයා ගති; **ඔධිං කත්වා**, ඇළි හෙලා හෙවත් හිම්කොට-සිසාරා සම් කපා කුණ ශුද්ධකොට; **රුක්ඛෙ නීහරති**, කැපූ ගස් ගෙනැ හැර මෑත ලන්නේ; **වෙජ්ජවෙතනත්ථාය**, වෙදකමට දෙන කුලී පිණිස හෙවත් මා පයට කළ

1 සෙණිභණ්ඩනං-මූ. අ. කා. සෙනාභණ්ඩනං BCF. 2 සෙණිපමුඛා-මූ.අ.කා. E. 3 දිවාදරථං-මූ. අ. කා. 4 උච්චාසද්දං මහාසද්දං-මූ. අ. කා. C. 5 මණිභණ්ඩං D. 6 වළවළුබඩු BCEF. 7 උක්ඛිපාපෙත්වා-මූ. අ. කා.

පිළියමට මිල පිණිස; **පුරිසාපි**, උත්තම පුරුෂයෝද; **අඩ්ඪසූකඛං**, සමහරක් වියැළි; **ඔතරිත්වා**, මිටිවූ තමන් ඇඟිනුත් සුවඳ පවත්නා හෙයින් 'අපිත් ගන්ධහත්ථිම්හ' යන සංඥාවෙන් නිහීයව බැස; **නාවාසංඝාටෙහි**, හගුලෙන් නොහොත් එක් කොට ඇඳූ නැව් දෙක හෝ නාවාසඞ්ඝාට නම්; **නදිං පක්ඛන්දිත්වා**, නදියට පැන ගී හෙවත් නදීමත්තෙහි ගමන් ගෙනැ; **කිං කාරාපෙන්ති**, අප ලවා කුමක් කරවනු කැමැතිව සිටීදැයි; **පොසාවනියං**, පොෂණය කළවුන්ට මිල; **ඔලොකෙත්වා**, බලා-සමුගෙනැ; **ඔපවය්හං කත්වා**, මඟුලැත් කොට හෙවත් රාජවාහන කොට; **අඞ්ගවිජ්ජාපාඨකා**, අඞ්ගවිජ්ජා දන්නාහු හෙවත් සිරුරු බලා ලකුණු කියන්නාහු; **ලීනං**, පසුබට; **පග්ගණ්හනෙනා**, හුවන්නේ නොහොත් උත්සාහවත් කරන්නේ; [1]**ඔසක්කන්ති**, පසුබසී; **වම්මං**, කවචය; **අවාපුරිත්වා**, විවර කොට; **චතුදෙසාපගතෙන විරියෙන**, උපන් කුසල් නැසීමෙහි අසමර්ථබවය නොඋපන් අකුසල් නොඉපැදවීමෙහි අසමර්ථබවය නොඋපන් කුසල් ඉපැදවීමෙහි අසමර්ථ බවය උපන් කුසල් වඩන බවෙහි අසමර්ථබවය යන චතුර්විධදෙෂයෙන් දුරුවූ "උප්පන්නානං අකුසලානං පහාණාය වායාමො අනුප්පන්නානං අකුසලානං අනුප්පාදය වායාමො අනුප්පන්නානං කුසලානං උප්පාදය වායාමො උප්පන්නානං කුසලානං භිය්‍යොභාවාය වායාමො"යි කියනලද සතර සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන්; **චතූහි යොගෙහි**, කාමයොගය භවයොගය දිට්ඨියොගය අවිජ්ජායොගය යන සතර යොගයන් විසින්; **හෙට්ඨිමමග්ගඵලානි**, යට තුන්මග තුන් ඵලයට; **දසන්නං සංයොජනානං**, කාමරාගසංයොජනය රූපරාගසංයොජනය අරූපරාගසංයොජනය දිට්ඨිසංයොජනය සීලබ්බතපරාමාසසංයොජනය විචිකිච්ඡාසංයොජනය ව්‍යාපාද සංයොජනය අවිජ්ජාසංයොජනය උද්ධච්චසංයොජනය මාන සංයොජනය යන දස සංයොජනයන්ගේ; **නිබ්බානං ආගම්ම**, නිවන් පැමිණ.

## 156. අලීනචිත්ත ජාතකං.

**පරිභොගසීසෙන**, අනුභව වශයෙන්; **විනිපාතෙතුං**, නසන්නට; **මත්තිකාලෙපං**, මැටිපිඩු ආලෙප; **ජනාකර**, ගිනි හල් ගෙය; **යුත්තවසෙන**, උපකාරවැ සිටි හෙයින්ද යෙදෙන හෙයින් යුක්ත වශයෙන්; **මුඛොලොකනිකං**, මුහුණ බලා දෙන පස; [2]**සසඛා**, සහවුන්; [3]**හරිණං**, මුව; **ඔසිදිත්වා**, ගැලී;

1 ඔසක්කන්ති C. 2 සසකා-මූ. අ. ක. 3 හරිණා-මූ. අ. ක.

**ගුණං කරිස්සාමි,** උපකාර කෙරෙම්යි; **මාතිකා,** ඇළ; **විස්සමිත්වා,** සැතපී; **ඔවිජ්ඣිත්වා,** විදපියා හෙවත් ළය පළාපියා; **ඉමං,** මේ ශෘගාලිය. "යස්මා සරණතො භයං ජාතං තස්මා ගමිස්සාම"යි සම්බන්ධ කරනු. **අවමානං,** අනාදර; **අතික්කන්තකාලෙපි,** හික්මුණු කාල්හිදු හෙවත් මළ කාල්හිදු.

## 157. ගුණ ජාතකං.

**කුතූහලෙන,** කුහුලින්-දෙදෙනාගේ කලහය දක්නා මැනැව යන උත්සාහ වශයෙන් යනුයි; **සංසජ්ජිංසු,** එක්වූහු; **සමිංසු,** දැඩිවැ සමගවූහු-සතවැ අතුරු නැත්තා වූහු; **සබ්බට්ඨකා,** සියලු කටයුත්තෙහිමැ අසවලුන් වුව මැනැවැයි කියා මෙසේ කැමැති විය යුතුවූ; **කූටඅස්සො,** කුළු අසෙක්; **අසුබාශමාණො,** එවුනු හා නොකල් සාරන්නේ-නොසතන්නේයැ යුසේයි; **ලෙහනතා,** ලෝනාහු; **වයස්ස,** සබඳ; **ගෙලඤ්ඤං,** ගිලන් බවට; **සමධාතුකා,** සමවූ අදහස් ඇත්තාහ; **නාංගෙශාචරොයෙව,** එම්මැ ගොදුරැකොට ඇතියේ; **අඤ්ඤානං** [උපරි], සෙසු අපුන් මත්තට; **පක්ඛන්දනසීලෙන,** පතනසුලුවූ; **පාගබ්භිය,** බුහුටි බැව්; **එතෙසු-පෙ-සක්ඛිං,** මොවුන් දෙදෙනා කෙරෙන් එක් පාපියක්හු හා සමග; [1]**භූතාමූලෙ,** [2]වූ මිලෙහි හෙවත් ඇති මිලෙහි.

## 158. සුහනු ජාතකං.

**අසමුද්දවිණ්ණා,** නොහැසුරුණු විරූ; **සමුද්දචරිංසු,** සතානතයෙහි ඇසිරුණාහු; **යස,** කීර්ති; **ආයසක්‍යං,** අයසට; **කණ්ණිකාරමකුලවණ්ණා,** කිණිහිරි මල් කැකුළක් වැනි-රන්වන් හෙයින් කිනු. **තිලෙසා පබ්බතරාජියො,** පර්වතවළලුතුනක්; [3]**දණ්ඩකාහිරඤ්ඤද,** දණ්ඩකහිරඤ්ඤද නම්වූ; **බ්‍රහ්මමන්තං බන්ධෙන්තා,** උත්තම මන්ත්‍රය බැඳ නොහොත් උත්තම මන්ත්‍රය බන්ධනය කරන්නේ-ගොදුරැ ගන්නා බිමදී තමාට උපද්‍රව නොවන පිණිස උත්තම මන්ත්‍රයෙන් ආරක්ෂා බඳනේය යනුයි; **සෙට්ඨවිසිට්ඨෙට්ඨෙන,** ශ්‍රෙෂ්ඨාර්ථයෙන්ද විශිෂ්ටාර්ථයෙන්ද නොහොත් ශ්‍රෙෂ්ඨාර්ථයෙන්වූ විශිෂ්ටාර්ථයෙන්; **ගණ්හාති,** [4]දත්හුනුයි; **තිණ්ණං මාරානං,** කාම් කෙලශ දෙවපුත්‍ර යන තුන් මරුන්ගේ; **විමුත්තානං,** කෙලශයන් කෙරෙන් මුක්තයනට නොහොත් ඒ අහිත් ඵල විමුක්තිසමඞ්ගීනට. **තදඞ්ගවිමුත්ති** නම්-තදඞ්ග ප්‍රහාණයෙන් කෙලශයන් කෙරෙන් මුක්තියි. නොහොත් ඒ

---

1 භූතමෙවමූලං-මු·අ.සා. 2 බූ මිලෙසි A. 3 දණ්ඩකො හිරඤ්ඤද, දණ්ඩකීරඤ්ඤද නම්වූ DE. 4 ගත්හුනුයි A.

තදඞ්ග තෙමේම කෙලෙශයන් කෙරෙන් මුක්තියට [1]හේතුවන හෙයින් තදඞ්ගවිමුක්ති නම්. **අක්ඛාතන-පෙ-න සංවරති**, මැඩ ගෙනැ යන තැන තුබූ මළ පය නොහෙන්නේයැ; **මඤ්ජූසාය**, කරඬුයෙහි නොහොත් පෙට්ටගමෙහි; **ජ රාජපරිවට්ටා**, [2]රාජ සපරම්පරායෙක්; **අතනනො**, තමහට; **හත්ථතාළසද්දෙන**, අත්තලගඬින්; **වස්සති**, හඬාද; **පාසයට්ඨිසෙයා** [3]**ඔරොපෙත්වා**, ඉඟිලී මළ ලා; **විසභාගං**, බ්‍රහ්මචර්‍ය්‍යාවට විරුද්ධවූ; **සක්කි**, දෙස්......

## 159. [4]මොර ජාතකං.

**සුසනාලයං**, සුගත්ලිලා; **විනීලකධාතුසාතනා**, මදක් [5]නිල්වූ සවභාව ඇති හෙයින්; **නාලමෙග**, තලගෙක්හි හෙවත් තල්ගසක් මත්තෙහි; **ඉමෙසං වසෙන ගිරිදුග්ගං භජසි**, ඉදින් තෝ මේ වල වසන්නෙහි වී නම් මේ පර්වතයන්ගේ වශයෙන් නොඑක් නොඑක් පර්වතයෙන් විෂමවූ මේ ස්ථානය භජනය කරන්නෙහි-දුර්ගස්ථාන හෙයින් තා වසන්නට මේ නුසුදුසුය යනුයි......

## 160. විනීලක ජාතකං.

## පඨමො වග්ගො.

**අඟ්ගදක්ඛිණ**[6]**වාහනෙන**, ආදි දකුණු [7]මෙරෙහි හෙවත් අක්කරවූයෙහි [සුළඟින්]; **පගිනනමද්දෙ ගුත්ථා**, වැහෙන මද ඇතිවැ; **පාසාණඵලකං**, හිඳිනා ගල්[8]ලැහැල්ල; **බිළිම්බා**, [9]තනා හෙවත් [10]වල දමා; **ආලම්බනඵලකං**, වැතිර හිඳිනා පොහොරුව; **ලුඤ්චිත්වා**, සුනුවිසුනු කොට කඩා දමා; **සොණ්ඩාය පරාමසිත්වා**, අතින් ගෙනැ; **කාපුරිසෙහි**, කුත්සිත පුරුෂයන් හා; **තණ්හාසන්ථවං**, තෘෂ්ණායෙන් කරන විශ්වාස හෙවත් කාමරාගයෙන් කරන [11]විසඹ; **ආචාරඅරියො** යනුයෙහි ආචාර ආර්‍ය්‍යයෝ නම් යහපත්වූ ආචාර ඇත්තාහුයි. **ලිඞ්ග අරියො** යනුයෙහි ලිඞ්ග ආර්‍ය්‍යයෝ නම් තපස්වී ලිඞ්ග ඇත්තාහුයි. [12]**සීලඅරියො** යනුයෙහි ශීලාර්‍ය්‍යයෝ නම් යහපත්වූ සිල් ඇත්තාහුයි. **දස්සනඅරියො** යනුයෙහි දර්‍ශන ආර්‍ය්‍යයෝ නම් දක්මෙන් අරීහුයි හෙවත් විශෙෂවූ රූ ඇත්තාහුයි. **පටිවෙධ**

---

1 යන බැවින් A. 2 රැජපරම්පරා සනයක් A. 3 ඔරොපෙත්වා-මු. අ. ක. A. 4 මයුර ජාතකං A. 5 නිල්පැහැ ඇති බැවින් A, 6 මාරුතෙන A. 7 මෙරුණයෙන් A. මෙරයෙහි CF. 8 ලෑහැල්ල A. ලෑල්ල BF. ලෑල්ල CD. 9 දමා A. 10 වළ B. 11 විශ්වාස BF. විසම CD. 12 මුද්‍රිත අට්ඨකථාහි නොපැනේ.

**අපිණො** යනුයෙහි ප්‍රතිවෙධාර්ථීයෝ නම් මාර්ගඵලාධිගම කළාහුයි. **යමෙනවව පුග්ගලං**, 'යං එව තු පුග්ගලං' යි තන්—

### 161. ඉන්දසමානගොත්ත ජාතකං.

[1]**අග්ගිජ්ජුහනං**, ගිනිපිදීමක්; [2]**පොතෙඨවා**, [3]**සපා**; **බහුසිනෙහෙ**, බොහෝ තෙල් ඇති; **අවලිඛි**, ගිනිසිළින්; [4]**සාමං මිගිං**, රන්වන් මුවදෙන්. 'සුවණ්ණසාමං' යු තැන්-හෙළලු මුවයෙත් මෙ; **ලෙහනතිං**, ලෙව්තිය—

### 162 සන්ථව ජාතකං.

**ජඤ්ඤදනං**, ජඤ්ඤයෙන් දෙන දන්; **විපිසඟාගෙන**, විපි කොටසින්; **ජඤ්ඤං සංහරිත්වා**, [5]අදහස් ගැන-එක් අදහස්වැ යු තැන්; **අඤ්ඤතිත්ථියා**, නානා ලබ්ධි ඇත්තෝ; [6]**යං බහුලං කාරිස්සාමාති**, යමක් බහුල කරම්හයි-දෙපක්ෂයක් කොට තෝරාපියා එයින් යම් තැනකට දෙම්හයි කියාය යු තැන්; [7]**සම්බහුලතාය කතාය**, යථොක්ත ක්‍රමයෙන් සම්බහුලත්වය කළ කල්හි. 'සම්බහුලං' යනුත් පාඨයි. අර්ථ මෙතෙක් මැයි. **හත්ථිමඞ්ගලඡණො**, ඇතුන්ට මගුල් කිරීම් වශයෙන් පවත්නා උත්සවය; **හත්ථිසුත්තං**, ඇත්සුතුරු-ඇත්වේදය යු තැන්; **ඔසක්කිස්සති**, තස්නේය; **අවචාසිකාතති**, ඉක්මනැයි; **එකොනෙව** [8]**උද්දේසමත්තෙන**, එක උද්දේසමාත්‍රයෙන්මැ හෙවත් එකවට කී මාත්‍රයෙන්මැ; [9]**සබ්බං**, සියලු අර්ථපාඨයි; **පරියන්තිං**, පෙළ; **පට්ඨපෙත්වා**, හදුරා නොහොත් හදුරන්නට පටන් ගෙනැ; **පදං පච්චාගට්ඨං**, පද පෙරළිය නොහොත් පද පෙරළාලීයේ; **සජ්ඣායමූළ්හට්ඨානං**, හැදෑරීමට මුළාවන තැන්-පෙළ හුණු තැන්-නොහොත් අර්ථ නුදුටු තැන්-[10]සජ්ඣායනය කිරීමෙන් නොදත හැකිවූ අර්ථ ඇතිවැ මුසුවැ තිබෙන තැන්; **ආචිණ්ණං**, සිරිත්—

### 163. සුසීම ජාතකං.

**මා උජ්ඣායිත්ථ**, නගමක් කිපෙව්; **ගිජ්ඣයොනියං**, ගිජු ළිහිණි ජාතියෙහි; [11]**අනොවස්සකට්ඨානෙ**, නොතෙමෙන තැනෙක්හි; **ගොසුසානං**, මළ ගෙරි අදනා තැනකට; **කාලල**

1 අගනිදූහනං-හැම. 2 ඨපෙත්වා B. ඔජෙත්වා C. ඔඨෙත්වා DF. 3 සමා BCDF. 4 සාමාමිගිං-මු. අ. කා. 5 එක අදහසට A. 6 සම්බහුලං-මු. අ. කා: 7 සම්බහුලාය කථාය-මු. අ. කා. 8 උද්දෙසමගෙගත-මු. අ. කා. 9 සබ්බ-හැම. 10 අජ්ඣායනය A. සජ්ඣායනය CD. 11 අනොවස්සකට්ඨානෙ ABF. අනොවස්සට්ඨානෙ-මු. අ. කා.

**සරීරා**, සවසථවූ ශරීර ඇත්තාහු; **සෙනා විය**, උකුස්සන් සේ; **ආකාසඞ්ගණෙ**, දෙර නොහොත් සඳල්ලෙහි—

## 164. ගිජ්ඣ ජාතකං.

**සෙණිභණ්ඩනං**, සෙනඟ නියුකතයන්ගේ ඔබර; **උඤ්ඡාචරියාය**, හැවිලිලි එලාඑල සෙවීමෙන්-ඇවිලිලි එලාඑල සොයා අනුභව කිරීමෙන්ය යනුයි; **නකුලො**, මුගටියෙක්; **රුක්ඛජාලෙ**, රුක්මුල් වදුලෙක්හි. **රුක්ඛබිලෙ** යනුත් පාඨයි-රුක් සිදුරෙහිය යන අර්ථයි. **න අවජානිතබ්බො**, මේ කුමක් කොට ගත හෙයිද්දැයි නොම හීනකොට දක්ක යුතුයි; **සමුප්පන්නං භයං**, උපන්නාවූ භය තෙමේ; **මිත්තස්ස**, මිත්‍රයාගේ; **සබ්බරන්ධානං**, සියලු සිදුරු-දෙෂයයි සේයි; **මූලඝච්චාය**, මුලින්ම විනාශය පිණිස හෙවත් ජීවිත විනාශය පිණිස—

## 165. නකුල ජාතකං.

**සුසානාසුද්ධිකං**, අනුන් නොදූවූ තැනක් වුවමැනැවැයි කියා [1]මෙසේ සොහොන් ශුද්ධි කැමැති; **දිට්ඨිගතිකානා**, දෘෂ්ටි පිහිටකොට ඇති බැවින්; **ධුරවිහාරෙ**, ආසන්න විහාර යෙහි; **අඤ්ඤස්ස වසලස්ස**, අතික් චණ්ඩාලයක්හු හෙවත් අතික් හීන සත්වයක්හු-තමා මුත් සෙස්සවුන් මුළුල්ල හීන කොට ගෙන කියා; **අනුච්ඡිට්ඨ**, නොඉඳුල්-නොදූවූ තැනය යු සේයි; **බොධෙය්‍යබන්ධෙව**, දූමියයුතු නැයත්; **සිඝානං අනිවෙසිතට්ඨානං වා**, මිනීඉස් නොතුබූ තැනෙක් වේවයි; **උපසාළහකනාමානං**, උපසාළහකය යන නම් ඇති-නොහොත් උපසාළකහය යන නම් ඇති ආත්මභාවයන් සම්බන්ධිවූ; **සහස්සානි චතුද්දස**, තුදුස් දහසක් දෙනා; **මතට්ඨානං**, මළ තැන; **උපචාරවචනෙන**, පියෙස්හි **මරණ**[2]වොහරින්; [3]**මතානන්ති වුච්චති**, 'මත' යයි කියනු ලැබේ. 'උපචාරවසෙන' යනුත් පාඨයි— [4]මළේ යි කියා ගැන්මෙන් නොහොත් මෙළේ නම් වෙයි සිතා ගැන්මෙන්; **චතුසච්චවත්ථුකං**, සිවුසස් වස්තු කොට ඇති; **පුබ්බභාග**, පූර්වභාගවූ; [5]**සච්චඤාණං**, [6]සත්‍යඥානයද හෙවත් විදර්ශනාඥානයද—

## 166. උපසාළහක ජාතකං.

1 වෙනහසා ගොසින් සුද්ධි කැමැති A. අනුමෂ්ඨ මෙසේ බොහෝ සුද්ධි කැමැති BCDF. 2 පෙරහරින් A. 3 අමතානති-මු. අ: ක. 4 නොමළේයයි ABCDF. 5 සත්‍යඤාණං BCDF. 6 සච්චඤාණයද A.

**තපොදරාමෙ**, හුණුදිය අරම්හි; **අනන්තරවාසකං**, හඳ නාව; **උත්තරාසඞ්ගං**, පොරෝනාව; **සුපරිකම්මකතා**, මනා කොට නිමවන ලද්දවූ; [1]**සුකුමාල**, සිවුමැළි; **කාසිගාමකෙ**, කසීරට ගමෙක්හි; **වක්කලං**, වල්කලා; **සරීරං වොදකං කරොන්තො**, සිරුරෙහි දිය සිඳුනේ; **ජීවිතං**, මෙතෙක් කල් පවත් මියි නොදත හැකි හෙයින් ජීවත්වන කලද; **ව්‍යාධිකාලො ච**, අසෝ පූර්වාහ්නාදියෙහි [අසෝ ව්‍යාධියෙන්] සත්ව මියෙයි කියා නොදත හැකි හෙයින් ව්‍යාධියද කාලයද; **දෙහනික්ඛෙපනං**, මෘතශරීරයාගේ නික්ෂෙපණස්ථානයද හෙවත් දමන දවන තැන්ද; **ගති**, අසෝ දිව්‍යගතියෙහි උත්පත්තිය වෙයි අසෝ මනුෂ්‍ය ගතියෙහි උත්පත්තිය වෙයි කියා නොදත හැකි හෙයින් ඉපැද්ද යුතු ගතියද; **අනිමිත්තා**, සලකුණක් නැත්තාහ හෙවත් හිමක් නැත්තාහ; **කාලෙ**, පූර්වාහ්නාදි කාලයෙහි වේවයි; **එස කාලො ජහෙන්තා**, මේ මියන්ට නිසි කල ප්‍රවජ්‍යාය-නොපැනෙයි යතුයි.

## 167. සමිද්ධි ජාතකං.

**අත්තජ්ඣාසයං**, තමන් වහන්සේගේ අදහසින්මැ දෙසූ; **ගොචරෙ**, කායගතාසති සඞ්ඛ්‍යාත ගොචරස්ථානයෙහි; **අගොචරෙ**, අගොචරස්ථානයෙහි-අවිෂය ස්ථානයෙහිය යූ තැන්; [2]**ලාපසකුණයොනියං**, [3]ලඹවටු පක්ෂි යොන්හි නොහොත් කැටකිරිලි යොන්හි-ගොමවැරැටි ලිහිණියෝය යෙත් මේ; **නඞ්ගලකට්ඨකරණෙ**, සාට තැන්හි; **ලෙඩ්ඩුට්ඨානෙ**, කැට ඇති තැන-කැට අතුරේ එව්; **සකුණග්ඝි**, ලිහිණිදෙර නම් පක්ෂි. 'සකුණෙ හනතීති-සකුණග්ඝි' යතුවේ-නොහොත් පියා හුස්සෝයි-උකුසු, දියවවුල් එව්. **අජ්ඣප්පත්තා**, පැමිණ; **අලක්ඛිකා**, ශ්‍රීනැත්තමූ; **පෙත්තිකෙ**, පියන් සතු; **විසයෙ**, අප විෂයවූ ගොචරස්ථානයෙහි; **සකෙ බලෙ** [4]**අපස්සද්ධා**, තා කොයි ගියත් මම් අල්වා ගන්ට පොහොසත්මියි කියා මෙසේ සවකීයවූ තමාගේ ශක්තියෙහි පිහිටියේ නොනොත් දෘඪවූයේ; **උභො පක්ඛෙ සණ්ඨාය**, දෙපියාය හිඳුවාගෙනැ හෙවත් පහරාගෙනැ; **අජ්ඣප්පත්තො**, හවුත් වතු; **යදා-පෙ-අක්කන්දසි**, යම් කලෙක්හි කැට කුරුළු මේ සකුණග්ඝික තෙම මා කරා ආසන්නව ආයයි ඔහු දත්ද; **පච්චාපාදි**, අවුත් වනි; **උරං පච්චතාලෙසි**, ළය ගැසී හෙවත් ළය තළා ගති; **තෙන කාරණෙන**, ආදි කැට කුරුල්ලා ගෙන හැරපියා නැවත ගනිම් කියා

1 සුසුකාල-මු. අ. ක. 2 ලාපසකුණ BCDF. 3 ලවවටු A. ලාඹවටු CDF. 4 පසද්දධ A.

විනාශයට ගිය හෙයින්ය යනුයි; **අපෙතසත්තු**, පහවූ සතුරන් ඇත්තෙම්.

### 168. සකුණග්ඝි ජාතකං.

---

**ආසෙවිතාය**, සෙවුනාලද; **බහුලීකතාය**, බහුල කරන ලද-නැවැත නැවැත වඩන ලදය යු තත්; **යානීකතාය**, යුක්ත යානාවක් මෙන් කරන ලද; **වත්ථුකතාය**, පිහිට කරන ලද; **අනුට්ඨිතාය**, අනුව සිටිනා ලද; **පරිචිතාය**, පුරුදු කරනලද; **සුසමාරද්ධාය**, [1]මොනොවට ආරම්භ කරන ලද හෙවත් [1]මොනොවට පටන් ගන්නා ලද; **මෙත්තාය චෙතොවිමුත්තියා**, මෛත්‍රීධ්‍යානයාගේ නොහොත් මෛත්‍රීචෙතොවිමුක්තියගේ. මෛත්‍රීධ්‍යානය නීවරණයන් කෙරෙන් විමුක්ත හෙයින් චෙතොවිමුත්ති නම්. **පාටිකඞ්ඛා**, පැසැස්ස යුත්තාහුයි; **න කමති**, නොවදී හෙවත් නොපැමිණේ-ඔහු ඇඟ නොගන්නී යී තැන්; **තුවටං**, වහාමැ; **උත්තරිං අප්පටිවිජ්ඣන්තො**, අභීත්ඵල ප්‍රතිවෙධ නොකටහෙතුයේ; **ඔදිස්සකඅනොදිස්සකවසෙන**, උදෙසත නොඋදෙසත විසින්. **ඔදිස්සක** නම් හිම් තබනු; **අනොදිස්සක** නම් හිම් නොතබනු. **සංවට්ටකප්ප** නම් නස්නා භාගයයි හෙවත් කප නස්නා කාලයයි. හෙද මහාකප සතර භාගයකින් එක්භාගයක් [2]කට්ටලයැ. **විවට්ටකප්ප** නම් හටගන්නා භාගයයි හෙවත් කප හටගන්නා කාලයයි. හෙද මහාකප සතර භාගයෙන් එක්භාගයක් කට්ටලයයි. එසේවූ සංවට්ට විවට්ට කප් දෙකක්ය යු තැන්. **අරකො නාම සත්ථා ශුඬවා**, අරක නම් ශාස්තෘවැ; **හිතං චිත්තං**, හිතවූ යම් චිත්තයෙක් ඇද්ද හෙවත් රූපාවචර කර්මයෙක් ඇද්ද; [3]**තත්ථ**, එහි; **උස්සදෙ**, සොළොස් ඔසුපත් නරකයෙහිද; **අවෙරා**, ද්වෙෂ නැත්තාහු; **අබ්‍යාපජ්ඣා**, දෞර්මනස් නැත්තාහු; **අනීඝා**, කායික දුක් නැත්තාහු; **පරිහරන්තු**, පවත්වනලද්‍ද වෙත්වා; **අසංහීරමානං**, කම්පා නොකරනලදුවැ [නාවසිස්සති] නොතිබෙනු වූයේ.

### 169. අරක ජාතකං.

---

### 170. කකණ්ටක ජාතකං.

---

## දුතියො වග්ගො.

---

1 මොනවට B. 2 කාලය BF. තත්‍ර-මු. අ. ක.

**බධිරසස්සුං**, බිහිරි නැන්දනා; [1]**සස්සු**, නැදි; [1]**බධිරධාතුකා**, බිහිරි සවභාව ඇත්තී; **භත්තසම්මදං**, භක්තාලස්‍යය; **ජාමාතා**, බෑනෝ; [2]**නගරං** යනු නුවර වෙතට යයි සේයි; **විරාමෙථතුං**, වරදත්තට-නසන්නට; **සුන්දරධම්මො**, ප්‍රව්‍රජ්‍යාධමී; **ධුරං**, පිළිවෙත් ධුර.

## 171. කල්‍යාණධම්ම ජාතකං.

**පදභාණං**, පෙළ පිරවීම්-උසුරුවන බණ; **භණන්ති**, පිරිවන්නාහ; [3]**අත්තනො** [4]**තුච්ඡභාවං**, තමා සිස්වූ සැළක් වැනි බව; [5]**කණවකකරණ්ඩකවණ්ණං**, කටුකරඬුමල පැහැ වැනි; **සාරජ්ජං**, ශරීර කම්පාවට-පිරිස්බිරු බඳු එව්; **ඔක්කමි**, වනී; **උදාහරිත්වා**, කියා; **න පස්සි**, සඳහන් නොකෙළේ; **අපක්කම්ම**, පහවැ.

## 172. දද්දර ජාතකං.

**ආධාවිත්වා පරිධාවිත්වා**, ඉදුරා දිව-වටකොට දිව; **විසීවෙන්තා**, තප්නේ; [6]**සඞ්කුපිතො**, හැකුලුණේ; **වවස්සග්ගත්ථෙ නිපාතො**, නිශ්චයාර්ථයෙහි නිපාතයි; **උම්මුක්කං**, පෙනෙහෙලි.

## 173. මක්කට ජාතකං.

[7]**වත්තනිමහාමග්ගෙ**, අටවි මහමඟෙක්හි; **උදපානෙ**, පැන් වළෙක්; **වාරකෙන**, කෙණ්ඩියෙන්; **දොණියා**, කොටුයෙහි; [8]**උක්කාපෙත්වා**, නඟා; **ආකිරිත්වා**, එව-හිස හෝ; **මුඛමක්කටිකං**, මුනුණු හකුලුවා දත වැර කරන විකාර; **කිකිකන්ති සද්දං**, 'කිකි' යන අනුකරණ හඬ; **ඌහච්ච**, කිලුටු කොට-සිරුරු [9]මල විහිද.

## 174. [10]දුභියමක්කට ජාතකං.

**උත්තිණානි**, විහිඳූ තණ ඇත්තවුන්; **තපචරණං චරන්තො විය**, තපස් කරන්නක්හු මෙන්; **අඩක්ඛුසම්ං**, නොපැහැදිය යුතු තන්හි; **ඌහනනං**, [11]වතීස් කොට නසන ලද.

## 175. ආදිච්චුපට්ඨාන ජාතකං.

**වස්සානෙ යෙව**, වහරේ කල්හිමැ; **කන්දර**, මහකඳුරු; **පදරාදයො**, කුඩු කඳුරැලි [12]පැන් කෙම් ආ; **සමපරායිකෙන**,

1 මේ පාඨද්වය හා අප හැම පුස්කොළ පොත්වලම නියුක්ත ජාතකයෙහි වැටී තිබේ. 2 තට යනු වරබතටයයි සේයි-හැම. 3 මේ පාඨය හා අප්‍රය A හි පමණකි. 4 තුච්ඡකුච්ඡිභාවං-මු. අ. ක. 5 කණව කුරණ්ඩක-මු. අ. ක. කරණ්ඩක, රන්කරඬු BCDF. 6 සඞ්කුචිතො A. 7 මේ ජාතකයට අයත් පාඨ හෝ අප A හි නොපැනේ. 8 උක්කාමෙත්වා-මු. අ. ක. 9 හඬ-හැම. 10 දුබ්භිය මක්කට ජාතකං-මු. අ. ක. මක්කටජාතකං A. 11 වතීෂ්‍යකොට A. 12 කෙම් ආදියෙන් පැළී විවරවූ BCDF.

[1]පරලෝ වැඩින්ද; [2]දිට්ඨධම්මිකෙන, මෙලෝ වැඩින්ද; [3]අබහුගගවජ්ජමානා, යුද්ධයට යන්නාහු; කලාය, මුං-සැණ හෝ; කළු මෑ හෝ; සෙදෙඩා, හුයා; කාළරාජමාස, කළු මහ මෑ; බහුං හායාම, බොහෝ අර්ථයෙන් පිරිහෙම්හ; අවකිරිත්වා, [4]විසුරුවා. "කිර-වික්ඛෙපණෙ"

## 176. කලායමුට්ඨි ජාතකං.

**වසති**, ගම වෙසෙයි; [5]**උබ්බසති**, වල වෙසෙයි; **තින්ඩුක රුක්ඛො**, තිඹිරිරුකෙක්; [6]**උබ්බසිතකාලෙ**, මිනිසුන් [7]ගම නොවසන කල්හි; **ඵලවාරෙ**, ඵල ගත් කල; **නළපරික්ඛිත්තො**, රතහුණින් පරික්ඛිත්ත වූයේ; **ගාළ්හවාසභාවං**, ඝනවූ මනුෂ්‍ය වාස ඇති බව; [8]**පටිසල්ලානවෙලාය**, කාබී හැපුණු වේලෙහි; **කලාප**, හියවුරු; **ආකඩ්ඪනපරිකඩ්ඪනවසෙන**, ඉදිරියට පස්සට ඇදීම් විසින්; **පරියන්තගෙහෙ**, කෙළවර ගෙහි; **උම්මුක්කං**, ගිනිපෙනෙහෙල්ලක්; **පදීපෙසි**, හැවිලවී.

## 177. තින්ඩුක ජාතකං.

**අභිවාතකරොගො**, අභිවාතක නම් රෝගයෙක්; **අස්සුම්හ**, ඇසුම්හ; **උපභොගවසෙන**, අනුභව වශයෙන්.

## 178. කච්ඡප ජාතකං.

**අනෙසනං**, නුසුදුසු එක්විසි අනෙෂණයෙන් ප්‍රත්‍යය සෙවීම. "කුච්ජිතා එසනා-අනෙසනා' හේ මෙසේයි: **වෙජ්ජකම්මෙන**, වෛද්‍යකම්යෙන්; **දූතකම්ම**, ගමින් ගමට යන දූතකමී; **පහෙණගමන**, ගමින් ගමට යන ගමන්; **ජඞ්ඝපෙසනිය**, ගෙන් ගෙට අසුන් ගෙන යාම්; **පිණ්ඩපතිපිණ්ඩ**, මඳක් දී බොහොවක් ගන්නා බව; **ධුරගොණා යුත්වා**, විය අදනා ගොන්වැ; **අත්තජ්ඣාසයං**, තමාගේ අදහසින් උපන්; **සකපටිභානං**, තමහට වැටහීමෙන් වූ; **හාසො වා**, ප්‍රීතියෙක්-හාසයෙක් වේවයි; **සොමනස්සං වා**, සොම්නසෙක් වේවයි; [9]**පාථෙය්‍යතණ්ඩුලෙන**, මගට සාලින්; **ජාතපක්ඛකෙනා**, සාහද අත් ඇති [10]**සතධම්මා**; සියක් ජනා අදනා දූනු අදනේ; **බුද්ධපතිකුට්ඨාය**, බුදුන් විසින් ගරහනලද.

## 179. සතධම්ම ජාතකං

1 පරලෙවසි BF. 2 A හි පමණකි. 3 අබහුගගවජ්ජමානාය-මු. අ. ක. 4 විකිරිවා BCDF. 5 උපවසති BCDF 6 ඔවසිතකාලෙ BCDF. 7 හැම BCDF. 8 පටිසල්ලීන BCDF. පතිසල්ලීන A. 9 පාථෙය්‍යතණ්ඩුලෙ-මු. අ. ක 10 සතධනවා BCDEF.

**ඡන්දකං සංහරිත්වා**, එක්සිත්ව ගෙනැ.....

## 180. දුද්දද ජාතකං.

---

# තතියො වග්ගො.

---

**ඉස්සාසසිප්පෙ**, ධනුශ්ශිල්පයෙහි. 'ඉසුං අසති ඛිපතීති-ඉස්සාසො-ධනුග්ගහො, තස්ස සිප්පං-ධනුබ්බෙදෙ". **රාජපාදමූලිකා**, රාජසෙවකයෝ; **අප්පච්චයො**, වැඩ කැමැත්තෝ; **අම්බපිණ්ඩිං**, අඹකැණක්; **නිවාසනන්තරෙ**, පිළීඅතුරේ-හිණයයි සේයි; **සන්නය්හිත්වා**, සහවා; **කච්ඡං බන්ධිත්වා**, කැස බැඳ-[1]එක්පටුව ගොතා; **පසිබ්බකතො**, බුලත් පසියෙන්; **සුවණ්ණකඤ්චුකං**, රන්වන් ඇඟි-රන් සැට්ටයයි සේයි, [2]**ආවාපනාළිං**, හියවුරු; **මෙණ්ඩකධනුං**, මැඩහගුදුන්න; **උණ්හීසං**, හිස්වෙළුම-තොප්පිය. තලල්පට යෙත් මැයි; **ඛුරප්පං**, හීය; **ආරොහණං**, නැගෙන; **ඔරොහණං**, බස්නා; **වණ්ටං**, නැට්ය; **කන්තමානං**, කපමින්; **ඔධියකෙඤ්ඤෙව පතිත්වා**, තුබූ අවධියෙහි-කැප්පූ සන්ධියෙහිමැ හී; **පුඞ්ඛෙ පහරිත්වා**, පගලියේ-දත්තේ-පැහැරැ; **අඞ්ගුලියො විධූනන්ති**, ඇඟිලි පෙළා-අසුරු ගසා; සාමන්ත රජ්ජු නම් ප්‍රධාන රජහුගේ [3]සේවා රජහුයි; **කඤ්චනපාතිමකුලෙ**, රන්තලි කැකුළෙහි; **අවිරාධිතවෙධී**, නොවරදවා විදිනෝ; **චම්මකායො**, සම්සමූහය; **අසනපදරං**, පියාපෝරු; **අතිපාතෙති**, විදනහා.....

## 181. අසදිස ජාතකං.

---

**අඞ්ගුලිබ්බෙතති**, සමහරක් පැණ ගැහූ; **තුවටං ගො**, වගාමැ; **ධමනිසන්ථත**, නහරවැල් පතළ; [4]**ඛාමකොබ්බෙතන**, දුවූ සේනෙහි; [5]**ජවිමත්තපළිගුණ්ඨිතං**, [6]සිවිසම් මතුයෙන් වසන ලද; **සුට්ඨු පච්චක්ඛං කාරොති**, මනාකොට සලකා; **අඩ්ඪතියකොපි**, අඩුතුන් කෙළක්; **කකුටපාද**, පරෙවියන් පය පැහැ බඳු රත්පතුල් ඇති. **පලුට්ඨමස්සකාපි**, පුලූටු වෙරලොම් වැදිරි; **පාපිහොගො**, ඇපය; **කිං නානාකරණං**, කවර තොර තුරු; **නිමෙතනජං අකාසි**, ඇලුම් මද කෙළේ; **පටිස්සවං**, ඇප; **ගොපුර**, දෙරටු; **සපත්තරාජා**, සතුරු රජු; **උණ්හකල්ලා** දිනි, හුණු මල ආදි; **පහරණානි**, ආයුධ; **පටික්කාමි**, පහවී;

---

1 එක් පටුව ඇදැයි සේයි A. 2 චාපනාළිං-මු. අ. ක. 3 භේවා CD. 4 ඛාමබෙතන.-මු. අ. ක. 5 චම්මමත්තං-ලොහිත පළිකුණ්ඨිතං-මු. අ. ක. ජවිතච මත්ත පළිගුණ්ඨිතං A. 6 සැව A. 7 කොටුම් A.

පවත්තසම්පහාරං, ලත ආයුධ [1]කොටුම් ඇති; පිට්ඨසඞ්ඝාතෙ, දෙරබා; එසිකාකූටමෙහ, වාසල් දෙර [2]හිඳුවූ හිඳි වසත වැඹ; අභිපිත්තකානි විය, නයි සතු කැකුල් මෙන්; පලිඝං, හිදි; ඔසාදෙත්වා, මැඩ.

## 182. සඞ්ගාමාවචර ජාතකං.

විසාසාදෙ, තා ගල හිසවත් කත කටුවන්; චුල්ලුපට්ඨාකා, [3]සිරිපිල්ලයෝ; අප්පනිඝෝසා, මඳ ගුගුම් හඬ ඇති; පතිසල්ලානමනුයුඤ්ජන්ති, විවෙකයෙහි යෙදෙත්; සන්නිසින්නා, සන්හුන්නාහු; සම්පාපෙත්වා, සදවා; අලලරසං, සවරසවූ; මුද්දිකපානං, මිදුපැනු; ගන්ධපානං, ජාතිරස පැනු; බහුකසටං, බොහෝ [4]වසලු; [5]මහාවිපිලොතිකාහි, තියඳින් කළ සේල කඩින්; න උපලවන්ති, නොඉල්පෙති.

## 183. වාලොදක ජාතකං.

අස්සබන්ධා, අස්ගොවු තෙමේ; මුඛරජ්ජුකෙ, මූවපාවලල් ලෙහි; සිඞ්ගාරභාවං, සැරහුම්-අජරසිරින් යුත් බැව්; ආනෙන, මූවරැහැණ.

## 184. ගිරිදත්ත ජාතකං.

ආවිලචිත්තො, කැලති සිතැත්තේ; නප්පටිභංසු, නොවැටහුණාහු; පගුණා, පුහුණුයි; [6]පිට්ඨාචරියො, පිටඇදුරු-ඇදුරා ඉක්බිති; අප්පටිභානං නාම, නොවැටහුම් නම්; සිප්පි සක්ඛච, කවඩි බොල්ලන්ද; සම්බුසක්ඛච, රන්වන් බොල් ලන්ද.

## 185. අනභිරති ජාතකං.

දණ්ඩපවෙසනවසෙන යත තැන දඹුහොස්සේ හිඳුවූ පොරොව හා සරස්හි හිඳුවූ [7]වැය හා කියත්; පහංසිත්වා, පැහැස; තලෙ, [8]ඇසහි; [9]ආවජ්ජයාථ, යොමුකරව-තමා පියවයි සේයි; චරන්තො [10]හැසිරෙන්නේ; මණිඛන්ධං, මිණි කඳක්-මහාමැණිකොකැයි සේයි; ජලකරණ්ඩකෙ, [11]සීතැසි දූල්මඩයෙහි; පරිමණ්ඩලං, වට වූවා; මණ්ඩූකකණ්ටකෙන,

1 ඇටුම් BCDEF. 2 හිදුවා-හැම 3 සිරිජ්පිළලයෝ AE. සිරිග්පිල්ලයෝ C. 4 කොටසලු C. 5 මකබපිලොහිකාහි-මු. අ. සා. 6 පිට්ඨිආචරියො-මු.අ. සා. 7 වඩාය BCF. 8 අත්ගි A. අස්ඞි BF. අසහි E. 9 ආවජෙජසසථ-මු. අ. සා. 10 කරන්නේ A. කරන්නේ හැසිරෙන්නේ BCD. 11 සීතැයි BCEF.

මඤ්චකටුයෙන්; **න සම්පජ්ජති**, නොතැගේ; [1]**ඵග්ගවවලලි**, කිඳි හෝ අඟුළු වැල්; **ඛඛකාරෙන** කාරා—

### 186. දධිවාහන ජාතකං

**අක්ඛරසෙට්ඨා**, ශබ්දඥී—

### 187. [2]චතුමට්ඨ ජාතකං

[3]**සිගාලිකං** [නාදං], කැණහිල් හඬ; **පෙත්තනිකො**, පියා සතු; **න උස්සහි**, නොපොහොසති—

### 188. සීහකොත්ථුක ජාතකං

**සරභඤ්ඤං**, හඬ විහිද–ව්‍යක්තකොට කියන බණ; **කොත්ථුක කුලෙ**, ගොව්කුලෙහි; [4]**ගද්‍රභහාරකෙන**, ගඩබුවන් පිටින් උසුල්වා—

### 189. සීහචම්ම ජාතකං.

**චෙමජ්ඣං ගතකාලෙ**, මැදට ගිය කල; **නහාපිතකුටුම්බිකෙන**, නැහැකෙළෙඹියකු හා; [5]**ලකාර**, රුවල්; **පදරානි**, පුවරු—

### 190. සීලානිසංස ජාතකං.

## චතුත්ථො වග්ගො.

[6]**ජිණතිකා**, විළි තැත්තී; **ධුතනිකඩාතුකා**, කෙළිපියෝ ඇත්තී; **නට්ඨසඤ්ඤී හුත්වා**, සැබැවැයි හැඟී; **පිතනං නෙ** [7]**උග්ගතං**, තා පිත් කිපියේද; 'තායමනි' කී තැන 'අමනි' යනු "ලජ්ජා පිතොමනි" යි යොදනු. **මරුවවාකෙසු**, මරුවා වැහැරි–තිය දින් කළද; **ජියාකාරකෙසු**, දුනුදිය [8]වටන්නවුන්; **ජිතතාග**, නිලීජ්ජිවූ—

### 191. රුහක ජාතකං.

### 192. සිරිකාලකණ්ණි ජාතකං.

**දක්ඛිණාජතුං**, දකුණු දසරුම; **රොදිත්වා**, හඬා–කඳුළු බහා; **ඛජ්ජිත්වා**, වැලප–වැතිර හඬා; **ඵලාඵලං**–ඵල නම් ක්ෂුද්‍ර ඵලයි. **අඵල** නම් මහාඵල–තල් ආදි. 'අසෙබා' යන තැන් සෙ සින් අකාර වෘද්ධ්‍යර්ථයෙහි. **ගඬගානිවත්තනෙ**, හෝවක්හි;

---

1 ඵගගවලලියො-මූ. අ. ක. ඵලලවලලි A. ඵගගුවලලි E. 2 චතුමට්ට ජාතකං ABCEF. 3 සෙගාලිකං නාදං-මූ අ. ක. 4 ගද්‍රභහාරකෙන-මූ. අ. ක. 5 මූ. අ. ක. යි නොආයේයි. 6 ගිතතිකා A. 7 කුපිතං-මූ.අ. ක. 8 යොදන්නවුන් A.

[1]**අම්මණෙ**, හොරුවෙක්හි; **පව්‍යාහෙසුං**, ගැවූහු; **අට්ටස්සරං**, බැගෑහඬ; **කාරුණ්‍ණං** [2]**පරිදෙවිතසද්දං**, කුලුණු කටයුතු බැගෑහඬ; **කාසාව**[3]**ධොවන**, කසට දියෙන් දෙවුනා; **ලෙපන**, බෙහෙත් ආලෙපකිරීම; **පටිකම්මං**, පිළියම; **සොණ්ඩං**, සොටහු; **ආවාහෙත්වා**, තභාගෙන; **පණීතනවානුසාරෙන**, පණීතතටානුසාරයෙන්; **සඞ්ඝරිත්වා**, රැස් කොට; **පිතුච්ඡාපුත්තා**, පියා තගා පිත්-තැන්දෑ පිතැයි සේයි; **පතිබ්බතා**, ස්වාමියාට මැණියක්වූ යයි සේයි; **වෙත්තපච්ඡිං**, වේවැල් පුළුල්ලක්; [4]**කුලදත්තිකො**, කුලවැස්සන් දුන්; **කොමාරපති**, කුමාර කලමැ ලද සැමි.

## 193. චුල්ලපදුම ජාතකං.

**වධාය පරිසක්කන්තං**, වධයට ප්‍රයොග කරන්නහු; **පුප්ඵලතා විය**, මල් පිපි ලියක් මෙන්. 'ලළමානා' යන පදය 'පුප්ඵලතා, මත්තකින්නරී' යන දෙපදයට යොදනු. **වත්ථානි පරිවත්තෙත්වා**, සළු පෙරළා; **චතුක්කෙ චතුක්කෙ**, සන්ධියෙහි සන්ධියෙහි; **බාහා පග්ගය්හ**, ඉස අත් බැඳ; **පවාසං**, අතික් තැනකට; **චාවෙතුකාමො**, චුතකරවනු කැමැත්තේ; **අනපගතානි**, නොපහවූ; **සස්සානං පක්කකාලෙ වා**, ගොයම් පැසුණු කල හෝ; **ලායනකාලෙ වා**, දන කල හෝ; **මද්දනකාලෙ වා**, කොළ මඩනා කාලයෙහි හෝ; [5]**ඵුත්තකාලෙ**, වැස්සයුතු කල් හිද; **අප්පටිලාභවසෙන**, නොලබන විසින්.

## 194. මණිචොර ජාතකං.

**පදුස්සි**, වැරැද්දේයි; **පරිවීමංසමානො**, පරීක්ෂා කරන්නේ; **දුබ්භිතුං**, ද්‍රොහ කරන්නට; **සබ්බසාපදානි**, සියලු තිරශ්චීනයෝ; **නදිං පිවන්තෙනව**, ගඟ පැන් බොත්මැයි; **ඔදකන්තිකතාය**, [[6]උදක කිස අවසන්කොට ඇති] ධර්මයෙන්; **ඔරමිංසු**, වැළැකියෝ.

## 195. පබ්බතූපත්ථර ජාතකං.

**උක්කණ්ඨිතො**, අද යෙමියි සෙට යෙමියි තභා ගත් කර ඇත්තේ; **උපලාළෙත්වා**, තළවා; **ඉත්ථිකුත්තෙන**, ස්ත්‍රීන්ගේ ආචාරයෙන්; [7]**අලඞ්කතඉත්ථිවත්තෙන**, සැදි මාගම්වතින්; **පුරිසසණ්ඨං**, [8]වෙණෙඳුන්; **උභොහි හනුකපොටෙහි**, දෙහනු කෙලවරින්; **තම්බපණ්ණි**, [9]තම්වැන්න; **සිරීසවණ්ණා**, එනම්

1 අම්මණකෙ-මූ. අ. ක. 2 පරිදෙවනං BCF. 3 ධොපන-මූ. අ. ක. 4 කුලදත්තියො-මූ අ. ක. 5 ඵුත්තපඵුත්තකාලෙ-මූ. අ ක 6 උදකාය ධම්මෙහි A. මේ පාඨය හා අර්ථය අනික් පුස්කොළ පොත්වල නොපැනේ. 7 මූ. අ. ක. හි නොආයේයි. 8 වෙළඳුන් A. 9 තඹවැන්න E.

නුවර-සරසවතී නම යෙත් මැයි. [1]විසාඛකාලෙ, තිසැකවූ කල්හි; පාදපරිචාරිකා, මෙහෙකරු; භාව, කටාක්ෂ ආදී; භාව නම් අදහස් උපදවන පියෝ. විලාස නම්:—

අනවස්ථානමඞ්ගස්‍ය රූපයෞවනවිභ්‍රමඃ,
තතො විලම්බනස්යෙවති විලාස ඉති කිත්තිතඃ.

දෙවසඞ්ඛලිකා නම් දෙව්හැකිලි-නෙළුම්ඇස් සෙයින් පාහි ගෙන අසෙක් ලු. [2]කාරණඝරෙ, දඬගෙහි; කල්‍යාණිං, කැලණි; ඛරගතා, මෙතෙරින්; [3]අඩ්ඪතෙය්‍යසතානි, දෙසියපන සක්; කාකපක්ඛසො, කවුඩකු බඳු හිස් ඇති; මුණ්ඩසෙඛසො, මුදුනණ බඳු කෙස් ඇති; තම්බපණ්ණිසරෙ, [4]තම්මැන්නා විල්හි; පල්ලලෙ, මඩ; ජනපදං, දඹදිව්ට; ඛන්නාසෙ, [5]වැලක් කන්; පඤ්චවිනිබන්ධන, පස් තැන බැඳුම් ඇති; තීසො කුල සම්පත්තියො, රජ බමුණු වෙළඳ තුන් කුලසපුව; [6]ජ කාම ගෙහ, සදෙව් ලොව.

## 196. වලාහස්ස ජාතකං.

උපාහනක්ඛිකං, වහන් පසිය; ගණ්ඩකං, ගණ්ඩාවාරි; පහට්ඨාකාරං, සතුටුලෙස්; චක්ඛුනා චක්ඛුං ආහච්ච, ඇසින් ඇස කොටා; [7]පච්චනීකාගාහං, විපක්ෂ ගැනුම්.

## 197. මිත්තාමිත්ත ජාතකං

ශිවං[8]වලිත්වා, කර අඹරා; පචාසා, [9]බැහැර වැස-වියො වැ; අනීසානිකං, නොතියෙනු; ඉදානි ගිරා යථා, 'ගිරා' යයි යම් සේ දූන් කියනු ලැබේද; ලිඞ්ගං අනාදියිත්වා, ලිඟු නොගෙනැ; සච්චුපසංහිතං, සැබැවින් යුත්; කුකාකුලෙ, හුණු අළුයෙහි.

## 198. රාධ ජාතකං.

අගෙනාවසෙස, [10]ඇතවස්හි; ඛණං, ඇස්වරක්; එසො, නේ; ගාමභොජකො, ගම්මුදළි; මංසමූලං සොමධෙනො විය, මස්මිල එළවන්නකුමෙන්; කිසං මංසං, මඳමස් ඇති; කාරං කත්වා, පරිච්ඡෙද කොට; සඞ්ගරං, ව්‍යවස්ථා; අතිචරිතුං, [11]ඉක්මවන්නට.

## 199. ගහපති ජාතකං.

1 විසාඛමිතකාලෙ-මු. අ. ක. 2 කාරණඝරෙ-මු. අ. ක. A. 3 අඩ්ඪතෙය්‍යසතා-මු. අ. ක. 4 තම්මැන්න BCEF 5 වලක්කන් BF. 6ජකාමසගෙහ-මු. අ. ක. 7 පච්ච නීකවාහි, විපක්ෂගැන්ම A. පච්චනිකවා, පක්ෂය ගැනුම BCF.; 8 පරිවත්තෙත්වා-මු. අ. ක. 9 බැහැරින් A. 10 ඇතුළුවස්හි A. 11 තික්මයුන්තට BCDEF.

¹නිවෙසනෙන, ²පිහිටුවන්නකු විසින්; භවසම්බන්ධූපගතත්තා, භවයෙන් මුවා වූ හෙයින්; ³සරීරදබ්බං, සිරුරුද්‍රව්‍ය; පුජ්ජා, පූජ්‍යයි.

200. සාධුසීල ජාතකං.

---

## පඤ්චමො වග්ගො.

---

සඤ්ඡිඤ්ඡෙදක, උමා බිඳුනාහු; පන්ථඝාතක, මං පහරන සොරහු; අන්දුබන්ධන, දම්ණි ලීම්; සඞ්ඛලික, හැකිලි; පිණ්ඩපාතපටික්කන්තා, බික්සිඟීමෙන් නැවැත්තාහු; ගෙහෙ කත්වා, ගෙට ගෙනහැර; වත්ථං කත්වා, සිසාරා ගෙනැ; ථනපානෙන, කිරි පීමෙන්; සම්පටිච්ඡාපෙත්වා, ගිවිස්වා; නගරගුත්තියා, නුවර ලදුවෝ; ඝිඝාණ, තිඳු කරන ලද; ⁴දුම්මොචං, නොමිදිය හැකි.

201. බන්ධනාගාර ජාතකං.

ඔමකො, උනුවූ අත්බැව් ඇත්තේ ලකුණමතො, ලුහුඬු-මිටියයි සේයි; ⁵සාමණෙරො විය බුද්ධගො, හෙරණකුසේ කුදුවූ; ⁶කීළනත්ථාය කතො විය, කෙළි පිණිස කරන ලද පෙතැලි රුවක් බඳු; විහාරකොට්ඨකෙ, වෙහෙරදොරටුයෙහි; හත්ථකුක්කුච්චං කත්වා, අතින් විරූප කොට; අභිනීහාරසම්පන්නො, උපනිඃශ්‍රය ඇති-රගත්වන පින් ඇති; අසෙසසක්ඛා, අලෙපශාත්‍යවූ; සම්පටිච්ඡනනත්ථාදි, බිම හිස් තබා පෙරලෙනු ආදිවූ; තිරො රට්ඨානි, තත් රට: බහුසම්පන්නෙ, ආසන්නයට ආ කල; ⁷අට්ටියති, පෙළේ; හරායති, ලජ්ජා කෙරේ; ජිගුච්ඡති, පිළිකුල් කෙරේ; වඩ්ඪාපචායිකකම්මං, දෙටුවන් පුදන ක්‍රියා.

202. කෙළිසීල ජාතකං.

---

ජනනාසර, ගිනිහල්ගෙයි; පූතිරුක්ඛනතරා, දිරුණු රුක් අතුරකින්-රුක්බුහුරින් එවි; අභාවයියස, භාවනා කෙළේ නම්; බදියස්සං කත්වා, උදෙසා; මනුස්සෙසු, මිනිසුන් කෙරෙහි; විච්ඡික, ගෝනුස්සෝයි; සතපදී, බහුපාදවූ බුහුවණු ආදීහු; අනොදිස්සකවසෙන, හිම් නොතබන බැව් විසින් යුසේයි. ⁸වට්ටෙ පක්ඛදසු බන්ධෙසු, සසර පයවීපතන පස්කදෙහි.

---

1 නිවෙසෙනෙනන-මූ. අ. ක. 2 පිහිටුවන්නන් ABF. 3 සරීරදව්‍යං-මූ. අ. ක. 4 දුම්මොචයං-මූ.අ.ක. 5 සාමණේර බන්ධුනො, හෙරණකු බඳු A. 6 මේ පාඨය හා අර්ථය A හි පමණක් ආයේයි. 7 අඩියති ABCEF. 8 වට්ටෙපසු ABCEF.

මෙයින් අනාසුවසක්ඛ [1]වැරූ වෙත්. [2]**සත්තා**, ඇලුණාහු; **විසත්තා**, මොනොවට ඇලුණාහු; "ලග්ගා, [3]ලගිතා" යනු කී මැ අත්‍ථි. **සබ්බසත්තසඞ්ගාහකානෙව**, හැම සතුන් [4]සඟහනුවෝ මැයි; **පමාණකතානං කිලෙසානං**, පරිච්ඡෙදකරවූ කෙලෙසුන්. කෙලෙස් නැති සතුන් පමණ නොදත හැකි බැවින් කෙලෙස්හු පමාණකර නම්හු. **සරන්තා**, සිහි කරන්නාහු; **උණ්ණාසදිසං**, එළලොම් බඳු; **සරබූ**, ගෙසුහුණු-සිකනලුන්; **මූසිකා**, මීයන්; **සත්තන්නං සම්මාසම්බුද්ධානං**, විපස්සී ආදි සත්දෙනා වහන්සේ—

## 203. ඛන්ධවත්ත ජාතකං.

**සුගතාලයං**, තථාගතලීලා; **උදකකාක**, දියකාවෝ; **අනාදියිත්වා**, නොගෙනැ; **උම්මුජ්ජන්තා**, කිමිදුනේ; **නිරස්සාසො**, ශ්වාස නිරුද්ධ වූයේ; **අපි**, කිම. නොහොත් **අපි පස්සසි**, නොදක්කිද; **පරියොනද්ධා**, සිසාරා බඳ—

## 204. වීරක ජාතකං.

[අසුභභාවනං] **අනනුයුඤ්ජිත්වා**, අසුභභාවනායෙහි නොයෙදී; **රූපං උපලාළෙන්තා**, රූ නළවන්නාහු; **රජිසා**, රිය ඉස්; **අනනුසාසංසකො**, තමා හුවන්නේ—

## 205. ගඞ්ගෙය්‍ය ජාතකං.

**කුරුඞ්ගමිගෙ**, එනම් මුව; **සනපෙන්තා**, [5]කෑරොල; **ලොහනිගලෙ**, යදම්; [6]**වද්ධමයං**, සම්මයවූ-සමින් කළ; **වස්සිත්වා**, ගඬා; [7]**පුරද්වාරෙන**, ඉදිරි දොරින්; **පදං වඤ්චෙත්වා**, පිය වළහා—

## 206. කුරුඞ්ගමිග ජාතකං.

**තෙලකලලෙ**, සුවඳතෙල් කලලැ; **ආලොකං වඩ්ඪෙත්වා**, ආලොක කිසුණු වඩා; **විප්ඵලපමාණො**, තන් බණන්නේ; **ගොමයපාණක**, ගොමපණු; **භවසඞ්ඛෙපගතකාලතො පට්ඨාය**, භවයෙන් මුවා වූ කල පටන් ගෙනැ; **කාමයමානාය**, පතන්තිය විසින්; **පිධීයති**, මුවා කරනු ලැබේ—

## 207. අස්සක ජාතකං.

---

1 වැසෑ A. වරූ BCDF. 2 ආසත්ත-මූ. අ. ක. 3 ලග්ගිතං-මූ. අ. ක. 4 සහගහනුවා AE. භගවනුවා BF. 5 සොගරෙළ A. 6 චම්මමයං, චම්මයවූ A. 7 පුරත්ථිමද්වාරෙන-මූ. අ. ක.

සුංසුමාරො, කිඹුලෙක්; ඛිනති, කිසිසේත්; කසටඵලානි, කසට රස ඇති ඵලයන්; විණ්ණමජ්ඣානෙ, හසළවිරූ තැන්හි; ලබුජ, දෙල්; උදුම්බරං, දිඹුල්; පිණ්ඩිසමානනං, මහත් කැන් ඇති; දීපකො, දිවයිනැ......

208. සුංසුමාර ජාතකං.

---

කිලිත්ත, විලිකුන්; [1]දීපකක්කරං, තමා හුන් තැන් හඬා පහළ කරන බැවින් [1]දීප නම් ලද සෙබටු–සේවටුවන්ද කියත්; අස්සකණ්ණා, අසුගස්–මුරුතද කියත්; විභීටකා, බුළු......

209. කක්කර ජාතකං.

---

[2]රුක්ඛකොට්ටක[සකුණ], රුක්කොටුලිහිණි; පාළිභද්දකා, එරබදු; [3]ඵුල්ලපුප්ඵෙ විය, මිහි එවැ ඇනූ අත්වට සෙයින්; [4]සමුච්ඡිතො, පුරුදුවූ; ඡින්නං, කැපිණි; සාරඛදිරගරුකොබඳු, හරනැති රුක්හි; සිම්බලී, හිඹුල්; [5]සප්පතිස්සවචනං, ආදර තෙපුලි......

210. කන්දගලක ජාතකං.

---

# ඡට්ඨො වග්ගො.

---

සම්පාදෙසො, සපයා; සාරජ්ජබහුලො, පිරිස් බිරිව; සන්නි ට්ඨානකාලෙ, සතිටුහන් කල්හි–තිමාම්හි යී සේයි; බීරණත්ථ මහතො සුසානෙ, එනම් සොහොන්හි; පරිසං [6]විගාහිත්වා, පිරිසට වැද; යොග්ගානං විණ්ණාවරණං යනු යොග්‍ය කිරීම යුසේයි......

211. සොමදත්ත ජාතකං.

---

කපණෙ[7]නටකුලෙ, බැගෑ[නට]කුලයෙක්හි; දුග්ගතො, දිළිඳු; දුරූපෙතො, දුකින් එළවන ලදුයේ–අරූපි හෝ; අතිචාරං චරති, සවාමිහු ඉක්ම පවති; භත්තං වඩ්ඪිත්වා, බත් පෙරට තබා; ඵලකං, බුදුනා පුවරු–[8]මොරවාද කියත්; උත්තානභාවයතෙන, ප්‍රකාශ භයින්......

212. උච්චිට්ඨභත්ත ජාතකං.

---

තෙන ඛො පන සමයෙන, එසමයෙහි; සක්කතො, සත්කාර කරන ලද්දේ; ගරුකතො, ගෞරව කරන ලද්දේ; මානිතො, සිතින් ආදර කරන ලද්දේ; පූජිතො, පුදන ලද්දේ;

---

1 දීපි–හැම. 2 රුක්ඛකොට්ඨක–මූ. අ. ක. 3 මධුරපුප්ඵෙ–මූ. අ. ක. A. 4 සමුට්ඨිතො–මූ. අ. ක 5 සප්පතිස්සවචනං–හැම. 6 විහෙත්වා A 7 නටකකුලෙ–මූ. අ. ක. 8 මූරවා C.

**අපචිතො**, බහුමාන කරන ලද්දේ; **ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරා**, ගිලන්හට රොගයට ප්‍රතිපක්‍ෂ බෙහෙත්; **අසඤ්ඤතිප්පිසා**, නොඑක් ලබති ගත්තාහු; **අහොරත්තං**, රාත්‍රිදින; **ගූළ්හසන්නිපාතං කත්වා**, රහස කැටිව ගෙනැ; **ලාභග්ගයසග්ගප්පත්තා**, ලාභයසකොටස්හි අග්‍රප්‍රාප්තවූ. 'අග්‍ර' ශබ්ද කොටස්හි වැටේ 'මධුරග්ගෙ අම්බිලග්ගෙ වා' සේ. 'අග්‍ර' ශබ්ද උත්තම හෝ; **භූමිසීසෙ**, ප්‍රධාන භූමියෙහි; **උච්චාසද්දමහාසද්ද**, පැතිරැ උස්වැ පවත්නා හෙයින්; **එකං පරියායධම්මදෙසනං**, එක් ව්‍යාජ ධර්මදෙශනාවක්; රජහු අත්ලස් ගත්බැව් ඉදිවැ නොකියා අන් ලෙසින් කියන ධර්මදෙශනාවයි. **ගණසජ්ඣා**, ගණයන්ට අනුශාසනා කරන; **වටරුක්ඛො**, නුගරුක්; **සුක්ඛි**, මෙළේ; **න දනි**, 'න ඉදනි' සී යොදනු; **මයං ඉමෙහි [1]ජිතක්ඛා**, ඇපි මොවුන් විසින් පරදවන ලදුම්හ; **රථපඤ්ජරං**, රථකොටුවක්–රියම්ණියක්; **උබ්බත්තෙත්වා**, උතුරුවා; **විවරං කත්වා**, සිදුරු කොට; **කිලෙසෙහි**, ඡන්දගති ආදි කෙලශයන් විසින්.

## 213. භරු ජාතකං.

**ජවනපඤ්ඤ**, රූපාදියෙහි අනිත්‍යාදි වශයෙන් දිවන නුවණැත්තේ; **තික්ඛපඤ්ඤ**, වහාම කෙලෙසුන් සිඳිනා ප්‍රඥ ඇත්තේ; **නිබ්බෙධිකපඤ්ඤ**, උද්වෙගඋත්‍රාසඋත්කණ්ඨා දීන් විද නික්මෙන පැන ඇත්තේ; **උපායපඤ්ඤාය**, මෙයට මේ කටයුත්තේය යන උපාය ප්‍රඥයෙන්; **අසතිකරණං**, සිහි නොකිරීම්.

## 214. පුණ්ණනදී ජාතකං.

[2]**වාචාහතො**, තෙප්ලෙන් නසන ලදුයේ; **දුට්ඨචෙටකා**, දුෂ්ට කොල්ලෙනි; **ආකාසඞ්ගණෙ**, සඳල්ලෙහි; [3]**චිරස්සං බො**, බොහෝ කල් පටන්; 'චිරපට්ඨාය' යනුත් පාඨයි. **අපරිමාණං**, පමණ නැති කොට; **බ්‍යාහරෙන්තා**, බණන්නේ; **නරවිරියසෙට්ඨ**, නරයන් කෙරෙන් වීර්‍ය්‍යයෙන් උත්තමය. 'සච්චාදි' යන තැන ආදි ශබ්දයෙන් ප්‍රඥවීර්‍ය්‍යත්‍යාගාදිය ගන්නේයි.

## 215. කච්ඡප ජාතකං.

[4]**මුඤ්චථ මං සාමිනො**, [5]මා ස්වාමීනි හරුව; **කචි න හඤ්ඤති**, කිසි තැනක නොනැසී; **මච්ඡං අනුබන්ධමානො**, මැසින්ත අනුව දිවන්නේ.

## 216. මච්ඡ ජාතකං.

1 පරාජිතා-මු. අ. ක. 2 වාචාය හතො-මු. අ. ක. 3 චිරපටිකාබො-මු. අ. ක. 4 මුඤ්චථ මෙ සාමිනො A. මුඤ්චථ සාමිනො BCDEF. 5 මාගේ සවාමීනු හරුව-හැම.

[1]සන්තනබ්බතාය, කටයුත්තකින්; තෙන යනු 'ගාමධම්මො' යු සේයි. වසලධම්මෙ, අධමයන්ගේ ධර්මයෙහි; පවත්තෙ, මහ වෙතෙහි; සා සස්ස සාදෑමි, 'අහං තස්ස තාදෑමි' යි [2]කිදේ.

## 217. සෙග්ගු ජාතකං.

පනතිකා හුත්වා, පයින් යන්නාහු; පුන දිවසෙ, ඉක්බිති දවස්; නිපපීලෙන්වා, පෙළා; පපයොඩ්ඪ්වා, ලස් කොට; එාලක, පළු-[3]සිහිවැල්; මුසිකාවචචං, මිහිවසුරු; කුලලො, රත් කඳට ඇති ගිජුලිහිණියෙක්-තබරුස්සෙක් හෝ; අසුතෙන හො තෙන, නොවියයුතු දෙයක් වන කල්හි; කාඩ්ඪාපෙස්සාමි, අද වම්; අට්ටං, සටන්; පටිසාධෙය්‍යං, නැවැත සැලබැව්-සොර බැව් සේයි; සොරාපිතෙන, වස්‍ෂවායෙන්; පටිහාගං සාත්වා, සුද්සු කොට; කූටපටිකූටානං, කුළුන් කුළු දෙසුතැයි සේයි.

## 218. කූටවාණිජ ජාතකං.

වන්තසම්පන්නො, ආචාරසම්පන්න වූයේ; හුත්වා අභා වතෙථන, ඉපැද තස්තා අර්ථයෙන්; දෙසනාසිසමත්තං, දෙශනාවට ශීර්ෂයි [4]ද්වාර යි සේයි; දසවිධම්පි රතනං යනු

"මුත්තා මණි වෙළුරියස්ච සඞ්ඛං සිලා පවාලං රජතං සුවණ්ණං
[5]මසාරගල්ලම්පි ච ලොහිතඞ්කො"

යන දස රුවනි; හුත්වා න භවන්ති, ඇතිවැ නොවෙත්; කත වෙණ්, ගොතා බඳතාලද [6]කේ ඇතියේ; විද්ධකණ්ණො, [7]විදි කන් ඇතියේ; විතුදති, කොටා.

## 219. ගරහිත ජාතකං.

වධාය පරිසක්කනං, වධයට [8]ප්‍රයොගකිරීම්; නානාකාරමනනම්පි, ත්‍රස්ත-භයපත් ආකාර-මාත්‍රයකුදු; සිසපසාධන කප්පෙසා, ඉස අල්වා සරහන මඟුල් කපු; පරපිට්ඨිමංසිකො, ජනා වෙනෙසන-අත්ලස් ගන්නෝ හෝ-අනුන් ඇඟ මස් කන්නා සෙයින්. සාධම්මෝපචාරයෙන් කිහු. සත්තානුද්දයාය, සත්වකරුණාවෙන්; බලාභිසඞ්ගෙසං, බැරි වරදක්; අසංගහම්සස කම්මං, ඔහට නොකට හැකි ක්‍රියාවක්; [9]කින්ති කත්වා, කුමක් කොට; පුප්ඵඵලහාරභරිත, මලින් පකින් බරවූ: පච්චක්ඛං

1 ඉතිසන්තනබ්බතාය-මු. අ. සා. 2 කිදෙද C. කිදදෙ D. 3 සිංහිවැල් CD. 4 වර සි CD. 5 ලොහිතඞ්කො මසාරගල්ලං දසවිධරතනං-නැම 6 කෙස් B. 7 විහි A 8 ප්‍රතිෙයාග කිරීම් A. 9 මු. අ. කථාහි නොපැනේ.

කත්වා, ප්‍රත්‍යක්‍ෂ කොට; සතං ධම්මං, සත්පුරුෂ ධර්‍ම; සුඛෙන ජීවිතසදිසො, සුවෙන් විසූවකු මෙන්; [1]සුඛපරිහටො විය, [2]සුවෙන් දිවිපෙවෙත් වටන ලදුවක්හු වැනි; නිරුදකට්ඨානං, දිය නැති තැන්; කපණො විය, බැගෑ එකකු මෙන්; පජ්ඣායසි, සිතයි-සොස්හි සී සේයි; විචනං, වලට; අභිහතා, පහරන ලදුවෝ; අනුසූයකො, ඊර්ෂ්‍යා නැතියෙම්; සම්පදුස්සිත්වා, කිපී; නිවත්ථවත්ථො, හන් පිළීය; [3]ඛාදසිං, කෑමි; මාඝාතො, [4]නොමරන්නේ-සතුන් නොමරන දවස්; පක්ඛස්ස, [5]අඩමාස සම්බන්ධවූ; [6]දුන්නික්ඛිත්තං, තපුරු කොට තබන ලදුවා; පරියස්සජනෙනා, සිපගන්නේ; ලලිතදරකං, [7]කෙලනා දරුවා; පානීයචාටියො, පැන්සැළ; පරිපච්චි, මිහිකිරිණි-විපාක සමාය වී; පච්චෙකබොධිපත්තං, පසේබුදුන් බික් සිඟන පාත්‍රය. [8]පසේබුදුහු පච්චෙකබොධි නම් ඇති මාගීඥතය හා යෙදීමෙන් පච්චෙකබොධි නම් වෙත්-නීලගුණයෙන් යුත් [9]පටය නීල නම් වන සෙයින්. [10]ආචිණ්ණපරිචිණ්ණත්තා, පුරුදු කළ බැවින්.

## 220. ධම්මද්ධජ ජාතකං.

---

## සත්තමො වග්ගො.

---

[11]වත්ථුම්පන රාජගහෙ සමුට්ඨිතං, වත් රජගහා නුවර උපන්නේ; ජඥකං [12]සංහරිත්වා, එක්සිත්වැ; මම්පි පත්තිකං කරොථ, මාද [13]හෙරි කරව්; ගන්ධකාසාවවත්ථං, සුවඳවූ කාශාය වස්ත්‍ර. [14]උතුරුකුරුදිවියිනැ මලවුන් වසා හළ පිළී ඇත් ගිජුලිහිණියෝ ගෙනෑ හැරපියති. ඒ වනචරයන් අතින් ලදින් ගන්ධපරිභාවිතවූ කරඬුයෙහි ලා තුබූ කසීවස්ත්‍රයෙක් වේ. සංඝඩ්ඩිතං, රැස්කළ; [15]ඔවට්ටිකං, [16]ඇස් තබන විදුම්; අරහද්ධජං, රහත්නට ධවජයක් බඳු; පරිදහි, හඳි; යූථපති, සමූහයෙහි ජ්‍යෙෂ්ඨවූ; දන්තවලය, දළවළලු; පච්ඡිසකං, හිස්පසිය; පරිගණ්හනෙතා, පරීක්‍ෂා කරන්නේ; ගරුං කාතුං, ගරු කරන්නට; මක්ඛො, අනුන්ගේ ගුණ මකන ලක්‍ෂණවූ මක්ඛය; පලාසො, අනුන්ගේ ගුණ සැහැ දමන්නා සේ පවත්නා ආකාර

---

1 සුඛපරිහටො-මූ. අ. කා. 2 සුවයෙන් දිවි පවත්වන ලදුවක්හු වැනි C. 3 ඛාදි AD. ඛාදිය• BF. ඛාදිස• CDE. 4 මාඝාතො, නොමරන්නේ-සතුන් නොමරන දවස්හි A. මාඝාතෙ, සතුන් නොමරන දවස්හි BF. මාඝාතො, සතුන් නොමරන දවස්හි CD. 5 මාස සම්බන්ධවූ BF. 6 දුනකිතතං A. 7 කෙලනාවර දරුවා BCDEF. 8 පසේ බුදුහු පචෙචකබොධ නම් වෙත් A. 9 පය BCDF. 10 ආචිණ්ණත්තා-මූ. අ. කා. 11 වත්ථු පන-මූ. අ. කා. 12 සඞ්ඝරිත්වා-මූ. අ. කා. 13 හිමි BCDEF. 14 උතුරුකුරු දිවින් BCDEF. 15 ඔවට්ටකං-මූ. අ. කා. 16 අස් BF.

ඇති දෞර්මනස්සසහගිය චිත්තොත්පාද පලාස නම්; ඉස්සා, පර සම්පත් නොඉවසන ඊර්ෂ්‍යායි; මච්ඡරියං, තමාගේ සම්පත් සැඟවීම ලක්‍ෂණ කොට ඇති මාත්සර්‍ය්‍යයි; මායා, කළ දෙය පැටිකරන වඤ්චායි; සාඨෙය්‍යං, නැති ගුණ පහළ කරන වඤ්චායි; ථම්භො, මානයෙන් තද බව; සාරම්භො, කරණුත්තරියකරණ; මානො, නවවිධ මන්; අතිමානො, උතුම්හට උත්තම යෙම් යන අතික මාන; මදො, ජාති ආදී විසින් පවත්නා [1]මත්; පමාදො, පස්කම් ගුණයෙහි විහිදුනා පමාබැව්; දියඩ්ඪං කිලෙසසහස්සං, යෙළදහසක් කෙලෙස්; අභිස්සවෙයාති, අති කඩනේනා; නියමකමෙවා, [2]සමීපාසීයෙහි; ආහිතො, පිහිටු වන ලද්දේ.

## 221. ඛාසාවජාතකං.

අභිමාරෙ, දුනුවායන්; සිලං පවිජ්ඣි, ගල් පෙරළී; සඝන ගුම්බෙ, හෝනා [3]ලැහැබිහි; පවෙධෙන්ත, දනව් කෙළවර; [4]අඩ්ඪ විජ්ජා, සිරුරු ලකුණු දන්නා විද්‍යා; න ඉජ්ඣති, නොපවත් නේයැ; ධනුකොටිං, දුනු කෙළවර; අඩ්ඪණපරියන්තෙන, මහ හෙළි කෙළවර; අපිනාම, යෙහෙකි; පවිඤ්ඤං, පිළිත; ධනුං සන්නයහි, දුන්න හැදගති; පිට්ඨිවංසකුණ්ඩා, වස්යට හා වස්කප්; පාරාසරියො යනු ගොත්‍ර විසින් කියත්; අත්තනි පස්සති, තමා කෙරේ දකී.

## 222 චුල්ලනන්දියජාතකං.

වොහාරං, ගනුදෙනු; ධාරණකො, ධරන්නේ-දරදී ඇත් තේ යයි සේයි; ජාතඡිත්තං, සාකුස් ඇති; පුටභත්තං, පළා බත්; පදුට්ඨකෙයාති, ද්‍රොහකරන්නේයි; උපචාරං කත්වා, ආදර කොට; මහල්ලකානං පිතුනං, මහලු දෙමවුපියන්ට; අධිවාසෙසි, ගිවිස්සේය; වනට්ඨං, සඳ; විපල්ලත්ථචිත්තෙන, පෙරළී සිතින්.

## 223. පුටභත්තජාතකං.

පරමහද්දකා, වෙසෙසින් සොඳුරුවූ; රාසවණ්ණ පිණ්ඩ වණ්ණ යනු ගුණ යන්නෙහි අර්ථයි. මෙතැන ගුණ ශබ්ද රාසි කියා.

## 224. කුම්භිලජාතකං.

1 මත් BCDEF. 2 සමීපාසීයෙහි A. 3 ලැව්හි C. 4 විජ්ජා-මු. අ. ඛු.

**පදුස්සි**, වැරැද්දේ; **තස්ස චෙසො පරාධස්සි** යන තැන ව්‍යඤ්ජනවිපර්‍යාසයෙන් [1]පකාරයහට වකාර කෙළේයි; **දණ්ඩං පණෙති**, දඬු යොද; **රාජ්ඤනං සන්තං**, රාජත්වයෙහි සිටි; **අරඤ්ඤෙ**, රාජ සවභාව නැත්තාහට —

## 225. ඛන්තිවණ්ණනජාතකං.

**උලූකසකුණො**, බකමුහුණු; **නිලීයි**, හැලිණී; [2]**කොසියගොත්තං**, කෞශිකගොත්‍ර ඇති බකමුහුණු; **පරිපාතෙන්ති**, හෙළත්; **නිග්ගමනං**, නික්මීම්; **පරක්කමනං**, පෙරකුම් කිරීම්; **සුත්තප්පසුත්තකාලෙ**, [3]සපත් කල්හි; **ධඞ්කසෙනා**, කවුඩුමුළු; **සංවිදහනං**, වැදූරුම් හෝ අනුෂ්ඨාන කිරීම් —

## 226. කොසියජාතකං.

**කොණ්ඩො**, කොටෙක්; **පක්කිත්තභත්ත** නම් දෙපෝයේ දෙන බත්; **පරිභාසති**, හවා; **චණ්ඩමෙණ්ඩකො** විය, කුළු පොර ගන්න එළුවකු සෙයින්; **චීවරං** [4]**සඞ්ඝරිත්වා**, සිවුරු පත් කොට; **අංසෙ ඨපෙත්වා**, [5]කුලල ලාගෙනැ; **ආසාදෙසි**, මිශ්‍ර කෙළේ; **සිඛන්තරෙ**, දෙරට හිම් මැද; **පාණකො**, ගොමපණුයෙක්; **විරවි**, මහත් කොට ශබ්ද කෙළේ; **ජිගුච්ඡන්තො**, පිළිකුල් කරන්නේ; **අවහයන්තො**, කැඳවන්නේ; **විරියවික්කමෙන**, වීය්‍ය පරාක්‍රමයෙන්; **සම්පහාරො**, යුද්ධ; [6]**ජනානං**, [7]එචිස්; **අපසාදෙන්තො**, ගරහන්නේ; **පූතිනාව භක්ඛතූති**, අසුචින්මැ නැසේවයි කියා; **උදකං විස්සජ්ජෙත්වා**, කිස කොට —

## 227. [8]ගූථපාණකජාතකං.

**අතිත්තභාවං**, තෘප්තියක් නැති බව; **ධෙමානි**, සේම වූවත්; **බලං සජ්ජං කාරෙත්වා**, සෙනඟ යුක්ත කොට; **වක්කු ලොහිතං**, හදවත් ඇසිරැ වූ ලේ; **ලොහිතපක්ඛන්දිකා**, රක්තාතීසාර; **තිකිච්ඡිතුං**, පිළියම් කරන්නට; **රාජවෙජ්ජා**, ප්‍රධාන වෙදහු; **නිවාපෙන**, බත් වියදමින්; **පරිබ්බයෙන**, අවශෙෂ වස්තු වියදමින්;

"සුදස්සනස්ස ගිරිනො—ද්වාරං හෙතං පකාසති"

යන තැන ගිරි ශබ්දයෙන් නුවර කියන තැන් පාඨයි. **පච්චත්තෙ උපයොගවචනං**, ප්‍රථමායෙහිවූ ද්විතීයායි. [9]**උපහතං**,

1 වකාරයහට මකාර කෙළේයි BCDF. වකාරයහට වකාර කෙළේයි E. 2 කො. සියං-මු. අ. ක. 3 සපත් BCDEF. 4 සංහරිත්වා-මු. අ. ක. 5 කුලලාගෙන A. කුරුල් ලාගෙන BCDEF. 6 මු. අ. කථාහි නොආයේයි. ජනානං E. 7 චතීසස් E 8 ගූථපාණී ජාතකං A. ගූථපාණජාතකං BCDEF. 9 පහතං-මු අ. ක.

නැසූ–[1]හිංසාකළ; වජ්ඣස්ස, නැසියයුත්තාහට; ඔසධ[2]පරිභාවනාදීහි, ඖෂධපරිභාවිත කිරීම් ආදීන් ~

228. කාමනීතජාතකං.

---

ඌමියො විය, රළ මෙන්; උන්නාදිනො හුත්වා, ඝොෂයෙන් යුක්තව; ආවුධෙහි පහරථ, ආයුධයෙන් යුද්ධ කරව්; ඵරුදණ්ඩෙහි, ඛඩ්ගයෂ්ටි ඇති; සෙලිත, එළසන් ~

229. පලාසිජාතකං.

---

වෙගවික්ඛම්භනවසෙන, වෙග සන්හිඳවීම් හෙයින්. "තස්ස තාදිසො අයමෙව"–'තාදිසං' යනු හෝ පාඨයි. විළක්ඛහසියෙව, දවනු ලබන්නෙහිමැයි; නිසෙධකං, වළකන්නනු; ගහණභීතො, ගැන්මෙහි බියපත් වූයේ ~

230. දුතියපලාසිජාතකං.

---

## අට්ඨමො වග්ගො.

---

ආචරියමුට්ඨිං, [3]ආචාර්‍ය්‍යයන් නොකියා තබන අභිසි. සමප්පකාරො, සම්වූ [4]ප්‍රකාර ඇත්තේ; [5]විලොමකං, ප්‍රතිපක්ෂ ක්‍රියා; ඔසක්කිතුං, පසුබස්නට; සාරම්භං, සැහැසීම–එකකට දෙකක් කෙරෙමි යන කථායි; සුඛත්ථාය, සුව පිණිස; [6]දුක්ඛාන උපාහනා විය, තදුරු කොට කළ වහන් මෙන්; [7]ආවහෙය්‍ය, එළවා; පාදෙසු පටිමුක්කා, පයෙහි බහාලනලද; තං තං මනතීති, ඒ ඒ අභ්‍යාස කෙරේනුයි. 'මත–අභ්‍යාසෙ' යන ධාතුයි. පරිවත්තෙන්තීති, පිරිවා ප්‍රගුණ කෙරේනුයි; සුතපරියත්තිං, ඇසූ පෙළ; සුතෙන, ශ්‍රැතපර්‍ය්‍යාප්තියෙන්-ශිල්පයෙන්; අත්තානමෙව, තමාම; ඛාදතීති, නසානුයි; සුතෙන ඛාදනො, ශ්‍රැතයෙන් නසනු ලබන්නේ; පානාය, වහනින්; දුනොති, තවනලදනුයි; පානදු, පානදු නම් වේ. 'දු–පතාපෙ' යන ධාතුයි ~

231. උපාහනජාතකං.

---

ගුත්තං අනන්තරෙ, ගෙරින් අතුරෙහි; ඛඤ්ජං, කියා ගැට–මොල්ලි යයි සේයි; අඤ්ඤාතකවෙසෙන, අප්‍රසිද්ධ වෙසකින්; වාරෙත්වා, වළකා–රැස්වා. 'වර–ඊප්සායාම්'. [8]සිතාගිහතස්ස,

---

1 හිංසාකොළෙල්-හැම. 2 පරිභාවිතාදීහි-මු. අ. ක. 3 ආචාරියයන්AF. ආචාර්‍ය්‍යයන්ගේ C. 4 පහාර F. 5 විලොමං-මු. අ. ක. 6 දුක්ඛතං උපාහනං-මු. අ. ක. 7 උබ්බහෙය්‍ය-මු. අ. ක. 8 සිත්‍ථාගිතස්ස A.

ශීතයෙන් පීඩිතයාගේ; අපරිනායකො, තෙමේ තමහට සවප්‍රධාන නුවූයේ; වාමනතනා, මිටි හෙයින්; වාමෙන, කුදු හා. 'වාමනෙත' යු තැන්. සදෙණිකො, දෙණ සහිතවූ; සඞ්කුපිතො, හැලින් ඇකිල ගියේ; නික්ඛන්තනාභාවමත්තමෙව ඤාතා, කුදු හා කැපිව තික්මුණු මාත්‍රයක් මුත් අතික් කාමසංසග්ගයක් නොකල බව දත—

## 232. වීණාථූණජාතකං.

විකණ්ණකසල්ලසදිසා, කතු නැති හීයක් වැන්නහ; [1]විද්ධවිකණ්ණකං සුංසුමාරං විය, විදිනාලද විකණ්ණක ශරය කිඹුලා මරණයට පැමිණවූවාසේ; [2]මම්මට්ඨානෙ, මර්මස්ථානයෙහි; සවාදිනෙන, බෙරසත් ඇති; මනාපනො, සිත් වඩනා විසින්—

## 233. විකණ්ණකජාතකං

කිසම්ඤුව් අමඤ්ඤමානො, කිසිවක් කොට නොසිතන්නේ; විතිනාමයමානා, දවස් යවන්නී; අට්ඨගවෙසිකා, වැඩ සොයන සුලු වී; අනුපදං, පිය අනුව; [3]පටිසංඛිතුං, සන්ධාන කරන්නට; අනිච්ඡමානො, අපරියන්ත තෘෂ්ණා ඇත්තේ—

## 234. අසිතාභූජාතකං.

රොජමල්ලං, එනම් ඇති [4]මල්ලවයා; ගිහීභොගෙන, ගිහි සැපතින්; චාරවිහාරෙ, [5]චරියා විහාරයෙහි; අනුස්සුකො, කිසි කර්මාන්තයෙහිත් උත්සාහයක් නැතිව; කරොති, අභිභවා- යටත් කෙරෙයි සේයි; නිප්පරිතසො, තෘෂ්ණා රහිත වූයේ- චිත්තඛෙදයක් නැතිව හෝ—

## 235. වච්ඡනඛජාතකං.

[6]අබලබලො විය, විශෙෂයෙන් [7]මද බලයකුමෙන්- බොළඳ බොළඳකු බඳුව හෝ. අතිශයාජීවයෙහි ආමෙඩිතයි. ගොපයති, රකී; කබලං කරිස්සාමීති, කම් කියා; ඛොභෙත්වා, අලලා—

## 236. බකජාතකං

1 විකණ්ණකං-විය පවිට්ඨං සුංසුමාරං--මු.අ.ක 2 කම්මට්ඨානෙ, කර්මස්ථානයෙහි A. 3 පටිසංඛෙඪතුං, සන්ථානකරන්නට A. 4 මල්ලයා BF. 5 ඉරියාපථවිහාරයෙහි A. 6 අබලාබලො-මු. අ. ක. 7 බඳයකුමෙන් මද B.

සුවාසිතස්ස, මොනොවට සුවඳ කරනලද; පරිසිඤ්චං විය, [1]පරිෂෙකකරන්නාක් මෙන්; [2]අනුබන්ධො, අනුව එනලද්දේ–

## 237. සාකෙතජාතකං.

එකං පදං එකං කාරණං, හැම වැඩට සුදුසු එක් කාරණයක්; බ්‍යඤ්ජනපදං, අක්ෂරපදයක්-පිරිවානා ශබ්දයි; නිස්සිතං, ඇසුරු කරන ලද්දහු; [3]සඞ්ගාහිකං, සඞ්ග්‍රහවූවහු; දක්ඛෙය්‍යං එකපදං, 'දක්ඛෙය්‍යං' යන මේ අනෙකාර්ථ නිශ්‍රිතවූ එකපද යයි. දක්ඛෙය්‍ය නම් ලාභොත්පාදයෙහි ඡේකයාගේ ඥානසම්ප්‍රයුක්ත වීර්‍ය යයි–

## 238. එකපදජාතකං.

මණ්ඩූකයොනියං, [4]මණ්ඩූක ජාතියෙහි; කුම්භානි, කෙ මෙන්; ඛෙඩඩසූං, හැටවූ; උදකාසිවිසො, ජලාශ්‍රය ආශීර්විෂයෙක්-දියබරණහුයි; එකලොහිතං අකංසු, එක පැහැර ලේ මුසු කොළෝයි; විනිච්ඡයට්ඨානං, තමා සිත ඇති දෙය කියා බැණ පියන්නට සුදුසු විනිශ්චයස්ථානයක්; ආගතවිසං සමානං, පැමිණි විෂ ඇතියහු හෙවත් උග්‍රවූ විෂ ඇතියහු; හරිතමණ්ඩූකපුත්ත යනු 'හරිතා මාතා' යනුයෙහි අර්ථයි. සො [5]විලුම්පතෙ, ඒ ආදි කොට විලුම්පනය කරන තැනැත්තේ–

## 239. [6]හරිතමාතුජාතකං

බුද්ධපටිකණ්ටකො, බුදුන්ට පිළියතිය; හසති වාති, සතොසාෂ හසතයද කොළේයි; දණ්ඩ, දඩ; බලි, අය; ජඞ්ඝකහාපණ, කකුල් ගණතින් ගන්නා කහවණු-මිනිස් ගණති නැයි සේයි; පණ්ණිං, විලුම්; ආලාහනං, සොහොන්; මණ්ඩිතකලෙසු, සොබනාලද කිම්හි. රට්ඨිකා, රට හිමියෝ-මණ්ඩලික යහයි සේයි; දොවාරිකො, දොරටු ගොවුවෙක්; අස්සසන්තා පස්සසන්තා, ආශ්වාස ප්‍රශ්වාස පවත්වන්නෝ-සුස්ම සුස්මා යු තැන්; නිබ්බිද්ධපිඞ්ගලානි, විනිවිද එතනෙලා පිඟුවූ කෘෂ්ණ මණ්ඩලය ඇත්තාහු; කම්මාරග්ගිවසිකාය හනන්තා විය, කඹුරු මිටියෙන් අන්නක්හු මෙන්; [7]අට්ඨට්ඨබටකෙ, අට අට වොක්කක්; වාහසහස්සානි, ගැල් දහසකින්; දණ්ඩෝ, දවන

1 පරික්ෂෙපකරන්නාක්මෙන් AC. 2 අනුබන්ධන්තො-මු අ. ක. 3 සිඞ්ගාහිකං A. 4 මණ්ඩූජාතියෙහි A. 5 විලුම්පිතො-මු. අ. ක. 6 හරිතමාත-මු. අ. ක. 7 අට්ඨට්ඨ මුණ්ඩකෙ E.

ලදු; ඛතා, ඛණා සමකරනලදු; අඤ්ඤත්‍ර ගතිවසා, ගතිවශයෙන්-උත්පත්තිවශයෙන්-ඊම වීතා ~

### 240. මහාපිඞ්ගලජාතකං.

---

## නවමො වග්ගො.

---

පඨවිජයමන්තං නාම, පොළෝ දනන මතුරු-පොළෝ තමහට නමන යු සේයි; ආවජ්ජනමන්තො, [1]වශ්‍ය මන්ත්‍ර-සියලු සතුන් තමා වසඟකරන මන්ත්‍ර යයි සේයි; සජ්ඣායිස්සාමීති, හදරා ප්‍රගුණ කෙරෙමියි; අඞ්ගණට්ඨානෙ, හෙළි තැනෙක්හි; පිට්ඨිපාසාණෙ, අතල ගලෙක්හි; සජ්ඣායං, හැදූරුම්; අඤ්ඤං විධිරකිතං, වෙන විධියක් නැත්තක්හු: සාමෙතුං, අස්වන්නට; තයාපි, තට වඩා; මහන්තං අකුසලං, මහත් පවක් නොහොත් මහත් නපුරෙක්; [2]මං ජානාසි න ජානාසීති, මා හඳුනෙහිද නොහඳුනෙහිදැයි විචාළේ; නොහොත් මාගේ ආඥා දන්නිද නො දන්නිදැයි සේයි. මේ මන්ත්‍රය ඉගෙන මත්වපියා ඉනිබ්බ මා සිතූ දෙයක් කෙරෙමියි සිතා මෙසේ කියා. සම්පටිච්ඡි, ගිවිස්සී; මාසපිට්ඨෙන, උඳුපිටියෙන්; ආණං සුත්වා, නියොග අසා; සො යස්මිං සිඞ්ගෙ නිසින්නො, හෙතෙම යම් සිංහයක්හු හිස්මත්තේ හුන්නේද; මුඛං උප්පීළෙත්වා, මුහුණ ඔබාගෙනැ; අප්පතිවත්තියං, අතිකක්‍ර විසින් නොපැවැත්විය හැක්කාවූ; [3]විජ්ඣිත්වා, ඇත-ඔවුනොවුන් විද හෝ; වල්ලූරං, [4]වැල්ලිහිරි මස්; දසීනං, සිංහයන්ට ~

### 241. සබ්බදාඨජාතකං.

---

අම්බලකොට්ඨකආසනසාලාය, එනම් ඇති හසුන්හල්හි; පානීයහාරකා, ඒ හසුන්හලට පැන් ගෙනෙන මනුෂ්‍යයෝ; ගද්දූලෙන, බලුකඳින්; න වස්සි, නොහැඬී; මං පියායතීති, මා කල් කෙරෙයි කියා-මා ගුණ වනැයි හෝ; විස්සට්ඨමන්තො, හරනලද මාත්‍ර ඇත්තේ; ධාතො යන්නෙහි අර්ථය සුහිතො යනු-සුවපත් වූයේ; අධිට්ඨිතමෙව, ඉටනලද්දේමැයි; පතිමානෙමි, බලමි; [5]සුපතු, නිදද ~

### 242. සුනඛජාතකං.

---

පච්චක්ඛාසි, හළි; ගන්ධබ්බකුසලෙ, ගායනා කරන [6]විද්දත් කුලෙහි; ගුත්තිලගන්ධබ්බො නාම, ගුත්තිල ගන්ධර්ව යයි කියා;

---

1 වෛශ්‍යමන්ත්‍ර F. 2 මයහං-මු අ. සා. 3 ඔවිජ්ඣිත්වා-මු. අ. සා. 4 වැල්ලිකිමස් BCDEF. 5 පසුපතු-මු. අ. සා. 6 විලත්කුලෙහි ABCDF. වියත්කුලෙහි E.

[1]**දරහරණං**, අඹුවන් රක්‍ෂාකිරීම්; **සුවෙඨ**, සෝෂා කල කල්හි; **උත්තමමුච්ඡනාය**, උතුම්කොට තත් සැරගීමෙන්. [2]ෂඩ්ජාදි පිණිස කියත්; **මුච්ඡනා**, තත් සරහා; **කිලඤ්ජකණ්ඩුවනං විය**, හුණපත් පැදුරෙහි තිය ගැහීමක් බඳුව; **මජ්ඣිමමුච්ඡනාය**, මධ්‍යම ස්වරූපයෙන්; **අයං විණං මුච්ඡතිති**, මේ ගායනා කරන්නට තත් සරහන වනැයි; **හඤ**, එබැවින්; **ලගෙගඩා**, අවුළුවා. 'සුසු' යී මීයන් පලවන්නට කියත්. **විපවුසො**, බැහැර ගියේ; **උපකාරං**, මෙහෙ; **සාකච්ජා**, [3]සසැදිලි-පුච්ඡායි; **එකතරස්ස**, එකක්හු; **න සම්පජ්ජති**, නොසැපවේ; **පත්තබ්බලජ්ජතො**, පැමිණිය යුතු ලජ්ජාවට වඩා; **නිවත්තනති**, [4]ආයේ නවත්නේය; **ජඞ්ඝාමග්ගො**, එක් පියවර මඟ; [5]**රමණීයං**, රම්‍ය වූ; **සුදඩදණ්ඩකමෙව**, තත් සුන් වීණාදණ්ඩමැ; **පාසසපිකා**, පසඇට; **වීණාඩුරෙ**, වීණා [6]අග්ගි-සමීපයේ හෝ; **චක්කාති චක්කා**, රියසක් ආදි සක් මත්තේ සක්; **උකකුටිඝි**, පොල්වර හඩ; **සාවෙනෙනා**, අස්වන්නේ; **හමරහනතිං**, බුරා බස්නා නායක තත; **ජාදෙඩා**, පැතිරු; **චෙළුක්ඛෙප**, පිළී හිස නැට වීම්; **විරජ්ඣිතවා**, විරොධවැ; [7]**සඤකාරං**, සමවූ ක්‍රියා; **අභික්කනෙනන**, ඉතා යහපත්වූ; **වණ්ණනාදසිකා**, උතුම් පිළී දුන්නී; **කාමවණ්ණිනී**, ඉච්ඡානුරූප වෙෂධාරීවූ; **සස්සුසසුරවතනං**, නැදිමයිල් වත්; [8]**සාගතං**, මොනොවට එන ලදි; **සුපපභාතං**, අද පහන්වූ තියා යහපති; **සුවුට්ඨිතං**, උදය නැගී සිටි තියා යහපති; **ඉමාසාහං**, ඉමාසං අහං; **සමචරියාය**, සම පිළිවෙතින්; **සංයමෙන**, කායාදි සංයමයෙන්; **දමෙන**, ඉන්ද්‍රියදමනයෙන්.

## 243. ගුත්තිලජාතකං.

---

[9]**එක නාම කිං**, එකෙක් නම් කිම; **නිගණ්හිතො**, පරාජය කරනලදි; **වනගන්ධපරිභාවිතං**, වෙනෙහි පුෂ්පගන්ධයෙන් සුවඳ කළ; **වාදෙන ඔත්ථරනෙතා**, වාදයෙන් මඩනේ; **ගඞ්ගා**, ගංගා නම්; **වාලුකා**, වැලිද-ගඞ්ගා නම් වන්නේ වැලි දූයි සේයි; **යං උදකං වා—පෙ—න තුස්සති**, යම් උදකයක් හෝ යම් රූපාදියක් හෝ ලබන්නේද ඒ ලත් දෙයකින් තුෂ්ටියකට නොපැමිණෙන්නේය-උදකාදිය දූක මේ උදකාදිය මූත් මේ හැර වෙන ගංගාවෙක් නැතැයි නොගැනීම් වශයෙන් හෝ නොහොත් රූපාදියට පැමිණ රූපයන් නිසා ආතම බැවහාර

---

1 දරාහරණං-මු.අ.කා. BCDEF. 2 ෂඩ්ජානි-හැම. 3 සසැදවීම් පාචජායි BCDE. 4 අය B. ආසේ D. 5 රාමණෙය්‍යං-මු.අ.කා. 6 අගෙග BCDE. 7 සමකාරකං--මු.අ.කා. සමකාරිං ABCDEF. 8 සවාගතං--මු. අ. කා. 9 එකං නාම කිං--මු. අ. කා.

මුත් ඒ හැර වෙන ආත්මයෙක් නැතැයි නොගැනීම් වශයෙන් ඒ ලද්දවූ උදකාදියෙන් තුෂ්ටියකට නො පැමිණෙන්නේය යනුයි. **එවං**, මෙසේ; **ගිලෙති**, ගරහා

## 244. [1]විතිච්ඡජාතකං.

**උක්කට්ඨං නිස්සාය**, එනම් ජනපදය නිසා; **අමෙහසි**, අප හා; **නානාකාරණං**, තොරතුරු; **අට්ඨසු භූමිසු**, "පුථුජ්ජනස්ස වසෙන එකා භූමි ඛීණාසවස්ස වසෙන එතසෙසා භූමියො [2]සෙඛානං වසෙන එකා භූමි තථාගතස්ස වසෙන ද්වෙ භූමියො"යි කියනලද අට බුමුයෙන්. මෙහි භූමි විභාග මූලපරියාය සූත්‍රයෙන් දතයුතු. **කිඤ්චි**, කිසිවක්; **මානපග්ගහිතසිරෙ**, මාන සිතින් හිවි [3]සිස් ඇතියවුන්; **අනුයොගං දත්වා**, පරීක්‍ෂා දී; **බදරී**, ඩෙබර; **අත්තනො වඤ්චනභාවං**, තමා වෙහෙසන බව; **සත්තාධිවචනං**, සතුන්ට නම්; **භද්‍රමුඛා**, යහපත් මුහුණු ඇතියෙනි; **කිං ජානිත්ථ**, කිම දතුද

## 245. මූලපරියායජාතකං.

**විහෙඨෙතුකාමා**, [4]වෙහෙසනු කැමැත්තෝ; **උද්දිස්සකටං**, තමා උදෙසා කළ; **ජානං භුඤ්ජති**, දැන දැන වළඳයි

## 246. තෙලොවාදජාතකං.

**පඤ්හං විනිවිජ්ඣනති**, පැන විසඳත්; **ඔට්ඨං භඤ්ජි**, තොල් බින්දේ; **ලාලො**, ජඩය; **දන්ධපරිසක්කනො**, දඳ පියෝ ඇත්තේ; **පස්සති නූනාති**, දක්නා වනැයි

## 247. පාදඤ්ජලීජාතකං

**කිංසුකා**, කැහැල; **ඛාණුකොරකකාලෙ**, කොළ වැගිර දලු ලූ කල්හි යයි සේයි; **බාලපලාසකාලෙ**, ළ පත් ඇති කල්හි; [5]**ඛාමඤ්ජුණා**, දූ කණු; **සිරීසො**, මහරි; **අපරිතුට්ඨා**, නොසතුටුවූවෝ; **විචිකිච්ඡථ**, සැක කරව්; **කඞ්ඛිංසු**, සැක කොළෝ; [6]**අප්පටිවිද්ධා**, ධර්මයන්ගේ ලක්‍ෂණ වශයෙන් ප්‍රතිවෙධ නොකළාහු

## 248. කිංසුකොපමජාතකං.

1 වීතිච්ඡා D. විතිච්ඡ E. 2 සාවකානං-හැම. 3 සිත් ඇතියවුන් A. 4 ජනයා වෙහෙසනු-හැම. 5 ඛාමඤ්ජුණො-මු. අ. ක. 6 අප්පටිවිද්ධතා-මු. අ. ක.

**පීළෙන්තො**, [1]පෙළන්නේ; **උපලාපෙති**, නළවා; **නෙව මං සහසි**, මා විෂයෙහි ඉවසිය නොහෙයි; **විනා වතතිතුං**, වෙන්ව වසන්නට; **සුභද්දකො**, මනා සිත් ඇත්තේ; **ධඤ්ඤවික්කයෙන**, ශාලිව්‍රීහ්‍යාදි ධාන්‍ය විකිණීමෙන්; **අභිගුණ්ඨිතො**, සපියන් ගත්තේ; **ජීවිකං කප්පෙසි**, දිවි පස්වැටී; **ධඤ්ඤාපණතො**, වී විකුණන සලින්; **වෙළුපෙසිකාය**, හුණ පත්තෙන්; **උපලාළෙන්තො**, නළවන්නේ.

249. සාලකජාතකං.

---

**කුහකවතතං**, තොහොන් වත්; **අවජිතනධාරෙ**, නිරන්තර ධාරා ඇති; **විසිබ්බෙස්සති**, සීත දුරු කරන්නේ; **සිසිරස්ස**, සීතට; [2]**අනුබන්ධජෙ** යන්නෙහි අර්ථ 'පවිසෙය්‍ය' යනුයි; [3]**උම්මුක්කං**, ගිනි පෙනෙහෙලි.

250. කපිජාතකං.

---

## දසමො වග්ගො.

---

## දුකනිපාතවණ්ණනා නිට්ඨිතා.

---

**අලඞ්කතපටියත්තං**, සදා පිළියෙළ කළ; **ආයසක්‍යං**, අය සට; **පුරාණපණ්ණසමං**, [4]පරඬලාපත්; [5]**තාදිසකං**, තා බඳු වක්හු; **මහාසාලකුලෙ**, [6]මහසල්කුලෙහි; [7]**හිරඤ්ඤාලොකන කම්මං කරොන්තො**, ඒ ඒ ස්ථානයෙහි තුබූ වස්තු බලන්නේ; **සමහතං**, රැස් කරනලද්ද; **උඤ්ඡාචරියාය**, පතාපැකි සෙවී මෙන්; **ජඞ්ඝාවිහාර**, කකුල් ගමන්; **පටිසල්ලානසාරුප්පං**, විවෙකයට නිසි; **සණ්ඨපෙත්වා**, මොනොවට තබා-වල්තලා හැඳ දළමඹුලු බැඳ අඳුන් දිවිසම් [8]එකාස් කොට බහාලාය යි සේයි; **හිරොත්තප්පමත්තාය**, විශෙෂයෙන්ම; **ඛහිසිතුං**, තවත් නට; **හසිතථ**, බව්; **විසභාගාරම්මණං**, නොසුදුසු අරමුණු; **නිස්සෙණියා**, හිනින්; **කම්පපරියොසානං**, දුවන්; **විප්පලපන්තො**, හඬන්නේ; **උක්කලාපං**, කසළ; **පියට්ඨානං**, ප්‍රිය තැන්; **වෙධං**, විදි තැන්; **රාගරත්තෙන**, රාග නැමැති ජල යෙන් ඥෙනාලද; **නිහිතෙන**, මූවහත් තබනලද; **සාව කණ්ණචූළිකං**, කන්සිළ දක්වා; **අනනුපසෙවනෙන**, නොසදනලදු

1 පෙළෙන්නේ ACF. 2 අවජෙ-මු. අ. කා. 3 උම්මුකං-මු. අ. කා. 4 පරණ ලාපත් A. 5 තාදිසං-මු. අ. කා. 6 මහත් කුලෙහි . 7 හිරඤ්ඤලොකන-මු. අ. කා 8 ඇකස්කොට A.

යෙන්; **අග්ගිපදිත්තානි ඉව**, ගිනි ගෙනැ දිලියෙන්නාක් මෙන්.

## 251. සඞ්කප්පජාතකං.

**උපායසබහුලො**, බද්ධවෛරී-කිපුම් ඇත්තේ හෝ; **කුප්පි**, දූහැවී; **අභිසජ්ජි**, සැටිණි; **අප්පච්චයං**, රැහැණි; [1]**එකපටලිකඋපාහනා**, එක්පට වහන්; **ඔමුඤ්චිත්වා**, ගලවා; **අපනාමෙත්වා**, හිසින් පහ කොට; **ආගන්තුකසඞ්ගහං**, පාද ධොවන තෙලම්කබ්භ පානීයප්‍රවජිත ඈ [2]අමුතුවන් සඟරා; **සඞ්ඝාටිකං**, දහසින් බඳ පියල්ල; **සල්ලහුකෙන**, ලඝුවූ; **තිලෙ සෙතෙ කත්වා**, තල හෙළ කොට; **තණ්හාලුකො**, තෘෂ්ණාපර බව ඇත්තේ; **ගිජ්ඣයා**, ගියේ; **පසර**, පෙරෙව්ද; **සඤ්ඤාපෙතුං**, ගිවිස්වන්නට; **අනුතාළනගහණාපෙක්ඛං**, 'යං මං' යනුයෙහි ද්විතීයා අනුතාලනාපෙක්ෂා යි. 'බාහාය මං ගහෙත්වාන' යනුයෙහි ද්විතීයා ගහණාපෙක්ෂා යි. [3]**වෙළුයට්ඨියා**, හුණ ලීයෙන්; [4]**අරියෙ**, උතුම් ආචාරයෙහි; **යො වද්ධමපචායති**, යො තං වද්ධං අපචායයි; **අරියාවකාසොසි**, උත්තමවූ ශරීර ශොභා ඇත්තෙහි; **ලිඞ්ගගහණෙනෙව**, වෙෂග්‍රහණයෙන්මැ; **ඡදනං කත්වා**, මුවහ කොට; **සුබ්බතානං**, මනා ව්‍රත ඇති බුදු පසේබුදු රහතන්; **පක්ඛන්දි**, පතන සුලුවූ-කිපෙන සුලුවූ හෝ; **පක්ඛ වෙරඝං කම්මං**, පණිවා ඈ පස්කම්; **පහරණකෙන**, ශස්ත්‍රයෙන්; **සාසනත්ථං**, අවවාද පිණිස; **අනුසත්ථි**, අවවාදයි; [5]**පූපසක්ඛලිකා**, පූ කැබැලි-නොහොත් උඳු තත දෑ ආදී. [6]කර නොවූ දෑ පූ නම්. කරවූ [7]ලහලු සක්ඛලික නම්. **සභණ්ඩං**, බඩු හා සමඟ; **දණ්ඩං පණෙත්වාති**, දණ්ඩන කරවයි.

## 252. තිලමුට්ඨිජාතකං.

**අඞ්ගාලවෙ චෙතියෙ**, එනම් දෙවාලයෙහි; [8]**සකඤ්ඤාවිකායො**, තමා විසින් ඉල්වන ලද [9]වෑ ආදී උපකරණ ඇති; **පුරිසක්කාරං**; පුරුෂයන් ලවා හස්තකර්මය; **උබ්බිජ්ජිංසු**, තල කිරුණාහු; **උත්තසිංසු**, භයපත් වූ; **සමොදනත්ථං**, සතුටු වන තෙපුල්; **විනොදෙත්වා**, දුරු කොට; **විනිවෙඨෙත්වා**, හුනා; **උම්මුජ්ජමානමෙව**, නැඟෙන්නාහුමැ; **අට්ඨපානක**, අම්බ ජම්බු චොච මොච මධු මුද්දික ඵාරුසක සාලූක යන අටපනු. [10]**න දස්සං ති**, නො දෙන්නෙම් නොවෙමි; **කාලපාසාණෙ**,

---

1 එකපටලිකඋපාහනා-මූ. අ. ක. 2 අමුතු සඟරා A. 3 වෙළුලට්ඨියා-මූ. අ. ක. 4 අරියාචාරෙ-මූ. අ. ක. 5 පූවසක්ඛලි-මූ. අ. ක. A. 6 කරණවූ A. 7 ලහැළුA. ලඝුලු C. 8 සකුඤ්ඤාවිකාය-මූ. අ. ක. 9 වෑ ABCD. 10 නදස්සං A.

තෙල්සණ; **ධොත**, සණ [1]ගා ශුද්ධ කරනලද; **කඤ්චනච්ඡරු**, රන්වන් මිටි ඇති; [2]**අබ්බහිත්වා**, කොපුයෙන් හයාගෙන......

## 253. මණිකුණ්ඩජාතකං.

**ධම්මඝොසක**, ධම්මඝොසක භික්ෂුහු නම් ආ ආ උපාසක වරුන්ට වහන්සේවරුන්ද විචාරා පාවාදෙන භික්ෂුහුයි; **පටිවිංස**, කොටස්; **උස්සූරෙ**, හිරු නැගි කල්හි; **වලඤ්ජත්වා**, තමන්ට අනුභවයට ගෙන; **මහල්ලිකගහපතානිං**, ගෙහිමි අඹු; **ගබ්භවුට්ඨානං**, ප්‍රසව වීම්; **වෙතනං**, නවාතැන් මිල; **වෙතනතො බණ්ඩත්වා**, නවාතැන් මිලයට කඩා; **අවස්සාවන**, [3]බත්නි වූ කැඳ; **ඛාමකභත්තං**, දඹුබත්; **විඝාසතිණං ච**, කා ඉතිරි තණද; **කුණ්ඩක**, කුඩු; **ගන්ධං**, තෙජස් සහිත ශරීරගඳ; **ඝායිතුං**, කන්නට; **පතිමානෙන්තො**, බලන්නේ; **කුණ්ඩකකුච්ඡික**, කුඩු කන කුස් ඇති; **සමානෙත්වා**, විචාරා; **ඔදනකඤ්ජිකං**, තිය හුණුකැන්; **පිණ්ඩරස**, මස්රස; **එකෙකං**, වෙන් වෙන් කොට; **පුට්ඨපොසාවනිකං**, වැඩූ මිල; **ඔදනාවස්සාවනං**, [3]බත්නි වූ කැඳ; **ආචාමකුණ්ඩකං අපි**, [3]බත්නි වූ කැඳ හා කුඩුත් ලබන බව යහපතැයි; **අත්ථරකං**, ඇතිරි; **ඉමෙ අස්සස සූඩකානොපි ගමාචෙස්සති**, සෙසු මොහුගේ වික්‍රම කියනු කිමිද? මොහුගේ වික්‍රම දුටුවෝ සුංවත් ගන්නා තැනින් මේ අසුන් සුංවත් කොටස පොවා නොගන්නාහ. එහෙයින් මේ සෛන්ධවතෙම සෙසු අශ්වයන් සුංවත් ගන්නා තැනින් පොවා මුදන්නේ යයි කී. **කාපෙපත්වා**, සදා; **වාහෙසි**, දිවී; **උදරෙ පරික්ඛිපිත්වා**, තමන් බඩ සිසාරා බැඳ; **ඔසාරයිංසු**, එල්වූ; **ඛායි**, දිලිහිණි......

## 254. කුණ්ඩකකුච්ඡිසින්ධව ජාතකං.

**අජිණ්ණකෙන**, අජීර්ණයකින්; [4]**අතිභොජනෙන**, අධික කොට කෑමෙන්; **අතිධාතතාය**, ඉතා කෑ බැවින්; **ඔසිදෙන්තො**, පාතට බස්නේ; **ජීවිතද්ධානං**, දිවි පවත්නා කල්; **අලලං**, [5]දුනු; **සුඛකං**, [6]හුනු; **බාළ්හා සුහිතො න සියා**, අධික ව පිරුණු කුස් නො ඇත්තේ; **ඌනූදරො**, සා කුස් ඇත්තේ; **මිතාහාරො**, පමණින් යුත් අහර ඇතියේ; **සතො**, සිහි ඇතියේ; **පරිබ්බජෙ**, පවත්වන්නේයි; **පතිතකතස්ස**, [7]ප්‍රතිපත්ති විෂයෙහි මෙහෙයනලද ආත්ම ඇති; **වෙදනා**, දුක් වේද

1 ගහා A. 2 අබ්බාහිත්වා-මු. අ. ක. 3 බත් තිඹු කැඳ BCDEF. 4 අතිභොජන පචමයෙන-මු. අ. ක. 5 හැදුණු A. 6 හුරු-හැම. 7 ප්‍රතිපත්තිවශයෙන් පහෙණි මෙහෙයනලද A.

තාවෝ; මනුජස්ස, මනුෂ්‍යයාට; සණ්ඨානං, සෙමෙන්; ආයුපාලයං, දිවි රක්නේ; අක්ඛස්ස අබ්භඤ්ජනං යථා, අකුර ගහනා වදනක් මෙන්. වදන නම් තෙලි. අමුච්ඡිතො, ගිජු නො වූයේ ˜

## 255. සුකජාතකං.

---

පුරාණඋදපානං, පරණ ළිඳක්; අයං, යකඩ; පටිසාමෙත්වා, නගා තබා; සිද්ධයත්තා, සිද්ධයාත්‍රා ඇත්තක්හු; එත්ථ, මේ ළිඳෙහි; උත්තණ්ඩගලං කත්වා, නගුල් උඩ බඳවා; තිපු, කළු තුඹ; සීසං, සුදු තුඹ ˜

## 256. ජරූදපානජාතකං.

---

වත්ථුවිජ්ජා, බිම් ලකුණු දන්නා විද්‍යා; විනිච්ඡයසුත්තං, යුක්තිශාස්ත්‍රය; චිත්තවතො, සිත් ඇත්තක්හට; අවස්සයො, පිහිට. [1]සත්ථං, අනුශාසනා කරනලදී; 'නායං කිඤ්චි විජානාති' යන ගාථාපදය 'නායං කිඤ්චි න දූසයෙ'යි පෙළ පැනෙයි. ඒ පදයට අටුවා නැති බැවින් ඒ නොගෙන 'නායං කිඤ්චි විජානාති'යි ගන්නේ. විචාරිතමෙව, දෙකමැ යහපතැයි නිශ්චය කරනලදී; සඤ්ජනිතො, ගළපන බැවින්; පරිචයෙන, ගෙට වැද පරිචය හෙයින්; [2]ථාලං, බත් කන තල්ල; [3]ථලකං, පුවරුව; [4]ඔලියනෙතා, හැකිළෙන්නේ; වජං, ගොවුද; ගීවං, ණයක්; අයං තෙ රාජදූතො, මේ තට රාජදූත යි. රාජදූත නම් ආඥායෙන් යුත් බොල ආදි යි. පතිතො, බිම හී බිහි වී; එකතො පපාතං, එක් දිසායෙකින් සෙල් වූ; [5]බද්ධපබ්බකං, බිම් හා එක් බැඳි පවුවක්; කිලඤ්ජං, හුණුපැදුරැ; [6]විනාති, වියෙත්; පපාතපස්සෙ, ගල්සෙල් සමීපයෙහි; අජ්ඣුසනෙතා, නොපහර තෙම්; වම්මිකපාදෙ, තුඹස් සමීපයෙහි; පලලවමුට්ඨිමත්තං, පලුපත් මිටක් පමණ; පණ්ණපරියොනද්ධං, සෙවෙලින් වළඳ නාලද; කසටානි, කසට රස; පාකටං, පුහුණු; පරිහරි, පරිහරණය කොළේ; විස්සත්ථො, නිසැකව; [7]විහාවෙතුං, සාධන්නට; මා මෙ ගෙහං ගච්ඡිති, මාගේ අඹුව ගෙනැ මාගේ ගෙය නො නැසුව මැනවැයි; පිණ්ඩපතිපිණ්ඩකෙන, තමාගෙන් උන්ට දී නැවත උන්ගෙන් තමා ගැන්මෙන්; ජාරෙ, වීරසැමි; හතිං, බැළ-පණයම්; ලඤ්ජවිත්තකො, අත්ලසින් සතුටු වන්නේ; බ්‍රහ්මදෙය්‍යං, උතුම් දන් ˜

## 257. ගාමණිචණ්ඩජාතකං.

---

1 අනුසත්ථං A. අනුසිට්ඨං BCDEF. 2 ථාලකං-මු. අ. සා. 3 ථාලකං-මු. අ. සා. 4 ඔලොසෙනෙතා-මු. අ. සා. 5 පබ්බතං-මු. අ. සා. 6 විනාති-මු. අ. සා. 7 සාධෙතුං-මු. අ. සා.

පරිත්තදීප, ක්ෂුද්‍ර දීප; මනුස්සපරිභොගෙනෙව, මිනිස්සැපි යෙන්මැ; චතූහි ඉද්ධීහි, අභිරූප දීඝායුක අප්පාබාධ බ්‍රාහ්මණ ගෘහපතීන්ට ප්‍රිය බව යන සතර සෘද්ධීන්; සමන්නාගතො, යුක්තවූ; දිබ්බමෙඝො විය, දිව්‍ය වර්ෂාවක් මෙන්; අබ්භුක්කිරිත්වා, "පවත්තතු භවං චක්කරතනං" යනු කියා දිය ඉසැ; දීඝො අද්ධා වීතිවත්තො, බොහෝ කල් ඉක්මිණි; පරිනායකරතනං, සෙනෙරත්; භක්ඛිත්වා, ගිලී; අනුට්ඨානසෙය්‍යාය, නො නැඟෙන හෙවීමෙන්; සිනෙරුං පරිහරන්ති, මහමෙර සිසාරා ඇවිදිත්; අභිරබොති, සවාමීහයි; භුජිස්සා,[1] නිදහස්; ධම්මසවණෙන [2]ජානන්තා, ධර්මශ්‍රවණපර්‍යාප්තියෙහි රහත්වූ හෙයින්.

258. මන්ධාතුජාතකං.

---

උස්සීසකමනිස්සාය, පැන් තබන පිණිස; [3]රජ්ජුහටකං, [4]මදුබඟන්; අපාපුණන්තෙ, නොපෙවෙන කල්හි; වම්මිත, පොරෝනාලද; සම්බාහිත්වා, මැඩ; සුතබද්ධම, අසන තැන් ආදි දීමෙන් නැවූ; සිප්පබද්ධම, ශිල්පයෙන් නෑ; යසදන්තා, යාගවන බැවින්.

259. තිරීටවච්ඡජාතකං.

---

භොජනසුද්ධිකො, ආහාරසුද්ධි ඇත්තේ; සතරස භොජනං, සියක් රසබොජුන්; පිපාසං, ආසා; අසිගාහො, කල් වඩන්නේ-අසිගාහා හෝ; අබ්භාහෙසි, ඇයි; උදරදූතො, උදරයාගේ දූතයෙමි; රථයොධජෙට්ඨකා, රථයෙහි සිට යුද්ධ කරන්නන්ට ප්‍රධානය; යුද්ධපරිණායකො, සමූහයට නායකවූ; සුතවිත්තකතාය, යාපත්වූ ශ්‍රැතයමැ ධනකොට ඇතිහෙයින්-බොහෝ ශාස්ත්‍ර දන්නා බැවින් හෝ.

260. දූතජාතකං.

---

## පඨමො වග්ගො.

---

උප්පලවීථිං, මහනෙල් විකුණන වීථියට; [5]වත්තුං ඡෙකා, බණන්ට දක්ෂයෝ; කථාකුසලා, කථායෙහි දක්ෂයෝ-හෙවත් චක්ෂුරාදිවූ වස්තුවර්ණනයෙහි දක්ෂවූවාහු; සරදසමයෙ, වස්කාලයෙහි; නික්ඛිත්තං, ක්ෂෙත්‍රයෙහි බහාලූ; ඝරෙ දත්වා, ගෙට හැර දී.

261. පදුමජාතකං.

---

1 නිදහස් C 2 ජාතො-මූ. අ. ක. 3 රජ්ජුහටං-මූ. අ. ක. 4 පදුබහන් BCDF. 5 වත්තුමෙජකා-මූ. අ. ක.

**අපරභාගෙ**, ඉක්බිති; [1]**අත්තනො ඡන්දෙන**, තමා අභිප්‍රායෙන්; **පිතුවචා**, නැඳි; **උදකභාසි**, කිවූ; [2]**ආනඤ්ජකාරණං**, හික්මවීම්; චතුරඞ්ග නම් මැඳින්යම කළුවර දෙපොහොය නැඟු මහාමෙඝය සහ වනය යන සිවුරඟ. **සජ්ජං කත්වා**, යොග්‍ය කොට ගෙනැ; **ආකාසඞ්ගණෙ**, සඳල්ල; **අලීයාපෙත්වා**, ඇලවා සිටුවා-වතුරුවා හෝ; **පදුමකෙ**, සිට නහන රන් පියුමෙහි; **ලඤ්ජෙත්වා**, හසොබා; **අප්පටිවාරණො**, අපගතවූ තෘෂ්ණා නැත්තේ-නො නවත්නේ හෝ; **භායෙර**, පිරිහෙත්; **අජ්ඣෙනං**, හැදෑරීම්; **පත්ථද්ධගීව තක්කරා**, මං පහරන සොරුන් මෙන්; **ගණං**, පරිවාරද; **පජානනං**, ප්‍රඥ ද-හෙවත් දැනීම්ද; **කට්ඨපුඤ්ජං**, දර රැසක්.

## 262. මුදුපාණිජාතකං.

**අනපෙච්ච හුත්වා**, දරුවන් නැතිවැ; **දුහිත්වා**, දෙව. **ඣානාගාරං** [යනු] විසභාග ජනයන්ගේ සඤ්චාර රහිතව භාවනාවට යොග්‍ය වනහෙයින් කියත්. 'අතිත්ථිගන්ධකුමාරයා' යි නම යි. **කන්දමූල**, අලමුල්; **අබ්බාහෙත්වා**, හයා; **කාමාවට්ටෙන**, කාමතැමැති සළාවැටුමෙන්; **ආවට්ටනතො**, අවුළුවන බැවින්; **විකොපනා**, විකොවුනෝ; **සිම්බලිතූල**, හිඹුල් පුළුන්.

## 263. චුල්ලපලොභනජාතකං.

**ජාතියාවෙන**, දැසමන් වෙනෙහි; **කොපිගාම** නම් එනම් ගමෙකි; **අපෙපත්වා**, ආපොකසිණයට සමවැද; **පුරෙ පබ්බජිත්වා** විය, පෙර මහණවූවා මෙන්; **සඞ්ඝාටෙ**, අගුළෙහි; **ථූපිකං**, කොත්කැරැල්ල. "තෙ ඉමං පාසාදං" යන්නෙහි "තෙ පිතා පුත්තා" යි නළකාරසමයෙහි පිතෘපුත්‍රවූ මහාපනාද රාජ සඞ්ඛ චක්‍රවර්ති දෙදෙනා නිසා උපන් හෙයින් ඒ දෙදෙනා අපෙක්ෂා කෙළේ. තිරියං [3]**සොළසඋබ්බෙධො**, පළලින් සොළොස් ශර යක් විදිනා පළල ඇත්තේයි; **උච්චං**, උසින්; **සහස්සධා**, දහසක් ශර පමණ යි; **සොළසකණ්ඩපාතවිත්ථාරො**, සොළොස් හීසතක් පමණ පළල ඇත්තේ යි; **සහස්සකණ්ඩගමනමත්තං**, දහසක් හීසන් පමණ; **උබ්බෙධා** අහු, උස් ඇත්තේ වී; 'සත හෙද්දෙ' යනුයෙහි අර්ථ 'සතභූමකො' යනු; [4]**සතභෙදෙ**, සියක් බුමු; **හරිතමණි** [5]**පරික්ඛිත්තා**, උචිතස්ථානයෙහි නිල්මිණි ඔබා

1 අත්තනො නමෙබන A. අත්තනො නබෙන-මූ. අ. ක. 2 ආනඤ්ජකාරණං-මූ. අ. ක. 3 සොළසපබ්බෙධො-මූ. අ. ක. 4 සතභෙණ්ඩ BCD. 5 පරික්ඛිත්තො-මූ. අ. ක.

කරන ලද්දේ යි; ද්වාරකොට්ඨකම, මහදොර; කායවෙය්‍යාවච්ච කරො යනු ප්‍රාසාදනිර්මාපණාදිය ගෙනැ කීහු~~~

### 264. මහාපනාදජාතකං.

---

අටවිආරක්ඛකා යනු යන එන මිනිසුන් අතින් බැල ගෙනැ උන්ට රකවල් ගෙනැ අටවියෙන් ඈත් කරන්නෝයි; උට්ඨිංසු, පැන හුන්හු; ඵරසුධාරෙ, සතර තිමවා ගිය තැන; ඛුරප්පෙ, ශර; මරණෙ විප්ලුලෙහ, මරණ පැමිණි කල්හි; එරුදණ්ඩකෙහි, කඩුමිටින්; නිහනන්තිං, තෘෂණා~~~

### 265. ඛුරප්පජාතකං.

---

අටනිං, හැඳ වල්; මෙ ඉස්සරියං, මාගේ ගම්; අජ්ජ නං මධුකුං ඛාදවා, අද මොහු කර බහවාපියා-නොහොත් රැහැණි කොට; [1]නිබන්ධෙය්යසි, බැම්; ඔසක්කිත්වා, පසුබැස; වාතග්ගසින්ධවො, වාතගති හා සමානවූ ගති ඇති හෙයින් වාතග්ගසින්ධව නම්; උපනිජ්ඣායමානො, හිඳුනා කල්හි; දන්තමූලං. සකු මුල්; ගබ්භිනභාවො, එබි ඇති බැව්~~~

### 266. වාතග්ගසින්ධවජාතකං.

---

උද්ධාරසාධනත්ථාය, දරදී එලවන පිණිස; උදකාරහදෙ, විල්; බලමණ්ඩල, කලවිටිමඩුලු; ඝණොරු, ඇතිති; විසදසූනං පතෙතා, විය පැමිණියේ; ලොහසලාකං විය, යකදක් මෙන්; අලද්ධමෙයෙන, දළදෙකින්; සිඞ්ග, අං; සබ්බසඞ්ගාහිකාවසෙන, හැම තිරශ්චීනයන්ට සාමාන්‍යයෙන්; චාතුරන්තාය, සතර සාගරය කෙළවර කොට ඇති; [2]සත්ථම්භි, තිහිය කෙළේ; මද්දි භවගෙන, මදවන කල; පවුසිංසු, ගෙනයන ලදහු; ආලම්බර මෙඝො විය, ආලම්බරමෙඝයක් මෙන්. ආලම්බරභෙරිහුගේ ධ්වනියට බඳුවූ ධ්වනි ඇති මෙඝ යයි; එනන්ති, ශබ්ද කෙරේයයි~~~

### 267. කක්කටකජාතකං.

---

දක්ඛිණගිරිජනපදෙ, දකුණුගිරි නම් දනව්වෙහි; විරල, තුනු; උපරොපකෙසු, ගිදුවූ පැලයෙහි-[3]පැලයෙහි හෝ; [4]වම්ම සමෙ, සම්කල; උදකං [5]උස්සිඤ්චිත්වා, දිය ඉසැ~~~

### 268. ආරාමදූසකජාතකං.

---

1 නිබන්ධවෙසි BCDF. 2 සත්ථමෙහත්වා-මු. අ. ක. 3 පැලයෙහිහො A. පැලයෙහිහො BF. 4 චම්මසවකෙ-මු. අ. ක. 5 සිඤ්චිත්වා-මු. අ. ක.

සුණිසං, යෙහෙළිය; කුලසුණ්හා, කුලදූ; ඛණ්ඩිතසොතා, යොමු කල කන් ඇත්තී; පදුට්ඨචිත්තා, රොෂ සිත් ඇත්තී; අහිතානුකම්පිනී, අහිත කරන්නීද; [1]අඤ්ඤදුස්සු, පරපුරුෂයන් කෙරෙහි; උස්සුක්කා, උත්සාහ ඇත්තීද; සාමිකො යං ධනං වින්දති—'පටිලභති' යූ තැන්; අභිවඩ්ඪං, කරන්නේ; [2]අකාමකාමා, ස්වාමීහු නොකැමැති දූ කරන්නීද; මහග්ඝසා, බොහෝ කන්නීද; දුරුත්තවාදිනී, නොකියයුතු පරුෂ කියන්නීද; [3]උට්ඨායිකා න, කර්මාන්තයෙහි නොමෙහෙ [4]නොයෙදෙන්නී ද; අභිභුය්‍ය, ස්වාමීහු මැඩ; අය්‍යා ච, [5]ස්වාමිදූ යයි කියා ද; හිරීමනා, ලජ්ජා සහිත සිත් ඇත්තී ද; චිරස්ස ආගතං, බොහෝ කලකින් ආ; සඛාරං, යහළුවක්හු දූක සතුටුවන්නාවූ; සඛී ඉව, යහළුවක්මෙන්; [6]කොලිනියා, උතුම් කුලෙහි වූ; [7]අක්කුට්ඨා, ආක්‍රොශ කරන ලද්දී—දූෂිව බණන ලද්දී හෝ; තිතික්ඛති, ක්ෂමාකෙරේ ද; චිරරත්තසංවුතා, බොහෝ කලක් කායද්වාරාදියෙන් සංවෘතවූවාහු; සරසුණ්හං, [8]ගෙහිමැ වූ යෙහෙළිය; අවස්සුතං, කාරණයක් නැති කොට; [9]අනුනයප්පං, ගිවිස්වනු පිණිස; කිංකිසකුණො, කිරලෙක්; එකා කොකිලා, එක් කෙවිල්ලක්; සරෙ සම්මත්තා හුත්වා, ශබ්දයෙහි මත් වැ; සණ්හවාචෙ, මට තෙපුල් ඇත්තිය; සඛිලවාචෙ, මිහිරි සිතිදු තෙපුල් ඇත්තිය; කථානිග්ගොසස්ස, කාව්‍ය [10]බණන කල කටින් නික්මෙන හඬ; ඛරවාචා, කෘර තෙපුල්; දුබ්බණ්ණං සරීරවණ්ණතො, ශරීරයෙන් දුර්වර්ණවූයේ; ඔනතාය, නුවණින්; [11]කාරණනිස්සිතං කත්වා, [12]හෙතුපපන්න කොට; සඤ්ඤාපෙසි, ගිවිස්වී—

## 269. [13]සුජාතජාතකං.

---

සත්තට්ඨනාළිමත්තානි, සත්අට [14]ලාසක් පමණවූ; [15]පඨමකප්පියකාලතො පට්ඨායාති, ප්‍රථම කල්පයෙහි වූ සත්වයන් පටනැයි; ආණාසම්පන්නං, ආඥ සම්පන්නවූ; අප්පතිස්සවවාසො, ප්‍රධානයක්හු නැති වැ විසීම්—ඔවුනොවුන් කෙරෙහි අනාදර බැව් හෝ; පවෙණිආගතං, පරම්පරායෙන් ආ;

1 'අඤ්ඤදුස්සු' යන්නෙහි පටන් 7 වැනි පෙළේ 'පරුෂ කියන්නීද' යනු දක්වා A හි පමණක් පැනේ. 2 අකාමකාමා-මු. අ. ක. 3 උට්ඨායිකා නං-මු. අ. ක. 4 යෙදෙන්නීද--හැම. 5 ස්වාමිහුයයි B CDF. 6 කොලෙය්‍යකා-මු. අ. ක. 7 අක්කුට්ඨ සන්තා-මු. අ. ක. 8 ගෙහිමබු A. ගෙය මව් B. ගෙහිමව් CD. 9 අනුනායනත්ථං-මු. අ.ක. 10 බඬන කළBCDEF. 11 කාරණසන්නිස්සිතං-මු. අ. ක. 12 හෙතුපයන්නා කොට A. 13 සුජාතජාතකං-මු. අ. ක. 14 ලාස්සක් CD. 15 පඨමකප්පිකා-මු. අ. ක.

[වචනං], කාරණ සහිත වචන; ඤාණොභාසධරා, ඤාණ නැමැති ආලොක ධරන්නාවූ—

270. උලූකජාතකං.

## දුතියො වග්ගො.

කිච්ඡා, දුකින්; [1]අවාහසි, නැසීද; එසිතගුණතනා, සො යන ලද ගුණ ඇති හෙයින්; ඌහදම, පුරීෂ විදුමෙය්; ඔමුත්තෙනමපි, මූත්‍ර ද විදුමෙය්. "තුම්හාකං ධම්මං වා අධම්මං වා" යනාදි ඔවුන් කෙරෙහි ධර්ම මේ ය අධර්ම මේ ය යන ව්‍යවස්ථාවක් නැති හෙයින් ධර්මාධර්මව්‍යවස්ථාව ඔවුන් නො දක්නා හෙයින් කියත්—

271. උදපානදූසකජාතකං

සංසග්ගම්පි න සහති, කැටි වැ හුන් කල තමාගේ නුගුණ පෙනෙන හෙයින් [2]එක්වත් නො කැමැත්තේ; වියොගම්පි, කැටි වැ හුන් කල ප්‍රත්‍යයාදියෙන් ඵාසුහෙයින් හෝ දුර හුන් කල නුගුණ කියතී කියා හෝ වියොග වැ වසන්නාත් නො කැමැත්තේ; [3]අරඤ්ඤෙ, අරණ්‍යයෙහි; [4]යොගක්ඛෙමා, කයින් සිතින් විඳිනා සුවයෙන්; පුබ්බවජ්ඣාභවං, තමාගේ ජීවිත යස ලාභ පිරිහෙන්නාට පළමු කොට; [5]සමුල්ලාපසංසග්ගා, කථාකිරීමෙන් සසඟ; පරිභොගසංසග්ගා, කැටි වැ ආහාරාදි අනුභව කිරීමෙන් සසඟ; රක්ඛෙය්‍ය, තමාගේ ලාභ යස ජීවිත රක්‍ෂා කරන්නේයි—

272. ව්‍යග්ඝජාතකං.

සලාකපවෙසනකම්මං, ලහ යවන ක්‍රියාව; දවං, කෙළි; උද්දිනහත්ථෙනාව, බත් පිරුණු පාත්‍රයක් අතින් ගත්තක්හු සෙයින්; [6]ඝනතාවඩ්ඪිතිකං, බත් ඇවිස්නාලද: වාචනකං, වෙදකී තැන ලද වසතුව; පුණ්ණහත්ථො, වසතුවෙන් පිරුණු අත් ඇති; [7]සද්ධභත්තං, දන්බත්; [8]අනාමසිතබ්බට්ඨානානි, නො පිරිමැන්දැයුතු තැන්. [9]'තයිදං' යනු 'මෙථුනකං' යනු හා සම්බන්ධ කරනු—

273. කච්ඡපජාතකං.

1 අවාහසී--මු. අ. ක., අවාහසි, දූෂ්‍ය C. 2 එක්වීමක් A. 3 අරඤ්ඤායතනෙ-මු. අ.ක. 4 යොගක්ඛෙමො-මු.අ.ක. 5 සමුල්ලපනසංසග්ගා C. 6 ඝනතාවඩ්ඪිත--හැම. 7 සද්ධාභත්ත-හැම. 8 අනාමසිතබ්බානි ඨානානි-මු. අ. ක. 9 තං ඉදං BCDEF,

**නීලපච්ඡිං**, කදලු පැස්; **පාරාපත**, [1]පරෙවි; **ඔසක්කිත්වා**, [2]පසුගැසීගෙනැ;] **ගොමයරාසිං**, ගොමරුසක්; **විද්ධංසිත්වා**, විසුරුවා; **ථුසපච්ඡිං**, තොපැසක්; **අජිණ්ණසඞ්ඛා අත්ථි**, කෑ දේ නො දිරුණු සැකයෙක් ඇතැයි; **රසකගෙරපිමත්ථකෙ**, රස පෙරහන කොරමරුව මත්තෙහි; **නිත්ථනන්තං**, කොඳුරන්නහු; **දවං කරොන්තො**, කෙළෙනේ; **අනනුසඤ්ඤය**, නො අදැළු හෙයින්; **ලඞ්ඝනතො**, නැගෙන හෙයින්. ලඞ්ඝී නම් මෙෂ යයි; **කණ්ණසදිසෙන**, මිඩෙරුවක් වැනි; **ලූනං**, පත් සිඳුනාලද—

## 274. ලොලජාතකං.

**ගාථාපි**, ගාථාවෝ ද; **එකන්තරිකා එව**, පළමු ගාථාව බොධිසත්වයෝ කිහ, ඉක්බිති දෙවන ගාථාව කවුඩු කීය, තුන්වන ගාථාව බොධිසත්වයෝ කිහයි කියා මෙසේ ගාථාවෝද ඉක්බිති ඉක්බිති වූහ යි යනුයි; ශිලක්ඛිං, තොපැසැ; **සාමාක**, බොඩහමු; **තිණබීජ**, බොඩහමු බිජු—

## 275. රුචිරජාතකං.

[3]**වාලිකාපුලිනෙ**, වැලිතලායෙහි; **තියංසං**, තුනැස්; **සකලත්තවාසං**, අඹුවන් සහිත වැ විසීම්; **අප්පමත්තකෙසුපි ඨානෙසු**, [4]මිඳ දෙයෙක්හි පොවා; **දසරාජධම්මෙ**,

“දානං සීලං පරිච්චාගං අජ්ජවං මද්දවං තපං
අක්කොධො අවිහිංසා ච ඛන්තී ච අවිරොධනං”.

යන දසරජධම්; **රජ්ජුගාහක** නම් යට ගසා කොත් බෙදනුයේයි; **දෙණ්ණමාපකො**, වී මණන්නේයි; **දූති**, මෙසේ මිතු කියන පරිද්දෙන්; **විපන්නානි**, විරූපභාවයට පැමිණියාහු; **නිග්ගහණා**, පිහිටක් නැත්තාහු; **දබ්බසම්භාරෙ**, ඉළුප් ඇතිරියෙහි—නො හොත් ගීතණ ඇතිරියෙහි; **පරිබ්බයං**, මාගෝපකරණ; **ඔකප්පනසද්ධං**, කම්ඵල හදහන ශ්‍රද්ධාව යි; **විනිච්ඡයවසෙන**, පෙරළි කිරීම් විසින්—ඇතු පෙරළි කොට වසතු ඇ ගැනුම් වස යෙන්; **නාගං දස්සති**, එකාන්තයෙන් අපට ඇතු දෙන්නාහ. එහෙයින් ඒ ඇත් අප සන්තකයා හා සමය. ඔහු ගෙනැ අවුත් පසුව දීපියම්හ යි කියා මෙසේ-**අත්තනො සන්තකෙන විය**, තමා සන්තකයා මෙන්; **ධාරයමානා**, ධරන්නමෝ; **නිම්මහසෙ**, පෙරළි කලම්හ-වික්කම්හ; [5]**පච්චාසිංසන්තාය**, ප්‍රත්‍යාශා

1 පරව් B. 2 පැසුනු ගැසීගෙන B. 3 වාලිකපුලිනෙ-මු. අ. ක. 4 මිඳයෙක්හි CD. 5 පච්චාසිංසමානා-හැම.

වෙකින්; **න ආරාධෙති**, තුරුස්වයි; **නතියෙ නතියෙ**, තුන් තුන්වන; **පුප්ඵපතිමණ්ඩිතෙ**, මලින් සරහනලද; **විත්තසරෙ**, විසිතුරු ශරයන්; **කළාකපාලියා**, [1]වැමියර; **උදකපිට්ඨෙ ඛිත්තං**, දියපිට හෙළූ; [2]**තං විනා**, ඒ මිස-එහෙයින් මිස ශූ සේයි; **සඞ්ගණ්හස්සාති**, භාරියා කරන්නේ යයි; [3]**රඤ්ඤං ච**, රැහැණ ද; **පුතෙනාදං ච**, කැහැට ද; [4]**අනනරධුරෙ**, විය මැදෙහි-විය පිට හෝ; **තරුණාරවිඩණ්ණං** සී රන්වන් බැවින් කිඃත්; **පුරතො ඛාදිස්සාමි**, ඉදිරියට කකුළු වළින් ඇත හිඳුවා ළීම් නම්; **පච්ඡතො ඛාදිස්සාමි**, මැත මා දසාවට කකුළු වළින් මැත හිඳුවා ළීම් නම්; **ඔතිණ්ණො භවිස්සති**, බට වන; **පරිස්සයෙන**, උපද්‍රවයක් වුවමැනවැයි සිතා; **සාලිසීස**, හැල් කරල්; **පච්චවෙක්ඛිත්වා**, පරීක්ෂා කොට; **වීහිමාලං**, කරල්මිටි; **සීසමුට්ඨිං**, කරල් මිටක්; **ධූනාය**, සනමහයෙහි; [5]**රාජභොගෙ**, රජ්ජුරු වන් සතු-උන්ට අයට; [6]**අභිතාවිහිතො**, නොමිනු වින්; **ලක්ඛං**, සන්; **වණ්ණදාසි**, කැති; [7]**පරමපාරිසුද්ධි හොතිති**, විශෙෂ යෙන්මැ පිරිසුදු වන්නේ යයි.

## 276. කුරුධම්මජාතකං.

[8]**පබ්බතකන්දරසමීපෙ**, ගල්කඳුරක් සමීපයෙහි; **අතිරෙක පණ්ණාසවස්සානි**, අධික පනස් හවුරුද්දක්; **ජිර**, දුරු; **පටික්කමිත්වා**, දුරු වැ; [9]**රොමක**, පරෙවිය; **උක්කණ්ඩිතරූපා**, උකටලී සවභාව ඇත්තෝ.

## 277. රොමකජාතකං.

**සීලව**, සිලැවූ; **පබ්බතපාද**, පර්වතපාර්ශ්වයෙහි ද; **ගිරිදුග්ග**, පර්වතයෙන් දුර්ගයෙහි ද; **වනසණ්ඩෙ**, අවශෙෂ ලැහැබ්හි ද; **ඵලාඵලෙනා**, හෝවිලි කෙළනෝ; **තිත්තකාසි**, සෂමා තෙරෙහි ද; **භියො**, බොහෝසේ; [10]**අවිසඞ්කාසමානො**, සපසී නො කරන්නේ; **විධූනමෙනො**, ඇඟ සලන්නේ.

## 278. මහිසජාතකං.

[11]**නිහතං**, සන්හුන්; **උතෙතාසෙති**, තසත්; **සංදිට්ඨා**, එක් වරෙක දුටුවෝ ද; **සම්භත්තා**, බොහෝ කලක් සෙවි ගුණ මිත්‍රයෝ ද; **උපසටමහා හුත්වා**, වගල් ව ගෙනැ, [12]**ගාහං**, පළමු

1 වාමියර-හැම. 2 විත්තං විනා-මු. අ. ක. රඤ්ඤොච-මු. අ. ක. 4 අනන්ත ධුරෙ-මු. අ. ක. 5 රාජභොගෙ-මු. අ. ක. 6 අමිත විහිරාසිතො-මු. අ. ක. 7 පරමා-මු. අ. ක. 8 ගිරිකන්දරසමීපෙ-මු.අ.ක. 9 කපොතක BCDEF. 10 අධිකොසමානො-මු. අ.ක. 11 නිහිතං A. 12 ගාළ්හං-හැම.

ගත් මතය; **භණ්ඩන**, ඩබර පලමුව ආරම්භයි; **කලහ** නම් හස්තපරාමර්ශාදියෙන් සීසපත් ඩබරයි; [1]**විග්ගහ** නම් ධම් අධ මැයි යනාදි විසින් අතික් මහක් ගැන්ම යි; **විවාද** නම් විරුද්ධ වූ නන් තෙපුලින් වාදයි; **එතස්මිං පකරණෙ**, මේ ප්‍රස්තාවයෙහි; [2]**පණ්ණුදූහන**, මං පැහැරීම්; **සන්ධිච්ඡෙද**, හුමං සොරකම්–මං පැහැරුම් හෝ; **ඔච්ඡින්දමානා**, හවුරන්නී; **සතපත්ත**, කැරල්; [3]**වස්ස**, හඬගසව; [4]**සබ්බරුතඤ්ඤු**, හැම සතුන්ගේ හඬ දන්නේ; **විසමපරිසණ්ඩි**, ලොභ උත්සන්න පිළිසඳ; **මාතා පන මෙ** [5]**මාතා ච**, තාගේ මව් වනාහි මව් මේ; **වාමමනො පතිගණ්හාති**, නො කටයුතු කොට ගන්නී යි; **උක්ඛිපන්ති**, හුවත්; **අනුප්පියභාණී මිත්තොති**, සිත එකක් තබා කටින් සිත් ගන්නට නැලවිලි තෙපුල් කියන මිත්‍රප්‍රතිරූපකයා යයි කියා; **අඤ්ඤදත්ථු**, එකාන්තයෙන්; **හරො**, තමන් අයත් ගන්නේ ද; **වචීපරමො**, සුඛ දුක්ඛයෙහි එක් නොවැ සිත් ගන්නට තිසි බස් උතුම් කොට ඇත්තේ ද; **අනුප්පියං ආහ**, නැලවිලි තෙපුල් කියන්නේ ද; **අපායෙසු**, අහිතයෙහි; **සඛා**, යහළු ද; **ආරකා**, දුරින්–

279. සතපත්තජාතකං.

---

**පුමෙව ඛාදා**, මුළු කොට–[6]පැළ කොට; **ඛොවිදෙ නූන**, දක්ෂ වන–

280. පුටදූසකජාතකං.

---

## තතියො වග්ගො.

---

**පිණ්ඩපක්කානං**, [7]කැණින් විලිකුණාවූ; **පුටං**, මුලක්; **පරිසක්කිස්සාමි**, තැත් කෙරෙමි; [8]**විසුං විසුං**, වෙන වෙන; **ඨිතත්තා වාසා**, තටවූ වාස ඇත් තෝ; **සඤ්ඤං දත්වා**, සංඥ දී; [9]**නිබද්ධං වත්වා**, අඹ වුව මැනවැයි එක්වන් කියා; **අනුස්සවොති**, අසා එන තියායි. **යානකවක්ක**, කුඩා රථසකක්; **නිප්ඵරිතුං**, සප යන්නට; **මක්ඛෙත්වා**, මැඩ; **නිපච්චාකාරං**, ආදර; **කඤ්චනපබ්බතන්තරෙ**, රන් පජීත ගුහා අභ්‍යන්තරයෙහි; **කුම්භණ්ඩ**, කළ සා අණ්ඩ ඇති හෙයින් කුම්භණ්ඩ යයි කියන ලද; **මූලන්තරෙන**, මුල් අතුරෙන්; **කම්මකරණං**, චිත්‍රවධ; **මද්දිත්වා**, ගහටා පියා; [10]**පුමිත්වා**, පිඹ; **අසන්තසිත්වා**, භයනැති වැ; **හත්ථුරජ්ජෙ**, ස්වාමිකායීයෙහි; **පරක්කමෙන්තා**, උත්සාහ කරන්නේ;

---

1 විග්‍රහ-හැම. 2 පණ්දූහන-මු. අ. ක. 3 උසොකාඵ ABD. උකකටඝඵ C. උසොකාටඝත F. 4 සබ්බරුදඤ්ඤු A. 5 මහාගුණා-මු. අ. ක. 6 පැළුකොට A. 7 කැණවිලිකුත්තාවූ BCDF. 8 මු. අ. කථාහි නොපැණේ. 9 නිබද්ධංකත්වා-මු. අ. ක. 10 පුඤ්ජිත්වා-මු. අ. ක. පුණිත්වා, හටාපියා, පච්ඡිත්වාපියා A.

අඞ්කං කත්වා ගණ්හාති, සලකුණු කොට රක්‍ෂා කරන ලදහ; [1]අසමෙනෙන, සමනොවන කල්හි; [2]පබ්බතජාතස්ස අන්තරෙ, පර්වතයන් අතුරෙහි; [3]ජුහමානො, ගිනි පුදන්නේ; සික්කාය, සාල්ලෙහි; පටිමුඤ්චිත්වා, බැඳ—

## 281. අබ්භන්තරජාතකං.

පෙසුඤ්ඤං, කෙහෙලාම්; ජනපදං භින්දන්තො, රට බිඳුවා තමා වසඟ කරන්නේ; පාණෙ ඝාතෙන්තො, මරන්නේ; යමක උක්කාහි, ගිනිසුළු යුගින්-විලක්කු දෙකින් හෝ; [4]දුක්ඛාභිතුන්නො, දුකින් මඩනාලද්දේ; සෙය්‍යංසො, උතුම් අංශ ඇත්තේයි; සන්ධිං කත්වා, විශ්වාස කොට; [5]ඝටෙත්වා, එක් කොට; [5]තූණීරසන්ධානං, හියවුරු යයි බැවහාර කරනලද—

## 282. සෙය්‍යංසජාතකං.

බිම්බිසාරරඤ්ඤො, බිම්සරරජහට; අගිකඛණං, එක්වත්; මන්තනෙච්ඡකා හොන්ති, මන්ත්‍රකම්හි දක්‍ෂයහ නොහොත් රහස්හි තමතමන් අතුරෙහි මන්ත්‍රණ කිරීමෙහි දක්‍ෂයහ. උම්මුක්කානි පොථෙත්වා, පෙනෙහෙලි ගසා; නිද්දායසි නො ඩනති, තෙප් නිදව් ද නොනිදව්දැයි විචාළේ; [6]ලාලො, ජඩවූ; චාටිමත්තං භත්තං, සැලක් පමණ බත්; යුද්ධං විචාරෙසි, යුද්ධ විධාන කෙළේ. පදුමබ්‍යූහ නම් පද්මාකාරයෙන් සෙනාසන්නිවෙශ ක්‍රමයි. චක්කබ්‍යූහ නම් චක්‍රාකෘති කොට සෙනාසන්නිවෙශ ක්‍රමයි. සකටබ්‍යූහ නම් ගැළත්තක් බඳු සෙනාසන්නිවෙශ ක්‍රමයි. ඔවජ්ජිත්වා, මහ අනුරුවා; වග්ගිත්වා, පැන; [7]බිපෙ, කරප්හි; ජෙට්ඨො භවාති, දක්‍ෂම වේදැයි; නිවිට්ඨා, පිහිටි; පුට්ඨත්තා, වැඩූ බැවින්; නිඛාදන, තියත්; මුග්ගරෙ, මුගුරු; කන්දමූල, අලමුල්; පරිස්සයො, උපද්‍රව; [8]චරාපෙත්වා, ගොදුරු කවා; භූමිසීසං, ජයභූමි; පිල්ලකෙ, පැටවුන්; තෙසං, ඒ හැම හුරන්; නා ආවිජ්ඣිත්වා, ඔවුන් පිසාරා; පොතකා, තහඹවුන්; බලගුම්බං, බලමුළු; පරිමණ්ඩලං, වට කොට; කුල්ලකසණ්ඨානං, කුළුසටහන් නොහොත් ඔරුවක් සේ දික් කොට; පබ්භාරසදිසං, ලෙණක් වැනිවූ; පටිබලො ඝෙළු නනති, ඔහු පෙරළී නැවැත නොපි බලව් යයි; මුඛං නිබ්බාපෙත්වා, කට විවෘත කොට; අස්සසි, ආනාපී; මුත්තං ඡඩ්ඩෙසි, වටන් කෙළේ; භූමිසීසෙ, ජයභූමියෙහි; සංවිදහමානො,

1 අසම්මොතෙන-හැම. 2 පබ්බතස්ස-මූ. අ. ක. පබ්බතජාලස්ස A. 3 දුහමානො ABCD. 4 දුක්ඛාභිභූතො-මූ. අ. ක. 5 මූ. අ. කට්ඨානී නොඅපේසී. 6 ලොලො-මූ. අ. ක. 7 බිපෙප-හැම. 8 වාරාපෙත්වා-මූ. අ. ක.

ප්‍රධාන එකෙක්. 'චරි' යනුයෙහි අර්ථයි 'විචරි' යනු. **ව්‍යපගම්ම**, පහව ගෙනැ; **ඛායසි**, සිතයි; 'පුථු' යනුයෙහි අර්ථයි [1]"විසුං විසුං හුත්වා' යනු. **රසන්ති**, හඬත්; **දුප්පසහා**, මැඩපිය නො හැකි; **කුල්ලකමුඛස්ස**, කුල්ලමුඛසංස්ථානවූ මුඛ ඇති, **අති සම්බාධමුඛට්ඨානෙ**, ඉතාමැ හකවූ කට ඇති තැන; **පුඤ්ජකතො විය අහොසි**, හකුළුවාලූවක් සේ වී; **අන්තරසත්ථිම්හි**, ඇතුළු කළවයෙහි; **යාව චක්ඛාපථෙදසා**, ලය දක්වා; **දාඨාය පලිවෙඨෙත්වා**, දළයෙන් වෙළාගෙනැ; **ආවිජ්ඣිත්වා**, ඇතින් මැතට ඇදපියා; **උපසිංඝන්තා**, හිඹුතාහු; **න තාව තුස්සන්ති**, තව සතුටු නො වූ; **එකප්පහාරමෙව කත්වා**, එකපහරක්ම කොට–එකපහරින්මැ යනුයි; **රාජානො අභිසිඤ්චන්ති**, රජ දරුවන් අභිෂෙක කෙරෙත්; **යත්‍ර හි** [නාම], "යෙ නාම" යී තන්; **අයමෙව වා පාඨො**, 'ජිතිංසු සූකරා' යි කියා හෝ පාඨයි.

## 283. වඩ්ඪකීසූකරජාතකං.

**සිරිචොර**, ශ්‍රීකාන්තාව තෙතා ගන්නට පියෝ කල හෙයින් සිරිචොරවූ; **සිරිලක්ඛණ**, ශ්‍රී ලකුණු දන්නා-ශ්‍රී කාන්තා වගේ ලක්‍ෂණ දන්නා යනුයි. **චූළාය**, සිළුනු මුදුනෙහි-මළෙහි යනුයි; **මණික්ඛන්ධෙ**, මැණිකෙහි; **ආරක්ඛගණ්ඨියං**, අතින් ගන්නා සැරයටි දණ්ඩෙහි; **ථෙනෙතුං**, පැහැරගන්නට; **චාරෙ ච**, කායසුචරිතයෙහි ද; [2]**විහාරෙ ච**, වාක්සුචරිතයෙහි දැ; **දෙවකුලෙ**, දෙවොලෙහි; **භණ්ඩාගාරිකට්ඨානං**, [3]භාණ්ඩාගාරපොත් තනතුරු; **උච්ඡඞ්ගෙ කත්වා**, හිත ලාගෙනැ; **වුසභට්ඨානං**, ගෙනයනු ලබන්නේ; **වාලුකොදකෙන**, වැලි මිශ්‍ර දියෙන්–වාතයෙන් අලළාගිය ගඟ මොහු ගැලී පැන් බී [4]මූළාවූ හෙයින් කියත්. **හත්ථිට්ඨානං**, ඇත්ඇදුරු තැන්; **තං පුරිසං**, ඒ කුකුළු මස් ගෙන ගහට නහන්නට ගිය පුරුෂයා; **තං කාරණං**, ඔහු කල කුකකුටමාරණාදිවූ සියලු කාරණ; [5]**ලක්ඛීව**, පිනැත්තේමැ; [6]**අතිච්චඡන්ද**, අනුන් ඉක්ම; **එවකාරො**, 'අඡන්දව' යන පදයෙහි එවකාර; **පුරිමපදෙන**, 'සබ්බත්' යන පූර්වපදය හා; **යොජෙතබ්බො**, 'සබ්බතෙථව' යි කියා යෙදිය යුතුයි. [7]'අතිච්ච' යන්නෙහි අර්ථ 'අතික්කමිත්වා' යනුයි.

**සුවණ්ණතා**, මනා වර්ණ ඇති බැව්; **සුස්සරතා**, යහපත් කටහඬ ඇති බැව්; **සුරූපතා**, යහපත් රූ ඇතිබැව්; **ආධිපච්චපරිවාරො**, අධිපතිබැව් හා පිරිවර; **චක්කවත්තිසුඛම්පි යං**;

---

1 විසුං හුත්වා-මු. අ. ක. 2 විහාරෙවා-හැම. 3 භාණ්ඩාරපුත්තනතුරැ A. 4 මුදවූ හෙයින් A. 5 ලක්ඛීවා-මු. අ. ක. 6 අතිවඡන්ද-හැම. 7 අතිව-හැම.

චක්කවත්තිසුඛම්පි' යි තන්; **යොනිසො**, උපායෙන්; **චෙ**, එකාන්තයෙන්; [1]**පයුඤ්ජෙ**, ප්‍රයොග කරන්නාහට; [2]**විජ්ජා**, දිවඇස් පූර්වෙනිවාසානුස්මෘති ආස්‍රවක්ෂයකරඥාන යන ත්‍රිවිද්‍යායි; **විමුත්ති**, තදඞ්ගවිමුත්තිය වික්ඛම්භනවිමුත්තිය සමුච්ඡේදවිමුත්තිය පටිප්පස්සද්ධිවිමුත්තිය නිස්සරණවිමුත්තිය යන පඤ්චවිමුක්තිද. එහි තදඞ්ගවිමුක්ති නම් විපස්සනායි. විෂ්කම්භණවිමුක්ති නම් ධ්‍යානයි. සමුච්ඡේදවිමුක්ති නම් මාර්ග යි. පටිප්පස්සද්ධිවිමුක්ති නම් ඵල යි. නිස්සරණවිමුක්ති නම් නිවන්. **වසීභාවො ච**, ධ්‍යානාදියෙහි වශග බවද; **පටිසම්භිදා**, අත්‍ථ ධම්ම නිරුත්ති පටිභාන යන සිව් පිළිසිඹියා. එහි අර්ථය දන්නා නුවණ අත්‍ථපටිසම්භිදා නම්. පෙළ දන්නා නුවණ ධම්මපටිසම්භිදා නම්. ව්‍යවහාර දන්නා නුවණ නිරුත්තිපටිසම්භිදා නම් අර්ථය ධර්මය නිරුක්තිය වෙන් වෙන් කොට දන්නා නුවණ පටිභානපටිසම්භිදා නම්. **විමොක්ඛා ච**, අෂ්ටවිමොක්ෂද අෂ්ටවිමොක්ෂ නම්:- “රූපී රූපානි පස්සති-අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති—සුභන්ති අධිමුච්චති—ආකාසානඤ්චායතන-විඤ්ඤාණඤ්චායතන-ආකිඤ්චඤ්ඤායතන-නෙවසඤ්ඤානාසඤ්ඤායතන-නිරොධසමාපත්ති” යන මේයි. බුද්ධභූමි, සවන්නැණ; **සත පුඤ්ඤානං**, සත් පින් ඇතිබැවි.

## 284. සිරිජාතකං.

**සුන්දරිමාරණං**, [4]සුන්දරියගේ මරණ; **අපි නු අයං**, කිම [5]ඇප වත්හිමියෙනි; **කුම්භපලාදීනි**, ලමඟ තකුල් ආදි; **මාලාකචවරන්තරෙ නික්ඛිපිත්වා**, මල්කසළ අතුරෙහි ලාපියා; **දුතියදිවසෙ**, මෙදවස්; **තත්‍ථ**, එහි-ගිය තැනැ; **උපවන**, [6]ගෙඋයන්වතු.

**අභූතවාදී**, බොරු කියන්නේ; **නිරයං උපෙති**, නරකයට එළබෙයි-පිළිසඳ විසින් උපද්දී යූ සේයි; **යො වාපි**, යමෙක්; **කත්වා**, යමක් කොට; **න කරොමීති**, නොකෙළෙමියි; **ආහ**, කියාද; 'සොපි නිරයං උපෙති' යි යොදනු. **පෙච්ච**, පරලොව; **තෙ උභොපි නිහීනකම්මා මනුජා**, හීනවූ කම් ඇති ඒ දෙපක්ෂයෙහි සත්වයෝ; **පරත්‍ථ**, පරලොකයෙහි; **සමා භවන්ති**, සමවන්නාහුයි.

**සුන්දරියා අඤ්ඤෙහි මාරිතභාවං**, සුන්දරිය භික්ෂූන්වහන්සේ විනා සෙස්සවුන් විසින් මැරූබව නොමැරූබව;

1 පයුජ්ජතො ACD. 2 තිවිජ්ජා-නැම. 3 දුතියජ්ඣාන තතියජ්ඣාන චතුත්‍ථජ්ඣාන ආකාසානඤ්චායතන විඤ්ඤාණඤ්චායතන යන මෙයි ACD. 4 සුන්දරීගේ BCDF. 5 ඇවත් A. 6 ගෙවුයන් BCDEF.

[ජානාථාති], පරීක්‍ෂා කොට දන්වයි; **ආඝිණ්ඩඪ**, ඇවිදුව; **පුරිසවධදණ්ඩනපළිබුද්ධා**, සුනැරි මැරූ ධූතීයන්ට කරන වධ දණ්ඩනයෙන් බඳනා ලද්දාහු-ඔවුන්ට [1]කරන දෑ බලා අපටත් වේදෝහෝයි යන භයින් පීඩිතවූවාහු බුදුන් විෂයෙහි කරන වික්‍රියායෙන් නැවැත්තාහ; **කාළකාභාවං**, කැළල-අයසස් හෝ; **තිසෙසා පබ්බතරාජියො**, තුන් පර්‍වත වලල්ලක්—තුන් පර්‍වත රේඛාවක් හෝ; **ජාතිමණිනො**, ජාතිරඞ්ගමාණික්‍ය යාගේ. ජාතිරඞ්ගමාණික්‍ය නම් අකෘත්‍රිමවූ ස්වභාව මාණික්‍ය යයි. **නාසස**, ඒ සිංහයාගේ; **ජායා**, ජායා තොමෝ; **මණිමයි**, මාණික්‍යයෙහි; **දරියා**, ගුහායෙහි; **අකාසකාමෙසා**, තොතො රොස්...

## 285. මණිසූකරජාතකං.

**උත්තරිහඞ්ගා**, අවුළු; **එස**, මේ හූරු; **මහාලොහිතො**, මහලේදරු; **ආතුරන්නානි භුඤ්ජති**, මරබත් කයි; **භුසං**, තොයි; **මුසලුන්නතරං**, [2]මොහොලක් වැනි සොට ඇති; **සො වෙවාහිකපුරිසො**, ඒ විවා මඟුල් කරන පුරුෂයා; **ජූතත සෙවක** නම් මඞ්ගල්‍ය මහත් පරිසදින් පිරිවරන ලද හෙයින් ජූතත-පිරිවරන ලද-සේවකයන් ඇති හෙයින් ඒ [3]වෙවාහික පුරුෂ තෙම ජූතත සෙවක නම් වේ. [4]**මාරිතං**, මරනලදුව; **විකන්තනං**, [5]විදූරයට පමුණුවන ලදුව; **ජරග්ගවා**, වෘද්ධවූ ගවයෝ; [6]**අවිනෙන්නාසුං**, [7]සිතු...

## 286. සාලූකජාතකං.

**සාමඤ්ඤං පහාය**, ශ්‍රමණ භාවය හැරැ; **විකිණ්ණවාචෙන**, බොරු කියා [8]ඇවිදිනවුන් විසින්; **විලුම්පන්ති**, පැහැරැ ගනී; [9]**පරියාදින්න**, තෘෂ්ණායෙන් වළඳනා ලද-ලොභයෙන් හෝ; **විජිඝච්ඡා**, ඇරැ; **උම්මත්තකෙන විය**, වියරු හුණුවනු මෙන්; **සොණ්ඩසහායයෝ** නම් ඉතා විශ්වාසයෝයි-නවටයෝ හෝයි. **විපකිණ්ණවාචො**, විසිතුරුවැ ගිය තෙපුල්—බොහෝ දෙනා කෙරෙහි පතළ තෙපුල්-ඇත්තේයි-නොහොත් නොඑක් තැනැ නොඑක් [දෑ] කියා ඇවිදිනාසුලු තැනැත්තේයි. **පධංසිතාති**, දූස්වන ලදහයි; **සුයති**, අප විසින් මෙසේවූ දෙයෙක් අසන ලද්දේයි; **සුසුත්තාදුසුත්තං**, යහපත් කොට නපුරු කොට යෙදූ දෙයක්; [10]**අනුසත්ථි**, අවවාදයි; **අත්තවිනිපාතෙන**,

1 කළු A. 2 මොහොල් අක්වැනි BCDF. 3 විවාහික BCDEF. 4 මාරයිතුං-මු. අ. කා. 5 විකාරයට CDFF. 6 විච්ඡෙන්නසුං-මු. අ. කා. අච්ඡෙන්නසුං-හැම. 7 ඉක්මුණවු-හැම. 8 ඇවිත්තවුන්-හැම. 9 පරියාදින්නචිත්තා-හැම. 10 අනුසාසති-මු. අ. කා.

තමා නැසීමෙන්; **විසමකිරියාය**, පාප ක්‍රියායෙන්; **අත්තානං විනිපාතෙත්වා**, ගරහාදීන් තමා නසා; **කස්ව**, එසේවූ ඒ ජීවිතවෘත්තිය ද; **ධිරත්ථු**, නින්‍දා වේවා; **ජීවිතපරියෙසනා**, ජීවිත ප්‍රවෘත්තියට හෙතුවූ යම් ප්‍රත්‍යය [1]පරියෙසනායෙක් ඇත් ද. **ජීවිකා** යනුයෙහි අර්ථ 'භික්ඛාචරියා' යනුයි.—

## 287. [2]ලාභගරහජාතකං.

**වොහාරං**, වෙළඳාම්–[3]පිරුළුන්; **දිබ්බන්ත යසෙන වඩ්ඪිත්වා** යනු ආදි යසස් ඇතත් පසුව පුණ්‍යානුමෝදනායෙන් අධිකවූ බව ගෙන කියත්. **එකං සක්ඛරාභණ්ඩිකං**, එක් හකුරු පොට්ටතමක්; **නාවං ආරොපෙත්වා**, මසු පොට්ටතම දියෙහි හුණු හඬ වැනි කොට තියෙන් නැව කොටා–තියෙන් නැවට ගසා අගිල කොට; **සත්තමාසෙන**, සත්මාසයක්–සත්වියැටක්; **සහස්සෙන ච**, දහසක් කහවණුයෙන් ද; **මච්ඡුද්දානං**, මස්වැල; **කිණෙය්‍යං**, ගනිම්; **මච්ඡවග්ගං**, මස්වැලයි. 'අපචිති' යන් තෙහි **අපචිති** නම් මෙතැන ආදරයෙන් පුණ්‍ය දනයයි. **න ඵාති හොති**, වැඩ නොවේ—

## 288. මච්ඡුද්දානජාතකං.

**අට්ඨවරලාභං**, බුදුන් වහන්සේ [4]සමීපයෙන් ලත් වර අටක්; **අය්‍ය කිං තෙ**, ස්වාමිය තට [5]ඉන් කිම්දැයි; **කොචි** [6]**ගාහො**, කිසි ග්‍රහ පීඩායෙක්; [7]**රොහිණිනං**, [8]කිරි ඇති; **උදුක්ඛල**, [9]වන්; **සුප්පං**, කුල්ල; **ජම්මි**, අධම වූ; **සම්පච්චජා පෙථ**, පාවා දෙව්—

## 289. නානාච්ඡන්දජාතකං.

**සීලවීමංසක**, ශීලය යහපත් දෝහෝ ශ්‍රැතය යහපත් දෝහෝ යි පරීක්ෂා කළ හෙයින් සීලවීමංසකවූ; [10]**හෙරඤ්ඤ ඵලකතො**, මසුරන් තිබෙන පුවරුයෙන්; **සීලවාති**, අනුන්ට විහෙඨනයක් නොකරන හෙයින් සිල්වතැයි යනු; [11]**අනුමතං**, දන්කාලදී—

## 290. සීලවීමංසජාතකං.

# චතුත්ථො වග්ගො.

1 පරියෙෂණයෙක් A. 2 ලාභගරු-හැම. 3 පිටළු රත් BC. පිළුරත් D 4 සවම්පයෙන් ACD. 5 ඉන්හට C. ඉන්දන්හට D. 6 ගහො CD. 7 මිරිනීනං BCDEF. 8 රුකැති A. කිරති BCDEF. 9 වං C. 10 හෙරඤ්ඤිකඵලකාතො-මූ. අ. සා. 11 මතං BCDEF.

**පානබ්‍යසනෙන**, සුරාපානයෙහි නියුක්ත භාවයෙන්; **පරකුඩ්ඩං**, [1]ගෙබිතක්කත; **වීපිං** [2]**ආචරිත්වා**, වීපිය අවුරා, [3]**නච්චං ගීතං**, නෝ ගී කිය; **සමජ්ජාභිචරො**, ගි නැටුම් අභී වූයේයි; **කුම්භං**, භද්‍රඝටයක්; **ධුත්තකෙසො**, මොහු සේවූ යම් ධූර්තයෙක්; **දිනෙනකා**, [4]ගර්විතවූ-පහළවූ හෝ; **පොත්ථක පිලොතිකාය**, කෑතිරිකඩ-රිරිසුඹුළු හෝ; [5]**අමත්තකා**, අයවිය දම් නොදුන

## 291. භද්‍රඝටජාතකං.

**උසුමං පලාපෙපෙනො**, [6]මහලු තිවන්නේ; [7]**වග්ගවග්ග කත්වා**, රැස්රැස්කොට; **භොජනවිකතිං**, බත් හා ව්‍යඤ්ජන; **අගිහනත්වා**, පැහැරැ; **ද්වීහි පාදෙහි**, දෙපයින්—දෙපසුරෙන් හෝ; [8]**මමඤ්ච න ලජ්ජි**, මා සොරෙහිද ලජ්ජා නොකෙළෙහි; [9]**මුඛං**, මුහුණ; **ඛණ්ඩසි**, සාඩ කෙළෙහි-වණ කෙළෙහි යූ සේයි; [10]**පච්චග්ඝං**, අලුත් නොභොත් වෙත වෙත මහ ඇඟි හෝ; **අබහුණහං**, හුණු; **අපරිවාසිකං**, අලුත්; **මච්ඡමංසවිකතිසු වා**, මත්ස්‍යමාංස විකෘතිය නිමිත්ත කොට හෝ; **සුභඡජකාතුං**, පක්ෂපාත කරන්නට

## 292. සූපතනජාතකං.

[11]**අට්ටිතො**, පීඩිත වූයේ; **බාළ්හං**, අනවරතයෙන්, **රුප්පතො**, විඩාව [12]ඇම්දිනාවූ; **අජසැඳං**, තපුරුවූ; **අධිමුච්ඡිතා**, කෙලශයෙන් මූච්ඡාවූ; [13]**පරිභොගසභාවං**, සකුස් සහව් ඇති බැව්

## 293. කායවිච්ඡන්දජාතකං.

**ජම්බුසණ්ඩ**, දඹවනයෙක; **වග්ගු**, මධුරවූ; **කිඤ්ජකසරො**, [14]නො විසිර කොට [15]කත හෙන්නාවූ තෙපුල් ඇති; **අවමුතො**, හුන්නේ; **අවිසමෙන**, නොවිසුරුණු; [16]**පිණ්ඩිතෙන**, පිඬු පිඬුවූ; **සරිවණ්ණා**, සමාන පැහැ ඇති; **බායසි**, වැටහෙයි; **වනනාදං**, තනාපි අගර කන්නහු

## 294. ජම්බුඛාදකජාතකං.

1 දනාමහබිතත්කත AC. දනාමහබික්කතD. 2 ආවාරෙත්වා A. අවාරෙත්වා CD 3 නච-මු අ. සා. 4 ගර්බිත පතළවූ C. 5 අමත්වා A. 6 මහළු ACD. 7 වගෙග වගගග-මු.අ.සා A. 8 මමච-මු. අ. සා. 9 නාසං-මු. අ. සා. 10 වෙත වේත; පච්චගඝං, අලුත් මහ ඇඟි හෝ CD. 11 අටඨිතො CD. 12 ඇඹිදිනාභූ CD. 13 පරිභොග සභාවං-මු. අ. සා. 14 නොවිසර C. නොඹිය සුතු දෙකොට A. 15 කරණ C. 16 පිණ්ඩක-BCDEF.

**ගාමූපචාරෙ**, ගම් උවසරෙහි-ගම් [1]වැළැත් හෝ; **ඛණ්ඩා**, කඳට; **පරියාති**, මුව ඒ; **කොත්ථුකො**, කැණහිල්

## 295. අඝනජාතකං.

[2]**උදකතුම්බං**, ඛබරා-දියලබු හෝ; **පණ්ණපරික්ඛාරෙ**, මනා පිරිකර [ඇති]; **අරියවංසකථං**, අල්පෙච්ඡ ප්‍රතිපත්ති දීපක වූ අරියවංසකථා; [3]**උදකං රක්ඛිතබ්බං**, [4]දිය රැක්කයුතු කොට-අනුන් දිය නොගතදී රැක්ක යුතු කොට; [5]**උදකකාකො**, දියකාවෙක්; [6]**පරිවාසති**, හඬාද; **සරිතං**, [7]ගං සෝතදී; **ඔසක්කනවෙලාය**, බාදිය වේලෙහි; **නික්ඛමනවෙලාය**, වඩදිය වේලෙහි

## 296. සමුද්දජාතකං.

[8]**උබ්බෙධමානා**, උඩවස්ථානයෙහි [9]යන්නව; **විහඞ්ගම**, ආකාශයෙන් [10]යන්නව; **වාමූරූ**, මනා කලවේ ඇති; **සත්තිං ච**, තෙබඳ; **නික්ඛං**, මුන්ද; **චිරං මෙ ගතස්ස පියස්ස**, මාගේ ස්වාමීහු ගියේ නැතක් කල; **උප්පලසදිසො**, නීලොත්පල පත්‍රයක් බඳුවූ; [11]**සො ච සන්නාහසජ්ජොති අත්ථො**, හෙද සන්නාහය හා යුක්තව තුබූයේය යන අර්ථයි; **පඤ්චමහි**, පස්කලඳක් පමණ; **අඞ්ගුලෙය්‍යකං**, මුන්ද

## 297. කාමවිලාපජාතකං.

**පිට්ඨිපාසාණෙ නිවිට්ඨො**, අතළගල පිහිටියේ; **සම්පියායමානා**, තපස්වින්ගේ දර්ශනය පතන්නාහු; **වස්සානෙ**, වර්ෂා සමයෙහි; **සත්තසත්තාහං**, සත්සතියක්; [12]**රත්තමුඛබුද්දක වානරො**, [13]රත් මුහුණු ඇති රිලවෙක්; **පාසාණදරියා**, ගල් ගුහායෙහි-ගල්ලෙණ; **කුච්ඡිං ඔලම්බෙන්තො**, බඩ එල්බවාද; **සුඛිතාකාරං**, තමා බඩ පිරුණු ආකාර; **කපිඤ්ජනා**, [14]පුලිල හෙළකිඳි ඇසතු හෝ; **පිලක්ඛා**, පුලිල; **ජිඝච්ඡාය**, සයින්; **සුඛිතො**, නිවුණාවූ තෘෂ්ණා ඇත්තේ; **වස්සාපෙස්සාමි නන්ති**, මොහු මා වසන ගුහායෙහි නොහිඳ පලා යන පරිද්දෙන් වස්වා කල මැනවැයි; **යො වඩ්ඪමපචායති** යනු තමා [15]වෘද්ධ කොට ගෙන වෘද්ධවූ තමා වසන තැන ගෙන [16]වෙසද නොකොට [17]තමාටම හරන පිණිස ඔහු වස්වා කිරීම් වශයෙන් ඕහට කියා.

---

1 පැලක් A පලල් BCDEF. 2 උදකකුම්භං-මු. අ. ක. 3 උදකා A. 4 දියෙන් A. 5 උදකාකො C. 6 පරිධාවති-මු. අ ක. 7 ගංසොතදී ACD. 8 උබ්බෙධජමානා C. උබ්බෙධමානා D. 9 යනාදීවූ CD. 10 යන්නට-හැම. 11 සොච, තෙබඳ; සොච ACD. 12 රත්තමුඛො බුද්දවානරො-මු. අ. ක. 13 රත්වූ මුඛ මුහුනු ඇති C. 14 කලපුලිල ACD. 15 මුඛසොට C. 16 මෙසඳ ACD. 17 තම තමාටම-හැම.

**අපචායති**, පුද; **සුඛිතො**, පිනා ගියෙමි; **හි**, තථාහි,– එසේ මැයි. තා කියන බස් [1]නොහැදහිය හැකිමැයි–තා කියන්නේ වූ කලි වඤ්චා මැයි; **ඉමස්මිං පදෙසෙ**, මේ [2]අරණ්‍යයෙහි; [3]**වස්සං**, වර්ෂාකාලයෙහි; [3]**න කිඤ්චි** [4]**සබ්බං ඵලං අදාසීති**, සියලු කිසියම් පකා පැකෙක් නැත්මැයි. යම් හෙයකින් තෝ මේ පකා පැකි නැති වනයට මෙමැ විගස පකා පැකි කන්නට ගොස් නොලදින්මැ අවුත් සිට පකා පැකි අනුභව කොට අද යම්සේ මම් සුහිත වීම්ද යනාදි කියයි ද එහෙයින් තාගේ [5]මෙ බස් [1]නො හැදහිය [6]හැකි මැයි. තා කියන්නේ වඤ්චාය—මි, මිත් යන පිණිස තා වඤ්චා කිරීම් වශයෙන් කියන බව දනිමියි යනුයි **කිලිතානං**, තෙත්වූ.

## 298. උදුම්බරජාතකං

[7]**සංවෙජෙයිති**, [8]කලකිරුවයි–[9]බවයි යූ තැන්; **අවජරං පහරිත්වා**, රැනැණිව අසුරු ගසා; **ඔක්ඛන්දිකං**, පැන පැන; **මක්කටියානි**, මුඛවිකාරාදීවූ වඳුරු කෙළියි; **ඔක්ඛන්දිත්වා**, [10]පැන පැන නොහොත් ඔකඳ කොට මතුරුවු උවත්වමින්; **මුඛවිකාරානි**, මුව විසුළු; **පරම විසුද්ධි** නම් ධ්‍යානයෙන් ශුද්ධ වන බවයි; **ඣානාභිඤ්ඤතො විහරාම**, ධ්‍යානයෙන් යුක්තවැ වසම්හ; **ආරා**, දුරින්; **පඤ්චවිධං බීජං**, මූල ඛන්ධ [11]ඵලු අග්ග බීජ බීජය යන මේ පස් බිජු. එහි මූලබීජ නම් අල කසා ආදියි, ඛන්ධබීජ නම් නුග ඇසතු ආදියි, ඵලුබීජ නම් උක් බුලත් ආදියි, අග්ගබීජ නම් ඉරිවේරිය අඳු ආදියි, බීජබීජ නම් උඳු තල ආදියි.

## 299. කොමායපුත්තජාතකං.

[12]**පුරාණසන්ථතං**, පරණ ඇතිරි–පංසුකූල–දමා පියා තුබූ චීවරාදියයි; **සණ්ඨාරා ගරහිතො**, දෙවසක් ඇතිවැ උපසම්පදා කළ හෙයින් බුදුන් විසින් නින්දිත වූයේ; **තිංලලිතෙ**, කොසඹ වස්තුයෙහි විවෙකවැ වැඩහුන් කල්හි; **අධම්මිකාකතිකා** නම් යම් කෙනෙක් සජීඥයන් [13]විවෙකවැ වැඩහුන් [14]තැනට ගියාහු නම් ආපත්ති යයි කියා මෙසේ ආපත්ති වශයෙන් කළ [15]කතිකායි. **වෙකො**, වක්—[16]දිවි ජාතියෙහි; **ගිජ්ඣොදකං**,

1 නොහැදිය ACD. 2 ආරණ්‍යයෙයි CD. 3 මේ පාඨ මුද්‍රිත අට්ඨකථායෙයි හා මෙහි විසදෘශව පැනේ. 4 සබ්බී CD. 5 බස් AD. 6 හැකිය AC. 7 සංවෙජෙසීති CD. 8 කලකිරිවයි CD. 9 බවයි හෝ AD. 10 පැන C. 11 ඵල CDE 12 පුරාණසං CD. 13 කතාවිවෙකව BCDEF. 14 කලතැනටයි D. 15 කතායි D. 16 දිවිආදියෙහි C. දිවිජාතියෙහි D.

**හුල්දිය; පරික්ඛිපි,** වටකොට [1]ගති-පහණ එකාහෙලා නොගලා සිසාරාගෙන දිය සිටි [2]බව ගෙනැ කිහු. **අජ්ඣප්පත්තො,** පැන හුනුයේ.

## 300. වකජාතකං.

## පඤ්චමො වග්ගො.

## [3]තිකනිපාතවණ්ණනා නිට්ඨිතා.

[4]**පුච්ඡපටිපුච්ඡවිතක්කා,** පෘච්ඡා ප්‍රතිපෘච්ඡාව ධන කොට ඇත්තාහු. පෘච්ඡා නම් පළමු පෘච්ඡාය. ප්‍රතිපෘච්ඡා නම් විභාග විසින් විස්තර වශයෙන් පිළිවිස්මයි. **සීසං,** [5]හිස්; **පානීයං,** බොන පැන්; **පබ්බජ්ජාභිසෙකං,** ප්‍රව්‍රජ්‍යා නැමැති අභිෂෙකය-ප්‍රව්‍රජ්‍යාව උත්තමස්ථාන හෙයින් කියත්. **පටියොධං,** තමා හා සම දෙවැනි යොධයක්හු; [6]**පසාදෙන්තො,** [7]පලඳනා පලඳවා; **බාහිරෙනෙව,** බැහැරින්මැ-නුවර වැද්දනොදී පිටතදීමැ යනුයි; **සීහහනු,** සිංහ සමාන වූ; [8]**සුසිට්ඨො,** මනාකොට අනුශාසනා කරන ලද; **නහනූන** යන නිපාත සමුදාය ප්‍රතිෂෙධාර්ථයෙහි වැටේ. 'නහනූන ජානාති'යි [9]සබඳ කරනු—නොදන්නා වනැයි යන අර්ථයි. **ලෙඩං,** පත් ගසුන්. 'සාලිඩෙගා ච' යනු තමා නොහඟවා කියා. **සෙනාගි,** [10]එසේ බැවින්; **අනිවත්තිනො හුත්වා,** නොවැළක—පසු නොබැස; [11]**ඔසානං ආපාදි,** වැර හෙළීමට පැමිණියේ; **යථාරුචිං,** අනුන්ගේ යෙදුම් මෙහෙයීමක් නැතිවැ තමන් කැමැති පරිද්දෙන්; **උදරපස්සෙ,** බඩ ඇල යෙහි; **වාමහත්ථෙන,** වමතින්; **උප්පීළෙත්වා,** පැහැරැ-අසු යටාපියා පෙරළා ගෙන හෝ; **අනයො,** අවැඩ; **විනාසං න භණන්ති,** බොරු නොකියත්; **උපාතිවත්තො,** ගික්ම පවත් තාහු; [12]**අප්පභඤ්ජකමුසාවාදං,** වැඩ නසන [13]මුසවා; **භඤ්ඤමානෙ,** කියන කල්හි; **න උස්සුයන්ති,** ඊර්ෂ්‍යා නොකෙරෙත්; **දමො,** වීර්‍යද; **අදෙජ්ඣො,** සමාධි තරකොට ගැන්මයි; එහිම අර්ථයි 'අභෙජ්ජසමාධි' යනු-නොබින්ද හැකි [14]සමවායි; සමාධි යනු මෙතැන තත්පරියාය [15]කියා. **කාලෙ** යන්නට අර්ථයි 'විරියකරණකාලෙ'; [16]**අවඞ්ගතා** යනුත් පරියායෙන්

1 ශැති CD. 2 හව CD. 3 තිකනිපාත CD. 4 පුච්ඡාපටිපුච්ඡාවිතක්කා-මු අ ක. 5 රිස් CD. 6 පසාදෙන්තො ACD. 7 පලනා පලඳනාව CD. 8 සුසිට්ඨා-මු අ. ක. 9 ශබ්ද කරනු ACD. 10 එබැවින් C. 11 වොසානං-මු. අ. ක. 12 අපච්ඡභඤ්ජනක මුසාවාදං-මු. අ. ක. 13 මුසාවාදයි D. 14 සමාගමයි A. සමාවයි C. 15 කියත් ACD. 16 අභාඞ්ගතා CD.

අතොලිත භාවයෙන්; [1]**එතං අඤ්ඤාසක්කානං**, එසේ ඒ අනොසක්කනයද; **විලාපං ගාහාපෙත්වා**, හැර පියා ගිය [2]වසතුව ගන්වා-කොල්ලගන්වා හෝ.

**301. චුල්ලකාලිඞ්ගජාතකං.**

**වම්මිකං**, සත්නාහ සන්නද්ධ වූ; **චඞ්කමාපෙත්වා**, ඇත මෑත ඇවිදුවා පියා; **බලිං**, කරවුවර; [3]**පක්කාපූවෙ**, [4]ලහළු; **පරිසජ්ජිත්වා**, සිපගෙන; **සුවණ්ණපට්ටකෙන**, රන්තට්ට මින්; **අභෙජ්ජා**, කාත් විසින් නොබිඳිය හැක්කාවූ; **දානං**, පරිත්‍යාගය; **අඞ්ජසෙසු**, සෘජුබුද්ධි ඇත්තවුන් කෙරෙහි; **ආපදාසු**, ආපත්තියෙහි, [5]**සංයොගො චෙව**, එක්වීමද; **එතං සබ්බං**, සංයොග විශෙෂ දර්‍ශනය යන මේ සියල්ල; **නස්සති**, නැසෙයි-නොපවතියි; [6]**මහාප්‍රජ්ඤං**, මහත් පැහැ ඇතියේ; [6]**මහාවිප්ඵාරං**, මහත් පතලාවූ අනුසස් ඇත්තේයි.

**302. මහාඅස්සාරොහජාතකං**

[7]**දුබ්භි**, ද්‍රොහ කෙළේ; **සිඞ්ඝාය**, සහල්ලෙහි: **උත්ත රුම්මාරෙ**, උඩළියෙහි; **අනුස්සවචසෙන**, අසා එන හෙයින්; **නිට්ඨිතා**, කොට නිමවන ලදහ; **ලභිත්වා පුරිමං**, 'අපුරිමං යස ඤ්චව ලද්ධා' යි තැන්-අපූර්වවූ තොලද විරූ ධ්‍යානය ලදින් යන අර්ථයි; **පනුජ්ජ** යනුයෙහි අර්ථයි 'පනුදිත්වා' යනු-දුරුකොට යනු අර්ථයි; **අභිනිබ්බුතා**, නට.

**303. එකරාජජාතකං.**

**උක්කාරභූමියං**, කසලගොඩ; **දද්දරපබ්බතපාදෙ**, සළුවිත පර්‍වත පාදයෙක්හි; **දෙඩ්ඩුභානි**, දියබරණහයි; **සපන්ති** යනු යෙහි අර්ථය 'අනෙකාසනාති' යනු. **දූරකතානි**, [8]දුවැසියන්; **පුන අත්තනො පහොනකකාලෙ**, නැවත තමහට පිළිවන් කාලෙක්හි.

**304. දද්දරජාතකං.**

රූ [9]දවහල් එක්කොට සඳස පැ ගෙනැ 'ජ්ඣුපි කොටඨාසෙ සු'යි කියූ වෙත්. **අනොනාභොපිසත්ථාරෙ**, කොටිසන්ථාරයෙන් ඇතුලත්හි; **සුලැස්සෙන්** මසු තබා ගත් පියෙස්හි ය යූ සේයි.

1 එවං-මු. අ. ක. 2 වසතු C. 3 පක්කාපූවං-මු. අ. ක. 4 අවුළු BCDEF. 5 සංයොගො ගොමෙව-මු. අ. ක. 6 මු. අ. කථාහි මේ වචනයන්ගේ ක්‍රම විපර්‍ය්‍යාසයක් පැනේ. 7 එකරාජ ජාතකයට අයත් පාඨ හා අර්ථ A හි පමණක් ආයේයි. 8 දුබැස්සන් A. 9 දවස් BCDEF.

මසුරන් සුලසින් තබා ගත් හෙයින් ජෙතවනයට නම්. **ඡෙත්වා**, සොරා ගෙනැ; **තං**, ඒ [1]අන්‍යයක්හු නැති තැන; **මයා අසුඤ්ඤං හොති**, මා ඇති හෙයින් මා විසින් [2]අශුන්‍ය වේ; **ධම්මං ජහු**, සත් ප්‍රතිලාභයෙන් පිරිහුණාහු; [3]**නික්කමෙන**, වැරැයෙන්.

## 305. [4]සීලවීමංසජාතකං.

**සිරිව්හාදෙ**, සත්‍රී කලහ-සත්‍රීන් පිණිස කළ ඩබර; **සයන කලහෙ**, ශය්‍යායෙහි කලහ-යහන් විෂයෙහි වූ කලහ; **එකා** [5]**පණ්ණිකධීතා**, එක් පලා වෙළඳ දූවක්; **බදරපච්ඡිං**, ඩෙබර පැසක්; [6]**කංසමල්ලකෙ**, රන්තච්චමැ; **වග්ගු**, මනොඥවූ; [7]**වොක්ඛා**, සුචි; [8]**හංසෙ**, මුඩුවූ; **කොලියං**, [9]කුලෙහි ආ; **එලං**, ඩෙබරපක්; **උඩ්ඩයනකෙ**, දනු ලැබෙයි; **ඛචිතොචිතං**, බුනු බුන් නා; [10]**ඛචිතාසි**, හවුලයි; [11]**කුලදනතියං**, කුලපරම්පරායෙන් තිට වෙළඳුම් වසයෙන් පැමිණියාවූ.

## 306. [12]සුජාතජාතකං.

**සෙඛො**, [13]සෙඛ සැහැවියෙම්—රහත් නොවූයෙම් යු සේයි; **සකරණීයො**, අවසිට කරණීය ඇතියෙම්. මහ සදණීන් සියුසස්හි කටයුතු කිස කරණීය නම්. **උය්‍යානොවරකෙ**, පිරිනිවන් පානට වැඩහොත් උයන් ගබඩායෙහි; [14]**කපිසීසෙ**, අගුළුකණුයෙහි; **පධානමනුයුඤ්ජ**, වීරියයෙහි යෙද; [15]**පලාසරුක්ඛ**, කැහැලරුක්හි; **පරික්ඛිපිත්වා**, සිසාරා—වති ආදීන් පරික්ෂෙප කොට; **පරිපාදිතානි**, කරන ලද්දවූ මෙහෙ; **තිම්බරු**, තිඹිරි; [16]**පිලක්ඛු**, පුළිල; **පුබ්බයඤ්ඤො**, පෙර කළ පින්; [17]**අදාසාදෙ**, අසසාමිකවූ; [18]**වාචාපන්දිතානි**, තෙපුල් පොපියෝ—වාග් විස්සන්දනත්හු යයි යනුයි; [19]**කායපන්දිතානි**, කායවිස්සන්දනී හුද—කායචලනයෝද; **පුබ්බ සිට්ඨයඤ්ඤවසෙන**, පෙර කළ දන සම්බන්‍ධවූ යාග වසයෙන්; [20]**කුම්භිනං වසෙන**, නිධාන චාරීන්ගේ වසයෙන්.

## 307. පලාසජාතකං

---

1 අන්‍යයක්හු CD. 2 ශුන්‍ය නොවේ A. ආසුත්තනවේ CD. 3 නික්කමෙ, නැව තුයෙන්-හැම. 4 සීලවීමංසනජාතකං-මු. අ. ක. 5 පණ්ණිකාධීතා CD. 6 කංසතලකෙ BCDEF. 7 පොක්ඛා-මු. අ. ක වොක්ඛා AC. 8 මණ්ඩු CD. 9 කුලෙහි BCDEF. 10 ඛචිතාසි ACD. 11 කුලදනතිකං-මු. අ. ක. 12 සුජාතා-මු. අ. ක. 13 සෙඛයන් B. සෙඛය C 14 කපිසීසං-මු. අ. ක. 15 පලාසරුක්ඛ-මු. අ. ක. 16 පිලක්ඛ AD. 17 ආදාසාදෙ ACD. 18 වාචාතන්දිතානි CD. 19 කායතන්දිතානි CD. 20 නිධිකුම්භීනං-මු. අ. ක.

[1]රුක්ඛකොටඨකසකුණො, රුක්[2]කොටු ලිහිණි-[3]කොටරමුණෝයි; පසුතො, සොයන්නේ; කිනෙන[4]දුක්ඛය තිති, කිමෙක් තට දුක් කෙරේ දැයි; පතිඪා ගතං, තුබූ තැනින් වැටී ගී පලා ගියේ-ලගනව තුබූ තැනින් ගිලිහී පිටතට පලා ගියේ යනුයි; [5]'අහු වම්හසෙ' යනුයෙහි 'අහු' 'එව' 'අම්හසෙ' යනු පදච්ඡේදයි. 'එව' යනු 'අම්හසෙ' යනුයෙහි යොදනු. අම්හසෙව, 'කරිම්හයෙව' යි තැන්; තතො, ඒ කෘත්‍ය යෙන්; [6]ලුද්දකානි කුබ්බතො, දරුණුකම් කරන්නාවූ; 'ජීවයි යං තං බහුං තනු' [7]යි ගන්නේ. 'යස්මිං කතඤ්ඤුතා නත්ථි තං තථාරූපං අකතඤ්ඤුං—පෙ—අප්පතිකාරකං පුග්ගලං සෙව නතස්ස සෙවනා නිරත්ථා' යනු සම්බන්ධයි. අනුසූයාං, ඔවුන් කෙරෙහි රැහැණි නොවන්නේ; [8]සමමුඛෙ සනෙත ගුණෙන, සම්මුඛයෙහි—දැක්කදී—ප්‍රත්‍යක්ෂකොට කළාවූ ප්‍රථමොපකාර සංඛ්‍යාත ගුණය හෙතුකොට ගෙනැ යමක්හුගේ මිත්‍රධර්මය නො ලැබේද හෙවත් ප්‍රත්‍යුපකාර වශයෙන් යමක්හුගේ මිත්‍රභාවයෙක් නැත්ද; සණිකං, සෙමෙන්

## 308. ජවසකුණජාතකං.

බාහිරමනෙනපි, පිටත් ශාස්ත්‍රද පොවා; වාචෙනෙන, පුහුණු කරන්නවුන් හෙවත් කියවාදී උගන්නවුන්; ධුව ඵලො, නිබඳ ඵල ඇතියේ හෙවත් අනවරතයෙන් ඵල ගන් නේ; වාහසා, කාරුණෙන්; [9]බලම්බනිසාඛං, බිම බලා එල්ලෙන අත්තක්; නටෙඨා, මාගම් විසිබැවින් [10]නටුයෙමි; ඪෑං [11]ධූලො, උසස්තෙහි හිඳ ශාස්ත්‍ර උගන්නා හෙයින් වරද [12]තුලුල් බැවින් තෝ [13]තුලුල්හි; මතො, [14]පුරාතන ධර්මයෙන් චුත හෙයින් මෙලේ්ය; උපසෙවනං යනු මාඑවට නම්. සිතකං, [15]සෙවනය කරන ලද—එයින් මිශ්‍රවූ—යුක්තවූ—යනුයි; අසමා, පහණෙකින්; පාසාණො ඝටං විය, 'ඝටං භිඥනෙතා පාසාණො විය' යූ සේයි; තාය, ඒ ව්‍රතයෙන්

## 309. ජවකජාතකං.

සලලකඛිතකඛණෙයෙව, සලකුණු කළ කෙණෙහිමැ; [16]නිටඨුයමෙකඛලසදියං හොති, කාරා දමාපි තෙල හා සම

1 රුක්ඛකොටඨකා-මු. අ. ක. 2 කොට ලිහිණි AC. 3 කොටරමුණෝයි BCDEF. 4 දුක්ඛතිති BCDEF. 5 අහු අම්හසෙ යනු පදච්ඡේදයි BCDEF. 6 ලුද්දානි-මු. අ. ක 7 සිතන්නේ C. යි තන් BD. 8 සමමුඛෙන CD. 9 ඔලම්බති--මු. අ. ක. 10 නටිමයන් BCDEF. 11 ඹූළෙහා-මු. අ. ක. 12 තුලුම් BCDEF. 13 තුල්හි BCD EF. 14 ධර්මයෙහි C. 15 සිකඩුවනය කරන ලද BCDEF. 16 නුවටුහ-මු. අ. ක.

වත්තේයි; ඛානසුඛෙනො, ඛානසුවයෙන්; අනනුවිනිපාතන සඞ්ඛාතෙන, තමා හෙළීම යයි කියන ලද.

## 310. සයහජාතකං.

## පඨමො වග්ගො.

**අරඤ්ඤකුටිකාය**, අරණ්‍යයෙහි කළ ගෙගෙක්හි; **කුටිපරිවෙණං**, [1]කිළිගේ ආකාරයෙන් කළ පිරිවන් කුටිපරිවෙණ නම්; **පමුඛෙ**, තිසවත්තෙහි; **පදං මොචෙත්වා**, නොපෙනෙන නියායෙන් [2]පිය වළහා; **උක්කං**, [3]සුළුකලේ; **නිම්බො**, කොසඹ; **සුපිනෙන**, නිදීමෙන්; 'යනනු' යන්තෙහි 'නු' යනු [4]පෘච්ඡාර්ථයි **ගහෙස්සන්ති යං**, ගන්නාහ යන යමෙක් ඇත්ද; **තත්ථ**, එහි; **පුචිමන්දස්ස**, කොසඹවෘක්ෂයහට; [5]**රුක්ඛසමුද්දචාරෙන**, වෘක්ෂයෙහි විසූ දෙවතාව හට වෘක්ෂයෙහි නමමැ කියන හෙයින් රුක් වොහරින්; **තස්මිං**, 'අසනනරුක්ඛෙ' යූ සේයි. [6]**ලභිස්සාම**, ලදුමෝ නම්.

## 311. පුචිමන්දජාතකං.

[7]**විස්සමෙත්වා**, සනපා; **සීසෙන උපසිලෙනෙනා විය**, ඉසින් යනත්තක්හු මෙන්-ඉසින් යන යනා ගෙනැ යත්තක්හු සේයි; **ත්වං මං** [8]**අවසං ආනෙසිනි**, තෝ මා නොකැමැති සේ ගෙනැ යෙයිද්දයි; **කොපිනො**, ආපස්සෙහි; [9]**දෙවදතනියං වක්කලං ගහෙත්වා**, දෙව්දූති සුඹුළු ගෙනැ; [10]**වස්සාරතෙන**, වැසි කල්හි; **ත්වං මං අනතානො රුචියා ආනෙසිනි**, තෝ මා නොකැමැති සේ ගෙනැ යේ දූයි; **පටිපස්සද්ධකිලමථං**, සන්හුන් මාගී පීඩා ඇතියහු; **උපනිසීදිත්වා**, සමීපයෙහි හිඳ; **සපති**, ආක්‍රොශ කෙරේද; **සමථං**, සන්හිදීමට; **සමායනති**, එක්වෙත්ද; [11]**න ජීරති**, නොනස්සි; **අධිපන්නං**, හික්මුණහු; [12]**ධිකතාපාපො**, නීන්‍දකරන ලද පව් ඇත්තේ; **උභයෙනාපි**, [13]'ධීරො' 'පණ්ඩිතො' යන දෙකින්මැ; [14]**අස්මිං**, මොහු කෙරෙහි මා කළ රොස් යයි කියා; [15]**නං අච්චයදෙසනං**, ඒ තමාගේ දෙෂ දන්නහු විසින් මේ මාගේ දෙෂය ක්ෂමා කළ මැනවැයි කියා මෙසේ

1 හිළිගෙ කළ BCF. ගිලිගෙ D. 2 පද A. 3 සුළුකෙලෙ ABDF. 4 ප්‍රච්ඡාර්ථයයි BCDEF. 5 රුක්ඛසමුද්දයෙන CD. 6 අලභිස්සාම BCDEF. 7 විස්සාමෙත්වා-මූ. අ. ක. 8 අනනනො වස.-මූ. අ. ක. 9 දනෙතාහි වක්කලං ගහෙත්වා, දතින් සුඹුළු උපුට ගෙන ABDEF. 10 වස්සනෙත-මූ. අ. ක. BCDEF. 11 නාභිරති BF. නවිභිරති CD. 12 ධිකතිනපාපො ACDEF. 13 ධිතො පණ්ඩිතො යනු C. 14 අස්සද්දස්මිං-මූ. අ. ක. 15 අච්චයදෙසනං-මූ. අ. ක. න අච්චයදෙසනං BCD.

කරන්නාවූ අච්චය දෙසනාව; පතිගණ්හිතුං, යහපත ක්‍ෂමා කොළෙමියි කියා මෙසේ පිළිගන්නාසේ; තේසු අධම්මපෙනෙන තූසි, ඒ විරුද්ධයන් තමා ¹කෙරෙහි ක්‍ෂමා නොකරන කල්හිදු තුමූම සමුච්ඡින්නවීයහීයෙන් යුක්තවූ.

## 312. කස්සපමන්දියජාතකං.

විවේකානුදනවසෙන, යමෙක් යමෙක් යම් යම් වස්තුවකට සුදුසු වී නම් ඔහට ඒ ඒ වස්තු පරිත්‍යාග කොට දෙන දාන වශයෙන්; අඩෙක සසී, ඇතයෙහි හිස තබා ගෙන ගොත්තෝය; ²පකොජිංසු, කොළෝ-පැවැත්වූ; ³පකබනතා, වන්නාහු; කිඤ්චි කිඤ්චි, ⁴කිසි කිසිවක්-මඳ මඳ ⁵ධම්යක් හෝ; වසලියො, ⁶චණ්ඩාල දූහු; වූපසමෙසුං, එවිටම සන්හිඳුවූ; ඛන්තිවාදී, ක්‍ෂාන්තියෙහි ගුණ කියන හෙයින් ⁷ක්‍ෂාන්තිවාදීම්හයි; කණ්ටකාකසඤ්ච, ⁸කටු සැම්ටියද; ⁹කාසායනිවසනො, කහද ආදී කාෂාය වස්ත්‍ර හැන්දේ; ¹⁰ගණ්ඩියා, හිස් තබා කපන ¹¹කොළොඹුයෙහි; උක්ඛිපිත්වා, ¹²උසුලාගෙන; සාටක කණ්ණෙ ඛන්ධා, කපා වල දමාපී හසනපාදදිය පිළී ¹³කුරු ගුලායෙක ලා එක්කොට තබා; ¹⁴බලිබද්ධසාටකො විය, කැඳ හොත් දළපිළීයක් සේ. ¹⁵කැඳ ලූ කඩ සේ නැතිවැ පැලෙන හෙයින් කියත්; අජෙදසි, මැරවිද; සමප්පිතො, පිහිටියේ.

## 313. ¹⁶ඛන්තිවාදිජාතකං.

චිත්තකෙළිං, රිසි රිසි නොඑක් කෙළි; මරණචක්කෙන, මරණ නැමැති ¹⁷බුරචක්‍රයෙන්-රියසකින්-චක්‍රායුධයෙන් හෝ; ¹⁸සාවත්ථිසාමන්තෙන, සැවැත් නුවර සමීපයෙහි; මේ පොළොව යටින් ලෝකුඹු නරකය සැවැත් නුවර ඉද්දේ බව ගෙන කියත්. ¹⁹විධූනිංසු, සලාපීහු; සසපපිනාම්මා අපසපිනාම්මාති, සවපනයට කළම්නා ප්‍රතිසාර ඇත්ද නැත් දැයි; ලම්බිකා සකුණිකා, ගොමරිති ²⁰ලිහිණි නොහොත් කැටකිරිලි; ²¹පච්චුපට්ඨපෙසුං, එළවූහු: ධුනූගනිතො, යාගසාමහයෙහි ²²බැන්දවුන්; ²³උස්සාහයන්තා, 'උස්සාහපතන්තා' යු සේයි-

---

1 හා BCDEF. 2 පසොජයිංසු-මු අ. ක. 3 පසාකනතා-මු. අ. ක. 4 කිසි කිසි හෙවත් BCDEF. 5 ධම්පදයක් හෝ BCDEF. 6 චණ්ඩාලදූ A. චණ්ඩාලවූ BCDEF. 7 ක්‍ෂාන්තිවාදි නම්හයි C 8 කටුශම්ටියෙන්ද CD. 9 කාසාවනිවසනො-මු. අ. ක. 10 ගණ්ඩියා BCDF. 11 මස්ලොඹුයෙහි A. 12 උදලාගෙන C. 13 කුරුගුණයෙක B. කුරගෙයක CD. 14 බලිඵද්දසාටකො C. බලිනදධසාටකො ABDF. 15 කාදළු CD. 16 ඛන්තිවාද CD. 17 සුබවක්‍රයෙන් D. 18 සාවත්ථියා-මු. අ. ක. 19 ධුනිංසු-මු. අ. ක. 20 මිහිදි BCDEF. 21 පච්චුපට්ඨාපෙසුං BCDEF. 22 බැඳවුන් D. බැඳුනුන් CEF. 23 උම්භාගයන්තා ABF, උම්මාහසනතා CD.

උත්සාහ ඇත්තාහු නොහොත් උඩඟු වූවාහු යන අර්ථයි; **පසුඝාතයඤ්ඤං**, තිරශ්චීනයන් මරා කරන හෙයින් පසුඝාතක නම් යාගය. මනුෂ්‍යයන්ද ඇතත් තිරශ්චීනයන් [1]බෙහෙවින් කීයත්. **ඵුනූපනීතො**, යාගටැඹට එලවන ලද්දේ; [2]**මමායසි**, නොවියදම්වීම පතහිද-වියදම්වනු නොකැමැත්තෙහිද යනුයි; **පටිබාහි**, වැළකී; **වාරිතනං**, අතිචරණයට-බැවහාරයට හෝ; [3]**ඛණ්ඩිතෙ**, කකියනලද; **ඛාර**, ඇතිත් මැතට කපා විදගෙනැ යන හෙයින් ක්ෂාරවූ; **ඵේනුද්දේහකං**, පෙණ නඟ නඟා; **කුම්භිනලං** ආහච්ච, [4]සැලපල්ලෙහි ගැසී; **පකටඨං කානං**, ප්‍රකම්පයෙන් කරන ලද; [5]**එතෙසං**, ඒ තිරිසනුන්ට; **පියාලපන මෙතං**, [6]මේ ප්‍රියත්වයෙන් ආලපනයයි; **වදඤ්ඤූ**, යාචකයන්ගේ අභිප්‍රාය දන්නෙම් හෙවත් ත්‍යාගී වූයෙම්; **නෙරයිකාසත්තෙතා** යනු වෙන වෙන එකක් එකක්හුගේ වශයෙන් එකවචනයෙන් කීහු. **භෙරිං චරාපෙත්වා**, සව්සත්වයන්ට අභය පිණිස බෙර ලවා.

## 314. ලොහකුම්භිජාතකං.

[7]**පීතවිරෙචනානං**, [8]බොනලද බෙහෙත් ඇත්තවුන්ට; **සෙනහවිරෙචනං**, විරෙක පිණිස වළඳනා තෙල් හෝ සෙනහ විරෙචන නම් වේ; **රසභතනං**, රසබත්-මස්රස සහිත ආහාර යයි; **ඔදනියඝරවීථියං**, බත් [9]විකුණන ගේ ඇති බත් වෙළඳුන්ගේ වීථියෙහි; [10]**අතිපපගෙව නිවතතිස්සාති**, [11]ඉතාමැ කලමැ-නොවේලෙහි-අවුතැයි; **පූරෙත්වා**, හැම දෙනාගේමැ පා පුරා; **මංසං ලභි** යනු මාංස සහිතවූ ආහාර ගෙනැ කීහු; **මගසභාගට්ඨානෙ**, මඟට නුදුරු තන්හි; **ඒතං—පෙ—**[12]**ආහරාපෙස්සාමි**, මේ වැද්දා ලවා මස්කඩක් ගෙන්වා ගනිම්ද හෙවත් මට දෙවා ගනිම් දැයි; [13]**කිලොමමංසඛණ්ඩං**, වැදලි මස් කඩක් නොහොත් [14]දලබුකඩක්; **අඞ්ගමෙව**, සතැලි මාංස යක්මැ නොහොත් ශරීරාවයව ඉක්මැ මස් පිණ්ඩියක්මැ; **අසනතො**, පවත්නා බැවින්; **අතතනො කුටුම්බමජෙඣ**, තමා බෘහදය හා එක්වැ.

## 315. මංසජාතකං.

1 වෙසෙසින් BCDEF. 2 වනායයි-හැම. 3 කුපිතෙ-මු. අ. ක. ඛණ්ඩිතො BCDF. 4 සැලි BCDEF. 5 මු. අ. කථාහි නොපැනේ. එතෙ, ඒ තිරා සතුන්ට CD. 6 වෙන වෙන එකක් එකක්හුගේ එකවචනය වශයෙන් ප්‍රියත්වයෙන් ආලපන යයි-හැම. 7 පීතවිරෙචනානං මෙව CD. 8 වළඳනා BCDEF. 9 විකන BCDEF. 10 අතිපගෙව නිවතතථානි-මු. අ. ක. 11 ඉතාම කලැ කලැ බතා නොලෙහි ආවු නැයි CD. 12 ආහරාපෙමීති-මු. අ. ක. 13 කිලොමඛණ්ඩං-මු. අ. ක. 14 මෙතැන් පටන් 174 වෙනි පිටේ 2 වෙනි පෙළේ 'මස්වායා' යනු දක්වා A හි පමණක් පැනේ.

**එකතො පබ්බතපාදෙ**, එක් දිගායෙකින් පර්වත බෙහෙයද; **උද්දා**, මස්කාවා නොහොත් මස්වායා; **බාලිසිකො**, බිලීවැද්දෙක්; [1]**භසසි**, බරි; **කුටියං**, පැල; **ද්වෙ මංසසූලානි**, වැල්හිරිමස් දෙකක්ද; **දධිවාරකඤ්ච**, දීගෙඩියක්ද නොහොත් දීපැණියක්ද; **උග්ගාහණරජ්ජුකං**, [2]උගුරු රැහැණ; **අම්බපිණ්ඩිං**, අඹකැතක්; **දබ්බතිණානි**, හීතණ; **පලෙගව**, ඉතාම උදූසනය; **රත්තිභත්තං**, රාත්‍රි භක්තය පිණිසැ; **අමුස්ස**, මේ ක්ෂෙත්‍රපාලයාගේ; **සංකඩ්ඪිත්වා**, හයා—එක තැනැ රැස් කොට; **දබ්බතිණසයනකො**, හොත් හීතණ යහතින්; [3]**උප්පතිත්වා**, අඟුරු මත්තට පැනැ; 'ලොමමත්තම්පි' යි නො කියා **ලොමකූපමත්තම්පි** යි කායෙන්ද්‍රිය සමහව වන තැන් ගැන කිහු. **පබ්බතරසං** යනු [4]හිඟුල් පර්වතය යූසේසි. **සසලක්ඛණං**, සා රුව—

## 316. සසජාතකං.

**පවෙසෙථාති**, වඩා එවයි. ආදර වශයෙන් බුදුන් ගෙට වඩනට කියන්නේ අනුන්ට නියොග කරන්නා සේ කියා. **අමච්චා**, ඔහු හා සුඛ දුක්ඛයෙහි එක්වැ ඔහුගේ ඒ ඒ කෘත්‍යයෙහි නියුක්ත වූවාහුද; **මුඛසංකොචනමත්තම්පි**, [5]මුහුණු හැකිළිම් මාත්‍රයකුදු; **අට්ඨ ලොකධම්මෙ**, ලාභය අලාභය අයසය යසය නින්දාය පසංසාය සුඛය දුක්ඛය යන [6]අෂ්ටලොක ධර්මයන්; **අත්තානම්පි**, තොප තොපටද; [7]**අහි ච භොගිනො**, භොගීය යන නම් ඇති සර්පයෝද; **අගිකීරරෙ**, [8]මඩිත්ද; **සූරා**, සූරයම්හයි යන අභිමාන ඇති හෙයින් සූරවූ; [9]**වීරා**, වීරියවන්තයම්හයි යන අභිමාන ඇති හෙයින් වීරවූ; **සරීරභොගෙන**, ශරීර භොගයෙන්-භොගාවලියෙන්ය යූසේසි—

## 317. මතරොදනජාතකං.

**තං** [10]**සභොගං ගාහාපෙත්වා**, ඔහු භාණ්ඩ හා එක්කොට අල්වා ගෙනැ; **බරස්සරෙන**, දැඩිවූ ස්වර ඇති; **පණවෙන**, [11]පණාබෙරින් යුක්ත කොට; **නගරෙ**[12]**විලොපඛාදකො**, නුවර පැහැරැ ගෙනැ කන්නාවූ; **සබ්බසං**[13]**මත්ථකෙන**, හැම දෙනා වමැ මත්තෙන් හෙවත් හැම දෙනහට උස්වැ-හැම දෙනහට වැඩි හරම්වැ; **අයං—පෙ—පාකටො**, මේ අප ගෙනැ හැරපී

---

1 මූ. අ. සාඨාභි නොපැනේ. 2 උගුරු ACD. 3 ලඞ්ඝිත්වා-මූ. අ. කා. 4 හිඟුල් පර්වතයයි BCDEF. 5 මූන BDF. 6 අෂ්ටලොකධර්මයෙහි CD. 7 උරගාච භොගිනො-මූ. අ. කා. 8 මිණීද A. මස්ද BCDEF. 9 මූ. අ. සාඨාභි නොපැනේ. 10 සභොණ්ඩං-මූ. අ. කා. 11 බෙරින් BCDEF. 12 විලොපකාරකො-මූ. අ. කා. 13 මත්ථකමත්ථකෙ-මූ. අ. කා.

සොර තෙම රට ප්‍රකටය. ඔහු රට වැස්සෝ හැම දෙනම[1] හඳුනති. එහෙයින් මේ සිටුපුතු දවගල් මරන්නට ගෙනැ යන්නමෝ වූ මෝ නම් මේ සොරා නොවෙයි අතිකෙකැයි දැන ගන්නාහ. එහෙයින්; **[2]සමන්ධකාරං නාම හොතු**, [3]ඒ තාක් තව අඳුරුවැ යේවයි-පසුවැ අඳුරුවැ ගිය කල; **පතිසල්ලීනවෙලාය**, හැකිළැ ගිය කල්හි; **ආඝාතනං**, වධ්‍යභූමියට; **උය්‍යානවතිං**, උයන්වැට; **භානුසු**, ශොභා ඇත්තේ; **රත්තරත්තානං**, මදක් රත් රත්වූ; **පරිවත්තෙනායි**, බොහෝ කලක් කරන ලද සංසර්ගී ඇති ඒ තමාගේ ස්වාමිහු පෙරළා මා ගැනීම් වශයෙන් පරිවත්තනය කළා; **අධුවං මං**, තමහට තහවුරු නොවූ මා.

## 318. [4]කණවේරජාතකං.

[5]**දීපකත්ථිතත්තිරං**, නමා හුන් තැන් [6]ගඩා පහල කරන හෙයින් දීපක නම් වටු—සේවටු යයි යනුයි; **මං පටිච්ච**, මා නිසා; **කම්මං**, කර්මය; **ඵුසති**, ලුද්දක තෙම ස්පර්ශ කරන්නේය·සිද්ධ කරන්නේයි; **පටිපන්නො**, [7]මාගේ නෑයන්ට උපද්‍රවස්ථානයෙහි; **තිට්ඨාමි**, සිටියෙමි; **අබ්‍යාවටස්ස**, පව් කිරීමෙහි උත්සාහ නො කරන්නාවූ තට; **පටිච්ච කම්මං ඵුසති**, මා නිසා ප්‍රාණවධයට පැමිණේ. [8]**නිනෙනා**, පාප විෂයෙහි [9]නිමත වූයේ; **නපොණා**, අධිකවැ නිමතවූයේ.

## 319. තිත්තිරජාතකං.

**උද්ධාරං**, දරදී; [10]**දුබ්බලයක්ඛි**, නසන්නේයයි; **ඉදං යස මත්තකමෙව**, අගමෙහෙසුන් තනතුරුයයි කියනලද මෙපමණ යසසක්ම; [11]**ගිත පාවිසාඛිකී**, ගිත පසස්නීය; **වාචාය**, දෙන්නා තිබියදී දෙම් යන බස් මාත්‍රයකින්ද; **ගිරිං**, පර්වතය; **අදදං**, නොදෙන්නේ; **සුවච්ජං**, දෙන්නට පිළිවන්වූවා; **නවච්ජී**, නොදුන්නේ. මේ පර්වතය ස්වර්ණමයවැ ගියේ වී නම් ඉන් මට කිසිවක් දෙවුදූයි මා කී කල දෙන්නා තිබියදී දෙම් යන බස් මාත්‍රයකුත් නොකිවේ යයි යනුයි. **පබ්බතං**, ස්වභාවයෙන් ස්වර්ණමය නොවූ මාගේ වචනයෙන් ස්වර්ණමයවූ ඒ පර්වතය; **වාචාය**, වචන මාත්‍රයකින්; [12]**අදද**, දුන්නේ වී නම්-ඒ පර්වතය නො දෙතුත් දෙම් යන බස් මාත්‍රයක් කියේ වී නම්;

1 හඳුනොති AD. හැඳිනෙති C. 2 සම්බන්ධකාරණං BCDEF. 3 ඒ තාක් තව අඳුරුව කියකල C. 4 කනවේර CD. 5 දීපන්තතිරං BCD. 6 පහළ කරන BCDEF. 7 මාගෙනයන්ට BCDEF. 8 තතාභිතොපා-මූ. අ. ක. 9 නිමාමවූයේ BCDEF. 10 දුබ්බෙහාසීනි BCDEF. 11 උපකාරිකා-මූ. අ. ක. 12 අදදං CD.

**නස්ස වඤ්චනස්ස**, හේ මා විසින් ඉල්වන ලද්දවූ පණීතය වචන මාත්‍රයකින් දෙන්නාවූ මේ රජහු සම්බන්ධවැ-ඒ පණීතය නො දෙතුත් දෙමි යන බස් මාත්‍රයක් කිවාවූ මේ රජහු විසින්; **කිං හි වදෙය්‍ය**, දිය යුත්තෙක් [1]කිම්ද-දෙමී කී හෙයින් මට වෙන ඉන් දෙන දෙයෙක් කිම්ද-දෙමියි කියාලා ආදි දෙමියි කී දෙය දුනමනා වේදූයි එකී පරිද්දෙන් දෙතොත් වේද එයට මැළිවැ [2]දෙමී නොකිව මැනවැ. [3]එසේ නැතිව නොදෙතුත් වී නම් [4]ලොකාඥත්ව පිණිස [5]දෙමියි කී බස් මාත්‍රයකින් මෝඝට කවර හානියෙක්ද. [6]**අථ හා වත**, මොහුගේ ලොභයක් ඉතා ආශ්චර්‍ය්‍යී [7]නියාය; **අදින්නම්පි**, කයින් සිතින් තමා අතට නුදුන් දෙය; [8]**වචනමත්තෙනෙව**, නොදෙතුත් දෙමි යන බස් මාත්‍රයකින්ම; **දින්නං හොති**, තමා අතට දුන්නා නම් වේ නම්-නොදෙතුත් දෙමියි කි බස් පමණකින්ම ඒ නුදුන් වස්තුව තමා අතට දුන්නා නම්මැ වේ නම්-[9]ඒ දෙනලද්ද නම්මැ වේ නම්; **තං**, එසේ ඒ සැටියේ ලබන දෙය; **පුරෙතරමෙව ලද්ධං නාම භවිස්සතීති**, දෙමියි කිවත් නොකිවත් ඒ පෙරමැ ලද්ද නම් වන්නේය. ඒ සැටියේ දෙන දෙය පෙරමැ ලද්දේමය. ඒ සැටියේ දෙන දෙයට වෙන දෙමි යි කිවමනා දූයි කියා මෙසේ ‘පුරෙතරමෙව ලද්ධං නාම භවිස්සතීති’යි කියා දෙමියි කිවත් ඒ සැටියේ දෙන දෙය තමාට නොලැබෙන හෙයින්මැ-තමා කරා නොපැමිණෙන හෙයින්ම ඇයි ඒ දෙයම වේදූයි කියා මෙසේ කියන බැවහාර නකා කිහු. **සභාවධම්මො**, අවිපරීතවූ ධර්මයෙහි; [10]**ජයම්පතී**, අඹුසැමි දෙදෙනා.....

**320. සුවචජාතකං.**

---

## දුතියො වග්ගො.

---

[11]**දුබ්බචො**, නපුරුවූ වත් ඇත්තෝ; **සබ්බදෙව**, හැමදපී කල්හි; **නාපෙතබ්බා**, හුණු නොව; **පිට්ඨිකොට්ඨකෙ**, මූවාපස ගෙයි පිටත-නහන කොටුව පිටිපස්සේ හෝ; **උසුමං**, උණුසුම්; **උළුඞ්කං**, හුණුදිය සාළුව-එ හෝ; **ඛනාරෙසි**, සැළ ඇතුළට බහාලී; [12]**භාජනස්ස තාලෙ**, සැළි පත්ලෙහි; **අහාභනො**-පෙ-[13]**දත්වා**, ඉන් සමහරක් තමා කැමැති අතික් තැනකටද දී;

---

1 කින්දූයි කී හෙයින් C. 2 දෙමි නොකියව C. 3 එසේ වී නම් CD. 4 ලොකාඥත්වං BCDEF. 5 මෙකී C. 6 වත-මු. අ. ක. 7 නිසා C. 8 වචනාමත්තෙනෙපව CD. 9 දෙනලද්දවූ නම්ම C. 10 ජයම්පතිකා-මු. අ. ක. A. 11 දුබ්බචො-මු. අ. ක. 12 තුමජභාජනතලෙ A. 13 ගතාබ්බා-මු. අ. ක.

**සහායට්ඨානෙ**, මිත්‍ර ස්ථානයෙහි; **චරඤ්චෙ නාධිගච්ඡෙය්‍ය සෙය්‍යං සදිසමත්තනො**, 'යදි චරන්තො අත්තනො සෙය්‍යං සදිසං වා නාධිගච්ඡෙය්‍ය'—'න පටිලභෙය්‍ය' යු සේයි. **යදි**, ඉදින්; **චරන්තො**, ඇවිදුනේ; **අත්තනො**, තමාට; **සෙය්‍යං**, උතුම් එකකු හෝ; **සදිසං**, සම එකකු හෝ; **නාධිගච්ඡෙය්‍ය**, 'න පටිලභෙය්‍ය'-නොලබන්නේද යනු අර්ථයි; **එකචරියං**, එකලාව හැසිරීම; **දළ්හං කයිරා**, දෘඪ කරන්නේයි. එකචරියා දෘඪ කරන්නට කාරණ කිම්ද යත්—**බාලෙ**, බාලයා කෙරෙහි; **සහායතා නත්ථි**, සහායත්වයෙක් නැති-බාලයා කෙරෙහි මිත්‍රත්වයක් නැති හෙයින් බාලයා හා එක් නොවැ එක චරියාව දෘඪ කරන්නේයි. **සිඞ්ගිලසකුණ**, මලිතිය; [1]**අනොවස්සකං**, නො තෙමෙන්නාවූ; **විචාරණපඤ්ඤ**, විචාරා පවත්නා නුවණ හෙවත් [2]විධානයට තිසි නුවණ; **අනවට්ඨිතචිත්තස්ස**, චපල වූ සිත් ඇති; [3]**දූභිනො**, මිත්‍ර ද්‍රොහිවූ; **ආනුභාවං**, උපාය; [4]**පරිත්තාණං**, වළකන්නාවූ ——

## 321. කුටිදූසකජාතකං.

---

[5]**නිඝංසියමානං**, තස්නා ලබන්නේ; **බෙලුවමිස්සකං**, [6]බෙලි ගස් මිශ්‍රවූ; **සංවෙඨයං**, හැකිළෙන්නී වූ නම්; **ගොකණ්ණො**, ගෝණෙක්; **ගවයො**, ගවරෙක්; **ඛග්ගො**, කඟවිසණෙක්; **උස්සුක්කං** [7]**අනාපජ්ජනෙන**, උත්සාහ නොකරන කල්හි; **පිණ්ඩිතා**, රැස්වැ ගෙනැ; **කිං වා එතං දද්දභායති**, කුමක් පිණිස මේ ස්ථානය 'දද්දභ' යන ශබ්ද කරන්නේද; [8]**සන්තත්තා**, භය පත්වූ; **ආරකා**, දුරුවූද; **විරතා**, දුරින් දුරුවූද; [9]'පරසොසං' යන්නෙහි අර්ථය [10]පරනාදං යනු-අනුන්ගේ වචනය; **ඛරනාභාවෙන**, නැවැති බැවින්; **අත්තනො පච්චක්ඛතාය**, තත්වාතත්වය [11]තමන්ට ප්‍රත්‍යක්ෂ හෙයින් ——

**යො නරො**, යම් සත්වයෙක් තෙම; **අසද්ධො**, [12]අවිඥ පෘථග්ජනයන් කෙරෙහි ඇදහිල්ලක් නැත්තේද නොහොත් ජනයාගේ තෙපුල් නොහදහාද; **අකතඤ්ඤු ච**, කිසිවක්හු විසින් නොකළ තිවත් දන්නේද; **සන්ධිච්ඡෙද ච**, පිළිසඳ [13]සිඳුනේද; **හතාවකාසො**, නසන ලද වට ඇත්තේද—

---

1 අනොවස්සං-මු. අ. ක 2 නිධානයට BCDEF. 3 දුබ්භිනො-මු. අ. ක. 4 පරිත්ත A. පරිත්තාන CDF. 5 මෙතැන් පටන් මූසික ජාතකය දක්වා පාඨ හා අර්ථ B හි නොපෑනේ 6 බෙල් DF. 7 නාපජ්ජනෙන--මු. අ. ක. 8 සන්තා CDF. 9 පරඝොස-මු. අ. ක. 10 පනාදං-මු අ. ක පරනාදං A. 11 තමහට D. 12 අවඥ A. අවිජ්ජා CDF. 13 සිඳිනේද CF.

කසන ලද භව ඇත්තේදැයි යූ සේයි; **වනනාසො**, වමාරන ලද තෘෂ්ණා ඇත්තේද—

### 322. දද්දභජාතකං.

[1]**එකතලිකා**, එක්පට; **පච්චාසිංසාමීති**, කැමැත්තෙමියි; **අපසක්කි**, පහවැ [2]ගියා; **නාමං ගහෙත්වා අසක්කොන්තො**, නම කැමැතිවැ ඉල්වන දෙයෙහි නම් නොකියා හෙන්නේ; [3]**රථපවර**, රිය[4]දෙටුව. රථ නම් සෙනඟය. එයට ජ්‍යෙෂ්ඨ හෙයින් රථපවර නම්. [5]**ගාරවලක්ඛණෙණ**, ආදර ලක්ෂණයෙහි—මෙපමණ සවල්ප දෙයක් පොචා අනුන් අතින් ඉල්වන්නට බැරි කොට සිතීම් වසයෙන් [6]යමෙක ගෞරව සවරූප ඇතිවීමෙහිය යූසේයි—

### 323. බ්‍රහ්මදත්තජාතකං.

**ඝුඤ්ජනට්ඨානං**, පොර ගන්නා තැනට; **ඔසක්කි**, [7]පසු බට; [8]**අසන්නපග්ගණ්හනාකාරණං**, අසජ්ජනයන් හුවන්නට කාරුණු, [9]**ඔසරන්තං**, පසු බස්නහු; **වණ්ණභණනමෙතං**, [10]මේ ඔවුන්ගේ ගුණ කීම්—'යසස්සී' යි කියා ඔහු ගුණ කියන පිණිස කියේය යනුයි; **ඉතනාරද්‍යසනෙන**, මඳ නොවැ දුටු මාත්‍රයෙන්; **ධාරිභාරො**, බරවූ [11]කද—තවුස් පිරිකර හෝ; **බ්‍රහ්මචාරී**, බ්‍රහ්මචාරි තෙම; [12]**හඤ්ඤතෙ**, නසනු ලැබෙයි හෙවත් නස්නේය එහෙයින්; **අභිධාවථාති**, දිව එවයි-මූබ එවයි හෝ-දිව අවුත් තො නස්නාතුරු වහා ගන්වයි යනුයි—

### 324. චම්මසාටකජාතකං.

**කායූපපන්නො**, මහත්වූ ශරීර ඇතිවැ; [13]**පදුට්ඨින්ද්‍රියං**, කිලිටිවූ චක්ෂුරින්ද්‍රියාදි ඉඳුරන් ඇත්තහු; **මං නාව[14]විරංදධා**, [15]මා වන්නා වරදවන ලදි; **හිඞ්ගු**, සිඟ; **ජීරක**, දූරුය; [16]**සිඞ්ගිවෙර**, හිඟුරුය; **මරිච**, [17]මිරිස; **පිප්ඵලී**, [18]වගපුල—

### 325. ගොධජාතකං

1 එකාපටලිකා-මූ. අ. ක. එකතූලිකා, එක්පටා CD. 2 ගියේ ABCF. 3 රථ සභ-මූ. අ. ක. රථපවරා CD. 4 දෙටුවා CDF. 5 ගාරවලක්ඛණෙං CD. 6 යමෙක් A. යමක් BDE. 7 පසුබටවී C. 8 අසන්නසම්පග්ගහණ-මූ. අ. ක. අසන්නූපපග්ගණ්හ F. 9 ඔසක්කාන්තං-මූ. අ. ක. 10 මෙළයන් ඔවුන්ගෙ ගුණ කියන පිණිසය යනුයි C. මොවුන්ගෙ ගුණ කියමි යසසංයි කියා D. 11 තදවූ-හැම. 12 හඤ්ඤදති-මූ. අ. ක. 13 පදුසින්ද්‍රියං CDF 14 මිරුංදධා ACDF. 15 මා වසන්නා නොවරද්නා ලදි CD. මා වන්නා නොවරදනා ලදි F. 16 සිඞ්ගිවෙරක C. 17 මිරිස් C. 18 වගපුල් C.

[1]කක්කාරු නාම, කකුරු යයි [2]යනු දිව්‍යලෝකයෙහි එක් මල් ජාතියෙකි; හීනාධිමුත්තිකානං, ලාමක සිත් ඇති; සො, ඒ [3]පුරොහිත තෙම; [4]අවහාර, සොරකම්; විතථං, වයනු; එසෙය්‍ය, සොයන්නේද; අභාලිද්දං, කසායේ පැහැයේ කණ්ණ යෙහි යහපත්වූ කණ්ණයෙහි තපුරු නොවේද; [5]චිරපෙමං හොති, මිත්‍ර සුහෘදයින් කෙරෙහි බොහෝ කලක් සවිරවූ පවත්නා ප්‍රෙම ඇති වේද; ඛකපපනියස්ස, හැදහිය යුතුවූ— හැදහිලි කටයුතුවූ; [6]සාදු, මධුර; [7]තිරො, තමා නොමැද යේ; සිඛරෙන, පෙණමතෙකින්......

## 326. කක්කාරුජාතකං.

---

[8]සිම්බලිදහවිමානෙ, මෙරු සාගර මධ්‍යයෙහි හිඹුල්වනය තිසාවූ විමානයෙහි; පරිගණහෙත්වා, සෙසු තැන් පරීක්ෂා කොට ගෙනැ නොදුකැ මේ සුපණ්ණයා කාමරූපීය. එහෙයින් මැය ගේ ගෙනැ ගියේ යයි ඔහු පරීක්ෂා කොට ගෙනැ; එකස්මිං සමෙ යනු ඒ සුපණ්ණයා එක් විලකදී මනුෂ්‍ය වෙශය හැරැ සවකීයවූ සුපණ්ණවෙශය ගෙනැ යන හෙයින් කියත්. එරකවනෙ, එරු වනයෙහි; නාගනා, නැවැත එක් දවසක් මනුෂ්‍ය වෙශයෙන් අවුත් රජ්ජුරුවන් හා කැටිවැ දූ කෙළ ඒ විලට අවුත් මනුෂ්‍ය වෙශය හැරැ [9]සවකීය වෙශයෙන් ඒ විලිත්; පනනානනරෙ, ඔහු නො දන්වා ඔහුගේ පියාපත් අතුරෙහි සැඟවී; කාථං [10]පතරි සොබ්භං යනු[යෙහි] සොබ්භා යයි ජලය කියනු ලැබෙයි. මෙ තැන ජලයෙන් යුක්ත හෙයින් [11]ගොය කියනු ලැබේ. [12]ජම්බු දීප සාගර නම් මෙරු සාගරයෙනුත් සප්ත සීදන්ත සාගරයෙ නුත් මැත සාගරයයි. තස්ස [13]පරතො, ඒ ජම්බුද්වීප සාගර යෙන් ඈත; පබ්බතානතරෙසු, සප්ත කුලපර්වතයන් අතුරෙහි; සන්ත සමුද්දානි ච, සප්ත සීදන්ත සාගරයන්ද; ඡාරං, සොර සැමියා; [14]ආවහාමි, ගෙනැ යෙමි; ආනෙනෙනනා, [15]මොබ ගෙ නෙන්නෙම්ද; [16]නෙනෙනා ච, ඔබ මාගේ විමානයට ගෙනැ යන්නෙම්ද......

## 327. [17]කාකාතිජාතකං.

---

1 කක්කාරුනි-මු.අ.ක. 2 යත ACD. 3 පොරොහිත ACDF. 4 අවහරෙ-මු. අ. ක. අවහරි CDF. 5 පිරපෙමං-මු.අ.ක. මිත්තපෙමං A. 6 සාධුං CDF. 7 තිරොක්ඛා-මු. අ. ක. 8 සිම්බලිරුක්ඛවිමානෙ-මු. අ ක. 9 සව ACF. 10 අතරි-මු. අ ක. 11 හො D. 12 ජම්බුදීපසමුද්ද—මු.අ.ක. 13 පුරතො-මු. අ. ක. 14 අවහාමි CD, 15 ගෙනයන්නෙමද C. 16 නොනෙනා-මු. අ. ක. 17 කාකාරි CD.

අක්කන්දන්තු, එකාන්තයෙන්; ආළාහනං, සොහොනට; කුටෙ දීපො විය, ඇතුළු කළයෙහි දිලියෙන පහනක් මෙන්; [1]සුගමනො, යහපත් කොට ආවාවූ ගමන් ඇතියේ; [2]සම්මිල්ලහාසිනී, සිනා පෙරදුරි කොට බණන්නී; ලොහිතපක්ඛන්දිකාබාධො, රක්තාතීසාර; තං පරිග්ගහෙත්වා, ඈ හැර ගෙනැ; එවංගතිකා, 'එවංසභාවා' යූ සේයි; [3]න සන්ථමහාම, නො සන්හිදෙම්හ—ශොක [4]හම්වා ගත නොහෙම්හයි යනුයි; පද්ධගුං, යන්තාහු; විජ්ජති, පවත්නීය; තෙහි වා සන්තෙහි අතිරෙකසම්බන්ධවසෙන, ඒ සත්වයන් හා වෙසෙස් සම්බන්ධ හෙයින් හෙවත් මා හා සම්බන්ධය හැර පරලොව මළ සතුන් හා [5]අයිරා වන සම්බන්ධවීම් වශයෙන්; ඉදම්පි මෙ කළෙබරං [6]එකං භවිස්සතීති, මාත් එකාන්තයෙන් මියන හෙයින් මාගේ මේ ශරීරයෙන් ඒ මළවුන් හා මැ එක් වන්නේය-සම වන්නේයි; [න] අනුගච්ඡතීති, ස්ථාන නිෂ්පන්නවූ ඒ ඒ ඊර්යාපථයට පැමිණැ ඒ ඒ ඊර්යාපථයෙහි මැ ක්ෂය වත් මුත් ඒ ඒ ඊර්යාපථයෙන් අන්‍ය අන්‍ය ඊර්යාපථයට අනුවැ නොයෙයි යනුයි; සරමානෙ, පිරිහෙන කල්හි; තස්ස ඉමස්මිං අතානි, ඒ මේ ආත්මය; පදෙධ, ආයුක්ෂයින් අඩිවූ කල්හි; යං සෙසං ගුනං, යම් සත්ව කොට්ඨාසයෙක් ශෙෂවීද; අමතං, නො මළද; යං පනෙතං, යම් මේ සත්ව කොට්ඨාසයෙක්; 'අනනුසොචියං' යන්නට 'තං' යන්නක් අධ්‍යාහාර කරනු.

## 328. [7]අනනුසොචියජාතකං.

---

[8]අග්ගිමාරාදිසු, දූනුවා ආදීන්; පට්ඨපිතානි, තබා දෙන ලද්දවූ; [9]ධුරහත්තාදිනි, නිත්‍ය භක්තාදීන්; මහාකාළමක්කටං, මහා කළු වඳුරක්හු; [10]තාදිලක්ඛණයොගා, තාදි ලකුණු යොගයෙන්; ඉෂ්ටානිෂ්ටාදීවූ අෂ්ටලොක ධර්මයෙහි නිර්විකාරවැ අචල බැව් තාදි ලකුණු නම්. [11]අපෙසක්ඛා, [12]'අප්පානුභාවා' යූ සේයි–[13]මඳ වූ ආනුභාව ඇත්තාහුයි යන අර්ථයි; නිද්ධාපිතං යන්නෙහි අර්ථයි 'නිවුද්ධං' යනු. එහි අර්ථයි [14]'නික්ඛාමිතං' යනු—නෙරන ලද්දම්හ යනු අර්ථයි; විස්සරමකංසු, හය පත්ව හැඬූ.

## 329. කාළබාහුජාතකං.

---

1 සුතාගමමණො-මු. අ. ක. සුගමනං CDF 2 සම්මිල්ලහාසිනී-මු. අ. ක. 3 න සහාම-මු අ. ක. 4 නොමගතහෙම්හයි A. 5 ඓරාවත CDF. එයිරාවත F. 6 එකා CD. 7 අනනුසොචිත CDF 8 ධනුගයහෙසු-මු. අ. ක. 9 ධුවභත්තාදිනි-මු. අ. ක. ධුරභත්තාදීන්-හැම. 10 තාදිලක්ඛණයොගතො-මු. අ. ක. 11 අප්පසක්ඛාරා-මු. අ. ක. 12 අල්පානුභාවා CDF. 13 මන්ද D. 14 නික්කඩ්ඪිතං-මු. අ. ක.

සූනාපණෙ, මස් තුබූ අංගානියෙහි; එතෙ, මේ පඤ්ච කාමයන්; ගණ්හන්තානං යෙව, මමායන කොට ගන්නවුන් ටමැ; කුලලා, උස්සෝ; නිප්පලිබොධං, පලිබොධයක් නැති යහු—[1]ඛහක් නැතියහුයයි යූ සේයි; නිරාසා, කිසිවෙක්හි අපගතවූ ආසා ඇත්තී; සුඛං සුපති, සුවයෙන් [2]නිදයි.

330. සීලවීමංසජාතකං.

---

## තතියො වග්ගො.

---

අමච්චරතනං යනුයෙහි රතන ශබ්දය [3]උත්තමවාචීයි—උතුම් ඇමැත්තෙකැයි යනුයි. [4]මුඛතුණ්ඩකෙන, මුවතුඩින්; පහාසති, [5]බොහෝ කොට බෙණේද; නිකච්ඡෙ, ඇසිල්ලෙහි; [6]අප්පමත්තකෙ කාලෙ, ස්වල්ප මාත්‍රවූ කල්හි—එවිගස්හිය යූ සේයි; වාචං [7]රක්ඛසෙව, යම් වචනයක් අනර්ථාවහ වී නම් එසේවූ වචනයක් නො කිමෙන් වචන රක්ෂා කරන්නේයි; [8]නිහතානාකාරණෙපි, තමා හා නොරතුරක් [9]නැත්තාදවූ; අක්ඛවිඤ්ඤුන, අවිය අනුභව කරන සුළුවු.

331. කොකාලිකජාතකං.

---

සාසවිසාසස, ගැල්ලාට; කාමං අසොධෙත්වා, කම් සොයා වරද නොපිරිස්සාය යූ සේයි; අහං ජිනොමහිති, මම් පැරැද් දෙමි; [10]නියාමෙත්වා, නියම් කොට; [11]ඤාණආධානගාහි වසෙන, තමාගේ ඥානය හෙතු කොට ගෙනැ මම් නුවණැත් තෙමි කියන අභිමානයෙන් තමා නොසෙ ගත් යම් ග්‍රහණයෙක් ඇති නම් එහි දෘඪග්‍රාහිවැ පැවැතිම් වසයෙන්; ඉස්සරිය, ආධිපත්‍යයයි.

332. [12]රථලට්ඨිකජාතකං.

---

පක්කගොධං, [13]පැලහු ගොයක්හු; පරම්මුඛො, පිටිපෑ පියා; සාඛාය, ආදි එල්ලූ අත්තෙන්; එවං ත්වං විදිතො, මෙසේ මා විසින් තෝ දන්නා ලදහි; [14]තිරීටවච්ඡනිවච්ඡස්ස,

---

1 ඛහකං A. ඔකං BCDEF. 2 නිදන්නීයි ACF. 3 උත්තමවාචීත් C. 4 මුඛතුණ්ඩකෙන-මු. අ. ක. 5 බොකොට බොකොට D. 6 අප්පමත්තෙක-මු. අ. ක. 7 රක්ඛෙය්‍ය-මු. අ. ක. 8 නිකුදකාරණෙපි CD. 9 නැත්තාවූ C. 10 මු. අ. කථාහි නොපැනේ. නිසාපෙත්වා A. 11 ඤාණවතො ආධානගාහි-මු. අ. ක 12 රථලට්ඨි-මු. අ. ක. 13 පැලූ CD. පැලුහු A. 14 තිරිතිවච්ඡනිවච්ඡස්ස CDF.

රිටිපුඹුළු [1]ගන්නාහට; **මඟාගමනකාලෙ**, මඟ එන කලැ; **අම්මො** යී කියා දෙවීන් ආමන්ත්‍රණය කෙරෙත්.

### 333. [2]ගොධජාතකං.

---

**අනෙතාජනෙ**, ඇතුළු රජගෙයි වසන ජනයන් කෙරෙහි; **ජිමහං**, [3]හැදවැ; **ගෙහත්වා**[4]**ගච්ඡන්තෙන**, යන එන තැනට ප්‍රධානවැ ගෙනැ යන්නාවූ; [5]**ඡන්දාදිඅගතිවසෙන**, [6]සැඳ දෙස් මොහ භය යන සතර අගති විසින්.

### 334. රාජොවාදජාතකං.

---

**අනුකරොනෙනා**, කලාක් කරන්නේ; [7]**ව්‍යජනිං**, [8]**වීජනිය**; **ජාණුනා**, දණින්—විළිබෙන යෙන් මේ; **යොනිසං**, යොන්හි-ජාතියෙහි යු තැන්; **උරෙන නිපජ්ජි**, බඩින් වැදගෙනැ හොති; **සීහවිසාණෙන**, සිංහයාගේ ඉඳුල් කෑමෙන්; **විලොමං**, විපරීත කොට: [9]'මා ගණ්හි' යොදනු. **උග්ගතකායො**, හිවි කාය ඇතියේ—මහත්වූ කාය ඇතියේය යනුයි; [10]**සිගාලිකං**, කැණහිල් හඬ; **කාළවාරණං**, කාලාවක ඇතක්හු; **අනුන්නුනෙනා**, තතනන්නේ හෙවත් කොඳුරන්නේ; [11]**කොට්ඨුව**, ශෘගාලයා මෙන්; **පමාය**, නුවණින් දැනැ; **පරිකඛවා**, පරීක්ෂා කරන්නේ; **පරිමඤ්ඤති**, සිංහ සමාන පරාක්‍රම ඇත්තෙමි කියා මෙසේ සිංහයා සමාන කිරීම් වශයෙන් තමා පෙරළාද; **සුසණ්ඨිතමහාකඛන්ධස්ස**, මනා සංස්ථාන ඇති මහා [12]කඳට ඇති යනුයි; **සමිණිත්වා**, පිරිසිඳැ; එමැ කියති 'උපපරිකඛිත්වා'යි. **අජ්ඣෙනෙනාති අජ්ඣෙනා**, මේ ශාස්ත්‍රය හදාළ කල මෙසේවූ [13]වෘද්ධියෙක් වෙයි කියා මෙසේ අර්ථානර්ථ පරීක්ෂා කොටැ ශාස්ත්‍රාධ්‍යයනයෙන්ද යනු අර්ථයි.

### 335. ජම්බුකජාතකං.

---

**අබ්භුග්ගන්ත්වා**, ගොස් හෙවත් යුද පිණිස අභිමුඛවැ ගොස්; **ගණසත්ථා**, සමූහයට අවවාද [14]කරන; [15]**ඛාරිං විවිධමාදය**, වල්කලා ආදීවූ අනෙක තවුස් පිරිකර ගෙනැ නො හොත් **ඛාරිං**, තවුස් [16]කඳ; **විවිධමාදය**, වල්කලාදීවූ නොඑක්

---

1 ගන්නාහට ACDF 2 පකාකගොධ-මූ. අ. ක. 3 හුදට CD. 4 ගවජනෙත, ACD. 5 ජන්දාදි අගතිගමනවසෙන-මූ. අ. ක. 6 සැත් ACF. ශත් D. 7 වීජනිං-මූ. අ. ක. 8 විජනිපත්‍රය A. 9 මගලහි CDF. මහපණ්ඩි A. 10 සෙගාලකං-මූ. අ. ක. 11 කුට්ඨුව-මූ. අ. ක. 12 කඳුව CD. 13 වුදධියෙක් CDF. 14 කරවාගෙන AF. කරගන C. කරවාගණ D. 15 ඛාරි-මූ. අ. ක. 16 කඳ CD.

තවුස් පිරිකර ගෙන; **ලොභවාපිතො**, ලොභොසැල; නිබිද්ධ රණමනානං, තිබි තභත මතුරු; **කො නු තෙ තිණමාහරි**, කව රෙක් තාගේ තණ ගෙන ගියේද; **පනාසසි**, කියන්නෙහි නොහොත් බෙණෙහි; **එවං එතං සාතතාබං හොති**, මේ මෙසේ කටයුතු වන්නේයි—බ්‍රහාජත්තයා තමා සවල්ප [1]තෘණ යෙන් බොහෝ වස්තු සොයා කැමැති වන්නා සේ කරන්නේ වේදැයි යනුයි; [2]**අගයුත්තුපගස්ස**, නො ගතයුතුවූ; **බාලා සිලානි කුබ්බති**, බාල තෙමේ සොරකම් ආදීවූ අපක්‍රියා කරන් නේයි.

## 336. බ්‍රහාඡත්තජාතකං.

**පටිසාමෙතවා**, තැන්පත් කොටැ තබා; [3]**අතිපපගෙව**, ඉතාම උදෑසන; **නසෝ නසෝ චරිතවා [4]පුන ගවෙසෙනා**, ඒ ඒ ගෙවල උදෑසනක් සේමැ ඇවිදපියා කිසිවක් නොලදින් [5]මේ තව කැඳ වළඳන වේලා නොවනැයි නැගී ගොස් ආයේ කැඳ වළඳන වේලා යන්නේයි; **අවචයං**, වරද; [6]**නෙව ලගාමි** යනු [7]'නෙව අභිසජ්ජාමි' යන්නෙහි අර්ථයි. [8]ක්‍රොධ වශයෙන් ලග්න නොවෙමි—නො ඇවිලෙමියි යනු අර්ථයි; **පාජ්ජං** [9]යන්නෙහි අර්ථයි 'පාදමක්ඛතං' යනු—පා ගාථා තෙල්.

## 337. පීඨජාතකං.

[10]**දක්ඛිණජතතු**, දකුණු දසරුවෙහි; **ඨදෙධා අඹහසි**, දෙල දූෂි වූයේ වී; [11]**සෙදුපෙසවා**, තබා; **පහුති**, පටන් කොටැ; **අජාකාසතතු** නම්[12]වූයේ නොඉපැදමැ සතුරුවූ හෙයින්; **මඤ්ඤතවා**, පසයින් ගන්වා; **මඹායසෙනා**, ප්‍රෙම කරන්නේ; **පටිවසෙතන සාරෙතවා**, මුවා තැන්හි ලා; **මහාඋපටඨාන සාලෙ**, දූකුම් දෙන වේලේ; **භතතපාතියං**, බත් කන තිලි යෙහි; [13]**ගතතතා ආරදෙඩයෙව**, බත් කන්නට පටන්ගත් කලමැ; **සාලවද්දලෙපි අසඩසාරෙ**, සතාකඩකාරයෙහිදු; **ඵුසං**, නොහො; [14]**නිකාණණ්සාවසෙන**, කනට කොඳුරා කියන මන්ත්‍රණ වශයෙන්; **සතතයකිතවා**, බැඳැ; [15]**ඉතිවිතිචකාරණං**, මෙසේ ගසම් දෙහොයි [මෙසේ ගසම් දෙහොයි] කියා මෙසේ

1 ත්‍රිෂණයෙන් ACD. 2 අගයුත්තුපසාසස-මු. අ. සා. 3 අභිපාතොව-මු. අ සා. 4 පුනාගවෙජතෙනා-මු. අ. සා. 5 එම පැව C. මෙතනට D. 6 නෙවලගහා CD. 7 අභිසජ්ජා C. අභිසජ්ජාමි D. 8 කොධවසයෙන් C. 9 යනුයෙහි D. 10 **දක්ඛිණ ජනතු** ACD. 11 දපෙත්වා-මු. අ. සා සොදපෙත්වා CDF. 12 වූ D. 13 භතෙත අවඤ්ඤතෙනයෙව-මු. අ. සා. භතෙ ආරදෙධා සෙව CD. 14 නිකතවසෙන CDE. 15 **ඉති විති ච කාරණං**-මු. අ. සා. ඉතිවිචිකතිකාරණං F.

සිතා [1]**පහරණොකාස** පරියෙසන සඞ්ඛාත කාරණයද; [2]**නක්ඛමනෙනන**, සිහිවිලි මාත්‍රයෙකින්; **අරඤ්ඤෙ[3]ජාතො මක්කටො** යනු යූථපති වානරයන් තමන් දරුවන් තමන් අභිභවා යූථ පරිහරණය කෙරෙතියි යනු හෙයින් බාල්‍යාවස්ථායෙහිමැ බීජොද්ධරණය කළ හෙයින් කියත්. **නාවපි** [4]**අතිරජ්ජකාමස්ස**, මා අභිභවා රාජ්‍යය කරන්නාවූ තාගේද; **සිරිසයනං**, ශ්‍රී යහන් ගහීයට; **සාසපකොබනෙන**, හබවත්තෙහි; [5]**පරිසප්පසි**, සැලෙයිද හෙවත් සැලී [6]ඇවිද්දීද; [7]**ඛාරණසරං**, සිරගෙට.

## 338. ථුසජාතකං.

[8]**වුද්ධිමන්වාය**, මහත්වැ ගෙන; **දිසාකාකං**, සාගරමධ්‍යයෙහි දිසාමූළ්වූ කල්හි දිසාව හඳුන්වනු පිණිසැ විහිදිය යුතුවූ කවුඩුවක්හු; [9]**කූපග්ගෙ**, කූඹ මත්තෙහි; [10]**ගලපරියොසානං**, තරක්; [11]**නාවාධුරෙ**, නැව් හිසැ; **වායසස්ස**, [12]කවුඩුහට; **පුථු**, බොහෝවූ; **නවහි ලොකුත්තරධම්මෙහි**, සතරමඟ සතරඵල නිවන යන නව ලොකොත්තර ධර්මයෙන්.

## 339. [13]බාවෙරුජාතකං.

**පටිබාහිකා**, ඔවුන්ගේ තෙපුල් නොගෙන; **දූතබ්‍යාවටා**, දූතයෙහි නියුක්තයෝ; **අඩ්ඪමාසකමත්තම්පි**, දෙවියට සමාරක් පමණත්; **අසිනකඤ්ච**, දෑකැත්තක්ද; [14]**ආසඤ්ච** යනුත් පාඨයි. අර්ථ මෙමැයි. **ද්වාරන්තරෙ**, දොරතුරෙහි—දොර මුල්ලෙහි හෝ; [15]**තිණවත්ථු**, තණ කෙතට—තණ වත්තට යූ තැන්; **ලායිත්වා**, [16]දයෙන් කපා; **අක්ඛීනි භමිංසු**, ඇස් [17]බමා ගියේ—[18]කළු හී ගියේ යනුයි; **තිණං අවත්ථරිත්වා**, ගෙන යෙමින් සිටි තණ මත්තෙහි වැතිර; [19]**සංයමනෙනස්සව**, අදන වසයෙන් සංයමන කරන්නාහටමැ; **සන්තවන්තපදනි**,

මාතාපෙත්තිභරං ජන්තුං කුලෙ ජෙට්ඨාපචායිනං
සණ්හං සඛිලසම්භාසං පෙසුණෙය්‍යප්පහායිනං
මච්ඡෙරවිනයෙ යුත්තං සච්චං කොධාභිභුං නරං
තං වෙ දෙවා තාවතිංසා ආහු සප්පුරිසො ඉති—

1 ප්‍රහරණොකාස-හැම. 2 තක්ඛාමනෙතනති CD. 3 ජාත-මූ. අ. ක. 4 අභිරජ්ජං කාමෙස්සාම ACD. 5 සංසප්පසි-මූ. අ. ක. 6 ඇවිදීද C. 7 බන්ධනාගාරං-මූ. අ. ක 8 වුඩ්ඪිමන්වාය-මූ. අ. ක 9 මූ. අ. කථාහි නොපැනේ. 10 සලාපරියොසානං කරං A. සාලපරියොසානං කතං CDF. 11 නාවාය ධුරෙ-මූ. අ. ක. 12 කවුඩුවහට AC. 13 බාවෙර ACDF. 14 අසංදමං A. ආසදණ්ඩ CD. 15 තිණවත්ථුං-මූ. අ. ක. 16 ද CD. 17 බලාගියේ A. බැමවා ගියේ D. 18 කළුහිගි C. 19 සංයමනතස්ස-මූ. අ. ක.

මෙසේ කියන ලද සපත ව්‍රත පදයන්ද; [1]නිහිතං, පිහිටුවන ලද්දාවූ; යං [2]වඩ්ඪං, දන [3]සඞ්ඛ්‍යාත යම් වෘද්ධියෙක් ඇත්ද; පමුස්සිතුං, සිහි නැති කොට හරනට; [4]පරිභුත්තාමනසොව, අනුභව කරන ලද අමා ඇත්තක්හු මෙන්.

## 340. විසයහජාතකං.

---

# චතුත්ථො වග්ගො.

---

විත්ථාරකථා, විස්තර කථා—ප්‍රත්‍යුත්පන්න කථා ගෙනැ කිහු. [5]කුනාලජාතකෙ ආවි භවිස්සති යි මෙහි නොකිමට කරුණු කියත්.

## 341. [6]කණ්ඩරීජාතකං.

---

සුංසුමාරි, කිඹුල් [7]දෙනක්; අත්ථං, වෘද්ධි කාරණය; බිජ්ජං අජානනෙනා, වහා නොදන්නේ; [8]ලොකිකකිච්චානං, ලෞකික කෘත්‍යයන්ගේ—වෘද්ධි කාරණවූ ඒ ඒ ලෞකික කෘත්‍යයන්ගේය යනුයි.

## 342. වානරජාතකං.

---

[9]නිවුත්ථ, විසූ; [10]කුහනනිසකුණිකං, කොස්ලිහිණියක; දූතෙය්‍යහාරිකා, දූතකම් කරනුවූ; පොසාවනිකා, වඩන; අයං, 'කුනනසකුණිකා' යූ සේයි; [11]අකාර, කොළෙහි; වජාමි, යෙමි; [12]වචස්සගගතෙ, [13]'සනානිටඨානතෙ' යූ සේයි; කන සස ච, ආදිකොට ද්‍රොහ කළාවූද; විභත්තිවිපරිණාමං කත්වා, 'න කතස්ස ච කතතා ච' යන ගාථාපෙදෙහි 'කතතා' යන ප්‍රථමා විභක්තිය ෂෂ්ඨීන් පෙරළා; [14]එමැ පයින් 'යො කතතා තස්ස'යි. [15]සමමති, සන්හිදේ.

## 343. [16]කුහනනිජාතකං.

---

සම්බන්ධ, ගුණවත්; සඞ්ඛාතනං කාරෙසි, ශක්‍ර දෙව රාජ්‍යය කොළේ; සංවෙජෙස්සාමි නානති, මොහු බවම්යි; පළිබුද්ධි,

1 නිගගත• CDF. 2 වතතං-මූ. අ. ක. 3 සමපාන CDF. 4 පරිභුතතමතත සෙසව-මූ. අ. ක. 5 කුණාල-මූ. අ. ක. F. 6 කිනනරී-මූ. අ. ක. කඩාරි A. කණ්ඩහාරි D. 7 දෙනොක්-හැම. 8 ලොකිය-මූ. අ. ක. 9 නිවුත්ථ.-මූ. අ. ක. 10 කුහකනී-මූ. අ. ක. 11 අකාරි-මූ. අ. ක. 12 වචස්සගගපටඨ-මූ. අ. ක. පරසසගගතෙන CDF. 13 සනානිටඨානතෙථයෙ යූපෙස්යි ACD. 14 එම පසින් යො කත්වා CD. 15 සනිසතො-මූ. අ. ක. 16 කුහනීනීජාතකා-මූ. අ ක.

වැලකි; [1]**නිලීනං මණ්ඩයති**, තරුප්පු ලාද; **උවසිතං**, නැගි නර; **සණ්ඩාසෙන**, හඬියෙන්; **අභිසාරිකා** නම් සවාමින් සොයා රෑ දෙරට යන ගෑනීයි; **භාරියා**, බැරිවූ; **සපථා**, [2]සපථ-දිවිරීම්....

## 344. [3]අම්බචොරජාතකං.

**අලසගිඬුං**, ප්‍රමාද භික්ෂුවක්හු-මැළි හෝයි සේයි; **උද්දෙස පරිපුච්ඡා**, හදරනු උදෙස් නම්. [4]අරුත් ගහණ පරිපුච්ඡා නම්; [5]**ආලසියො**, ප්‍රමාදයෑ; **කුසිතො**, මැළියෑ; **ආලසියං**, දක්ඛවූ-ප්‍රමාදවූ—ගමන් ඇති; **එතං ගජකුම්භං නාම**, ගජකුම්භ නම් ඇති [6]එක් ප්‍රාණියකු-පිනැඹිලියෝය යු තැන්; [7]**වෙවචනානි**, 'පරියාය වචනානි' යු සේයි; **නිච්චං පචලායති**, නිරන්තර යෙන් හුන් තැන සිටි තැන කපිනිද්‍රා වශයෙන් නිදන්නේයෑ; [8]පචලකයෝ නමුත් පිනැඹිලියෝ මැයි; [9]**ගරුවිරියො**, ලසි ගත් [10]විර්ය ඇත්තේ; **දක්ඛායති**, [11]කුසීත වේද හෙවත් ලසි ගනීද....

## 345. ගජකුම්භජාතකං.

**ඔපානභූතං**, පැන්වලක් වැන්න; **කාසාවපජ්ජොතං**, සිවුරෙන් දිලියෙන්නේයි; **ඉසිවාත** [12]**පටිවාතං**, ඍෂිවරයන්ගේ ගමනින් උපන් වාතයෙන් යුක්තයෑ; [13]**තං හතතං ගෙහං** [14]**දත්වා** යනු ස්වහස්තයෙන් ආදරයෙන් තමන් වහන්සේ වරුන්දෑගේ අභිප්‍රායානුකූලවෑ තමන් වහන්සේ වරුන්දෑට දී වලඳනු පිණිස ඒ කුලයන්ට දුන් බව ගෙනෑ කීහු. **ලූඛං**, රස නැත්තාවූ-කොරසැටි හෝ; [15]**නීවාර**, හුරුහැල්; [15]**සාමාක**, බොඬහමු; **උදකමත්තසිත්තං**, දිය එවලා හුයාපී; [16]**චෙතසිකරොගො**, චෛතසික රොග සඞ්ඛ්‍යාත රොගය; **ගාථා—පෙ—කතො**, 'ජාදයති'යි කිවමනා තැනෑ 'ජාදයන්ති'යි කියා ගාථාබන්ධ සුවය පිණිස අනුනාසික කරන ලදි; **කථං** [17]**ජාදයති**, කෙසේ සතොෂ කරන්නේද: [18]**සුඛත්ථං**, සුව පිණිස; [19]**විසජ්ජෙථා**, සැක නැතිවෑ ගෙනෑ; [20]**අම්බිලකඤ්ජිකං**, ඇඹුල්කඳු....

## 346. කෙසවජාතකං.

---

1 නීලියං-මු. අ. ක. 2 සපථය ACDF. 3 අම්බජාතකං-මු. අ. ක. 4 අරුත් ගණන් A. අරුත් නතන් C. 5 ආදසියො, පමාදය; ආදසියො, හුළුමදය C. 6 එක් ප්‍රාණියෙක් D. එක් පාසියෙක් CF. 7 මු. අ. කථාහි මේ පාඨය නොපැනේ. 8 පචාලකායො CDF. 9 මුදුවිරියො-මු. අ. ක. 10 විරිය CF. 11 ලකුසීත වේද CDF. 12 පරිවාතං ACDF. 13 තං හන්ද CDF. 14 ගහෙත්වා C. 15 මු. අ. කථාහි හා මෙහි පද විපර්‍යාසයෙකි. 16 චෙතසිකරොගා CDF. 17 ඡාදෙති ACDF. 18 සුඛත්තං CDF. 19 විසජ්ජෙථං-මු. අ. ක. 20 අම්බිලකඤ්ජියං-මු. අ. ක.

[1]කණ්ණිකමත්තං, කැණිමඬලක් සාවූ; ආදිත්තං, දිලි යෙන්නාවූ; ඉන්දවජිරං, වජ්‍රායුධය; සබ්බායසං, සියල්ලම යක ඩින් කළාවූ; [2]පහිතො නු අසි, එලබැ සිටියෙහි වී; හන්දනනු, හඬත්වයි–හඬා යෙත්වයි යනුයි; [3]විහෙසිකං, හැවිලි~

### 347. අයකූටජාතකං

කරමරෙ ගහෙත්වා, කරළු ගෙනැ. ගම් පැහැරැපියා ඉන්මැ අයුකතීන් සිර කොට බැඳ ගෙනැ යන මිනිස්සු කරමරයෝ නම් වෙත්. [4]පණියං, සෙනහය; වීසාසවචනං, විශ්වාස යෙන් කියන්නාවූ වචනය; මුහුනෙනනෙව—පෙ—සභාවං, කෙණෙහි ඇලෙන කෙණෙහි විරක්ත වන සවභාව ඇති; විචි නිත්වා, විචාරා~

### 348. අරඤ්ඤජාතකං

තඤ්ච පන ගහෙත්වා, ඒ පෛශුන්‍ය වචනය ගෙනැ–ඒ අනුන් කී කේලාම් ගෙනැ; කුලෙන ආගතමෙතනිකා, පර පුරෙන් ආවාවූ මිත්‍රත්වයෙන්–දෙමවුපියන් කෙරෙහි සිට පැවැත ගෙනැ ආ [5]මිත්‍රත්වයෙනැයි යනුයි; එතෙසං නතියතෙ උපප නෙන, මොවුන් දෙන්නාට තුන්වැනිවැ විශ්වාස වශයෙන් අති කක්හු සමහවවූ කල්හි; ගතෙ, වල සිට ගිය සමයෙහි; සාම ඤ්ඤං, සාමාන්‍ය බවෙක්–එක් බැවෙක් හෝ; [6]යාව නං චිනති නං, අධිකවූ චින්තිතයක්–විශෙෂ වූ ඒ සිතූ උපායක්; [7]‘පසසසි’ යනු හා සන්ධාන කරනු. [8]මිතතසන්ධිභෙදසස, මිත්‍රයාගේ විශ්වාස බිඳුනාවූ; පරිවතතමානෙ, ඔබින් [9]තුබ කියා [10]තුබින් [11]ඔබ කියා මෙසේ පෙරළුන ලබන කල්හි; න සාරතො පවෙචනති, හේ සන්ධි භෙදකයාගේ පෛශුන්‍ය වචනය සාර හෙයින් නො පසසිත්–[12]නො අදහත්; චොදෙත්වා, මේ තියා වූ දෙයක් කළාවද? කිවාවද? ඒ කුමක් පිණිස කළාද කිවු දැයි කියා මෙසේ චොදනා කොට; සාරෙත්වා, සාරණ කොට— කළ වරද සිහි කරවාය යූ සේයි~

### 349. සන්ධිභෙදජාතකං

### 350. දෙවතාපඤ්හජාතකං

## පඤ්චමො වග්ගො.

## චතුක්ක නිපාතවණ්ණනා නිට්ඨිතා.

---

1 කණ්ණිකපත්තංව CDF. 2 විහිතො-මු. අ. ක. A. 3 විහිසිකං-මු. අ. ක. 4 මු. අ කථායි නොපැනේ. 5 මිත්‍රයෙනැයි CDF. 6 යාවසුචින්තිතං-මු. අ. ක. 7 පසස-මු. අ. ක. පසෙසසි CDF. 8 මිතතසන්ධිභෙදකසස-මු. අ. ක. 9 තුඹ C. 10 තුඹින් C. 11 උඹ D. 12 නොදවත් A. නොදහත්‍C.

ජීනො, පිරිහිණී; [1]නිස්සෙසෙසු[2] භවෙසු, නිරවශෙෂ කොට හැරැ ගත් කල්හිය යනුයි; මචෙවා වා, සත්ව හෝ; මහාජනස්ස සොකකාලෙපි, මහාජනයා ශොක කරන්නට නිසිවූ මෙසේවූ ආපදප්‍රාප්ත කාලයෙහිද; සත්තුක, සතුරු රජ; අත්ථං [3]පලෙති යන්නෙහි අර්ථයි 'අත්ථං ගච්ඡති' යනු. [4]චාරං පරිගණ්හනෙතා, චර්‍ය්‍යා පරිග්‍රහ කරන්නේ—ඒ රජහුගේ දූෂ්‍යවූ චරිත ගෙනැ'චොදනා කරන්නේ; පටිච්ඡාදෙත්වා, පාවාදී...

## 351. මණිකුණ්ඩලජාතකං.

ආරාමෙ, උයන්හි; ආවිජ්ඣනෙතා, සිසාරන්නේ-සිසාරා ඇවිදිනේයි; [5]සඤ්ඤාපෙතුං, හඟවන්නට; [6]ලුඤ්චිත්වා, සිඳැ; සමුට්ඨහෙය්‍යාති, නැගී සිටිනේ යයි; සත නම් ගිතෙලි. [7]අබ්බහි, උදුරාපී; අපානුදී, දුරු කෙළේද; [2]යම්මාසි, 'යං මෙ ආසි' යි තැන්; අනාවිලො, නො කැළඹුණාවූ චිත්තසන්තාන ඇත්තෙමි...

## 352. සුජාතජාතකං.

භග්ගෙසු, [8]භගුරටැ; [9]සුංසුමාරගිරිං, කිඹුලකු වැනි පර්වත—ඒ නම් නුවර හෝ; භෙසකලාවනෙ, මිහිඟු වෙනෙහි; පරිසුද්ධසිප්පං, පරිශුද්ධවූ ශිල්ප [ඇති]; [10]ප්ලවො, නැව; කායෙ, ශරීරයෙහි; [11]යා ච එසා, යම් මේ සුවපත් බැවෙක් ඇත්ද; රුන්ධිත්වා, [12]වළකා; පටිසන්ධිත්වා, තරකොට; අප්පධංසියං, නොනැසිය හැකි කොට; පඤ්චමධුරමංසං, හදමස් ළමැඩි අක්මා පපු අතුණුය යන මේ පස් මිහිරු මස්; අනතවට්ටිකි, අතුණුවැටියෙන්; මල්ලෙ, මල්ලවයන්; [13]නිප්පිළනෙනෙව, සිප ගැන්මෙන්මැ; [14]බලභෙරිං, යුද්ධ බෙර; ආකොටාපෙත්වා, [15]ගස්වා; අයමෙව සො රුක්ඛො යනු [16]'අයමෙව සො' යන්නෙහි අර්ථයි. සොභඤ්ජනකස්ස යන්නෙහි අර්ථයි [17]'සිගගුරුක්ඛස්ස' යනු. සිගගු නම් මුරුංගායි; [18]පරිත්තාතුං, රක්නට...

## 353. [19]ධොනසාඛජාතකං

---

1 නිස්සෙසසෙසු-මු. අ. ක. 2 මු. අ. කථාහි නොපැනේ. 3 එලෙති AD. 4 චොරං ගරහනෙතා-මු. අ. ක. 5 සඤ්ඤාපෙතුං CDF. 6 ඡින්දිත්වා A. ලුඤ්චිත්වා CDF. 7 අබ්බුළ්හං-මු. අ. ක. අබ්බහි CD. 8 බගු CD. 9 සුංසුමාරගිරං-මු. අ. ක. 10 පලලවො ... 11 යාවා එසා-මු. අ. ක. යා මෙ එසා DF. 12 වැළකී CF. වැලක D. 13 නිප්පීළනෙන-මු. අ. ක. 14 බලිභෙරිං-මු. අ. ක. 15 A හි පමණකි. 16 අයමෙව සො පිඨිගිරයා-හැම. 17 සිඛග්ගු-මු. අ. ක. 18 පරිත්තාණං කාතුං-මු. අ. ක. 19 ධොනසාඛ-මු. අ. ක. ධොනසංඛ ACEF. ධොනසංඛ D.

[1]තබ්භාවෙනෙව, ආදි උපන් සවභාවයෙන්මැ-ආදි සිටි සැටියෙන්මැ යනුයි; නිමුජ්ජාපෙනෙනා, ගල්වන්නේයි—[2]ඔබාය යනුයි; විනාසං, සැ; භොගරහිතෙ, [3]අනුභව රහිතවූ—ප්‍රවෘත්තියක් නැත්තාවූ; මරණකාලං, මරණ සඞ්ඛ්‍යාතවූ [4]ක්‍රියාව-චුති ක්‍රියාවයි යනුයි; [5]රුදෙනෙන වා, ඇඬීමෙන් හෝ; [6]පරිදෙවනෙන වා, වැලපීමෙන් හෝ. වැලපීම නම් මහත් කොට නො හඬා ඇසින් කඳුළු ගැන්මයි. 'රුන්න' නමුත් [7]'රොදන' නමුත් මහත් කොට [8]නරවැ හැඬීමයි. යා [9]අත්තනො ගති, යම් ආත්මගතියෙක් ඇත්ද—ඉපැද්ද යුතුවූ යම් දිව්‍ය ගති ආදිවූ ගතියෙක් ඇත්ද; පරිහරිත්වා, පරිහරණය කොට—උපුලාය යූ සේයි; ඵසඳං, කිරි; [10]අනාගුණො, [11]නොකැඳවන ලදු යේ; අරති සියා, මොවුන්ට වූ දුක් මහත් තියායයි කියා අප නිසා බොහෝ කිරිකැටලි [12]උපන්නේ වන්නේයැ; ලබ්භනීයා ලබ්භනීයං, ලැබෙනු නොලැබෙනු; එවං සම්පදමෙව යනුයෙහි අර්‍ථයි 'එවං නිපඵත්තිකමෙව' යනු. එවැනි නිපැත් එවැනි නිෂ්පා ඇත්තේයි—එමැ යයි යූ සේයි; [13]බ්‍රහෙම යි කියා [illegible] ගාරව වචනයි—උත්තමයයි [14]කී තියායි.

## 354. උරගජාතකං.

---

නාබ්භතීනාහරෙ, ඉකුත්වූ අර්‍ථ ගෙනෙන්නේ නොවේ; රූපසෙනා, එයින් මඩනා ලද්දහට; [15]සාතසුඛසඞ්ඛාතං, මධුර සුඛයයි කියන ලද; කිලෙසදරථරහිතං, කෙලෙස් ගිනි නැත්තාවූ—කෙලෙසුන් [16]තැවුලි නැත්තාවූ; යස්සනො, යම් රජක්හුගේ [17]ආත්මය තෙමේ.

## 355. ඝතජාතකං.

---

මච්ඡබන්ධාදිනං, කෙවුළු ආදීවූ; අරුචියා, [18]නොකැමැති යෙන්; බ්‍රාහ්මණවාචනකත්ථාය, වෙද කියවන පිණිස-ශාන්ති [19]කරවන පිණිස; චාතුරන්තං, 'චතුසාගරන්තං' යූ සේයි; දරිං, කඳුරැ; ජිගිංසං, දිනන්නට උත්සාහ කරන්නේ; සංසාරමොචකාදයො, මෙසින් සැව අතික් තැනෙක නොවදුම්හයි—[20]එයින් ඇපි මේ ආත්මභාවයෙන්ම සසරින් මිදෙම්හයි සිතන්නෝ.

## 356. [21]කාරණ්ඩියජාතකං.

---

1 තංසභාවෙනෙව-මු අ.ක. 2 සාජ්ඔබාය-හැම. 3 සනුභවCDF. 4 ක්‍රියාව යනුයි CDF. 5 සාරුසොඥත-මු.අ.ක. රොදෙත A. රොනොතා CDF. 6 පරිදෙවෙන-මු. අ. ක. පරදෙවතා CD. 7 රොදු-හැම. 8 නරවා CD. 9 අත්තනො ගති-මු. අ ක. 10 අනබ්භිතො-මු. අ. ක 11 කැඳවන CD. 12 උපන්නේයි CD. 13 මු. අ. සාඨාහි නොපැනේ. බ්‍රහමා CD. 14 කියායි CD. 15 ඝාතසුඛසංඛාතං-මු. අ. ක. 16 තැවිලි CD.17 ආතම CDF. 18 නොකැමැතිසේ CDF. 19 කරන පිණිස AD, 20 AF හි පමණකි. 21 කාරණ්ඩිජාතකං AC,

[1]ලටුකිකසකුණිකා, කැටකිරිලි; [2]පරිත්තාණත්ථාය, රක්ෂා කරන පිණිස; [3]සට්ඨිහායන, සැට [4]හවුරුද්දෙකින් [5]මද ගිලිහෙන්නව; සකුණපොතකානං උපරි [6]ගන්ත්වා, සකුණ පොතකයන් මත්තෙහි ගොස්—පැටවුන් යටබඩැ කොටැ ගෙනැ සිට යනුයි; තස්ස, ඒ එකචාරි [7]හස්තියාට; [8]මුත්තෙත්ත පවත්තෙත්වා, මූත්‍ර වත්කොටැ; පච්චාසිංසාමි, කැමැත්තෙමි; ආසාටිකං, හියඩ; පුළවෙහි, පණුවන් විසින්; [9]පවට්ටෙත්වා, පෙරලා—

### 357. ලටුකිකජාතකං.

[10]පරිසක්කන්තං, උත්සාහ; අසිමාලකං යන්නෙහි අසිමාලක නම් ආසට තඟා උඩදී කඩුයෙන් කොටා [11]සුන්සුන් කිරීමයි; උපධානසීසකං, තබා අත්පා [12]සිඳුනා දඬුකඩ; අවජ්ජිත්වා, උදුරාගෙනැ; ඵලකං, පුවරුව; ඵරසුං, කෙටේරිය පොරව හෝ; භූනහතා, වැඩ නැසූයෙම්; තරුණවංසකළීරෙ විය, ළා හුණුකිලිල් කපන්නා සේ; අසිතුණ්ඩෙන නං පටිච්ඡිත්වා, අහසට තඟා කඩුමුවහත එළවා; පල්ලඞ්කෙ ඨාතුං, පයඞ්කයෙහි හිඳිනට; මහාතලෙ, මහාමාලෙහි තිමැ; [13]පදරං, පුවරුව—

### 358. චුල්ලධම්මපාලජාතකං.

[14]බුද්ධමාමකා, 'මමෙව බුද්ධො'යි කියා මෙසේ බුදුන් කෙරෙහි පැවැති මමත්ව ඇත්තීයි; රත්තකම්බලගෙණ්ඩුකසදිසෙන, රත්පලස් පෙදක් වැනිවූ; කිං [15]එස, මේ තොපට [16]කිමෙක්ද; පාසං [17]සන්ධාරෙතුං න සක්ඛිස්සසි, මේ මළ තොපි උසුලා ගත නොඒද—මේ මළ ධරාගත නොහී බඬරාව කරන්නේය යනුයි; තස්ස [18]පාදතො පට්ඨාය—පෙ—[19]ගාරවෙනෙවමාහ, [20]පා රත්වුවද ඔහුගේ පය පටන්—පා මඩාද කොට සියලු [21]ශරීරය රත්වන් හෙයින් සවණ්ණවණ්ණවූ ශරීරයට පාදයාගේ මඩාදභාවය ගෙනැ මෝ තොම සුවණ්ණමිග යයි

1 ලටුකිකා-මූ. අ. ක. 2 පරිත්තානාය CDF. 3 සට්ඨිහායනං-මූ. අ. ක 4 අවුරුද්දක් D. 5 මද මද ගිලිහෙන්නාවූ CDF. 6 ඨත්වා-මූ. අ. ක. 7 හස්තිහට CDF. 8 මුත්තෙත්ත-මූ. අ. ක. 9 පරිගලිත්වා-මූ. අ. ක. පවෙඨෙත්වා A. 10 පරිසක්කන්තං-හැම. 11 සුන් CDF. 12 සිඳිනා D. 13 පදරතලං-හැම. 14 බුද්ධමාමකා-මූ. අ. ක. 15 එතං-මූ. අ. ක. 16 කුමක්ද CDF. 17 සන්ධාරෙතුං නාසක්ඛිසි ACD. පටිසන්ධාරෙතුං නාසක්ඛිසි F. 18 මූ. අ. කථාහි නො පැනේ. 19 රාගවෙගෙනෙවං ආහ-මූ. අ. ක. 20 පැ රත්වුවද CDF. 21 ශරීරයත් වහන කරන හෙයින් A. ශරීරයත් වහන හෙයින් CDF.

නොකියා බොධිසත්වයන් කෙරෙහි ගෞරවයෙන් කීහු; [1]**පරිග්ගහෙත්වා**, තමා ඇඟ වතුරුවා ගෙන; [2]**ඡමාවෙතුං**, මුකතවන්නට සුදුස්සක්; **පලාසපණ්ණානි**, කැල කොළ; [3]**අසිකොසකො**, කඩු කොපුයෙන්; **වාසියා**, මස් කපන කැත් තෙන්; **අනුමොදනං කරොන්ති**, වැද්ද සතුටු [4]කරත්තී.

**359. සුවණ්ණමිගජාතකං.**

---

**සුවණ්ණභූමිං**, [5]සුවණ්ණාකරයට; [6]**නාවාවෙතනං ඛණ්ඩත්වා**, නැව් කුලියට කඩා; **සුඛපයාතාය නාවාය**, සුවසේ නැව සාගර මධ්‍යයට පැමිණි කල්හි; **මච්ඡා වලිස්සන්ති**, ගායනා ශබ්දය අසා මත්ස්‍යයෝ [7]මත්වැපියා ඇලලෙන්නාහ; **මනුස්සමත්තො**, මනුෂ්‍ය මාත්‍රයක්හු—මිනිසකු ගායනා කල හෙයින්ය යනුයි; [8]**මුච්ඡිත්වා**, සරහා; [9]**සම්මත්තා හුත්වා**, ගායනා ශබ්දය අසා එහි ලොල්වැ මත්වැපියා; **වලිංසු**, ඇලලී ගියෝයි; **යථාවාතං**, සුලඟ හමන දසට; **බාහාහි පරිග්ගහෙත්වා**, බාහුයුගම යෙන් ඔසවා ඇරැ ගෙන; **සමස්සත්ථකාලෙ**, අස්වස් ලද කල්හි-[10]සැනපී ගිය කල්හිය යනුයි; **තිම්බරුක්ඛා**, මිදෙල් ගස්—කස ගස් හෝ; **තම්බෙන කාමිතකාමා**, තම්බ නම් රජහු විසින් ඒ [11]සුසොන්දිය විෂයෙහි කැමැති වන ලද කාමයෝ; **තෙ**, ඒ තම්බ නම් රජහු විසින් [12]කැමැති වන ලද [11]සුසොන්දිය විෂයවූ කාමයෝ; **අනන්නාසි**, තමා කාද.

**360. [11]සුසොන්දියජාතකං.**

---

## පඨමො වග්ගො.

---

[13]**සුඤ්ඤාගාරං**, විවෙක සුඛ; සුඤ්ඤාගාර නම් ජන රහිත ගෙයය. මෙතැන එහි හිඳ කරන විවෙක සුඛ සඞ්ඛ්‍යාත භාවනා කියනලදි. **අනුබ්‍රෑහෙස්සාමීති**, වඩම්හයි; **විසාසාභෙදෙ**, [14]කවුළුවෙක්; [15]**කලාභාගමපි**, සොළොස් කොටසින් එක් කොටස කුදු; **පසවෙ**, උපදවන්නේයි; **වයස්ස**, යහළු; **යථාතච්ඡං**, තත්ව යෙන්-ස්වභාවයෙන්ම ඇති දෙයක් යම්සේද; **අවිසංවාදකෙන**,

---

1 පග්ගහෙත්වා A. 2 මු. අ. ඝාටාති නො පැතේ. 3 අසිං කොසතො-මු. අ. ක. 4 කරවා A. 5 සුවණ්ණාකරයට F. 6 නාවාය වෙතනං-මු.අ.ක. 7 මත්ව ලොල්ව C 8 මුඤ්චිත්වා-මු. අ. ක. 9 මත්තා හුත්වා-මු අ. ක 10 සැනපුණු කල්හිය A. 11 සුසන්ධි-මු. අ. ක. 12 කැමැති A. 13 අරඤ්ඤායතනං-මු. අ. ක. 14 කවුලුවෙක් CDEF. 15 කලභාගමපි-මු. අ. ක.

කී දෙයට අන්‍යථාත්වයක් නොකරන්නාවූ-කී [1]දෙයෙහි අන්‍යථාත්වයක් නැත්තාවූ; සෙති, හොති—සත්‍යාධිෂ්ඨාදිවූ චතුර්විධ ඊර්‍ය්‍යාපථයෙන් යුක්තවැ පවතිද.

### 361. වණ්ණාරොහජාතකං.

[2]සුතාධාරයුතෙනාති, ශ්‍රැත සඞ්ඛ්‍යාත ආධාරයෙන්—ප්‍රතිෂ්ඨායෙන් යුක්තයයි කෙරේද්‍යෙහෝයි; [3]විලොපඛාදකොති, පැහැර ගෙනැ කන්නේයි; සම්පරායාය, පරලොව පිණිසැ; සුතපරියත්තිතො, ඇසූ පෙළට වඩා; චාරිත්ත සීලය නම් [4]ආචාර සීලයයි. වාරිත්ත සීලය නම් පණිවා ආදීන් දුරු විම වශයෙන්වූ ශීලයයි. කායික සීල නම් කායද්වාරයෙන් අව්‍යතික්‍රම වශයෙන් ප්‍රවෘත්ත සීලයයි. වාචසික මානසික සීල යත් මෙසේ මැයි. [5]සො හි, ඒ බ්‍රාහමණ තෙම; [6]අනුසසව වසෙන, අසා එන හෙයින්; [7]ඡවඩාහකචණ්ඩාලා, මිනී දවන සැඩලෝ; පුප්ඵඡඩ්ඩකපුක්කුසා, අසුචි දමන බබුරෝ.

### 362. සීලවීමංසජාතකං.

[8]පවජිතත, හටුවාවූ; සබ්බසාපතෙය්‍යා, සියලු ධන [9]ඇත්තාහු; පටිකාරකො, ප්‍රත්‍යුපකාර [10]කරන්නවුන්; ඵලං ච, දිව්‍යලොක ඵලද; ආනිසංසං ච, ඉහ ලොකයෙහි සම්භව වන ප්‍රයොජන සඞ්ඛ්‍යාත අනුසස්ද; උපධිවිවෙක නම් කෙලශොපධියෙන් චිත්තසන්තානයාගේ විවෙකයයි.

### 363. හිරිජාතකං

බජෙජාපනකපඤ්හා, කද්‍යෙපැත—මහ උමංදයෙහිමැ එන්නේයි.

### 364. බජෙජාපනකජාතකං.

විබ්භමි, සිවුරු හැරපී; සුභද්‍රයො, මෙසේ ගඟට [11]කර තුත් වී නම් තෙරුන්ට කිසි දුක්ඛයෙක් තමා විසින් [12]නොකෙළේ වී නම් මනාවූ ලු ඇත්තේ; සික්ඛාපෙත්වා, ශිල්ප ඉගෙනැ කෙළවන පරිද්දෙන් හික්මවා ගෙනැ; අහිං කීළාපෙනෙනා, ඒ වඳුරා ලවා සපියන් කෙළවන්නේ; උපලාපෙත්වා, තළවා;

---

1 දෙයට A. 2 සුතාචාර-මු. අ. ක. 3 විලුම්පකචොරකොති-මු. අ. ක. 4 ආචාර ගුණ CD. 5 මු. අ. කථායි නොපැණේ. 6 අනුසසම වසෙන වදනි CD. 7 ඡවඡඩ්ඩක චණ්ඩාලාච-මු. අ. ක. 8 අවජිතාත-මු. අ. ක. 9 ඇත්තාවූ A. 10 කරන්නාවූ A. 11 කරතොත් CDF. 12 කෙළේ වී නම් A. නොල වී නම් CD.

සම්ම, සබඳ; සුමුඛ, යහපත් මුහුණු ඇතියෙනි; [1]දූතෙ, දූත මණ්ඩලයෙහි; අක්ඛපරාජිතො, දූ කෙළියෙන් පරදවන ලද් දෙම්; [1]වුතෙනා අම්හි, අඹ පක් දෙම්යි කියෙම් වීමි—පැරදි තැනට අඹ පක් දෙම්යි ගිවිසැ කියෙමි වීමියි යනුයි; අම්බ පක්කානි, අඹ පක්; [3]සාවෙහි, හෙළ; තෙ විරියං, තොපගේ වීයර්යය; හඤ්ඤයාමසෙ, කමු—තොප හෙළූ අඹ දී තොපගේ වීයර්යයෙන්—ශෞර්යයෙන්—ඒ දිය යුත්තෙන් මුක්තවීමෙන් [4]තොපගේ වීයර්යය—තොපගේ ශෞර්යය—දූන් අපි අනුභව කරම්හයි යනුයි; [5]සුභොජනරසෙන මාතුකුච්ඡියං සෙව යනු මාතෘ කුක්ෂියෙහි වසන තැන් පටන් තොටමැ සියලු සැප තින් ඌනතාවයක් නැති බව [6]ගෙනැ [7]කීහු. අලඩ්කත පටියත්තො සයනගබ්භ යනු [8]හුන් තැන තින්දදීමැ කිසි දුකක් නැතිවමැ සියලු සැපත් තිපදනා බව ගෙනැ කීහු. [9]නිතතං, සියලු සැපතින් පිනා [10]ගියහු.

## 365. [11]අඟිගුණ්ඨකජාතකං.

එකෙන [12]ගුම්බියෙන, ලැහැප්හි ඇවිදිනා හෙයින් එනම් ලද එක් [13]යකක්හු විසින්; ‘ගුම්බෙ චරතීති ගුම්බියො-තෙන ගුම්බියෙන’යි තැන්. මහාවනතානි, මහා විස්තාරවූ මාර්ගයෙහි; [14]මධුකබණ්ඩ, මීවද; [15]අඩ්ඪබාදිතානි, ඒ විෂයෝ මදක් කන ලද්දුහුද; [16]වමනයොගං, [17]නහන්නට තිසි ඖෂධ යොග යක් යොදා; [18]යෙ කෙ පඤ්චගුණා නාම, [19]යම් මේ පඤ්ච කාම ගුණ කෙතෙක් ඇත්ද; එතං, මේ පඤ්චකාම ගුණය; [20]මච්චුගුනස්ස, [21]‘සත්තුභූතස්ස’[22]යි තැන්; [20]ලාමකස්ස, ලාමකවූ මනුෂ්‍යයාහට; ආමිසං, ආමිෂ යයි—[23]ඇමය යනුයි; අඤ්ජු නම් හැකිලි; මච්චු යනුයෙහි [24]අර්ථකථා කීහු ‘මරණ මච්චු’ යනු—මරණ සඞ්ඛ්‍යාතවූ මෘත්‍යුයයි යනුයි. මෙයින් මෘත්‍යු යයි කිවා වෙත්. [25]ආගතාතුරා, සම්ප්‍රාප්ත පීඩා ඇත් තාහු—සම්ප්‍රාප්තවූ විනාශ ඇත්තාහු; [26]කිලෙසසංවට්ටකො,

1 ජුතෙ-මු. අ. ක. 2 වුතෙතා--මු. අ. ක. 3 හරෙසි-මු. අ. ක. සෙවෙහි, හෙළ--හැම. 4 තොපගේ ශෞර්ය්‍යවීර්ය්‍යය A. 5 සුභොජනෙන--මු. අ. ක. 6 දූන--හැම. 7 කියත් CD. 8 හුන් තැන්හිදීමැ A. 9 නිතනිං--හැම. 10 ගියාහු AD. 11 අඟිතුණ්ඩක-මු. අ. ක. අඟිකුණ්ටික C. අඟිගුණ්ටික DF. 12 ගුම්බියෙන-මු.අ.ක. ගුම්බසොනා F. 13 සනක්හු CDF. 14 මධුකබණ්ඩ--මු.අ.ක. 15 අඩ්ඪබාදිතා-හැම. 16 වමනාවිරෙචනං-මු. අ. ක. 17 වන්නාට A. 18 එතෙ පඤ්චකාමගුණා නාම-මු. අ. ක. එතෙ පඤ්චගුණා නාම A. 19 මේ ගුණ කොතෙක් A. 20 මු. අ. කථාහි නොපැනේ. 21 සතත A. සතු C. 22 යී සේයි CD. 23 අමය A. 24 අර්ථ කියනු තකා කීහ CD. 25 ආතුරා-මු. අ ක. 26 කිලෙසබන්ධනො-මු. අ. ක.

කෙලෙස් වටවූ; **සඞ්ග** නම් ලොභයි—රාගාදීවූ කෙලශ ජාතියයි.

## 366. ගුම්බියජාතකං.

[1]**විටභිඅන්තරෙන**, වෙලෙප් අතුරෙන්; **සාලියවප්පං**, සැලලිහිණි පැටවක්හු; **කම්මසරික්ඛකං**, කම් සදෘශ-කළ කම්ය වැනිවූ; **පටිච්ඡති**, විපාකදීම් වශයෙන් නැවැත පෙරළී ඒ කම්ය ඒ නිරපරාධයන්ට අපරාධ කළාවූ පුද්ගලයා කරා පැමිණෙන් නේය.

## 367. සාලියජාතකං

[2]**ගණ්ඩුලෙයි**, බලු කදින්. 'කුදණ්ඩක' යයි කියාත් බලු කඳට නම්. **තචසාරසමප්පිතා** යනු හුණ දණ්ඩෙන් කළ බලු කදින් බැඳි බව ගෙනැ කීහු; **එනගගහණෙන**, සැසැඳිලින්; **යතො**, යම් කලෙක්හි.

## 368. තචසාරජාතකං.

**ආසාදෙසි**, පැමිණියේ; **ක්‍යාහං දෙවානමකරං** යනු දෙවතාවන් තමහට එදුක් කළහයි යන බුද්ධීන් කියා; [3]**උහච්ච** යනුයෙහි අර්ථය '[4]හතිච්චා' යනු—පැහැර යූ සේයි; **අත්‍ර**, මෙහි; [5]**භවිස්සන්ති මඤ්ඤෙති**, වන්නාහයි සිතමි; [6]**නිප්පිසමානං**, සකල ශරීරය සුනු කෙරෙමින්; **භසි**, ඉසින් පාතට බටි.

## 369. [7]මිත්තවින්දජාතකං.

**ගමනාගමනමග්ගෙ**, යන එන මඟ; **විසම්භා**, සැතපී; [8]**විටභිඅන්තරෙ**, වෙලෙප් අතුරෙහි; **සම්ම පලාස** යි කියා ඒ පලාසවෘක්ෂ දෙවතාවාට ඒ පලාසවෘක්ෂ [9]ව්‍යවහාරයෙන් ආමන්ත්‍රණයි. **පටිගච්චෙව**, පළමුකොටමැ; **පඨමපාදෙ පනෙත්ථ** [10]යතාදි මේ ජාතකයෙහි පළමුවන [11]ගාථායෙහි හංසයාගේ මන්ත්‍රණයන් ඇති හෙයින් 'පඨමං ගාථමාහ'යි ඔහුමැ කීවාමැ වැනි කොට කී බව මූත් ආදී පාදය බුදුහු වදාළහයි හඟවන පිණිස කීහු.

## 370. පලාසජාතකං.

# දුතියො වග්ගො.

1 විටපබ්භන්තරෙත-මු. අ. ක. 2 කුදණ්ඩකොයි-මු. අ. ක. 3 ඔහච්ච-මු. අ. ක. 4 ඔහතිච්චා-මු. අ. ක. 5 භවිස්සරෙ-මු. අ. ක. භවිස්සන්ති-හැම. 6 නිපපීළියමානං-මු. අ. ක. නිපතසමානං A. නිපිරසමානං D. 7 මිත්තවින්දක-මු. අ. ක. 8 විටපබ්භන්තරෙ-මු. අ. ක. 9 බැවහාරයෙන් CDF. 10 යතාදියෙහි CDF. 11 ගාථාව A.

භණ්ඩනකාරකො, ඩබර කරන්නාවූ; ඔරසා, '[1]උරසි ජාතා ඔරසා'; පුත්තා යනු හා සබඳ කරනු. ඔරසතිය සාධන්නට කියති මුඛතො ජාතා යනාදි-මුඛයෙන් උපන්නාවූ-දෙශනායෙන් උපන්නාවූ යනුයි; න දුබ්භාමි, [2]මිත්‍රද්‍රොහ නොකෙරෙමි.

## 371. දීඝීතිකොසලජාතකං.

පරිබාහිරො [3]එසො භවිස්සතීති, පිටත් එකෙක් වනැයි කිය කියා [4]හුන්නු; සොචාමෙවාහනති, එහෙයින් මම් ශොක කෙරෙම්මැයැයි කී; කිං නික්ඛමම්මා [5]අචජාම, ඊ කම් කුමට [6]හිඳුමෝද.

## 372. මිගපොතකජාතකං.

අමඤ්ඤාකං ධූමකාලෙ, අප මළ කල්හි; [7]සංරූළ්හවණං, හටගත්තාවූ ව්‍රණ ඇති; යවවත්ථුං, යව [8]වත්තකට-ක්‍ෂෙත්‍රය කට හෝ; චොරඝාතං [ඝාතුං], ශත්‍රු පක්‍ෂයෙහි සිට සොරකම් කරන්නට හෙවත් [9]පසත් දතව්වට ගොස් සතුරුවැ ගම් පැහැරුම් ආදීන් රාජ්‍යය ගන්නට; සොබෙත්වා, බලා ශුද්ධ කොට; කක්කගහෙන, සිතාගැන්මෙන්—අනුමානයෙනැයි යු සේයි; [10]දබ්භවින්ද නම් ආයුධයෙන්; අඩගසරික්ඛකෙන, ආතමසමානවූ; [11]අනුජෙන, [12]පුත්‍රයා විසින්; පරියනතිං, [13]පෙළ හා සන්නයි; අධිසිනබ්බමෙවාති, ඇසිය යුතු මැයි.

## 373. මූසිකජාතකං.

එකං [14]ඨානං, එක් අරණ්‍ය ප්‍රදෙශයක්; තං ඨානං අභිරූහිතුං, ඒ ඇතු සිටි වලට නැඟෙන්නට—යන්නට; උචඨහි, දිව [15]අයි; එකං [16]මංසපූලං, එක් මස්හිරක්—එක් මස්වැදූල්ලක් හෝ; අනානානං සමභාවෙත්වා, මාසේ වූවන්ටත් මෙසේ කෙරෙත්දැයි තමා අධික කොට—ගරු කොට—තකා; කණ්ඩනාළියං, හියවුරෙහි; නාසස උරෙ, ඔහු ළමැද; ඨරුං, කඩුම්ට; ඨරුදණ්ඩං පරාමසිත්වා, [17]කඩුමිට අල්වාගෙනැ; උතතානතලං, සකුස් ඇයි—නො ගැඹුරුවූ කුස් ඇතිය යනුයි; නරඉනා විය, පිහිනන්නක්හු සෙයින්; එළගලාගුම්බං, කලිල බැද්දකට. [18]'කම්බොජගුම්බ' නමුත් හේමැයි. [19]ජාතෙථා,

1 උරසිජා CDF. 2 ද්‍රොහ CDF. 3 එසො-මු. අ. ක. 4 හුන්නාහු A. 5 ගචජාම-මු. අ. ක. 6 හිදිංමෝද A. 7 ආරූළ්හවණං A. 8 වත්තට A. 9 පසල් CDF. 10 දණ්ඩක-මු. අ. ක. 11 පුතෙතන-මු.අ.ක. අනුජ-හැම. 12 රාජපුත්‍රයා A. 13 පෙළ ශාසත්‍රයි BCDF. 14 පදෙසං-මු. අ. ක. 15 ආයි D. 16 මංසපූලං A. 17 කඩුව මිට A, 18 කම්බොජි-මු. අ. ක. හා කම්බොජ BCDF. 19 මු. අ. කථාහි නොපැනේ,

සොරසැමි; [1]**පමුඛ**, අභිමුඛයෙහි; [2]**අහුහාසියන්ති**, 'අහුහාසියං' කියා; **දන්තවිදංසකං**, දත් විවෘත කොට කරන; **මහාහසිතං වුච්චති**, මහා හාස්‍යය කියනු ලැබේ—[3]දත්වළු සිනා කියනු ලැබෙයි යනුයි; [4]**අනමහකාලෙ**, අඬන්නට සුදුසු කාලයෙහි; **ජානිප්පත්තො හුත්වා**, [5]හානි ප්‍රාප්තවැ—මංසපෙසි ආදියෙන් හානියට පැමිණියේ යනුයි; **හරති**, යමෙක් මේ මාත්‍රයකුත් සොරා ගත්තේවීද; **සො හරතෙව**, ක්‍රමයෙන් සොරකම් වඩා ගෙනැ [6]ගොසින් එසේවූ [7]මහඇඟිවූ වස්තූත් හෙතෙම ගන්නේ මැයි.

## 374. චුල්ලධනුග්ගහජාතකං.

**නීලපච්ඡියං**, කදලු පැසැ; [8]**තිනතිනාගතෙනා**, තතනන් නේ; [9]**පාරාපතෙන**, පරෙවියා විසින්; කපොට[10]යසිද කියත්. **ගතො මෙ පච්චාමිත්තකණ්ටකො** යනු තමා කරනු කැමැති නොකටයුත්තට බාධා කොට කියන හෙයින් කියා. විජ්ඣනාථ යෙන් [11]දුමදයකාචයෙන් කණ්ටකයක් වැන්නෝතුයි පස මිතුරෝ කණ්ටක නම් වෙති. එසේ හෙයින් මාගේ පච්චාමිත්ත සඞ්ඛ්‍යාත කණ්ටකය ගියේය—[11]සපරහ විය යනුයි. [12]**පවාහෙතෙන**, තිවන කල්හි; **රසකාරොපියං** [13]**නිලීයි**, රස පෙරහන කොරමරුයෙහි [14]හිනි; **පිට්ඨිමද්ද** නම් ශෘඛගිවෙරාදීන් [15]එක් කොට කළ කල්කයි; **පිණ්ඩජානි**, පත්; [16]**කණ්ඩලං**, කැබිලිති.

## 375. [17]කපොතජාතකං.

# තතියො වග්ගො.

## [18]පඤ්චකනිපාතවණ්ණනා නිට්ඨිතා.

**තිපඤ්චනාවිකං**, තොට නැවියකු—තොට හඳුනන නැවියකු යයි යූ සේයි; [19]**හෙට්ඨා තිපඤ්චං නාවං නෙත්වා**, ඉඳුරා අවුත් පසුවැ යට [20]නොටබලා නැව පැදගෙනැ ගොස්; **උල්ලොලං කත්වා**, [21]උලෙළ කොටැ—[22]නැව ඇත් මැත් කොට සලා

1 සමුඛ-මු. අ. ක. 2 අහුකාලියන්ති අහුහාලියං කියා-හැම. 3 තදවළු B. 4 අනමහිකාලෙ-මු. අ. ක. 5 ජානි ACF. 6 ගොස් AC. 7 මාහැඟි CD. 8 තිපඤ්චනා යනෙතා-මු. අ. ක. 9 පාරාවතෙන-මු. අ. ක. පරෙවපතෙනF. 10 යසි කියාද කියත් BCDF. 11 චිමසිය යුතුයි. 12 පවාහෙන්තො, තිවන්නේ-හැම. 13 නිලීයිත්වා-මු අ. ක. 14 බැස හිනි CD. 15 හා එක්කොට A. 16 කණ්ඩලිකං-මු. අ. ක. 17 කපොට B. 18 පඤ්චනිපාත-හැම. 19 හෙට්ඨානාවං-මු. අ. ක. හෙට්ඨාතිපඤ්ච නාවං A. 20 නොටලා A. 21 උලෙලාල A. 22 නැවැතත් F.

ඇතුළු නැවට දිය වදනා පරිද්දෙන් හලලාය යනුයි; [1]සකිං උපට්ඨානං, එක් වරෙක උපස්ථාන; [2]අනුසත්ථියා, අවවාද යෙන්; ආයාපායං, වැඩ අවැඩ; තාරං, තරණය; [3]භොගවඩ්ඪී, භොගයන්ගේ වෘද්ධියයි—භොගයන්ගේ වන වැඩ හෝ; [4]අත්ථ නම් ඵලය; [5]ධම්ම නම් ඒ ඵලයාගේ නිෂ්පත්තියට හෙතුවයි; එහිලා මෙතැන [6]අක්‍රොධය හෙතුය, එයින් නිපදනා ඵලය ඔවුන් දෙදෙනාගේ වෘද්ධිය—'අත්ථවඩ්ඪි ධම්මවඩ්ඪි' නම් වේ. හෙද හෙතුව කීමෙන් ඵලය කීවා නම් වේනුයි මෙම ගාථා යෙන් දෙකමැ කියන ලදි. [7]සො ඉති ඉමෙසං පදානං, 'සො' යන 'ඉති' යන මේ දෙපදයන්ගේ; [7]සූති සන්ධි හොති, 'සූති' යන සංහිතාවේ; කුමය යු තැන යත්? 'සූති' යන සංහිතාව 'සො ඉති'යි සිඳැ ඉකාරයහට ලොප් කොටැ ඔකාරයහට උකාර කොට දීර්ඝ කළ කල්හි 'සූති' යන පදය සිද්ධ වෙයි යු තැන්.

## 376. [8]ආචාරියජාතකං

උදිච්ච, ප්‍රසිද්ධවූ; පාදන්තරෙන, දෙපා අතුරෙන්—දෙපා හස්සෙන්; තං ගමෙස්සති, තා යවමි යි; කාමෙත්තවා, සිතා ගෙනැ; බද්ධවෙරො [ගහෙත්වා], කාදෙට-කාර-ගෙනැ යනුයි; [9]න ලච්ඡසෙ, 'න හඳුනො' යු සේයි; දිසා යනු 'දිසතා' යනු යෙහි අර්ථයි—යථොක්තවූ මාත්‍රාදීවූ පූර්වදිශා ආදිවූ දිසාවන් අතුරෙහි හෝ; අපදිසිත්වා, තිසා; උපරූපසි අවහායනතො, මතු මත්තෙහි සම්පත්තියට කැඳවන හෙයින්—දායකයන්ගේ දානය පිළිගෙනැ සඵල කිරීම් වශයෙන් උන් මතුමත්තෙහි සම්පත්තියට [10]කැඳවන්නේ නම් වෙතියි ගෙන කියත්; [11]අලමත්තො, සමර්ථ ආත්ම ඇති—මනාවූ සිත් ඇති හෝයි; [12]අනවසෙසකං, යනු 'තෙලපත්තං' යන්නට විශෙෂණ කරනු. [13]'පරිහරෙය්‍ය' යන ක්‍රියාවට හෝ විශෙෂණ කරනු. මේ 'තෙලපත්තං' යන්නට විශෙෂණ වත් අවසෙස රහිතවූ—මෝවිටිසමවැ පිරුණු හෙයින් පූරනු පිණිස නැවැත වත් කිරීමක් නැත්තාවූ තෙල් පැණ යනු වේ. 'පරිහරෙය්‍ය' යනුවට විශෙෂණවත් [14]අනවසෙස කොට නොවම්වා පරිහරණය කරන්නේය යනු වේ. 'සිප්පමනන්ත චරණ' යන්නෙහි සිප්ප නම් හස්ති ශිල්පාදි ශිල්පයි;

---

1 දෙවසිසාං-මු. අ. සා. 2 අනුසිට්ඨියා-මු. අ. සා 3 භොගවුඩ්ඩී-මු. අ. සා. 4 අත්‍ථ ACDF. 5 ධම් ACDF. 6 ආ ක්‍රොධහෙතුය A ආක්‍රොධහෙතුවය D. 7 මු. අ. සාථාහි මේ පාඨයෝ නොපැනෙත්. 8 අචාරිය-මු. අ. සා. ආචාරි BCDF. 9 මු. අ. සාථාහි නොපැනේ. 10 කැඳවන්නී-හැම. 11 අප්පමත්තො-මු. අ. සා. 12 අනවසෙසං A. 13 මෙ පරිහරෙය්‍ය A 14 අනවශෙෂ CD.

[1]මන්ත නම් වෙද මන්ත්‍රයි; සාඛා [2]ගන්ධ චරණ නම්; [3]නොහොත් ශිල්පයි; **පරිචිණ්ණත්වා**, වළඳවා; **වග්ගුලිවතං චරථ**, වවුල් තපස් කරව; **කණ්ටකාපස්සයං**, කටුමැස්සේ තපස්; [4]**පඤ්චතාප** නම් සතර දිශාවෙන් ගිනි හා උඩින් අවුයෙන් තැවෙන බවයි; [5]**උක්කුටිකප්පධානමනුයුඤ්ජථ**, කෙළිල්ලෙන් හිඳ තපස් කරව; [6]**උදකොරොහණකම්මං**, දියෙහි ගැලීමද; **මන්තෙ සජ්ඣායථ**, වෙද මන්ත්‍ර හදාරව; **අපස්සයපීඨකෙ**, පිටාවු සහිතවූ පුටුයෙහි; [7]**පඤ්චවණ්ණසමුජ්ජලවාසනං**, පස් පැහැයකින් දිලියෙන වසා ඇති; **ආධාරකෙ**, දණ්ඩාසනයෙහි. 'අනඤ්ජිතා අමණ්ඩිතා [8]ලූඛනිවාසනා ලූඛපාරුපනා'යි යොදනු. **අනඤ්ජිතා**, අඳුන් [9]නොගෑවාහු; **අමණ්ඩිතා**, නොසැරහුණාහු; **ලූඛනිවාසනා**, නොපිණි අන්තරවාසක ඇත්තාහු—නොපිණි වල්කලා හැන්දහුය යනුයි; **ලූඛපාරුපනා**, රූක්ෂවූ වල්කලා [10]පෙරවියාහු; **මනුස්සෙහි කාතබ්බපයොගෙ** යනු ඔවුන් කොට ගෙනැ හුන් ක්‍රියා තකා කීහු; **ලොකං විදිත්වා**, ලොව වූතියාව දැනැ; **සහස්සවෙදොපි**, සහස්‍ර භාග හෙයින් දත්තාවූ වෙද ඇත්තේද; **චරණං** යනුයෙහි අර්ථය 'සීලසම්පත්තිසඞ්ඛාතං' යනු. සිල් [11]සම්පත් චරණ නම්; 'චරති—එතෙන ගච්ඡති අමතං දිසං නිබ්බානන්ති චරණං' යනු වේ. [12]**එලකාවුධානි**, කඩු පලහ; [13]**මහාකාරකො කත්වා**, ගේ රක්නවුන් කොට—ගේ රක්නා පරිද්දෙන් හෝ; **අයං කිර** [14]**මහාකාරකානං වංසො**, මෙතැන සිටැ ගණවැස්සන් ආ හෙයින් මේ ගණවැස්සන්ගේ වංශ......

### 377. සෙතකෙතුජාතකං.

**දරිමුඛො**, රූ ඇති මුහුණු ඇත්තේ; **පගණ්හාපෙසි**, ගැස්වී; **පස්සද්ධදරථො**, සන්හුන් ශ්‍රම ඇත්තේ; **ඛය** නම් අතුරෙහි මියන ලක්ෂණ මරණය; **වය** නම් සන්තාන භෙදයි; **පට්ඨපෙත්වා**, විචාරා—පටන් ගෙනැ; **තිලක්ඛණං සම්මසිත්වා**, තුන් ලකුණු විචාරා—ත්‍රිලක්ෂණය සම්මර්ශනය කොට; **ගිහිලිඞ්ගං**, ගිහිවෙස්; **පටිමුඤ්චි**, ලගනවී; **නළ**, හුණ ගස්; **ආසනතා**, [15]හැලුණාහු; **විසන්තා**, වෙසෙසින් [15]හැලුණාහු; **මහාභද්දකො**,

1 මන්ත්‍ර ACD. 2 ගන්ධ-හැම. 3 ගෙ.ශිල්පයි CD. 4 පඤ්චාතප-මු. අ. සා. A. 5 උක්කුටිකප්පධානං අනුයුඤ්ජථ-මු. අ. සා. 6 උදකොරොහණකම්මං-මු. අ. සා. 7 පඤ්චවණ්ණරඞ්ගසමුජ්ජල-මු. අ. සා. 8 ලූඛනිවාසනිවාසනා BCDF. 9 නොගෑවූවාහු AD. 10 පෙරවියහු-හැම. 11 සම්පත CD. 12 එලකායුධානි CD. 13 මහානතකාරකො-මු. අ. සා. 14 මහන්තකාරකානං-මු. අ. සා. මහන්තකාරණං BCDF. 15 ගැලුණාහු BCDF,

පලිප නම් මහා කදදමයි—[1]මහා සැල්පලි; **පඞ්කලෙඛා**, පිහිරා; **අකිඤ්චනං**, කිසි යමක් [2]නැත්තාවූ; [3]**තිහි මූලෙහි**[4]**පතිට්ඨිතං විය**, තුන් මුලකින් පිහිටි දෙයක් පරිද්දෙන්; **අචලං**, [5]කාමය නම් නිශ්චලවූ භයෙක–මහත්වූ භයෙක යනුයි; **අත්තානුවාදභයං** නම් 'න මෙ ඊදිසං කම්මං පතිරූපං' යන ඇතෙන් තමා තමාට කරන [6]අපවාදයි; **ද්වත්තිංස**[7]**කම්මකාරණ** නම් [8]පඤ්චවිධ බන්ධන ඈ කම්හාවුලි; **අභිජ්ඣාකාය**[9]**ගන්ථෙන**, ලොභ නම් ඇති කාය [10]ග්‍රන්ථයෙන්; නාමකාය හා [11]රූපකාය ගැට ගෙලන අපිත් ලොභය කාය [10]ග්‍රන්ථ නම් වේ. **පකාති ජහාපනෙන**, [12]සාලක්ෂණ ප්‍රකෘතිය දුරුකිරීමෙන්; [13]**ගුණපරිධංසකං**, ගුණ නසන්නාවූ; [14]**ජානං**, දන්නා දන්නා; **ධුරනික්ඛෙපං අකත්වා**, අපවාද නොකියම්යි තබා නොපියා; [15]**චතුකුණ්ඩිකා නිරයො නාම**, සිවුපසින් [16]හැකිළෑ පැසෙන [17]නිරා නම්; **අප්පස්සාදං**, නොසතස්; **ජස්සාදරූපං**, 'ජස්සාදකාරං' යූ සේයි; [18]**ගම්තා**, [19]හිජුවූවාහු; [20]**ගබ්භාකාසනතිමූලකානං**, මවුකුස පිළිසඳ මුල්කොට ඇති; [20]**ගබ්භපරිහාරමූලකානං ච**, ගබ් පරිහරණය මුල්කොටැ ඇතිවූද; [21]ගබ්භ පරිහරණයත් දුක් හෙයින් කියත්. **පළිබුද්ධා හුත්වා**, වළඳනා ලදුවෑ; **පිච්ඡිල**, බෙල සුල්වූ; **මීළ්හ**, අසුචි; **හත්ථං වා**, අනුන් අත හෝ—ප්‍රසවාදිය පිණිස අනුන් දික්කළ අතය යනුයි; [22]**අසම්මිස්සං**, [23]සුව හා නොමුසු.—

## 378. දරීමුඛජාතකං.

---

**සො නාම**, කී තම්ද; [24]**පකතිකාකසමා**, ප්‍රකෘති කාක සමූහයෝ—ගම් කවුඩෝයි; **ඒතෙ ඒතං ඒකාසදිසාය පූජාය පූජනියා භොන්ති** යනු සියලු ඒ පජීතය තමා කරා පැමිණී ගීතොත්කෘෂ්ටාදී මෘහාදීන් නොතෝරා හැම දෙනාමෑ එක පැහැර රත්වත් කරන හෙයින් කියත්. **න** [25]**විභජති**, නොතෝරාද; **හන්දාති වචස්සග්ගත්ථෙ නිපාතො**, 'හන්ද'යි කියා

---

1 සැල්පලි A. 2 නැත්තාහු--හැම 3 තිමූලෙහි ABCDF 4 පතිමණ්ඩිතං BCDF. 5 කාමය නම්වූ නිශ්චලවූ බලවභයස්ස මහත්වූ භයෙක් යනුයි A. 6 අනුවාදයි BCDF. 7 කම්මකාරණං BCDF. 8 පඤ්චවිනිබන්ධන A. 9 ගන්ථනා--හැම. 10 ගන්ථ--හැම. 11 රූපකාය හා A. 12 සාලක්ෂණ BCDF. 13 ගුණපරිධංසං--මු.අ.සා. 14 ජාතං--මු. අ. සා. 15 චතුකුට්ටිකා--මු. අ සා. 16 හැකිළෙන A. 17 නිරය BCDF. 18 ගෙතිතා--මු. අ. සා. 19 හියුජුවාහු--හැම. 20 ගබ්භ ඔකාසකතිමූලකා පරිහරණ මූලකා--මු. අ. සා. 21 ගබ් A. 22 අසුචිමිස්සං--මු. අ. සා. 23 සවභාව හා BCDF. 24 පකතිකාකසමූහා--මු. අ. සා. 25 විජති A. විහනති BCDF.

නියමාර්ථයෙහි [1]ගිවිස්වතාර්ථයෙහි හෝ නිපාතයි; **සඤ්ඤ**, [2]විසෙස් නොකරන බැවින්.

## 379. නෙරුජාතකං.

[3]**ජිඝච්ඡා**, පිරිහී; [4]**නිවෙසෙච්ඡා**, බැඳෑ; **යානි දුජ්ජානානි නාමානි**, යම් නොදත හැක්කාවූ නාම කෙතෙක් ඇත්ද; **කිත්තෙච්ඡා**, කියා; **ඵලනි**, ඵල ගන්නී; **අරොගා[5]නුබොනොති**, නට දේ හෝ නොනට දේ හෝයි; [6]**දසනාමකං කාරෙච්ඡා**, එකෙකි වස්තුවට දස දස නම් [7]බැවින් දසනාමක නම් ශාස්ත්‍රයක් කරවා; **බකස්ස නිසිතනටඨානතො අවිදූරෙ**, බකයා හුන් පර්වතයට නුදුරු තැන්හි; **ඔසපුණ්ණං කතච්ඡා**, වතුරෙන් [8]පිරුණා කොට—දියෙන් [8]පිරුණා කොට; **පබ්බත මත්ථකෙන පෙසෙසි**, ශක්‍රයා තමාගේ ආනුභාවයෙන් පර්වත පාදයෙහිවූ නදිය පර්වත මස්තකයෙන් [9]මෙහෙයී - යන පරිද්දෙන් කෙළේ; **හසිච්ඡා**, බැසැ; [10]**එවං දූරගතා සමානා**, මෙසේ දූරස්ථවූද ඒ බකයාගේ ආශා නොමේ—හුන් තැනට දුරුවූ උදක මත්ස්‍යයන් කෙරෙහි කරන ලද්දාවූ ඒ බකයාගේ ආශාවද පොවා සමෘද්ධවිය. තොපගේ ආශාව කුමක් පිණිස සමෘද්ධ [11]නොවන්නේද; සමෘද්ධ වන්නේ මැයි. එසේ හෙයින් ආශාචෙඡ්දය නොකරව යනුයි. **සෙරෙය්‍යකස්ස මාලා**, රන්වන් කටුකරඬු මල්දමක් සේ—කටුකරඬු මලක් සේ; 'කණ්ටකකුරණ්ඩක' නමුත් 'සුවණ්ණකුරණ්ඩක' නමුත් හේ මැයි. **ජයසුමන**, වදමලි; **අහං**, මම; **පිතරං ආමන්තයාමි**, මා පියාණන් ආපුච්ඡා කොට යම්තාක් වැඳ සමු ගනිම්ද; **මහාරාජ**, මහරජ; **ආගමෙහිති**, ඒ තාක් හැම්මැයි කියා.

## 380. ආසඞ්කජාතකං.

[12]**මුනියානං**, මුනීන්ට විෂයවූ; [13]**නිඛනං**, විනාශයට; [14]**චතුක්කණ්ණකෙදුරොච**, සතර කන් [15]ලියද්දක් මෙන්; **එතෙනා පරං**, මෙසේ පෙනෙන ඔබට; **සස්සති** යනුයෙහි අර්ථයි 'පර්විපබ්බතාදීහි' යනු; **අතනෙනා වස්සසහස්සපරිමාණං ආයුං** යනාදි ගිජුලිහිණියන්ට හවුරුදු දහසකට ආයු ඇති

1 ගිවිශවනානාර්ථයෙහි A. 2 පිසෙසෙස නොකර බැමින් A. විසෙස් කරන බැවින් BCDF. 3 ජඝිච්ඡා-මු. අ. ක. ජිච්ඡා A. 4 නිවාසපෙච්ඡා-මු අ. ක. 5 නුබොති-මු. අ. ක. 6 දසනාම.-හැම. 7 බැගින් CD. 8 පිරුණු කොට A. 9 මෙහෙයයි A. 10 අවිදූරගතා A. 11 නොවන්නෙහිද CD. 12 මු. අ. කථාහි නොපැනේ. 13 බ්‍යස නං-මු. අ. ක. 14 චතුක්කණ්ණංච කෙදුරං-මු. අ. ක. 15 ලියන්දක් BCD.

හෙයින් කියත්. කාළවාත නම් වෙරම්බ වාතයෙන් යට හැසිරෙන වාතයි.

## 381. මිගාලොපජාතකං.

**දාසකම්මකරපොරිසාපි**, දාසයෝද කම්මකර පුරුෂයෝද; **අත්තනො උපට්ඨානෙයෙව**, තමන් හෝනා යහන් ගැබෙහිමැ; **මම[1]මනුස්සානඤ්ඤෙව**, මාගේ සේවකයන්ගේමැ; **යන්තපාසාණො විය**, යන්ත්‍රයෙකින් පෙරළූ පහණක් සෙයින්. ශීඝ්‍රගතිය ගෙනැ කීහු. **උපට්ඨානද්වාරෙ**, යහන් ගබඩා දෙරැ; **ඛාතුකෙසා**, අදහස් හෙයින්; [2]**අනුවජිට්ඨාසනෙ ච**, අනුන් විසින් අනුභව නොකළ යහන්හිද; **යුගගාහං**, සමවැ ධුර ඉසුලුම්; **සාරමහවසෙන**, සැහැල්ලි විසින්; [3]**කොරාපිකලක්ඛණෙන**, 'සාලෙය්‍ය ලක්ඛණෙන' යු සේයි; **සදත්ථං**, තමහට වැඩ; **විත්ථාරෙතබ්බං**, යොජනාදි ක්‍රමයෙන් විස්තර කටයුත්තාහ—අනුත්තාන පදමැ වණ්ණිතා කාරම්හයි යනුයි; **කිච්චං**, වෘද්ධි කෘත්‍යය; **දවෙන**, ක්‍රීඩාවෙන්; [4]**අද්දිතා හුත්වා**, පීඩිතවැ ගෙනැ; **එතෙහි[5]මක්ඛාදීහි**, මේ මක්ඛාදීවූ පාපධර්මයෙන් උපලක්ෂිතවැ—ඔවුන් කරණ කොට ගෙනැ හෝ; [6]**සුවණ්ණස්ස දස්සනෙන**, රන්වන් පැහැ ඇති; **ඩංස**, ඇට ලේ මැස්සෝද; **සිරිංසපෙ ච**, සර්පයන්ද; [7]**පිඞ්ගලමක්ඛිකා චුම්බනති**, [8]පිඟුවන් මැස්සෝ කියනු ලැබෙත්. එතකුදුවුවත් සියලු මැස්සෝමැ සඞ්ගෘහිත යෝයි. **නිවාතවුත්ති** යනුයෙහි අර්ථයි [9]'මතෙනහි අනුද්ධතො නීචවුත්ති' [10]යනු; **පදට්ඨානං**, ප්‍රතිෂ්ඨා වේ; [11]**පතන්තිකා**, හෙරි; **පමුස්සති**, නසාද; [12]**ආමිසසංවිභාගෙන**, ආමිස බෙදුදීම්; **මෙ**, මට; **ඛනතා සිරි**, මනොඥවූ ශ්‍රී තොම; [13]**භාරියට්ඨානෙ ඨිතාති**, බැරි තැන සිටීයයි-ශ්‍රී රක්ෂාකොට ගන්නට මට බැරි යයි ශ්‍රී දුරුකරන පිණිසැ ශ්‍රී වෘද්ධියට කාරණවූ ගුණයන් කෙරෙහි ප්‍රමාද වේද යනුයි; [14]**ඉච්ඡෙනාව**, කැමැත්තේමැ—[15]ශ්‍රියට නොපැමිණමැ ශ්‍රී වුව මැනවැයි [16]පසස්තේමැ; **ලභිත්වා**, ශ්‍රී ලදින් එහි මූර්ජිතවැ; **යො කොචි**, යම් කිසිවෙක්; [17]**අත්තනාව**, තෙමේම තමාට; **සිරිසයනස්සාසං වංසො**,

1 පුරිසානඤ්ඤෙව-මූ. අ. ක. 2 අනුවජිට්ඨාසනාසයනෙ-මූ. අ. ක. අනුවච්ඨාසනෙච-හැම. 3 කොරාවිය-මූ. අ. ක. 4 අද්ධිතා ABF. අඩිතා CD. 5 මක්ඛිතාදීහි-මූ. අ. ක. 6 සුවණ්ණවණ්ණහි-මූ. අ. ක. 7 පිඞ්ගලමක්ඛිකාච BCD. 8 පිඟුවන් මැස්සෝද BCD. 9 යසෙන-මූ. අ. ක. 10 යනුයෙහි නියතිවවුත්තිකා හෙරිපදට්ඨානං A. යනු පතන්තිකාහෙරිපදට්ඨානං CD. 11 භතන්තිකා-මූ. අ. ක. 12 මූ. අ. කථාහි නොපැනේ. 13 යට්ඨානෙ-මූ. අ. ක. 14 ඉච්ඡතො-මූ. අ. ක. 15 තට ශ්‍රී AD. 16 පස්සෙන්මැ-හැම. 17 අත්තනා-මූ. අ. ක.

එසමයෙහි සිටැ ඒ යහනෙහි ප්‍රවෘත්තවූ ව්‍යවහාරය ගෙනැ ඒ ව්‍යවහාරයෙන් අන්‍ය ශයනයන්මද ශ්‍රීශයන යයි කියා එන හෙයින් මේ ශ්‍රී ශයනයන්ගේ වංශයයි.

## 382. සිරිකාලකණ්ණිජාතකං.

**තස්සා ගහණං,** ඇගේ ගැන්මට-ඇ අත්පත් බවට හෝ; **උපලාපෙත්වා,** පොලොඹා—නළවාය යනුයි; **වණ්ණභාසන පුබ්බඞ්ගමාය,** 'ගුණකථනපුරෙචාරිකාය' යු සේයි; **තව කොමාරිකා භරියා භවිස්සාමීති,** [1]තට කන්‍යාදූතයෙන් අඹු වෙමියි. කොමාරිකභාර්‍ය්‍යාවෝ නම් කන්‍යාදූතයෙන් හිඳුවූ අඹුවෝයි; [2]'කුණපඛාදිනී' යනාදී [3]මුළු පදමැ [4]ආමන්ත්‍රණ පදයි. ජඥස් පිණිස දීඝයි. **න විසහි,** [5]නොපොහොසත්වූ; **චාතුරියෙන,** වර්ණසංස්ථාන විලාසභාවයෙහි චාතුර්‍ය්‍යයෙන්—දක්ෂභාවයෙන යු සේයි.

## 383. කුහකජාතකං

**ජාපකෙ ච,** පැටවුන්ද; [6]**උපසන්නො හුත්වා,** සන්හුන්නකු සේ වැ; **මනසා විදුග්ගො,** සිතින් දුදුළුවූ—චපලවූ හෝ-මායා සාඨෙය්‍යාදිවූ කෙලෙස් දුදුළු ඇත්තාවූ යනුයි; **බිලාසයො,** බිලයෙහි හෝනා කෘෂ්ණ සර්පයක්හු මෙන් ප්‍රච්ඡන්නවූ කාය වාක් කර්ම ඇති සත්ව තෙම.

## 384. [7]ධම්මද්ධජජාතකං.

[8]**මිගවධවිතතකො,** මෘග මාරණය මැ ධන කොටැ ඇත් තේ-මුව දඩ කැමැත්තේ-එහි යුක්ත වූයේය යූසේයි; [9]**මිගවං,** මුවදඩ; [10]**අඤ්ජනවනං,** අඳුන් වන නම්වූ—කුඹුක්වන නම් වූය යනුයි කුඹුක් බොහෝ හෙයින් කියත්. **නීහරිත්වා,** ගෙනැ හැරැ; **පරිවාරෙත්වා,** නොයන පරිද්දෙන් සිසාරා වට කොට ගෙනැ; **ගොරූපානි විය වජං,** [11]ගහලට [12]ගෙරින් [13]වද්දන්නාසේ; **නානාළඞ්කාවුධහත්ථා,** නානාප්‍රකාරවූ කඩුපලඟ ආදීවූ ආයුධ ගත් අත් ඇත්තාහු; **බාහුනා බහුං පීළෙත්වා,** අතින් අත බැඳ ගෙනැ; **ද්වාරං ථකෙත්වා,** දොර පියා; **නිවාප,** කන පිණිසැ වපුළ කුද්‍රැසාදි ගොදුරු තණද; **පාන,** බොන

1 තස්සව A. තව CD. 2 කුණපාදිනි-මූ. අ.ක. සකුණෙපබාදිනි A. සකුණොපදිනි BCD. 3 මූළුලු ACDEF. 4 ආමන්ත්‍රණය ABCDE. 5 නොපොසත්හු A. නොපොත්වූ C. 6 උපසන්නූපසන්තො-මූ. අ. ක. 7 ධම්මධජ BCDF. 8 මිගවිතතකො-මූ. අ. ක. 9 මිගවධං-මූ. අ. ක. 10 අඤ්ජනවන--මූ. අ. ක. 11 ගහල A. 12 ගෙරි CD. 13 වද්දනසේ BCD.

පිණිසැ පිළියෙළ [කළ] පැන්ද; **භොජනං**, උද්‍යානයෙහි අවශෙෂ තෘණද; [1]**නිවුත්ථා**, වපුලාවූ; **සංඛාදිත්වා**[2]**සමොධානවෙඨන**, ඇතින් මැතින් [3]ගෙනැ කැටි කළ අටින්; [4]**අවගොනතුං**, තපුරැ කොටැ තොකා හැක්කැ; [5]**අවහුඤ්ජනයි නාම**, තො එසේ [6]වළඳන්නා නම් වේ; **ඛුරප්පං**, හීය; **සනනය්හිත්වා**, දුන් නෙහි හිඳුවං ගෙනැ; [7]**මහාඵාසුකපස්සං**, මහ ඇළය; **ඔදහිස්සාමි**, [8]තවළී හෙවත් තතු කෙරෙමි—විදිනා පරිද්දෙන් තතු කොටැ පැ සිටිමි යනුයි; **මාතරං පස්සෙය්‍යං අපිනාම**, මැණියන් දුටුයෙම් වීම් නම් යෙහෙකි; [9]**කාලිඞ්ගරදණ්ඩම්පි**, [10]දුනු දඬුකඩද පොවා; **අජ්ජවං**, සෘජු බවද; **ඉච්චෙවෙතෙ** යනුයෙහි 'ඉති' යනු නිදශිතාර්ථයෙහි [11]නිපාතය. 'එතෙ' යනු දර්ශිතය පරාමර්ශන කිරීමයි—මේ දක්වන ලද කුශල කර්මය යු සේයි; **තස්ස සන්තිකෙ**,[12]ඔහුට සමීපවූ; **අදෙජ්ඣං තාතවාන**, තනාලා; **ඔබෙධයිං**, [13]පැ තතුකෙළෙම්.

## 385. නන්දියමිගජාතකං.

## පඨමො වග්ගො.

[14]**භුසං විය**, හළු මිටක් සෙයින්; [15]**පිපීලිකානම්පි**, සින් තන්ගේද-කුහුඹුවෝයි; [16]**නිකුජ්ජිතං**, නමා පියන ලදි; **සිත්ථං**, [17]බත්හුළු; [18]**කාටවජ්ජං**, සැන්දයි; [19]**නිබද්ධො**, වෙහෙසන ලද්දේ—'පීළියමානො' යු සේයි; **අජිකං කත්වා**, [20]එළියක් කොටැ; [21]**ගද්‍රභො** යනු ගද්‍රභයාට උපන් අශ්වයහට කියත්; **කරණත්ථෙ**, තෘතීයාර්ථයෙහි; **පච්චන්තානං**, ප්‍රථමායි; [22]**වජිස්සති**, තසයි; [23]**එත්ථ හි වකාරොපි කරණත්ථෙ නිපාතො**, මෙහි වකාරයද කරණාර්ථයෙහි නිපාතයි. සෙසු තන්හි කරණාදිය යම්සේ කරණාර්ථ විද එසේමැ මෙතැන වකාරයත් කරණාර්ථයෙහි

1 නිවුත්‍ථානි-මූ. අ. කා. 2 සමොධානකවෙඨන--මූ. අ. කා. 3 කැටි කළ C. ගෙන හැර කැටි කළ D. 4 මේ පාඨය හා අර්ථය A හි පමණකි. 5 අවභුත්තං භුඤ්ජනි නාම-මූ. අ. කා. 6 වෙලන්නා CD. 7 මහාඵාසුකං BCDF. 8 තබමි A. 9 කාලිඞ්ගරකණ්ඩම්පි-මූ. අ. කා. A. 10 දුනු දඬු කඩ A. දඬුකඩද පොවා BCDF. 11 නිපාතය පරාමර්ශන කොරේ BCDF. 12 ඔහට CD. 13 පැත්තකොරෙ C. පැනතුකොරෙ D. 14 භුසං, හළයි A. 15 කිපිලලිකානම්පි-මූ. අ. කා. 16 නිකකුජ්ජිතං--මූ. අ. කා D. 17 බත්හුළු A. 18 A හි පමණකි. 19 නිබද්ධො, වෙහෙසා ලද්දේ A. සොකම්පිළයමානො යුසේයි CD. 20 එළි කොටැ AD. 21 මූ. අ. කථාහි නොපැනේ. 22 ජහිස්සති-මූ. අ. කා. වජෙස්සති CD. 23 එත්ථ හි වකාරො පිකාරත්ථෙ නිපාතො--මූ. අ. කා. එවකාකාරො කාරණත්ථෙ නිපාතො මෙ භවකාරණයද කාරණාර්ථයෙහි නිපාතයි CD. A හි නොපැනේ.

නිපාතය යනුයි. එහෙයින් ['එත්'] ආදී කියේ. [1]**ඔචිතත්තෙන** යනුයෙහි අර්ථය 'වඩ්ඪිතත්තෙන' යනු—යසසින් වඩනා ලද්දාවූ ආත්ම ඇත්තහු විසින යනුයි; [2]**චෙටකො**, ගෙඩි දෙන කොල්ලන්.

## 386. ඛරපුත්තජාතකං.

[3]**කුම්භසහස්සා**, ගෙය දහසක් ඇති; **ජනපදකල්‍යාණී ලක්ඛණෙහි**, ජනපද කල්‍යාණි ලක්‍ෂණයෙන්. ජනපද කල්‍යාණි ලක්‍ෂණ නම් ඡවි කල්‍යාණය මාංශ කල්‍යාණය අට්ඨිකල්‍යාණය කෙසකල්‍යාණය වයකල්‍යාණය යන මේයි. [4]**සාමන්තගාමෙ**, ආසන්න ගම්හි; **වාසි**, වෑය; **ඵරසු**, පොරොව; **ඵාල**, සීවැල්; [5]**පාචනාදි**, කැහැටය යන මේ ආදි; **අසං**, [6]යකඩක්; [7]**සත සූචිං**, සතවූ—අවජ්දවූ හිදිකටුවක්; **පාසෙ විජ්ඣිත්වා**, හිදිකටු මල විද; **ඔපිලාපෙත්වා**, උපුල්වා; **කොසකං**, කොපු; **නාලිකාය**, [8]හිදිකඳ; **ඔවට්ටිකාය ඨපෙත්වා**, හිත තබා ගෙනැ; **ද්වාරෙ ඨත්වා**, වීපිදෙරු සිට; **කිණ්ණාතුං**, [9]විකිණි ගන්නට; **වණ්ණෙන්තො**, වණීනා කරමින් ගොස්; [10]**පටලස්ස වා**, [11]පටලයක් වේවයි; **තිලකස්ස වා**, [12]පිහිරි නොපැහැරු තුබූ තලකළු වේවයි; [13]**ඔභිනො වා අභාවෙන**, හිරි වේවයි නැති හෙයින්; [14]**අරෙන**, පිහිරින්; [**ධොතත්තා**,] [15]ධොතහෙයින්ද; **පාසාණධොතත්තා**, කුරුඳු සණෑ ලූ හෙයින්ද; [16]**කුරුවින්දක චුණ්ණෙන**, කුරුඳු සුන්නෙන්; **පාසවෙධකෙන**, හිදිකටුමල විදිනා කටුයෙන්—කඩප්පතියයි; **යා**, යම් සූචියක් තොමෝ; **ධාතියමානා**, කිණිහිරිමැද අගින් පහරනු ලබන්නී; [17]**අධිකරණිං අනුපවිසති**, කිණිහිරි විද ගෙනැ වදීද. 'සත' යයි කියාද 'අධිකරණි' යයි කියාද කිණිහිරට නම්. **අල්ලපිණ්ඩමංසෙන**, අලුත් මස් [18]පිඩෙකින්. මොළොක් බව හා සීතල බව ගෙනැ කියත්. **ඔභිආලිඤ්ඤෙත**, පිටත තිසවත්තෙහි; **සඬ්ඛානි**, [19]ය සැත්හු; **විභත්තිවිපල්ලාසො කතො**, 'සූචි'යි කියා ප්‍රථමා විභක්ති වියයුතු තැන 'සූචිං' කියා ද්විතීයා විභක්ති කොටැ

1 ඔචිතත්තෙන, වැඩි ආත්ම ඇත්තවුන් විසින් A. 2 චොරඝාතකො-මූ. අ ක. A හි නොපෑනේ. 3 සහස්සකුම්භො-මූ. අ.ක. සහස්සාඩ්ඪ්වායදහසක් BCDF. 4 සාමන්තගාමෙසු-මූ. අ. ක. සාමාන්‍යගාමො ආසන්නයෙ ගම ඇතෝ A. 5 පාචන, කැවිපිද්ඹු A. 6 යායි A. 7 සතං සූචිං--මූ. අ ක. 8 ජලකනද B. ජලිනකද CD. ජලිකතද F. 9 විකුණන්ට A. 10 එලස්ස-මූ. අ. ක. පටස්ස BCDF. 11 පටල වේවයි A 12 අහිරි BCDF. 13 ඔස්නා, හිරිනැති බැවින්ද A. 14 ඛරෙන-මූ. අ. ක. ආරෙන A. 15 ඛරදෙන නම් කුරුඳුසණෑලූ හෙයින් A. අධොත හෙයින්ද චඤ්ඤුව පසාරෙනයා තතනා කුරුඳු සනමූ හෙයින්ද BCDF. 16 කුරුවිඤ කුරුඳුයි A. 17 අධිකරණී නාම් සණ නම් කිණිහිරටනම් A. 18 පිඩින්; ඔහි ආලිඤ්ඤකෙ A. 19 යගස්තහු--හැම.

විභත්තිවිපල්ලාස කරන ලදී; තස්ස තස්ස සිප්පස්සාචරියා, ඒ ඒ ශිල්ප දන්නා ඇදුරෝ; එවං වා [1]ඤාතාති, මෙසේ මේ ආකාරයෙන් [2]කළැයි කියා හෝ; තයා ච, තී විසින්ද හෙවත් තීගෙන්ද; මං නිමන්තෙන්තියා, මා නිමන්ත්‍රණය කරන්නෝය—පවරන්නෝය යනුයි; කංසථාලං, කස්ලොහො තල්ලක්—ලෝමණ්ඩයක්ය යනු ; [3]නෙව අනන්තං, මේ හිදිකඩයයි කියා අනන්තයක් වේවයි; න කොපිං, මේ හිදිකටුව යයි කියා කෙළවරක් වේවයි; අයං සූචි යි කියා මත්තේ කොපුව හළ බව මුත් ඉතිරි කොපු තව නොහළ හෙයින් මේ කොපු සහිතවූ මැ සූචිය; [4]උද්ධං වා, උඩට බලාමැ උස්වැ වේවයි; අධො වා අනුන්නතා, එක් දිසාවෙකින් දියෙහි ගැලී යට බලා මැ මිටිවැ වේවයි මෙසේ නොවැ සමවැ; [5]අඞ්ගුලියො පොථෙන්තා, අපොළා—විසමයවැ අසුරු ගසාය යු තැනි—

## 387. සූචිජාතකං.

කාචජියං විද්ධසෙසො විය, ශරයෙකින් කුසෙහි විදි සාවකු මෙන්; තදෙව, එම මරණමැ; [6]බාරාණසිගාමවාසිනි, 'බාරාණසීද්වාරගාමවාසිනී' යි තැන්—බරණැස් නුවර දෙරගම වසන්නාවූය යනුයි; යට්ඨියා, කතනර යටසින්; [7]ආකොටෙන්ති, 'හනන්ති'—ඇනැ ඇනැ යනුයි; කිණන්තානං, විකිණී ගන්නවුන්ට; පරිබ්බයං කරොහිති, වියදම් කරවයි; [8]ඨපසිංසු, 'ඨපෙසුං' යු සේයි; එතස්මිං ගච්ඡති, මේ ගසමුල යයි නොහොත් මේ ළැහැබ යයි කිවූ; සන්ධිමිත්තං, සන්හිදෙන් තට හෙවත් තරවැ සිටිනට; පරිබ්භමති, භ්‍රමත්වැ ඇවිදුනේයි; වෙධසි, [9]වෙවුලන්නෙහි; [10]කුණ්ඩකයාගු වා, කුඩු [11]හඹු හෝ; ඛාමකභත්තං වා, දඹුබත් හෝ; නවච්ඡන්දකං, යන් නෙහි අර්ථය 'නවාකාරං' යනු—මෙතෙක් කල් මෙසේවූ ආහාරයක් නුදුන් විරූ හෙයින් අලුත්වූ යනුයි; දානං, ආහාර දනයෙක්; එවං එතෙසං [12]සීතභාවාපි, මොවුන් මෙසේ සිටි බැවින්ද: 'අපි' ශබ්දයෙන් නවච්ඡන්දක භාවාදිය ගතයුතු. එතෙස්ව, මේ අනෙනාග්‍රාමයෙහිමැ; උදහරණතසෙසව, 'කථෙනාතසෙසව' යු සේයි; [13]ගච්ඡං, බොධිසත්වයන් සිටි [14]තැන

1 ඤාතාවිතීති--හැම 2 කරන කියා--හැම. 3 නෙව අං කියා අනන්තයක් වේවයි—හැම. 4 උඩට බලව උස්ව වේවයි-හැම. 5 අඞ්ගුලිං පොථෙසි, අසුරු ගැසූ A. 6 බාරාණසීද්වාරගාම-මු. අ. ක. 7 ආකොටෙන්ති, හනන්ති-හැම. 8 ඨපිං-හැම. 9 වෙවුලයි A. 10 කුණ්ඩකයාගු, කුඩු හඹු A. 11 අඹු D. 12 සීතභාවොපි-මු. අ. ක. 13 ගවෙජ-මු. අ. ක. ගච්ඡන්තං, ගස් ඇතුළ A. 14 තැනට ACDF.

ගස්තාක් නොහොත් ලැහැබිතාක්; **ගච්ඡන්තරං** යනුත් නම් ගස් ඇතුළය යනු අර්ථයි; **ඛග්ගා**, කඩු; **තීණි සුචරිතානි**, කාය සුචරිත වාක්සුචරිත මනොසුචරිත යයි යන තුන් [1]සුචරිතයෝද; [2]**සත්තතිංසබොධිපක්ඛියධම්මා**, 'චත්තාරො සතිපට්ඨානා චත්තාරො සම්මප්පධානා චත්තාරො ඉද්ධිපාදා පඤ්චින්ද්‍රියානි පඤ්චබලානි සත්තබොජ්ඣඞ්ගා අරියො අට්ඨඞ්ගිකො මග්ගො' යන සත්තිස් බොධිපාක්ෂික ධර්මයෝද. එහි සතර සතිපට්ඨාන නම් කාය වෙදනා චිත්ත ධම්ම යන මේ සතර තැන පවත්නාවූ සිහියි. සතර සම්මප්පධාන නම් නූපන් [3]අකුසල් නූපදවා උපන් [3]අකුසල් නසා නූපන් කුසල් උපදවා උපන් කුසල් ස්ථිර කරන වීර්‍ය්‍යයි. [4]සතර ඉද්ධිපාද නම් ඡන්ද චිත්ත විරිය වීමංසා යන මේ සතරයි. පඤ්චින්ද්‍රිය නම් සද්ධින්ද්‍රිය විරියින්ද්‍රිය සතින්ද්‍රිය සමාධින්ද්‍රිය පඤ්ඤින්ද්‍රිය යන මේ පසයි. [5]අස්සද්ධිය කොසජ්ජය මුට්ඨස්සතිය වික්ඛෙපය අඤ්ඤාණය යන මොවුන් නසා [6]ප්‍රධාන බැවින් ඉන්ද්‍රියයෝ නම්හු. පඤ්චබල නම් එම සද්ධාදී පස්දෙන [7]අස්සද්ධාදි එම පස් අකුසලුන් කෙරෙහි [8]කම්පා නොවන හෙයින් බල නම්හු. සත්ත [9]බොජ්ඣඞ්ග නම්—බොධි නම් සතර මඟ නුවණය. එයට අඞ්ගවූ—කාරණවූ සිටිනා හෙයින්—සති ධම්මවිචය විරිය පීති පස්සද්ධි සමාධි උපෙඛා යන මොහු සත්දෙන සත්ත [9]බොජ්ඣඞ්ගයෝ නම්හු. අරියො අට්ඨඞ්ගිකො මග්ගො—සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි යන මේ අරී අට මඟයි.

**ඉමිනා**, 'අකද්දමො' යන මෙයින්; **සෙසධම්මතො**, 'ධම්මො' යි සාමාන්‍යයෙන් කිවද සෙසු යථොක්තවූ ශීලාදි ධර්මයන් කෙරෙන්; **විනිවට්ටෙත්වා**, තොර කොට; **නිබ්බානමෙව දස්සෙති**, 'ධම්මො'යි කියා නිබ්බානයමැ [10]දක්වයි; කුමක් හෙයින්ද යත්? සකල කෙලශයන් නසා සන්තානයෙහිත් පහළ වන හෙයින, සෙසු ධර්මයෝ ශෙෂ වෙත්නුයි ඔවුන්ට වඩා හුදු මේමැ සර්වප්‍රකාරයෙන් කෙලශකාදීම හා අසම්මිශ්‍ර භාවයෙන් [11]අකාදිමත්වයෙන් උත්තමනුයි [12]කියා අකාදීමත්වයෙන් [13]උත්තම බවට ප්‍රමාණ පෑ ලීයි. **යාවතා භික්ඛවෙ** යනාදි

1 සුචරිතයෝයි A. 2 සත්තතිංස බොධිපාක්ෂික ධර්මය නම් A. 3 අකුසලුන් A. 4 සතර ඉද්ධිපාදයෝ නම් වීමංසා යන CD. 5 අස්සද්ධිය-හැම. 6 ප්‍රධානව විසින් CD. 7 කොසජ්ජාදි-හැම. 8 කල්වන හෙයින් CD. 9 බොධ්‍යඞ්ගයෝ CD. 10 දක්වත් CD. 11 අකද්දමත්වයෙන් C. අකද්දමත්වයෙන් D. 12 කියායි CD. 13 උම උත්තම බවට CD.

[1]සඞ්ඛ්‍යාත වාචීයි. ප්‍රත්‍යය සමුත්පන්න [2]ධර්මයන් කියනු. [3]**වට්ටූපච්ඡෙදෙ,** කම්මවට [4]විපාවට කෙලෙස්වට නසන හෙයින් වට්ටූපච්ඡේදකවූ; **උපනිස්සයපච්චයවසෙන** කිර[5]**බොධිසත්තා,** යමෙක් තෙමේ යමක් නිසා උපන්නේ වීනම් ඔහුගේ සම්භවයට හෙතුවූ දෙය උපනිශ්‍රය ප්‍රත්‍යය නම් වෙයි. එහෙයින් නිර්වාණාධිගමයට යම් [6]ප්‍රතිපත්තියෙක් උපනිශ්‍රය ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වේද එසේවූ නිර්වාණගාමී ප්‍රතිපදා සඞ්ඛ්‍යාතවූ [7]උපනිශ්‍රය ප්‍රත්‍යය වශයෙන්වූ [8]ප්‍රතිපත්තියම වෙසෙසින් [9]කියන්නාවූ බොධිසත්වයෝ; **එවං භාසෙසි,** 'ඔගහ රඤ්ඤං අකාලුම්'යි කීහු; **යදිදං මනොපදොසො,** යම් මේ චිත්තයාගේ දුෂ්ටතාවෙක් ඇත්ද; **එකවිධෙන පාපං,** මේ එක් ප්‍රකාරයෙකින් පාපය; **චත්තාරි** [10]**අගතිගමනානි,** ඡන්දාගති දෝෂාගති භයාගති මෝහාගති යන සතර අගති ගමනයයි; [11]**පඤ්චචෙතොඛිල** නම් 'බුද්ධෙ කඞ්ඛති ධම්මෙ කඞ්ඛති සඞ්ඝෙ කඞ්ඛති සික්ඛාය කඞ්ඛති සබ්‍රහ්මචාරීසු ආහතචිත්තො හොති ඛිලජාතො' යන පසයි. **ඡ අගාරවා** යන [12]තන්හි 'සත්ථරි අගාරවො ධම්මෙ අගාරවො සඞ්ඝෙ අගාරවො සික්ඛාය අගාරවො අප්පමාදෙ අගාරවො පටිසන්ථාරෙ අගාරවො' යන මේ ෂට් අගාරව [13]නම් වේ. **සත්ත අසද්ධම්මා** යනුයෙහි 'අස්සද්ධො හොති අහිරිකො හොති [14]අනොත්තාපී හොති අප්පස්සුතො හොති කුසීතො හොති මුට්ඨස්සතිකො හොති අප්පඤ්ඤො හොති' යන මේ සත සත් අසද්ධම්ම නම්. **අට්ඨමිච්ඡත්තා** යන්නෙහි 'මිච්ඡාදිට්ඨි මිච්ඡාසඞ්කප්ප මිච්ඡාවාචා මිච්ඡාකම්මන්ත මිච්ඡාආජීව මිච්ඡාවායාම මිච්ඡාසති මිච්ඡාසමාධි' යන මේ අට අට්ඨමිච්ඡත්ත නම්. **නව ආඝාතවත්ථූ** නම් 'අනත්ථං මෙ අචරි චරති චරිස්සතීති ආඝාතො ජායති පියස්ස මෙ මනාපස්ස අනත්ථං අචරි චරති චරිස්සතීති ආඝාතො ජායති අප්පියස්ස මෙ අමනාපස්ස අත්ථං අචරි චරති චරිස්සතීති ආඝාතො ජායති' යන මේ නවයයි. **දසවිධෙන පාපං** යන්නෙහි දස [15]ප්‍රකාරයෙන්වූ [16]පාප නම් පාණාතිපාත අදත්තාදාන [17]කාමමිච්ඡාචාර මුසාවාද පෙසුඤ්ඤ ඵරුසාවාචා අසම්භින්නප්‍රලාප අභිජ්ඣා ව්‍යාපාද [18]මිච්ඡාදිට්ඨි යන මේ දසයයි. [19]**එක** නම් රාග

1 සංඛ්‍යාතවාචී BCDF. 2 ධර්මයෙන්-හැම. 3 වට්ටූපච්ඡෙදකං ACD. 4 විවට D. 5 බොධිසත්වයො-හැම. 6 ප්‍රවෘත්තියෙක් නොවම් A. ප්‍රතිපත්තිහෙයින් BCDEF. 7 උපනිශ්‍රයසංඛ්‍යාතවූ ප්‍රත්‍යය CD. 8 ප්‍රතිපත්තියට වෙසෙසයි-හැම. 9 කියන්නාට A. 10 අගතිගති ගමනානි A. 11 පඤ්චවෙතොඛිලා CD. 12 තන්හි ෂට් අගාරව නම් BCDF. 13 නම් BCDF. 14 අනොත්තපෙපා A. අනොත්තපපී D. 15 ප්‍රකාරයකින් C. 16 පාපය CD. 17 මිච්ඡාචාර CD. 18 මිථ්‍යාදෘෂ්ටි A. 19 එකක-මූ. අ. ක.

[1]දෙවෂාදියි. **දුක** නම් [2]'පාපිකඤ්ච සීලං [3]පාපිකා ච දිට්ඨි [4]යනාදියි. **තික** නම් 'තීනි දුච්චරිතානි' [4]යනාදියි. [5]**චතුක්ක** නම් 'චත්තාරි අගති ගමනානි' [6]යනාදියි. **පඤ්චක** නම් 'පඤ්ච චෙතොඛිලානි' [6]යනාදියි. **ඡක්ක** නම් 'ඡ විවාදමූලානි' [6]යනාදියි. **සත්තක** නම් 'සත්ත අසද්ධම්මා' යනාදියි. **අට්ඨක** නම් 'අට්ඨ මිච්ඡත්තා' [6]යනාදියි. **නවක** නම් 'නව ආඝාතවත්ථූනි' යනාදියි. **දසක** නම් 'දස අකුසලකම්මපථා' යනාදියි. **චතුපාරිසුද්ධි**[7]**සීල** නම් ප්‍රාතිමොක්ෂ සංවර [8]ශීලය ඉන්ද්‍රිය සංවර[8] ශීලය ආජීව [9]පාරිශුද්ධි [8]ශීලය ප්‍රත්‍යය සන්නිශ්‍රිත [8]ශීලය යන මේ සතරයි. **චතුජ්ජාතිගන්ධ** නම් [10]'කාලාගරු ච තගරං කප්පූරං හරිචන්දනං' යන මේ සතරයි. **මල්ලිකා**, සීනිද්ද; **වස්සිකී**, දෑසමන්; **තගර**, තුවරලා; **යො ච සීලවතං ගන්ධො**, යම් මේ [11]සීලවන්තයන්ගේ සීලගන්ධයෙක්; [12]**සො**, ඒ සීල ගන්ධය; **වාති**, හමයි; **පාණාතිපාතස්ස**, [13]ප්‍රාණඝාතකර්මීයාගේ; **සබ්බලහුසො**, හැමයට ලඝුවූ; **යො විපාකො**, යම් විපාකයෙක් ඇත්ද—නරකාදීවූ සතර අපායෙහි [14]දුක් අනුභව කොටැ අවශිෂ්ටවූ එහෙයින්මැ ඉතාමැ සවල්පවූ ප්‍රාණාතිපාත කර්මීයාගේ යම් විපාකයෙක් ඇද්ද ඒ විපාකය යනුයි; **යාව පාපං න පච්චති**, කරන ලද්දාවූ පාපකර්මීය යම්තාක් විපාක [15]නොදේද ඒ තාක්; **බාලො**, අඥානතෙම; **මධුවා**[16]**මඤ්ඤතී**, 'මධු ඉව මඤ්ඤතීති'—පාපකර්මීය මධුවක් මෙන් සිතන්නේයයි—මීවැත්තක් සේ මධුර කොට සිතන්නේයයි වදාළ හෙයින්; මධුර **සඤ්ඤිනො හුත්වා**, පාපයෙහි මධුර සඤ්ඤා ඇතිවැ; **අමිත්තෙනෙව අත්තනා**, අනෙක දුඃඛාවහ හෙයින් අමිත්‍රයක්හු වැනිවූ [17]තමාගේ ආත්මය හා සමඟමැ; 'දුම්මෙධා බාලා චරන්ති'යි අනුසන්ධාන කරනු. **එත්තකම්පි න ජානන්ති**, 'චරන්ති බාලා දුම්මෙධා' [18]යනාදි වදාළ හෙයින් නොඑක් පාපයට භාජනවැ අනෙක දුඃඛාවහ හෙයින් ආත්මය නම් තෙමේ අමිත්‍රයක්හු වැන්න. එසේ අමිත්‍රයක්හු වැනිවූ [19]තමාගේ ආත්මය හා සමඟ [20]අපායොත්පත්ති වන්නේයයි කියා මෙපමණකුත් බාලයෝ නොදන්නාහුය යනුයි; 'යස්ස' යන්නට 'කම්මස්ස'

1 දෙවෂාදී A. 2 පාපකඤ්ච-මු. අ. ක. 3 පාපිකඤ්ච-හැම. 4 යනාදී A. 5 චතුක්ක යනුයෙහි පටන් දසක අවසන් කොට ඇති පාඨ මු. අ. කථාහි 'තිකාදි' යන ආදි ශබ්දයෙන් සඞ්ගෘහිතයි. 6 යනාදියයි A. 7 සීලය A. 8 සීලය CD. 9 පාරිසුද්ධි CD. 10 කාලාගරු තගර CD. 11 ශීලවන්තයන්ගේ A. 12 මු. අ. කථාහි නො පැනේ. 13 ප්‍රාණඝාතයාගේ A. 14 අනුභව කොට AC. 15 නොලද්දේ CD. 16 මඤ්ඤති-හැම. 17 තමන්ගේ CD. 18 පාපයට භාජනව CD. 19 ආත්මය හා CD. 20 අප පවත්නේයයි A.

යන්නක් අධ්‍යාහාර කොට 'විපාකං' යනු හා සම්බන්ධ කරනු. **අස්සුමුඛො**, කඳුළු මුසු මුහුණු ඇත්තේ; **රොදං**, වලප්නේ—[1]'රොදන්තො' යු සේයි; **න හඤ්ඤෙය්‍ය**, නොමරනු; **න ඝාතයෙ**, නොමරවනු. නොහොත් **න හඤ්ඤෙය්‍ය**, නොපහරනේය; **න ඝාතයෙ**, [2]නොමරවන්නේයි; **ගුණපුණ්ණාය**, [3]ගුණෙන් පූර්ණවූ. [3]පූර්ණමියෙහි නොඑක්දෙනා නොඑක් සුචරිතයෙහි යෙදෙන හෙයින් කියත්. **අඡෙඡ**, [4]යුකති; [5]**නිරෙති**, විචාරා—

## 388. තුණ්ඩිලජාතකං.

---

**ධනපාලගජ්ජිතං**, ධනපාල හස්ති දමනය; [6]**සෙඛපටිසම්භිදප්පත්තො ගුණො**, ශෛක්ෂ පිළිසිඹියා පත්වැ. [7]තුන් මඟ තුන්ඵේලෙහි ලබන පිළිසිඹියා සෙඛ පිළිසිඹියා නම්. **කස්සකා**, කෘෂි කර්මාන්ත කොටැ ජීවත් වන්නාවූ; **කරීසසහස්සමත්තං**, [8]'සහස්සමත්තඛෙත්තං' යු සේයි; **කසිං කාරෙසි**, සෑවී; **සොබ්භං**, ගෙබකට; [9]**උත්තරිසාටකන්තරෙ**, උතුරුසළු [10]අතුරෙහි—හිණය යනුයි; **තීනි මණ්ඩලානි**, ශ්වෙත මණ්ඩල කෘෂ්ණ මණ්ඩල දෘෂ්ටි මණ්ඩල යයි යන [11]ත්‍රිවිධ මණ්ඩලයෝ; **දුශෙද්දාහලෙ**, නොමනා දෙළෙක්; **ඡවං—පෙ - ජානාමි**, තෝ [12]නොපොහොසත්හියි කියා [13]මමත් තා නොපොහොසත් බව දනිම්යි-බලන්නට එක් උපායක් කියම්යි යනුයි; **සොදූර මරියාදං**, ළිංගදිම්යර; **නිලීයනං ච**, හිඳිමද; **නිලීයිත්වා**, හිඳැ; **අලෙනා**, දළින්; **එකස්ස කාරණා**, මේ පුරුෂයා කරණ කොට ගෙනැ; **තාව**, [14]ඒ තාක්—විෂ දුරු කරන තෙක්; **කාකො**, කවුඩු තෙම; **පටිබද්ධමොකා හොහිති**, ඇප වන්නේය—ඇප වැ හිඳිනේය යනුයි; **ආචමාහි**, දුරුකර; **උප්පලමකුලං විය**, උපුල් කැකුළක් මෙන්—

## 389. සුවණ්ණකක්කටකජාතකං.

---

**බිලඩගදුතියං**, ඇඹුල් [15]කාඩිදිය දෙවනු කොට ඇති; **කණාජකමෙව**, [16]තිඹුඩු සාලේ බත්මැ; **ධූපිතවාසිතෙසු**, දුම් කවා සුවඳ කළ; [17]**ථූලගුළහාකසාටකෙ**, දහවලු පොවා

1 රොදන්නේ A රොදන්තො BCDF. 2 නොමරන්නේයි BCDF. 3 පූණ්ණිමියෙහි BCDF. 4 සටත් A. 5 නීරෙසි-මු. අ. ක 6 සෙක්ඛ BCDF. 7 තුන්මඟ තුන්ඵෙලෙ මෙහොහි A. තු.මං.සමයෙහි B. තුන්මඟ මෙහොහි CDF. 8 සහස්සමත්තං යුසේයි A. 9 උත්තර-මු. අ. ක. 10 අතුහි A. 11 ත්‍රිෂ්ණ A. 12 නොපොහොසත්මියි A. නොපොහොසත්හයි C. 13 මමහා A. 14 ඒ තාක්කල් BDF. 15 කාඩි BCDF. 16 තිඹුඩු A. 17 ථූලගුළවාලසාකාටකෙ-මු. අ. ක. ථූලගුලසාකාටකෙ BCDF.

...............; **ඣාඣතරරථෙන**, මහලු රථයෙකින්; **සත්තහි** [1]**රත්තින්දිවෙහි**, සත්රැ සත් [2]දවහලකින්; **බුද්ධුපට්ඨානං න කරොසි** යනු නැතක් ද නො ආ හෙයින් [3]වදළෝ. **ධනලාභො ච**, ධනලාභ කාරණයද; **නනු චරාම** [4]**මහාසෙට්ඨිනි**, [5]මහ සිට තව සිඟන්නමෝ නොවූමෝදැයි නොහොත් මහසිට තව සිඟන්නමෝ වේදැයි; **අහො වත මෙ ජානීති**, මට ඉතා පරිහානියෙක් වූයේ යයි; **පුබ්බෙව දනා සුමනො**, දනයට පූර්වභාගයෙහි මැ සුමන වන්නේය; **යඤ්ඤස්ස**, දනයාගේ; **කනිට්ඨං**, මලනු; **සඞ්ගණ්හිත්වා**, ඇති නැති දැ දී [6]ඔවුන් රක්ෂා කොටැ; **ඔසිලාපෙත්වා**, ගලා; **භාතුජායා**, [7]බෑදෑවූ; **ගිරිසානුදරීසු**, ඝන ශෛල පර්වත ගුහායෙහිද—පාංශුමිශ්‍ර පර්වත ගුහායෙහිද; **පිසළිං**, පුලිල-කලසු එව්.........

## 390. [8]මය්හකජාතකං.

**අද්දක්ඛිංසු**, දත්හු; **තං දිස්වා ආගතපුරිසෙ**, ඒ විද්‍යාධරයා [9]දැක ආ පුරුෂයන්; **සබ්බසෙට්ඨරමෙව**, ප්‍රධාන තෙරුවන්මැ; **පුරක්ඛත්වා**, ඉදිරිකොටැ; **උදවා**, නොහොත්; [10]**යථාවසරසවසෙන**, යථා තත්ව වශයෙන්—[11]යථා ස්වභාව වශයෙන්; **න** [12]**ගණ්හන්ති**, නොකියත්—ඇසියදී නම්හොත් නොකියති යුසේයි; **සීලවරණෙන**, සීල හා අෂ්ට සමාපත්ති සඞ්ඛ්‍යාතවූ වරණයෙන්. [13]වරණ යනු සීලය හා අෂ්ට සමාපත්තියි.........

## 391. ධජවිහෙඨජාතකං.

**උපසිඞ්ඝසි**, [14]හිම්බෙයි; **ගන්ධත්ථෙනො නාම**, අනුන් විසින් නුදුන් දෙය හිඹි හෙයින් 'ගන්ධත්ථේන' නම් වන්නෙහි. ප්‍රව්‍රජිතයන්ට නො සරුප් හෙයින් කියා. **ථෙය්‍යඞ්ගන්ති**, [15]ස්තෙය කොට්ඨාසයෙකැයි—තොපගේ මේ එක් සොරකමෙකැයි කියා; **සංවෙජෙසි**, බැවී; **සායාමි**, [16]ආඝ්‍රාණය කෙරෙමි-හිඹෙමි යනුයි; **යානි චෙව**, නෙලුඹු අලද; **පුණ්ඩරීකානි**, පියුම් කෙමිද; **ආරා ඨත්වා උපසිඞ්ඝන්තං**, දුර සිට හිඹිනනුව; [17]**ධාතිදැසියා**, කිරිමව් මිඹියගේ නොහොත් [18]දරුමිඹියගේ;

1 රත්තින්දිවසෙහි-මු. අ. ක. 2 දවලකින් BC. දවාලකින් DF. 3 විචාළෝ C. 4 සෙට්ඨිනි-මු. අ. ක. 5 'නොහොත්' යනු දක්වා A හි පමණකි. 6 ඔහු BD. 7 බෑදූවා A. 8 මය්හබක A. මයක BCDF. 9 කැදවා ආ A. දැක උදා ආ CD. 10 යථාව-මු.අ.ක. 11 A හි පමණකි. යථා ස්වභාව තත්ව වශයෙන් A. 12 භණන්ති A. 13 සීලා වරණයසි A. 14 හිඹෙයි-හැම. 15 ථෙය්‍ය A. සෙත D. 16 ආඝ්‍රාණ AC. 17 ධාති ධ.තියා BF. 18 දරුමැම්ඹියගේ BE. දරුමැඹියගේ CD.

අබ්බොහාරිකං කරොසි, 'වොහරිතුං අයුත්තං කරොසි' යුසේයි—කුමක් පිණිස කියන්නට [1]නුසුදුසු කෙරෙයිද යනු අර්ථයි; තව [2]හතිඛනා, තොපට බැලයට මෙහෙ කොටැ ජීවත් වන්නාවූ නොහොත් තව[3]හතිභූතා, තොපට බැල මෙහෙ කරන්නාවූ.

## 392. භිසපුප්ඵජාතකං.

**මෙජ්ඣාරඤ්ඤෙ**, සුචිවූ [4]ශ්‍රමණ ධර්මයට යොග්‍යවූ මහ වල්හි; **යොගෙ**, ශ්‍රමණ ධර්මයෙහි; **යොගං**, යෙදීම හෙවත් වීර්‍ය්‍යි; **කායදඩ්ඪිබහුලා**, කය තරකිරීමෙහි තත්පරවැ ශරීර පොෂණයෙහි නියුක්ත වූවාහු; [5]**සාවජ්ජනා**, අස්වන්නේ; **සෙ බ්‍රාහ්මණස්ස** යනාදී ගාථායෙන් යමෙක් තමා සන්තක දෙය සිල්වත් [6]මහණන්ට දී ඉතිරි දෙයක් අනුභව [7]කරන්නාහු [8]වූනම් එසේවූ ජනයෝ විඝාසාදී නම්හ. තෙපි නිකම් ශ්‍රමණ යම්හයි [9]ප්‍රතිඥතවැ ක්‍රීඩාශීලීවැ සිංහව්‍යාඝ්‍රාදීන් කා ඉතිරි මාංසාදිය අනුභව කොටැ හිඳිනා හෙයින් උච්ඡිට්ඨ [10]භොජීහ. එහෙයින් තෙපි යථොක්ත වූ ගිහි ජනයනුත් නොවටනා ශ්‍රමණයම්හයි [11]ප්‍රතිඥතවැ හිඳිනා [12]විඝාසාදීයවයි යනු භාවා.

## 393. විඝාසජාතකං.

***ලුඛං**, නපුරුවූ; ***අරියානං සුඛං**, [13]ආර්‍යයන් සම්බන්ධවූ සුඛය; **ජීවිතවුත්ති**, ජීවිත [14]වෘත්ති තොමෝ; **සමුද්දෙනතුං**, පවත්වන්නට; **සුනිබ්බත්තියා**, සුවයෙන් නිපදවා ගත හැක්කැයි යනුයි.

## 394. වට්ටකජාතකං.

[15]**බරාටකං**, කැබිලිත්තක්; **නහාපිතං**, කරනැවැමියක් හු; **කප්පක** යි කියාත් කරනැවැමියාට [16]මැයි; **කිඤ්චරසි**, කිමෙක; **තෙසාහං අනුසික්ඛාමි**, ඔවුන් අනුව හික්මෙමි—ඒ සුවපතුන් දරුවන් කර මැණික් එල්ලෙත හෙයින් මමත් උන්

1 නොසුදුසු ACF. 2 හතහතා BCDF. 3 හතිභූනි BODF. 4 ශුත A. ශරක BODF. 5 සංවෙජේනතා-මු. අ. ක. 6 මහනාදි CD. මහණදී BF. 7 කරන්නාක්හු CD. 8 වීනම් AC. 9 ප්‍රතිඥාවත්වැ A. 10 භොගීවූ A. භොජීව CD. 11 ප්‍රතිඥාත්වැ A. 12 විඝාසායවයි ABF. හිඳිනා විඝාසායවයයි D. *පුස්කොළ පොත්හි මේ පද හා අර්ථ විපර්යාසව මැරී තිබේ. 13 අරියානං A. අප්පහතත්වූ ආරියයං CD. 14 වුත්ති CD. 15 වරාටකං-මූ. අ. ක. කරාටං CD. 16 නාමැයි D.

සේමැ මා කර මැණික් බැන්දෙමි යනුයි; මා තවං මඤ්ඤදි, තෙපි මා මේ කෙළියට කළැයි නොසිතවු.

395. කාකජාතකං.

---

## දුතියො වග්ගො.

---

### ඡක්කනිපාත වණ්ණනා නිට්ඨිතා.

---

**වාසාගාරං,** වසන ගෙයක්; **විසඞ්ඛතං හොති,** නොනිමියේ වේ; **දියඩ්ඪකුක්කු,** උසින් යෙළ [1]රියනක් පමණ; **සසිංසපා,** සිංසපා සහිතවූ. සිංසපායයි ගෝනැස් [2]විද ලූ පිට දැවත් කියත්මැයැ. මත්තේ [3]කැණිමඬල ගාවා ගෝනැස් මූල් වසා ඒ මත්තේ ගසාලූ [4]පුවරුවටත් කියත් මැයි. **අපේගුතා,** [5]පිට කොවුල් නැති; **දියඩ්ඪරතනා,** යෙළ රියන්; [6]**උච්චතෙත**, උසින්; **මාතුලුඞ්ගං,** [7]ලප්නාරං; [8]'වෙල' යයි කියාද [9]'මෙලල' යයි කියාද ඒටමැ නම්. [10]**තිත්තකං වා කාරොනති,** [11]සැසැ හැරපියමනා පොත්ත සම්ප්‍රකාරයෙන් නොහැරීමෙන් වේවයි හළමනා කට්ටලයේ නොහැර[12]තුනුකොට හැරීමෙන් වේවයි තිත්ත හෝ කරන්නාහ; **අම්බිලං වා,** හළමනා පොත්තමැ හැර නොපියා නොහළමනා මධුර රස ඇති සුඹුළු [13]හැර හුදු [14]හැඹුල් හෝ කරන්නාහ; [15]**පජාපිව,** රජ; [16]**සක්ඛභක්ඛො,** කැති ගත් අත් ඇත්තේ; **බහිතචං තනුකම්පි අනච්ඡනෙතා,** [17]පිටත පොත්ත තුනු කොටත් නොසස්නේ—[18]පිටපොත්ත මඳකුත් නොසස්නේය යනුයි; **තනුකං පන වට්ටං උද්ධරනෙතා,** තිත්ත රස පොත්ත හළමනා කට්ටලයේදී [19]හැර නොපියා තුනු කොට [20]පොතු හරනේද; [21]**අනාපනෙනෙතා,** පොත්ත නොගන්නේ; **උපචිකානං,** වේයන්; **වම්මිකවඩ්ඪනනියාමෙන,** තුඹස් බඳනා ක්‍රමයෙන් හෙවත් වේයන් නැහෙන තුඹස් සේ; [22]**මධුකරානං,** බමරුන්; **අජ්ජව** නම් ඍජු බවයි; **මද්දව** නම් මෘදු බවයි; **තප** නම් වීයසීයි නො◌ෙ◌ාත්

---

1 සියයක් C. 2 වදවුව්වට දවත් A. විදළුපිටිදූවත් CD. 3 කැණිමඬලය A. 4 පුවරුවවත් AC. 5 පිටකොටුම් A. පිටිකොවුල් BF. 6 උච්චතනතෙන-හැම. 7 ලප්නාරන් A. 8 මෙලෙ CD. 9 වෙලල BCDF. 10 තිත්තකං-මු. අ. ක 11 සැසහැර පිටමද් පොත්ත CD. සැසහැණි මදපොත්ත BEF. 12 තුනී A. 13 හැර හැත හුදු A. පා හැරහුදු CD. 14 ඇඹුල් BCDF. 15 පජාපිවා-මු. අ. ක. 16 සත්ථහත්ථො-මු. අ. ක. 17 පිට D. 18 කටපොත්ත A. පොත්ත CD. 19 රහැ C, 20 පොත්ත CD. 21 අනපනීතතතා--මු. අ. කා. 22 මධුකරා-හැම.

පක්ඛව ශිලාදියයි; වෙවචන නම් [1]පර්‍යායයි; [2]අග්ගිනිකාසිනා, වහ්නිස්කන්ධයක් සේ දිලියෙන්නාවූ; හුම්මගෙහ, සපනාමශ්‍රී යෙහි; කිං කාරණා, යථොක්ත [3]ගුණාඞ්ගසඞ්ගත රජහු කෙරෙහි කාම්කෙලශය [4]නොඑලෙන්නට කාරණ කිම්ද යත්; තාදිසො, එබඳුවූ රජතෙම—යථොක්තවූ [5]ගුණාඞ්ගයෙන් යුක්තවූ රජය යනුයි; පොක්ඛරණ්‍යෙ ජාතපදුමං යථා, [6]පුෂ්කරිණියෙහි සඤ්ජාතවූ පද්මය [7]උදකකර්දමාදින් යම්සේ අනුපලිප්තද එපරිද්දෙන්මැ [8]කාම්කෙලශයන් විසින් අනුපලිප්ත වන්නේය. එහි-ඔහු කෙරෙහි-කාම්කෙලශයෝ [9]නො ඇලෙත්.

## 396. කුක්කුජාතකං.

ගණ්හි, වැස්වී; [10]රාජභොගා, රාජවාහනයහ; නගොපි, ඒ ඇතුළු නුවර පොකුණෙනුදු; අට්ඨකං, මැස්සක්; [11]ගරු භාරභාය, බර ගත් බැවින්; ඔලිනවෙගං, මඳවූ වෙග ඇතියහු; නාරාචෙන, ශරයෙන්; නිකතමතී, නැමේද හෙවත් නැම්ණිද—[12]තහන ලද ද; නොතැගූ දුන්නෙහි ජ්‍යා ශබ්ද නැති බව ගෙනැ කියත්. [13]හඤ්ඤති, තසත ලදී—[14]තට්ටැයි යනුයි; [15]සරවරවෙගනිබ්බූතං, උතුම් හීයෙන් විදුනා ලදුව මළාවූ.

## 397. මනොජජාතකං.

මිගඹිතකසො, මූව දඩ කැමැත්තෝ; සො ඉමං නාම ජිගොකි, ඒ මෙනම් දෙයක් [16]දන්නා ලබන්නේ යයි හෙවත් [17]මෙනම් දෙයක් දියයුතු වන්නේ යයි; ධුවමග්ගට්ඨානෙ, එකාවතු පලන කඩ නොහොත් මුවන් එකාවතු යන එන කඩ; උට්ඨාපිතෙසු, නඟන ලද මුවන් කෙරෙන්; [18]එනිමිගො, එළ මුවෙක්; ඛති, පමා [19]කොටලා යන පිණිස එතැනමැ වැටී හිති; අපහසිංසු, [20]සිපිහුයි; වගෙ, න්‍යග්‍රොධ වෘක්ෂයෙක්හි; කිං අජ්ජෙව ඛාදිස්සසි, කිමෙක්ද තෝ මා ගෙනැ අදමැ කයිද. නොහොත් නිබද්ධං ඛාදිස්සසිති, අද මා හැරැපියා මා නට බිලී තබා දුන් කල [21]ඒ නිරන්තරයෙන් කයිදැයි; අසුකිලින්න

1 පර්යායයි BCD. 2 අග්ගිකාසිනා-හැම. 3 ගුණගණාඞ්ග A. 4 නොඑයන් නට C. 5 ගුණගණාඞ්ගයෙන් BCDF. 6 පුෂ්කරණීයි BCDF. 7 උදකකර්දමලාදීන් A. 8 කාම්කෙලශයෝ නොඇලෙත්නේ A. 9 නොඇලෙත්නෙත් BCDF. 10 රාජඛගා BCDF. 11 ගුරු BCDF. 12 ලද නොතැගූ CD. 13 හඤ්ඤතෙ-මූ. අ. ක. 14 මිතට්ටැයි A. 15 සරවරවේගනිබ්බුතං-මූ. අ. ක. 16 ලබන්නේ යයි A. දන්නාලද දෙයක් දන්නා ලබන්නේ CD. 17 මේ නම් දිය CD. 18 එණිමිගො-මූ. අ. ක, 19 නොකොටලා BCDF. 20 සිපුයි BCDF. 21 එයි A.

**මුඛං**, කඳුලෙන් තෙත්වූ මුහුණ; **අඤ්ඤෙසු—පෙ—එති**, සෙසු දවස් සෙසු පුරුෂයන් එන සැටියේ නොවෙයි අද එන්නේය; **අසිතුණ්ඩන—පෙ—ඛාදිතබ්බා**, ඇතුළු රුක් සෙවණ [1]නොව දනා පිණිස කඩු මුණයෙහි බත්තලිය තබාගෙන කඩු මුණයෙන් බත් තලිය දික්කොට ගෙන ඇතුළු රුක් සෙවණට [2]කොට ගෙන; **අප්පකෙන කාරණෙන**, ඉදින් තෝ [3]මා මැරුයෙහි වී නම් යේ මාගේ ප්‍රාණ විනාශ සඞ්ඛ්‍යාත සවල්ප කාරණයෙන්; **මහන්තං අත්ථං**, තට වන්නාවූ මහත් වැඩ—තට නිරන්තරයෙන් දෙන්නාවූ මේ බලි; [4]**අයං ලද්ධගමනං**, මේ නිරන්තරයෙන් [5]ලද්දාවූ ගමන් ඇත්තේයි හෙවත් නිරන්තරයෙන් තට එන්නේයි; **අහං හි තව සන්තකෙ ඨානෙ** යනාදි රුක්සෙවණ සිටියත් තමන්ට උපද්‍රවයක් නොකොට ගතහැකි බව ගෙන කියත්. **සජ්ජො හුත්වා**, සැරහී ගෙන; **නගරද්වාරෙ**, නුවර දොරට වදනා [6]තැනැ.

## 398. [7]සුතනුජාතකං.

---

**ගිජ්ඣගුහාය**, [8]ගිජ්ඣ පබ්බත ගුහායෙහි නොහොත් ගිජු ලිහිණියන් වසන ගුහායෙහි; **අනියාමෙත්වා**, අසෝ ගිජුහු බැදෙන පිණිස යයි මෙසේ නියම නොකොට; **කා නු**, තව රෙක් [9]**නම්ද**—[10]කුමන නම් හැඬීමෙක්ද යනුයි; **යොජනසතං අතික්කම්ම** යනාදි කුණප සොයා ඇවිදිනා කල දෙතුන් සියයක් යොදුන් කට්ටලයෙහි තුබූ කුණපයෙක් වීනම් එක් දෙසියයක් යොදුන් ගෙවා ගෙන ගිය කල යොදුන් සියයක් [11]කට්ටලයේදී දක්නා බව ගෙන කීහු; **ආසජ්ජාපි**, [12]පැමිණද; **සන්තිකං ආගන්ත්වාපි න ජානාසීති**, යොදුන් සියයක් ඉක්මැ තුබූ කුණප දක්නට සමර්ථවූ තෙපි තොප බැදෙන පිණිස අටවන ලද දැල් හා මල හා සමීපයට අවුදිනුත් එමෙ දැල්මල කුමක් පිණිස නොදක්නාදැයි—කුමක් පිණිස නුදුටුවාදැයි විචාලේ.

## 399. ගිජ්ඣජාතකං.

---

**අරියවංසපටිපදං**, 'චත්තාරොමෙ භික්ඛවෙ අරියවංසා. කතමෙ චත්තාරො? ඉධ භික්ඛවෙ භික්ඛු සන්තුට්ඨො හොති

1 නොවන A. 2 ගෙන A. 3 තෝ මැරුයෙහි A. 4 ලද්ධාගතානි ලද්ධ අයං ලද්ධාගමනං-මු. අ. ක. 5 දෙන ලද්දාවූ A. 6 තෙනායි A. 7 සුතනො-හැම. 8 ගිජ්ඣකූට ගුහායෙහි C, 9 නම් A. 10 කුන්නම් නැසීමෙක්ද BODF. 11 කට්ටලයේද CD. 12 පැමිණෙද-හැම.

ඉතරීතරෙන චීවරෙන ඉතරීතරෙන පිණ්ඩපාතෙන ඉතරීතරෙන [1]සෙනාසනෙන භාවනාරාමො හොති භාවනාරතො පහානාරාමො හොති පහානරතො' යන මේ ආයඪිවංශ ප්‍රතිපත්තියි; පාදෙ වලලියා පළිබුඡෙඩා, පය වැල [2]බැඳ පැකිල්ලේ; අද්ධා යනාදි ඒ විහාරයෙන් ලැබිය යුතු වස්තුවට මේ ලතායෙන් පාදසඬ්ඛලනය පූර්වනිමිත්ත යයි ගෙනැ කියා. න පටිපදාය අනුමජ්ඣිමං කතං, ආයඪිවංශ පිළිවෙතට සුදුස්සක් නොකරන ලද; පතිරූපෙ, සුදුසු පිළිවෙත්හි; [3]පළිබුඡ්ඣිත්වා, පැකිලැ—[4]රොහිත මත්ස්‍යයා ප්‍රතිලාභයට [5]ඉෂ්ට නිමිත්තයක් ලදිම්යි සිතා ගෙනැ; අනුතීරමෙව, හෝතෙර හොස්සේමැ; දෙව උද්දා, [6]මස්වාගෙෝ දෙදෙනෙක්; පරිකඩ්ඪෙනො, නගුට [7]ගත්[8]මස්වායා [9]ලා හයා ගෙනමැ; සො, ඒ මත්ස්‍යයා විසින් දියට හැද ගෙනැ යන මත්ස්‍යයාගේ නගුට ගත් [10]මස්වායා තෙමේ; මහාමච්ඡො, මත්ස්‍යයා [11]ඉතාමැ මහති; ඉතරෙන සද්ධිං, [12]ගොඩ සිටි මස්වායා හා සමඟ; අනුතීරචාරි, [13]අනුතීරචාරිය; න සංහිරාමි, අදනා නොලැබෙම්ද; අනුධාවාති, ගොඩට බලා [14]අදුයි කී; විවාදෙ[15]වූපසම්මතං, තොප විසින් අපගේ මේ විවාදය සන්හිඳේවා; දබ්භපුප්ඵසමාන වණ්ණතාය, වැලුක් මල් හා සමාන හෙයින්—වැලුක්මල් පැහැ වැනිවූ සිරුරු පැහැ ඇති [16]හෙයින්මැ; තං ආලපති, [17]'දබ්භපුප්ඵ'යි කියා ඒ ශෘගාලයා ආමන්ත්‍රණය කෙළේ; [18]අලලං, අලුත්වූ; අධිගමූපායං, ලද උපාය; මායාවි යි කියා [19]කැණහිලීට ආමන්ත්‍රණයයි.

## 400. [20]දබ්භපුප්ඵජාතකං.

---

වෙතසිකරොගෙන, සිතිවිලි රොගයෙන්; පුරොහිතපුත්තො, [21]පුරොහිතයාගේ පුතා; [22]නාවාය භන්නමගො විය, දියෙහි නැව් ගිය මඟක් මෙන්; කුචයිනො ලොහිතං නික්ඛමි යනු [23]රක්තාතීසාර ගෙනැ කියන්; තිකිච්ඡිස්සාමිති, පිළියම් කෙරෙම්යි; [24]සමජ්ජ නම් කෙළියි. අථස්ස තං, ඉක්බිති තෝ ඔහට; [25]තථාරූපිං වාචං, [26]නො දෙනොත් නොදෙම්යි

---

1 'සෙනාසනෙන' යන්න ලඟට ඉතරීතරෙන ගිලානපච්චය භෙසජ්ජ පරික්ඛාරෙන' යන පාඨය හැම පොත්වලම පැනේ. 2 පැකිල්ලේ A. 3 පළිබුජ්ඣිත්වා-මු. අ. ක 4 රේමත්ස්‍යයා CD. 5 ඉෂ්ටනිමිත්තයට D 6 මසවාහයෝ A. මසහායෝ CD 7 ගත-හැම. 8 මසවායා BCDF. 9 හයා C. 10 මසවායා BCDF. මත්ස්‍යයා මේ තෙමේ CD. 11 ඉතා CD. 12 හෝ සිටි A. 13 අනුගීරචාරියා-හැම. 14 අදයි A. 15 උපසම්මතු-මු. අ. ක. 16 හෙයින් CD. 17 දබ්බපුපඵ-හැම. 18 මු අ. කථායි නොපැනේ. 19 කැණහිලාට BCDF. 20 දබ්බපුප්ඵ CD. 21 පුරොහිතපුත්‍රයාගේ BCDF. 22 නාවා BCDF. 23 රක්ත අතීසාර A. 24 A හි නොපැනේ. සමජ්ජ නම් කෙළේයි-හැම. 25 තථාරූපං-මු. අ ක. 26 නොදෙතුත් BCDF.

කියන එබඳු වචනය නිසා; **න ඛාදනති**, එබඳුවූ [1]බසමැ නා ජීවත් නොවන්නාහ. 'සම්පන්නං ච [2]තං පායිතං චාති [3]සම්පන්නපායිතං'. **සම්පන්නං**, 'සුන්දරං—[4]නිප්පන්නනති අත්‍ථො' 'පාතං සීලමෙතස්සාති පායී'. තස්ස පාතනති ආසඞ්කාය පරස්ස ලොහිතනාති සාමත්‍ථියතො ලබ්භති'යි අර්‍ථ ගන්නේ. එමැ කියති අටුවායෙහි 'සම්පන්නං [5]පරලොහිතපායිතං'යි. **අතිදුක්කරං [6]වචනං කතනති**, මා විසින් [7]නොකොට ගත හැකි වචනයෙක් කරන ලදැයි—දෙමියි කියන්නාවූ මා විසින් කියන්නට නොපිළිවන් [8]බසෙකැ [9]කියේ. [10]යහපත මා කළ දැයයි ප්‍රසාද උපයා. **තදත්‍ථජොතකො ගන්‍ථො**, ඒ ප්‍රශනාර්‍ථය ප්‍රකාශ කරන්නට තිසි ශාස්ත්‍රයෙහි. මෙයින් ප්‍රශන ව්‍යාකරණය ශාස්ත්‍රයෙහි පරිචය [11]ඇතිව මුත් නො පිළිවන්නේයයි බොහෝ ශාස්ත්‍රයෙහි පරිචය ඇති බව ගෙනැ කියත්. **තස්මිං ලොභං අවාකරෙය්‍ය**—[12]**ජහෙය්‍ය**, එහි [13]ලොභය දුරු නොරේද—[14]යමක් [15]දෙමියි [16]කීයේ වී නම් එහි ලොභ නොකොට කී පරිද්දෙන් දේද යනුයි; **දුස්සන්ධාපියා**, පිරිසුදු [17]කොට දුහැම්තිය හැකි—පිරිසුදු කොට නොධැරිය හැක්කැයි [18]යනුයි; **ආදුච්ඡපං**, පරමදුනු; **යං කුමාරා විහඤ්ඤරෙ**, 'යෙන කාරණෙන කුමාරා විහඤ්ඤරෙ' යු සේයි; **සනන්තව[ධම්මං]**, හුදී කුසල්ධම්; **කුච්ඡි**, කුක්ෂිරොග හෙවත් ශොභයෙන් ඇතිවූ රක්තාතිසාරය; **පක්ඛන්දිකා**, සිටගති

## 401. දසණ්ණකජාතකං.

---

**සරභපල්ලඞ්ක**, සරභ මූවන් හිඳුවා කළ [19]පලග්; **සමනතීගි**, හෝ [20]ගගින්; **උපාදගෙනන**, දරින්; **ඣායී**, ධ්‍යානලාභී තෙමේ; [21]**ඣානවිහාරසමාපත්තියා**, [22]ධ්‍යාන විහාර සමාපත්තීන්; **සෙඛො**, සොවාන් ආදී; **අපචයෙන**, වට විහිදීමෙන් හෙවත් කෙලශ ප්‍රහාණියෙන් නොහොත් නිර්‍වාණයෙන්; [23]**ධූතගුණෙන**, අපිස් ගුණෙන්; **විරියාරම්භෙන**, වීර්‍ය වැඩීමෙන්—වීර්‍යයෙන්; **සාකච්ඡාය**, ඔවුනොවුන් හා ධර්‍මකථා කිරීමෙන්; **විසාරදො**, භය නැත්තේ; **විසත්‍ථො**, නිසැකවැ—

---

1 බස BCDF. 2 බො තං BCDF. 3 සම්පන්නපායිං-හැම. 4 නිප්පන්නනති CD. 5 පරලොහිතපාතපායිතැයි A. පරලොහිතපායතැයි CD. 6 වත ෑමෙ-මු. අ. ක. 7 නොකාටහැකි D. 8 වතසේකැ A. 9 මා කියේ-හැම. 10 යහපතැයි A. 11 ඇති බව යෙන කියත් A. 12 ජිහෙය්‍ය-මු. අ. ක. 13 ලොභ A. 14 යමෙක් CD. 15 දෙමෙයි A 16 කීයේ නම් CD. 17 කොළු හැම නියරැකි CD. 18 කියනුයි A. කීයනුයි CD. 19 පලක් CD. 20 හගින් CDF. 21 විහාරසමාපත්තියා-මු. අ. ක. 22 ඣාන BCDF.:23 ධූතඞ්ගගුණෙන-මු. අ. ක.

බුහුටිවැ; [1]**බද්ධසත්තුඅබද්ධසත්තූනං**, බද හත් නොබද හත්; බද හත් නම් [2]හත්වටයි. නොබද හත් නම් [3]හත්සුනුයි. **රුක්ඛසුසිරෙ**, ගස් සිදුරෙහි; **තොරණං ආභුජිත්වා**, දරණ ලා; [4]**පක්ඛපප්ඵොටෙනි**, උම්මාපුප්ඵ කණිකාරපුප්ඵ බන්ධුජීවකපුප්ඵ ඔසධිතාරකා [5]අඞ්ගුරිට්ඨක යයි යථාක්‍රමයෙන් කියන ලද නීල පීත ලොහිත ඔදාත කාළ වර්ණ ගෙනැ කීහු. උම්මාපුප්ඵ නම් දිය [6]මෙරලිය මලි; [7]අඞ්ගුරිට්ඨක නම් පෙණල මලි. බන්ධුජීවක නම් බදුවදයි. **කාමයස්ස**, 'අස්ස සොකං' යු සේයි; [8]**ඝට්ටිතින්ද්‍රියොසි**, ශොකයෙන් සැපුණාවූ—පහරන ලද්දාවූ ඉදුරන් ඇත්තේයි; **වෙදෙයෙනා**, වොදනා කරන්නේ හෙවත් ශොක කාරණ විචාරන්නේ; **සත්තසඞ්ඛාරෙසු**, සත්ව සංස්කාරයන් කෙරෙහි—සජීව අජීව වස්තූන් කෙරෙහිය යනුයි; **උබ්බඣිත්වාපි**, කර වැල් ලා ඇද ගෙනැ ද මියන්නාහ; **ඉමිනා සප්පෙන**, මොහු සපියක්හු වුව මැනවැයි; **කණ්හසප්පෙන**, මොහු යළිත් කෘෂ්ණ සපියක්හු වුව මැනැවැයි [9]හෙවත් නයකු වුව මැනව; **උපායකොසල්ලඤාණෙනෙව**, උපාය විෂයෙහි—ඒ ඒ කාරණ විෂයෙහි—දක්ෂවූ ඥානයෙන්මැ; **පච්චවෙක්ඛාති**, වනැයි; **මඤ්ඤාමි**, 'එතමත්ථං මඤ්ඤාමි'—මේ අර්ථය හෙවත් මේ කාරණය සිතමි; [10]**කඞ්ඛාමෙව**, කාඞ්ක්ෂාව මැ. කාංක්‍ෂා නැවැත නැවැත උපදනා හෙයින් විචිකිච්ඡා නම් වෙයි. එහෙයින් එසේ වූ **පුනප්පුන උප්පජ්ජමානානි විචිකිච්ඡිතානි ච**, නැවැත නැවැත උපදනා විචිකිච්ඡාවෝද; [11]**හනතං පමුඤ්ච**, පසුම්බිය මුදයි කිවු; [12]**සංවිග්ගරූපො**, භයින් කලකිරුණාවූ ස්වරූප ඇත්තේ; **මුඛබන්ධනං කත්වා**, තො කැහැකි පරිද්දෙන් මන්ත්‍රෞෂධාදීන් මුඛබන්ධනය කොට; **එතෙන**, මේ රජහු විසින්; **විවත්තච්ඡදනො**, 'විවත්තං—පරිවත්තිතං-කිලෙසමයං ඡදනං යස්ස සො විවත්තච්ඡදනො'යි [13]දන්නේ; **විවත්ත**, පරිවර්තනය කරන ලද නොහොත් නසාපියන ලද; **විවට**, ඥාන නැමැති චක්ෂුසට ප්‍රකාශවැ පෙනෙන; **බලවන්ති**, බල වත් දැයි විචාළේ; **ජාරස්ස**, වෛර ස්වාමියාහට; [14]'තුය්හම්පි අත්ථි' යනුයෙහි '[15]කුලූපක බ්‍රාහ්මණා' යනු යොදනු.

## 402. [16]සත්තුභත්තජාතකං.

---

1 බද්ධසත්තූනං-මු. අ. ක. 2 අහත්වටයි A. 3 සුනුයි BCDF. 4 'පක්ඛපප්ඵොටෙනි' යන පදයට පරව 219 වැනි පිටේ 12 වැනි පෙළේ 'ඉති බැවින්' යනු පටන් 19 වැනි පෙළේ 'ගමන වාරයෙක්ද' යනු දක්වා පාඨය BCD පොත්වල වැටී තිබේ. 5 අවඩාරිකබන්ධු ABDE. අඞාරිටඨකබන්ධු BF. 6 බෙරලිය CD. 7 අඞාරිටඨක BF. 8 කුපිතින්ද්‍රියොසිනි-මු. අ. ක. 9 A හි නොපැනේ. 10 කංඛං මේ කාඞ්ක්ෂාව A. සඞ්ඛමෙව කාංක්‍ෂාවද BCDF. 11 භසතං A. මු. අ. ක. 12 සංවිගෙගා-මු. අ. ක. 13 දක්නේය BCDF. 14 A හි නොපැනේ. තුය්හම්පි අත්ථි BCD. තුශහම්පි අත්ථි F. 15 කුලූපකබ්‍රාහ්මණයා A. 16 සත්තුභත්ත-මු. අ. ක.

කුම්භකාරසික්ඛාපද නම් සෙතපුන් තහන්නට පැනවූ ශික්ෂායි. [1]චාරවිහාරෙ, චයසිං විහාරයෙහි නොහොත් ඊයසිං පඨ විහාරයෙහි; අසජ්ජමානො, [2]නොඇලෙන්නේ—ලොභ වශයෙන් සබලතයක් නැත්තේ; වනිබ්බකා, වනීපකයෝ; ගුණ කියා ඉල්වන්නෝ වනීපක නම් වෙත්. මිත්තාමච්චාදිනම්පි, මිත්‍රයන්ටද ඇමැතියන්ටද; [3]විදෙද්දසො '[4]හවෙශ්‍යමෙව, සතුරු [5]වෙම්මැයැ; විදෙද්දසනා, ද්‍රොෂ; අධිගමෙති, අධිගම කරවා—පුණ්‍යකොට්ඨාසයට පමුණුවයි යනුයි; න දිස්සතති යනුයෙහි අර්ථය [6]'න කුජ්ඣනති' යනු. [7]'ද්විෂ—අප්‍රීතෞ' යන ධාතුයි; අඤ්ඤදත්ථු, එකාන්තයෙන්; [8]වරමනනං යනුයෙහි අර්ථය 'තං මං [9]වරෙහි' යනු. [10]ආචිණ්ණා, පියචි—සවභාවය යනුයි; කායඞ්ගං වාචඞ්ගං, කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති ප්‍ර සේයි; භික්ඛාය තිට්ඨනා, භික්ෂාතව්‍ය වස්තුව නිසා භික්ෂාචාර [11]වෘත්තියෙන් සිටීම්; ගුහනං, ගෙරි; අකිඤ්චනො, කිසි පළිබොධයක් නැත්තාවූ—

## 403. අට්ඨිසෙනජාතකං.

විතිකොට්ඨිකාය දූසියා, වී පරන ම්ඞියගේ; ආතපෙ පසාරිත, [12]හවුයෙහි වැනූ; ඔමුකොකන, ගිතිපෙතහෙල් ලෙන්; ආදිත්තසරීරො, ගින්නෙන් දිලියෙන සිරුරු ඇත්තේ; [13]වණ්ණිතා, ව්‍රණව ගියාහු; මක්කටවසා, වඳුරු තෙල්; දිසො හොති, සතුරු වේ; වෙතසො, සේවටු; එතානි සීලාදීනි විශ, තමා කෙරෙහි පිහිටි ශීලාදීන් දුටුවාසේ තමාගේ සන්තානයෙහි පිහිටි ශීලාදීවූ ධර්මයන් මේ ශීලාදී ධර්මයෝ මාගේ සන්තානයෙහි පිහිටියෝ යයි [දුටුවාසේ] යනුයි; පතිට්ඨිතො අනුබොමහි, අඛණ්ඩාදි භාවයට [14]පැමිණිවිමට සමර්ථවීම් වශයෙන් මමත් ඒ ශීලාදි ධර්මයෙහි පිහිටියෙම් දෙහොයි; පතිට්ඨිතභාවං, අඛණ්ඩාදි භාවයට [15]පැමිණිවීමට සමර්ථවීම් වශයෙන් තමාද ඒ ගුණධර්මයෙහි පිහිටාගත් බව; [16]පරිසුපට්ඨාපකෙනාපි, පිරිස් වටන්නහු විසින්ද. 'පරිසං උපට්ඨාපෙතීති [17]පරිසුපට්ඨාපකො' යනු වේ—

## 404. කපිජාතකං.

---

1 ආචාර විහාරෙ-මූ. අ. ක. 2 ඇලෙන්නේ-හැම. 3 විදෙද්‍ධසො-හැම. 4 හවෙශ්‍ය-මූ. අ. ක. 5 නොවෙම්මැයැ-හැම. 6 කුජ්ඣනති-හැම. 7 විෂපීතෞ A. දිස ආප්‍රීතෞ B. දිය අප්‍රියතො CD. දිෂ අප්‍රීතෞ F. 8 වරත•-මූ. අ. ක. වරමනතා-හැම. 9 වරෙහි BCDF. 10 ආචිණ්ණ• වියචි-හැම. 11 වෘත්‍රතාත යය A. වෘත්තියෙයි D. 12 අව්යෙහි A. 13 ගණ්ඨිකා-මූ. අ. ක. 14 පැමිණීමට C. 15 පැමිණවීමට 16 පරිසුපට්ඨාකෙනාපි BCDF. 17 පරිසුපට්ඨාකො BCDF.

**ඉදං**, මේ ආත්මය; **නිච්චං**, නිත්‍යයැ; **ධුවං**, ඒකාන්තයැ; **සස්සතං**, ස්ථිරයැ; **අචවනධම්මං**, නොමියන සුලුයි; **නිස්සරණං**, නිවන්; 'නිස්සරති එතෙනාති නිස්සරණං'යි ගන්නේයි. **හෙට්ඨුපපත්තිකො**, ධ්‍යාන භාවනා කොට නිකාන්ති වශයෙන් [1]උඩ බඹලොවින් යට බඹලොව දක්වා උපන් ඇතියේයි. හෙට්ඨුපපත්තියමැ විභාවනා කටැට්වැ කියති 'පුබ්බෙ ඣානං භාවෙත්වා' ආ. [2]**සුභකිණ්ණෙසු** යනු [3]වෙහප්ඵලයෙහි සිටැ තතියජ්ඣාන උකටකොට හවා තතියජ්ඣාන් තෙලෙහි නිපත් ගෙනැ කියත්. **ආභස්සරෙසු** යනු සුභකිණ්ණ තෙලෙහි සිටැ දුතියජ්ඣාන් උකට කොට හවා [4]අප්පමාණසුභ [5]පරිත්තසුභ නම් ඇති [6]තතියජ්ඣාන් තල [7]දෙක් පියා දුතියජ්ඣාන් තෙලෙහි [8]මතු පත් ආභස්සර තෙලෙහි උපත් ගෙනැ කියත්. [9]ඉති බැවින් 'හෙට්ඨුපපත්තිකො' යනුයෙහි යට යට [10]තෙලෙහි උපැත් ඇතියේයි අරුත් [11]නො ගන්නේයැ. යට යට ධ්‍යාන් තෙලෙහි උපැත් ඇතියේ යයි අරුත් [12]ගන්නේයි. **සම්මිඤ්ජිතං වා බාහං**, හකුළුවා ගත් අතක්; [13]**පසාරෙය්‍ය**, දික්කරන්නේද; **සම්මිඤ්ජෙය්‍ය**, හකුළුවා ගන්නේද; **එවමෙවං**, එපරිද්දෙන් හෙවත් එපමණ කලෙකින්; **යදිදං ඉධාගමනාය**, [14]මේට ඊම පිණිස ආවාවූ යම් මේ තොපගේ ගමනවාරයෙක්ද; [15]**චිරස්සං බො මාරිස ඉමං පරියායං අකාසි**, නිදුක තෝ මේ ගමන වාරය [16]බොහෝ කලෙකින් [17]කෙළෙහි; **ඉදං**, මේ ආත්මය; **කෙවලං**, ජරාමරණාදීන් අසම්මිශ්‍රය; **න චවති න උපපජ්ජති** යනු මතු මතුයෙහි චුති ප්‍රතිසන්ධි නැතැයි ගෙනැ කියා. [18]**අවිජ්ජාගතො**, මොහයෙන් වසන ලදුයේ; **යත්‍රහි නාම**, 'යො නාම'—[19]ය නම් මේ [20]බකය යන නම් ඇති බ්‍රහ්මයෙක් තෙම; **සන්තඤ්ච** [21]**පනඤ්ඤං**, 'විජ්ජමානඤ්ඤෙව පනඤ්ඤං' යු සේයි; [22]**උත්තරිං නිස්සරණං**, 'අත්තනො දිට්ඨියා ගහිතනිබ්බානතො උපරි විජ්ජමානං යෙව නිබ්බානං' යු සේයි—තමාගේ දෘෂ්ටියෙන් ගත් නිර්වාණයට වඩා නොහොත් තමාගේ ගත් දෘෂ්ටියට වඩා මත්තෙහි විද්‍යමානවූමැ නිර්වාණය යනුයි. [23]**ත්වං එවං—පෙ—කථෙසීති**, තෝ මෙසේ කීද තෝ මෙසේ කීද

1 උඩබඹලොව උපන් ඇතියේ B. උඩබඹලොව යට බඹලොව උපන් CDF 2 සුභකිණ්ණහසු-මු. අ. ක. 3 වෙහප්ඵලකෙය A. 4 අප්පමාණභවා-හැම. 5 අසු. පතතිසුභව A. අසුභපතතිසුභ BCDF. 6 තතියජ්ඣාන D. 7 දෙක් කියා A. 8 මතු උපන් BCDF. 9 තතු බැවින් A. ඉති එබැවින් D. 10 තෙලෙහි සිට BCDF. 11 නො ගනුනේයැ-හැම. 12 ගතාන්නේයි-හැම. 13 අපසාරෙය්‍ය A. 14 මීට BCDF. 15 අචිරස්සං-හැම. 16 බෝ A. 17 කෙළෙයි A. 18 අවිජ්ජාගතො-මු. අ. ක. 19 විමසිය යුතුයි. යය නම්ම BF. යනම්ම CD. 20 බකයා BCDF. 21 පනඤ්ඤද විජ්ජමානංඤෙදපනං CD. 22 උත්තර BCDF. 23 තං එවං-හැම.

වැලියයි නොහොත් තෝ මෙසේ කියයිද [1]තෝ මෙසේ කියයිද වැලියයි; **අනුවිජ්ජන්තො**, විචාරන්නේ; [2]**අනුබන්ධිත්වා**, ලුහු [3]බඳනේ යයි [4]හෙවත් වෙහෙසන්නේයයි; [5]**අනුයොගභයා**, චෝදනා භයින් හෙවත් සර්වඥයන් තමා මෙසේ විචාරතියි කියා විචාරයෙහි කළ භයින්; **භීතො**, බිය පත්වූයේ; **අඤ්ඤදපි—පෙ—ආචික්ඛන්තො**, මම මතු නොවෙමි. සෙස් සෝත් මෙසේ කියතියි කියා සෙසු තමාගේ [6]සහායයන් [7]කියන්නේ; **පුඤ්ඤකම්මා**, කුශල කර්මයෙන්; **අඤ්ඤෙසං උපරි**, සෙස්සවුන්ගේ [8]මත්තෙහි; **අත්තනො වසං වත්තෙන්තො**, තමන්ගේ ඉසුරු පැවැත්වීමෙන්; **නො**, 'අම්හාකං'—අපගේ; **අයං**, මේ [9]අජරාමරභාව ප්‍රාප්ති වසයෙන් බ්‍රහ්මපත්ති තොමෝ—ශ්‍රෙෂ්ඨභාව ප්‍රාප්ති තොමෝ; [10]**වෙදෙහි**, වේදයෙන් නොහොත් ප්‍රඥයෙන්; **බ්‍රහ්මපත්ති**, 'බ්‍රහ්මං උත්තමං—තස්ස පත්ති බ්‍රහ්මපත්ති.' එමැ කියති 'පච්ඡිමකොටිප්පත්ති සෙට්ඨභාවප්පත්ති'යි. **අස්මා** යනුයෙහි අර්ථය 'අමෙහ' යනු. **අභිජප්පන්ති** යනුයෙහි අර්ථය 'අයං ඛො භවං බ්‍රහ්මා මහාබ්‍රහ්මාති ආදීනි වදන්තා නමස්සන්ති' යනු. **සතං සහස්සානං නාම**, සහස්‍රයන් සම්බන්ධිවූ ශතයක් නම්; [11]**සතසහස්සං**, ලක්‍ෂයෙක. එකී ගණනායෙන් නිරබ්බුද ලක්‍ෂයකට ආයු යයි කී නියායි. **උපාතිවත්තෙන්තාසම්හි**, හික්මිණිමියි; [12]**නිසම්පරෙතො** යනුයෙහි අර්ථය 'අතිවිය දුවෙථ' යනු. **උබ්බත්තෙත්වා**, පෙරළා [13]නොහොත් හුපුල්ලා; **සාරමරගාහං**, සිරකොට ගෙනැ; **චණ්ඩමනුස්සෙ**, [14]සිරිගළුන් හෙවත් වරපුරුෂයන්; [15]**පබ්බනජාලං**, පර්වත ජාලයට—ලතාදීන් පිහිත පර්වත [16]බෙහෙදවය යූ සේයි; **ශුද්ධමෙහිං ආඝොඛාවා පෙසෙන්තා**, සටන් බෙර ගස්වන්නේ; **දෙව—පෙ—සඞ්ඝාටෙ බන්ධිත්වා**, දෙතුන් [17]හගුළුක් එක්කොට බැඳැ; 'සඞ්ඝාට' නම් හගුළු හෝයැ. එක්කොට බැඳි නැව් හෝයි. **සම්බන්ධකුලං**, එතෙර සබඳ කුලයකට; **භූතානාදිකාවසෙසානි**, අනුභව කොට—[18]කා—ඉතිරි; **ඔසීදපෙම්සු**, ගලා පියමියි; [19]**බිප්පනිසන්තියා**, සතුසින් ඛින් [20]සමවැජිය [21]සහත බැවින්;

1 A C පොත්වල නොපැනේ. 2 අනුබද්ධහිති-හැම. 3 බඳවන්නේයයි A 4 A හි පමණකි. හෙවත් වෙහෙසන්නියි A. 5 අනුයොගභයගීතො-මු. අ. ක. 6 සහයන් BDF. 7 වෙත් BCDF. 8 සොරෙයි BCDF. 9 අජරාමරප්‍රාපතA. 10 වෙදසි-මු. අ. ක. 11 සතසහසානං-හැම. 12 සමමනිසම්පරෙතත-මු. අ. ක. නිසම්පරෙතො-හැම. 13 නොහොත් පුලල A. නොහුපුල්ලා BF. නොහුල්ලා CD. 14 සිරිගලුන් A. 15 පබ්බතබිලං-මු. අ. ක. 16 බෙදයට A. හෙදයට B. 17 හගුල් D. 18 ඉතිරි BCD. 19 බිප්පනිසන්තිතාය-මු. අ. ක. බිප්පනිසන්තිටඨා A. 20 සමවැජ්වැ A. සමවජිවග BCDF. 21 සහත බැව් A. සහතායවූ BCDF.

'ඛිප්පං—සීඝතරං–ඛානාරම්මණස්ස නිසමන්තං ඛිප්ප නිසන්ති—තස්සානුභාවෙන' යු සේයි. තථා ත්වං බුද්ධො, එසේ මැයි තෝ සම්බුද්ධයෙහි මැයි; [1]නං දස්සෙති, එහෙයින් තෝ සම්බුද්ධයෙහි මැයැයි කියා සම්බුද්ධයන් දක්වා; තව අයං ජලිනො සරීරප්පභාවො, දිලියෙන්නාවූ තොපගේ මේ ශරීර ප්‍රභාවය—ශරීරාලෝකය; ආසවෙඛී, කෙලෙසුන් කෙරෙන්; [2]විගතානි, සිත්; විමුච්චිංසු, [3]මුක්තවූ.

## 405. බකබ්‍රහ්මජාතකං.

---

## පඨමො වග්ගො.

---

භෙසජ්ජසන්නිධිකාරසික්ඛාපදං, බෙහෙත් තබා තිබීමෙහි පනවන ලද ශික්ෂාපදය; සොවණ්ණමයෙ භාජනෙ, සුවර්ණමය කල සාල්හි; පඤ්චභෙසජ්ජානි, 'සප්පි [4]නවනීතං තෙලං මධු ඵාණිතං' යන මේ පස් බෙහෙත්; බාහුල්ලිකා අහොසි, ප්‍රත්‍යයාගේ බාහුල්‍යයෙන් යුක්තවූ; කොලම්බෙ, බඳුනෙහි කුඩුවමද කියත්; පත්තත්ථවිකායොපි, පාත්‍ර පසිඳ; පටිසාමෙසි, තබා තුබූ; අන්තොකොට්ඨාගාරිකා, ඇතුළු කොට ගෙවල් ඇත්තාහ—ඇතුළු--තමන් වසන තැන—[5]කොට් ගෙවල් ඇත්තාහ; සික්ඛාපදං පඤ්ඤපෙසි, 'යානි ඛො පන තානි ගිලානානං පටිසායනීයානි භෙසජ්ජානි සෙය්‍යථීදං සප්පි නවනීතං තෙලං මධු ඵාණිතං. තානි පටිග්ගහෙත්වා සත්තාහපරමං [6]සන්නිධිකාරකං පරිභුඤ්ජිතබ්බානි. තං අතික්කාමයතො යථාධම්මො කාරෙතබ්බො' යන [7]සිඛ පනවා; [8]ලොණසක්ඛරාමත්තං, ලුණුකැට මාත්‍රයක්; නිදහනෙන, තබා තබන්නවුන්; සන්නිධිං, නිධන්; [9]අදිට්ඨවයස්සා, නොදුටු විරූ [10]යහළුවෝ; ධම්මත්ථයුත්තං, 'ධම්මයුත්තං අත්ථයුත්තං'යි යොදනු. ධම්ම නම් කුශල ධර්මයයි; [11]අත්ථ නම් වැඩයි; අගිලඩ්ඩණනාමෙව, නැහෙන්නාවූ මැ; අවත්ථරි, ගති. [12]මයහමෙපස යනාදි පරිහරණාදිය සවගීමොක්ෂාවරණ ගෙයින් කියත්. තාහං, 'සො අහං' යි [13]බිඳුනේයි; චන්දමණ්ඩලං විය, චන්ද්‍රමණ්ඩලය පරිද්දෙන් කිසි උපක්ලේශයක් නැතිව; කුලෙ ච, ඤාතිකුලාදි කුලයෙහිද; ගණෙ ච, පරිවාරයෙහිද; සො, ඒ ගන්ධාර රජ තෙම;

1 දස්සෙති-මු. අ. ක. එතං .දස්සෙති A. 2 විගතං, සිත-හැම. 3 මුක්වූ BF. මුත්වූ CD. 4 නවනීත තෙල BCDF. 5 කොටසම ගෙවල් A. 6 සන්නිධිකාරං-හැම. 7 සික්ඛාපද A. 8 ලොණසක්ඛර-හැම. 9 අදිට්ඨසහායා-මු. අ. ක. 10 යහළුවා-හැම. 11 අව-හැම. 12 මයනමෙපසතාධිපරිහරාදිය A. 13 යොදන්නේ A.

**රජ්ජං**, රාජ්‍යශ්‍රීයද; **සමවත්තවාසං**, මෛත්‍රී කරුණා මුදිතා උපෙක්ෂා යන සතර බ්‍රහ්ම විහාර වාසය නොහොත් එක් තැනෙහිමැ නොහිඳැ නොඑක් තැනැ දවස් මස් හවුරුදු ගණනින් විසීම් හෝයි; **ඉදං**, මේ [1]රාජ්‍යශ්‍රී තොම; [2]යාව මං නිප්පභං කරොතී'සි අනුසන්ධාන කරනු. **පවත්තඵලභොජනා හුත්වා**, ස්වයම්පතිත [3]පකාපැකිමැ ආහාර කොට ඇත්තාහු; **පණ්ණපුටෙ බන්ධිත්වා**, පත් ගොටුයෙක බැඳැ; **තිණවට්ටි අනන්තරෙ**, තණ කැරැල්ලක් අතුරෙහි; **අක්ඛණවෙධාභාවං**, [4]නිප්පලිබොධ භාවයට; **වජ්ජදස්සිනං සං**, වරද දර්ශී වූ යමකු; **නිධීනං පවත්තාරං ඉව පස්ස**, නිධානයක් කියන එකකු මෙන් [5]දක්නේයැ; **නිග්ගය්හවාදිං**, නිගෙනැ කියන්නාවූ-[6]නිගෙනැ අවවාද කරන්නාවූය යනුයි; **සෙවෙය්‍ය**, වැඩ; **සො**, යමෙක්; **ඔවදෙය්‍ය**, දුටු වරදට අවවාද දෙන්නේද; **අනුසාසෙය්‍ය**, නො උපන් වරදෙහි අනුසස් දෙන්නේද; **අසබ්භා ච**, අකුසලින්; **කුණ්ඨසත්ථෙකෙන**, නොකැපෙන කරයකින්; [7]**මුණ්ඩෙනෙනා** විය, මුඬු කරන්නකු සේ; **මහන්තම්පි චෙ වාචං**, ඉදින් මහත් වූ ප්‍රයොජන ඇති [8]වාචායෙකුත් වී නම්; **තං**, එසේවූ වාචාව; [9]**භුසං ච**, රඩු මිටක් මෙන්; [10]**විකිරීයනු**, විසිරේවයි; **යථා කුම්භකාරො** [11]**ආමකමත්තිකෙ**, යම්සේ කුම්භකාරයා හමු මැටියෙහිද—යම්සේ කුම්භකාරයා භාජනය [12]නැවැත නැවැත ගසා බලා ආමභාජනය හැරැ පක්කභාජනය ගනීද; **ආනන්ද**, ආනන්දය; [13]**වො**, තොපට; **තථා න පරක්කමිස්සාමි**, එසේමැ උත්සාහ නො කෙරෙමි—එසේමැ නැවැත නැවැත අවවාද කොට [14]නිගෙනැ [15]අපක්ක භාජන සදෘශ පුද්ගලයා හරිමියි-[16]පක්කභාජන සදෘශ පුද්ගලයා හික්මවාගන්ට උත්සාහ කෙරෙමියි යනුයි; [17]**නිග්ගය්හ නිග්ගය්හ**, නිගෙනැ නිගෙනැ; **ආකොටෙත්වා**, ගසා බලා; **ආමකං**, [18]පැලහු ද අමු මැටි බඳුන; **ආචාරපණ්ණත්තිවිනයෙ**, 'ආචාරවිනයො පණ්ණත්තිවිනයො'යි යොදනු. **ආචාර විනය** නම් ආචාරයෙහි හසළ බවයි—ආචාර සමාචාර විසින් රක්නා චාරිත්‍ර ශීලයයි; **පණ්ණත්ති විනය** නම් වදාළ විනය නො ඉක්මෙන බවයි—ශික්ෂාපදයෙහි [19]භික්ෂු නියෙන් රක්නා [20]චාරිත්‍ර ශීලයයි; 'ආචාරම්හි' යනුයෙහි

1 රාජ්‍යශ්‍රිය තොම A. රාජ්‍යශ්‍රී තොම BDF. 2 යාමං-හැම. 3 ඵලාඵල A. 4 නිපප ලිරොධ B. නිෂපලිරොධ CDF. 5 දක්නේයි BCDF. 6 නිගෙනැ නිගෙනැ A. 7 මුවෙනෙනා විය, මුවකරන්නකු සේ B. 8 වාචයකුත් D. 9 භූසංචා-මු. අ. ක. 10 විකිරියනු-මු. අ. ක. 11 ආමකමනෙත-හැම. 12 නැවැත A. 13 වො-මු. අ. ක. 14 ගෙනැ A. 15 සුපක්ක A. 16 දුපක්ක A. 17 නිග්ගණෙහ-මු. අ. ක. 18 පලවුව ද A. පැලවූද CD. 19 භිවු CD. 20 චාරිත්‍ර-හැම.

අර්ථය [1]ආචරියස්ස සන්තිකෙ යනු. ඉමිනා හි සත්තෙන, මේ සත්‍වයා විසින්; [2]අභික්කන්ත නම් ඉදිරියට [3]යෑමයි; පටික්කන්ත නම් නැවැත්මයි—ආයේ ඒමයි; ලොකස්මිං හි, [4]මේ ලොකයෙහි වනාහි; බාහුසච්චඤ්ච, [5]බාහුශ්‍රැතයද; සිප්පඤ්ච, යම් කිසි උගත් [6]ශිල්පයද; [7]අනධිවාසකජාතිකාය, නො ඉවසිය හෙන පියවි ඇති බැවින්—

## 406. ගන්ධාරජාතකං.

---

සන්දච්ඡායො, ඝන සෙවණ ඇති; බහලපත්තො, බොලවූ පත් ඇති—ඝනවූ පත් ඇතිය යනුයි; [8]නාතිමහන්තකුම්භප්පමාණානි, ඉතා නො මහත් දිය කළ සා ඇත්තාහ; උදකම්පත්තෙ සාඛාය, දිය පිට [9]අතුයෙහි; පුප්ඵකාලෙ, මල් මැලෑසි කල මෑ; කළායමත්තකාලතො පට්ඨාය, [10]මැලෑසි කළු වැ මෑ ඇට සා කල පටන්; කිපිල්ලකපුටපටිච්ඡන්නං, [11]දිමිතිලි බුරායෙන් මුවාවූ; එකං, එක් අඹ පකක්; උදකජාලෙ, උඩු ගඟ බැඳි දැලෑ; ජුරිකාය, සිරියෙන්; අග්ගිං කරිංසු, උපද්‍රව නිවාරණය පිණිසැ ඒ ඒ තැන්හි ගිනි දැල්වූ; ඝරෙ සන්නහිත්වා, දූන්නේ හීය හිඳුවා ගෙනැ; [12]උජුකං උග්ගතසාඛං, ඉඳුරා නැඟි අත්තට; [13]තස්සා පරියන්තතො, ඒ අතු කෙළවරින්; ගඞ්ගාතීරෙ, ඇත ගංතෙරැ; ආකාසං පරිච්ඡින්දිත්වා, පැන හුණු අඹ අත්ත හා පැන නැඟී ගොස් හුණු තොට හා මේ දෙ අතුරෙහි ආකාශය මෙතෙකැයි පිරිසිඳැ නියත කොටැ; [14]අධොගඞ්ගාය, [15]යට ගඟ—ගඟ මත්තේ යනුයි; සංඝාටං, නැවක්; නාවං, 'සංඝාටෙ' යු සේයි; අට්ටකං, අටුවක්; [16]කාසායවත්ථං, කසට පෙවූ පිළියක්; [17]තෙලචම්මං, තෙලි සමක්; අත්තානං [18]සංසයං කත්වා, තමා සංශය කොට හෙවත් ජීවිතය සංශය කොට—මොහු ජීවත් වන්නා සේ නොවෙයි මියන්නා සේ යයි කියා මෙසේ අනුන්ට ජීවිත සංශය කොටය යනුයි; තුලං ආරොපෙත්වා, 'අත්තානං දෙළායමානං කත්වා' යු සේයි. නොහොත් තුලං ආරොපෙත්වා, [19]තොප තුලාවකට මෙන් තගා හෙවත් තුලාවකට [20]තගන්නා සේ තෙපිමැ තොප

---

1 ආචරියසන්තිකෙ-මු. අ. ක. 2 අභික්කන්තං CD. 3 යාමයි AC. 4 ලොකයෙහි A. 5 බහුශ්‍රැතභාවයද BF. බහුශ්‍රුතභාවද CD. 6 ශිල්පද CD. 7 අනධිවාසවාචක ABDF. 8 මහන්තානි මහන්තකුම්භප්පමාණානි-මු. අ. ක. 9 ඇතුයෙහි-හැම. 10 මැලෑසි කළු මෑ ඇට BCDF. 11 දිමිතිලිබුරායා මුවාහුවූ A. 12 උජු BCDF. 13 තස්ස-හැම. 14 අනොතා ගඞ්ගාය-මු. අ. ක. 15 යට ගඟ ගඟා යට ගඟ මත්තෙත් A. යට ගඟස යට ගඟ මත්තේ BCD. 16 කාසාව-මු. අ. ක. A. 17 එළකචම්මං-මු. අ. ක. 18 සංසයං-මු. අ. ක. 19 තුලාවකට D. 20 තගන්නා මෙසේ-හැම.

උබට නගා තුලාවක් සේ [1]හෙළා; [2]**ඛෙමෙන**, නිර්භය කොටැ; [3]**උල්ලඞ්ඝයිත්වා**, නගා; **ගජ්ජමානො**, ගොස් සිට එතෙරින් නැවැත; **ලතාගුණං**, [4]වැල්වලය; [5]**විස්සජ්ජිත්වා**, අහසට තමන් විහිදුවා; **නුණ්ණො**, ප්‍රේරණය කරන ලද්දෙමි – මෙහෙයන ලද්දෙම් නොහොත් පිනුයෙම්; **වෙත්තලතාය ච**, වෙත්‍රලතාව ගේ ද දෙ අතුරෙහි; **වීණාය තම්බරතන්ති විය**, වීණායෙහි බඳ බමරතත් සෙයින්. 'හමරතන්ති' නම් [6]බුරවන තතයි. **විතතං**, [7]දික්වැ සිටියාවූ ශරීර ඇති; **වාහනස්ස**, [8]විය උසුලන්නා වූ; **යොගස්ස**, වාහනවූ හස්ත්‍යශ්වයන්ටද; **ඉස්සාගාරම්පි**, අන්තඃපුර වධූන්ටද; **කූටාගාරෙ**, කෝල් අග්හි....

## 407. මහාකපිජාතකං.

[9]**සමුද්දවාරං**, සමුද්‍රවරණය හෙවත් හැසිරීම—ප්‍රවෘත්තිය යනුයි; [10]**කුම්භකාරකුලං නිස්සාය**, [11]අන් කුඹල් කුලයක් නිසා බැලයට මෙහෙ කොටැ; **අම්බපිණ්ඩිං**, අඹකැනක්; **සෙසෙයි**, ගැත්තන් විසින්; [12]**ඔභග්ගවිභග්ගසාඛං කත්වා**, [13]ඇත් මැන්හි බිඳුණු අතු ඇති කොටැ; නොහොත් **ඔභග්ග**, බිඳුනා ලද; **විභග්ගසාඛං කත්වා**, විශෙෂයෙන් බිඳුනා ලද අතු ඇති කොටැ; **ගහිතඵලො**, අනුන් විසින් කඩා ගන්නා ලද්දවූ පක් ඇත්තේ; **අඤ්ඤතො**, අනික් දිශායෙකින්; **මුණ්ඩමණිපබ්බතො විය**, කුළු නැති ඉඳුනිල් මිණි පව්වක් සේ; **සොසිතො**, සියලු ශොක පරිදෙවාදීන් තාක් දූරීකෘත හෙයින් වියළා පියන ලද; **අට්ඨිපාකාරො**, ඇට සැකිලි නැමැති පවුර. සසරින් නොයාදී පරික්ෂිප්ත ආවරණව සිටිනා හෙයින් කියත්. **යුත්තයොගස්ස**, යෙදුණාවූ යොග ඇත්තාහට–භාවනායෙහි යෙදුනා [14]වූය යනුයි 'යුඤ්ජිතබ්බතතා යොගො–භාවනා. තෙන යුත්තස්ස' යු සේයි; **අනිලපථෙන**, ආකාශයෙන්; **නන්දමූලපබ්භාරමෙව**, එනම් පබ්බත බෙයදටමැ; **මණිවලයං**, මැණික් වළලු නොහොත් සාදුවළලු; **ගන්ධං පිංසමානං**, සුවඳ වටන්නිය; **සෙනො**, උකුස්සෙක්; [15]**සූනාපණිකො**, මස් අවුණින්; **ඉමෙ හි බහුන්නං සාධාරණා**, මේ පඤ්චකාමයෝ නම් බහු සාධාරණයහ; **වජද්වාරං**, ගාල්දොර; **අන්තරසත්තිමහි**, යටබඩැ; **නික්ඛාවරියං**, කින් සිහිම් ඇති; **සෙල** නම් මැණිකි; **චල**

1 හෙළි-හැම. 2 A හි පමණකි. 3 උල්ලඞ්ඝිත්වා-හැම. 4 වැල්වැලය A. 5 විස්සජ්ජෙත්වා-මු අ. සා. 6 බූපවත A. 7 එක්වැ A. 8 උසුලන්නාවූ BCDF. 9 නිගගහ-මු. අ. සා. 10 කුම්භකාරසාමම.-මු. අ. සා. 11 අනික් BCDF. 12 ඔහගගවිහගග• BCDF. 13 ඇත්මැත් බලා හිඳුණු අතු BCDF. 14 වූ CD. 15 සූනාපණිකතො AC, සූනාකතො D.

කකුධං, සැලෙන්නාවූ මොල්ලිය ඇති; [1]කාලිඞ්ගානං, [2]කලිඟු රට වැසියන්ගේ; සීලාදීහි පඤ්චහි ගුණෙහි, ශීලයැ සමාධියැ ප්‍රඥායැ [3]විමුක්තියැ විමුක්ති ඥාන දර්ශනයැ යන පස් ගුණෙන්; භගනවී, [4]කිඹුල්ල; [5]අත්තනො අත්තනො ඔකාසෙන, තම තමන්ගේ සීමා වශයෙන්—පරිච්ඡේද වශයෙන්. 'යථොධිකානි' යනුයෙහි 'යථා' යන්නෙහි අර්ථය 'අත්තනො අත්තනො' යනු. රූපාදිබන්ධවසෙන, රූප ශබ්ද යනාදි පරිච්ඡේද වශයෙන්. රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශ යන පඤ්චකාම ගුණයන් අන්‍යසංකීර්ණ නොවැ [6]පිරිසිදී සිටි බැවින් කියත්. යථොධිකානි යන පාඨයෙහි විග්‍රහ වාක්‍ය [7]පසිති 'යතො—උපරතො ඔධි එතෙසං' සී. යතො යනු 'යම—උපරමෙ' යන ධාතුසී. එයින් කියති අර් කියන්නාහු 'උපරතො'යි. උපරතකොට්ඨාසානි, පහවූ කාම කොට්ඨාසයන් ඇත්තාවූ කාමයන්; එකො කොට්ඨාසො, තදඞ්ග වශයෙන් එක් කොටසෙක්; 'එකො කොට්ඨාසො' යනු තදඞ්ග වශයෙන් ප්‍රහාතව්‍ය කෙලශ කොට්ඨාසය ගෙනැ කිහු. [8]අයානය, [9]'කරණීයාකරණීයං' යු සේයි; නොහොත් වැඩ අවැඩ; ථොකං උත්තණ්ඩුලං, මඳක් [10]සහල් කොටැ; කිලින්නං, [11]විලිස්සවැ; [12]ආම, මේ නොපැසුණැයි කියාද—

## 408. කුම්භකාරජාතකං.

---

[13]සබ්බලොකනිස්සරණ, සියලු ලොකයා [14]සසර මහ සයුරෙන් එතෙර කරන්නාවූ; භගවා සබ්බඤ්ඤු, භාග්‍යවත්වූ සර්වඥයෙහි; උදෙනො වංසරාජා, [15]වංශාගත වූ මේ උදෙන නම් රජ තෙම; පියාසිකො, ගුණවත් වැ; ධූමකාටකං, දුම් මලා-සුවඳ දුම්මලායි; [16]අරඤ්ජරකොනකාන, වැටකේ කොළු; [17]ඔටස්, ඔටු දෙනෙක්; ව්‍යාධි යයි පිට [18]මහා මොල්ලි ගැට ඇති හෙයින් කියන ලදී; දූතෙය්‍යහරණකිච්චං, හසුන් ගෙනැ යන කම්; [19]ගොමයහරණයානකෙ, ගොමවැරටි ගෙනෙන ගැල්හි; අනනෙනො ධම්මතාය, තමා [20]කැමැති පරිද්දෙන්—කැමැති යම තැනෙක්හි; සාධු, [21]'යාචාමි'-නොපට ආරාධනා කෙරෙමි; සත්තූනං උපරි, සතුරන් මත්තට හෙවත් සතුරන්

---

1 කාලිඞ්ගානං A. 2 අලිගුරට F. 3 විමුකාන්යැ යනා පඤ්චකාම ගුණයන් අන්‍ය A. විමුකාන් ඥානදර්ශනය CD. 4 A හි නොපැනේ. කිඹුල්ල BCDF. 5 අත්තනො ඔක-මු. අ. ක. 6 පිරසාදි CD. පිරිසඳී BF. 7 දක්වති A. 8 ආයනාය A. අයනායං BCDF. 9 කාරණීයං යු සේයි BCDF. 10 සාල් A. 11 වලක්සවා A. විල්කැවා BCDF. 12 ආමං-හැම. 13 සබ්බලොකනිස්සාර-හැම. 14 සතර C. 15 රාජ වංශාගත BCDF. 16 අරසොඳදෝ-මු. අ. ක. 17 ඔටුනු CD. 18 මොල්ලී BCDF. 19 ගොමයහරණ BCDF. 20 කැමැත්වන A. 21 යාචාමීති A.

**කරා**; **අභිහරන්ති**, ප්‍රේරණය කරන්නෙම් හෙවත් දමන්නෙම්; **සුසෙද්ධ[1] වික්කන්තගාමිනි**, සුද්ධවිෂයෙහි වික්‍රම ප්‍රාප්තවූ—වික්‍රම වත්වූය යනුයි; **ජඞ්ඝාභාරිකා**[කම්බා], ගොමවැරටි ගැල් [2]හයන පරිද්දෙන් කොටැ; [3]**පච්ඡන්ති** යනුයෙහි අර්ථය 'භජති—සෙවති' යනු. **තං නානාකිච්චෙසු [4]පත්ථිතං පොසං**, ආදි අපරිගීත කාලයෙහි—සමර්ථවැ සිටි කාලයෙහි—ඒ ඒ [5]කෘත්‍යයෙහි මොහුවුව මැනැවැයි කියා මෙසේ ප්‍රාර්ථනා කරන ලද්දවූ—කැමැතිවන ලද්දවූ—ඒ පුරුෂයා පසුවැ......

## 409. දළ්හධම්මජාතකං.

---

**උඤ්ඡාචරියාය**, [6]හැපිළිලි ආහාරයෙන්; **මං දූරං පච්චුදෙති**, දුරදී මැ මා පෙරමඟට එන්නේයැ; **විභාවනත්ථෙ**, පහළ කරන අර්ථයෙහි. [7]විභාවනාය මැ [8]පයිති 'අයමෙව සො න අඤ්ඤෙ' යි. **මාලුවලතාය**, [9]මාලුවා ලියයෙහි; **අග්ගප්පවාලං**, අලුත [10]හටගත් අක්දලුවයි—අග්‍රාඞ්කුරය නමුත් හේ මැයි; [11]**මනො වත**, ඒකාන්තයෙන් [12]මෙලේ; **විප්පමුත්තස්ස චෙතසො**, කාමයන් කෙරෙහි මුක්තවූ සිත් ඇති; **කිං [13]නික්කම්මා අවජාම**, [14]නිෂ්කර්මික වැ කුමට [15]හිඳුමෝද—නිකම් කුමැයි [15]හිඳුමෝද යනුයි; **ඔජ්ජිත්වා**, [16]පිසැපියා; **යොත්තං**, යම් බඳුවූ තෝ......

## 410. සොමදත්තජාතකං.

---

**න නිගූහන්ති**, නොසඟවන්නාහ; [17]**පත්තියාපෙත්වා**, [18]හඟවා; [19]**උඤ්ඡා විචිනන්ති**, උකුණන් බලන්නී; **භමරඤ්ජනවණ්ණානි**, තිල් බමරුන්වන් අඳුන්වන් පැහැ ඇති; [20]**දසකුසලකම්මපථධම්ම** නම් පාණාතිපාත අදත්තාදාන [21]කාමමිථ්‍යාචාර යන මේ තුනින් වැළැක්ම යයි කියන ලද තුන් කාය සුචරිතයැ මුසාවාද පෙසුඤ්ඤ ඵරුස සම්ඵප්පලාප යන මේ සතරින් වැළැක්ම යයි කියන ලද සතර වාක් සුචරිතයැ [22]අභිධ්‍යා ව්‍යාපාද මිථ්‍යාදෘෂ්ටි යන මේ තුනින් වැළැක්ම යයි කියන ලද තුන් මනොද්වාරික සුචරිතයැ යන මේ දශයයි;

---

1 වික්කන්තගාමිණී-හැම. 2 හරන BCDF. 3 කියනුයෙහි BCDF. 4 පට්ඨිතං-මු. අ. ක. 5 ප්‍රත්‍යයෙහි-හැම. 6 ඇම්ලිලි A. 7 විභාවනාය A. 8 කියති A. 9 මාලුව BCDF. 10 අටගත් CD. 11 අමනො-හැම. 12 මෙළ-හැම. 13 නික්කම්ම-හැම. 14 නිස්කර්මික D. 15 සිඳුමෝදූයි CD. 16 පිස CD. 17 පටිඤ්ඤපෙත්වා-මු. අ. ක 18 පහදවා A. 19 මිචිනන්ති-මු. අ. ක. 20 දසකුශල කර්මපථධර්ම ADF. 21 කාම මිච්ඡාචාර BDF. 22 අභිද්ධ්‍යා BCDF.

මමෙව [1]සීසෙ [2]ජාතපලිතං, මාගේමැ හිසැ හරයයි දනු; ඉතරං, 'උත්තමඞ්ගං' යනු කියත්; උග්ගතො, [3]හිවියෙහි; තරුණකාළිරො [4]විය, [5]ලා හුණ කිළිල්ලක් මෙන්; දුතියෙ වා තතියෙ වා අත්තභාවෙ [6]විපාකදනතො යනු බ්‍රම්සරවස් එමැ අත්බැවැ විපාක ඵල [7]නො දෙන්නෙන් කියත්. දෙවන තුන්වන අත්බැවැ නියමයෙන් ඵල දෙන බැවින් කියත්. කාලිකං නාම, කලෙකින් වන්නා නම් වෙයි – කලෙකින් සුව එලවන්නා නම් වෙයි; [8]'අකාලිකං අනුධාවි මා කාලිකං අනුධාවි'යි යොදනු. කල් නියමයෙන් ඵල දෙන බ්‍රම්සරවස් [9]නහම් අනුවා යු තැන්. [10]භවිතබ්බමෙමවෙතං කථෙසි, වියයුතු දෙය මැ කී—තොප ඉසැ මේ හරයයි කියන තොප එකාන්තයෙන් වන දෙය [11]මැ යැ කියේ යනුයි; [12]පරිණාමිතෙනා පරිණමෙනා යි වයෙ, වයස් පෙරළෙත් පෙරළෙත්—[13]මූකුරත් මූකුරත්ය යනුයි; සාණිවාකසදිසෙසහි, [14]සණවැල්සේ සුදුවැ; කාළා යනුයෙහි අර්ථය 'කාළවලලී' යනු. කාළවල්ලි, කළුවැලි; පවාළාව ගුත්ථා, [15]පබළුවන්වැ පලුපතින් අඞ්කුරයෙන් යුක්ත වැ ගෙනැ; පවෙල්ලනි, ලෙළේද; ගොපානසිසමභොගගං, [16]ගොනැසක් වැනි වක්වූ ශරීර ඇතිවැ; එමැ කියති 'ගොපානසී ආකාරෙන භග්ගසරීරං'යි. [17]නවඨකාකණ්ණිකං පරිසෙසනතිං විය, නව කණාවක් සොයන්තියක මෙන්; [18]භග්ගසරීරො, වක්වැ ගියාවූ ශරීර ඇතියෙම්; පරිවතතිතුං, පෙරළී ගන්නට; විවෙකසුඛවසෙන, ඒ කෙලශයන් කෙරෙන් වෙන්වී මෙන් සම්භාව කායික චෙතසික සුඛ වසයෙන්; පරිවතතිතුං, පෙරළී ගන්නට; කාමරති—පෙ- ආරම්මණානි අගාර මජෙඣ ඨපිතානි, කාමරති දනකවූ රූපාදි ආලම්බනයෝ අගාර මධ්‍යයෙහි පිහිටුවන ලදහ; තානි ආරබ්භ, ඒ රූපාදීන් නිසා. [19]ආදි කී 'තෙසං' යනු 'පරිවතතමානානං' යනු හා සම්බන්ධ කරනු. පරිවතතමානානං, පෙරළෙන්නාවූ හෙවත් [20]පවත්නාවූ; තෙසං, ඒ සත්වයන්ගේ; තං මුහුත්තං, එකෙණෙහි; උපායාස නම් බලවත්වූ දුකි; එතමපි රජ්ජුං, නොසිඳ පිය හැක්කාවූ මේ කාමරති නැමැති රජ්ජුවද—

## 411. සුසිමජාතකං.

1 සීසං-හැම. 2 සඤ්ජාත-මු. අ. ක. 3 ග.. ස්සේ A. 4 මු. අ. කථාහි නොපැනේ. 5 හුණ A. 6 විපාකජනනතො-මු. අ. ක. 7 නොදෙන තැන් ගෙන A. 8 කාලිකං-හැම. 9 නහකම්-හැම. 10 භවිතබ්බමෙවෙතං-මු. අ. ක. භවිතබ්බමෙවතං A. 11 මැකීයේය A. 12 පරිණමනො යි වයෙ-මු. අ. ක. 13 මූකරත් මූකරත් A. 14 සැණැ A. සැණවා BCDF. 15 වපුළුවන්වූ-හැම. 16 ගොනසක් CD. 17 නවඨකාකණ්ණිං-හැම. 18 භොගගසරීරො BCDF. 19 ආදි කී පරිවත්තමානං යනු ,BCDF 20 පවත්වන්නාවූ C.

[1]**කොටසිම්බලියං**, කොළ හිඹුලෙහි; **බ්‍යාමසහස්සායාමං**, දහසක් බඹ [2]දිග ඇති; [3]**භොගං පවෙසෙත්වා**, දරණ ගසා; **සමුග්ඝාතං**, උන්මූල බවට හෙවත් මුලින් උපුට ගෙනැ ගිය බවට; **නාගමෙදං**, නාතෙල්; [4]**රුක්ඛානං**, වෘක්ෂයන්ගේ මස්තකයෙහි–මහා ගස් මත්තෙහි; **අජ්ඣාරුහා**, නැඟෙන්නා වූ; **වනප්පති** යයි කියා [5]මහත් වැ වනයට [6]ප්‍රධාන වැ සිටිනා වූ වෘක්ෂයටද කියති—මල් නොගෙනැ පක් ගන්නා ගසටද කියත් ~

## 412. [7]කොටසිම්බලිජාතකං.

---

**යුධිට්ඨිලගොත්තො**, යුධිට්ඨිලයා හා සමාන ගොත්‍ර ඇති; කුරුරටවාසීන්ට රජ හෙයින් **කොරව්‍ය** නම්; **කිංසොකො නාම තුම්හාකං සොකො**, තොපගේ ශොකය කුම්න නම් ශොකයෙක්ද; **සරභෙ**, සරභ මුවන්; **බහුකෙත්ථා** යනුයෙහි අර්ථයි 'බහුතඞ්ඛිතො' යනු. **බහුතඞ්ඛිතො**, ගිනිදුම් පිණිසැ කැටි කරන ලද බොහෝ දර ඇත්තේ; **චරිත්වා**, ගොදුරු ගෙනැ; [8]**අපච්චවෙක්ඛිතා**, පරීක්ෂා නොකරන ලද්දුවූ—නොවිචාරන ලද්දුවූ; **නදීනං පභවට්ඨානානි ච**, නදීන්ගේ උත්පත්ති ස්ථානයටද හෙවත් [9]බොහෝ ගං හෝ ඇති තැනටද; **සො තුම්හාදිසො එකො**, ඒ [10]තොපගේ වූ [11]සමහර එකෙක්; [12]**විභවන්ති**, 'විනස්සන්ති' යූ සේයි; **සන්තාපිං** [13]**ගම්හෙත්වා**, ගිම්සමට පැමිණැ—[14]ගිම්සැ යයි යනුයි ~

## 413. ධූමකාරිජාතකං.

---

**චඞ්කමං අධිට්ඨාසි**, රාත්‍රිය මුළුල්ලෙහි නොයිඳැ සක්මන් කෙළේ; **ජග්ගන්තං**, නොනිදන්නාවූ; **ජග්ගතො**, නොපමා වූයේ; [15]'ඨානං චඞ්කමො ච ඉරියාපථො එතස්සාති' [16]**ඨානචඞ්කමිරියාපථො** යනු වේ—සිටීම් හා සක්මන් මැ ඉරියවු කොටැ ඇත්තේය යූ සේයි; **ජාගරතං සත්තානං** [17]**අනන්තරෙ**, නොනිදන සතුන් අතුරෙහි; **නවවිධලොකුත්තරධම්මං**, සෝවාන් සෙදගැමි [18]අනාගැමි රහත් මඟය යන මේ සතර

---

1 කොටිසිම්බලියං-මු අ. ක B. 2 ඇහි BCDF. 3 භොගංවා-හැම 4 රුක්ඛා-මු. අ. ක. 5 මහත් CD. 6 ප්‍රධානවූ A. 7 කොටිසිම්බලී-මු. අ. ක. 8 අපච්චවෙක්ඛනස්ස-මු. අ. ක අපච්චවෙක්ඛිකා BCDF. 9 ගංහෝ C. 10 තොපගේ සමහර CD 11 සම A. 12 මු. අ. කථායි නොපැනේ. 13 ගහාත්වා-මු. අ. ක 14 ගිම්සම A. 15 ඨානචඞ්කමො-හැම. 16 ඨානචඞ්කම-මු. අ. ක. 17 අනන්තරෙසු-හැම. 18 අනාගැමි C. අනාගාමී D.

මගඵ සෝවාන් [1]ඵල ආදී සතර ඵලය නිර්වාණය යන මේ නව ප්‍රකාරවූ ලොකුත්තර ධර්මය; **අයං සද්ධම්මො**, මේ කාය වාක් සංයමයැ—[2]මෙයින් මාර්ගගත ශීලය කීහු. **අයං දමොති**, මේ ඉන්ද්‍රිය දමන යයි කියාද—මෙයින් ඉන්ද්‍රිය සංවර කීහු. **මනච්ඡට්ඨානං ඉන්ද්‍රියානං**, මනස [3]සවනු කොට ඇති ඉන්ද්‍රිය යන්—ෂඩින්ද්‍රියයන්ගෙ යනුයි; **පදසඞ්ඛාත**, 'රාගො [4]සාරාගො' යනාදීන් පාලියෙහි දක්වන ලද සියක් පෙදෙන්; **දුක්ඛාදිසු [5]අට්ඨවත්ථූසු**, 'දුක්ඛෙ අඤ්ඤාණං දුක්ඛසමුදයෙ අඤ්ඤාණං දුක්ඛනිරොධෙ අඤ්ඤාණං දුක්ඛනිරොධගාමිනිපටිපදාය අඤ්ඤාණං පුබ්බන්තෙ අඤ්ඤාණං අපරන්තෙ අඤ්ඤාණං පුබ්බන්තාපරන්තෙ අඤ්ඤාණං ඉදප්පච්චයතාපටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු අඤ්ඤාණං' යන මේ අට තැන්හි පවත්නාවූ; **ලට්ඨකාං කත්වා**, යහපත් කොට; **මයම්පි නං [6]එවමෙවං කථෙම**, අපිත් එපරිද්දෙන් මැ කියමු—තෙපි මේ ප්‍රශ්නය යම් පරිද්දෙකින් කිවුද අපිත් [7]කියන්නමෝ' එමැයි.

## 414. ජගරජාතකං.

---

[8]**කුම්මාසපිණ්ඩ** නම් යවසාලින් කළ කොමු පිඬුයි; **පුප්ඵපච්ඡියං**, මල්කඩන [9]පැසෙහි; **මහාරාජදත්තියං**, සතර වරම් මහරජුන් විසින් දෙන [10]ලද; **නාසාරජ්ජුයා**, [11]දත් ගෙතෙහි; **අස්සා ඔරුය්හ**, අසු පිටින් බැස [12]පියා; **අත්තනො—පෙ—පක්කොසෙත්වා**, ඇ තමාගේ ගෙටමැ [13]නගා යවා පියා; [14]**පුබ්බුට්ඨායිනාදිහි**, 'පුබ්බුට්ඨායිනී පච්ඡානිපාතිනී කිංකාරපටිස්සාවිනී පියවාදිනී මනාපචාරිනී' යන; [15]**අලොණිකං**, 'ඵාණිතරහිතං' යු සේයි—ඵාණිත රහිතාවූ [16]නොමිහිරිවූයේ යනුයි; **අනන්තරාපණතො**, අතුරු අවුණෙන්-[17]අංගාණියෙන් යනුයි. **එවං**, මෙසේ කල්හි; **වාලිකාං උස්සාපෙත්වා**, ගොඩ ගොඩ කොට වැලි කැටි කොට; **සාඛාභඞ්ගං**, 'භග්ගසාඛං' යු සේයි—කඩන ලද අතු නොහොත් අතු කඩා; **පණ්ණපුඤ්ජෙන**, පත් ගොටුයෙන්; **නිස්සන්දෙන**, මුඛ්‍ය ඵලයෙන්; **සබ්බඤ්ඤුත—පෙ—භොතු** යනු සර්වඥතාඥනයත් මුඛ්‍ය ඵලකොට තැකූ

---

1 ඵලය D. 2 මෙත් A. 3 සයනු ACD. 4 සරාගො-A. අනික් පොත්හි නොපැනේ. 5 අට්ඨසු-මු. අ. ක. 6 එවමෙව-මු. අ. ක. 7 කියන්නෝ-හැම. 8 කුම්මාසපිණ්ඩි-හැම. 9 පැස BCDF 10 ලද්දේ A. 11 විමසිය යුතුයි. 12 පියා-පෙ-හැම. 13 යවා C. 14 පුබ්බුට්ඨායිකාදීහි-හැම. 15 අලොණිකං අඵාණිතං-මු. අ. ක. අලොණිකං ඵාණිතං ඵාණිත BCDF, 16 නොමිහිරිවූය CD. 17 අගාහියෙන්-හැම.

බැවින් කියත්; [1]ඨානං, [2]එතැන හෙවත් [2]එතැන කල ඒ පුණ්‍යකර්මය; **පසන්නාදාසෙ**, පහන් [3]කැටපතෙක්හි; **සුවණ්ණපිණ්ඩකං**, රන් පුඩු ඇති; **කඤ්චනමාල**, [4]රන්මලොලඹු ඇති; **තිස්සො චෙතනා**, පුරිම චෙතනා මුඤ්චන චෙතනා අපර චෙතනා යන මේ චෙතනාත්‍රය. පුරිමචෙතනා නම් දානොපකරණ සොයන කාලයෙහි චෙතනාවයි. මුඤ්චන චෙතනා නම් දානය පිළිගන්වන සමයෙහි ලොභාදීන් අභිභවනය කොට උපදනා චෙතනාවයි. අපරචෙතනා නම් 'දුක්කරං මයා [5]කතං'යි දානය ප්‍රත්‍යවෙක්ෂා කොට පසුවැ සොම්නස් උපදවන චෙතනාවයි. **විසොධෙත්වා** යනුයෙහි පුරිමචෙතනාව මාත්සර්‍ය්‍යමලාදිය සොයනු. මුඤ්චන චෙතනාව [6]ලොභාදීන් අභිභවනය කිරීම් වශයෙන් [7]සොයනු. අපරචෙතනාව 'දුක්කරං මයා' යන ඈ විසින් පශ්චාත්තාපය මැඩ සොයනු; **පරිච්චජනකිරියාපි**, පරිත්‍යාග කිරීමද; **පරිත්තා[8]නාම**, විපාක වශයෙන් මහත් හෙයින් ස්වල්පවූ පරිචරියාවක් නම්; [9]**ඵලපාටිකඞ්ඛිනා**, 'ඵලං ඉච්ඡන්තෙන' යූ සේයි; 'කාමො - [10]ඉච්ඡිතො වණ්ණො කාම වණ්ණො, සො එතස්ස අත්ථීති' **කාමවණ්ණී** යනු වේ. [11]කැමැති කැමැති වර්ණ ඇත්තාවූ නොහොත් කැමැති කැමැති [12]රූ මවන්නාවූ—'ඉච්ඡානුරූපවෙසධාරී' යනුයි; **මුත්තාදිධනං ච**, මුක්තා මාණික්‍ය වෛඩූර්‍ය්‍ය ශඞ්ඛ[13]ශිලා ප්‍රවාල[14]මසාරගල්ල යන ධනද; [15]**සත්තවිධධඤ්ඤානි ච**, 'සාලි වීහි යවො කඞ්ගු කුද්‍රූස වරක ගොධුමා' යන සප්ත ප්‍රකාරවූ ධාන්‍යද. සාලි නම් හැලැ. වීහි නම් වීයැ. යව නම් යවයැ. කඞ්ගු නම් තණයැ. කුද්‍රූස නම් හමුයැ. වරක නම් වරායැ. ගොධුම නම් [16]ගොධුම්. **මච්ඡෙරමලං**, මසුරුමළ; **චිත්තං**, සිත; **පරියාදාය**, වැළඳ ගෙනැ; **චරිමො ආලොපො** යනුයෙහි අර්ථයි 'චරිමං කබලං' යනු. කෙළවර ආලොපය—අවසන්හි පිඩය යූ සේයි; **තතොපි**, 'චරිමකබලතොපි' යූ සේයි; **අසංවිභජිත්වා**, 'පරෙසං විභජ්ජ අදත්වා' යූ සේයි; **පානාගාර** නම් රා බොන ගෙයයි; **ගීතස්ස** යනු 'න කිරන්ති' යනාදි දෙගය සඳහා [17]කියා. **මය්හං න කිඤ්චි නත්ථි**, මට එසේ නැති දෙයෙක් නැත—සියලු වස්තුමැ මාගේ ඇත; **අත්ථං කථෙත්වා දෙථ** යනුයෙහි කථන ක්‍රියාව

1 මූ. අ. කථාහි නොපැනේ. 2 එතෙන-හැම. 3 කැඩපතෙක්හි C. 4 රන් ලෝලඹු A. රන්මලෙලොඹු CD. 5 කතං දානය CD. 6 ලොභාදී A. 7 සොදනු A. 8 නාම-හැම. 9 ඵලුපපත්තිං පාටිකඞ්ඛමානෙන.-මූ. අ. ක. ඵලපාටිකං CD. 10 ඉච්ඡතො CD. 11 කැමැති A. 12 රූප CD. 13 සීල CD. 14 මසාරගල්ලය A. 15 සත්ත A. 16 ගොධූම් CD, 17 කීය A.

හා දූත ක්‍රියා දෙකම මැ 'අත්‍ථං' යනු නම් වේ. 'අත්‍ථං කරෙය්‍යා අත්‍ථං දෙථ' යනු වේ; කාකවනහද්දපිඨං, රන්පුටුවක්; තුසසි ඣා, [1]සතුටු සතුටුවැ; [2]ගායන, [3]එක්වන් කියන; ඉදං රජ්ජං, මේ රාජ්‍යශ්‍රී; [4]පරමෙවතානහනො, අනුන් [5]බැල මේ කොට ලත් වියදමින් ජීවත්වන්නාවූද මම්; එකවිසතියා [6]අනෙසනෙහි යන්නෙහි එක්විසි අනෙසුන් නම් 'ඉධෙකච්චො වෙළුදානෙන වා පත්තදානෙන වා [7]පුප්ඵඵලසිනානදන්තකට්ඨදානෙන වා [8]චාටුකම්මතාය වා මුග්ගසූපතාය වා [9]පාරිභට්ටකතාය වා ජඞ්ඝපෙසනිකෙන වා [10]අඤ්ඤතරඤ්ඤතරෙන බුද්ධපතිකුට්ඨෙන මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙති'යි මෙසේ කියන ලද දසයද 'ආජීවහෙතු පඤ්ඤත්තානං ඡන්නං සික්ඛාපදානං [11]වීතික්කමස්ස වසෙන'යි කියන ලද සයද [12]'කුහනා ලපනා [13]නෙමිත්තිකතා නිප්පෙසිකතා ලාභෙන ලාභං [14]නිජිගිංසනතා' යන පසද මේ හැම එක්විසි [15]අනෙසුන් නම්. එහි [16]පත්‍ර දාන නම් [17]පලා ආදි දීමයි. සිනාන දාන නම් [18]නහානාවූ සනානචුණ් දානයයි. චාටුකම්මතා නම් [19]සවුල කම් කිරිමයි මුග්ගසූපතා නම් සිත් ගන්නා පිණිස බොරු සබායෙන් යුක්ත තෙපුල් කිණීමයි පාරිභට්ටකතා නම් සිත් ගන්නා පිණිස දරුවන් [20]සැනීමයි ජඞ්ඝපෙසනිකා නම් මෙහෙවර කොට ඇවිදීමයි. නෙමිත්තිකතා නම් ප්‍රත්‍යය උපදවා ගන්නා පිණිස අනුන්ට කියන කරන නිමිත්ත සලකුණුයි. නිප්පෙසිකතා නම් දූත කර්මාන්තයි. [21]එකාදසහගිනිබ්බානෙන ච, රාග දෙස මොහ ජාති ජරා මරණ සොක පරිදෙව දුක්ඛ දෙමනස්සුපායාස යන මේ එකොළොස් ගිනි නිවීමෙන්; කාමාසවාදි යනුයෙහි ආදි ශබ්දයෙන් [22]භවාසව දිට්ඨාසව අවිජ්ජාසව ගතයුතු. [23]නියස්ස එලං, මුඛ්‍ය ඵලයි; පුලලිනං, සම්ෘද්ධවූ; පතිරූපදෙසවාසාදිකං යනුයෙහි ආදි ශබ්දයෙන් සත්පුරුෂ [24]සෙවා සෘත පුණ්‍යතා ආත්ම [25]සම්‍යක් ප්‍රණිධි ගතයුතු. ථාමං, [26]වීර්‍ය්‍ය; 'අරාතං හතත්තා අරීනං ච හතත්තා'යි යොදනු. අරානං,

1 සතුටුළුවැ සතුටුම්වැ A. 2 යනා A. ගායනා BCDF. 3 එක්වැ A. 4 පරමෙවතාන හනකො A. 5 බැලමේලත් A. බැලමෙහෙ කොට ගත් D. 6 අනොසනෙහි-මු. අ ක. 7 පුප්ඵවල B. පුප්ඵඵසී CDF. 8 චාටුකම්‍යතාය BC. 9 පාරිභටටකථාය D. 10 අඤ්ඤතරපභිකුට්ඨෙන A. 11 වීතික්කාම්මස්ස-හැම. 12 කුහනාලපනා AC. කුහනාලපනා D. 13 නෙමිත්තකතා AD. 14 නිජිගිංසනා A. ජිගිංසනතා BCDF. 15 අනෙසනා CD 16 ප්‍රත්‍ය CD. 17 පතආදි A. ඵලආදි D. 18 නාහනාවුණ් BCDF. 19 සවුලුකම් කීමයි A. 20 නැසීමයි C. 21 එකාදසඅග්ගිනිබ්බාපනෙන ච-මු. අ. ක. 22 කාමභවාසව A. 23 නියස්ස නාම මුඛ්‍ය A. 24 සංසෙවාදි CF. 25 සම්‍යග් ප්‍රණිති A. 26 වීරිය CDF.

සංසාර නැමැති චක්‍රයෙහි [1]කුශලාකුශල නම් නැමැති දැවි; **අරිනං**, කෙලෙස් නැමැති සතුරන්; **හතත්තා**, නසන ලද බැවින්; **අග්ගදක්ඛිණෙය්‍යත්තා**, උතුම් දක්ෂිණාවට නිසි බැවින්; 'අග්ගදක්ඛිණං අරහන්තීති අග්ගදක්ඛිණෙය්‍යා' යනු වේ. **ලීලාවිලාසෙන වා**, 'ලීලාසඞ්ඛාතෙන විලාසෙන වා'යි යූ සේයි; **උද්ධරිත්වා**, උදුරා වෙන් කොට; **තණ්හං මිලාපෙත්වා**, තෘෂ්ණාව නසා; **තව පාදෙ පරිචරමානා**, තොපගේ ශ්‍රී පාදයෙහි මෙහෙ කරන්නෙම්.

### 415. [2]කුම්මාසපිණ්ඩජාතකං.

---

[3]**සිලෙ පවිජ්ඣි**, ගිජුකුළු පව්වෙන් බුදුන් මරන පිණිස ගල් හෙළූය; **තාසමත්තම්පි**, භය මාත්‍රයකුදු; **පතිසල්ලීනෙසු**, හැකුළුණු සල්හි; [4]**උදකනිද්ධමනෙන**, වාරිමාර්ගයෙන්; **අද්ධිකමනුස්සා**, ගමනී මිනිසෙක්; **සභාගට්ඨානෙ**, නිසි තැනෙක්හි-සෙනග වන්නට සුදුසු තැනෙක්හිය යනුයි; [5]**අභිණ්හසංසග්ගවසෙන**, අනවරත සමාගමයෙන්; **අතිචරි**, අනාචාර කළා; **භූම්‍යං නිබ්බාහිති**, බිම වළ කැණ පියා [6]වළලාපියවයි කීවූ; [7]**ගිතගිකො**, වෙසෙසින් බිය පත්වූයේ; **ආවාටෙ** [8]**නිඛාතනභාවං**, වළ ලූ බැව්; **උස්සන්නාසිවිසෙ**, [9]බොහෝවූ ආශීර්විෂයන් ඇති; **බ්‍රාහ්මණියා**, බැමිණිය විෂයෙහි; **සල්ලක්ඛිතං මෙති**, මා විසින් සලකන ලදුයි—[10]නිද්මන නොසලකා නිකම් කියා පිමියි සිටිමියි සලකා ගතිමියි; [11]**අසිතාපඞ්ගි**, අඳුනෙන් තිල්වූ ඇස් කෙළවර ඇත්තිය; **විප්පටිපජ්ජිත්වා**, පිළිබඳ සිත් ඇතිවැ අනාචාර කොට; **යෙනන** යනුයෙහි 'තෙ' යනු 'පිතු' යනු හා සම්බන්ධ කරනු—තපියාට යයි යනුයි; **යෙන**, ඒ පරන්තපයා විසින්; **ථරුගහණං**, කඩු අල්වා ගන්නා සේ; **සික්ඛාපෙසි**, හික්ම වී—ඉගැන්වීය යනුයි.

### 416. පරන්තපජාතකං.

---

## දුතියො වග්ගො.

---

## සත්තකනිපාතවණ්ණනා නිට්ඨිතා.

---

1 කුශලසාම් CD. 2 කුම්මාසපිණ්ඩි A. 3 සිලං-මූ. අ. ක. 4 නිද්ධමනෙන-මූ. අ. ක. 5 අභිණ්හසංසමග්ග A. අභිනන CD. 6 වළළු A. 7 ගිතනසිතො-මූ. අ. ක. 8 නිඛාතභාවං-මූ. අ. ක. 9 බොහෝ BCDF. 10 නිද්මන නොසලකන ලද කානී නම් කියා පිමි සිටිව සලකා CDF. 11 අසිත අපඞ්ගි-මූ. අ. ක.

**මාතිදෙවතො හුත්වා**, මව මැ දේවතා කොට ඇත්තේ; [1]**ධූමකාලෙ**, මළ කල්හි; **උම්මුජ්ජිත්වා**, කිම්දු හෙවත් මූසවැ පැවැතැ; **උජ්ඣ පෙත්වා**, [2]උදවාපියා; **අවමානං**, කළ කළ දෙය නොකැමැතිවීම් වශයෙන්වූ [3]අවඥව; **පටිච්ඡන්නානං**, ඉක්බිති ගෙයි ඇත්තවුන්ට; **අභියරිත්වා**, ගෙන හැර; **කිච්චං** [4]**නිෂ්පිතුං**, කටයුතු කරන්නට; **භගවා**, සර්වඥයෙනි; **ධම්මො මතො** යනු [5]ජේටඨ්‍යපචායනාදිවූ ධර්ම්ය ලොකයෙහි නැතැයි ගෙනැ තැත්හා නම් එන්නේ මළෙන් වේද යන [6]බුද්ධින් බෙදවැ කියා; [7]**තිලපිට්ඨඤ්ච**, තල සුනුද නොහොත් තලමුරු වටද; **පමනඵාලිකාඤ්ච**, බත් පිසන [8]සැළියද; **දබ්බිඤ්ච**, සැන් දද; **තිශි මනුස්සශිශෙයි උද්ධනං කත්වා**, මිනිහිස් තුනකින් ලිපක් ඉදිකොට; **උදකං ඔරුය්හ**, දියට බැසැ; [9]**සාටකං විකත්වා සෙළුං**, හන්කඩ දියෙහි [10]සෝධා [11]හැද ගෙනැ; **තිලොද නෙන**, තලබතින්; **තිවිධසුචරිතධම්මො ච**, කායසුචරිත වචී සුචරිත මනොසුචරිත යන ත්‍රිවිධ සුචරිත ධර්මයද; [12]**ධම්මවරං** යනුයෙහි අර්ථයි ‘උත්තමධම්මං’ යනු; **අත්තානං** [13]**උත්තම ධම්මං කත්වා**, ධර්මාත්මක හෙයින්ද ලොකයහට ධර්මය ප්‍රකාශ කරන හෙයින්ද තමාම උත්තම ධර්ම කොට; **සුණ්හා**, යෙහෙළි; [14]**නාසො**, [15]ඒ ධර්මය මළ බැවෙහි; **අහං** යනු ශොචනාර්ථයෙහි නිපාතයි. **හි** යනු නිඤයි; [16]**එතං ච තෙ** [17]**රුච්චතු**, මේ [18]**මා මතු** කියන්තාවූ [19]දෙය තට රුචි වේවා; **නානා**, [20]මුනුබුරේදැ—

417. කච්චානිජාතකං.

---

**අභිනිශබ්ඛාශසද්දං**, මේ අසෝ [21]ශබ්දයෙකැයි කියා මෙසේ [22]නොතෝරා ගත හැකි ශබ්දයක්; [23]**රාජනිවෙසන සාමන්තා උයානෙ**, රජගෙට සමීපවූ උයනෙහි; [24]**සුණපාණකො**, ගුල්ලෙක්; [25]**පොසාවනිකා**, [26]වඩන නොහොත් වසන; **මිගො**, මුවා; **සචෙපි අඤ්ඤං කිඤ්චි න භක්ඛති**, ඉදින් [27]ගම් අන් කිසිවෙක් නොවේ නමුත්.—[28]අන් කිසි යම් වස්තුවෙක් සම්භව නොවේ නමුත් යනුයි; [29]**නිස්සන්දං**, ඵල;

---

1 මහකාලෙ BCDF. 2 දවාපියා A. උපදවාපියා BD. 3 අවජානවැ A. 4 නිප්ඵාදිතුං-හැම. [5]ජෙට්ඨාපචායිකො A. 6 බුද්ධීන්ගේමද කියා A. බුද්ධීයෙන් බෙදවයි. BD. 7 තිලපිට්ඨිං BCD. 8 තලිය CDF. 9 මුඛං-මු. අ. සා. 10 සෝද BCD. 11 ගෙන A. 12 ධම්මං චරං-හැම. 13 උත්තමං A. 14 එත්-මු. අ. සා. 15 මේ BCDF. 16 එතංමව A. 17 රුච්චති-මු අ.සා. 18 මතු BCD. 1 දෙයට රුචි A. 20 මුනුබුරෝ A. මුනුබුරා D. 21 ශබ්දයයි C. 22 තෝරා නොගත D. 23 රාජනිවෙසනසා-මු. අ. සා 24 සුගුන CD. සුගුණ BF. 25 පොසාවනිය-මු. අ. සා. පොසනිකා A. 26 වසන-හැම. 27 අන් යම් CD 28 අන්ක් කිසි CD. 29 නිප්ඵත්ති-මු. අ. සා. නිස්සන්ද ඵලං BCD.

නලාටෙ සිඛං බන්ධිත්වා, දන්තා බවට සලකුණු පිණිසැ නලල [1]හගක් බැඳ ගෙන; [2]සුතපච්චයා, 'සුතස්ස-සවනස්ස පච්චයා' යූ සේයි-ඇසූ හෙයින් යූ නැති; ජිඝච්ඡාපරෙතො, සයින් පෙළෙන්නේ; නින්නමාහු, දියෙන් ගැඹුරැ විය; බකරාජස්ස සී බකයා තමා පියා අපෙක්ෂායෙන් කියා—[3]ම පියවූ බකරාජයාටය යනුයි; උදකතුම්බෙන, 'උදකපනාලියා' යූ සේයි; හත්ථිමෙණ්ඩො, ඇත් ගොවු; ඓළගූ, පිට තොවුල්; නාසස, ඒ ගුළු [4]පණුවහට; ඓළගුයා, ඓළගුවගේ; යාව, යම්තාක් තැන්; නිප්ඵත්ති අභාවෙ, ආහාරවැ ප්‍රතිෂ්ඨාවීම් වශයෙන් [5]නිෂ්පත්තිවීද නිෂ්ඨාවීද හෙවත් ආහාරවැ ප්‍රතිෂ්ඨාවීම් වශයෙන් [6]ප්‍රවෘත්තවීද; සා යබ්බා, ඒතාක් ඔහට ආහාරවැ ප්‍රතිෂ්ඨාවීම් වශයෙන් ප්‍රවෘත්තවූ ඒ සියලු ඓළගු තොම; අනන්තානං [7]රමිස්සාමි, කවර දවසක් රමණීයවූ වනයෙහි ඇළ වම්ද; [8]සුඛනනිසෙනා ගුහා, යහපත් කොට කරන ලද නිවාසස්ථාන ඇතිවැ නොහොත් [9]ආලය ඇතිවැ; [10]බාහිරක රට්ඨවාසී, පිටිරට වසන්නාවූ; තුඬග, උස්වූ; ඔච්නතනා, නඩා රැස්කරන්නාහු නොහොත් සිඳුනාහු; අපඞ්කලෙපනා, නොපැකිලෙන්නෙහි; [11]අන්ධකාරෙ තමෙ, අන්ධකාරවූ තමස්හි—ඝනාන්ධකාරයෙහිය යනුයි; ෂා පාදං බනි, තොපගේ පය ගල්වල ගසා නහමක් [12]පළවූ; අස්මනි, ගල්හි; න ඛඤ්ඤති, හැණ් ගැසී නො[13]පැළේද; 'ඛනු-අවදාරණෙ' යන ධාතුයි. ඛන්ධභාරං, පඤ්චස්කන්ධ සංඛ්‍යාත භාරය; පුනබ්භවාය, පුනර්වයෙහි උත්පත්තිය පිණිස පවත්නාවූ; සාධුකීළං, මනා කෙළි; සබ්බගන්ධවිකතෙසා, සඳුන් කළුවැල් ආදී සියලු සුගන්ධ ද්‍රව්‍යයෙන් කරන ලද සුවඳ දර සෑයෙහි; [14]සරීරනික්ඛෙපං [කත්වා,] [15]ගළ කිස කොට—

41ඁ. අට්ඨසද්දජාතකං.

විස්සමනට්ඨාය, සැනපෙනු පිණිසැ; උස්සීසකවාති, නහයි; ආනිසදං, ඉඳුම කෙරෙහි; 'ආ නිසීදන්ති එතෙනාති ආනිසදෙ-තං ආනිසදං' යූ සේයි. ආසුම්භි, හෙළා [16]පහළැ; මනමහි, සැණෙකින්; ධානුපස්සන්තිනපඤ්ඤසං, ඇසිල්ලේ

1 අහක් A. 2 සුතපපච්චයා BCD. 3 මපියාවූ A. 4 පණුවාහට A. 5 නිෂ්පත්ති වීද හෙවත් A. 6 ප්‍රවෘත්තවූ ඒ සියලු ඓගගුනතාම BCDF. 7 මාරයිස්සාමි-හැම. 8 කනනිසෙනා-මු. අ. ක. 9 ආදර A. 10 බාහිරකාට්ඨවාසී-මු. අ. ක.11 අන්ධභාවකාරකො-මු. අ. ක. 12 පළමු CD. 13 පෙළේද BCDF. 14 සරීරං ඛාපෙත්වා-මු. අ. ක -හැම.15 අළ C. 16 පහළ BCF.

සිතාගත් ප්‍රඥයෙන්-ඇසිල්ලෙහි ඒ ඒ උපාය සිතන්නට [1]තිබූ නුවණින් යනුයි; [2]වණ්ණදසී නම් වෙලෘාවෝයි; **සහසෙසන රතනිං භජන්ති**, එක් පුරුෂයකුත් [3]මනාවරත් රැකනට දහසක් ගන්නීයි; **ගුම්බං**, බල මූළු; [4]**ආඝාතනං**, මරන තැනට; **සඤ්ඤාපයාමි**, පොහොසත් වූයෙම් වීම් හැඟි—හරවා ගත හිනිම් නම්ය යනුයි; [5]**පටිස්සුණිං**, ගිවිස්සෙම්; [6]**ගිංස පෙති**, බවයි; [7]**අහනනබ්බා**, නොමරා; **න චාහං** [8]**අනුජානාමි**, නී කියන [9]යමක් ඇත් නම් ඒ අනුනොදනිම්; [10]**ධනමාහනං**, නී මෙතැනට ගෙනා යම් වස්තුයෙක් ඇත් නම් ඒ හැම තිගේ උතුරු සළුයෙහි පොදිකොට තබා ලයි කී; [11]**ඨානුප්පත්තිකකාරණං පවිලගිත්වා**, ස්ථානොත්පත්තික ප්‍රඥව ලදින්-ස්ථානොත්පත්තික ප්‍රඥයෙන් ඇසිල්ලෙහි උපායක් සිතා ගෙනැය යනුයි; **යතො**, යම් තැනෙක පටන්; **අභතාහං**, මා; **සරාමි**, සිහි කෙරෙම්ද—යම් තැනෙක [12]පටන් මම් කි බිණු බව දනිම්ද එතැන පටන් [13]මා පුරුෂයන් හා එක්වන මානයේශ යනුයි; **උපගුහස්සු මනති**, මා සිප [14]ගතැයි; **පාදපිට්ඨියං ඨිසං ඨපෙත්වා**, දෙ පත්ල පිට ඉස තබා-ඉදිරියෙන් වැද; **බාහාපසෙස**, දෙඅත ඇලයෙහි; දවීසු [15]**පජ්ජාහාමෙගසු**, පිටතින් දෙඅතක් කර අල්වා ගෙනැ; **සතපොරිසෙ**, [16]සිය මිනිස් පමණ ඇති; **නිරයෙ**, අපගතවූ වෘද්ධි ඇති හෙයින් නිරය යයි කියන ලද ප්‍රපාතයෙහි; **පූරිතධනුස්මිං**, නන දක්වා [17]අයා ගත්තාවූ දුන්න ඇති කල්හි—දුන්න [18]කන පුරා අයා ගත් කල්හිය යනුයි. එම කියති මත්තෙහි '[19]ආකණ්ණපූණ්ණධනුසම්'යි.—

## 419. [20]සුලසාජාතකං.

**පාගුණෙයාභා**, අමුත්තෝ; **සිසං විවරිත්වා**, [21]හිස් වසා පෙරෙව් සිවුරුපට හිසින් පහකොට; **සරං** [22]**ලුඤ්ඤවි**, ඇගින් ශරය තුදුරා හයාපී; **අනුකම්පිත්ථාති**, අනුකම්පා කළවූ දුයි විවාළේ; **රාජවතනං**, රජසිරිත්; **අවෙක්ඛිත්වා**, දූත නොහොත් විචාරා; **අට්ඨවත්තුකාදිභෙදං දණ්ඩං**, අට කහවණුවක් ගන්නා දඩය සොළොස් කහවණුවක් ගන්නා දඩය යනාදීවූ විභාග ඇති දඩ; **පරයත න පතෙයාක්‍ෂ**, අනුන්ට [23]නොයොදන්

1 නිසිය යනුයි BCDF. 2 වණ්ණදසීහු BCF. 3 සාරා-හැම. 4 ආඝාතං-මූ. අ. ක. 5 පටිස්සුණිං-මූ අ. ක. 6 භයාපෙති A. 7 අහන්තබ්බාති-හැම. 8 අභිජානාමි-මූ. අ. ක. ආජානාමිහි ACD. 9 යමෙක්-හැම. 10 ධනාමාභනහාති-හැම. 11 ඨානුප්පත්ති-කාරණං-මූ.අ.ක. 12 සිටන් සබඳ නිම්ද CD. 13 මා පුරුෂයන් එක්වන සේශ යනුයි A. 14 ගනිම්යි C. 15 පළජාබාහෙසු BF. 16 සියක් BCDF. 17 පුරා අයා BCF. ගායා D. 18 සාරණ D. 19 ආකාඩ්ඪිතපුණ්ණ-මූ. අ. ක. 20 සුලස-හැම. 21 හිසින් වසා BCDF. 22 මූඤ්චි CD. 23 නොයදන්නේයි CD.

හෝයි; නානානයං, [1]යුක්තායුක්ති; [2]අහෙතුකො ති දණ්ඩං, නිවරදෙහි දඬ; කිලෙසසන්තතියක්ඛව, කෙලෙසුන් [3]සන්හිඳී චීමෙහිද; සොරමෙව යනු යෙහි අථියි [4]'සොසිලජ්ජසඞ්ඛාතො' යනු; නරානක්ඛව පමදනක්ඛව, 'පුරිසාන ඤ්ච දුජ්ජිනක්ඛව' යු සේයි; මා විජහි, ඒ ශ්‍රියද—ලක්‍ෂ්මියද—නහමක් [5]හරු—දුරු කොකොට බොහෝ කලක් සපිර [6]කරනුයි.

## 420. සුමඞ්ගලජාතකං.

බණ්ඩුපොසථකම්මං, කඩ [7]පොහෝ—[8]දවස් මුළුල්ලෙහි නුවූ හෙයින් කඩ [9]පොහෝ නම්; වච්ඡපාලකාපි, වස්සන් රක්නා [10]වසු ගොපල්ලෝද; ජ දිවසෙ යනු සාර පොහොයෙහි [11]දෙ විසේනි එවි දෙ එකොළොස්වක් ගෙනැ කියත්; සුබ්බඡො හුත්වා, සීකරුවැ; උරං දත්වා, ළ දී—ළ ඇතිවැය යනුයි; අත්තනො කිලමථං අගණෙත්වා, තමාගේ පීඩා නොවිචාරා; ඡණං, [12]පෙශෂථොනසවය; භත්තකාරිකා, බත් දෙන තැනැත්තී; [13]පාතියා භත්තං වඩ්ඪෙත්වා, තලියෙහි බත් ඇවිසැලා; සත්ථකවාතා, බඩ සතින් කපන්නාසේ පහරන රුජාවෝ; සමුට්ඨහිංසු, පහළවූ; [14]ජීවිතපරියන්තං කත්වා සමාදියිං යනු මෙතැන පටන් ජීවිතාන්තය දක්වා [15]රක්‍ෂා කෙරෙමියි කියා මෙසේ තමා සමාදන්වූ හෙයින් හෝ කීය. නොහොත් [16]මාගේ ජීවිතය යේ නමුත් ශීලයට අනතුරක් නොකෙරෙමියි කියා මෙසේ [17]තමා සමාදන්වූ හෙයින් හෝ කීහු; නීහරිත්වා, ගෙන් පිටතට කොට ගෙන හැර; ඔකාරකෙ, තිසවත්තෙහි; කිළා පසුතො, කෙළියෙහි බද්දේ—තත්පරවූයේය යනුයි; උදකභතිං, [18]දිය බැළ—දිය බැළ නම් බැළයට දිය ඇදීමයි. [19]අඩ්ඪමාසකං, [20]වියට සමාරක්—[20]වියට භාගයක්ය යනුයි. දෙ[20]වියටකැයිද දෙ[20]වියට සමාරකැයිද සතර [20]වියටකැයිද [21]කියත් මැයි. [22]පාකාරපිට්ඨිකාය අන්තරෙ, නුවර [23]පවුරේ උළු අතුරෙහි; නගරෙ, ඒ [24]නුවරමැ දක්‍ෂිණද්වාරයෙහි; මාසකො හොති, [25]මාසකයෙක් වෙයි—[26]වියටෙක් වෙයි යු සේයි;

1 යුක්තායුක්තියි A. අයුක්තායුක්ති D. 2 අහෙතුකං දණ්ඩං-මු. අ. ක. අහෙතුං දණ්ඩං BCDF 3 සන්හිදවීමෙහි BCF. 4 සුසීලය-හැම. 5 හැර නොකර BCDF. 6 නොකරනුයි A. 7 පෙහේ A. 8 දවස CD. 9 පෙහෙ CD. 10 චවුත්ගොපල්ලෙද BF. චවුත්ගොල්ලොද CD. 11 දවිසෙනි CD. 12 පෙශෂථොනසවය AC. 13 පාතියං-මු අ. ක 14 ජීවිතපරියන්තිකං CD. 15 පෙගසථොනසවය රක්‍ෂා A. 16 තමාගේ AD. 7 තමත් D. 18 දියබැලයට දිය ඇදීමයි CD 19 අඩ්ඪභාගං C. 20 විට BD 21 කියත් A. කීයයි මැයි CD 22 පාකාර පිට්ඨිකාය BCDF. 23 පවුර A 24 නුවර මැද BCDF. 25 මාසකයෙක් වියටෙක් A. 26 වියටෙක යු සේයි CDF.

'අඩ්ඪමාසක' යයි කියා දෙවියට සමාරක්ද සතර වියටක්ද ගත් පක්ෂයෙහි **මාසකො හොති** යනුයෙහි මදටෙක් වෙයි කියා අර්ථ ගතයුතු. මදටෙක් නම් සතර වියටෙක් වෙයි, පස් [1]වියටෙකුත් වේ, අට වියටෙකුත් වේ. **කාසාවනන්තකනිවාසනෙනා**, කසට රැඳු පිලිකඩ හන්නේ—සාළු දූ කඩරෙද්දක් [2]ඇඳ ගෙනැයි යනුයි; [3]**අයොගවනෙතතක**, ග්‍රාම්‍ය රාගයකින්; **ජාරිකා** යයි ද **කුඹකුල** යයි ද හළු මැයි; **සො නාම තෙ අපොසාති**, යට කී තාගේ ඒ කටයුතු නම් තවරේ දූයි; **හදයං න විජහති**, ළෙන් පත නොවන්නේය; **අඩ්ඪා**, කහවණු භාගයෙක්ද; **පාදො**, දෙ අකෙක්ද; **චත්තාරො මාසකා**, සතර වියටෙක්ද නො හොත් මදටෙක්ද; මම ගමනං [4]**අභාසෙපඤ්ච**, මාගේ ගමන පියස් නො කොට; [5]**අබ්බහිත්වා**, කොපුයෙන් හැර ගෙනැ; **පවෙසෙසි**, කොපුයේ ලී; [6]**කාමමූලං**, කාමයාගේ මූලය—කාමයාගේ මූලය නම් [7]කාමසංකල්පනාවයැ. හේ කාමයාගේ උත්පත්තියට පෙළෙඹීමට [8]ප්‍රවෘත්තියට කාරණ වන හෙයින් මූල නම් වී. **අයං**, මේ කාමය තෙමැ; **ජගහෙතො**, ප්‍රමාද නිද්‍රාව දුරැ කරන්නේ; [9]**අපරියන්තා**, නො සැහෙන්නාහ; **අහො** යනු ඛෙදයි; **ඉමෙ**, මේ කාමයන්; **පරිඤ්ඤප්පහානාභිසමයෙන**, සකන්ධ පඤ්චකය තීරණය කරන්නාවූ තීරණ පරිඤ්ඤ යයි කියන ලද විදර්ශනා ප්‍රඥයෙන් හා ක්ලෙශයන්ගේ සමුච්ඡෙද ප්‍රහාණය කරන්නාවූ මාර්ග ඥානයෙන්; **අභිසමෙත්වා**, දැනැ; **තං උදානං සකලං කත්වා**, ඒ තමාගේ අඩීවූ "අප්පස්ස කාමස්ස ඵලං මමෙදං" යන මේ උදානය දැන් සම්පූර්ණ කොට—අතික් තුන් [10]පාදයකින් යුක්ත කොට; [11]**මඞ්ගලනහාපකො**, මඟුල් කපුයෙක් නොහොත් මඟුල් කරනැවැමියෙක්; **ඛුරපරිකම්මං**, කරකම්; **සණ්ඩාසෙන**, නාසා [12]හඬියෙන්; **ලොමානි ගහෙත්වා**, නාසා ලොම් උදුරුවා; **ඤාතිභොගපරිවට්ටං**, 'ඤාතිපරිවට්ටං භොගපරිවට්ටං' යි යොදනු. ඥාති[13]වර්ගයාද භොග[13]වර්ගයද නොහොත් නොඑක් භොග රාශියද යනුයි; **හිනජච්චො**, හිනවූ ජාති[14]ඇත්තාවූ; **මලමජ්ජනො**, ඇඟ රොමාදිවූ මල [15]හරන; **සොරච්චස්ස**, සංවර ශීල සඞ්ඛ්‍යාතවූ

1 වියටකුත් A. වියටෙක් D. 2 තවද A. හැද BCDF. 3 අයොවගනෙතක-මු අ. ක. අයොගෘවනෙතක A. 4 ආභාපෙසඤ්චා-මූ. අ. ක. 5 අදාභිත්වා A. බොහිත්වා CD. 6 කාමස්සමූලං-මූ අ. ක. 7 කාමයාගේ සංකල්පනාවය A. 8 ප්‍රවෘත්ති කාරණ BCDF. 9 අල. පර්යන්තා-මූ. අ. ක. 10 පාදයක් CD. 11 මඞ්ගලනාහාපිතො-මූ. අ. ක. 12 හැඬියෙන් A. 13 වර්ගද C. 14 ඇත්තේ A. ඇත්තාහු BCF. 15 හරනාවූ BCF.

[1]පුරතභාවයාගේ; **පස්සථ අම්මාති,** බැලුව [2]මැතව අම්මයි; **තුමෙහ,** තොප; **නාමෙන,** තමින් හෙවත් නම කියා; [3]**ආල පිතුං,** කැඳවන්නට. 'එවරූපස්ස ගිහපච්චස්ස අයුත්තං'යි අනුසන්ධාන කරනු. **අගාරිකා** මුනිහු නම් [4]ගිහිවූ [5]ප්‍රව්‍රජ්‍යා ලිඞ්ග යෙහි සිටි [6]ආයසීයෝයි; **අනගාරියා** මුනිහු නම් [5]ප්‍රව්‍රජ්‍යායෑ සිටි [6]ආයසීයෝයි; [7]**සෙක්ඛ** මුනිහු නම් තුන් මාගීසථ ඵලසථ යන් හා අහීත් මාගීසථයෝයි; [8]**අසෙක්ඛ** මුනිහු නම් අහීත් ඵලසථයෝයි; **පච්චෙක** මුනිහු නම් පසේ [9]බුදුහුයි. [10]**මොන පථෙසු,** මොනපථ නම් මුනීන්ගේ පූර්වභාග ප්‍රතිපත්තියෑ—එසේවූ ඒ පූර්වභාග ප්‍රතිපත්තියෙහි; **සික්ඛමානං,** හික්මෙන ලද්දාවූ—

## 421. ගඞ්ගමාලජාතකං.

**අජ්ඣාකාරං,** [11]නීවවූ වෘත්ති යූ සේයි; **සුපරිහාරං,** 'සුඛෙන පරිහරිතබ්බං' යූ සේයි; **ඨානන්තරං පන පුත්තස්ස** [12]**දස්සෙමි** යනු ඉදින් ඒ ස්ථානාන්තරය තමන් නො [13]කැමැත හොත් මා හුන් කල මට [14]දෙවූවම්මනා වේද එසේ මට නො දෙවා තමන් පුතණුවන්ට දෙවූවා නම් වන්නේ [15]තමන්මෑ කරන නියා වේද එහෙයින් තමන් පුතණුවන් කරන ස්ථානාන්තරය බැණෝ තුමූමෑ කරන්නා [16]නම් නොවෙත්ද යන අභිප්‍රායෙන් කීහු. **විජ්ජාධරො,** [17]විද්‍යාධරය හෙවත් නොඑක් මන්ත්‍ර ධරන්නේය; **පෙතෙනායස්ස,** [18]සිළු පියහට; **ගුණපරිධංසකො,** ගුණ නසනු වූයේ; **අහපෙනා,** නො නසන ලද ධම්ය; [19]**කාසාවිනං,** [20]කිසිවක්හු; **න හනති,** නො නසා; **පඤ්හං පුච්ඡිතො,** ප්‍රශ්න විචාරන ලද්දේ—මෙසේ තෙලේ ඇත්ද [21]මෙසේ කිණුයේ ඇත්ද මේ කෙසේද යනාදීන් මෙසේ [22]විචාරන ලද්දේය යනුයි; [23]**එතං,** ම බැණෝ [24]විද්‍යාධරයහ, අභූතයෙන් තොප වඤ්චා කෙරෙති, දිව්‍යපුත්‍රයන් [25]වඤ්චා වූවන් මෙන් තෙරෙති [26]යනාදීන් මේ; **අත්තනො** [27]**කථිත මෙව** [28]**පුරතො කාරොනෙනා,** බොධිසත්ත්වයන්ගේ බස්

1 පුවරිත BCDF. 2 මැනාපි අම්මායි CD. 3 ආලපත.-මු.අ.සා. 4 ගිහිවූ සිටි A. 5 ප්‍රව්‍රජ්‍යාව A. පබ්බජ්ජා BF. ප්‍රව්‍රජ්‍යාය CD. 6 ආචාරියයෝයි BD. ආරියයෝයි F. 7 සෙඛෙඛ A. සෙක්ඛ BCDF. 8 අසෙඛෙඛ A. අසෙක්ඛ BCDF. 9 මුනිහුයි A. 10 මොනවා මොහු BCDF. 11 නීචවූනති BCDF. 12 දපෙමි AD. 13 නොකැමැති නම් BCDF. 14 දෙවූ BCDF. 15 තමන් AD. 16 නම් වන්නේ වේද්ද BCDF. 17 විද්‍යාධරයා A. විද්‍යාධර BCDF. 18 පුළු CD. 19 කාසාවනං-මු. අ. සා. 20 කිසිවක් C. 21 මෙසේ ඇද්ද C. 22 කරන ලද්දේ CD. 23 ඒ කීම බැදෙනා CD. 24 විද්‍යාධරයා හා A. 25 වඤ්චාමවුන් A. වඤ්චාවූවදන් CD. 26 යනා මේ CD 27 කථමෙව A. කතමෙව CD. 28 පුරෙ CD.

[1]තොගෙනැ ඒ අභිභවනය කොට තමාගේ කථාවම පෙර දූරි කරන්නේ—තමාගේ බසමැ මතු කරන්නේ; [2]**සල්ලක්ඛෙසි**, [3]සලකා හෙවත් සිහි එළවා ගෙනැ බොරු නොකියා සබා [4]කියා; **එවං වත්වා**, සබා [5]කියව එසේ සබා කී කල්හි තොප පිරිහුනු සතර [6]ඍද්ධිය පෙර පරිද්දෙන් ඇති කොට ලන්නට පිළිවනැයි මෙසේ කියා; [ගාථ] **ගොපෙත්වා**, ගොප් මස දක්වා; [7]**පච්චෙථ**, [8]වනි; එහෙයින්—**ඉසිනා අභිසත්තො**, ඉදින් මහරජ තෝ බොරු [9]කියන්නෙහි වී නම් හිම [10]පිහිටන්නෙහි ආකාශයට නැඟ නොනෙන්නෙහි යනාදි කියන ලද [11]වචන ගෙනැ කීහු; **කාලපරියායං**, මරණ කාල වාරයට; **සත්තපතිට්ඨිතං**, 'චතූහි පාදෙහි සොණ්ඩත වාලධියා [12]තොසෙහිති සත්තහි අවයවෙහි භූමියං පතිට්ඨිතං' යූ සේසි; [13]**පඤ්චාරං**, පස් දූවියක් ඇත්තාවූ; **චක්කපඤ්ජරං**, නිම් වළලු නැති සකක් නොහොත් ගැලැත්ත හෝසි; [14]**මහාධූමං කත්වා**, මහා විනාශ කොට—හිති දිපියාය යෙත් මේ; [15]**පච්ඡිමුත්තරදිසාය**, වායව්‍ය කොණයෙහි—

## 422. චේතියජාතකං.

---

**නවකානා චෙව**, අලුත් බැවින්ද; [16]**පීඨං වා**, [17]පුටුවක් වේවයි; **ඵලකං වා**, [18]පුවරුවක් වේවයි; **උළුඞ්කපිට්ඨෙන**, [19]එළු පිටින් නොහොත් [20]සහළු පිටින්; **සට්ඨිතා**, සටන ලද; **ගිනනාසිකප්පක**, බිඳුණු [21]හුළු ඇති නොහොත් [22]හුළු ඇලී ගියාවූ; [23]**කසජ්ජියාගු වා**, [24]කළු කැඳ එව්—අඹු එව්; කළු [25]කැඳ අඹු නම් අනතයෙහි බොහෝ [26]බඳුන් පතුල් රැරා පෙරා එක් [27]කොට සැදි සපා පීවාවූ නැඳයි; **පූතිපුක්කඛජ්ජකං වා**, [28]පිළිතිවූ විශළී ගොස් නිරොජස්කවැ ගිය කත දූ ක් වේවයි; **ඛාමසුක්ඛකුම්මාසො වා**, දූ ගොස් නිරොජස්කවැ ගිය [29]දමුකාඩෙක් වේවයි හෙවත් දමු බතෙක් වේවයි; **සුසම්පාදිතානි**, මනාකොට සපයන ලද; **සෙතවත්ථනිවාසා**, [30]පඬුමැටි යෙන් [31]හෙවත් සුදු මැටියෙන්; **නිසිද්දිෂෙපත්වා**, තමා [32]ගලනු

---

1 තො ගැනැ අභිභවනය A. 2 සල්ලකෙබසි ACD. 3 සලකා CD. 4 කියැ A. කිය CD. 5 කියවා A. 6 ඉද්ධිය CD 7 පාපචෙකි-මු. අ. කා. 8 වනහි A. වන්න CD. 9 කියන්නන් වීයි නම CD. 10 පිහිට වන්නෙයි ACD. 11 ඒ වචනය CD 12 තො සෙහිති C. 13 මු. අ. කථායි නොපැනේ. 14 මහාධූපං-මු. අ කා. 15 පච්ඡිම උත්තර-මු. අ කා. 16 පිඨකං-මු. අ. කා. 17 පුටුවෙක් A. 18 පුවරුවෙක් A. 19 එළු පිටින් A. එළුවු පිටින් CF. මුහුවු පිටින් BD. 20 සහළු ACD. 21 හුණු-හැම 22 සුළු CDF. 23 යාගුවා-මු. අ. කා. 24 කළු කැඳ අඹු A. කළු කැඳවු BCDF. 25 කැඳවු අඹු ACD. 26 බුමඳු පතුල් C. 27 කොට ගත් BCDF. 28 පිළිතම C. 29 දමු A. 30 පඬු C. 31 නොහොත් CD. 32 කලතුය CD.

කරන්නට ආ එකක්හු මෙන් කොට හිඳුවාලා; **පිට්ඨිසඞ්ඝාටෙ,** ගෙන් [1]පිටත ගැබ; **අතිච්ඡාපෙති,** ‘අතික්කමිත්වා [2]ඉච්ඡාපෙති’ යූ සේයි—අපගේ මේ ගෙය [3]ඉක්මැ අතික් තැනක් කැමැති කරව හෙවත් පරගෙන් [4]බික කැමැති වන පරිද්දෙන් කරායි කිව යූ සේයි; **ආගනත්වා,** තමා අවුළු පිසන තැනින් නික්මැ; [5]**සාණිකං,** අවුළු පිසන තැන තමාට මුවා කොට තුබූ කඩ තුරාව; [6]**අමහා,** බෙදයැ; **දුරකාපියාති,** මා දරුවන් පියාණෝ යයි; **තුම්හෙ ඉමඹව පරිනිබ්බායථ,** තුඹවහන්සේ [7]ඉතිකින් **මෙම් වෙෂයේ** සිට මෙහි මැ පිරිනිවිය [8]වැනව; **විබ්භමිස්සාමි,** ගිහි වෙමි; [9]**පබ්බජාපෙසෙනො,** පාවා දෙන්නේ; **චතුකි ඣානෙනාති** යනු චතුක්ක නයින් රූපාවචර ධ්‍යාන චතුෂ්කය ගෙනැ කීහු; **අගගද්වාරෙන,** [10]පළමුවන වාසල් දොරින්; **කච්චඩ්ඩකඅස්සමෙ,** එනම් අසපුයෙහි—ගිවුළු වෙනහි පිහිටි බැවින් එව් එනම් කියත් මේ; **අවනතිදක්ඛිණාපථෙ,** අවනති නම්වූ **දක්ඛිණ** [11]දෙශයෙහි; **සනනසෙලං,** මුදුනෙහි ගස් කොළ නැති ගන [12]ගලක්; **ගුහාලෙණෙ,** [13]ගල්ලෙණෙක්හි; **හවං අකලලකොනි,** පින්වත් තෙමැ ගිලනැයි කියා; **අවත්ථුකං කථෙසි,** බොරු කියා හෙවත් අකාරණ කොට [14]සිස් කියා; **කච්චි,** කිමැ; **ඉතරෙන,** නාරද තාපසයන් විසින්; **නාතිවත්තති,** අනුවැ නොපවතීද; **කිච්ජස්ස,** දුකබය; **නිරාමිසසුඛං,** කෙලෙශ [15]රහිත හෙයින් නිරාමිස සුඛවූ; **කිච්ජනානං,** දුකබයාගේ අනාතිම යයි කියන ලද; **තං වා සොගසුඛං,** ඒ නිර්වාණ සුඛ යට හෝ; **අනුබ්බිලලාවිතත්තං,** නො ඉපිලෙන බව; **අසිතො දෙවලො,** [16]කළු දෙවුල් සෘෂි; **එතත්තං එතං පණ්ඩිච්චං,** මේ පාණ්ඩිත්‍යය නම් මෙතෙක් මැයි—නුවණැති බව නම් මෙතෙක් මැයි—නුවණැත්තවුන් කිවමනා දෙය මැ මොහු කීයේය—නුවණැති [17]බව හැමත් [18]මෙතෙක් වේද යනුයි. **ඉතො,** [19]මොහට වඩා; **යො හි පඨමං මෙව කතතබ්බකිච්චකං න කරොති,** යමෙක් වනාහි පළමු කොට කටයුතු දෙය නො කෙරේද—නාරදය නා මෙසා දුකකට පැමිණියේ මේ උපද්‍රවය නොවන පරිද්දෙන් පළමු කොට මැ කළමනා දෙය නොකළ හෙයින් වේද—පළමුකොට ඉන්ද්‍රිය සංයමාදිය නොකළ හෙයින් වේද—වැළිදු නාරදය යමෙක් වනාහි මෙලොව තමහට වන

1 ඵට CDF. 2 පුච්ඡාපෙති C. 3 ඉක්මවා C. 4 බික් C. 5 සාණිං-මු. අ. ක 6 අමෙහා-මු. අ. ක 7 එතකින් BCDF. 8 මැනවැයි A. 9 පබ්බජාදෙනතං C. 10 පළමවයනා A 11 දිශායෙහි A. 12 ගසක් A. ගලක BCF. 13 ගල්ලෙනෙහි A. 14 සිය A. සිසැ BCDF. 15 රහිතයෙන් A. 16 කළුල්දෙව්-හැම. 17 බව නම් හැත් BCDF. 18 මෙත් A. 19 මේ කට A.

යම් උපද්‍රවයෙක් ඇත් නම් ඒ නොවන පරිද්දෙන් පලඹුකොට මැ [1]කලමනා දෙය නොකෙරේද යනුයි; [2]ගිරිපබ්භාරං, පර්වතයක්හු විසින් පිරිබෙව් කරන ලද—සිසාරා සිටි [3]පර්වතයක් ඇතිය යනුයි; පබ්බතජාලං, පර්වත [4]බෙයදකට; [5]අනාභිණ්ඩනෙනාව, නො ඇවිදිනෙම්මැ; දිට්ඨධම්මවෙදනියං, මෙමැ ජාතියෙහිමැ විඳුවන; රාජිමයා, පැළිහිරි; දුරූපො, [6]විරූප වූයේ; දුස්සණ්ඨිතො, නපුරුවූ සංස්ථාන ඇත්තේ හෙවත් සටහන් නැත්තේ; ආජීවසාධකං කිච්චං, ජීවනොපාය කෘත්‍යය හෙවත් දිවි වටන තම්; [7]සහසජ්ජිතො, [8]දහසෙකින් පරදවන ලද; [9]සොහං, 'සො අහං'යි පදච්ඡෙද කරනු—යම් බඳුවූ මමය යන අර්ථයි; භොගෙ උප්පාදෙය්‍යං, භොගයන් උපදවම් ද; කොට්ඨාසං, [10]දුඃඛ කොට්ඨාසයට හෙවත් දුඃඛාවස්ථාවට—

## 423. ඉන්ද්‍රියජාතකං.

විචිනිත්වා, [11]සොයා—පරීක්‍ෂා කොට; අනවජ්ජියං යනු බුද්ධොත්පාදයෙහි දුන් හෙයින් අනාගවත්‍යී කොට ගෙනැ කියු. වනිබ්බකයෝ නම් ගුණ කියා ඉල්වන්නෝයි; දනගගං, දත් දෙන්නාවූ ස්ථානය හෙවත් දත්ගල; න හාමෙසති [12]නො සතුස්වයි හෙවත් සතුටු [13]නොකරවයි; පුප්ඵානි පෙසෙත්වා, පසේ බුදුන් වසන දිගට මල් අහසට දමා යවා; උපොසථඩගානි, අටසිල්; සුමනපුප්ඵ, දෑසමන් මල්; පඤ්චඩගානි, යස්තාද්වයයැ පාදද්වයයැ තලාටයැ යන [14]පස් අවයවයන්; පුන දිවසෙ, පැවරු දවස් මූත් අතික් [15]දවස්—[16]සෙට වැනි දවස් වළඳන කල පැවරිම අද වැනි දවස් වන බව ගෙනැ කිහු; උපරි පතිංසු, මුදුනෙහි වැගිරු ගියෝ; සත්තපච්චෙකබුද්ධනාදීමෙයහි සත් දෙනකු වහන්සේමැ නැඳවා වඩනා පරිද්දෙන් ඇමමත කෙළේ සත් මල් මිටක් දූනැ සත් [17]දෙනකු නැමැත් තාන යන [18]අදහසිති; ඡාහං භුනනානං, ආදි ඉා දවස් හා එක්කොට සදවසක් මූළුල්ලෙහි වැළඳූ [19]පසේ බුදුනවරුන්දූව; [20]රතනන්සන්ථාරොපි, රියනක් දිග ඇතිර කඩකුත්;

1 කලම්නා කෙරෙද C. 2 ගිරිපකබ්භාරං B C D F. 3 පර්වතයක්ය යනුයි C D. 4 පහදයසාට B C D F. 5 ආභිණ්ඩනෙනා ඇවිදිනොඹිම-හැම. 6 විසරූප C 7 සහසජ්ජනො-මු. අ. සා. සහසසජිතං A. සහසපරාජිත B සහසජිත C D F. 8 දහසෙත් A. 9 සහසසයොගයි පදචෙජ්දයි B C D F. 10 දුඃඛ C F. 11 පරීක්‍ෂා A. 12 නොතුස්වයි B C D F. 13 නොසකරවයි B C D F. 14 පස් අග අවයවයන් A. 15 දවස A B D. 16 මේ සෙට වැනි C D. 17 දෙනනකු C D 18 අදසිති D. 19. පසේ බුදුන් වහන්සේවරුන්ට B C D F. 20. රතණසත්ථාරොපි මු. අ. සා.

**එකාදසහි අග්ගීහි,** රාග දෝෂ මෝහ ජාති ජරා මරණ ශෝක පරිදේව දුඃඛ දෞර්මනස්‍යෝපායාස යන එකාදශාග්නීන්; **දසවිධදානවත්ථුභෙදං,**

[1]"අන්නං පානං යානං වත්ථං මාලාගන්ධවිලෙපනං
සෙය්‍යාවසථපදීපෙය්‍යං දානවත්ථු [2]ඉමෙ දස"

යන දස වැදෑරුම්වූ දානවස්තු විශෙෂ ඇති; **විපස්සකයොගාවචරා,** විදර්ශනායෙහි නියුක්ත යෝගාවචරයෝද—භාවනා කරන පුහුලි; [**උට්ඨානවිරියෙ**] 'උට්ඨානවිරියෙන' යු සේයි-උට්ඨානයයි කියන ලද වීර්‍ය්‍යයෙන් යනුයි. **උට්ඨාන** නම් නො උපන් ගුණ උපදවන්නට කරන්නාවූ වීර්‍ය්‍යයයි. **යො ජන්තු,** 'යො සත්තො' යු සේයි; **එසො,** මෙහි; **උපයොගත්ථෙ සාමිවචනං [3]සාඛාපි,** ද්විතීයාර්ථයෙහි [4]ෂෂ්ඨී විභක්ති කොටද,-'ධම්මලද්ධං උට්ඨානවිරියාධිගතං'යි කිවමනා තැන 'ධම්මලද්ධස්ස උට්ඨානවිරියාධිගතස්ස'[5]යි ද්විතීයාර්ථයෙහි [4]ෂෂ්ඨී [6]කොටද යනුයි. **අයෙසා [7]දට්ඨබ්බා,** 'ධම්මලද්ධං උට්ඨානවිරියාධිගතං දෙය්‍යධම්මං යො ජන්තු සීලවන්තෙසු දදාති'යි අර්ථ දත යුත්තේයි; **අට්ඨමහානිරයෙ,** සඤ්ජීව කාලසූත්‍ර සංඝාත රෞරව මහා රෞරව අවීචි තාප [8]ප්‍රතාප යන අට මහා නිරයෙහි; [9]**බ්‍යග්ඝිරූපකස්ස,** ව්‍යාඝ්‍රීරූපකයහට—වස්තුව්‍යය [10]බඳුවහටය යු තැන්; **භයභීරුකස්ස,** මරණ[10]බඳුවහට; [11]**මුඤ්චනචෙතනා,** වස්තු පරිත්‍යාග [12]චේතනා තොම-දන් දෙන කල උපදනා චේතනායි; [13]**දක්ඛිණං ච,** දක්ෂිණාවද—දියයුතු[14]වස්තුවද යු සේයි; [15]**දක්ඛිණෙය්‍යෙසුව,** දක්ෂිණාවට නිසි [16]පුහුලාද; 'දක්ඛිණං අරහතීති දක්ඛිණෙය්‍යා'යනු වේ. **සූරො හොති,** නිර්භයවීම් වශයෙන් සූර වේද; **බාහිරතිත්ථායතනෙ,** බාහ්‍යවූ තීර්ථක ශාසනයෙහි; **ඣානස්ස උපචාරමත්තං,** මතු උපදනා අර්පණාධ්‍යානයට සමීප [17]මාත්‍රවූ ධ්‍යානය හෙවත් උපචාර ධ්‍යානය; [18]**පණිධාය,** ප්‍රාර්ථනා කොට—එක්තරා දෙවනිකායක් පතා හැසිරෙන්නාවූය යනුයි. **පුබ්බනරා,** 'ඉමස්මිං කප්පෙ කස්සපබුද්ධාදීනං [19]අතිසයෙන

1 අන්නං පානං යානං මාලාගන්ධවිලෙපනං A අන්නං පානං වත්ථං C D. 2 දස ඉමෙ-හැම 3 සාඛා-හැම 4 ෂෂ්ඨි කොටද BCDF. 5 මෙතැන සිට 21 වැනි පෙළේ චේතනා තොම යනු දක්වා A හි පමණකි. 6 කොටදක්ද යනුයි A 7 වෙදිතබ්බා-මූ අ. සා. 8 ප්‍රතාපන A. 9 භය A. 10 බාදුනට A. බදුවිහට B C D F. 11 මුඤ්චනචෙතනාය A. 12 චෙතනාතෙම A. 13 දක්ඛිණා A C D. 14 මුදූය C 15 දක්ඛිණෙය්‍යාව CD. 16 පුහුලෝද A D. පුහුලෙක්ද C. 17 මාත්‍රවූ A. 18 පනිධාය A. 13 ආදිස්සෙන B C D ආදිසසෙන F.

[1]පුබ්බන්තා—පාරන්තා—දූරන්තා වෙස්සභූදසබලාදයො [2]පුබ්බතරා නාම, තෙ පුබ්බතරෙ' යු සේසි.

## 424. ආදිත්තජාතකං.

---

[3]තොසෙතුං, සතුටු[4]කරන්නට; [5]එතෙ, පණ්ඩිතවරුන්; සමුල්ලපන්තෙස්සව, [6]බණින්නාහටමැ—[7]බිණියදිය යනුයි; අම්හාකං [8]සහස්සකෙළි නාම නත්ථි, අපට දහසක් ගෙනැ කෙළි නම් නැත. අපට එසේ දහසක් ගෙනැ කෙළි නැත. දහසක් එසේමැ ආදි කොට අප අත තබාලුව මැනැවැ. [9]එතෙන යින්ය යනුයි. අසිතිකොටිධනං[10]බාදිං යනු ඇ හා තමන් සංවාසයෙහි පවත්නා තෙක් මාතයෙහි ඇට දී එතැනට වියදම් වූ ධන ගෙනැ කීහු. විරජ්ජි, ස්ත්‍රීන් කෙරෙහි විරක්ත වී—ඇලුම් දුරැ කෙළේය යනුයි; [11]පාපෙ, පවිට; ජම්මි, යටත් තැනැත්තිය; සුතිවසෙන, ශ්‍රැති වශයෙන්--අසෝ තැන වෙසෙතියි කියා මෙසේ ඇසුවවුන් කෙරෙන් අසාය යනුයි; යං න භවිතබ්බං, යමෙක් නොවිය යුතුද හෙවත් යමෙක් නොවන්නේද; තං භවිස්සති, ඒ නොවන[12]දෙය වන්නේ වී නම්;[13]සීඝසොතාභාවං පහාය, ශීඝ්‍රවූ ජලප්‍රවාහ භාවය හැරැ—ශීඝ්‍ර වැහිම් හැරැය යනුයි; භවෙය්‍ය නාමාති, එකාන්තයෙන් [14]වන්නා නම් වෙයි කියා; [මක්කිනා] [15]ගණ්ඩූවාරිණ්—මූව මූවවැ ඇවිදිනා මක්ෂිකාවෝ; කම්බලලොමුහෙයන, කැසුප් ලොම් පුපිත් කළ; එතෙනා, 'පාවාරො' යු සේසි. පාවාර නම පොරෝනායි හෙවත් පිඩාම්; තූලෙන, පුලුතින්; එකො උභයෙන, කැස්බන්ගේ රෝමයෙන් හා පුලුතින් හා දෙකින් කළ එක පොරෝනාවෙක් වන්නේද; පාපුරණාය, පොරෝනා පිණිසැ; එතෙසානං සුරාඝටං පිවිත්වා,[16]එකෙකි දෙන එකෙක් රා කළ බී; බිම්බඵල, කෙම්ඵල; අඤ්ඤමඤ්ඤස්ස සම්පත්තිං ඉච්ඡන්තා, ඔවුනොවුන්ට සැපත් සමෘද්ධි කැමැත්තාහු; [17]පිහයෙය්‍යුං, ඔවුනොවුන්ට වෘද්ධි පතත් ද; [18]පුලසගච්ඡන්තානං, කවුපිළ පතින්; යනෙනන වෙව, රුවල් යොතින් හාද-රුවල් [19]තගත [20]බාතයි; [21]වටාසාරෙන ච, රෝමාදි [22]බනතින් හාද——

## 425. අට්ඨානජාතකං.

---

1 පුබ්බන්තා දූරන්තා BCDF 2 පුබ්බන්තා C D. 3 පොසෙතුං-මු. අ. ක. 4 කරවන්නට A. 5 තෙ-මු. අ. ක. 6 බණින්නාටමැ A. 7 බිනියමදිය CD. 8 සහස්සකෙළි-මු. අ ක. 9 එසේනෙයින් D. 10 බාදි-නැම 11 පාපො A C D. 12 නොවන දෙවියන්ගේ විනාම් A. 13 සීඝසොතං පහාය-මු අ ක. 14 වන්නාවූ නම් BCDF 15 ගනාවාරිනි C ගනාවරින් D 16 එකෙකි රා කළ B C D F. 17 පිහයන්තු B. C. D. 18 පුලසගවජ්ජපණ්ණානං-මු. අ ක. 19 හඳනා CD. 20 පාතයි-නැම. 21 වටාසාරෙන ච-මු. අ. ක. 22 පනජ්න්-නැම.

[1]ගිරිපරික්ඛිත්තෙන, පර්වතයන්හු විසින් පිරිවෙළු කරන ලද—වටා සිටි පර්වතයක් ඇතියෙ යනුයි; ගිරිබ්බජසෙනාසනෙ, [2]වටා සිටි පර්වතය හෙතු කොටැ ගෙනැ වජයක් වැනි හෙයින් ගිරිබ්බජ නම්වූ විහාරයෙහි; බගිසී, හැවැත්තීයි—රැඳී සිටියා යනුයි; විසණ්ඨදනෙනා, මෙසේ ආ කල මෙසේ ගනිමියි යනාදීන් [3]සැරැහී සිටියදීමැ; [4]වාරෙනෙනස්සු, තණ කවන කල්හි; ඛමනීයං, තොපගේ ශරීරය ක්‍ෂමද; සුඛං සුපෙච්ඡ..ාසිනි, සුවදුක් [5]විචාරවයි කියා; නඞ්ගුට්ඨමණ්ඩලං, නඟුටු [6]මඬුල්ල හෙවත් නගුට; [7]හෙඨයිත්වා, වෙළා හෙවත් මැඩගෙනැ—නොමැඩියද [8]විෂම තමට කියා; [9]අට්ඨිතට්ඨානං නාම, නොතුබූ තැනෙක් නම්; ඛන්ධි ගහෙත්වා, කඳට ගෙනැ හෙවත් තර බැහැගෙන; ගීවං මද්දි, උගුර [10]මැඩී; පරක්කමෙව යුඤ්ජෙය්‍ය, ශෞර්‍යය නමැ යෙදෙන්නේයි-දුෂ්ටයා විෂයෙහි සුභාෂිත වචනයෙක් නම් නැත. ඔහු කෙරෙන් මූකනවැ ගන්නට තිසි යම් ශෞර්‍යයෙක් [11]ඇත්තේ නම් ඒ මැ ඔහු විෂයෙහි [12]යොදන්නේයැ යනුයි.

## 426. දීපිජාතකං.

---

## කච්චානි වග්ගො.


---

## [13]අට්ඨනිපාතවණ්ණනා නිට්ඨිතා.

---

1 ගිරිපක්ඛිත්තෙන D. 2 වටසිටි C. 3 සැරහි සැරහී සිටියදී D. 4 චරනෙනස්සු-මූ. අ. සා. වාරනෙනස්සු ABC. 5 විචාරයි CD. 6 මඬොල්ල CD. 7 විනෙඨයිත්වා A. 8 විෂමකාව ABDF. මිෂකාව C. 9 රහිතට්ඨානං-මූ. අ. සා. අසිතයිට්ඨානං A. 10 මැඬීA. මැඬ CD. 11 ඇත්නම් CD 12 යෙදෙන්නේයැ A. 13 අට්ඨක-මූ. අ. සා

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු